වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2011

පර්යේෂණ මගින් නව තාක්ෂණය හඳුනාගැනීම,



ගුණාත්මයෙන් යුත් උපස් බිජවගිනිපැවැත්ම,



ගොවි ජනතාව වෙත තාක්ෂණ හඳුන්වාලබාදීම,



රට සමෘද්ධිමත් කිරීමට දායක වන වගයි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය, ශ්‍රී ලංකාව

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2011

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය
ශ්‍රී ලංකාව

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින්

ප්‍රකාශයට පත් කරන ලදී

2011

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය විසින් සම්පාදනය කොට සංස්කරණය කරන ලදී.

සියලුම හිමිකම් ඇවිරිණි. විවේචනය හා පුනරීක්ෂණය සඳහා කෙටි වාක්‍ය ඛණ්ඩවප උපුටා ගැනීම් හැරුණුවිට, මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ණ අනුමැතියෙන් තොරව, නැවත ඉදිරිපත් කිරීම, පුනරුත්ථාපනය කළ හැකි වන සේ ගබඩා කර තැබීම, විද්‍යුත්, යාන්ත්‍රික, ඡායාස්ථිත, පටිගත කිරීම හෝ වෙනත් ක්‍රම උපයෝගි කරගනිමින් සම්ප්‍රේෂණය කිරීම සපුරා තහනම් වේ. අසාධාරණයක් නොවන පරිදි වාණිජ නොවන ස්වරූපයේ කටයුතු සඳහා මෙම අවසරය ලබාදීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලබන ප්‍රකාශන වල, වාණිජ නොවන, කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමේදී ගාස්තු ගෙවීම අනවශ්‍යවේ. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණාත්මක සොයාගැනීම් සඳහා අව්‍යාජව යොදා ගැනීමට මෙම හිමිකම් ඇවිරීමේ ප්‍රකාශය බාධාවක් නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉදිරි දැක්ම

ජාතියේ සෞභාග්‍යය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම.

මෙහෙවර

නව දියුණු කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කර ව්‍යාප්ත කිරීම සහ අදාල සේවාවන් ගොවීන් වෙත වැඩි අවධාරණයක් සහිතව සියළුම පාර්ශ්වකරුවන් වෙත ලබාදීමෙන් ජාතියේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යෝග්‍ය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්කර ගැනීම.

සම්බන්ධීකරණය

පී. සී. පීරිස්

උපදේශකත්වය

පී. කේ. කේ. ආර්. පෙරේරා

සංස්කරණය

ආචාර්ය ඊ. එම්.දසනායක

පරිවර්තනය හා සෝදුපත් කියවීම

ඊ. එම්. එස්. කේ. ඒකනායක

ඩබ්. ඩී. යූ. නිරංජලා

ඒ. එච්. එන්. විජයතිලක

යතුරු ලියනය

සමුද්‍රා ප්‍රේමදාස

කේ. එච්. එන්. පෙරේරා

එච්. එම්. කුමාරි හේරත්

පී. එස්. හේමමාලා

කේ. ජේ. එම්. ජයසිංහ

රංග මධුශංක

පිටු සැකසුම

කේ. ජේ. එම්. ජයසිංහ

අධ්‍යක්ෂ මණ්ඩලය

කේ. ජී. ශ්‍රියාපාල මයා

(කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්)

පී. කේ. කේ. ආර්. පෙරේරා මයා (අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - සංවර්ධන)

ආචාර්ය ඊ. එම්. දසානායක මිය (අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - පර්යේෂණ)

එච්. පී. ඩී. එම්. සරච්චන්ද්‍ර මිය (අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - පාලන)

ආචාර්ය ඩී. එම්. එන්. දිසානායක

කේ. බී. වහුන්දෙණිය මයා

ඩබ්. ජී. එම්. ජී. දයාවංශ මයා

ආචාර්ය රොහාන් විජේකෝන්

ටී. එච්. සී. එස්. පෙරේරා මයා

ආචාර්ය ඩබ්. එම්. ඒ. ඩී. බී. වික්‍රමසිංහ

ගාමිණී ද සිල්වා මයා

ආචාර්ය ඩබ්. එම්. ඩබ්. වීරකොන් මයා

ආචාර්ය ජී. එම්. ඩබ්. චිත්‍රාල්

ආචාර්ය එච්. එම්. එස්. හීන්කෙන්ද

ඉංජිනේරු එම්. එච්. එම්. ඒ. බණ්ඩාර

කේ. යූ. රණාවක මයා

ආර්. පී. ප්‍රේමරත්න මයා

පෙරවදන

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තාක්ෂණික අංශ හය සහ සහාය සේවා අංශ තුන මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් තුළින් 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආහාර කෘෂිකර්ම ක්ෂේත්‍රයට දැක්වූ දායකත්වය පිළිබඳ තොරතුරු සම්පාදනය කර මෙම වාර්ෂික කාර්යසාධන වාර්තාවේ දක්වා ඇත. ජාතියේ සෞභාග්‍යය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීමේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු ඉදිරි දැක්ම වී, වෙනත් ක්ෂේත්‍ර බෝග, පලතුරු, එළවළු සහ විසිතුරු පැළෑටිවලට අදාළ සියලුම පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් තුළ අන්තර්ගත වන අතර එම වැඩසටහන් ආහාර කෘෂිකර්ම ක්ෂේත්‍රයේ නිෂ්පාදනය සහ ඵලදායිතාව ඉහළ නැංවීම පිණිස 2011 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී. වී සහ වෙනත් ආහාර බෝග වගාවේදී බොහොමයක් ගොවීන්ට ඇති දැවෙන ගැටලු වන තත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය නොමැති වීම, නියඟය, ගංවතුර, ලවණතාව, පළිබෝධ හා රෝග යනාදියට ප්‍රමාණවත් පරිදි විසඳුම් ලබාදිණි. එලෙස සඳහන් කළ මෙන්ම වෙනත් වැදගත් පර්යේෂණ හා සංවර්ධන ක්ෂේත්‍ර ද පිළිබඳ විස්තර මෙම වාර්තාවේ දැක්වේ.

ආහාර බෝග අංශයේ නිෂ්පාදනය හා ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා නිතිපතා සිදුකරන වැඩසටහන්වලට අමතරව, උසස් තත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම පිණිස ද පහසුවෙන් නෂ්‍ය වන බෝගවල පසු අස්වනු හානි අඩුකර ගැනීම පිණිස ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නවත් කාර්යයන් රැසකට ද දායක වී ඇත. ආහාර බෝගවල ඵලදායිතාව ඉහළ නංවන අතරම කෘෂිකර්මය මගින් පරිසරයට වන බලපෑම අඩුකර ගැනීමේ පර්යේෂණ වැඩසටහන් කෙරෙහිද අවධානය යොමු කරනු ඇත.

මෙම වසර තුළ දෙපාර්තමේන්තුවට ස්වයංපෝෂිත වීමේ ඉලක්කය ජයගත හැකි වූ අතර වර්තමානයේ සහල්වල තත්වමය ලක්ෂණ වැඩිදියුණු කිරීම පිණිස ද ආනයන සීමා කිරීමේ අරමුණින් වෙනත් ආහාර බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම පිණිස ද ක්‍රියා කරයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෙක්ටයාර් 7000 ක් ආවරණය කරමින් හා එයින් ටොන් 4300ක අස්වැන්නක් ලබා ගනිමින් තෙවැනි කන්න බෝගයක් වශයෙන් (අතරමැදි කන්නයක වගා කරන බෝග) මුං වගාව ප්‍රවර්ධනය කිරීමට සමත් විය. බුත්තල පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයේදී මෙවර ද මෙම දෙපාර්තමේන්තුවේ කෘෂි ප්‍රදර්ශන ක්ෂේත්‍රය අඛණ්ඩව සිව්වන වරටත් ප්‍රථම ස්ථානය දිනාගත් බව සඳහන් කළ යුතුය.

2011 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තොරතුරු අඩවිය වෙනුවෙන් කෘෂිකර්මයේදී තොරතුරු හා සංනිවේදන තාක්ෂණ භාවිතය සඳහා වන අන්තර්ජාතික සම්මානය ද (2011 E-World International Award for ICT in Agriculture) 'විකිගොවියා' යන තොරතුරු අඩවිය සඳහා විද්‍යුත් -කෘෂිකාර්මික අධ්‍යාපනය සඳහා වන අන්තර්ජාතික සම්මානය ද (UN affiliated WSA 2011 International Award for E-Agriculture Education) වශයෙන් ලද අන්තර්ජාතික සම්මාන 2 මෙම දෙපාර්තමේන්තුවේ ඩිජිටල් තාක්ෂණ භාවිතයේ උසස් මට්ටම සඳහා ලැබුණු ජාත්‍යන්තර පිළිගැනීම පිළිබඳ සාක්ෂිය. වඩාත්ම වැදගත් වන්නේ මෙම වසරේදී ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාවට අවශ්‍ය සියලුම සේවා එකම ස්ථානයකින් සැපයීමේ අරමුණෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන (කෘෂිකර්ම සේවා පියස) 9ක් ස්ථාපිත කිරීම මගින් පර්යේෂණ, ව්‍යාප්ති කටයුතු හා ගොවි ප්‍රජාව අතර සබඳතා ප්‍රවර්ධනය වීමක් සනිටුහන් වීමය.

කෘෂිකර්මයේ ඵලදායිතාව ඉහළ නැංවීම සහ එමගින් ගොවි ප්‍රජාවේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව සාර්ථකව තම සම්මානලාභී පිළිවෙත් අඛණ්ඩව ක්‍රියාවට නංවන බව සහතිකය. මෙම වාර්තාවෙන් දැක්වෙන සාර්ථකත්වය අත්කර ගැනීමට දරන ලද සාමූහික ප්‍රයත්නය වෙනුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්ටද මෙම වාර්තාව සකස් කර නිම කිරීමට දරන ලද මහත් පරිශ්‍රමය වෙනුවෙන් එම අදාළ නිලධාරීන්ටද මාගේ ස්තුතිය පුදු කරමි.

කේ. ජී. ශ්‍රියාපාල
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

පටුන

1 කාලගුණ වාර්තාව 1

2.1 ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, මහ ඉලුප්පල්ලම 14

2.1.1 ධාන්‍ය රනිල සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අඟුණාකොළපැලැස්ස 28

2.1.2. කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අරලගංවිල 36

2.1.3. කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - කිලිනොච්චිය 43

2.2 උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, ගන්නොරුව 49

2.2.1. පැළෑටි වයිරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය - හෝමාගම 75

2.2.2 පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - හොරණ 81

2.2.3 ආහාර පර්යේෂණ ඒකකය - ගන්නොරුව 93

2.2.4 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල 97

2.2.5 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර 104

2.2.6. කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - සීතාඑළිය 109

2.2.7 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල 115

2.2.8 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - ගිරාඳුරුකෝට්ටේ 119

2.2.9 උද්‍යාන බෝග පර්යේෂණ ඒකකය - 2, ගන්නොරුව 122

2.3 වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය - බතලගොඩ 129

2.3.1 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බෝඹුවල 146

3.1 බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නොරුව 151

3.1.1 බීජ සහතික කිරීමේ සේවය - ගන්නෝරුව 158

3.1.2. පැළෑටි සංරක්ෂණ සේවය - ගන්නෝරුව 168

3.1.3. ජාතික පැළෑටි නිරෝධායන සේවය - කටුනායක 173

3.1.4 පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය - පේරාදෙණිය 180

3.1.5 පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය - ගන්නෝරුව 190

3.2. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය - පේරාදෙණිය 196

3.3. සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය - පේරාදෙණිය 210

3.4 ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය - පේරාදෙණිය 214

3.5 ස්වාභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය - පේරාදෙණිය 221

3.6 ව්‍යාප්ති සහ පුහුණු අංශය - පේරාදෙණිය 229

4.1 පාලන අංශය 243

4.2 ඉංජිනේරු අංශය - පේරාදෙණිය 250

4.2.1 ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය මහඉලුප්පල්ලම 254

4.3 මුදල් අංශය 259

5 ප්‍රකාශන හා ඉදිරිපත් කිරීම් 262

6 ජ්‍යෙෂ්ඨ කාර්‍ය මණ්ඩලය 269

7 තාක්ෂණික කාර්ය මණ්ඩල සුදුසුකම් (2011.12.31 දිනට 285

1. කාලගුණ වාර්තාව

ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි පාරිසරික කලාප නියෝජනය කරමින් 2010 /2011 මහ (සැප්තැම්බර්-පෙබරවාරි) සහ 2011 යල (මාර්තු - අගෝස්තු) කන්න තුළ කෘෂි කාලගුණික විද්‍යා නිරීක්ෂණ මධ්‍යස්ථාන 13කින් එක්රැස් කරගත් කාලගුණික දත්ත මෙම වාර්තාවෙහි සාරාංශගතව දක්වා ඇත. මෙම වාර්තාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සම්පාදනය කරන ලද්දකි.

කන්න දෙකෙහි සමුච්චිත වර්ෂාපතනය වගු අංක 1.1හි දැක්වේ. කාලගුණික නිරීක්ෂණ මධ්‍යස්ථාන 13හි මාසික වර්ෂාපතනය සහ දස වසරක සාමාන්‍ය අගයන් පිළිවෙළින් වගු අංක 1.2හි සහ 1.3හි දැක්වේ. අනෙකුත් වැදගත් කෘෂි කාලගුණික පරාමිතියන් වන විභව වාෂ්පීකරණ උත්ස්වේදනය (විවෘත තැටි වාෂ්පීකරණය මගින් තක්සේරු කරන ලද), උෂ්ණත්වය, සාපේක්ෂ ආර්ද්‍රතාව, හොඳින් හිරුඑළිය පැවති පැය ගණන සහ සුළඟේ ප්‍රවේගයට අදාළ මාසික මධ්‍යන්‍ය අගයන් පිළිවෙළින් වගු අංක 1.4, 1.5, 1.6, 1.7, 1.8හි දැක්වේ.

පහතරට තෙත් කලාපය

බෝඹුවල (WL1b)

2010/2011 මහ කන්නය තුළ මෙම කලාපයට අපේක්ෂිත මට්ටමේ වර්ෂාපතනයක් ලැබිණි. එය එහි දිගු කාලීන සාමාන්‍යයට වඩා 20%කින් වැඩිවීමකි. කෙසේවුවද, ඔක්තෝබර් මාසයේදී ලද වර්ෂාපතනය අපේක්ෂිත ප්‍රමාණයට වඩා සැලකිය යුතු අයුරින් අඩු වූ අතර ඉන් පසු මාසයේ සමුච්චිත වර්ෂාපතනයේ 100%ක පමණ වර්ධනයක් වාර්තාවෙමින් එම අඩුව පිරි මැසිණි. මාසික වශයෙන් හිතකර ව්‍යාප්තියක් සහිතව සාමාන්‍ය කන්නමය වර්ෂාපතනයට වඩා 5%ක් පමණක් වැඩිවූ 2011 යල කන්න වර්ෂාපතනය ව්‍යාප්ත වූ ආකාරය එහි සුපුරුදු රටාවට සමීප විය.මෙය බෝගවල ජල ඉල්ලුම සපුරාලීමට සමත්විය.කෙසේ වුවද, කලාපය තුළ දුර්වල නිරිතදිග මෝසම් තත්වයක් පැවතීම හේතුවෙන් ජූනි මාසයේදී ලද වර්ෂාපතනය අපේක්ෂිත ප්‍රමාණයට වඩා සැලකියයුතු මට්ටමින් අඩුවිය. මෙම තත්වය මෙම කලාපයේ ගංවතුරට ලක්වෙන තැනිතලා ප්‍රදේශයන්හි ඇති ඉඩම්වල පැවති වගාවන් කෙරෙහි හිතකර වන්නට ඇත.නොඑසේනම් මෙම ප්‍රදේශ මෙම මාසය තුළ සාමාන්‍යයෙන් පවතින කාලගුණික තත්වයන් යටතේ ගංවතුරට ගොදුරු වේ.

මැදරට තෙත් කලාපය

පේරාදෙණිය (WM2b)

2010/2011 මහ කන්නයේදී මෙම කලාපයට ලැබුණු සමුච්චිත වර්ෂාපතනය මි.මී.1951ක් පමණ වූ අතර එය දිගු කාලීන සාමාන්‍යය සමග සසඳා බලන විට 100%කටද අධික වැඩිවීමකි. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතුවන්නට ඇත්තේ නොවැම්බර් සිට පෙබරවාරි දක්වා වූ කාල පරිච්ඡේදයේදී සාමාන්‍ය පරිදි ලද වර්ෂාවයි. සාමාන්‍යයෙන් වියළි වන ජනවාරි සහ පෙබරවාරි යන මාසවලදී වර්ෂාපතනයේ වැඩිවීම 300%ද ඉක්මවා ගිය අතර ඒ හේතුවෙන් ස්ථාන කිහිපයක විපත් ඇතිවිය.විශේෂයෙන්ම ශාක පලතුරු බෝගවල මල් හට ගැනීම සඳහා යෝග්‍ය තත්වයක් ඇතිවීම වළකාලමින් මෙම අසාමාන්‍ය කාලගුණික තත්වයන් මෙම කලාපයේ බෝග නිෂ්පාදනය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය. එසේවුවද, 2011 යල කන්නයේදී මෙම කලාපයට ලද සමුච්චිත වර්ෂාපතනය 50%කටද වඩා අඩුවිය. කලාපයට බලපෑ නිරිතදිග මෝසම් තත්වය දුර්වල වීම මත මැයි-ජූලි දක්වා වන කාල පරිච්ඡේදයේදී අපේක්ෂිත වැසි නොලැබී යාම මෙයට හේතුවිය. ජූනි සහ ජූලි යන මාස 2හි සමුච්චිත වර්ෂාපතනය වායුගෝලීය වාෂ්පීකරණ ඉල්ලුම සපුරාලීමට තරම්වත් ප්‍රමාණවත් නොවූ අතර එය මෙම මාස තුළ මෙම කලාපයේදී අත් විඳීමට ලැබෙන දුර්ලභ කෘෂි කාලගුණික සංසිද්ධියකි. කෙසේවුවද, ප්‍රදේශයේ වියළි කාලගුණික තත්වයන් පැවතියද, විශේෂයෙන්ම උෂ්ණත්වය ඇතුළු ප්‍රදේශයෙන්ම වාර්තා වූ වෙනත් කෘෂි කාලගුණික පරාමිතියන් සීමාන්තික ඉහළ අගයන් දක්වා නොගොස් බෝග වර්ධනය සඳහා හිතකර මට්ටමින් පැවතිණි.

උඩරට තෙත් කලාපය

සීතා එළිය (WU3)

2010/2011 මහ කන්නයේදී මෙම කලාපයට ලැබුණු සමුච්චිත වර්ෂාපතනය මි.මී. 1,469ක් පමණ වූ අතර එය දිගු කාලීන සාමාන්‍ය සමග සසඳා බැලූවිට 37%කටද අධික වැඩිවීමකි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ නොවැම්බර් සිට පෙබරවාරි දක්වා වන කාලපරිච්ඡේදය තුළ මධ්‍යම කඳුකරයට සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා වැසි ලැබීමයි. ජනවාරි සහ පෙබරවාරි මාසවල සමුච්චිත වර්ෂාපතනයේ වර්ධනය පිළිවෙළින් 100% හා 200%ක් පමණ විය. කන්නයේ අවසන් භාගයේ පැවති අධික වැසි සහිත කාලගුණික තත්වය මෙම කලාපයේ සිදු කරන

උඩරට එළවළු වගාවෙහි ප්‍රමාණාත්මක සහ ගුණාත්මක මට්ටම කෙරෙහි බලපාන්නට ඇත.කන්නයේ උපරිම උෂ්ණත්වය සෙ. 14^0- සෙ. 23° අතර පරාසයක පැවතිණි.

2011 යල කන්නය තුළ මෙම කලාපයේ සමුච්චිත වර්ෂාපතනය මි.මී. 460ක් වූ අතර එය දිගු කාලීන සාමාන්‍යයට වඩා 40%ක පමණ අඩුවීමකි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ කලාපයට බලපෑ නිරිතදිග මෝසම් තත්වය දුර්වලවීම මත මැයි සිට අගෝස්තු දක්වා වූ කාල පරිච්ඡේදයේදී සාමාන්‍ය ප්‍රමාණයට වඩා අඩුවෙන් වැසි ලැබීමයි. ජූනි සහ ජූලි මාසවල සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනය මුළු වර්ෂාපතනය ඉක්ම වූ අතර අගෝස්තු මාසයේදී ලද වර්ෂාපතනය එම වායුගෝලීය අවශ්‍යතාව යන්තමින් සපුරාලීමට සමත් විය. මෙය, මැදරට තෙත් කලාපයේදීසේම මෙම කලාපයේදීද ඉතාමත් කලාතුරකින් අත්විඳීමට ලැබෙන කෘෂිකාලගුණික සංසිද්ධියකි.මෙම කලාපයේ උපරිම උෂ්ණත්වය සෙ. 16° - 23° අතර පරාසයක පැවති අතර අවම උෂ්ණත්වය සෙ.8° - 17° අතර පරාසයක පැවතිණි.

පහතරට අතර මැදි කලාපය

බතලගොඩ (IL1a)

හිතකර මාසික ව්‍යාප්තියක් සහිත 2010/2011 මහ කන්නයේ සමුච්චිත වර්ෂාපතනය එහි දිගුකාලීන සාමාන්‍යය සමග සසඳා බැලූ කල 68%ක පමණ වර්ධනයක් පෙන්වන අතර කන්නය පුරාම විභව වාෂ්පීකරණ උත්ස්වේදනය ඉක්මවිය.එසේ වුවද, දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා වූ කාලයේ අහස වලාකුළින් බරව පැවතීම මෙම කලාපයේ සිදු කළ වී වගාවේ ධාන්‍ය ඇට පිරීම (grain filling) කෙරෙහි බලපෑමක් ඇති කරන්නට ඇත.

2011 යල කන්නයේදී මෙම කලාපයට සාමාන්‍ය ප්‍රමාණයට ආසන්න මි.මී. 697ක සමුච්චිත වර්ෂාපතනයක් ලැබිණි. අප්‍රේල් මාසයේදී ලද ඉහළ වර්ෂාපතනය මෙම තත්වයට ප්‍රධානවශයෙන්ම හේතුවිය. ජූනි සහ ජූලි මාසවල මෙම කලාපයට බලපෑ දුර්වල නිරිතදිග මෝසම් ප්‍රවාහය හේතුවෙන් ලැබුණු වර්ෂාපතනය අපේක්ෂිත ප්‍රමාණයට වඩා අඩුවිය. සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනය අප්‍රේල් මාසයේදී හැරුණු විට කන්නයේ එක් එක් මාසයේදී සමුච්චිත වර්ෂාපතනයට වඩා වැඩිවිය. එමනිසා, වර්ෂාපෝෂිතව වගා කළ බෝග නියත වශයෙන්ම පාංශු තෙතමනය පිළිබඳ අහිතකර තත්වයන්ට ලක්වන්නට ඇත. එමෙන්ම කලාපයේ කුඩා වැව්වල රැඳි ජල ප්‍රමාණය කන්නය පුරාම අදාළ සමස්ත ප්‍රදේශයටම ජලය සම්පාදනය කිරීමට තරම් ප්‍රමාණවත් නොවන්නට ඇත. එමනිසා මෙම කන්නය තුළ සමහර ස්ථානවල වූ වී වගාවන්ට නියගය හේතුවෙන් හානි සිදුවීම හෝ බෝගය මුළුමනින්ම විනාශ වී යාම සුලභ ලක්ෂණයක් වන්නට ඇත.

පහත රට අතර මැදි කලාපය

මොණරාගල (IL1c)

නොවැම්බර්, ජනවාරි හා පෙබරවාරි මාසවලදී සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා වර්ෂාව ලැබීම හේතුවෙන්2010/2011 මහ කන්නයේ සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍යයට වඩා 22%කින් වැඩි විය. කෙසේ වුවද, ඔක්තෝබර් මාසයේදී ලැබුණු වර්ෂාපතනය අපේක්ෂිත ප්‍රමාණයට වඩා 40%කින් අඩු වූ අතර ඒ හේතුවෙන් කන්නය ප්‍රමාද විය.නමුත් නොවැම්බර් මාසයේදී මනා වර්ෂාවක් ලැබීමේ හේතුවෙන් එම අඩුව පිරිමැසුණු අතර කන්නයේ වගා කටයුතු ඉදිරියට කරගෙන යාමට හැකිවිය. වර්ෂාපෝෂිතව වගා කෙරෙන ගොඩබිම් බෝග සඳහා හිතකර පාංශු තෙතමන තත්වයන් ඇති කරමින් විභව වාෂ්පීකරණ උත්ස්වේදනය කන්නයේ සෑම මාසයකම වර්ෂාපතනයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවතිණි.කන්නය තුළ අනෙකුත් කෘෂි කාලගුණික පරාමිතියන්හි තත්වයද මනා බෝග වර්ධනයකට හිතකර මට්ටමින් පැවතිණි. පැඟිරි,උක් සහ අනෙකුත් පලතුරු බෝග කෙරෙහි හිතකර තත්වයක් ඇති කරමින් රාත්‍රී කාලයේ අවම උෂ්ණත්වය, පහතරට අතරමැදි සහ වියළි කලාපයේ අනෙකුත් කොටස්වල පැවති තත්වය සමග සසඳා බලන කල සාපේක්ෂව අඩු අගයන්හි පැවතිණි.

මෙම කලාපයේ 2011 යල කන්නය තුළ ලද සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය සමග සසඳා බලනවිට 14%ක පමණ වර්ධනයක් පෙන්වීය. මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන්ම හේතුවූයේ මාර්තු සහ අප්‍රේල් මාසවලදී පළමු අන්තර් මෝසම් වැසි ඉතා ඉහළ මට්ටමකින් ක්‍රියාකාරිවීමයි. මෙම තත්වය මෙම කලාපයේ වැව් වල ජල මට්ටම කෙරෙහි හිතකර අයුරින් බලපාන්නට ඇත. කන්නයේ ඉතිරි කොටස් තුළ ලද වර්ෂාපතනය සාමාන්‍ය ප්‍රමාණයට ආසන්න විය. එසේ වුවද, මාර්තු සහ අප්‍රේල් මාසවලදී හැරුණු විට කන්නයේ අනෙකුත් මාසවල සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනය වර්ෂාපතනයට වඩා වැඩිවිය.එමනිසා, අතිරේක ජල සම්පාදනයක් නොමැතිව ගොඩබිම් බෝග වගා කිරීම අපහසු වන්නට ඇත. කෙසේවුවද, යල කන්නයේ වගා කරන බෝගවල ක්‍රියාකාරී වර්ධන අදියර තුළ මෙම කලාපයට මනාව පැතිරුණු වර්ෂාවක් ලැබීම

කලාතුරකින් සිදු වන්නක් හෙයින් මෙය මෙම කලාපය තුළ අසාමාන්‍ය කාලගුණ තත්වයක් ලෙස සැලකිය නොහැකිය.

ගිරාඳුරුකෝට්ටේ (IL2)

කන්නයේ එක් එක් මාසය තුළ මි.මී. 100ට වැඩි වර්ෂාපතනයක් ලැබීම නිසා 2010/2011 මහ කන්නයේ වර්ෂාපතනය සාමාන්‍ය ප්‍රමාණයට වඩා 33%කින් වැඩිවිය. ජනවාරි සහ පෙබරවාරි යන මාස දෙකේදීම පිළිවෙළින් මි.මී. 800ක් හා මි.මී. 350ක් වශයෙන් ලද වර්ෂාපතනය අපේක්ෂිත අගයන්ට වඩා බෙහෙවින් වැඩිවිය. මෙම තත්වය වී බෝගය පරිණතවීමට ඉවහල් වන ප්‍රභා සංශ්ලේෂණය ඇති කරන කිරණ පතිතවීම වළකා පසුව අස්වනු අඩුවීමකට මග පාදන්නට ඇත.

2011 යල කන්නයේ සමුච්චිත වර්ෂාපතනය මි.මී. 354ක් පමණ වු අතර එය එහි දිගු කාලීන සාමාන්‍යය සමග සසඳා බැලූ විට 24%ක පමණ අඩු වීමකි. මාර්තු සහ අප්‍රේල් මාසවලදී හැරුණු විට කන්නයේ අනෙකුත් සියලුම මාසවල ලද වර්ෂාපතනය වායුගෝලීය ජල ඉල්ලුමට වඩා බෙහෙවින් අඩුවූ අතර ඒ හේතුවෙන් වර්ෂාපෝෂිතව වගා කළ ගොඩබිම් බෝග කෙරෙහි පාංශු තෙතමනය අඩුවීමේ අහිතකර තත්වයන් ඇතිවිය. සාමාන්‍ය කාලගුණික තත්වයක් යටතේ මෙම කලාපයේ වර්ෂාපෝෂිත යල කන්නයක් සාමාන්‍යයෙන් නොපවතී.එය මෙම කන්නය සම්බන්ධයෙන්ද සැබෑවිය.

මැදරට අතරමැදි කලාපය

කුණ්ඩසාලේ (IM3a)

2010 /2011 මහ කන්නයේ මනා ව්‍යාප්තියක් පැවති සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍යයට වඩා වැඩිවිය.මෙම කලාපයෙන් වාර්තාවූ විභව වාෂ්පීකරණ උත්ස්වේදනය අගයන් තුළින් මෙහි වගා කරන බෝග කෙරෙහි අහිතකර පාංශු තෙතමන තත්වයක් ඇතිවීමේ ඉඩක් නොමැති බව අනාවරණය වී ඇත.කෙසේ වුවද, නොවැම්බර් සහ දෙසැම්බර් මාස තුළ පැවති වලාකුළෙන් බර අහස, සාපේක්ෂ වශයෙන් ඉහළ ආර්ද්‍රතා තත්වයන් සහ අඩු උෂ්ණත්ව ව්‍යාප්තිය ව්‍යාධිජනක වර්ධනයට හිතකර පරිසරයක් බිහි කරන්නට ඇත.

මෙයට වඩා වෙනස් තත්වයක් ඇති කරමින් මැයි සිට අගෝස්තු දක්වා වූ මාස තුළ වර්ෂාව අඩුවීම හේතුවෙන් 2011 යල කන්නයේ වර්ෂාපතන ව්‍යාප්තියේ ස්වාභාවය කිසිදු වර්ෂාපෝෂිත බෝගයක් වගා කිරීමට හිතකර නොවිය. සමුච්චිත කන්නමය වර්ෂාපතනය මි.මී. 285ක් වූ අතර ඉන් 40%කට වැඩි ප්‍රමාණයක් ලැබුණේ අප්‍රේල් මාසය තුළය. විභව වාෂ්පීකරණ උත්ස්වේදනයට වඩා ලැබුණු වර්ෂාපතනය වැඩි වූයේ කන්නයේ මාර්තු සහ අප්‍රේල් යන මාස දෙකේදී පමණි. එමනිසා අතිරේක ජල සම්පාදනයක් නොමැතිව සාර්ථක අයුරින් ගොඩබිම් බෝග වර්ෂාපෝෂිතව වගා කිරීම අපහසු වන්නට ඇත.

උඩරට අතරමැදි කලාපය

බණ්ඩාරවෙල (IU3C)

මධ්‍යම කඳුකරයේ අනෙකුත් කොටස්වලට මෙන්ම මෙම කලාපයටද 2010/2011 මහ කන්නයේදී සාමාන්‍ය ප්‍රමාණය ඉක්ම වූ වර්ෂාපතනයක් ලැබිණි. මි.මී. 1,545ක් වූ සමුච්චිත කන්නමය වර්ෂාපතනය එහි දිගුකාලීන සාමාන්‍ය සමග සසඳා බැලූ කල 52%ක පමණ වර්ධනයක් පෙන්විය.විභව වාෂ්පීකරණ උත්ස්වේදනය කන්නයේ එක් එක් මාසයේ වර්ෂාපතනයට වඩා බෙහෙවින් අඩුවිය.මේ අතර ජනවාරි හා පෙබරවාරි මාසවල වර්ෂා කාලගුණයත් සමග අහස වලාකුළින් බරවීම, අඩු උෂ්ණත්වය සහ ඉහළආර්ද්‍රතාව ඉහළ මට්ටමින් පැළෑටි රෝග ඇතිකිරීමට ඉවහල් වන්නට ඇත.මෙම කන්නයේ උපරිම උෂ්ණත්වය සෙ. 18° - 30° අතර පරාසයකද අවම උෂ්ණත්වය සෙ.07° - 19° අතර පරාසයකද පැවතිණි.

2011 යල කන්නයේ සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍යයට වඩා 9%කින් අඩු විය.ප්‍රදේශය තුළ සංවහන ක්‍රියාකාරීත්වය වර්ධනය වීමේ හේතුවෙන් මාර්තු සහ අප්‍රේල් මාසවල මැනවින් වර්ෂාව ලැබුණු නමුත් මැයි සිට අගෝස්තු දක්වා අපේක්ෂිත මට්ටමේ වර්ෂාපතනයක් නොලැබුණි. කන්නයේ 2වන භාගය පුරාම විභව වාෂ්පීකරණ උත්ස්වේදන අගයන් ලද වර්ෂාපතනයට වඩා බෙහෙවින් අඩු වූ අතර අතිරේක ජල සම්පාදනයක් නොකළේ නම් පාංශු තෙතමනය පිළිබඳ අහිතකර තත්වයන් ඇතිවීමේ ඉඩකඩ පැවතිණි. එසේ වුවද, මෙම කාල පරිච්ඡේදය තුළ පැවති වායුගෝලීය ජල ඉල්ලුම හා ලැබුණු වර්ෂාපතනය අනුව කන්නයේ මෙම කාලය තුළ ජල සම්පාදනය සඳහා ප්‍රදේශයේ උල්පත්වලින් ජලය ලැබීම ගැටලුවක් වන්නට ඇත. කන්නය තුළ උපරිම උෂ්ණත්වය සෙ. 21° - 30° දක්වා පරාසයකද අවම උෂ්ණත්වය සෙ 10° - 19° අතර පරාසයකද පැවතිණි.

වියළි කලාපය

මහ ඉලුප්පල්ලම (DL1b)

DL1bනමැති කෘෂි පාරිසරික කලාපයේ උතුරු මැද කොටසකට මහ කන්නයේදී මි.මී.1,524ක සමුච්චිත වර්ෂාපතනයක් ලැබුණු අතර එය දිගු කාලීන සාමාන්‍යය සමග සසඳා බැලූ විට 60%ක පමණ වැඩිවීමකි. ඔක්තෝබර් මාසයේදී මෙම කලාපයට සාපේක්ෂව අඩු වර්ෂාවක් ලැබුණු අතර නොවැම්බර් හා දෙසැම්බර් මාසවලදී එම තත්වය තුලනය වීමෙන් කන්නය ප්‍රමාද වී ආරම්භ කිරීමට හැකිවිය.විභවවාෂ්පීකරණ උත්ස්වේදන අගයන් ඔක්තෝබර්ද ඇතුළු කන්නයේ එක් එක් මාසයේ ලද වර්ෂාපතනයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවතිණි. එසේවුවද, දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා වූ කාල පරිච්ඡේදයේදී ලද ඉහළ වර්ෂාපතනය අහස වලාකුළින් පිරි තත්වයක් නිර්මාණය කර වැඩි වශයෙන් පැළෑටි රෝග ඇති කිරීමට හේතුකාරක වන්නට ඇත. එමෙන්ම, කලාපයේ වගා කළ වී සහ අනෙකුත් ධාන්‍ය වර්ගවල ධාන්‍ය ඇට පිරීයාම (grain filling) කෙරෙහි බලපෑමක් ඇති කරන්නටද ඇත.

2011 යල කන්නයේ ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 392ක් වූ එහි දිගු කාලීන සාමාන්‍යය සමග සසඳා බැලූ විට 14%ක අඩුවීමක් පෙන්වයි. මාර්තු මාසයේදී අන්තර් මෝසම් කාලගුණික තත්වයන් ස්ථාපිත වීමේ ප්‍රමාදයක් ඇතිවීම මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වන්නට ඇත. සුපුරුදු අයුරින්, කන්නය තුළ විභව වාෂ්පීකරණ උත්ස්වේදනය ඉක්මවූ වර්ෂාපතනයක් ලැබුයේ අප්‍රේල් මාසයේදී පමණි. කන්නයේ ඉතිරි කොටස පුරාම වියළි උණුසුම් සුළං තත්වයන් පැවති අතර එය වසරේ මෙම කාලය තුළ මෙම කලාපයට සාමාන්‍ය තත්වයකි.

අඟුණකොළපැලැස්ස (DL1b)

2010/2011 මහ කන්නයේදී DL1b කෘෂි පාරිසරික කලාපයේ දකුණු කොටසට ලද වර්ෂාපතනය එහි සාමාන්‍ය සමුච්චිත වර්ෂාපතනයට වඩා 16%ක් පමණ වැඩිවිය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා කාලය තුළ සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා වැසි ලැබීමයි. ඔක්තෝබර් මාසයේදී ලද වර්ෂාපතනය මි.මී. 74ක් පමණක් වූ අතර එය එහි දිගු කාලීන සාමාන්‍යය සමග සසඳා බැලූ විට 50%ක පමණ අඩුවීමකි. වියළි කලාපයේ අනෙකුත් කොටස්වලදී සිදුවූවා සේම මෙම කලාපයටද නොවැම්බර් මාසයේදී මැනවින් වැසි ලැබීම නිසා වගා කන්නය ප්‍රමාද වී හෝ ආරම්භ කිරීමට හැකිවිය. නොවැම්බර් මාසයේදී කන්නය ආරම්භ කළ පසු සමුච්චිත මාසික විභව වාෂ්පීකරණ උත්ස්වේදනය එක් එක් මාසයේ ලද වර්ෂාපතනයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවතිණි. එමනිසා, මෙම කලාපයේ වගා කළ කෙටි කාලීන ගොඩබිම් බෝග අභිතකර පාංශු තෙතමන තත්වයන්හි බලපෑමට ගොදුරු නොවන්නට ඇත. විශේෂයෙන්ම පෙබරවාරි මාසය ඇතුළුව කන්නයේ අග භාගයේදී ලද ඉහළ වර්ෂාපතනය වියළි කලාපයේ උතුරු මැද කොටසට තරම් තීව්‍රව නොලැබිණි. එමනිසා, එවැනි අසාමාන්‍ය කාලගුණික තත්වයක ඍණාත්මක බලඵලය DL1bකලාපයේ ඉතිරි කොටස සමග සසඳා බැලූ විට මෙම කලාපයට එතරම් තදින් නොදැනෙන්නට ඇත.

මි.මී. 489ක් වූ මෙම කලාපයේ 2011 යල කන්න සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍යයට බොහෝසෙයින්ම සමාන වූ අතර ඒ සඳහා අප්‍රේල් සහ අගෝස්තු මාස තුළ ලද වර්ෂාවෙන් සැලකිය යුතු දායකත්වයක් ලැබිණි. කෙසේවුවද, කන්නයේ ඉතිරි මාස තුළ විභව වාෂ්පීකරණ උත්ස්වේදනය මාසික වර්ෂාපතනයට වඩා ඉහළ මට්ටමක පැවතිණි. එහෙයින් අතිරේක ජල සම්පාදනයක් නොකළේ නම් වර්ෂාපෝෂිතව වගා කළ ගොඩබිම් බෝග ඒවායෙහි පරිණත අවධියේදී අභිතකර පාංශු තෙතමන තත්වයන්හි බලපෑමට ලක්වන්නට ඇත.

අරලගංවිල (DL2b)

වියළි කලාපයේ නැගෙනහිර කොටසෙහි පිහිටි මෙම කලාපයට හිතකර ව්‍යාප්තියක් සහිත සාමාන්‍ය ප්‍රමාණය ඉක්ම වූ වර්ෂාපතනයක් ලැබිණි.වායුගෝලයේ වාෂ්පීකරණ ඉල්ලුම කන්නයේ එක් එක් මාසයේ සමුච්චිත වර්ෂාපතනයට වඩා අඩු මට්ටමක පැවතිණි.එමනිසා උස්බිම්වල වගාකළ බෝග සඳහා අභිතකර පාංශු තෙතමන තත්වයන් වර්ධනය වීමේ ඉඩකඩ බෙහෙවින්ම අඩු විය.

කෙසේ වුවද, කන්නයේ අවසන් මාස 3 තුළ ලද අධික වර්ෂාපතනය(ඒ ඒ මාසයේ මි.මී. 500ද ඉක්මවූ) නිසා ගංවතුර, ජලවහන ගැටලු, හිරු කිරණ පතිතවීම සිමිතවීම, ඉහළ මට්ටමින් ව්‍යාධිජනක පැතිරීම සහ අස්වනු නෙළීමේ කටයුතු වලට බාධා පැමිණීම වැනිතත්වයන් ඇති වීම කලාපයේ බෝග නිෂ්පාදනය කෙරෙහි අහිතකර අයුරින් බලපාන්නට ඇත.

සුපුරුදු පරිදි, මෙම ප්‍රදේශයට යල කන්නයේදී ලැබුණු වර්ෂාව අප්‍රේල් මාසයේදී සාමාන්‍යයෙන් ලැබෙන සංවහන ස්වරූපයේ වර්ෂාවට සීමාවිණි. කන්නයේ ඉතිරි කොටස දිවා කාලයේ දැඩි උෂ්ණත්වයක් සහ තද සුළං සහිත අතිශයින්ම වියළි ස්වභාවයෙන් යුතු වූ අතර එය යල කන්නය

තුළ මෙම කලාපයේ සාමාන්‍යයෙන් පවතින කාලගුණ රටාවයි. සාමාන්‍ය කාලගුණ රටාවක් යටතේ මෙම කලාපය තුළ යල කන්නයක් බොහෝවිට නොපවතී. එය මෙම කන්නය සම්බන්ධයෙන්ද සැබෑවිය.

වීරවිල (DL5)

වියළි කලාපයේ අනෙකුත් කොටස්වලදී මෙන්ම මෙම කලාපයේද මහ කන්න වර්ෂා ආරම්භය නොවැම්බර් මුල දක්වා ප්‍රමාද වූ නමුත් ඉන් අනතුරුව, පෙබරවාරි මුල දක්වා අඛණ්ඩව, හිතකර ව්‍යාප්තියක් සහිතව මනා වර්ෂාවක් ලැබිණි. මි.මී. 915ක් වූ වාර්තාගත සමුච්චිත කන්නමය වර්ෂාපතනය මි.මී. 772ක් වන දිගු කාලීන සාමාන්‍යය සමඟ සසඳ, බලන කල 18%ක පමණ වර්ධනයක් පෙන්වයි. කන්නයේ එක් එක් මාසයේ සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනය සැප්තැම්බර් සහ ඔක්තෝබර් හැරුණු විට අනෙකුත් එක් එක් මාසයේ සමුච්චිත වර්ෂාපතනයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පැවතිණි. එම නිසා දිවයිනේ වියළිතම කලාපය වුවද මෙම කලාපයේ වගා කළ බෝගවලට අහිතකර පාංශු තෙතමන තත්වයන් හේතුවෙන් සැලකිය යුතු හානි ඇති නොවන්නට ඇත.

එනමුත්, මෙම කලාපයට ලද යල කන්න වර්ෂාපතනයේ ප්‍රමාණය සහ ව්‍යාප්තිය සාර්ථක බෝග වගාවකට හිතකර නොවීය. මෙම කන්නයේ සමුච්චිත වර්ෂාපතනය මි.මී. 236ක් වූ අතර එය එහි දිගු කාලීන සාමාන්‍යය සමඟ සසඳ, බලන කල 26%ක අඩුවීමකි. අප්‍රේල්ද ඇතුළු කන්නයේ කිසිදු මාසයක් තෙත් මාසයක් වශයෙන් නම් කිරීමට අවශ්‍ය මි.මී. 100 අවම වර්ෂාපතන අගය වාර්තා කිරීමට අසමත් විය. කන්නයේ එක් එක් මාසයේ සමුච්චිත විභව වාෂ්පීකරණය සමුච්චිත වර්ෂාපතනයට වඩා බෙහෙවින් වැඩිවිය. කන්නය පුරාම දැඩි හිරු කිරණ සහ වේගවත් සුළංද සමගින් ඉහළ උෂ්ණත්වයක් පැවතිණි. කෙසේ වුවද, දිවයිනේ වියළිතම කලාපය වීමේ හේතුවෙන් මෙය, වසරේ මෙම කාලය තුළ මෙම කලාපයට අසාමාන්‍ය කාලගුණික තත්වයක් නොවේ.

වගු අංක 1.1: 2010 /2011 මහ සහ 2011 යල කන්නවල ලද මුළු වර්ෂාපතනය(මි.මී.)

කෘෂි කාලගුණික ස්ථානය	කෘෂි පාරිසරික කලාපය	2010/11 මහ (සැප්.- පෙබ.)	මහ කන්නයේ දස වසරක සාමාන්‍යය (2000-2009)	2011 යල (මාර්තු - අගෝස්තු)	යල කන්නයේ දස වසරක සාමාන්‍යය (2000-2009)
බෝඹුවල	WL_{1b}	1838.1	1516.5	1520.6	1454.8
පේරාදෙණිය	WM_{2b}	1951.4	963.4	595.3	928.1
සීතා එළිය	WU_3	1468.8	1070.2	459.9	776.5
බතලගොඩ	IL_{1a}	1739.7	1033.8	697.1	692.3
මාකඳුර	IL_{1a}	1279.8	1048.5	705.5	921.4
මොණරාගල	IL_{1c}	1528.2	1250.6	665.6	582.5
ගිරාඳුරුකෝට්ටේ	IL_2	2209.8	1657.6	353.6	461.0
කුණ්ඩසාලේ	IM_{3a}	1476.7	808.6	284.9	599.7
බණ්ඩාරවෙල	IU_{3c}	1545.4	1018.1	560.3	615.8
මහ ඉලුප්පල්ලම	DL_{1b}	1524.0	956.6	337.9	392.2
අඟුණාකොළපැලැස්ස	DL_{1b}	855.2	734.2	489.4	438.6
අරලගංවිල	DL_{2b}	2390.1	1478.6	324.4	395.9
වීරවිල	DL_5	914.8	772.4	236.3	317.7

වගු අංක 1.2. මුළු මාසික වර්ෂාපතනය - 2010/2011 (මි.මී)

කෘෂි කාලගුණික මධ්‍යස්ථානය	2010				2011							
	සැප්.	**ඔක්.**	**නොවැ.**	**දෙසැ.**	**ජන.**	**පෙබ.**	**මාර්තු**	**අප්‍රේල්**	**මැයි**	**ජූනි**	**ජූලි**	**අගෝ.**
බෝඹුවල	390.4	284.6	678.2	259.3	132.2	93.4	237.7	382.4	412.2	155.9	131.4	201.0
පේරාදෙණිය	122.8	245.9	560.9	408.9	354.7	258.2	75.7	243.7	87.5	56.1	58.2	74.1
සීතා එළිය	178.0	184.8	329.9	213.0	337.0	226.1	102.5	153.9	78.5	36.6	47.2	41.2
බතලගොඩ	149.3	237.8	574.2	361.9	236.3	180.2	58.6	418.7	84.1	49.4	19.0	67.3
මාකඳුර	209.6	162.0	568.8	255.3	46.2	37.9	18.5	217.4	171.0	116.5	33.8	148.3
මොණරාගල	188.6	173.3	491.5	138.7	290.8	245.3	207.9	300.9	67.0	11.8	66.1	11.9
ගිරාඳුරුකෝට්ටේ	112.5	161.3	280.2	469.6	807.6	378.6	165.6	125.0	32.2	0.0	5.7	25.1
කුණ්ඩසාලේ	88.1	145.6	391.4	308.1	280.8	262.7	15.7	165.0	51.1	15.9	24.2	13.0
බණ්ඩාරවෙල	177.1	141.4	345.0	277.9	298.8	305.2	207.5	204.9	90.7	8.0	23.4	25.8
මහ ඉලුප්පල්ලම	204.4	187.7	301.1	254.5	304.3	272.0	42.1	238.1	47.5	4.0	2.4	3.8
අඟුණාකොළපැලැස්ස	42.1	73.7	214.0	233.8	191.0	100.6	125.8	135.6	64.0	9.3	17.4	137.3
අරලගංවිල	112.2	127.6	383.0	539.1	660.8	567.4	72.2	142.7	60.3	0.0	9.4	39.8
වීරවිල	38.9	40.1	230.7	276.6	235.5	93.0	69.1	61.6	0.0	2.4	0.0	103.2

වගු අංක 1.3: මාසික සාමාන්‍ය වර්ෂාපතනය (2000- 2009) මි.මී.

කෘෂි කාලගුණික මධ්‍යස්ථානය	මාසය											
	සැප්.	**ඔක්.**	**නොවැ.**	**දෙසැ.**	**ජන.**	**පෙබ.**	**මාර්තු**	**අප්‍රේල්**	**මැයි**	**ජූනි**	**ජූලි**	**අගෝ.**
බෝඹුවල	289.6	468.9	339.8	205.3	141.0	107.9	153.6	266.9	415.9	257.4	168.9	189.0
පේරාදෙණිය	138.8	254.0	272.5	179.7	80.7	59.2	159.0	284.1	118.0	140.3	126.3	100.6
සීතා එළිය	151.5	232.6	262.9	209.9	176.4	76.7	109.1	166.5	141.9	129.4	123.6	105.9
බතලගොඩ	119.3	325.2	285.1	170.9	86.9	74.1	125.0	248.0	85.2	89.5	63.9	80.7
මාකඳුර	186.2	372.5	258.5	102.2	82.9	73.1	153.5	246.9	172.0	158.4	83.9	106.7
මොණරාගල	97.6	288.6	367.4	254.8	180.7	104.0	91.2	246.1	86.8	33.0	51.6	73.8
ගිරාඳුරුකෝට්ටේ	78.5	184.3	447.4	469.2	355.6	163.5	124.6	172.2	47.8	16.6	33.0	67.0
කුණ්ඩසාලේ	80.6	178.8	224.8	183.9	91.3	69.3	124.2	184.5	74.2	80.9	62.0	73.9
බණ්ඩාරවෙල	116.2	285.6	268.3	185.7	132.4	67.4	119.3	215.6	121.0	48.3	46.0	65.6
මහ ඉලුප්පල්ලම	83.9	250.9	280.8	187.4	100.0	87.1	91.9	177.6	51.7	21.7	19.5	29.8
අඟුණාකොළපැලැස්ස	96.0	146.1	239.1	133.1	84.5	58.2	109.8	104.2	79.3	45.8	44.2	55.1
අරලගංවිල	55.3	242.7	405.6	395.7	277.7	138.5	92.5	140.3	49.0	25.2	35.5	53.4
වීරවිල	45.9	158.0	279.9	157.9	95.2	58.6	80.1	120.3	46.3	15.0	16.4	39.5

වගු අංක 1.4 :මාසික විභව වාෂ්පීකරණ උත්ස්වේදනය-2010/11 (මි.මී.)

කෘෂි කාලගුණික මධ්‍යස්ථානය	2010				2011							
	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.	ජන.	පෙබ.	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ.
බෝඹුවල	60.0	76.9	60.0	59.5	62.0	56.0	81.8	88.8	86.8	74.4	69.4	71.9
පේරාදෙණිය	62.4	71.9	55.2	52.1	59.5	67.2	104.2	69.6	79.4	67.2	62.0	62.0
සීතා එළිය	55.2	*	*	32.2	57.0	65.0	71.9	76.8	71.9	69.6	*	47.1
බතලගොඩ	74.4	76.9	62.4	52.1	59.5	65.0	96.7	79.2	99.2	93.6	96.7	94.2
මාකඳුර	79.2	91.8	74.4	81.8	86.8	80.6	79.4	74.4	81.8	86.4	86.8	94.2
මොණරාගල	76.8	89.3	55.2	52.1	54.6	62.7	84.3	79.2	101.7	115.2	96.7	119.0
ගිරාඳුරුකෝට්ටේ	*	84.3	*	*	*	*	81.8	91.2	106.6	*	*	*
කුණ්ඩසාලේ	67.2	74.4	55.2	52.1	52.1	65.0	91.8	81.6	96.7	91.2	91.8	79.4
බණ්ඩාරවෙල	60.0	74.4	45.6	47.1	47.1	51.5	67.0	72.0	86.8	96.0	76.9	86.8
මහ ඉලුප්පල්ලම	74.4	74.4	45.6	37.2	37.2	60.5	74.4	76.8	99.2	103.2	*	114.1
අඟුණාකොළපැලැස්ස	110.4	119.0	79.2	69.4	81.8	78.5	104.2	105.6	124.0	122.4	121.5	111.6
අරලගංවිල	110.4	114.1	67.2	52.1	47.1	62.7	86.8	91.2	121.5	151.2	153.8	156.2
වීරවිල	112.8	116.6	69.6	67.0	67.0	65.0	79.4	79.2	119.0	136.8	138.9	124.0

* - දත්ත නොමැත.

වගු අංක 1.5: උපරිම සහ අවම වායුගෝලීය උෂ්ණත්වය (සෙ.°)-2010/11

කෘෂි කාලගුණික මධ්‍යස්ථානය	2010								2011															
	සැප්.		ඔක්.		නොවැ.		දෙසැ.		ජන.		පෙබ.		මාර්තු		අප්‍රේල්		මැයි		ජූනි		ජූලි		අගෝ.	
	උපරිම	අවම	උපරිම	අවම	උපරිම	අවම	උපරිම	අවම	උපරිම	අවම	උපරිම	අවම	උපරිම	අවම	උපරිම	අවම	උපරිම	අවම	උපරිම	අවම	උපරිම	අවම	උපරිම	අවම
බෝඹුවල	30.1	24.6	30.5	24.4	30.4	23.5	29.9	23.0	29.9	22.3	30.4	23.1	31.5	23.3	31.4	24.4	31.4	25.6	30.9	25.9	30.3	24.9	30.3	24.7
පේරාදෙණිය	29.4	21.1	20.6	29.5	29.5	20.3	27.5	20.0	27.2	18.9	28.8	19.7	19.5	31.4	31.4	20.3	30.6	21.7	29.3	22.1	28.6	22.0	28.6	21.6
සීතා එළිය	*	13.4	19.3	12.8	19.6	12.5	18.0	*	17.7	*	19.3	*	11.7	21.0	21.0	12.0	21.4	13.5	19.5	13.5	18.5	13.5	18.8	13.5
බතලගොඩ	31.2	23.4	30.7	23.2	30.5	22.4	28.1	21.7	27.8	20.1	29.7	21.1	21.6	32.6	32.6	22.6	32.0	23.8	30.9	23.8	30.7	23.2	31.1	23.0
මාකඳුර	32.1	21.8	30.9	24.1	30.8	23.6	29.6	*	30.0	22.6	31.0	22.6	23.6	32.6	32.6	23.4	32.0	24.2	31.4	24.2	31.1	24.3	31.3	23.6
මොණරාගල	33.6	23.2	33.0	22.1	31.3	22.1	28.9	21.9	29.5	20.1	30.5	21.7	20.5	33.0	33.0	22.2	34.3	22.9	35.7	22.1	35.0	22.2	35.7	22.7
හිරාඳුරුකෝට්ටේ	34.6	23.2	33.7	23.1	31.6	23.4	28.8	22.8	27.6	21.4	30.2	22.3	23.0	33.9	33.9	22.6	35.6	24.3	36.5	24.0	35.7	24.1	36.3	23.7
කුණ්ඩසාලේ	29.4	20.4	29.2	19.6	29.1	21.8	27.2	19.5	26.7	17.9	28.5	18.9	19.3	31.4	31.4	22.2	31.3	21.1	30.9	21.4	29.9	21.5	30.4	21.2
බණ්ඩාරවෙල	26.4	16.2	26.7	15.8	24.7	16.0	23.3	16.0	22.6	15.2	24.0	15.2	15.0	26.7	26.7	15.9	27.7	16.4	28.2	15.9	27.4	16.6	27.5	16.7
මහ ඉලුප්පල්ලම	32.1	23.7	31.4	23.5	30.6	22.7	28.2	21.9	28.0	20.7	30.1	21.6	22.0	33.4	33.4	23.2	33.1	24.8	32.9	25.1	32.9	24.8	33.3	24.5
අඟුණාකොළපැලැස්ස	32.5	24.2	33.0	24.1	31.7	23.4	30.8	22.7	30.3	21.9	30.9	22.6	23.1	32.3	32.3	23.8	33.3	25.2	33.4	25.2	33.4	25.0	32.4	24.3
අරලගංවිල	34.6	22.2	34.1	22.8	32.0	22.7	29.3	21.9	28.3	20.5	30.4	21.1	21.0	35.0	35.0	22.5	36.1	23.2	35.3	23.8	34.5	23.9	35.2	23.0
වීරවිල	43.4	24.5	34.0	24.0	32.6	23.5	31.3	23.0	30.0	22.3	31.3	22.8	23.4	33.1	33.1	23.8	34.2	24.9	34.5	24.9	34.7	24.0	33.3	23.4

වගු අංක 1.6: සාපේක්ෂ ආර්ද්‍රතාව(%) - 2010/2011

කෘෂි කාලගුණික මධ්‍යස්ථානය	2010								2011															
	සැප.		ඔක්.		නොවැ.		දෙසැ.		ජන.		පෙබ.		මාර්තු		අප්‍රේල්		මැයි		ජූනි		ජූලි		අගෝ.	
	උදැසන	සවස	උදැසන	සවස	උදැසන	සවස	උදැසන	සවස	උදැසන	සවස	උදැසන	සවස	උදැසන	සවස	උදැසන	සවස	උදැසන	සවස	උදැසන	සවස	උදැසන	සවස	උදැසන	සවස
බෝඹුවල	87	80	82	76	84	79	88	77	86	75	89	81	86	74	84	77	85	78	83	78	86	77	85	78
පේරාදෙණිය	82	77	81	76	90	94	86	81	87	78	87	71	83	71	84	83	87	83	87	81	88	83	90	84
සීතා එලිය	91	89	85	87	85	89	93	94	91	91	82	87	81	86	82	86	87	85	91	88	95	92	90	90
බතලගොඩ	86	77	85	73	90	79	89	81	88	78	89	67	84	60	84	71	84	70	82	73	83	73	83	73
මාකඳුර	81	83	88	84	89	87	90	85	91	83	90	79	85	77	86	79	88	80	85	79	83	76	85	77
මොණරාගල	86	71	84	70	89	88	88	83	88	79	88	74	86	76	88	67	81	74	76	54	81	60	73	58
ගිරාඳුරුකෝට්ටේ	80	67	76	64	90	75	92	77	91	84	91	74	88	64	85	69	81	60	71	53	69	*	74	*
කුණ්ඩසාලේ	78	72	77	69	85	76	86	79	87	76	87	68	82	55	80	71	77	66	74	65	75	64	74	64
බණ්ඩාරවෙල	74	72	68	68	84	83	85	79	89	79	86	73	81	70	77	74	74	72	73	59	69	60	69	61
මහ ඉලුප්පල්ලම	85	66	83	67	91	78	93	82	95	82	93	68	89	55	85	61	82	63	81	62	80	60	77	59
අඟුණකොළපැලැස්ස	79	70	77	91	81	75	85	79	88	78	88	78	85	76	83	78	80	73	79	69	80	60	81	71
අරලගංවිල	71	55	69	62	83	73	87	79	91	79	88	68	83	64	82	69	73	53	61	50	64	51	65	49
වීරවිල	70	62	62	62	80	74	86	78	85	76	87	74	72	71	80	71	76	71	76	63	75	59	78	68

උදෑසන - පැය 8.30ට කියවීම
සවස - පැය 15.30ට කියවීම
*** - දත්ත නොමැත.**

වගු අංක 1.7: හොඳින් හිරු එළිය පැවති පැය ගණන - 2010/11

කෘෂි කාලගුණික මධ්‍යස්ථානය	2010				2011							
	සැප්.	**ඔක්.**	**නොවැ.**	**දෙසැ.**	**ජන.**	**පෙබ.**	**මාර්තු**	**අප්‍රේල්**	**මැයි**	**ජූනි**	**ජූලි**	**අගෝ.**
බෝඹුවල	5.1	7.0	5.6	4.0	5.0	5.6	7.7	6.9	7.4	7.3	6.5	6.7
පේරාදෙණිය	4.2	5.3	3.6	2.0	3.5	4.5	7.0	5.3	6.8	6.1	3.6	4.4
සීතා එළිය	3.3	4.6	2.7	1.1	2.5	3.5	5.0	5.1	6.5	7.6	3.6	5.1
බතලගොඩ	5.5	6.1	4.5	2.9	4.3	5.7	8.4	7.1	8.5	7.5	6.1	7.3
මාකඳුර	*	*	*	*	*	*	*	*	*	*	*	*
මොණරාගල	*	*	*	*	*	*	*	*	*	*	*	*
හිරාඳුරුකෝට්ටේ	5.0	6.7	4.0	*	2.1	4.2	6.3	6.6	7.5	6.8	5.4	7.5
කුණ්ඩසාලේ	4.9	5.2	4.6	4.1	5.0	6.1	7.3	6.3	7.1	5.2	4.7	5.3
බණ්ඩාරවෙල	4.6	5.9	2.9	2.5	3.1	4.6	5.7	6.2	7.1	8.3	5.9	6.7
මහ ඉලුප්පල්ලම	6.2	7.1	4.6	2.7	3.3	6.1	8.2	7.5	9.8	9.2	8.3	9.0
අඟුණාකොළපැලැස්ස	*	*	*	*	*	*	*	*	*	*	*	*
අරලගංවිල	7.2	7.9	5.0	2.8	3.0	5.1	8.0	7.8	9.4	9.5	8.7	9.0
වීරවිල	7.0	8.3	5.4	4.9	5.4	5.6	7.3	7.2	9.1	8.6	7.2	8.1

*** - දත්ත ලැබී නොමැත**

වගු 1.8: සුළඟේ ප්‍රවේගය(පැයට කි.මී.) - (2010/11)

කෘෂි කාලගුණික මධ්‍යස්ථානය	2010				2011							
	සැප්.	**ඔක්.**	**නොවැ.**	**දෙසැ.**	**ජන.**	**පෙබ.**	**මාර්තු**	**අප්‍රේල්**	**මැයි**	**ජූනි**	**ජූලි**	**අගෝ.**
බෝඹුවල	*	4.5	3.1	2.6	2.8	3.2	3.1	3.7	4.5	4.1	3.7	3.8
පේරාදෙණිය	*	*	*	*	*	*	*	*	*	*	*	*
සීතා එළිය	*	*	*	*	*	*	*	*	*	*	*	*
බතලගොඩ	5.8	6.7	3.6	4.1	4.6	4.4	4.0	3.8	6.9	8.3	8.3	8.5
මාකඳුර	5.5	6.3	6.2	4.1	5.2	5.3	4.0	3.9	2.9	4.3	4.2	4.6
මොණරාගල	0.9	1.0	0.9	1.5	1.8	1.8	1.2	1.1	1.4	1.5	1.6	2.8
ගිරාඳුරුකෝට්ටේ	*	*	*	*	*	*	*	*	*	*	*	*
කුණ්ඩසාලේ	*	*	*	*	*	*	*	*	*	*	*	*
බණ්ඩාරවෙල	3.3	4.0	2.4	3.3	3.2	3.1	3.2	3.1	3.1	4.6	4.8	5.1
මහ ඉලුප්පල්ලම	5.6	6.1	2.9	3.4	3.9	3.7	3.3	3.3	6.8	8.6	*	*
අඟුණාකොළපැලැස්ස	5.8	6.2	4.3	3.9	4.3	3.6	4.8	4.2	6.5	6.5	6.8	5.9
අරලගංවිල	3.7	4.5	2.3	2.4	2.9	2.5	2.3	2.3	3.0	5.8	5.6	4.7
වීරවිල	6.8	6.4	2.3	2.5	2.5	2.0	2.0	2.4	5.5	7.5	7.7	7.5

*** - දත්ත ලැබී නොමැත.**

2.1 කෙෂ්ත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, මහ ඉලුප්පල්ලම

මහඉලුප්පල්ලම කෙෂ්ත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය සහ එහි උප මධ්‍යස්ථාන ප්‍රභේද සහ ඒවාට සම්බන්ධ අනෙකුත් තාක්ෂණයන් බිහිකර අදාළ පාර්ශවයන්ට ව්‍යාප්ත කිරීමේ වගකීම දරයි. එයට අමතරව, මෙම ආයතනයට පැවරී ඇති සියලුම බෝගවල මූලික බීජ අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් නිපදවීමේ වගකීමද දරයි. කුළුබඩු (මිරිස් සහ ලූනු), ධාන්‍ය රනිල (මුං,කව්පි, උඳු), තෙල් බෝග (රටකජු, සෝයා බෝංචි, තල සහ සූරියකාන්ත) සහ රළු ධාන්‍ය (බඩඉරිඟු, කුරක්කන්, ඉඳල් ඉරිඟු සහ වෙනත් සුළු ධාන්‍ය වර්ග) කෙෂ්ත්‍ර බෝගවල අන්තර්ගත වේ. මෙම ආයතනය කලාපීය වශයෙන් වැදගත් වී, පලතුරු සහ එළවළුවල ඵලදායිතාව වර්ධනය කිරීම පිණිසද කටයුතු කරයි.

කෙෂ්ත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතන සංකීර්ණයට මහඉලුප්පල්ලම ප්‍රධාන පර්යේෂණ ස්ථානය ද, අඟුණකොළපැලැස්ස ධාන්‍ය රනිල හා තෙල් බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයද අරලගංවිල, කිලිනොච්චිය, තිරුනෙල්වේලි සහ වවුනියාවෙහි පිහිටි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානද ඇතුළත්වේ.

අයවැය

විවිධ වැය ශීර්ෂ සහ ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 2.1.1 හි දැක්වේ.

වගු අංක 2.1.1 වාර්ෂික අයවැය - 2011 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	11,943,000	9,691,416	82
පුනරාවර්තන	27,218,300	24,348,791	90
ව්‍යාපෘති			
'අපි වවමු රට නගමු'	7,375,000	6,179,871	83
කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය වැඩි දියුණු කිරීම	1,740,000	944,570	54
දෙමුහුම් ප්‍රභේද වැඩිදියුණු කිරීම, "සම්පත්" දේශීය දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේදයේ බීජ නිෂ්පාදනය	625,000	565,603	90
ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘති	7,353,400	5,215,501	71
ආදර්ශ ගම්මාන	200,000	130,185	65
එකතුව	**56,454,700**	**47,075,937**	**83**

ප්‍රගතිය

බෝග වැඩි දියුණු කිරීම

කුළුබඩු

මිරිස්

වැඩි අස්වනු ගෙන දෙන එමෙන්ම උසස් තත්ත්වයේ කරල් සහිත සහ පළිබෝධ හා රෝගවලට ප්‍රතිරෝධී/ඔරොත්තු දෙන ප්‍රභේද බිහි කිරීමේ අරමුණ ඇතිව බෝග වැඩි දියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි.

- MICH - 03 සහ MI - වැරනියා - 01 නමැති අමු මිරිස් ප්‍රභේද 2 දීප ව්‍යාප්ත වගාව සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිදහස් කරන ලදී.
- PC - 01 (මඩකලපුව දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය වශයෙන් වගා කරන දේශීය වගා ප්‍රභේදයකින් තෝරාගත් ආරක්) සහ ICPN වරණය 18-7 (ආසියානු එළවළු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ICPN තුළින් තෝරාගත් ආරක්) යන බලාපොරොත්තු තැබිය හැකි මිරිස් ආර 2 මිරිස් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සඳහා නම් කරන ලදී.
- මිරිස්වල මාපිය නුමුහුම් ආර 12 ක් ඒවායෙහි අස්වැන්න සහ අනෙකුත් ශස්‍ය විද්‍යාත්මක ක්‍රියාකාරිත්වයන් මත පදනම්ව දෙමුහුම් අභිජනන වැඩසටහන සඳහා තෝරා ගන්නා ලදී.
- මුහුන් 140 ක් අත්හදා බලා එයින් 6 ක් වැඩිදුර ඇගයීම සඳහා සුදුසු බවට හඳුනා ගන්නා ලදී.

ලූනු

වැඩි අස්වනු ලබාදීම, නිසි ලෙස බීජ ඇතිවීම, පළිබෝධ හා රෝගවලට ප්‍රතිරෝධීවීම සහ ඉහළ කල්තබා ගැනීමේ හැකියාවකින් යුතුවීම යන ලක්ෂණාවලින් සමන්විත ප්‍රභේද බිහි කිරීම පිණිස ලූනු බෝග වැඩි දියුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

- රෙඩ් ස්ටාර් F1 සහ රාවණා යන විදේශීය ලොකු ලූනු ප්‍රභේද 2 ක්ෂේත්‍රයේ ක්‍රියා කරන ආකාරය 2011 යල කන්නයේදී අත්හදා බලන ලදී. දඹුල්ලවරණය නමැති නිර්දේශිත ප්‍රභේදයට (හෙ. 1 කට ටො.25) සහ ගලේවෙල ලයිට්රෙඩ් නමැති වගා ප්‍රභේදයට (හෙ. 1 කට ටො.28) වඩා රාවණා ප්‍රභේදයේ අස්වැන්න (හෙ.1 කට ටො.18) අඩු බව ප්‍රතිඵල මගින් අනාවරණය විය. දේශීය දේශගුණික තත්ත්වයන් යටතේ රෙඩ් ස්ටාර් F1 බල්බ නිපදවීමට අසමත් විය. එම ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා මෙම පරීක්ෂණය 2012 යල කන්නයේදී යළිත් සිදු කෙරෙනු ඇත.
- පසුගිය වර්ෂ 3 තුළ බීජ ඇතිවන පොකුරු ලූනු ආර 7 ක් බිහිකර 2011 යල කන්නයේදී ඒවායෙහි බල්බ අස්වැන්න සම්බන්ධයෙන් ඇගැයීමට ලක් කෙරිණි. වේතාලන් නැමැති සැසඳුම් ප්‍රභේදයට වඩා ආර 3 ක් (MICLO - 09-01, MICLO-10-03 සහ MICLO-10-05 ඉහළ බල්බ අස්වනු ලබාදුණි.
- පැළ සිටුවීමෙන් දින 75 කට පසු MICLO-10-03 හා MICLO-10-6 නමැති ආර 2 කායික විද්‍යාත්මකව පරිණත අවධියට ළඟා වූ අතර එය, පරිණත අවධියට එළඹීමට දින 85-95 අතර කාලයක් ගත් වේතාලන් හා අත්හදා බලන ලද අනෙකුත් ආරට සාපේක්ෂව කලින් පරිණතවීමකි. මෙම ආර සියල්ල ඒවායෙහි සත්‍ය බීජ අස්වැන්න සම්බන්ධයෙන් 2011/12 මහ කන්නයේදී ඇගයීමට ලක් කෙරෙනු ඇත.
- පසුගිය වසර 3 තුළදී තෝරා ගන්නා ලද වැඩි දියුණු කළ නව ලොකු ලූනු ආර 10 ක් බලාපොරොත්තු තැබිය හැකි ආර තෝරා ගැනීම සඳහා 2011 යල කන්නයේදී ඇගයීමට ලක් කරන ලදී. අත්හදා බලන ලද ආර අතරින් පැළ සිටුවීමෙන් පසු දින 90- 105 අතර කාලයකින් පරිණත වූ MIBO-10-02 සහ MIBO-10-03 යන ආර නිර්දේශිත ප්‍රභේදය වූ දඹුල්ල වරණයට (හෙ. 1 කට ටො. 24.5) වඩා වැඩි බල්බ අස්වැන්නක් (හෙක්. 1 කට ටොන් 27-28) ලබාදුණි.MIBO-09-E1 හා MIBO-09-E2 යන ආර 2 පැළ සිටුවීමෙන් දින 80-82 කට පසු කායික විද්‍යාත්මක පරිණත අදියරට පත් වූ අතර, එය දඹුල්ල වරණයට දින 10-12 කට පෙර පරිණතවීමකි. කෙසේ වුවද, එහි අස්වැන්න හෙ. 1 කට ටො. 19-20 ක් වූ අතර, එය දඹුල්ල වරණයට වඩා අඩු ප්‍රමාණයකි.
- මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි රිවර්ස්ටන්හි සිසිල් දේශගුණික තත්ත්වයක් පවතින අතර, එය ප්‍රධාන වශයෙන්ම ලූනු වගා කරන ප්‍රදේශවලට සමීපව පිහිටා ඇත. එමනිසා, ලොකු ලූනු මව් බල්බ වසන්තීකරණය කෙරෙහ රිවර්ස්ටන්හි පවතින දේශගුණික තත්ත්වය බලපාන ආකාරය සොයා ගැනීම පිණිස අධ්‍යයන සිදු කෙරිණි. රිවර්ස්ටන්හි ජනවාරි මුල සිට නොවැම්බර් අවසානය දක්වා පැවති සෙ.18.5^0 - 19.6^0 අතර අගයක වූ උෂ්ණත්වය ලොකු ලූනු වගාව සඳහා හිතකර විය.

රළු ධාන්‍ය

බඩ ඉරිඟු

උසස් තත්ත්වයේ බීජ සහ අහිතකර අපේව සහ පේව තත්වයන්ට ප්‍රතිරෝධිතාවක් සහිත වැඩි අස්වනු ගෙන දෙන ප්‍රභේද බිහි කිරීම පිණිස බඩඉරිඟු බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

- KH 74, KH 76 සහ KH 157 නමැති බලාපොරොත්තු තැබිය හැකි උසස් තත්ත්වයේ ප්‍රෝටීන් බඩඉරිඟු දෙමුහුම් 3 ක් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් තුළ ඇගයීමට ලක් කෙරිණි. බලාපොරොත්තු තැබිය හැකි මෙම දෙමුහුම් තුළ 4% ක පමණ ලයිසීන්ද 1% ක පමණ ට්‍රිප්ටොපන්ද අන්තර්ගත වන අතර, එම ප්‍රමාණයන් සාමාන්‍ය බඩඉරිඟුවල අන්තර්ගත ප්‍රමාණයට වඩා 3-4 ගුණයකින් වැඩිවීමකි. එහි වාර්තාගත සාමාන්‍ය අස්වැන්න හෙ. 1 කට ටොන් 4.5-5.5 ක් පමණ විය.

- දේශීය නුමුහුන් බඩඉරිඟු ආර සහ CIMMYT නුමුහුම් බඩඉරිඟු ආර යොදා ගනිමින් බිහිකළ බලාපොරොත්තු තැබිය හැකි බඩඉරිඟු දෙමුහුම් 7 ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සඳහා තෝරා ගැනිණි. මෙම දෙමුහුම් හෙ. 1 කට ටො. 4.5-5.5 අතර සාමාන්‍ය අස්වැන්නක් ලබාදුණි.

- විදේශීය දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේද 18 ක් දේශීය තත්ත්වයන්ට අනුවර්තනය කරගත හැකි ආකාරය සම්බන්ධයෙන් අත්හදා බලන ලදී. සම්පත් නැමැති දේශීය දෙමුහුම් ප්‍රභේදයට සාපේක්ෂව හෙ.1 කට ටො. 5.5-6.5 අතර සැලකිය යුතු අයුරින් ඉහළ හෝ එයට සමාන අස්වනු ලබාදීමට මෙම විදේශීය දෙමුහුම් සමත් වූ අතර දේශීය තත්ත්වය යටතේ අගය කළ හැකි මට්ටමේ ක්‍රියාකාරිත්වයක් ද පෙන්වීය.

කුරක්කන්

- දේශීය ජනකප්ලාස්මවලින් තෝරාගත් මාස 3-3 1/2 වයස් කාණ්ඩයේ බලාපොරොත්තු තැබිය හැකි කුරක්කන් එකතුන් 4 ක් (AC 10326, AC 11352, AC 11369 හා AC 8630) ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් තුළ අගයන ලදී. මෙම එකතුන් හෙ. 1 කට මෙ.ටො. 2-2.5 අතර සාමාන්‍ය අස්වැන්නක් ලබාදුණි.

ධාන්‍ය රනිල

මුං

පළිබෝධ හා රෝගවලට ප්‍රතිරෝධී හෝ ඔරොත්තු දෙන, එමෙන්ම අපේක්ෂිත තත්වමය ලක්ෂණවලින් යුතු බීජ සහිත, වැඩි අස්වනු ගෙන දෙන ප්‍රභේද බිහි කිරීම පිණිස පර්යේෂණ සිදු කෙරිණි.

- අස්වැන්න සහ අනෙකුත් අපේක්ෂිත ශස්‍ය විද්‍යාත්මක ක්‍රියාකාරිත්වයන් මත පදනම්ව මුං පිළි දෙමුහුම්වල [(MIMB 101 X V 2709)X V 2709 සහ (MIMB 101 xV 2709)XMIMB 101] F6 පරම්පරාවේ බීජවලින් ඇති වූ පැළ 100 ක් තෝරා ගන්නා ලදී.

- MIMBCP 111, MIMBCP 113,MIMBCP 5913 සහ MIMBCP 539-17 යන ආර ගොවි ක්ෂේත්‍රවල ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් තුළ පරීක්ෂා කර බලන ලදී. MIMBCP 111 සහ MIMBCP 114 යන ආර මනා ක්‍රියාකාරිත්වයක් පෙන් වූ අතර, MI-6 යන සැසඳුම් ප්‍රභේදයට වඩා පිළිවෙළින් 15% කින් සහ 12.5% කින් වැඩි අස්වනු ලබාදුණි. ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් තුළ අත්හදා බලන ලද බලාපොරොත්තු තැබිය හැකි මුං ආර 7 අතරින් 8452 යන මුං එකතුවෙහි තද බීජ ප්‍රතිශතය ඉතා අඩුවිය (<0.01%).

කව්පි

- MICP 01 නැමැති කෙටි කාලීන (දින 70-75) ක්‍රීම් පැහැති විශාල බීජ සහිත, වැඩි අස්වනු ගෙන දෙන (හෙ.1 කට ටො. 2ට වැඩි) කව්පි ආර සාමාන්‍ය වගාව සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිදහස් කරන ලදී.
- කුඩා කළු ලපයක් සහිත සුදු බීජ ඇති හෙ. 1 කට ටො. 2 ටවැඩි අස්වැන්නක් ලබාදෙන බලාපොරොත්තු තැබිය හැකි කව්පි ආර 2 ක් විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා බීජ සහතික කිරීමේ සේවයට ලබාදෙන ලදී.

උඳු

- උඳු ආර 3 ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් තුළ පරීක්ෂා කර බලන ලද අතර, ඒ කිසිදු ආරක් සැසඳුම් ප්‍රභේද වූ අනුරාධ සහ MI 1 ට වඩා උසස් ලක්ෂණවලින් සමන්විත නොවිණි.

තෙල් බෝග

සෝයා බෝංචි

- ක්‍රීම් පැහැති විශාල බීජ සහිත (බීජ 100 ක් ග්‍රෑ. 12 -13 ක බරින් යුතු) ඉහළ අස්වැන්නක් ලබාදෙන (හෙ. 1 කට ටො. 3 ට වැඩි) එමෙන්ම දින 80-90 කින් පරිණත වන සෝයාබෝංචි ආරක් විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පිළිබඳ පරීක්ෂාව සඳහා බීජ සහතික කිරීමේ සේවයට ලබා දෙන ලදී.

රටකජු

- විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පිළිබඳ පරීක්ෂාව සඳහා විශාල බීජ සහිත මධ්‍යකාලීන ආර 4 ක් (ICGV 97045, ICGV 97049,ICGV98396 සහICGV 98704) බීජ සහතික කිරීමේ සේවයට ලබාදෙන ලදී. ලබාදෙන අස්වැන්න හේතුවෙන් ICGV 98704 සඳහා ද අස්වැන්න සහ බීජමය ලක්ෂණ හේතුවෙන් ICGV 97045 සඳහා ද වැඩිම පාරිභෝගික කැමැත්ත හිමිවිය.

වියළි කලාපීය එළවළු

බණ්ඩක්කා

- OKS-1 නැමැති බණ්ඩක්කා ආර විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පිළිබඳ පරීක්ෂාව සඳහා තෝරා ගැනිණි. OKS-1, MI-5 හි කරල් ලක්ෂණවලින් සමන්විත වේ. කෙසේ වුවද, MI-5 ට සාපේක්ෂව මෙහි වයිරස්වලට ඔරොත්තුදීමේ හැකියාව ඉහළය. එමනිසා, මෙම ආර නාරටි විචිත්‍ර වෛරසයට බොහෝ සෙයින්ම ගොදුරු විය හැකි MI-5 ප්‍රභේදය වෙනුවට ආදේශ කරගත හැකිය.

පලතුරු

මිදි

- මිදි සඳහා අඩු පිරිවැය සහිත වැල් සකස් කිරීමේ ක්‍රමයක් හඳුනා ගැනීම පිණිස පරීක්ෂණයක් පැවැත්විණි. පැන්ඩල්, ඩබල් ගයට් (DG), ජිනීවා ඩබල් කර්ටින් (GDC) හා ටැට්‍යුරා යන පුහුණු ක්‍රම මේ සඳහා යොදා ගන්නා ලදී. මේ අතරින් පැන්ඩල්, ජිනීවා ඩබල් කර්ටින්, සහ ටැට්‍යුරා පිළිවෙළින් වැලකට කි.ග්‍රෑ. 1.43, 2.0 සහ 7.4 වශයෙන් අස්වනු ලබාදුණි. ජිනීවා ඩබල් කර්ටින් ක්‍රමය තුළින් ඊශ්‍රායල් බිලූ ප්‍රභේදයෙන් ඉහළම සාමාන්‍ය අස්වැන්නක් (වැලකට කි.ග්‍රෑ.8) ලැබිණි.

  පැන්ඩල්, ජිනීවා ඩබල් කර්ටින් යන ක්‍රම යටතේ මස්කට් MI ප්‍රභේදයේ සාමාන්‍ය අස්වැන්න වැලකට කි.ග්‍රෑ. 4.0 ක් වූ අතර, ටැට්‍යුරා ක්‍රමය යටතේ එය වැලකට කි.ග්‍රෑ. 7.7 ක් විය.ටැට්‍යුරා ක්‍රමය යටතේ ෆ්‍රෙන්චිMI ප්‍රභේදයේ සාමාන්‍ය අස්වැන්න වැලකට කි.ග්‍රෑ. 41.4 ක් වූ අතර, අනෙකුත් ක්‍රම යටතේ එය වැලකට කි.ග්‍රෑ. 11.0 ක් පමණ විය.

දිවුල්

- වියළි කලාපය සඳහා සුදුසු ඉහළ අස්වනු ලබාදෙන දිවුල් ප්‍රභේද හඳුනා ගැනීම පිණිස අධ්‍යයනයක් පවත්වන ලදී. දේශීය වශයෙන් එක්රැස් කර ගන්නා ලද එකතුන් 8 ක් අත්හදා බලන ලදී. මහ ඉලුප්පල්ලම ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානයෙන් එක්රැස් කරගත් අංක 06 දරන එකතුව අනෙක්වාට වඩා අපේක්ෂිත ලක්ෂණවලින් සමන්විත බව පෙන්වා දුණි. ගෙඩියක බර ග්‍රෑ. 180-380 අතර පරාසයක විහිදෙමින් ගසකින් ලද සාමාන්‍ය ගෙඩි සංඛ්‍යාව 573 ක් විය. දිවුල් එකතුවෙහි කුඩා, මධ්‍යම සහ විශාල ප්‍රමාණයේ ගෙඩි ප්‍රතිශතයන් පිළිවෙළින් 23% ක්, 29%ක් සහ 48% ක් විය.

ශස්‍ය විද්‍යාව

ඒකක වර්ග ඵලයක මිරිස් කරල් ඇතිවන ස්ථාන සංඛ්‍යාව වැඩි කිරීම මගින් මිරිස් අස්වැන්න ඉහළ නංවා ගැනීම පිණිස දින 30 ක් සහ දින 50 ක් වයසැති පැළ යොදා ගනිමින් ඒවායෙහි රිකිලි කපා දැමීමේ ක්‍රමයක් අත්හදා බලන ලදී. රිකිලි කපා දැමීම මගින් අස්වැන්න කෙරෙහි කිසිදු බලපෑමක් ඇති නොවිණි. නමුත් දින 30 ක් වයසැති බීජ පැළවලට සාපේක්ෂව දින 50 ක් වයසැති බීජ පැළ වැඩි අස්වනු ලබාදුණි.

- විවිධ වයස් කාණ්ඩවලට අයත් (මාස 3, 3 1/2 සහ 4- 4 1/2) වී ආර 4 ක් ඒවායෙහි කලාපීය අනුවර්ත්‍යතාව සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් තුළ අගයන ලදී. අදාළ සැසඳුම් ප්‍රභේද සමඟ සසඳ, බලන විට පහත සඳහන් වී ආර මනා ක්‍රියාකාරිත්වයක් පෙන්විය.
  මාස 3 ක් වයස් කාණ්ඩය: At-09-854 සහ Bg - 11-139

  මාස 3 1/2 වයස් කාණ්ඩය: Bw-05-1805 සහ At -08-1078

බෝග සංරක්ෂණය

ව්‍යාධිවේදය

- 2010 යල කන්නය තුළ කොළ කොඩවීමේ වයිරස් රෝගය ඇතිවීම අඩුකර ගැනීමේ හැකියාව සොයා බැලීම පිණිස පර්යේෂණ පවත්වන ලදී. එම ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ සෙවන සැපයීමේ ප්‍රතිකර්මය තුළින් (30% කින් ආලෝකය අඩු කිරීමෙන්) මිරිස් කොළ කොඩවීමේ වයිරස් රෝගයේ තීව්‍රතාව අඩු වූ බවයි. එයට හේතුව සෙවන සැපයෙන විට වාහක සංචලනය අඩුවීමයි. එමෙන්ම, එමඟින් යල කන්නය තුළ මිරිස් අස්වැන්න හෙ .1 කට කි.ග්‍රෑ. 160 කින් වර්ධනය විය.

- සම්පත් නැමැති දේශීය බඩඉරිඟු දෙමුහුම් ප්‍රභේදය (F1 දෙමුහුම) සහ එහි මාපිය ආර බීජ පැළ අංගමාර සහ බීජ පැළ වර්ධනය බාලවීමේ රෝග ලක්ෂණ පෙන්නුම් කළේය. රෝග ආසාදිත බීජ පැළවලින් ව්‍යාධිජනකයින් හුදෙකලා කර ගැනීමෙන් වැඩි වශයෙන්ම පෙනිසිලියම් විශේෂයක් (*Penicillium* sp.) දක්නට ලැබූ අතර, එමඟින් බීජ ප්‍රරෝහණය කෙරෙහි කිසිදු බලපෑමක් ඇති නොවූ නමුත්, බීජ පැළ මතුවීම අඩුවීමක් ද පැළ මතු වූ පසු අංගමාර තත්ත්වය ඇතිවීම ද සිදුවිය. පීවී බීජ කලලය පෙනිසිලියම් විශේෂයේ (*Penicillium* sp.) ආසාදනයට වැඩි වශයෙන්ම ගොදුරු වූ කොටස විය. මුලින්ම බීජයේ තෙතමනය අන්තර්ගත වන ප්‍රමාණය වැඩිවීමත් සමඟම රෝගය ඇතිවීම ද වැඩිවිය. එමනිසා තෙතමනය අන්තර්ගතය 13% ට වඩා අඩු බීජ ගබඩා කිරීම පිණිස යොදාගත යුතුය.

- මලයාසියාවෙන් ලබාගත් බඩඉරිඟු ප්‍රභේද 9 ක බීජ නියැදි, කෘත්‍රිම පෝෂණ මාධ්‍යයක් තුළ වර්ධනය කරගත හැකි ව්‍යාධිජනකයින් සමඟ පරීක්ෂා කර බලන ලදී. මෙම බීජ ශ්‍රී ලංකාවේ වාර්තා වී නොතිබුණු බඩඉරිඟුවල ඇන්ත්‍රැක්නෝස් රෝගයට කාරකවන ජීවියා වන කලෙටොට්‍රිකම් විශේෂය (*Colletotrichum* sp.) හේතුවෙන් ආසාදිතව පැවතිණි. රෝගය තව දුරටත් පැතිරීම වැළැක්වීම සඳහා බීජ නියැදි සියල්ලම විනාශ කෙරිණි.

- පේරාදෙණිය සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් සත්ත්ව ආහාරයක් වශයෙන් හඳුන්වා දී වගා කරන ලද සත්ත්ව ආහාරවලට සුදුසු ඉදල් ඉරිඟු ප්‍රභේද පැවතිය හැකි නිරෝධායන රෝග සම්බන්ධයෙන් ඇගැයීමට ලක් කෙරිණි. එහිදී කිසිදු නිරෝධායන රෝගයක් නිරීක්ෂණය කිරීමට නොලැබිණි. අස්වනු නෙළන කාලය මත පදනම්ව එවැනි සත්ත්ව ආහාරවලට සුදුසු ඉදල් ඉරිඟු ප්‍රභේද සඳහා ඇති අවශ්‍යතාව සැලකිල්ලට ගෙන මෙම ආර ගොවි ක්ෂේත්‍රවල විශාල පරිමාණයෙන් අත්හදා බැලීම පිණිස සලකා බැලිය හැකිය.

කීට විද්‍යාව

- මිරිස් කොළ කොඩවීමේ සංකීර්ණය මිරිස් වගාවේ ඇති ප්‍රධාන පෙළේ පළිබෝධ ගැටලුවකි. මෙම රෝගය පාලනය කිරීම සඳහා විවිධාකාරයෙන් ක්‍රියාකාරී වන විකල්ප පළිබෝධනාශක හඳුනා ගැනීම සඳහා පරීක්ෂණයක් පවත්වන ලදී. මිරිස් වල කොළ කොඩවීමෙන් ඇතිවන හානිය අඩුකර ගැනීම සඳහා ස්පිනොසැඩ් 45 SC සහ ඉමිඩක්ලෝප්‍රිඩ් 70% WG යන කෘමිනාශක 2 ඵලදායි වූ බව හඳුනා ගැනිණි.

- බීජ ප්‍රතිකර්මය මෙන්ම පතුවලට කෘමිනාශක යෙදීම ද කළ ක්ෂේත්‍රවල පැළ සිටුවා සති 6 ක් යනතුරු කොළ කොඩවීමෙන් ඇති වූ හානියේ තීව්‍රතාව සැලකිය යුතු අයුරින් අඩු මට්ටමක පැවතිණි (තීව්‍රතා දර්ශකය: 10%). කෙසේ වුවද, පැළ සිටුවා ගෙවුණු සති 8-12 ක කාලය තුළ ප්‍රතිකර්ම යෙදූ ක්ෂේත්‍ර අතර සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබිණි.

- ගොවිහු බඩඉරිඟු අස්වැන්න වැඩිකර ගැනීම සඳහා නයිට්‍රජන් පොහොර ඉතා ඉහළ මාත්‍රාවන් භාවිතා කරති. කෙසේ වුවද, මෙම පිළිවෙත බෝගයේ සමස්ත ක්‍රියාකාරිත්වය කෙරෙහි සෘණාත්මක බලපෑමක් ඇති කරන්නට ඇත. විශේෂයෙන්ම කෘමිනාශක නොයෙදූ ක්ෂේත්‍රවල 80% කින් පමණ නයිට්‍රජන් යෙදීම වැඩි කිරීම මගින් කළ විදින්නාගේ හානියේ තීව්‍රතාව 85% කින් පමණ වැඩි වූ අතරම, හෙ. 1 කට කි.ග්‍රෑ.200 කින් අස්වැන්නද වැඩිවිය.
- මිරිස් වගාවේ කොළ කොඩවීමේ සංකීර්ණය පාලනය කිරීම සඳහා ඇබමෙක්ටින්1.8EC නිර්දේශ කරන ලදී. නිර්දේශිත නිපැයුමෙහි මාත්‍රාවම සහිත නව සම්මිශ්‍රණ වර්ගයක් (N-Methyl 2 pyrrolidane-Butyrolactone-NMP Free abamectin) එහි පෙර්ව කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් අත්හදා බලන ලදී. මීතයිල් 2 පයිරොලිඩේන් (NMP) රහිත ඇබමෙක්ටින් සහ ඇබමෙක්ටින් 1.8 EC යෙදීම

අතර මිරිස්වල කොළ කොඩවීමේ සංකීර්ණය පාලනය කිරීමේදී සැලකිය යුතු වෙනසක් නොතිබිණි.

- බණ්ඩක්කා සහ වම්බටු වගාවන් ආසාදනය කරන සුදු මැස්සා සහ පත්‍ර කීඩෑවා පාලනය සඳහා ඇසිටැමිප්‍රිඩ් 18 SL නමැති නව සම්මිශ්‍රණය ඵලදායී වන ආකාරය පිළිබඳව සොයා බැලීම සඳහා පරීක්ෂණයක් පවත්වන ලදී. එහිදී එම වගාවන්හි සිටින සුදු මැස්සන් සහ පත්‍ර කීඩෑවන් පාලනය සඳහා නව ඇසිටැමිප්‍රිඩ් සම්මිශ්‍රණය ද (ඇසිටැමිප්‍රිඩ්18 SL)ඵලදායී වන බව සොයා ගැනිණි.

වල් පැළෑටි කළමනාකරණය

ක්ෂේත්‍ර බෝග සඳහා පවතින නිර්දේශිත පැළෑටි නාශක සංඛ්‍යාව ඉතාමත් සීමිත වීමේ හේතුවෙන් මහ ඉලුප්පල්ලමේදී නව පැළෑටිනාශක පිළිබඳව අඛණ්ඩව ඇගයීම් කටයුතු සිදු කෙරේ.

- මිරිස් සහ රටකජු වගාවන්හි වල් පැළ පාලනය සඳහා ක්විසලොස් - පී - ඊතයිල් EC ලී. 1 කට ග්‍රෑ. 50 ක් වශයෙන් යෙදීමේ සාර්ථකත්වය විමසා බලන ලදී. මිරිස් සහ රටකජු සම්බන්ධයෙන් හෙ. 1 කට ලී. 1.0, 1.5, 2.0 වශයෙන් ප්‍රමාණ 03 ක් යොදා පැළෑටිනාශකය අත්හදා බලන ලදී. එහෙත් එය සාර්ථක වූයේ තෘණ වර්ග පාලනය සඳහා පමණි.
- බඩඉරිඟු වගාවේ වල් පැළ පාලනය සඳහා හැලසල්ෆියුරන් - මීතයිල් 75 WG සතු කාර්යක්ෂමතාව සොයා බැලීම පිණිස පරීක්ෂණයක් පවත්වන ලදී.බඩඉරිඟු වගාව සම්බන්ධයෙන් හෙ.1 කට ග්‍රෑ.60, 80 සහ 100 වශයෙන් ප්‍රමාණ 3 ක් යොදා එම පැළෑටි නාශකය අත්හදා බලන ලදී. එහෙත් එය සාර්ථක වූයේ පන් වර්ග පාලනය කිරීම සඳහා පමණි.
- ට්‍රිගර් නමැති වල් පැළෑටිනාශකයේ (කාෆෙන්ට්‍රසෝන් - ඊතයිල් ලී. 1 කට ග්‍රෑ. 6.5 + ග්ලයිෆොසේට් CS (a.e) ග්‍රෑ. 179) වර්ෂාවට ඔරොත්තුදීමේ හැකියාව නිරීක්ෂණය කිරීම පිණිස පර්යේෂණයක් සිදු කෙරිණි. අධික වැසි පවතින විට මහ කන්නය තුළ වල් පැළෑටි වර්ග සියල්ල විනාශ කිරීම උදෙසා පැළෑටි නාශකයක් යෙදීම ගැටලුවක් විය හැකි හෙයින් මෙම තොරතුරු ප්‍රයෝජනවත් වනු ඇත. වර්ෂා තත්ත්වයක් ඇතිකර ට්‍රිගර්, ග්ලයිෆොසේට් සහ පැරකොට් සමඟ අත්හදා බලන ලදී. අත්හදා බලන ලද පැළෑටිනාශක කිසිවක වර්ෂාවට ඔරොත්තු දීමේ හැකියාවක් නොතිබිණි.

- රනිල බෝග වගාවේ වල් පැළ පාලනය සඳහා ඉමැසතපයර් දක්වන කාර්යක්ෂමතාව පිළිබඳව විමසා බලන ලදී. මුං වගාව සඳහා හෙ. 1 කට මි.ලී. 600, 700, 800 වශයෙන් ප්‍රමාණ 3 ක් වල් පැළ මතුවීමට පෙර සහ පසුව යොදා එම පැළෑටිනාශකය අත්හදා බලන ලදී. වල් පැළ මතුවීමට පෙර යෙදීම මගින් බලාපොරොත්තු තබා ගත හැකි මට්ටමේ ප්‍රතිඵල ලැබුණු අතර, වැඩිදුර ඇගයීම් කටයුතු සිදු කෙරෙනු ඇත.

- එයට අමතරව ජාතික සම්බන්ධීකරණ පැළෑටි නාශක අත්හදා බැලීම් වැඩසටහන යටතේ 2010/11 මහ කන්නය තුළ වී වගාව සඳහා නව පැළෑටිනාශක 6 ක් ඇගයීමට ලක්කර අදාළ දත්ත බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයට ලබා දෙන ලදී.

පාංශු සාරවත්භාවය

- ඒකාබද්ධ පැළෑටි පෝෂක ක්‍රමය බෝග නිෂ්පාදනය සඳහා පොහොර යෙදීමේ කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීමට උපයෝගි කරගත හැකි ක්‍රමයකි. බඩඉරිඟු වගාව සඳහා ඒකාබද්ධ පැළෑටි පෝෂක ක්‍රමයකට සුදුසු කාබනික පොහොර හඳුනා ගැනීම පිණිස පරීක්ෂණයක් පවත්වන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම් යන අකාබනික පොහොර ප්‍රමාණයන් 25% කින් අඩුකර ඒ සමඟ කාබනික පොහොර වර්ග 4 ක් (ග්ලිරිසීඩියා පත්‍ර, කොම්පෝස්ට්, සන්හෙම්ප් සහ එළවළු කව්පි) අත්හදා බලන ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත අකාබනික පොහොර නිර්දේශයෙන් 75% ක් සමඟ ග්ලිරිසීඩියා හෝ උසස් තත්ත්වයේ කොම්පෝස්ට් හෙ. 1 කට ටො. 10 ක ප්‍රමාණයෙන් යෙදීම මගින් හෝ සන්හෙම්ප් (බීජ ප්‍රමාණය - හෙ. 1 කට කි.ග්‍රෑ. 20) හෝ එළවළු කව්පි (බීජ ප්‍රමාණය හෙ. 1 කට කි.ග්‍රෑ. 25-30) එම ස්ථානයටම යෙදීම මගින් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත අකාබනික පොහොර නිර්දේශය 100% ක් අනුගමනයෙන් ලැබුණා හා සමාන අස්වනු ලැබිණි.

- උසස් ශ්‍රේණියේ එප්පාවල රොක් ෆොස්ෆේට් සහ එප්පාවල සින්ගල් සුපර් ෆොස්ෆේට් දේශීය වශයෙන් නිපදවන ෆොස්ෆරස් පොහොර වේ.

එහෙත් එම පොහොර වර්ග වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව සඳහා යොදා ගැනීම සුදුසු දැයි තවමත් නොදනී. එම නිසා ආරම්භක පියවරක් වශයෙන් මෙම පොහොර නිපැයුම් බඳුන් පරීක්ෂණයක වූ බඩ ඉරිඟු වගාවකට යොදා අත්හදා බලන ලදී.බඩ ඉරිඟු වගාව සඳහා ට්‍රිපර් සුපර් ෆොස්ෆේට් වෙනුවට එප්පාවල සින්ගල් සුපර් ෆොස්ෆේට් ආදේශකයක් වශයෙන් සුදුසු බව සොයා ගන්නා ලදී. එහෙත් උසස් ශ්‍රේණියේ එප්පාවල රොක් ෆොස්ෆේට් ඒ සඳහා නුසුදුසු විය. එම ප්‍රතිඵල සනාථ කර ගැනීමට සහ නිර්දේශයක් ලබාදීම සඳහා පර්යේෂණය ක්ෂේත්‍ර මට්ටමින් අඛණ්ඩව සිදු කෙරේ.

ජල කළමනාකරණය

- මිරිස් වගාව සඳහා බිංදු ජල සම්පාදන පිළිවෙත් මාලාවක් සකස් කිරීම පිණිස බිංදු ජල සම්පාදන ක්‍රමය යටතේ රතු දුඹුරු පසෙහි ජල ව්‍යාප්ති රටාව ඇගයීම පිණිස අධ්‍යයනයක් ආරම්භ කෙරිණි. අමු මිරිස් අස්වැන්න අඩුවීමකින් තොරව ආංශික ජල නලවල සිට සෙ.මී. 25 ක් දක්වා මිරිස් පැළ ස්ථාපිත කළ හැකි බව විමර්ශන මගින් පෙන්වා දුණි. අත්හදා බලන ලද පැළ පරතරය තුළ මූල කලාපයේ පාංශු තෙතමනය (හාරමිතික තෙතමනය 20% ක් පමණ) සහ ලවණ සාන්ද්‍රණයන් (මීටරයට ඩෙසිසීමන්ස් < 0.15) අපේක්ෂිත මට්ටම්වලින් පවත්වා ගැනිණි.

- රතු දුඹුරු පසෙහි වගා කරන ලද "සම්පත් " නමැති දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේදයේ ප්‍රශස්ත ජල සම්පාදන අවශ්‍යතාව සොයා ගැනීම පිණිස විමර්ශනයක් සිදු කෙරිණි. බෝගයක් සඳහා ජල සම්පාදන අවශ්‍යතාව නිශ්චය කිරීම පිණිස යොදා ගන්නා පරාමිතියක් වන්නේ සම්පාදනය කරන ලද ජල ප්‍රමාණය සහ සමුච්චිත තැටි වාෂ්පීකරණය අතර අනුපාතයයි. සම්පත් නමැති බඩඉරිඟු ප්‍රභේදයේ මාස 3 ක් වූ බෝග වර්ධන කාල පරිච්ඡේදය පුරා එවන් අනුපාත සංයෝජන 13 ක් පරීක්ෂා කර බලන ලදී. 1.15, 1.15 සහ 0.70 වශයෙන් වර්ධන කාල සීමාවේ පළමු, දෙවන හා තෙවන මාස සඳහා පරීක්ෂා කර බලන ලද අනුපාත සංයෝජන 3, 2011 යල කන්නයේදී බඩඉරිඟු බෝගයේ වර්ධනය හෝ අස්වැන්න සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනසක් ඇති කළ බවක් නොපෙනිණි. එමනිසා, පරීක්ෂා කර බලන ලද ඕනෑම සංයෝජනයක් රතු දුඹුරු පසෙහි වගාකරන සම්පත් නැමැති දෙමුහුම් බඩ ඉරිඟු ප්‍රභේදයේ ජල සම්පාදන අවශ්‍යතාව නිශ්චය කිරීම සඳහා යොදා ගත හැකිය. ප්‍රතිඵලවල නිරවද්‍යතාව සනාථ කර ගැනීම සඳහා මෙම පරීක්ෂණය නැවතත් සිදු කෙරෙනු ඇත.

ආහාර තාක්ෂණය

- කව්පි ප්‍රභේද 4 ක් ඒවා පොඟවා තැබිය යුතු කාලය, තැම්බිය යුතු කාලය සහ සංවේදන ඉන්ද්‍රියයන්ට දැනෙන ආකාරය පිළිගත හැකි මට්ටමින් යුතුවීම සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලිණි. MI-35 නැමැති ප්‍රභේදය තැම්බීම සඳහා වඩා දිගු කාලයක් ද වැඩි ජල ප්‍රමාණයක් ද අවශ්‍ය විය. ධවල ප්‍රභේදය ඉන්ද්‍රියයන්ට දැනෙන ආකාරය අනුව ඉහළම පිළිගත හැකි මට්ටමින් යුතු වූ අතර, එය එහි මෘදු වයනය සහ රසය නිසා සිදු වන්නට ඇත.

- කව්පි ප්‍රභේද 5 ක් ඒවායෙහි ඇති දළ ප්‍රෝටීන් අන්තර්ගතය පිළිබඳව දැන ගැනීම සඳහා පරීක්ෂා කර බලන ලදී. ධවල (19.3%)MI-35 (19.53%) සහ MICP-03 (19.53%) යන ප්‍රභේදවලට වඩා වරුණි (21.5%) සහ MICP-01 (21.9%) යන ප්‍රභේදවල වැඩි ප්‍රෝටීන් අන්තර්ගතයන් පැවති බව පෙනිණි.

- සෝයාබෝංචි ප්‍රභේද/ආර 4 ක් ඒවායෙහි ඇති දළ මේද සහ ප්‍රෝටීන් ප්‍රමාණයන් දැන ගැනීම සඳහා පරීක්ෂා කර බලන ලදී. ඒවායෙහි අන්තර්ගත මේද ප්‍රමාණයන්හි සැලකිය යුතු වෙනසක් නොවූ අතර (19-20%), නවසෝයාබෝංචි එකතුන් 2 හි අන්තර්ගත දළ ප්‍රෝටීන් ප්‍රමාණයන් 32.7- 39.1% අතර පරාසයක පැවතෙමින් Pb -01 ප්‍රභේදයට සමාන විය.
- සම්පත් නමැති දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේදයේ සහ එහි මාපිය ආරවල ආසන්න සංයුතිය ඇගයීමට ලක් කෙරිණි. දළ ප්‍රෝටීන්, දළ මේද සහ තන්තු හෝ අඕ අන්තර්ගතයන්හි කිසිදු සැලකිය යුතු වෙනසක් දක්නට නොලැබිණි.

- අලුතෙන් නිකුත් කරන ලද KC-01 නමැති තක්කාලි ප්‍රභේදය ආහාර සැකසීමට සුදුසු තත්ත්වයෙන් සහ මූලික රසායනික ලක්ෂණ වලින් සමන්විත වන්නේ දැයි දැනගැනීම සඳහා පරීක්ෂා කරන ලදී. තක්කාලිවල අපේක්ෂිත ආම්ලිකතාවට අනුව (සාමාන්‍යයෙන් පීඑච්අගය 4.6ට අඩු) මෙම ප්‍රභේදයේ ආම්ලිකතාව පිළිබඳ පීඑච්අගය 5.63ට සමාන විය. එමනිසා, මෙය

සෝස් සහ කෙවප් වැනි නිෂ්පාදනය සඳහා සාර්ථකව යොදා ගත හැකිය.

- අලුතින් බිහිකරන ලද මෘදු බීජ සහිත පේර ආර කායික, රසායනික සහ සංවේදන ඉන්ද්‍රියයන්ට අනුගතවන ලක්ෂණවලින් සමන්විත වන ආකාරය සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා ප්‍රචලිත ප්‍රභේදයට සාපේක්ෂව අගයන ලදී. මෘදු බීජ සහිත ප්‍රභේදයෙහි ගෙඩි වඩා විශාල වූ අතර, ඒවායෙහි බීජ ප්‍රතිශතය ද අඩුවිය. එමෙන්ම බීජ වඩා මෘදු විය. මෙම ආරෙහි පොත්ත වැඩි ඝනකමකින් යුතු වන අතර, පොත්තෙහි පැහැය ඒකාකාරී විය (කහ පැහැති කාණ්ඩය: BHS වර්ණ සටහන අනුව 144 B – 144 C).
- උසස් තත්ත්වයේ ප්‍රෝටීන් සහිත බඩඉරිඟු මාපිය ආර 7 ක්, බලාපොරොත්තු නැඹිය හැකි උසස් තත්ත්වයේ බඩඉරිඟු දෙමුහුම් 9 ක් සහ සාමාන්‍ය බඩඉරිඟු දෙමුහුම් 2 ක් (පැසිෆික් 984 හා සම්පත්) බීජවල අන්තර්ගත සමස්ත ප්‍රෝටීන් සහ ට්‍රිප්ටෆන් ප්‍රමාණයන් පිළිබඳව දැන ගැනීම සඳහා පරීක්ෂා කර බලන ලදී. පිළිවෙළින් 7.2 -9.7% සහ 3.4 - 6.4% අතර පරාසයක පැවැති බීජ ප්‍රෝටීන් සහ මේද ප්‍රමාණයන් අතර කිසිදු සැලකියයුතු වෙනසක් නොවිණි. නුමුහුන් ආරවල ට්‍රිප්ටෆන් අන්තර්ගතය 1.09 -0.84% ක් වූ අතර, උසස් තත්ත්වයේ ප්‍රෝටීන් සහිත බඩඉරිඟු දෙමුහුම්වල එය 1.16- 0.92% අතර ප්‍රමාණයක විය. උසස් තත්ත්වයේ ප්‍රෝටීන් සහිත බඩඉරිඟු නුමුහුම් ආර සහ උසස් තත්ත්වයේ ප්‍රෝටීන් සහිත බඩඉරිඟු දෙමුහුම් බොහොමයකට වඩා සම්පත් සහ පැසිෆික් 984 යන ප්‍රභේදවල පැවැති ට්‍රිප්ඝන් අන්තර්ගතයන් සැලකිය යුතු අයුරින් අඩු විය. KH 156, KH 74, KH 76 සහ KH 157 යන දෙමුහුම් තුළ පැවැති ට්‍රිප්ටෆන් අන්තර්ගතයන් 1% ඉක්මවිය.

- බිහි කරන ලද කෝමාරිකා නිපැයුම් 3 ක් (පානයක්, පේලි සහ ආස්‍රැතිය මගින් වියළන ලද ස්නැක් වර්ගයක්) සංවේදන ඉන්ද්‍රියයන්ට අනුගත වන තත්තවයෙන් යුක්ත වන්නේ දැයි දැන ගැනීම සඳහා පරීක්ෂා කර බලන ලදී. සියලුම නිෂ්පාදන සම්බන්ධයෙන් සමස්ත පිළිගැන්ම 'බෙහෙවින් කැමතියි' යන කාණ්ඩයට වඩා ඉහළින් පැවතිණි.

කෝමාරිකා පේලි කල්තබා ගැනීමේ හැකියාව දීර්ඝ කර ගැනීම සඳහා සුදුසු පූර්ව ප්‍රතිකර්ම හඳුනා ගැනීමට පරීක්ෂණයක් පවත්වන ලදී. ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ උණු කිරීමට පෙර පොටෑසියම් මෙටබයිසල්ෆයිට් මිලියනයකට කොටස් 120 ක් එක් කිරීම මගින් සකස් කරන පේලි ශීතකරණයක තැබීමෙන් දින 36 ක කාලයක් පුරා කල්තබා ගත හැකි බවයි.

- රළු ධාන්‍ය පිටිවල (බඩඉරිඟු, කුරක්කන් සහ ඉදල් ඉරිඟු) හා තිරිඟු පිටිවල ආසන්න සංයුතිය විශ්ලේෂණය කරන ලදී. ප්‍රෝටීන්, මේද සහ අΩ අන්තර්ගතයන් පිළිවෙළින් 3.2%, 0.6% සහ 1.4% වූ තිරිඟු පිටිවලට වඩා රළු ධාන්‍ය පිටිවල ප්‍රෝටීන් (6.6 -6.3%), මේදය (2.7 - 5.7%), තන්තු (0.3- 2.0%) සහ අΩ අන්තර්ගතයන් (1.6-2.5%) ඉහළ මට්ටමක විය. තිරිඟු පිටිවල ඇති තන්තු ප්‍රමාණය අල්පය. රළු ධාන්‍ය පිටි යොදා නිපදවන ලද බිස්කට් සහ කේක් සංවේදන ඉන්ද්‍රියයන්ට පිළිගත හැකි මට්ටමේ තත්ත්වයෙන් යුතු වූ නමුදු තිරිඟු පිටි නිෂ්පාදනවලට තරම් පිළිගැන්මක් නොලැබිණි.

- තිරිඟු පිටි යොදා නිපදවන පාන්වලට බඩඉරිඟු පිටි එක් කළ හැක්කේ 20% ක් දක්වා පමණි. බඩඉරිඟු පිටි පූර්ව ජෙලටිනීකරණය කිරීම මගින් වයන ලක්ෂණ වර්ධනය කර ගැනිණි.

- පොත්ත රිදී පැහැති ලූනුවල සැර ස්වභාවය අඩු හෙයින් ආහාර පිළියෙල කිරීමේදී ඒවාට ඇති පිළිගැන්ම අඩුය. මෙම වර්ගය ලොව පුරා අච්චාරු සකස් කිරීම සඳහා භාවිත කෙරේ. සැකසුම් ක්‍රම 5 ක් යොදා ගනිමින් පොත්ත රිදී පැහැති ලූනු සමඟ රතුලූනු යොදා අච්චාරු සැකසීමේ හැකියාව අත්හදා බලන ලදී. 2% සහ 5% ලවණ ද්‍රාවණවල අච්චාරු සකස් කිරීමෙන් සංවේදන ඉන්ද්‍රියයන්ට පිළිගත හැකි තත්ත්වයෙන් යුතු නිපැයුමක් බිහිවිය.

බීජ නිෂ්පාදනය

අභිජනන සහ සහතික කළ/වාණිජමය බීජ නිෂ්පාදනය

මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් අභිජනන හා සහතික කළ/වාණිජමය බීජ පහත දැක්වෙන ප්‍රමාණවලින් නිපදවා බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට සහ වෙනත් අදාළ ආයතනවලට සපයන ලදී (වගු අංක:2.1.2).

වගු අංක: 2.1.2: 2011 වර්ෂයේදී ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී නිපදවන ලද අභිජනන සහ සහතික කළ/වාණිජමය බීජ ප්‍රමාණය

බෝගය	ප්‍රභේදය	අභිජනන බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)	සහතික කළ/ වාණිජමය බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ)
බඩ ඉරිඟු	සම්පත් නැමැති දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේදයේ මාපිය ආර	පුමංගී 288.0 ජායාංගී 438.0	-
	රුවන්	89.0	-
කුරක්කන්	රාවණා	9.5	-
	ඕෂධ	5.5	-
මිරිස්	MI ග්‍රීන්	-	110.0
	ගල්කිරියාගම වරණාය	8.0	-
	MI 2	1.2	-
මුං	ආරි	24.0	232.0
	MI 5	47.5	-
	MI 6	39.5	280.0
ලොකුලූනු	දඹුල්ල වරණාය	මව් බල්බ 280 සත්‍ය බීජ 0.7	790.0 -
උඳු	MI 1	33.8	-
	අනුරාධ	28.5	-
සෝයා බෝංචි	Pb01	113.0	-
කව්පි	ධවල	27.0	-
	MI 35	11.0	-
	වරුණි	14.5	-
	බොම්බේ	22.0	-
බණ්ඩක්කා	හරිත	58.5	-
	MI 5	7.5	-
කරවිල	MC 43	3.8	-
මුරුංගා	කුරු ප්‍රභේදය	11.0*	-

*හෙක්ටයාර 25 ක් පමණ වගා කිරීම සඳහා බීජ පැළ නිෂ්පාදනය කිරීමට ප්‍රමාණවත්ය.

තාක්ෂණ ප්‍රචාරණය

පුහුණු වැඩසටහන්, දේශන, වැඩමුළු, ක්ෂේත්‍ර ආදර්ශන, පැළෑටි සායන, ක්ෂේත්‍ර දින, ප්‍රදර්ශන සහ තාක්ෂණික උපදෙස්

වසර තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

- ගොවීන්, පාසැල් සිසුන්, විශ්වවිද්‍යාල සහ කාර්මික විද්‍යාල සිසුන් 3000 කට අධික සංඛ්‍යාවක් සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග පිළිබඳ පුහුණු වැඩසටහන් 120 කට අධික සංඛ්‍යාවක් පවත්වන ලදී.
- ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ විෂය ප්‍රවීණයෝ සම්පත්දායකයින් වශයෙන් විවිධ වැඩසටහන්වලට සහභාගි වූහ.

    - ක්ෂේත්‍ර ආදර්ශන 40 කට අධික සංඛ්‍යාවක්
    - ක්ෂේත්‍ර දින 2 ක්
    - පැළෑටි සායන 7 ක්
    - "ගොවි සතිය" හා "දැයට කිරුළ" යන ජාතික ප්‍රදර්ශන 2

- මෙම ආයතනයට පැමිණි සහ දුරකථනය හරහා සම්බන්ධ වූ 600 කට අධික සංඛ්‍යාවකට තාක්ෂණික උපදෙස් ලබාදෙන ලදී.
- තාක්ෂණික තොරතුරු රැගත් පත්‍රිකා 1500 ක් පමණ බෙදා හරින ලදී.
- ගොවීන් සහ අනෙකුත් ආයතන සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නියැදි 1500 ක් පමණ නිකුත් කරන ලදී.
- කාර්මික විද්‍යාල සිසුහු 3 දෙනෙක් සහ එක් විශ්වවිද්‍යාල සිසුවෙක් මෙහිදී තම ආයතනික පුහුණුව සම්පූර්ණ කළහ. එක් උපාධි අපේක්ෂකයෙක් මෙම ආයතනයේදී තම අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘතිය නිම කළේය.

රූපවාහිනී/ගුවන් විදුලි වැඩසටහන්

- ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ විෂය ප්‍රවීණයින්ගේ සහභාගිත්වයෙන් ගුවන්විදුලි වැඩසටහන් 4 ක් ප්‍රචාරය කෙරිණි.

පුවත්පත් ලිපි

- වසර තුළ පුවත්පත් ලිපි 2 ක් පළ කෙරිණි.

වෙනත් ව්‍යාපෘති/සේවා

කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය වර්ධනය කිරීම

කාබනික පෙහොර ටො. 80 ක් සහ කොම්පෝස්ට් මුහුන් කි.ග්‍රෑ. 1500 ක් නිපදවා බෙදා හරින ලදී. සන්හෙම්ප් *(Crotalaria juncea)* බීජ කි.ග්‍රෑ. 40 ක් ද නිපදවා ආයතනයේ බීජ ගුණන කටයුතු වලදී ද, කොළ පොහොරක් වශයෙන් ද භාවිතා කෙරෙමින් පවතී.

'ආදර්ශ ගම්මාන' වැඩසටහන

කොම්පෝස්ට් නිෂ්පාදනය සහ පලතුරු බෝග කප්පාදු කිරීම පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන් සහ විශේෂ ක්ෂේත්‍ර දින වැඩසටහනක් එප්පාවල නැල්ලමුදව ග්‍රාමයේදී ක්‍රියාත්මක කරන ලදී. විශේෂ ක්ෂේත්‍ර දින වැඩසටහනක් පවත්වන ලද අතර, ඒ සඳහා ගොවීහු 44 දෙනෙක් සහභාගි වූහ.

2011/12 මහ කන්නයේදී ගුණනය කිරීම සඳහා ප්‍රභේද 15 කට අයත් උසස් තත්ත්වයේ බීජ ගොවීන් 4 දෙනෙකු අතර බෙදා හරින ලදී. කුරු වර්ගයේ මුරුංගා පැළ 500 ක්, කොම්පෝස්ට් මුහුන් කි.ග්‍රෑ. 1250 ක් සහ රෝක්ක 250 ක් නැල්ලමුදව ග්‍රාමයේ ගොවි පවුල් 250 ක් අතර බෙදා දෙන ලදී.

පාංශු පරීක්ෂණ වැඩසටහන

අනුරාධපුර පළාත් සහ අන්තර් පළාත් ප්‍රදේශවල හා මහවැලි "එච්" කලාපයේ ගොඩ සහ මඩ පස් නියැදි 56 ක් විශ්ලේෂණය කර පාංශු පරීක්ෂණ පදනම් කරගත් පොහොර සහ කාබනික ද්‍රව්‍ය නිර්දේශ ලබාදුණි.

වෙනත් වැඩසටහන්

සැල්විනියා සහ ජපන් ජබරවල පෙව පාලන කාරකයින් බෝකර එම නියැදි එක් එක් ගොවීන්ට, ගොවි සංවිධානවලට සහ රජයේ බලධාරීන්ට ලබා දෙන ලදී.

2012 වසර සඳහා සැලැස්ම

පර්යේෂණ

කුළු බඩු

මිරිස්

- වර්ෂාපෝෂිත සහ ජල සම්පාදිත තත්ත්වයන් සඳහා සුදුසු සාමාන්‍ය පරිදි පරාගණය වූ සහ

දෙමුහුම් මිරිස් ප්‍රභේද (අමු මිරිස් හා වියළි මිරිස් වශයෙන් ද්විත්ව නිපැයුම්) බිහි කිරීම

- මිරිස් දෙමුහුම් සහ සාමාන්‍ය පරිදි පරාගණය වූ ප්‍රභේද සඳහා නව මුහුන් බිහි කිරීම සහ අලුතින් බිහි කරන ලද දෙමුහුම් ඇගයීම
- මිරිස් ජනක ප්ලාස්ම ඇගයීම, බලාපොරොත්තු තැබිය හැකි ආර සහ කලාපීය වශයෙන් වැදගත් දේශීය මිරිස් ප්‍රභේද තෝරා ගැනීම, සංශුද්ධ කිරීම සහ ඒවායෙහි බීජ ගුණනය
- බලාපොරොත්තු තැබිය හැකි මිරිස් අභිජනන ආර පිළිබඳ ජානික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්වීම
- බලාපොරොත්තු තැබිය හැකි මිරිස් අභිජනන ආර වලට අදාළ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පැවැත්වීම
- විදේශීය මිරිස් දෙමුහුම් පිළිබඳ ඇගයීම් කටයුතු කිරීම

ලූනු

- වැඩිදියුණු කළ ලොකු ලූනු ආරවල බල්බ අස්වැන්න ඇගයීම සහ වරණය
- වැඩිදියුණු කළ ලොකු ලූනු ආරවල බීජ අස්වැන්න ඇගයීම සහ වරණය
- අවාරයේ වගා කිරීම සඳහා විදේශීය ලොකු ලූනු ප්‍රභේද ඇගයීම
- මහ කන්නය තුළ පවතින අඩු උෂ්ණත්ව තත්ත්වයන් යටතේ සත්‍ය බීජ නිෂ්පාදනයට සුදුසු නව ලොකු ලූනු ආර වැඩිදියුණු කිරීම
- ලූනු දෙමුහුම් කිරීම සහ වරණය
- බීජ පැළවලින් වර්ධනය කරගත් වැඩිදියුණු කළ පොකුරු ලූනු ආර ඇගයීම
- බලාපොරොත්තු තැබිය හැකි ලූනු ආරවල සහ තෝරාගත් ලූනු එකතූන්වල බීජ සහ බල්බ ගුණනය

ධාන්‍ය රනිල

මුං

- මුංදෙමුහුම්කරණ සහ වරණ වැඩසටහන
- මුංජනකප්ලාස්ම ඇගයීම සහ වරණය
- බලාපොරොත්තු තැබිය හැකි මුං අභිජනන ආරවලට අදාළ ජානික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්
- බලාපොරොත්තු තැබිය හැකි මුං ආරවලට අදාළ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්

උඳු

- උඳු ජනකප්ලාස්ම ඇගයීම
- උඳු දෙමුහුම්කරණ සහ වරණ වැඩසටහන

කව්පි

- කව්පි දෙමුහුම්කරණ සහ වරණ වැඩසටහන
- කව්පිවලට අදාළ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම
- කව්පිවලට අදාළ ජානික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්

සෝයා බෝංචි

- ආසියානු එළවළු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් ලද සෝයා බෝංචි ජනකප්ලාස්ම ඇගයීම
- බලාපොරොත්තු තැබිය හැකි සෝයාබෝංචි ආරවල බීජ ගුණනය
- බලාපොරොත්තු තැබිය හැකි කොණ්ඩ කඩල ප්‍රභේදවල බීජ ගුණනය

තෙල් බෝග

රටකජු

- බලපොරොත්තු තැබිය හැකි රටකජු ආරවල බීජ ගුණනය
- බලාපොරොත්තු තැබිය හැකි මධ්‍ය කාලීන රටකජු ආරවලට අදාළ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්
- අංකුර අංගමාරයට අදාළව ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පැවැත්වීම

අඹ

- අඹවලට අදාළ ජානික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්වීම
- අඹවලට අදාළ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පැවැත්වීම

රළු ධාන්‍ය

බඩඉරිඟු

- 'දෙමුහුම් මිශ්‍රය'- පරම්පරාව ඉදිරියට ගෙනයන ගහනයෙන් නුමුහුන් බඩඉරිඟු ආර බිහි කිරීම

- දේශීය නුමුහුම් ආර යොදා ගනිමින් බිහි කරන ලද බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් තුළ ඇගයීම
- උසස් තත්ත්වයේ ප්‍රෝටීන් සහිත බඩඉරිගු දෙමුහුම් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් තුළ ඇගයීම
- විදේශීය විළඳ ඉරිගු සහ බඩඉරිගු දෙමුහුම් ඇගයීම
- බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් සහ මාපිය ආරවල බීජ නිෂ්පාදනය
- එළිමහනේ පරාගණය වූ ඉන්දුනීසියානු බඩඉරිගු ප්‍රභේද උසස් අස්වනු අත්හදා බැලීම් තුළ ඇගයීම
- එළිමහනේ පරාගණය වූ ඉන්දුනීසියානු බඩඉරිගු ප්‍රභේදවල බීජ ගුණනය
- බඩඉරිගුවල කොපු කුණුවීම සම්බන්ධයෙන් ප්‍රභේද පරීක්ෂා කර බැලීමේ ක්‍රමයක් බිහි කිරීම

කුරක්කන්

- කුරක්කන් එකතූන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සහ ප්‍රභේද අත්හදා බැලීම් තුළ ඇගයීම
- නව කුරක්කන් එකතූන් මූලික අස්වනු අත්හදා බැලීම් තුළ ඇගයීම

වෙනත් වියළි කලාපීය බෝග

- බලාපොරොත්තු තැබිය හැකි මෙනේරි ජනක ප්ලාස්ම නඩත්තු කිරීම
- බලාපොරොත්තු තැබිය හැකි තණහාල් ජනක ප්ලාස්ම නඩත්තු කිරීම
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්

එළවළු

- වැඩි අස්වැන්නක් සහ කරල්වල තත්ත්වය පිළිගත හැකි මට්ටමෙන් යුතු කහ නාරටි විචිත්‍ර වයිරසය සඳහා ප්‍රතිරෝධී/ඔරොත්තු දෙන බණ්ඩක්කා ප්‍රභේද වැඩි දියුණු කිරීම
- පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයෙන් ලද බණ්ඩක්කා ජනකප්ලාස්ම ඇගයීම
- බලාපොරොත්තු තැබිය හැකි බණ්ඩක්කා ආරවලට අදාළ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්

මෑ/එළවළු කව්පි

- පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයෙන් ලද එළවළු කව්පි ජනකප්ලාස්ම ඇගයීම සහ මුහුන් කිරීම හා ප්‍රභේද වැඩිදියුණු කිරීම සඳහා සුදුසු ආර තෝරා ගැනීම
- මෑවලට අදාළ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්
- වම්බටුවලට අදාළ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්

පලතුරු

- මිදි සහ අඹ ජනකප්ලාස්ම නඩත්තු කිරීම
- දිවුල් ජනකප්ලාස්ම ඇගයීම
- මෘදු බීජ සහිත පේර ප්‍රභේද ඇගයීම
- මිදි ප්‍රභේද 3 ක මව් වැල් නඩත්තු කිරීම
- මිදි වැල් පුහුණු කිරීමේ ක්‍රම ඇගයීම
- ඩ්‍රැගන් පෘථි ආදර්ශන ක්ෂේත්‍රයක් නඩත්තු කිරීම
- මිදිවල අස්වැන්න හා තත්ත්වය කෙරෙහි වැල් කප්පාදු කිරීමේ කාලය මගින් ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යයනය
- මිදිවැල් සකස් කිරීම සඳහා කාලානුරූපීව ව්‍යුහයන් වශයෙන් යොදා ගැනීමට සුදුසු පැළෑටි හඳුනා ගැනීම
- මිදි ගෙඩිවල තත්ත්වය වැඩිදියුණු කිරීමට ඒවාට ගිබෙරලික් ඇසිඩ් යෙදීම
- මුරුංගා ආදර්ශන ක්ෂේත්‍රයක් නඩත්තු කිරීම

කීට විද්‍යාව

- මිරිස්වල කොළ කොඩවීමේ සංකීර්ණය ඇතිවීම සහ අස්වැන්න කෙරෙහි විවිධ නයිට්‍රජන් මට්ටම් බලපාන ආකාරය
- මිරිස් කොළ කොඩවීමේ සංකීර්ණය පාලනය සඳහා කෘමිනාශක පරීක්ෂා කර බැලීම
- ලූනු වගාවේ පැළ මැක්කන් පාලනය සඳහා කෘමිනාශක පරීක්ෂා කර බැලීම
- ලූනු වගාවේ පැළ මැක්කන් පාලනය සඳහා බීජ ප්‍රතිකර්ම බලපාන ආකාරය
- කව්පි වගාවේ පත්‍ර කණින්නා මගින් ඇති කරන අස්වනු හානිය තක්සේරු කිරීම
- බඩඉරිගු වගාවේ පළිබෝධ පාලනය සඳහා බීජවලට කෘමිනාශක යෙදීම අත්හදා බැලීම

ව්‍යාධිවේදය

- මිරිස්වගාවේ කොළ කොඩවීමේ වයිරසය ඇතිවීම කෙරෙහි සෙවන මගින් ඇති කරන බලපෑම අධ්‍යයනය කිරීම
- කව්පි වගාවේ කඳ පාමුල කුණුවීම පාලනය කිරීමට අදාළව ජනකප්ලාස්ම පරීක්ෂා කර බැලීම
- කව්පි වගාවේ කඳ පාමුල කුණුවීම කළමනාකරණය කිරීම සඳහා බීම සකසන ගැඹුර, හිරු එළියෙන් පස තැම්බීමට හැරීම සහ කාබනික පෙහොර වර්ග හා ප්‍රමාණයන් වෙනස් කරමින් යෙදීම පිළිබඳව අධ්‍යයනය කිරීම
- රනිල බෝගවලට වැළඳෙන ඇස්කොච්ටා අංගමාරය කළමනාකරණය කිරීමේ පිළිවෙත් හඳුනා ගැනීම
- බඩඉරිඟු වගාවට ප්‍රධාන වශයෙන්ම වැළඳෙන දිලීර රෝග සඳහා දිලීරනාශක පරීක්ෂා කර බැලීම
- බඩඉරිඟු වගාවේ බීජ පැළ අංගමාරය කළමනාකරණය කිරීම

ශස්‍ය විද්‍යාව

- මිරිස්වල වර්ධනය හා අස්වැන්න වැඩිකර ගැනීම සඳහා ඒකාබද්ධ පාංශු කළමනාකරණ ප්‍රවේශයක් අත්හදා බැලීම
- වර්ෂාපෝෂිත තත්ත්වයන් යටතේ වගා කරන ලද රනිල බෝග සඳහා බීජ කිහිපයක් එකට ස්ථාපිත කිරීමේ ක්‍රමයක් බිහි කිරීම
- ප්‍රධාන වශයෙන්ම ලූනු වගා කරන ප්‍රදේශවල ඇති ලොකු ලූනු වගාවන්හි අග්‍රස්ථය පිළිස්සීමට හේතු හඳුනා ගැනීම
- අවාරයේ මව් බල්බ නිෂ්පාදනය පිළිබඳ මූලික ශක්‍යතා අධ්‍යයන
- මුං වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි පත්‍රවලට යූරියා, පොටෑසියම් සහ සැලිසිලික් ඇසිඩ් යෙදීමෙන් ඇතිවන බලපෑම

වල් පැළ කළමනාකරණය

- මිරිස් සහ රටකජු වගාවන්හි වල් පැළ පාලනයට ලී. 1 කට ග්‍රෑ. 50 බැගින් යොදන ක්විසලොප්-පී- ඊතයිල් දක්වන කාර්යක්ෂමතාව
- බඩ ඉරිඟු වගාවේ වල් පැළෑටි පාලනය කිරීම කෙරෙහි හැලොසල්ෆියුරන් - මීතයිල් 75 WG දක්වන කාර්යක්ෂමතාව
- ට්‍රිගර් නමැති පැළෑටිනාශකයේ [ලී. 1 කට කාෆෙන්ට්‍රසෝන් - ඊතයිල් ග්‍රෑ. 6.5 + ලී. 1 කට ග්ලයිෆොසේට් (a.e) CS ග්‍රෑ.179] වර්ෂාවට ඔරොත්තු දීමේ හැකියාව
- රනිල බෝග වගාවේ ඇතිවන වල් පැළ පාලනය සඳහා ඉමැසෙතපයර් දක්වන කාර්යක්ෂමතාව
- සැෆ්ලුෆෙනසිල් 70%WG සතු වල් පැළ පාලන කාර්යක්ෂමතාවය
- සැෆ්ලුෆෙනසිල් 70% WG අවශේෂ මගින් ඇති කරන බලපෑම
- බඩඉරිඟු වගාවේ ඇතිවන වල් පැළ පාලනය සඳහා නිකොසල්ෆියුරන් දක්වන කාර්යක්ෂමතාව
- ලූනු වගාවේ වල් පැළ පාලනය සඳහා ලී. 1 කට ග්‍රෑ. 480 බැගින් යොදන ඔක්සිෆ්ලුඅෆෙන් (a.e) දක්වන කාර්යක්ෂමතාව

පසෙහි සරුබව, පොහොර සහ පරිසරය

- උසස් ශ්‍රේණියේ එප්පාවල රොක් ෆොස්ෆේට් සහ එප්පාවල සිංගල් සුපර් ෆොස්ෆේට් යෙදීමට සාපේක්ෂව බඩඉරිඟු වගාව ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳව අධ්‍යයනය කිරීම
- බඩඉරිඟු වගාවේ ඒකාබද්ධ පැළෑටි පෝෂක ක්‍රමය සඳහා සුදුසු කාබනික පොහොර හඳුනා ගැනීම
- මිරිස්වල වර්ධනය සහ අස්වැන්න සඳහා යූරියා බිඳිති සහ කැට වශයෙන් යෙදීම මගින් ඇති කරන සංසන්දනාත්මක බලපෑම
- බඩඉරිඟු වගාව සඳහා පොටෑසියම් පොහොර යෙදීමට සුදුසු කාලය නිශ්චය කර ගැනීම
- පත්‍ර වර්ණ සටහන මගින් බඩඉරිඟුවල නයිට්‍රජන් අවශ්‍යතාව දිගුකාලීනව නිශ්චය කිරීම
- පාංශු පරීක්ෂණ වැඩසටහන
- බඩඉරිඟු වගාව පෙව පටල පෙව පොහොර (biofilm bio fertilizer) යෙදීම කෙරෙහි ප්‍රතිචාර දක්වන ආකාරය අධ්‍යයනය කිරීම

ජල කළමනාකරණය

- රතු දුඹුරු පසෙහි ගිල්වූ පාත්ති සහිත මතුපිට ජල සම්පාදන ක්‍රමය සඳහා ප්‍රශස්ත වන පාත්තියෙහි ප්‍රමාණය නිශ්චය කර ගැනීම

(ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘතියකි.)

- රතු දුඹුරු පසෙහි ගිල්වූ පාත්ති සහිත මතුපිට ජල සම්පාදන ක්‍රමය තුළ පාංශු තෙතමනය අඩුවන රටාවන් නිශ්චය කර ගැනීම (ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘතියකි.)

- DLIb කෘෂි පාරිසරික කලාපයේ මනාව ජල වහනය වන රොඩුස්ට්ඇල්ෆ්ස් පසෙහි වගා කරන මිරිස්වල වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ජල සම්පාදනය කරන කාල පරතරය මගින් ඇති කරන බලපෑම (ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘතියකි.)

ආහාර තාක්ෂණය

- අභිජනකයින් විසින් ඉදිරිපත් කරන ලද වෙනත් ක්ෂේත්‍ර බෝග/පලතුරු/එළවළු ප්‍රභේදවල/ අභිජනන ආරවල තත්ත්වය ඇගයීම

- ධාන්‍ය හා රනිල මිශ්‍ර පිටි භාවිත කර අගය එකතු කිරීම

- රළු ධාන්‍ය සහ රනිල බෝගවල පසු අස්වනු මෙහෙයුම් කටයුතු අතරතුර සිදුවන අස්වනු හානිය නිශ්චය කර ගැනීම

- රළු ධාන්‍ය සහ රනිල වර්ග යොදා ගනිමින් නිපද වූ බඳින ලද ස්නැක්ස්වල තත්ත්වය ඇගයීම

- මිරිස් ප්‍රභේදවල අමු මිරිස් අස්වැන්නෙහි තත්ත්වය ඇගයීම

- නිර්දේශිත වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රභේදවල ආසන්න සංයුතිය ඇගයීම

අභිජනන බීජ නිෂ්පාදනය

- මිරිස් (MI - ග්‍රීන් සහ MI 2), බඩඉරිඟු (හද්‍රා, රුවන්, සම්පත් ප්‍රභේදයේ මාපිය ආර සහ සම්පත්), කුරක්කන් (ඕෂධ සහ රාවණා), මුං (MI 5, MI 6 සහ ආරි), උඳු (MI 1 සහ අනුරාධ), කව්පි (ධවල, MI 35, වරුණි සහ බොම්බේ), සෝයා බෝංචි (PB 1), එළවළු කව්පි (BS 1), තක්කාලි (KC 1), බණ්ඩක්කා (හරිත) සහ කරවිල (MC 43)යන එළවළුවල නිර්දේශිත ප්‍රභේදවල අභිජනන බීජ නිෂ්පාදනය

- නිර්දේශිත ලූනු ප්‍රභේදයේ (දඹුල්ල වරණයේ) අභිජනන මව් බල්බ සහ බීජ නිෂ්පාදනය

තාක්ෂණය බෙදා හැරීම

- පර්යේෂණ සොයා ගැනීම් පර්යේෂණ ප්‍රකාශන මගින් ප්‍රකාශයට පත් කිරීම

- පළාත් තාක්ෂණික කාර්ය කණ්ඩායම් සහ වෙනත් කන්න සමාලෝචන රැස්වීම් හරහා තොරතුරු හුවමාරු කර ගැනීම

- පුහුණු වැඩසටහන්, දේශන, වැඩමුළු, ක්ෂේත්‍ර ආදර්ශන, පැළෑටි සායන, ක්ෂේත්‍ර දින, ප්‍රදර්ශන, තාක්ෂණික උපදෙස් මගින් ද පුවත්පත් ලිපි සහ ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන් මගින් ජන මාධ්‍ය හරහා ද තාක්ෂණය ප්‍රචාරණය කිරීම

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරි/සේවක සංඛ්‍යාව
අධ්‍යක්ෂ	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ	02
පර්යේෂණ නිලධාරි	30
කෘෂි ආර්ථික විද්‍යාඥ	01
වැඩ සටහන් සහකාර (කෘෂිකර්ම)	04
පර්යේෂණ සහකාර	16
කෘෂිකර්ම උපදේශක	01
පර්යේෂණ උපසහකාර	09
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	16
කාර්යාල කාර්ය සහායක	01
රියදුරු	05
බද්ධකරු	01
ගබඩාකරු	01
සංචාරක බංගලා භාරකරු	01
ට්‍රැක්ටර් ක්‍රියාකරු	04
මුරකරු	08
කම්කරු	142
කම්කරු (කොන්ත්‍රාත්)	224
එකතුව	**467**

2.1.1 ධාන්‍ය රනිල සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අඟුණාකොළපැලැස්ස

හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ධාන්‍ය රනිල සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට පැවරී ඇති ප්‍රධාන වගකීම වන්නේ ධාන්‍ය රනිල, තෙල් බෝග මෙන්ම වගකීම පැවරී ඇති පලතුරු හා එළවළු බෝග වගාව සඳහා අවශ්‍ය තාක්ෂණයන් ජනනය කිරීමයි.

මෙම මධ්‍යස්ථානයේ අරමුණු වන්නේ විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ජල සම්පාදිත හා වර්ෂාපෝෂිත පරිසරයන්ට අනුවර්තනය වීමේ හැකියාවෙන් යුක්ත තෙල් බෝග සහ ධාන්‍ය රනිල ඇතුළු වැඩි අස්වනු ගෙන දෙන එමෙන්ම පිළිගත හැකි තත්වමය ලක්ෂණවලින් යුතු වෙනත් ක්ෂේත්‍ර බෝග බිහි කිරීම, පළිබෝධ, රෝග සහ වල් පැළෑටි හේතුවෙන් ඇතිවන බෝග හානි අවම කර ගැනීම සඳහා පැළෑටි සංරක්ෂණ ක්‍රමෝපාය සකස් කිරීම, නිෂ්පාදන පිරිවැය අඩුකර ගන්නා අතරම බෝග හා ඉඩම්වල ඵලදායිතාව වැඩිකර ගැනීම පිණිස දියුණු ශස්‍ය විද්‍යාත්මක පිළිවෙත් බිහි කිරීම, වියළි කලාපයේ බෝග වගා කරන පරිසර පද්ධති සඳහා දියුණු පාංශු හා ජල කළමණාකරණ සහ සංරක්ෂණ ක්‍රියාමාර්ග බිහි කිරීම සහ නව වැඩිදියුණු කළ ප්‍රභේදවල හා තාක්ෂණයන්හි අනුවර්තන හැකියාව පරීක්ෂා කර බැලීමයි.

අයවැය

වගු අංක 2.1.1..1 : වාර්ෂික අයවැය - 2011

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	10,980,000	8,786,669	80
පුනරාවර්තන	14,001,200	13,593,178	97
ව්‍යාපෘති			
අහිතකර තෙතමන තත්වයන්ට ඔරොත්තු දෙන කව්පි ප්‍රභේද වැඩිදියුණු කිරීම	755,000	753,608	100
දකුණු සහ ඌව පළාත්වල රටකජු වගාකරන ප්‍රදේශයන්හි ඇති පසෙහි වත්මන් සල්ෆර් මට්ටම	460,000	234,817	51
මැදකන්න බෝගයක් වශයෙන් වගාකිරීමට සුදුසු මුං ප්‍රභේද බිහි කිරීම	315,000	305,198	97
මුංවලට විවිත්‍ර වයිරසය වැළඳීම වළක්වා ගැනීම සඳහා වඩාත්ම ඵලදායී ක්‍රියාමාර්ග හඳුනා ගැනීම	613,800	611,661	100
ඉහළ අස්වනු ගෙනදෙන සුදු බීජ සහිත තල ප්‍රභේදය වැඩි දියුණු කිරීම	609,500	467,013	77
ඉහළ අස්වනු ගෙනදෙන විශාල බීජ සහිත රටකජු ප්‍රභේද බිහි කිරීම	348,000	328,592	94

පැඟිරි ප්‍රභේද ඇගයීම	1,420,000	1,112,750	78
එළවළු - කව්පි වැඩසටහන	75,000	75,000	100
වට්ටක්කා ප්‍රභේද බිහි කිරීමේ වැඩසටහන	400,000	360,659	90
ප්‍රභේද බිහි කිරීම, බීජ නිෂ්පාදනය සහ සම්පත් නමැති දේශීය දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේදය වැඩිදියුණු කිරීම	300,000	305,106	102
කාබනික බෝග නිෂ්පාදනය	1,000,000	906,744	91
දෙමුහුම් බීජ නිෂ්පාදනය	228,350	214,013	94
ආදර්ශ ගම්මාන වැඩසටහන	100,000	48,780	49
ඉඩම් සංවර්ධන වැඩසටහන (අපි වවමු - රට නගමු)	7,000,000	6,958,835	-
එකතුව	38,705,805	35,143,511	91

ප්‍රගතිය

පර්යේෂණ

පැළෑටි අභිජනනය (බෝග වැඩිදියුණු කිරීම)

තෙල් බෝග

- අංකුර අංගමාර රෝගයට ඔරොත්තු දෙන ප්‍රභේද පිළිබඳ අනුවර්තන අත්හදා බැලීම්-ආර 2ක් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් සඳහා තෝරා ගන්නා ලද අතර අත්හදා බැලීම් 2ක් ස්ථාන 6කදී සම්පූර්ණ කරන ලදී.
- මධ්‍ය කාලීන රටකජු ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්-ආර 5ක් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් සඳහා තෝරා ගන්නා ලද අතර අත්හදා බැලීම් 2ක් ස්ථාන 5කදී සම්පූර්ණ කරන ලදී.
- බීජාවරණය රතු පැහැති රටකජු ප්‍රභේදය පිළිබඳ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් - ස්ථාන 6කදී අත්හදා බැලීම් 2ක් සම්පූර්ණ කරන ලදී.
- වලව, ඉන්දි , ටිකිරි. සහ තිස්ස යන එක් එක් රටකජු ප්‍රභේදයෙන් කි.ග්‍රෑ. 20 බැගින් මූලික බීජ නිෂ්පාදනය කරන ලදී.
- විශාල බර සහිත රටකජු ආර ඇගයීම - ආර 15ක් ලක්ෂණීකරණය කර ඉන් 7ක් තෝරා ගන්නා ලදී.
- මධ්‍ය කාලීන රටකජු ආර ඇගයීම - මෙමගින් ආර 10ක් තෝරා ගැනිණි.
- වලව ප්‍රභේදයෙන් කි.ග්‍රෑ 101.7ක්, ටිකිරි ප්‍රභේදයෙන් කි.ග්‍රෑ. 130ක්, ඉන්දි ප්‍රභේදයෙන් කි.ග්‍රෑ 139ක් සහ තිස්ස ප්‍රභේදයෙන් කි.ග්‍රෑ. 190.3ක් වශයෙන් රටකජු අභිජනන බීජ නිපදවන ලදී.
- එක් ආරකින් කි.ග්‍රෑ. 20 බැගින් රටකජු ආර 4ක බීජ අනාගත බීජ අවශ්‍යතාව සපුරාලීම පිණිස ගුණනය කරන ලදී.
- කළු පැහැති බීජ සහිත තල ආර ඇගයීමට ලක්කර ඉන් ආර 6ක් තෝරා ගැනිණි.
- උමා නමැති තල ප්‍රභේදයේ අභිජනන බීජ කි.ග්‍රෑ 12.7ක් නිපදවන ලදී.

- එක් එක් ආරෙන් කි.ග්‍රෑ. 2 බැගින් තෝරාගත් අබ ආර 7ක බීජ ගුණනය කරන ලදී.

ධාන්‍ය රනිල බෝග

- එෆ් 1 පරම්පරා 16ක් දෙමුහුම් කර වැඩිදියුණු කිරීමෙන් පසු ඉදිරියට ගෙන ගොස් ඉන් ආර 16ක් එෆ් 2 පරම්පරාව සඳහා තෝරා ගන්නා ලදී.

- එකිනෙකට සමගාමීව පරිණාතවන තෝරාගත් මුං ආර පිළිබඳ මූලික අස්වනු අත්හදා බැලීම් තුළින් ආර 7ක් තෝරා ගන්නා ලදී.

- තෝරාගත් මුං ආර පිළිබඳ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් තුළින් ආර 7ක් තෝරා ගැනිණි.

- නිදහස් කරන ලද ප්‍රභේදවල බීජ ගුණනය සඳහා අත්හදා බැලීම් ස්ථාපිත කරන ලදී.

- දෙමුහුම් වැඩසටහන - II (තෝරාගත් මුං දෙමුහුම්වලට අදාළ දෙමුහුම් දිරිය සහ ආවේණිකතාව) අත්හදා බැලීම් ස්ථාපිත කරන ලදී.

- උසස් තත්වයේ ප්‍රෝටීන් ඇති පින්න මුං ජනකප්ලාස්ම හඳුනා ගැනීම පිණිස අත්හදා බැලීම් ස්ථාපිත කරන ලදී.

- අස්වැන්න ද සහ පළිබෝධ හා රෝගවලට ඔරොත්තු දෙන ආකාරය ද සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා ක්ෂේත්‍ර තත්වයන් යටතේ කව්පි ජනකප්ලාස්ම අගයා ඉන් ආර 3ක් තෝරා ගන්නා ලදී.

- වඩා හොඳින් ක්‍රියාත්මක වන මධ්‍ය කාලීන කව්පි ආර තෝරා ගැනීම පිණිස පවත්වන ලද ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් තුළින් ක්ෂේත්‍ර ඇගයීම් කර ආර 10ක් තෝරා ගන්නා ලදී.

- වඩා හොඳින් ක්‍රියාත්මක වන මධ්‍ය කාලීන කව්පි ආර තෝරා ගැනීම පිණිස පවත්වන ලද මූලික අස්වනු අත්හදා බැලීම් තුළින් ක්ෂේත්‍ර ඇගයීම් කර ආර 15ක් තෝරා ගන්නා ලදී.

- වඩා හොඳ පැළෑටි ව්‍යුහයක් සහිත ඉහළ අස්වනු ගෙනදෙන කෙටි/ මාධ්‍ය කාලීන (දින 60-75) කව්පි ප්‍රභේද බීහි කිරීම (එෆ්3 පරම්පරාව පිළිබඳව ඇගයීමේදී)යටතේ ක්ෂේත්‍ර ඇගයීම තුළින් මුහුන් 10ක එෆ් 3 පරම්පරා ලබා ගැනිණි.

- මහ කන්නයේ දෙමුහුම් වැඩසටහන සඳහා සුදුසු මධ්‍ය කාලීන කව්පි ප්‍රභේදයක් බීහි කිරීම පිණිස මුහුන් 10ක් ඇති කෙරිණි.

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සඳහා නම් කරන ලද කව්පි ආරවල බීජ ගුණනය - ස්ථාන 7කදී ක්ෂේත්‍ර ඇගයීම් කර ආර 6ක් තෝරා ගන්නා ලද අතර ආර 14ක් පිළිබඳ ක්ෂේත්‍ර ඇගයීම් සිදු කෙරෙමින් පවතී.

- කොල්ලු ජනකප්ලාස්ම ඇගයීම - ස්ථාන 07ක සිදුකළ ක්ෂේත්‍ර ඇගයීම් තුළින් ආර 6ක් තෝරා ගන්නා ලදී.

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සඳහා නම් කරන ලද කොල්ලු ආරවල බීජ ගුණනය

ශස්‍ය විද්‍යාව

- බම්බාරා ගුවුන්ඩිනට් බෝගයේ ක්‍රියාකාරීත්වය කෙරෙහි පැළෂනත්වය මගින් ඇති කරන බලපෑම ඇගයීම තුළින් ප්‍රශස්ත පැළෂනත්වය සොයා ගැනිණි.

- නව කව්පි ප්‍රභේදවලට අදාළ පැළෂනත්ව නිර්දේශය නිශ්චය කර ගැනීමට පවත්වන ලද පරීක්ෂණ තුළින් ප්‍රශස්ත පැළෂනත්වය සොයා ගන්නා ලද අතර එම ප්‍රතිඵල ලබන වසරේ සනාථ කර ගත යුතුය.

- අබ බෝගයේ ක්‍රියාකාරීත්වය කෙරෙහි පැළෂනත්වය මගින් ඇති කරන බලපෑම ඇගයීමේ පරීක්ෂණය යටතේ එක් කන්නයක එක් අත්හදා බැලීමක් නිමකරන ලද අතර එහි ප්‍රතිඵල මීළඟ කන්නවලදී සනාථ කර ගත යුතුය.

- කව්පි ප්‍රභේද ඇගයීමට අදාළව ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීමක් ස්ථාපිත කරන ලදී.

- ප්‍රභේද ඇගයීම - කුරක්කන් පිළිබඳ පළමු ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම නිම කරන ලද අතර 2වන අත්හදා බැලීම ස්ථාපිත කරන ලදී.

- ප්‍රභේද ඇගයීම - කොල්ලු පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හද බැලීමක් ස්ථාපිත කරන ලදී.

- ප්‍රභේද ඇගයීම - මිරිස් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හද බැලීම නිමකර දෙවන අත්හද බැලීම ස්ථාපිත කරන ලදී.

පෛව තාක්ෂණය

- උද්භිදංග පළිබෝධනාශක වශයෙන් යොදා ගැනීම සඳහා දේශීය ඖෂධ පැළෑටි පිළිබඳ ඇගයීම් කටයුතු සිදු කිරීම - පැළෑටි විශේෂ 13ක් අතරින් විශේෂ (ඇත් තෝර, ඇහැල, බෝගන්විලා සහ කුඹුක්) තෝරා ගන්නා ලද අතර තෝරගත් එම විශේෂ පිළිබඳ ඇගයීම සිදුවෙමින් පවතී.

- රටකජුවලට වැළඳෙන ස්ක්ලෙරොටියම් රොල්ෆ්සි (*Sclerotium rolfsii*) පාලනය කිරීම සඳහා උද්භිදංග නිපැයුම් සතු කාර්යක්ෂමතාව පිළිබඳව අධ්‍යයනය කෙරෙමින් පවතී.

- තෝරා ගන්නා ලද යටෝක්ත පැළෑටි විශේෂ දිලිරවලට එරෙහිව ක්‍රියාකරන ආකාරය පිළිබඳව ඇගයීම් කෙරෙමින් පවතී (නලස්ථ අධ්‍යයනය).

- උසස් තත්වයේ හා ප්‍රමාණාත්මකව වැඩි අස්වැන්නක් ගෙනදෙන එමෙන්ම මනා ලක්ෂණවලින් යුත් පැපොල් මුදු පුල්ලි රෝගයට ඔරොත්තු දෙන ප්‍රභේද/යක් බිහි කිරීමේ කාර්යය සිදු කෙරෙමින් පවතී.

- දේශීය වශයෙන් දක්නට ලැබෙන පැපොල් මුදු පුල්ලි වයිරසයට ඔරොත්තු දෙන ලක්ෂණවලින් යුතු වගා ප්‍රභේද එක්රැස් කර ඒවා ඇගයීම පිණිස ස්ථාපිත කරන ලදී.

- වයිරස්වලට ඔරොත්තු දෙන කෙසෙල් සහ තුඹ කරවිල ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් (Protocols) සකස් කිරීම (පරීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී.)

ව්‍යාධිවේදය

- ට්‍රිකෝඩර්මා හර්සියානා (*Trichoderma harsiana*) යොදා ගනිමින් ස්ක්ලෙරොටියම් රොල්ෆ්සි (*Sclerotium rolfsii*) පාලනය කිරීමට සුදුසුම ක්‍රමය හඳුනා ගැනීම - ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා අබණ්ඩව මෙම පර්යේෂණය සිදු කෙරෙනු ඇත.

- රටකජුවලට වැළඳෙන ස්ක්ලෙරොටියම් රොල්ෆ්සි (*Sclerotium rolfsii*) පාලනය කිරීම සඳහා පැළෑටි කොටස් දක්වන හැකියාව අධ්‍යයනය කිරීම - ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා පර්යේෂණය අබණ්ඩව සිදු කෙරෙනු ඇත.

- කඳ හා මුල් කුණුවීමේ රෝගය සම්බන්ධයෙන් තල ආර පරීක්ෂා කර බැලීම - පර්යේෂණය අබණ්ඩව සිදු කෙරෙනු ඇත. එම රෝගයට ඔරොත්තු දෙන ලක්ෂණවලින් සමන්විත තල ආර 6ක් තෝරා ගන්නා ලදී.

කීට විද්‍යාව

- අඹ වගාව ආශ්‍රිත ප්‍රධාන පළිබෝධ හඳුනා ගැනීම හා කළමණාකරණය

- පළිබෝධනාශක නොයෙදූ තත්වය යටතේ සිටින සත්ව විවිධත්වය පිළිබඳ දත්ත එක්රැස් කිරීමේ කටයුතු හා සම්බන්ධ පර්යේෂණ

- ගබඩා තත්වයන් යටතේ කැලසොබ්‍රුකස් මැක්‍යුලේට්ස් (*Callosobruchus macuates*) පාලනය කිරීම සඳහා හානිකර වන ප්‍රශස්ත උණුසුම් හා ශීත තත්වයන් හඳුනා ගැනීම - පර්යේෂණය සිදු කෙරෙමින් පවතී.

- විවිත්‍ර වයිරස් ආසාදනය වීම මර්ධනය කිරීම කෙරෙහි අනෙකුත් වගා පිළිවෙත් බලපාන ආකාරය ඇගයීම

- මුං වගාවේ විවිත්‍ර වයිරස් රෝගය මතුවීම පාලනය කිරීම සඳහා ඵලදායී කළමනාකරණ පිළිවෙත් මාලාවක් හඳුනා ගැනීම - පිළිවෙත් මාලා 7ක් පරීක්ෂා කර බලා වඩා යෝග්‍ය පිළිවෙත් එකතූන් 2ක් තෝරා ගන්නා ලදී.

- විවිත්‍ර වයිරසය සඳහා ප්‍රතිරෝධී වන්නේදැයි දැන ගැනීම සඳහා මුං ජනකප්ලාස්ම ඇගයීම - සංයෝග 6ක්

පරීක්ෂා කර බලා එක් සංයෝගයක් හඳුනා ගන්නා ලදී.

පාංශු විද්‍යාව

- සල්ෆර් පිළිබඳ වත්මන් තත්වය හඳුනා ගැනීම සහ සල්ෆර් නිර්දේශ - අත්හද බැලීම් 2ක් ස්ථාපිත කර නියැදි 350ක් විශ්ලේෂණය කෙරිණි.

- විවිධ වගා තත්වයන් යටතේ වෙනත් ක්ෂේත්‍ර බෝගවල පෝෂක අවශ්‍යතාව - මේ සම්බන්ධයෙන් සින්ක් මට්ටම් 5ක් පරීක්ෂා කර බලන ලද අතර හෙ. 1කට කි.ග්‍රෑ 2 දක්වා සින්ක් යෙදීම කෙරෙහි බෝග ප්‍රතිචාර දැක්විය.

එළවළු බෝග වැඩිදියුණු කිරීම

- තුඹ කරවිල පිළිබඳ බෝග වැඩිදියුණු කිරීම් සහ නිෂ්පාදන වැඩසටහන

- දෙමුහුම් බණ්ඩක්කා ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන දෙමුහුම් 72ක් බිහි කෙරිණි.

- දෙමුහුම් බණ්ඩක්කා ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන-ජනකප්ලාස්ම 46ක් එක්රැස් කර ගන්නා ලදී.

- බම්බාරා ග්‍රවුන්ඩ්නට් බෝගය වැඩිදියුණු කිරීමේ වැඩසටහන - හෙ. 1කට කි.ග්‍රෑ. 650ක් නිපදවන ලදී.

- එළවළු කව්පි ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන-ආර 3ක් තෝරා ගන්නා ලදී.

- වම්බටු ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන- ආර 2ක් තෝරා ගන්නා ලදී.

2012 වසර සඳහා සැලැස්ම

පැළෑටි අභිජනනය - තෙල් බෝග

- අංකුර අංගමාර රෝගයට ප්‍රතිරෝධී රටකජු ප්‍රභේද පිළිබඳ ප්‍රභේද අනුවර්තන අත්හද බැලීම

- මධ්‍ය කාලීන රටකජු ප්‍රභේද පිළිබඳ අනුවර්තන අත්හද බැලීම

- බීජාවරණය රතු පැහැති රටකජු ප්‍රභේදය පිළිබඳ අනුවර්තන අත්හද බැලීම

- විශාල බීජ සහිත රටකජු ප්‍රභේද පිළිබඳ මූලික අස්වනු අත්හද බැලීම

- මධ්‍ය කාලීන රටකජු ප්‍රභේද පිළිබඳ මූලික අස්වනු අත්හද බැලීම

- වලව, ඉන්දි . ටිකිරි සහ තිස්ස යන රටකජු ප්‍රභේදවල මූලික බීජ නිෂ්පාදනය

- වලව, ඉන්දි . ටිකිරි සහ තිස්ස යන රටකජු ප්‍රභේදවලඅභිජනනබීජ නිෂ්පාදනය

- ඉදිරි බීජ අවශ්‍යතාව සපුරාලීම සඳහා රටකජු එකතූන් 4ක බීජ ගුණනය

- බීජ කළු පැහැති තල ප්‍රභේදය පිළිබඳ මූලික අස්වනු අත්හද බැලීම්

- මාලි සහ උමා යන තල ප්‍රභේදවල අභිජනන බීජ නිෂ්පාදනය

- තෝරාගත් අබ ආරවල බීජ ගුණනය

පැළෑටි අභිජනනය - ධාන්‍ය රනිල

- මුංවල එෆ් 1 පරම්පරා 16ක් දෙමුහුම් කිරීම සහ වැඩිදියුණු කර ඉදිරියට ගෙනයාම

- සමගාමීව පරිණත වන තෝරාගත් මුං ආර පිළිබඳ මූලික අස්වනු අත්හද බැලීම

- තෝරාගත් මුං ආරවලට අදාළ ප්‍රධාන අස්වනු අත්හද බැලීම්

- බීජ ගුණනය (නිර්දේශිත මුං ප්‍රභේද)

- දෙමුහුම් වැඩසටහන (තෝරාගත් මුං දෙමුහුම් වල දෙමුහුම් දිරිය හා ආවේණිකතාව)

- උසස් තත්වයේ ප්‍රෝටීන් ඇති පින්න මුං ජනකප්ලාස්ම හඳුනා ගැනීම

- තෝරා ගන්නා ලද මුං ආර පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂණ අත්හද බැලීම්

- තෝරා ගන්නා ලද මුං ආර පිළිබඳ ප්‍රභේද අනුවර්තන පරීක්ෂාව

- අස්වැන්න සහ පළිබෝධ හා රෝගවලට ඔරොත්තු දෙන ආකාරය දැන ගැනීම සඳහා කව්පි ජනකප්ලාස්ම ඇගයීම
- තෝරා ගන්නා ලද මධ්‍ය කාලීන කව්පි ආර පිළිබඳ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම්
- මධ්‍ය කාලීන කව්පි ආර පිළිබඳ මූලික අස්වනු අත්හදා බැලීම්
- වඩා හොඳ පැළෑටි ව්‍යුහයකින් සමන්විත ඉහළ අස්වනු ගෙනදෙන කෙටි/ මධ්‍ය කාලීන (දින 60-75) කව්පි ප්‍රභේදයක් බිහි කිරීම (එෆ් 3 පරම්පරාව ඇගයීම)
- වර්ෂාපෝෂිත මහ කන්නය සඳහා මධ්‍ය කාලීන කව්පි ප්‍රභේදයක් බිහි කිරීමේ දෙමුහුම්කරණ වැඩසටහන
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සඳහා නම් කරන ලද කව්පි ආරවල බීජ ගුණනය
- කොල්ලු ජනකප්ලාස්ම ඇගයීම
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සඳහා නම් කරන ලද කොල්ලු ආරවල බීජ ගුණනය

ශස්‍ය විද්‍යාව

- බම්බාරා ගුවුන්ඩිනට්වල අස්වැන්න කෙරෙහි පැළෂනත්වය මගින් ඇති කරන බලපෑම ඇගයීම
- නව කව්පි ප්‍රභේද සඳහා පැළෂනත්ව නිර්දේශය නිශ්චය කිරීම
- අඹ බෝගයේ ක්‍රියාකාරීත්වය කෙරෙහි පැළෑටි ෂනත්වය මගින් ඇති කරන බලපෑම ඇගයීම
- තෝරාගත් කව්පි ආර පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂණ අත්හදා බැලීම්
- තෝරාගත් කුරක්කන් ආර පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂණ අත්හදා බැලීම්
- තෝරාගත් කොල්ලු ආර පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂණ අත්හදා බැලීම්
- වර්ෂාපෝෂිතව වගා කරන ලද කව්පි බෝගයේ තිරසාරත්වය කෙරෙහි ස්ථානීය වැසි ජල සංරක්ෂණය මගින් ඇති කරන බලපෑම
- දකුණු වියළි කලාපයේ (DL1b, DL5) වර්ෂාපෝෂිත කෘෂිකාර්මික ක්‍රමය පිළිබඳව අධ්‍යයනය කිරීම
- මුං බීජ කෙරෙහි නියගය මගින් ඇති කරන අහිතකර තත්වය පාලනය කර ගැනීම පිණිස වර්ෂාපෝෂිතව සිදු කරන මුං වගාවේදී අතිරේක ජල සම්පාදනය මගින් ඇති කරන බලපෑම
- තල බෝගය රෝපණය කිරීමට ප්‍රශස්ත කාලය සොයා ගැනීම
- රටකජුවල (*Arachis hypogaea* L.) විවිධ වර්ධන අදියර, අස්වැන්න හා පෝෂක සංයුතිය කෙරෙහි අහිතකර ජල තත්වයන් මගින් ඇති කරන බලපෑම

වල් පැළෑටි විද්‍යාව

- රටකජු අස්වැන්න කෙරෙහි වල් පැළෑටි මගින් ඇති කරන බලපෑම අධ්‍යයනය කිරීම සහ රටකජු බෝගය සහ වල් පැළෑටි අතර තරඟකාරීත්වයේ තීරණාත්මක කාල පරිච්ඡේදය නිශ්චය කර ගැනීම

පාංශු විද්‍යාව

- දෙමුහුම් බඩඉරිඟුවල (සම්පත් නමැති ප්‍රභේදයේ) වර්ධනය හා අස්වැන්න කෙරෙහි නයිට්‍රජන් සහ සින්ක් මගින් ඇති කරන බලපෑම
- සමස්ත සහ ප්‍රයෝජ්‍ය පාංශු නයිට්‍රජන් කෙරෙහි විවිධ කාබනික ද්‍රව්‍ය මගින් ඇති කරන බලපෑම
- බම්බාරා ගුවුන්ඩිනට් සඳහා පොහොර නිර්දේශය
- තුඹ කරවිල සඳහා පොහොර නිර්දේශය

ජල කළමනාකරණය

- ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ විවිධ පස් වර්ගවලට සුදුසු විවිධ මතුපිට ජල සම්පාදන සැලැසුම් සඳහා ප්‍රශස්ත වන ලියද්දෙහි ප්‍රමාණය (basin size) නිශ්චය

කර ගැනීම (ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘතිය)

- ශ්‍රී ලංකාවේ DL1b සහ DL5a කෘෂි පාරිසරික කලාපවල වගාකරන මුං බෝගයේ බෝග සංගුණකය සහ ජල අවශ්‍යතා නිශ්චය කිරීම

- අඟුණාකොළපැලැස්ස ගොවිපළ ක්ෂේත්‍රය වෙනුවෙන් පාංශු ලවණතා සිතියමක් සකස් කිරීම

පෛව තාක්ෂණය

- උද්භිදාංගමය පළිබෝධනාශක වශයෙන් භාවිත කිරීම සඳහා දේශීය ඖෂධ පැළෑටි පිළිබඳ ඇගයීම් කටයුතු සිදු කිරීම

- රටකජුවල ස්ක්ලෙරොටියම් රොල්ෆ්සි (*Sclerotium rolfsii*) පාලනය කිරීම සඳහා උද්භිදාංගමය නිපැයුම්වල කාර්යක්ෂමතාව අධ්‍යයනය කිරීම

- උසස් තත්වමය සහ ප්‍රමාණාත්මක අස්වනු ලක්ෂණවලින් යුතු පැපොල් මුදු පුල්ලි වයිරසයට ප්‍රතිරෝධී ප්‍රභේදය/ප්‍රභේද බිහි කිරීම

- ෆියුසාරියම් (*Fusarium*) හිටුමැරීමේ රෝගයට ප්‍රතිරෝධීතාව / ඔරොත්තු දීමේ හැකියාව ඇති කිරීම සඳහා කෙසෙල්වල නලස්ථ විකෘති ජනනය

- තුඹ කරවිල (*Momordica dioica*) සඳහා සුදුසු ක්ෂුද්‍ර ප්‍රචාරණ ක්‍රමයක් බිහි කිරීම

ව්‍යාධිවේදය

- ට්‍රිකොඩර්මා හර්සියානා (*Trichoderma harsiana*) භාවිතා කර ස්ක්ලෙරොටියම් රොල්ෆ්සි (*Sclerotium rolfsii*)පාලනය කිරීමේදී පැළෑටි නිස්සාරක දක්වන කාර්යක්ෂමතාව අධ්‍යයනය කිරීම

- රටකජුවල ස්ක්ලෙරොටියම් රොල්ෆ්සි (*Sclerotium rolfsii*) පාලනය කිරීමේදී පැළෑටි නිස්සාරක දක්වන කාර්යක්ෂමතාව අධ්‍යයනය කිරීම

- කඳ හා මුල් කුණුවීමේ රෝගයට අදාළව තල ආර පරීක්ෂා කර බැලීම

කීට විද්‍යාව

- මුං වගාවට වැළඳෙන විවිත්‍ර වයිරස් ආසාදනය පාලනය කිරීම සඳහා යොදාගත හැකි කළමණාකරණ පිළිවෙත් මාලාවක් හඳුනා ගැනීම

- මුං වගාවට විවිත්‍ර වයිරසය වැළඳීම මර්ධනය කිරීම කෙරෙහි විවිධ ඒකාබද්ධ ක්‍රම මගින් ඇතිවන බලපෑම සසඳා බැලීම

- මොසායික් වයිරසයට ඔරොත්තු දෙන්නේදැයි දැන ගැනීම සඳහා මුං ජනකප්ලාස්ම පරීක්ෂා කර බැලීම

- සත්ව විවිධත්වය හඳුනා ගැනීම සහ අබ වගාව ආශ්‍රිත ප්‍රධාන පළිබෝධ සඳහා ඵලදායී පාලන පිළිවෙත් මාලාවක් සකස් කිරීම

- ගබඩා තත්වයන් යටතේ කැලසොබ්‍රැකස් මැක්‍යුලේටිස් (*Callosobruchus maculates*) පාලනය කිරීම සඳහා ඔවුන්ට අහිතකර වන ප්‍රශස්ත උණුසුම් හා ශීත තත්වය හඳුනා ගැනීම

ආහාර විද්‍යාව සහ තාක්ෂණය

- ශ්‍රී ලංකාවේ වගා කරන මුං ප්‍රභේදවල පෝෂණ තත්වය ඇගයීම

උද්‍යාන බෝග අංශය

එළවළු බෝග අංශය

- නිර්දේශිත තුඹ කරවිල ප්‍රභේදවල ජායාංගී ග්‍රාහක ස්ථාපිත කර නඩත්තු කිරීම

- තුඹ කරවිලවල ජනකප්ලාස්ම නඩත්තුව හා සංරක්ෂණය

- නිර්දේශිත තුඹ කරවිල ප්‍රභේදවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

- වට්ටක්කා ජනකප්ලාස්ම එක්රැස් කිරීම, ඇගයීම සහ තෝරා ගැනීම

- දෙමුහුම් බණ්ඩක්කා ප්‍රභේද බිහි කිරීමේ වැඩසටහන

- දෙමුහුම් වට්ටක්කා බිහි කිරීමේ වැඩසටහන

- බම්බාරා ගුවුන්ඩිනට්වල ශක්‍යතාව පරීක්ෂා කිරීම

- එළවළු කව්පි පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම

- වම්බටු දෙමුහුම් පිළිබඳ ජාතික සම්බන්ධීකරණය ප්‍රභේද අත්හදා බැලීම

පලතුරු බෝග අංශය

- ශ්‍රී ලංකාවේ වියළි සහ අතරමැදි කලාපවලින් දිවුල් ජනකප්ලාස්ම එක්රැස් කර ගැනීම, එම ජනකප්ලාස්ම ස්ථාපිත කිරීම සහ ඇගයීම

- ශ්‍රී ලංකාවේ වියළි සහ අතරමැදි කලාපවලින් දෙහි ජනකප්ලාස්ම එක්රැස් කර ගැනීම, එම ජනකප්ලාස්ම ස්ථාපිත කිරීම සහ ඇගයීම

- ශ්‍රී ලංකාවේ දෙළුම් ඇති කලාපවලින් එම ජනකප්ලාස්ම එක්රැස් කර ගැනීම, ස්ථාපිත රත්න පැපොල් ප්‍රභේදයේ අභිජනන බීජ නිෂ්පාදනය කිරීම සහ ඇගයීම

- ශ්‍රී ලංකාවේ ඇඹුල් කෙසෙල් ඇති කලාපවලින් එම ජනකප්ලාස්ම එක්රැස් කර ගැනීම,ස්ථාපිත කිරීම සහ ඇගයීම

- දීප ව්‍යාප්ත පටක රෝපණ වැඩසටහන සඳහා රෝගවලින් තොර මව් පැළ නිෂ්පාදනය කිරීමට නුදෙකලා කෙසෙල් උද්‍යානයක් ස්ථාපිත කිරීම

- ශ්‍රී ලංකාවේ පේර ඇති කලාපවලින් එම ජනකප්ලාස්ම එක්රැස් කර ගැනීම, ස්ථාපිත කිරීම සහ ඇගයීම

- ශ්‍රී ලංකාවේ කොමඩු ඇති කලාපවලින් ජනකප්ලාස්ම එක්රැස් කර ගැනීම, ස්ථාපිත කිරීම සහ ඇගයීම

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරී/ සේවක සංඛ්‍යාව
අතිරේක අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිලධාරී	17
පරිපාලන නිලධාරී	01
වැඩසටහන් සහකාර	01
කෘෂිකර්ම උපදේශක	07
කළමනාකරණ සහකාර සේවය	06
ගොවිපළ ලිපිකරු	01
පර්යේෂණ සහකාර (විශේෂ ශ්‍රේණිය)	01
පර්යේෂණ සහකාර	11
පර්යේෂණ උප සහකාර	03
කාර්යාල කාර්ය සහායක	01
රියදුරු	08
පස් කපන යන්ත්‍ර ක්‍රියාකරු	02
ගබඩාකරු	01
පෑස්සුම්කරු	01
සංචාරක බංගලා භාරකරු	01
මුරකරු	10
නුපුහුණු කම්කරු	60
එකතුව	**133**

2.1.2. කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - අරලගංවිල

අරලගංවිල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට පැවරී ඇති වගකීම වන්නේ අදාළ තාක්ෂණයන් ජනනය කර එයට වගකීම පැවරී ඇති බී, සී, ඩී සහ පී යන මහවැලි කලාපවල, නැගෙනහිර පළාතේ සහ අන්තර් පළාත් ප්‍රදේශවල එම තාක්ෂණයන් භාවිතා කිරීමට කටයුතු යෙදීමයි. මෙහි පර්යේෂණ වැඩසටහන ශස්‍ය විද්‍යාව, ප්‍රවේණි විද්‍යාව හා පැළෑටි කායික විද්‍යාව, කීට විද්‍යාව සහ පාංශු හා ජල කළමනාකරණය යන විවිධ ක්ෂේත්‍ර යටතේ ක්‍රියාත්මක කෙරේ.

අයවැය

වගු අංක අංක 2.1.2.1: වාර්ෂික අයවැය - 2011 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම්%
පුනරාවර්තන	9,896,710	8,735,482	88
මූලධන	3,775,000	2,553,098	68
ව්‍යාපෘති			
වියළි කලාපයේ පසෙහි මිරිස් හා ලූනු වගා කිරීම සඳහා කාර්යක්ෂම ජල කළමනාකරණ පිළිවෙත් මාලා සැකසීම - ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම	701,900	651,891	93
කෙසෙල් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහන 2011 - ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම	40,000	40,000	100
ආදර්ශ ගම්මාන ස්ථාපිත කිරීමේ වැඩසටහන	100,000	74,920	75
බඩඉරිඟු දෙමුහුම් බීජ නිෂ්පාදනය			
අතිරේක බෝග බීජ නිෂ්පාදන වැඩසටහන	250,000	221,493	89
පලතුරු පැළ නිෂ්පාදනය (පැපොල්)	202,460	190,885	94
අලුතින් වගා කරන ප්‍රදේශවල අවාරයට බී ලූනු සහ පොකුරු ලූනු ස්ථාපිත කිරීම	400,000	337,992	84
කොම්පෝස්ට් නිෂ්පාදනය සහ භාවිතය පිළිබඳ පර්යේෂණ කිරීම	650,000	586,630	90
	1,000,000	959,352	96
එකතුව	**17,384,220**	**14,351,742**	**83**

ප්‍රගතිය

පර්යේෂණ

ශස්‍ය විද්‍යාව

වී

ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් තුළින් මාස 2.5 වයස් කණ්ඩයට අයත් වී වර්ග 5ක් අත්හදා බලා මාස 3 වයස් කාණ්ඩයට අයත් වී වර්ග 6ක් අගයන ලදී. මාස 3.5 වයස් කාණ්ඩයට අයත් වී වර්ග 7ක් පිළිබඳ ඇගයීම් කටයුතු සිදු කෙරිණි.

වම්බටු

අමන්දා සහ බීඩබිලිවි 11 යන ප්‍රභේද යොදා ගනිමින් වම්බටු වර්ග 6ක ඇගයීම් කටයුතු සාර්ථකව නිම කෙරිණි.

කව්පි

ධවල සහ වරුණි නමැති සම්මත සැසඳුම් ප්‍රභේද යොදා ගනිමින් කව්පි වර්ග 7ක් ඇගයීමට ලක් කෙරිණි.

මිරිස්

කේඒ2 සහ එම්අයි ග්‍රීන් නමැති සම්මත ප්‍රභේද යොදා ගනිමින් මිරිස් වර්ග 4ක් අගයන ලදී.

තිබ්බටු

තිබ්බටුවල 'හාඩ්වුඩ් බෝරර්' නමැති පළිබෝධයා පාලනය කිරීම සඳහා විවිධ ශස්‍ය විද්‍යාත්මක ක්‍රම පරීක්ෂා කර බලන ලදී. කෙසේවුවද, එම ප්‍රතිකර්ම කිසිවකින් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබිණි.

බඩඉරිගු

බඩඉරිගු මූලික කර ගනිමින් අතුරු බෝග වගා කිරීමේ අත්හදා බැලීම සාර්ථකව අවසන් කෙරිණි. අත්හදා බැලීම් අතරින් බඩඉරිගු සමඟ බණ්ඩක්කා අතුරු බෝගයක් වශයෙන් වගා කිරීමෙන් ඉහළම ලාභය ලැබිණි.
එෆ්$_1$ දෙමුහුම් බීජ (සම්පත් ප්‍රභේදය) කි.ග්‍රෑ. 300ක් නිපදවන ලදී.

ජාන විද්‍යාව සහ අභිජනනය

ලූනු

නව වර්ග 4ක් ඇතුළු ලූනු ආර 119ක් රූප විද්‍යාත්මකව ලක්ෂණීකරණය කරන ලද අතර 2008 වර්ෂයේ ලක්ෂණීකරණ දත්ත මත පදනම්ව ආර 6ක් මූලික අස්වනු අත්හදා බැලීම් සඳහාද, ආර 4ක් උසස් අස්වනු අත්හදා බැලීම් සඳහාද තෝරා ගැනිණි. ස්වපරාගණනය වූ ප්‍රජනිත 19කින් ආර 2ක් එෆ් 2 පරම්පරාව දක්වා වැඩිදියුණු කරන ලද අතර ආර 119ක අභිජනන රෝපණ ද්‍රව්‍ය (සමූහ) පර්යේෂණ කටයුතු සඳහා නිපදවන ලදී.

පොකුරු ලූනු (රතු හෝ කුඩා ලූනු)

මූලික අස්වනු අත්හදා බැලීම් සඳහා ආර 11ක් ද ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් සඳහා ආර 5ක් ද තෝරා ගැනිණි. මල් පිපෙන සහ මල් නොපිපෙන ප්‍රභේද යටතේ වර්ග 8ක් යොදා ගනිමින් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පවත්වන ලදී.

වෙනත්

මිරිස්, කව්පි, මුං, උඳු, කොණ්ඩ කඩල, වම්බටු, තක්කාලි, තම්පලා, පිපිඤ්ඤා, කරවිල, වැටකොළු, දඹල, තිරිඟු, සහ බාර්ලි යන බෝගවල විදේශීය ප්‍රභේද රැසක් හඳුන්වාදී අනුකූලනය කරන ලදී.

ඌන උපයෝජිත බෝග

බම්බාරා ග්‍රවුන්ඩ්නට්, කව්පි යන මාෂ බෝග හා කොළ එළවළු වර්ග එක්රැස් කරගෙන ඇගයීම් කටයුතු සඳහා ඒවායෙහි බීජ ගුණනය කරන ලදී.

තිබ්බටු

තිබ්බටු ක්ෂේත්‍ර ජාන බැංකුව නඩත්තු කර ඒවායෙහි අභිජනන බීජ නිපදවිණි.

තුඹ කරවිල

උසස් තත්වයේ රෝපණ ද්‍රව්‍ය ලබාදීම සහතික කිරීමට අවශ්‍ය මව් වැල් ස්ථාපිත කිරීම පිණිස අභිජනන බීජ (රෝපණ ද්‍රව්‍ය) නිෂ්පාදනය අබණ්ඩව සිදු කෙරිණි.

උද්‍යාන බෝග වගාව

කෙසෙල්

ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් යටතේ කෙසෙල් වර්ග 4ක් පැරකුම් නැමති සැසඳුම් ප්‍රභේදය සමග අගයන ලදී. එමෙන්ම ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සඳහා රත් කෙසෙල් එකතුවක්ද තෝරා ගැනිණි.

පැපොල්

අභිජනන බීජ කි.ග්‍රෑ. 1ක් නිෂ්පාදනය කිරීම සඳහා රත්න පැපොල් ප්‍රභේදය සහිත ක්ෂේත්‍රයක් ස්ථාපිත කරන ලදී.

ඩ්‍රැගන් පෲට්

ශීඝ්‍ර ගුණනය සඳහා බහු ප්‍රරෝහ තාක්ෂණික ක්‍රම 2ක් අත්හදා බලන ලදී.

පේර

ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් යටතේ දෙමුහුම් 4ක් ඇගයීමට ලක් කෙරිණි.

අඹ

ජාන සම්පත් එකතුන් 10ක් ක්ෂේත්‍ර ජාන බැංකුව තුළ නඩත්තු කර තෝරා ගත් එකතුන් 10ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සඳහා ගුණනය කරන ලදී.

පැළෑටි ව්‍යාධිවේදය

ලූනු

බල්බ කුණුවීම, අග්‍රස්ථ පිළිස්සීම සහ දම් පැල්ලම් රෝගය සඳහා ප්‍රතිරෝධී ප්‍රභවය හඳුනා ගන්නා ලදී.

වී

විවල ධාන්‍ය අවපැහැවීම වැළැක්වීම සඳහා සුදුසු දිලිරනාශක පරීක්ෂා කර බලන ලදී.

පාංශු සහ ජල කළමනාකරණය

- වේලි සහ කාණු සහිත ක්ෂේත්‍ර ව්‍යුහය එනම් වේලිවල එළවළුද කාණුවල විද වගා කිරීම, මහවැලි 'බී' කලාපයේ ජලවහනයක් සහිත ඉඩම් ප්‍රයෝජනයට ගැනීම සඳහා යෝග්‍ය ඉඩම් කළමනාකරණ තාක්ෂණ ක්‍රමවේදයක් බව සොයා ගැනිණි.

- චූර්ණමය නොවන දුඹුරු පසෙහි පාංශු බාදනය වන ආකාරය නිශ්චය කර ගැනීම සඳහා ක්ෂේත්‍ර අත්හදා බැලීමක් සිදු කෙරිණි. එහි ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ ඉඩම් වගා නොකළ තත්වය තුළ ඉහළම පාංශු බාදනයක් හා වසුන් යෙදූ තත්වය තුළ අඩුම පාංශු බාදනයක් සිදුවන බවයි.

- වසුන් සහ කාබනික පොහොර යෙදීම අනුව විවිධ ජල සම්පාදන/සමුච්චිත තැටි වාෂ්පීකරණ අනුපාත IW/CPE යොදා ගනිමින් රතු ලූනුවල ජල සම්පාදන අවශ්‍යතාව නිශ්චය කිරීම පිළිබඳ ක්ෂේත්‍ර අත්හදා බැලීමක් සිදු කෙරිණි.

වල් පැළෑටි විද්‍යාව

මහවැලි බී කලාපයේ කුඹුරු ඉඩම්වල ඇති අශ්වවලිග වල් පැළෑටි (*Leptochloa chinensis*) ගහනය මගින් ඇති කරන බලපෑම ඇගයීමට ලක් කරන ලදී.

ව්‍යාප්තිය

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම

- වියළි කලාපීය පසෙහි වගාකරන මිරිස් සහ ලූනු සඳහා කාර්යක්ෂම ජල කළමනාකරණ පිළිවෙත් මාලාවක් සකස් කෙරිණි.

- ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ 2011 වර්ෂයේ කෙසෙල් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහන පැවැත්විණි.

කාබනික පොහොර නිෂ්පාදනය, භාවිතය සහ වැඩිදියුණු කිරීම් කටයුතු

- පවතින අමුද්‍රව්‍යවල මෙන්ම නිපැයුම්වලද ඵලදායකත්වය ඇගයීමට ලක් කෙරිණි. 2011 වර්ෂය තුළ කොම්පෝස්ට් ටො. 56ක් නිෂ්පාදනය කරන ලදී.

වෙනත් කාර්යයන්

- ආදර්ශ ගම්මාන ස්ථාපිත කිරීමේ වැඩසටහන
- අතිරේක ආහාර බෝග බීජ නිෂ්පාදන වැඩසටහන
- පලතුරු පැළ නිෂ්පාදනය(පැපොල්)
- නව ප්‍රදේශවල අවාරයේ බී ලූනු සහ පොකුරු ලූනු වගා කිරීම
- කොම්පෝස්ට් නිෂ්පාදනය සහ භාවිතය පිළිබඳ පර්යේෂණ කටයුතු සිදු කිරීම
- සීනි සහ ඇඹුල් කෙසෙල් ප්‍රභේදවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- මදය සුදු ඩ්‍රැගන් පෘථි ප්‍රභේදයේ රෝපණ ද්‍රව්‍ය නිපදවීම
- තිබ්බටුවල (බිංදු ප්‍රභේදය) අභිජනන බීජ ග්‍රෑ. 4,350ක් නිපදවා ගොවීන් අතර බෙදා හැරීම

තාක්ෂණ ප්‍රචාරණය

පත්‍රිකා

පැපොල් කළමණාකරණ පිළිවෙත්, තිබ්බටු වගාව සහ තුඹ කරවිල වගාව පිළිබඳ පත්‍රිකා 542ක් පිළියෙල කර බෙදා හරින ලදී.

ක්ෂේත්‍ර දින සහ පුහුණු කටයුතු

- කෘෂිකර්ම අමාත්‍ය ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා සහ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා අරලගංවිල පර්යේෂණ මධ්‍යස්ථානය වෙත ක්ෂේත්‍ර චාරිකාවක නිරත වූහ.
- ක්ෂේත්‍ර දින - ගොවීන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හා මහවැලි අධිකාරියේ කෘෂිකර්ම නිලධාරීන් සඳහා ක්ෂේත්‍ර දින වැඩසටහන් 3ක් පවත්වන ලදී. ඒ සඳහා ගොවිහු සහ නිලධාරීහු 300කට අධික සංඛ්‍යාවක් සහභාගි වූහ.
- පුහුණු වැඩසටහන් - කෘෂිකර්ම නිලධාරීන්, ක්ෂේත්‍ර සහායකයින්, ගොවීන් සහ පැසැල් සිසුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්විණි.
- බෝග සායන - බෝග සායන 8ක් පවත්වන ලදී.
- පැළෑටි සංරක්ෂණ ගැටලු ක්ෂේත්‍ර චාරිකා සහ නියැදි විශ්ලේෂණය තුළින් මතු වූ ඒවා විය.

පාංශු පරීක්ෂාව

පාංශු නියැදි 632ක් විශ්ලේෂණය කර ඒ අනුව, නිර්දේශ ලබාදෙන ලදී.

2012 වර්ෂය සඳහා සැලැස්ම

ශස්‍ය විද්‍යාව

වී

- වල් පැළෑටිවලට ඉහළ තරඟකාරිත්වයක් දිය හැකි වී ප්‍රභේදයක් බිහි කිරීමේ අරමුණ ඇතිව වල් වී ගැටලුව පාලනය කිරීම පිණිස පැළ අතර දුර හා පර-
පරාගණ අනුපාතය හඳුනා ගැනීම

අඹ

- අස්වනු නෙළීම වඩා පහසු කිරීම පිණිස වියන කළමනාකරණය කිරීමේ පිළිවෙතක් බිහි කිරීම

ඩ්‍රැගන් පෘථි

- වියළි සහ අතරමැදි තෙතමන තත්වයන් යටතේ චූර්ණමය නොවන දුඹුරු පසෙහි සිදු කරන ඩ්‍රැගන් පෘථි වගාවේ ක්‍රියාකාරිත්වය ඇගයීම

- අරලගංවිල කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය විසින් හඳුනා ගන්නා ලද විශාල පරිමාණයේ රෝපණ ද්‍රව්‍ය නිපදවීමේ තාක්ෂණය තවදුරටත් වැඩිදියුණු කිරීම

පේර

- වියළි සහ ජල සම්පාදිත තත්වයන් යටතේ කප්පාදු කිරීමට සහ පුහුණු කිරීමට සුදුසු දෙමුහුම් ඇගයීම

පැපොල්

- පැපොල් වගාව සඳහා සුදුසු ජලවහන ක්‍රමය වැඩි දුරටත් ඇගයීම

ලූනු

- චූර්ණමය නොවන දුඹුරු පසෙහි වගා කරන රතු ලූනුවල පොහොර අවශ්‍යතාව ඇගයීම
- ලූනු බීජ නිෂ්පාදනය සඳහා සුදුසු විකල්ප ක්‍රමයක් බිහි කිරීම

තුඹ කරවිල

- තුඹ කරවිලවල වර්ධනය සහ අස්වැන්න කෙරෙහි විවිධ සෙවන මට්ටම් මගින් ඇති කරන බලපෑම ඇගයීම

කීට විද්‍යාව

වම්බටු

- මහවැලි 'බී' කලාපයේ පවතින තත්වය යටතේ කරටි සහ ගෙඩි විදින්නාගේ හානියට ඔරොත්තු දෙන සොලේනම් විශේෂ (*Solanum* spp.) ඇගයීම

මිරිස්

- යුෂ උරාබොන පළිබෝධ කළමනාකරණය කිරීම, මහවැලි බී කලාපීය තත්වය යටතේ වගා කරන මිරිස්වල පැළ මැක්කන් කළමනාකරණය කිරීම

ලූනු

- මහවැලි බී කලාපයේ වගා කරන ලූනුවල පැළ මැක්කන් කළමනාකරණය කිරීම
- පැළ මැක්කන් සඳහා ප්‍රභේදීය ප්‍රතිරෝධිතාව

ජාන විද්‍යාව සහ පැළෑටි අභිජනනය

ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්

- බඩඉරිඟු, අඹ, මිරිස්, කව්පි, කොල්ලු, සහ කෙසෙල් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම පැවැත්වීම

ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්

- රටකජු පිළිබඳ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පැවැත්වීම

ලූනු

- ජනකප්ලාස්ම ලක්ෂණීකරණය
- එළවළු සඳහා සුදුසු පොකුරු ලූනු ප්‍රභේදයක් බිහිකර වැඩිදියුණු කිරීම
- පොකුරු ලූනු පිලිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්
- පොකුරු ලූනු පිළිබඳ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්
- පළිබෝධ හා රෝගවලට ඔරොත්තු දෙන හා ඉහළ අස්වනු ගෙනදෙන රතු ලූනු ප්‍රභේදයක් හඳුන්වා දීම
- දෙමුහුම් පොකුරු ලූනු ප්‍රභේදයක් බිහි කිරීම
- සලාද සඳහා ගතහැකි ආකාරයේ සුදු පැහැ පොකුරු ලූනු ප්‍රභේදයක් බිහි කිරීම

පැපොල්

- රත්න ප්‍රභේදයේ අභිජනන බීජ නිෂ්පාදනය

කෙසෙල්

- දැනට පවතින කෙසෙල් ජනකප්ලාස්ම ඇගයීම

අඹ

- දැනට පවතින අඹ ජනකප්ලාස්ම ඇගයීම

පලතුරු බෝග

- පලතුරු බෝග සඳහා ශීඝ්‍ර ගුණන ක්‍රමයක් බිහි කිරීම
- අවාරයේදී පලතුරු ලබා ගැනීම සඳහා සකස් කළ පිළිවෙත් මාලාව ඇගයීම

ඌන උපයෝජිත පලතුරු බෝග

- වියළි කලාපයේ ඌන උපයෝජිත පලතුරු බෝග ගවේෂණය, ලක්ෂණීකරණය සහ ඇගයීම

වී

- වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් සම්බන්ධීකරණය කරන ලද ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සහ ජාතික සම්බන්ධීකරණ පැළෑටිනාශක පරීක්ෂණ අත්හදා බැලීම් පැවැත්වීම

තුඹ කරවිල

- අභිජනන බීජ (රෝපණ ද්‍රව්‍ය) නිෂ්පාදනය

සෝයා බෝංචි

- වැඩි දියුණු කර ඉදිරියට ගෙනයන ලද අභිජනන ආර ඇගයීම සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්වීම

තිබ්බටු

- අභිජනන බීජ නිෂ්පාදනය

කව්පි

- අස්වනු විභවය, කරවල්වල තත්වය, පළිබෝධ හා රෝග සහ වෙනත් අපේක්ෂිත ශස්‍ය විද්‍යාත්මක ලක්ෂණ ඇගයීම සඳහා එළවළු කව්පි පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්වීම

පැළෑටි ව්‍යාධිවේදය

පොකුරු ලූනු

- ප්‍රභේදීය ප්‍රතිරෝධිතාව ඇගයීම

ලූනු

- වී, රනිල බෝග මාරු ක්‍රමය යටතේ බෝග ඵලදායිතාව සහ පාංශු සාරවත්භාවය කෙරෙහි රසායනික පොහොර සහ කාබනික පොහොර දිගු කාලීනව යෙදීම මගින් ඇතිවන බලපෑම (ස්ථානීය පර්යේෂණ)

- වී වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම් අඩු මාත්‍රා සහ විවිධ කාබනික ද්‍රව්‍ය යෙදීම මගින් ඇතිවන බලපෑම ඇගයීම

පේර

- චූර්ණමය නොවන දුඹුරු පසේ ඇති තත්වයට සුදුසු ජල සම්පාදන පිළිවෙත් මාලාවක් බිහි කිරීම

- බල්බ කුණුවීම පාලනයට යොදා ගත හැකි පළිබෝධනාශක පරීක්ෂා කර බැලීම

- පොකුරු ලූනු සඳහා රෝග පාලන ක්‍රම බිහි කිරීම

වී

- ධාන්‍ය ඇට අවපැහැවීම පාලනය කිරීමේ ක්‍රම බිහි කිරීම

තුඹ කරවිල

- තුඹ කරවිල විශාල වශයෙන් නිපදවිය හැකි ක්‍රමයක් ජනනය කිරීම

- දිලිර හේතුවෙන් ඇතිවන හිටු මැරීමේ රෝගයට ඔරොත්තු දීම ඇති කරන ක්‍රමයක් බිහි කිරීම

පාංශු සහ ජල කළමනාකරණය

වී

- බෝග ඵලදායිතාව සහ පාංශු සාරවත්භාවය කෙරෙහි රසායනික පොහොර සහ කාබනික පොහොර දිගු කාලීනව යෙදීම මගින් ඇතිවන බලපෑම (පරිබාහිර පර්යේෂණ)

වෙනත්

- එළවළුවල වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ක්ෂුද්‍ර පෝෂක මගින් ඇති කරන බලපෑම ඇගයීම

- චූර්ණමය නොවන දුඹුරු පස් සහිත තත්වය තුළ අනුගමනය කරන විවිධ පාංශු සංරක්ෂණ ක්‍රියාමාර්ග (සැවැන්දරා තීරු, සමෝච්ච කාණු, ඇලි සහ වැටි, පුරන්වීමට හැරීම) යටතේ පාංශු බාදනය සහ ජලවහනය පිළිබඳව ඇගයීම

- චූර්ණම නොවන දුඹුරු පස සඳහා සුදුසු ජල කළමණාකරණ තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම.

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරි/සේවක සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ(පර්යේෂණ)	1
පර්යේෂණ නිලධාරි	8
පර්යේෂණ සහකාර	3
කෘෂිකර්ම උපදේශක	4
පර්යේෂණ උප සහකාර	1
පරිපාලන නිලධාරි (වැඩබලන)	1
රාජ්‍ය කළමනාකරණ සහකාර	2
ගබඩා භාරකරු	1
රියදුරු	4
විදුලි ශිල්පි	1
මුරකරු	10
ට්‍රැක්ටර් ක්‍රියාකරු	3
වඩු කාර්මික	2
කම්මල්කරු	1
පෙදරේරු	1
සංචාරක බංගලා භාරකරු	1
බද්ධකරු	1
කම්කරු	50
කම්කරු (කොන්ත්‍රාත්)	39
එකතුව	134

2.1.3. කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - කිලිනොච්චිය

කිලිනොච්චියේ පිහිටි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවිධාන මධ්‍යස්ථානයට සහ තිරුනෙල්වේලි, වවුනියා, මුරුන්කන් සහ පරන්තන් පිහිටි එහි උප මධ්‍යස්ථානවලට පැවරී ඇති වගකීම වන්නේ උතුරු පළාතේ ගොවීන්ගේ අවශ්‍යතා සැපිරීම පිණිස විශේෂයෙන්ම එම කලාපයට (DL1, DL3 සහ DL4) ආර්ථිකමය වශයෙන් වැදගත් වන වෙනත් ක්ෂේත්‍ර බෝගවලට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීමයි. මෙම පර්යේෂණ මධ්‍යස්ථානය මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අනුබද්ධය.

වර්තමානයේ මූලතිවිහි පිහිටි උපයෝගිතා පර්යේෂණ ස්ථානය හැරුණුවිට අනෙකුත් සියලුම උප මධ්‍යස්ථාන ක්‍රියාත්මකව පවතී. කිලිනොච්චියේ පිහිටි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සහ පරන්තන් වී පර්යේෂණ ස්ථානයේ මේ වන විට මූලික පර්යේෂණ හා සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත. මෙම වාර්තාවේ සඳහන් කාර්යයන් බෙහොමයක්ම වවුනියාව උපයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානය, තිරුනෙල්වේලි කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, මුරුන්කන් කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය සහ පරන්තන් වී පර්යේෂණ ස්ථානය තුළ සිදු කර ඇත.

අයවැය

වගු අංක : 2.1.3.1: වාර්ෂික අයවැය - 2011 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
පුනරාවර්තන	3,350,000	3,328,038	99
මූලධන	1,875,000	728,770	39
කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය	1,250,000	80,000	60
එකතුව	**6,475,000**	**4,136,808**	**64**

ප්‍රගතිය

බෝග වැඩිදියුණු කිරීම

රතු ලූනු

'තිරුනෙල්වේලි රෙඩ්' නමැති ෂැලොට් ආකාරයේ රතුලූනු ප්‍රභේදයෙන් අභිජනන බීජ බල්බ කි.ග්‍රෑ. 320ක් ව්‍යාප්ති කාර්ය මණ්ඩලය හරහා ගොවි ජනතාවට ලබා දීම පිණිස නිෂ්පාදනය කරන ලදී. ඉහළ අස්වැන්න සහ වෙනත් ලක්ෂණ මත තෝරාගත් ගුණන ආකාරයේ දෙමුහුම් 3ක් නඩත්තු කරන ලදී. එමෙන්ම ගුණන ආකාරයේ ආර 3ක් (TMV-1, TMV-2, TMV-4) ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හඳ බැලීම්වලට ඇතුළත් කරන ලදී.

මිරිස්

එම්අයි - 2 සහ කේඒ - 2 සැසඳුම් ප්‍රභේද වශයෙන් යොදා ගනිමින් මිරිස් ආර 8ක් පැළ මැක්කන්ගේ හානියට ප්‍රතිරෝධී වන අයුරින් වැඩිදියුණු කිරීම සඳහා ඇගයීමට ලක් කෙරිණි. හෙ.1කට ටො. 5.9 - 6.0 අතර ඉහළම අස්වැන්න ලබා දුන්නේ ටීවීසී - 5 නමැති ආරයි. ටීවීසී -1, ටීවීසී - 3, ටීවීසී - 5, සහ ටීවීසී - 9 යාපනය දිස්ත්‍රික්කයේදී මනා ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ අතර ඒවා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හඳ බැලීම් සඳහා උසස් කළ හැකිය.

රටකජු

විවිධ කෘෂි පාරිසරික කලාප සඳහා තෝරාගත් බලාපොරොත්තු තැබිය හැකි ආර අතරින් ආර 6ක් අත්හද බලන ලදී. 2010/11 මහ කන්නයේදී අයිසිපීවී 97049 සහ අයිසිපීවී 98396 මනා ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.

උඳු

උඳු ආර 5ක් අත්හද බලන ලදී. 2010/11 මහ කන්නයේදී 'අනුරාධ' නමැති ආර පමණක් අනෙක්වාට වඩා හොඳ ක්‍රියාකාරිත්වයක් පෙන්වීය.

අබ

ආර 6ක් ඒපී26 නමැති සැසඳුම් ප්‍රභේදය සමඟ අත්හද බලන ලදී. එහෙත් 2010/11 මහ කන්නයේදී සැසඳුම් ප්‍රභේදය අනෙක් ආරවලට සාපේක්ෂව මනා ක්‍රියාකාරිත්වයක් පෙන්වීය.

වී

ප්‍රභේද අනුවර්තන අත්හද බැලීම්, ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හද බැලීම්, බහු-ස්ථානීය හා තාක්ෂණ අනුවර්තන අත්හද බැලීම්

වර්ෂාපෝෂිත සහ ජල සම්පාදිත යන තත්වයන් දෙක තුළම පරන්තන් වී පර්යේෂණ ස්ථානය, වවුනියාව කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය සහ මුරුත්කන් කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය තුළ මාස 2 1/2, මාස 3 සහ මාස 3 1/2 යන වයස් කාණ්ඩවලට අයත් ප්‍රභේද අත්හද බලන ලදී. එයට අමතරව, දේශීය ප්‍රභේදයක් වන අත්තක්කරි ද එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා අත්හද බලන ලදී.

පවිත්‍රතාව නඩත්තුව කිරීම

රතුලූනු සහ ගුණන ආකාර යටතට ගැනෙන ලූනුවල දේශීය ප්‍රභේද හා ආර 17ක් නඩත්තු කරන ලදී. පහත දැක්වෙන බෝග ඒවායෙහි ප්‍රභේද පවිත්‍රතාව නඩත්තු කිරීම පිණිස වගා කරන ලදී.

වගු අංක 2.1.3.2 : බෝගවල පවිත්‍රතාව නඩත්තු කිරීම

බෝගය	ප්‍රභේදය
වම්බටු	තිරුනෙල්වේලි පර්ප්ල්
කරවිල	තිරුනෙල්වේලි වයිට්
පතෝල	තිරුනෙල්වේලි ලෝන්
තක්කාලි	කේසී - 1
මෑ	හවරි මෑ
උඳු	අනුරාධ

බීජ නිෂ්පාදනය

අපි වවමු රට නගමු ව්‍යාපෘතිය යටතේ බීජ පහත දැක්වෙන ප්‍රමාණවලින් නිපදවන ලදී.

වගු අංක 2.1.3.3. : 2011 වර්ෂයේදී බීජ නිෂ්පාදනය

බෝගය	ප්‍රභේදය	බීජ ප්‍රමාණය
බඩඉරිඟු	රුවන්	කි.ග්‍රෑ 250
කුරක්කන්	ඕෂධ	කි.ග්‍රෑ 300
මුං ආර	එම්අයිඑම්බී	කි.ග්‍රෑ 65

අභිජනන බීජ නිෂ්පාදනය

අභිජනන බීජ පහත සඳහන් ප්‍රමාණවලින් නිපදවන ලදී.

වගු අංක 2.1.3.4. 2011 වර්ෂයේ අභිජනන බීජ නිෂ්පාදනය

බෝගය	ප්‍රභේදය	බීජ ප්‍රමාණය
කරවිල	තිරුනෙල්වේලි වයිට්	කි.ග්‍රෑ.5.6
තක්කාලි	කේසී -1	ග්‍රෑ. 100

සහතික කළ බිත්තර වී

බීපී 300 ප්‍රභේදයේ සහතික කළ බිත්තර වී කි.ග්‍රෑ 4387ක් නිපදවන ලදී.

ශස්‍ය විද්‍යාව

වී

ගොවි ක්ෂේත්‍ර තුළ වයස් කාණ්ඩ 3කට අයත් වී ප්‍රභේද අත්හදා බැලිණි. මාස 3 වයස් කාණ්ඩයේ ඒටී 07- 800 හා ඒටී 307 යන ප්‍රභේද පිළිවෙළින් හෙ.1 කට ටො. 4.5ක සහ 4.4ක අස්වනු ලබාදිණි. ගොවීන්ගේ වැඩි කැමැත්ත හිමි වූයේ රතු නිවුඩු වී ප්‍රභේදය කෙරෙහිය.

ලවණතාවට ප්‍රතිරෝධී ආර 2ක් වන 11-139 හා 5-110 සැසඳුම් ප්‍රභේදය වන ඒටී 362 සමඟ අත්හදා බලන ලදී. ලවණතාව මීටරයට ඩෙසිසිමන්ස් 2.6 වශයෙන් ඉතා ඉහළ මට්ටමක පැවතිණි. මෙම ආර මනා ක්‍රියාකාරීත්වයක් පෙන්වූ අතර හෙ.1කට ටො. 2 - 2.5 අතර අස්වැන්නක් ලබාදිණි.

එළවළු

මෑ, වැටකොළු, තම්පලා, පිපිඤ්ඤ, සහ අර්තාපල් යන එළවළු බෝගවලට අදාළව ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පවත්වන ලදී.

මෑ

සීඑම්1, සීඑම් 2, ටීවීයූ 2852, පොළොන් මෑ, හවරි මෑ යන මෑ ප්‍රභේද 5 අත්හදා බලන ලදී. සීඑම් 1 හෙ. 1කට ටො 15.5ක ඉහළම කරල් අස්වැන්න ලබාදුන් අතර කරලක දිග සෙ.මී. 67ක් විය. මෙම ප්‍රභේදය සඳහා වැඩි පාරිභෝගික කැමැත්ත හිමිවිය.

වැටකොළු

ආර 7ක් (10020 X In 17, 10656 X 9895, In 192338 X 10014, La 33 X TD, Naga, LA 33) අත්හදා බලන ලදී. නාග ආර හෙ. 1කට ටො. 69ක ඉහළම අස්වැන්න ලබාදිණි.

තම්පලා

රතු තම්පලා, දියපලාගොඩ, පියෝ ග්‍රීන් සහ ඩිඕඒ ග්‍රීන් යන ආර 4 අත්හදා බලන ලදී. රෝපණය කිරීමෙන් සති 4කට පසු දියපලාගොඩ ආර හෙ.1කට ටො. 32ක ඉහළම අස්වැන්න ලබා දුන් අතර 3:2 වශයෙන් ඉහළම කඳට පත්‍ර අනුපාතය වාර්තා කළේය.

පිපිඤ්ඤ

එච් 31, එච් 41, එච් 18, සහ ඊ 2 යන පිපිඤ්ඤ, ආර 4 කේඩබ්ලිව් සහ චැම්පියන් යන සැසඳුම් ප්‍රභේද සමඟ අත්හදා බලන ලදී. එච් 41 හෙ. 1කට ටො. 25ක වැඩිම අස්වැන්න ලබාදිණි. එහෙත් එච් 31 ආරට වැඩි පාරිභෝගික කැමැත්ත හිමිවිය.

අර්තාපල්

ආර්නෝවා, ගෝල්ඩින් ස්ටාර්, ඒඅයිඩීඒ, ඇට්ලස්, කැල් වයිට්, රෙඩ් ලැසෝඩා රෙඩ්, වයිපී-03-107, රොසානා, ආර්නෝවා (ලෝකල්) යන ප්‍රභේද අත්හදා බලන ලදී. කැල් වයිට් සහ රෙඩ් ලැසෝඩා ඉහළ අස්වනු ලබාදිණි.

කැල්වයිට් ප්‍රභේදය ඉහළම අස්වැන්න වූ පැළයකට ග්‍රෑ. 456ක් ලබාදිණි.

පැළෑටි සංරක්ෂණය

යාපනය දිස්ත්‍රික්කයේ වගා කරන දැඩි උණුසුමට ඔරොත්තු දෙන අර්තාපල් ප්‍රභේදවල රෝග පැතිරීම පිළිබඳ තක්සේරුවක් කිරීම

ආර්නෝවා, ගෝල්ඩින් ස්ටාර්, ඒඅයිඩීඒ, ඇට්ලස්, කැල්වයිට් රෙඩ්, ලැසෝඩා, වයිපී-03-107, රොසානා යන අර්තාපල් ප්‍රභේද අත්හදා බලන ලදී. කැල් වයිට් සහ රෙඩ් ලැසෝඩා යන ප්‍රභේදවල පශ්චිම අංගමාරය පැතිරීම අඩුවිය.

කාබනික පොහොර භාවිතය මගින් ලූනු වගාවේ රෝග කළමනාකරණය

කුකුල් පොහොර, එළු පොහොර, ගොම, ග්ලිරිසීඩියා පත්‍ර යන කාබනික පොහොර වර්ග හා කොහොඹ පත්‍ර සහ අකාබනික දිලීරනාශකයක් වන හොමායි පාලක ප්‍රතිකර්ම සමග අත්හදා බලන ලදී. එහිදී රෝග වැළඳුණේ අවම බල්බ සංඛ්‍යාවකට බවත් කුකුල් පොහොර යෙදීමෙන් ඉහළම අලෙවි කළ හැකි අස්වැන්න ලැබුණු බවත් පෙනිණි.

ග්ලිරිසීඩියා වීදි බෝග වගාව යටතේ කාබනික පොහොර යෙදීම මගින් වම්බටුවලට වැළඳෙන පත්‍ර සිහින්වීමේ රෝගය පිළිබඳ තක්සේරුවක් කිරීම

මෙහිදී කුකුල් පොහොර, එළු පොහොර, කොම්පෝස්ට් සහ ගොම යෙදීම අත්හදා බලන ලදී. සාමාන්‍ය බෝග වගාව සමග සසඳා බැලූවිට, වීදි බෝග වගාව යටතේ පත්‍ර සිහින්වීමේ රෝගය ඇතිවීම අඩු වූ අතර කාබනික පොහොර එක් නොකළ විට රෝගය ඇතිවීම ඉහළ මට්ටමක පැවතිණි.

පාංශු විද්‍යාව

වම්බටු වගාව තුළ බයෝෆොස් ක්‍රියාකාරීවන ආකාරය

බයෝෆොස් යෙදීම වම්බටු වගාවට බලපාන ආකාරය අකාබනික පොහොර යෙදීම සමග සසඳා බලන ලදී. බයොෆොස් ප්‍රතිකර්මය යටතේ බෝගයේ සමස්ත ක්‍රියාකාරිත්වය හොඳ මට්ටමක වූ අතර එය අස්වැන්න මගින් හොඳින් කැපී පෙනිණි. යොදන අකාබනික පොහොර ප්‍රමාණයෙන් 50%ක් වෙනුවට කාබනික ෆොස්ෆරස් යොදාගත හැකිය.

මිරිස් වගාවේ සමෝධානික පළිබෝධ හා පෝෂණ කළමණාකරණ ක්‍රමය

ග්ලිරිසිඩියා විදි බෝග වගාව යටතේ මිරිස් බෝගය රෝපණය කර අකාබනික පොහොර 50%ක හා 75%ක ප්‍රමාණයක් සමග හෙ. 1කට ටො. 25, ටො. 18.75 හා ටො. 12.5 වශයෙන් ග්ලිරිසිඩියා කොළ පොහොර එක් කෙරිණි. 50% සිට 75% දක්වා නිර්දේශිත අකාබනික පොහොර ප්‍රමාණයක් සමග 50% සිට 75% දක්වා කොළ පොහොර යෙදීම තුළින් වර්ධන පරාමිතියන්ගේ හා කරල් අස්වැන්නෙහි මනා වර්ධනයක් ඇති විය.

කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය

කොම්පෝස්ට් ටො. 20ක් නිෂ්පාදනය කර යාපනය අර්ධද්වීපයේ ගොවීන් 250දෙනෙකුට කොම්පෝස්ට් කි.ග්‍රෑ. 10 බැගින් වූ මලු නොමිලයේ ලබා දිණි. කොම්පෝස්ට් ප්‍රමාණයෙන්30%ක් පර්යේෂණ කටයුතු සඳහා යොදා ගන්නා ලද අතර සන් හෙම්ප් බීජ කි.ග්‍රෑ. 200ක් ද නිපදවන ලදී.

කොළ පොහොර සහ කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා ගිලිරිසිඩියා සහ ඉපිල් ඉපිල් වගාවන් ස්ථාපිත කෙරිණි.

පාංශු සහ ජල නියැදි පරීක්ෂා කිරීම

ලවණතාවට ලක් වූ ප්‍රදේශවලින් පාංශු සහ ජල නියැදි එක්රැස් කරගෙන පීඑච් අගය සහ විද්‍යුත් සන්නයනතාව සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලදී. ලවණතා මට්ටම පදනම් කරගෙන එයට පිළියම් වශයෙන් ගතයුතු ක්‍රියාමාර්ග ද ගොවීන්ට ලබා දෙන ලදී. ගොවිජන සේවා මධ්‍යස්ථාන අනුව එක්රැස් කර පාංශු නියැදිවල සාරවත්භාවය පිළිබඳව ඇගයීම් ද සිදු කෙරිණි.

ජල සම්පාදනය සඳහා යෝග්‍යදැයි පරීක්ෂා කර බැලීම සඳහා වාඩ්ඩෙයික්කච්චි ගොවි ක්ෂේත්‍රයේ ඇති නල ළිඳෙන් සහ කිලිනොච්චි දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයෙන් ලබා ගත් ජල නියැදි විශ්ලේෂණය කෙරිණි.

පාංශු හා ජල කළමනාකරණය

චූර්ණමය රතු - කහ පැහැති ලැටසෝල් පස සඳහා මතුපිට ජල සම්පාදනය කිරීමට සකස් කළ යුතු ලියැද්දෙහි ප්‍රශස්ත ප්‍රමාණය නිශ්චය කිරීම පිණිස අධ්‍යයනයක් සිදු කෙරිණි. ලියැද්දෙහි ප්‍රමාණය මී.2 X මී.1ක් වන විට සෙ.මී 0-20 ගැඹුරේදී 12%ක ඉහළ තෙතමන තත්වයක් පෙන්නුම් කළ අතර මී.3 X මී. 2 ප්‍රමාණය සෙ.මී. 20 - 40 ගැඹුරේදී සහ සෙ.මී. 40 - 60 ගැඹුරේදී පිළිවෙළින් 11%ක සහ 13.3%ක වැඩි තෙතමන තත්ත්වයන් පෙන්වීය.

දේශීය එළවළුවල පවිත්‍රතාව නඩත්තු කිරීම

වම්බටු (තිරුනෙල්වේලි පර්ප්ල්), කරවිල (තිරුනෙල්වේලි වයිට්), පතෝල (තිරුනෙල්වේලි ලෝන්ග්) තක්කාලි (කේසි- 1) සහ මෑ (ලෝකල්) යන එළවළු බෝග පවිත්‍රතාවට අදාළ පර්යේෂණ කටයුතු සඳහා නඩත්තු කෙරිණි.

පලතුරු ජනකප්ලාස්ම නඩත්තු කිරීම

අඹ (විලාඩ් -3, කරුතකොළොම්බන් -3) වරකා -14 (දේශීය එකතුව), කෙසෙල් - 20 (කැදලි, කප්පල්, මොන්දන්, ඇම්බන් : අළු හා කොළ පැහැති, ඉතාරෙයි, කැවෙන්ඩිෂ්), දෙහි : (ලෝකල්), පැණි දෙඩම් (බිබිලේ) , දෙළුම් (මෘදු බීජ සහිත ප්‍රභේද - නිමාලි, දයා) යන පලතුරු ප්‍රභේද නඩත්තු කරන ලදී.

දෙළුම් බීජ පැළ 500ක් නිපදවා කිලිනොච්චි ප්‍රදේශයේ පදිංචි වූ ගොවීන්ට ලබාදීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ (ව්‍යාප්ති) වෙත බාරදෙන ලදී.

උපදේශක සේවා

පළිබෝධ හා රෝග ආසාදන සම්බන්ධයෙන් ගොවීන්ගෙන් ලැබුණු පැළෑටි නියැදිවල රෝග විනිශ්චය කර ඒ සඳහා පිළියම් පිණිස ගත යුතු ක්‍රියාමාර්ග ගොවීන්ට ලබා දෙන ලදී. ක්ෂේත්‍ර ගැටලු පැවති ප්‍රදේශවලට ගොස් එම ස්ථානවල පැවති ගැටලු හඳුනාගෙන එවාට විසඳුම්ද ලබා දිණි.

පාසැල් 25කින් සිසුහු 3,000ක්ද ගුරුවරු 250ක්ද මෙම පර්යේෂණ ස්ථානයට පැමිණ කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු පිළිබඳ දැනුම ලබා ගත්හ.

දෙපාර්තමේන්තු ප්‍රකාශන අලෙවි ඒකකයක් ස්ථාපිත කෙරිණි.

උඩරට ප්‍රදේශයේ පාසැල් සිසුහු මෙහි පැමිණ පාංශු පරීක්ෂාව සහ විද්‍යාගාර කටයුතු පිළිබඳ තොරතුරු ලබා ගත්හ.

ප්‍රදර්ශන

කෘෂිකර්ම ව්‍යාප්ති අංශය සමග සම්බන්ධව තිරුනෙල්වේලි කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ සතියක් පුරා ප්‍රදර්ශනයක් පැවැත්විණි.

පර්යේෂණ අධ්‍යයන කටයුතු සඳහා අනෙකුත් ආයතනවලට සහ ගොවීන්ට බීජ ආදිය ලබා දීම

මිරිස් - එම් අයි ග්‍රීන් - කි.ග්‍රෑ. 3

බණ්ඩක්කා- ටීවී 8 - කි.ග්‍රෑ. 3

ලූනු ටීවී රෙඩ් - කි.ග්‍රෑ. 5

කාබනික පොහොර නිෂ්පාදන සහ භාවිත කිරීමේ වැඩසටහන

වවුනියාව කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පාංශු පරීක්ෂණ විද්‍යාගාරය වැඩිදියුණු කිරීම සඳහා 2011 වසරේදී මෙම වැඩසටහන යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයෙන් ඍජුවම උපකරණ රැසක් (Oven, Orbital Shaker, Kjeldhal Unit, Waterbath, PH Meter, UV Spectrophotometer) ලැබිණි.

2012 වර්ෂය සඳහා සැලැස්ම

- මිරිස් වගාවේ ප්‍රධාන පළිබෝධයින්ගේ ගහන ගතිකත්වය ඇගයීම
- වීදි බෝග වගාව යටතේ මිරිස් බෝගයේ ක්‍රියාකාරිත්වය
- උඳු ආරවල ජානමය ප්‍රභේදනය සහ ඒ ආශ්‍රිත අධ්‍යයන
- වාර්ෂාපෝෂිත සහ ජල සම්පාදිත තත්වයන් යටතේ උඳු ආර ඇගයීම
- කේසී 1 යන තක්කාලි ප්‍රභේදයේ අභිජනන බීජ නිෂ්පාදනය
- තින්නවේලි සුදු කරවිල ප්‍රභේදයේ අභිජනන බීජ නිෂ්පාදනය
- ගෝවාවල විවිධ පැළෂනත්වයන් සමග සිදු කරන තක්කාලි අන්තර් බෝග වගාව යටතේ තක්කාලි බෝගයේ ක්‍රියාකාරිත්වය
- වීදි බෝග වගාව යටතේ තක්කාලි බෝගයේ ක්‍රියාකාරිත්වය
- ලූනු ජනකප්ලාස්ම නලස්ථව සංරක්ෂණය කිරීම
- ලූනු වගාවේ ඇතිවන නෙමටෝඩාවන් කළමනාකරණය කිරීම සඳහා සුදුසු තාක්ෂණය ජනනය කිරීම
- කරවිල වගාවේ ඇතිවන පළිබෝධ පාලනය සම්බන්ධයෙන් උද්හිදංගමය පළිබෝධනාශක ඇගයීම
- මෑ වගාවේ ඇතිවන පළිබෝධ පාලනය සම්බන්ධයෙන් උද්හිදංගමය පළිබෝධ නාශක ඇගයීම
- දේශීය වී ප්‍රභේද සංශුද්ධ කිරීම
- කුඹුරුවල ලවණතා ගැටලුව සහිත පස් පරීක්ෂා කිරීම
- ගොවීන් විසින් වගා කරන ලවණතා ගැටලුව සහිත ප්‍රදේශවලින් එක්රැස් කරගත් පාංශු සහ ජල නියැදිවල ලවණතාව පිළිබඳව පරීක්ෂා කර බැලීම
- ඉහළ අස්වැන්නක් ලබා දෙන එමෙන්ම කරටි හා ගෙඩි විදින්නාට ප්‍රතිරෝධී, සුදුසු වගා ප්‍රභේදයක් තෝරා ගැනීම පිණිස යාපනය අර්ධද්වීපය තුළ ගොවි ක්ෂේත්‍ර තත්වය යටතේ අර්තාපල්වල දේශීය වගා ප්‍රභේද අත්හදා බැලීම
- වීදි බෝග වගාව යටතේ වම්බටු බෝගයේ ක්‍රියාකාරිත්වය
- වම්බටු වගාව කෙරෙහි ෆොස්ෆේට් සහ ට්‍රිප්ල් සුපර් ෆොස්ෆේට් මගින් ඇති කරන බලපෑම සැසඳීම
- පැළ මැක්කන්ට ප්‍රතිරෝධී මිරිස් ආර පිළිබඳ මූලික අස්වනු අත්හදා බැලීම්
- මිරිස් වගාවේ සිටින පැළ මැක්කන් පාලනය සඳහා උද්හිදංගමය පළිබෝධනාශක දක්වන කාර්යක්ෂමතාව
- දේශීය කොමඩු සමග කොමඩු අන්තර් බෝගයක් ලෙස වගා කිරීම
- වීදි බෝග වගාව යටතේ පිපිඤ්ඤා බෝගයේ ක්‍රියාකාරිත්වය
- වීදි බෝග වගාව යටතේ රතුලූනු බෝගයේ ක්‍රියාකාරිත්වය
- කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ / ක්ෂේත්‍රයේ වල් පැළෑටි ආසාදනය පිළිබඳ අධ්‍යයනය

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරි/ සේවක සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ(පර්යේෂණ)	01
පර්යේෂණ නිලධාරි (වැඩබලන නි. අධ්‍යක්ෂ - පර්යේෂණ)	02
ස්ථාන භාර පර්යේෂණ නිලධාරි	01
පර්යේෂණ නිලධාරි	04
කෘෂිකර්ම උපදේශක	10
පර්යේෂණ උප සහකාර	02
ජල පොම්ප ක්‍රියාකරු	01
මුරකරු	02
කම්කරු	40
එකතුව	**62**

2.2 උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, ගන්නොරුව

උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයට පැවරී ඇති වගකීම වනුයේ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් තුළින් ජාතික උද්‍යාන බෝග නිෂ්පාදනය ඉහළ නැංවීමයි. මෙයට වගකීම පැවරී ඇති බෝගවලට අන්තර්ගත වන්නේ එළවළු, පලතුරු, බිම්මල්, මුල් හා ආකන්ද බෝග සහ මල් බෝගයි. පර්යේෂණ වැසටහන මගින් ප්‍රධාන වශයෙන්ම දියුණු උද්‍යාන බෝග ප්‍රභේද බිහි කිරීම, වැඩිදියුණු කරන ලද බෝග නිෂ්පාදන සහ කළමනාකරණ ක්‍රම, පැළෑටි පෝෂක කළමනාකරණ ක්‍රම, පළිබෝධ හා රෝග කළමනාකරණය, පසු අස්වනු සහ ආහාර සැකසුම් ක්‍රම, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ ගෙවතු වගාව කෙරෙහි අවධානය යොමු කෙරේ.

මෙම ආයතනයේ වගකීම, ඉල්ලුම අනුව කටයුතු කරමින් ඵලදායී, පාරිසරික වශයෙන් හිතකර, තිරසාර, ආර්ථිකමය ශක්‍යතාවෙන් යුතු එමෙන්ම සමාජීය වශයෙන් සාධාරණ උද්‍යාන බෝග පිළිබඳ පර්යේෂණවල නියැලීමයි. මෙමගින් සිදු කරන පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්වලින් මෙම වගකීම ඉටු කිරීමට අරමුණු කෙරේ. මෙම ආයතනයට පැවරී ඇති අනෙකුත් වගකීම් වන්නේ ගොවීන්, කෘෂිකර්ම උපාධි අපේක්ෂකයින් සහ ඩිප්ලෝමා සිසුන් පුහුණු කිරීම සහ ගොවි ප්‍රජාවට හා අනෙකුත් පාර්ශ්වකරුවන්ට නව තාක්ෂණයන් ප්‍රචාරණය කිරීම පිණිස දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමයි.

අයවැය

වගු අංක 2.2.1 වාර්ෂික අයවැය – 2011 (රු.)

වැය ශීර්ෂය	**ප්‍රතිපාදනය**	**වියදම**	**වියදම් %**
මූලධන	13,072,765	13,131,601	100
පුනරාවර්තන	60,572,700	57,442,972	95
ව්‍යාපෘති			
• රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩසටහන	10,000,000	8,761,716	88
• පලතුරු සහ එළවළු දෙමුහුම් බීජ නිෂ්පාදනය	4,100,000	3,499.911	85
• කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම	7,527,470	9,737,587	129
• කාබනික ගොවිතැන් තාක්ෂණය පිළිබඳ ආසියානු ජාලය	840,000	635,719	76
• කඩිනම් එළවළු නිෂ්පාදනය (ගොවි හාරකාර අරමුදල්)	1,108,600	918,082	83
• යටිතල පහසුකම් සංවර්ධනය	5,000,000	3,036,159	61
• ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම	10,000,000	7,483,425	75
• ආදර්ශ ගම්මාන වැඩසටහන	4,100,000	2,860.091	70
එකතුව	**116,321,535**	**107,507,263**	**92**

ප්‍රගතිය

ව්‍යාපෘති

- **එළවළු සහ පලතුරුවල දෙමුහුම් බීජ නිෂ්පාදනය**

ඉතා උසස් තත්ත්වයේ දෙමුහුම් එළවළු සහ පලතුරු ප්‍රභේද බිහි කිරීමේ පර්යේෂණ කිරීම සහ නිර්දේශිත ප්‍රභේදවලට අයත් මාපිය ආර නඩත්තු කිරීම මෙන්ම දෙමුහුම් බීජ නිෂ්පාදනය මෙම වැඩසටහන යටතේ ඉටු කරන කාර්යයන් වේ. තක්කාලි, වම්බටු, වැටකොළු, මාළුමිරිස්, පිපිඤ්ඤා, මෑ, කරවිල ආදී එළවළු සහ පලතුරු (පැපොල්) සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකර ඇත.

- **රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය**

උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය සතුවතමන්ගේම ගොවිපළ ඇති අතර ඒ සියල්ලෙහිම නිර්දේශිත පලතුරු බෝග රෝපණ ද්‍රව්‍ය මව් ශාක උද්‍යාන ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ මුල් හා ආකන්ද බෝග හැරුණු විට කොළ එලවළු සහ ගෙවතු වගා බීජ ද නිපදවනු ලැබීය.

වගු අංක 2.2.2 : 2011වර්ෂයේදී නිපදවන ලද රෝපණ ද්‍රව්‍ය

පලතුරු බෝගය	රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණය
රඹුටන්	36,750
දොඩම්	21,154
දූරියන්	4,150
අඹ	10,884
අන්නාසි	112,000
පෙයාර්ස්	3,240
ජම්නාරං	6,500
මිදි	1.972
දෙළුම්	15,350
එකතුව	**212,000**

කාබනික පොහොර නිෂ්පාදනය සහ ප්‍රවර්ධනය

මෙම ව්‍යාපෘතියේ අරමුණ ශ්‍රී ලංකාවේ ගොවීන් අතර කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීමයි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යය වන්නේ කොම්පෝස්ට් මුහුන් විශාල වශයෙන් නිපදවා තම ගොවි ක්ෂේත්‍රවලම කාබනික පොහොර නිෂ්පාදනය ආරම්භ කිරීමට ඉවහල් වනු පිණිස ඒවා ගොවීන් අතර බෙදා හැරීමයි. එම ව්‍යාපෘතිය මගින් කාබනික පොහොර නියැදි මෙන්ම කොම්පෝස්ට් සෑදීම සඳහා යොදා ගන්නා අමු ද්‍රව්‍ය ද විශ්ලේෂණය කරන ලදී. ඒ අතරම, විවිධ බෝග සඳහා කාබනික පොහොර කාර්යක්ෂම අයුරින් භාවිතා කිරීමට නව පිළිවෙත් මාලාවක් සකස් කිරීම පිණිස සමෝධානික පැළෑටි පෝෂණ ක්‍රම පිළිබඳ අත්හදා බැලීම් ද පවත්වන ලදී.

වගු අංක 2.2.3 : කාබනික ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය

කාර්යය	ප්‍රගතිය
පුහුණුවන්නන් සංඛ්‍යාව	6,178
කොම්පෝස්ට් නිෂ්පාදනය	මෙ.ටො. 445
සමෝධානික පැළෑටි පෝෂක ක්‍රමය	16
පාංශු නියැදි විශ්ලේෂණය	1,372
කොළ පොහොර සඳහා වගාව	3

- **ආදර්ශ ගම්මාන වැඩසටහන**

බෝග නිෂ්පාදනය සඳහා යෝග්‍යතම කළමනාකරණ පිළිවෙත් සහ නිර්දේශිත බෝග, පළිබෝධ හා රෝග හඳුනා ගැනීම සහ කළමනාකරණ පිළිවෙත් පිළිබඳව ගොවීන්ගේ දැනුවත්භාවය වැඩි කිරීම මගින් ඔවුන්ගේ ජීවිකා මාර්ගය වර්ධනය කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණයි. මහනුවර, කුරුණෑගල, මාතලේ, කොළඹ, කළුතර, මොණරාගල, නුවරඑළිය, කෑගල්ල සහ මාතර යන දිස්ත්‍රික්කවලට අයත් ගම්මාන 41 ක ගොවීන්ට සහනදායී මිල ගණන් යටතේ එළවළු හා පලතුරු බෝගවල බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබාදෙන ලදී. එළවළු සහ පලතුරු බෝග කෙරෙහි අවධානය යොමු කරමින් නවතම බෝග නිෂ්පාදන තාක්ෂණික පිළිවෙත් මාලාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්වලට මෙම ගම්මානවල ගොවීන් යොමු කෙරිණි. ගොවීහු 800 කට අධික සංඛ්‍යාවක් වැඩසටහනට සහභාගි වූහ.

කාබනික ගොවිතැන් තාක්ෂණය පිළිබඳ ආසියානු ව්‍යාපෘති ජාලය

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනුයේ ආසියාවේ සාම්ප්‍රදායික, තිරසාර සහ කුඩා කාබනික ගොවිපළ ප්‍රවර්ධනය කිරීම සඳහායි. ශ්‍රී ලංකාවේ කාබනික ගොවිතැන් කටයුතු ශක්තිමත් කිරීම පිණිස මෙම ව්‍යාපෘතිය යටතේ කාර්යයන් ඉටු කිරීම උදෙසා කණ්ඩායමක් මේ වනවිටත් හඳුනාගෙන ඇත. ගොවීන් අතර දැනට භාවිතා වන කාබනික ගොවිතැන් තාක්ෂණයන් එක්රැස් කිරීම පිණිස පියවර ගනිමින් තිබේ. කාබනික ගොවිතැන් ක්ෂේත්‍රයේ එළවළු හා පලතුරු නිෂ්පාදනයට අදාළව ප්‍රධාන වශයෙන්ම පෝෂක කළමනාකරණය සහ පළිබෝධ හා රෝග කළමනාකරණය පිළිබඳ නව තාක්ෂණයන් ජනනය කෙරෙමින් පවතී.

කඩිනම් එළවළු නිෂ්පාදනය (ගොවි භාරකාර අරමුදල්)

මෙම වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ එළවළු නිෂ්පාදනය වැඩි කිරීම මගින් ගොවීන්ගේ ජීවනෝපායන් වර්ධනය කිරීමයි. මෙම අරමුදල් සත්‍ය වශයෙන්ම භාවිතා කරන ලද්දේ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය යටතේ ඇති පර්යේෂණ ස්ථානයන්හි පවතින වගා නොකළ ඉඩම්වල එළවළු බීජ නිෂ්පාදනය වර්ධනය කිරීම පිණිසය.

ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය

පස්යාල සහ වල්පිට පර්යේෂණ ගොවිපළවල පවතින වගාවන් වැඩිදියුණු කර යටිතල පහසුකම් ඉහළ නැංවීම පිණිස ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

වල්පිට පර්යේෂණ ගොවිපළ

අක්කර 02 ක අඹ වගාව පුනරුත්ථාපනය කරන ලදී. හෙ. 3 ක පොල් වගාවට පොහොර යොදා දැනට පවතින දැල් ගෘහ 2 අලුත්වැඩියා කරන ලදී. පොලි-නෙට් ගෘහයක් ද ගෙවතු වගාව සඳහා ජල සම්පාදන ක්‍රම 02 ක් ද මුල් හා ආකන්ද වගාව සඳහා ජල සම්පාදන ක්‍රම 1 ක් ද ස්ථාපිත කරන ලදී. පවතින හෙ. 02 ක රඹුටන් සහ අඹ වගාවන් කප්පාදු කර පොල් ගස්වලට පොහොර ද යොදන ලදී. එමෙන්ම ගොවිපළ උපකරණ ද මිලදී ගන්නා ලදී.

එළවළු බෝග අංශය

මෙම අංශයේ කාර්යයන් මගින් මූලික වශයෙන්ම අවධානය යොමු කරන ලද්දේ පළිබෝධ සඳහා ප්‍රතිරෝධීබව සහතික කරමින් උසස් තත්ත්වයෙන් සහ වැඩි අස්වැන්නෙන් යුතු එළවළු ප්‍රභේද අභිජනනය කිරීම කෙරෙහිය. දෙමුහුම් බිහි කිරීම කෙරෙහි ප්‍රමුඛතාව ලබාදුන් නමුදු සාම්ප්‍රදායික අභිජනන ප්‍රවේශයන් ද උපයෝගී කර ගැනිණි. නව ජාන දර්ශවලින් ප්‍රයෝජන ගැනීම සඳහා අවශ්‍ය පරිදි ශස්‍ය විද්‍යාත්මක අධ්‍යයන පවත්වන ලදී. විවිධ ක්‍රම මගින් තාක්ෂණය ප්‍රචාරණය කිරීමට අමතරව මූලික බීජ නිෂ්පාදනය ද සංවර්ධන කටයුතු තුළ අන්තර්ගත විය.

වැටකොළු

- බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් 02 ක් හඳුනා ගැනිණි.
- මාපිය ආර 06 ක ජානමය නුමුහුන් බව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යන ලදී.
- දෙමුහුම් 10 ක් ජනනය කර බීජ ලබා ගැනිණි. (මුහුන් 10කින් දෙමුහුම් 10ක බීජ ලබා ගැනිණි)
- ස්ථාන 04 කදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පවත්වන ලදී
- දිස්ත්‍රික්ක 03 ක ප්‍රභේද අනුවර්තන පරීක්ෂණ අත්හදා බැලීම් පවත්වන ලදී.

බෝංචි සහ දඹල

- ස්ථාන 03 ක ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පවත්වන ලදී
- දිස්ත්‍රික්ක 04 ක ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පවත්වන ලදී.
- ක්‍රිෂ්ණ (කි.ග්‍රෑ. 08) සහ SLS 44 (කි.ග්‍රෑ. 04) යන දඹල ප්‍රභේදවල අභිජනන බීජ නිපදවන ලදී.
- ' එම් සිලෙක්ෂන් ' නමැති දඹල ආර සංශුද්ධ කරන ලදී.
- ' ගන්නොරුව ග්‍රීන් ' නමැති වැල් බෝංචි ප්‍රභේදයනිදහස් කිරීම සඳහා නම් කරන ලදී.

මෑ

- ' ගන්නොරුව හවරි මෑ ' නමැති මෑ ප්‍රභේදය නිදහස් කිරීම සඳහා නම් කරන ලදී. දේශීය වශයෙන් බිහි කරන ලද ආර 05 ක් ඒවායෙහි අනුවර්තන හැකියාව අධ්‍යයනය කිරීම සඳහා තෝරා ගන්නා ලදී.
- දෙමුහුම් 13ක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් දක්වා වැඩි දියුණු කර ඉහළ අස්වනු ලබාදෙන ආර 03ක් හඳුනා ගැනිණි.

වම්බටු

- වැඩි අස්වනු ලබාදෙන ' ලේන ඉරි ' වම්බටු දෙමුහුම නිදහස් කිරීම සඳහා නම් කරන ලද අතර එම දෙමුහුම ' ලේන ඉරි – 1 ' වශයෙන් නම් කර නිදහස් කරන ලදී.

- අනුවර්ත්‍යතා අධ්‍යයන සඳහා දෙමුහුම් 03ක් තෝරා ගන්නා ලදී.

තක්කාලි

- මෑතකදී නිදහස් කරන ලද 'ලංකා චෙරි' නමැති චෙරි තක්කාලි ප්‍රභේදයේ බීජ ගුණනය කර වැඩිදුර ඇගයීම සඳහා අභිජනන බීජ වශයෙන් නිකුත් කිරීමට අමතරව, උනන්දුවක් දැක් වූ ගොවීන් අතර බෙදා හරින ලදී.

- HF 3 නමැති බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් ප්‍රභේදය සහ MI 127 නමැති බලාපොරොත්තු තැබිය හැකි විකෘත ප්‍රභේදය ඒවායෙහි අනුවර්ත්‍යතාව සනාථ කර ගැනීම සඳහා තවදුරටත් අත්හදා බලන ලදී.

- මොන්ගල්, TM 701, F1 15043, ස්ටාර් 9062 සහ ස්ටාර් 9064 යන විදේශීය තක්කාලි හඳුන්වාදීම් වාණිජමය වගාව සඳහා පිළිගත හැකි බවට හඳුනා ගන්නා ලදී. අපේක්ෂිත අනෙක් තක්කාලි ප්‍රභේද 2 ක්ෂේත්‍ර අත්හදා බැලීම් අනුව වාණිජමය වගාවට නුසුදුසු යැයි සලකන ලදී.

- උසස් ලක්ෂණ සහිත නුමුහුම් ජනනය පිණිස ඉහළ අස්වනු, පළිබෝධ හා රෝගවලට ප්‍රතිරෝධී සහ පිළිගත හැකි මට්ටමේ ලක්ෂණවලින් යුතු ගෙඩි ලබාදීම සම්බන්ධයෙන් වියුක්ත ගහන 04ක වූ ආර තුළ සහ ආර අතරද වරණ කටයුතු සිදු කෙරිණි.

මාළුමිරිස්

- HCA 1 නමැති බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් ප්‍රභේදය එහි අනුවර්ත්‍යතාව සනාථ කර ගැනීම සඳහා වැඩිදුරටත් අත්හදා බලන ලදී.

- විදේශීය ප්‍රභේද ඇගයීම - මාළු මිරිස් හඳුන්වාදීම් කිහිපයක් (21348, HP 210, FST 403 සහ හැලපීනෝ වර්ග, පර්ෆෙක්ටෝ සහ මැග්නිෆිසියෝ) වාණිජමය වගාව සඳහා පිළිගතහැකි මට්ටමින් යුතුයැයි හඳුනා ගන්නා ලදී. අපේක්ෂිත අනෙකුත් තක්කාලි ප්‍රභේද 05 ක්ෂේත්‍ර අත්හදා බැලීම් අනුව වාණිජමය වශයෙන් ආනයනය කිරීමට නුසුදුසු යැයි සලකන ලදී.

පිපිඤ්ඤා

- F1 දෙමුහුම් පිපිඤ්ඤා ප්‍රභේද 02 ක් විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව සම්බන්ධයෙන් අත්හදා බැලීම සඳහා නම් කරන ලදී.

- මාපිය ආර 07 ක ජානමය නුමුහුම් බව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යන ලදී.

- F1 දෙමුහුම්වල තනි මුහුන් 08 ක් සිදුකර බීජ ලබා ගැනිණි.

- පහත සඳහන් ලක්ෂණ සලාද සඳහා ගන්නා පිපිඤ්ඤාපරිණතවීම පිළිබඳ දර්ශක වශයෙන් හඳුනා ගන්නා ලදී.

    - ගෙඩිවල පැහැය - කොළ පැහැයේ සිට කහ පැහැය දක්වා වෙනස්වීම
    - ගෙඩියේ ප්‍රශස්ත පරිධිය සහ බර
    - අස්වැන්න නෙළීම - මල් හට ගැනීමෙන් දින 11-14කට පසු
    - දාර මතු වීම අඩුකර ගැනීම

කරවිල

- කරවිල F1 දෙමුහුම් ප්‍රභේද 02 ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් මට්ටමේ පවතී.

- මාපිය ආර 07ක ජානමය නුමුහුම් බව ඒ ආකාරයෙන්ම පවත්වාගෙන යන ලදී.

- F1 දෙමුහුම්වල තනි දෙමුහුම් 11 කින් බීජ ලබා ගැනිණි.

- විදේශීය කරවිල ප්‍රභේදවල F1 දෙමුහුම් 08ක් අගයන ලදී.

පලතුරු සහ පටක රෝපණ අංශය

පලතුරු

කෙසෙල්

වැඩි අස්වැන්න, උසස් තත්වය සහ පැහැමා රෝගයට ඔරොත්තු දීම සම්බන්ධයෙන් අගයන ලද කෙසෙල් එකතූන් අතුරින් සීනි කෙසෙල් එකතූන් 03 ක් සහ අළු කෙසෙල් එකතුවක් වැඩිදුර ඇගයීම සඳහා තෝරා ගන්නා ලදී. එක් ඇඹුල් කෙසෙල් එකතුවක් සහ එක් සීනි කෙසෙල් එකතුවක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්

තුළඇගයෙමින් පවතී. එක්රැස් කරගත් ඇම්බන් එකතූන් 37 ක් වසර තුළ අගයන ලදී. ඒවායෙහි වර්ධන සහ අස්වනු පරාමිතියන්ද වාර්තාගත කරන ලදී. ඇගයීම අඛණ්ඩව සිදුවෙමින් පවතී.

පැපොල්

තෝරාගත් පැපොල් එකතූන්වල 3 වන පරම්පරාව අගයා වඩාත්ම බලාපොරොත්තු තැබිය හැකි පැළ 12 ක් නුමුහුන් ජනනය සඳහා තෝරා ගැනිණි.

වියළි සහ අතරමැදි කලාප තුළ ක්‍රියාකරන ආකාරය ඇගයීම සඳහා පැපොල් දෙමුහුම් බීජ නිපදවන ලදී. අධික වර්ෂාව හේතුවෙන් බෝගය විනාශ විය. 2012 වර්ෂයේදී ඇගයීම සඳහා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ආරම්භ කරන ලදී.

පැඟිරි

දේශීය හා විදේශීය ප්‍රභේද 15ක් අගයා බලාපොරොත්තු තැබිය හැකි පැළ 2ක් නුමුහුන් ජනනය සඳහා තෝරා ගැනිණි.

රඹුටන්

රඹුටන් ගෙඩි අඩුවීම කෙරෙහි කැල්සියම් මගින් ඇති කරන බලපෑම පිළිබඳව අධ්‍යයනය කරන ලදී. ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ මල් හට ගන්නා අවධියේදී සල්ෆර් සමඟ කැල්සියම් යෙදීමෙන් ගෙඩි අඩුවන බවයි. අධ්‍යයන අඛණ්ඩව සිදු කෙරේ.

දූරියන්

දූරියන් ප්‍රභේද ඇගයීම අඛණ්ඩව සිදු කෙරිණි. දූරියන් එකතූන් 14 ක් අගයන ලදී. එමෙන්ම වර්ධක කොටස් ලක්ෂණීකරණය එකතූන් 2 ක සිදු කරන ලදී. එකතූන් 5 ක මල් හට ගැනුණු අතර උසස් තත්ත්වයේ ගෙඩි ලබාදෙන වඩා හොඳ මුහුන් සංයෝග සොයා ගැනීම පිණිස විවිධ මුහුන් 05 ක් සිදු කෙරිණි. මෙම මුහුන්වල ඇති වූ ගෙඩිවල තත්ත්වය පිළිබඳ දත්ත වාර්තාගත කරන ලද අතර ඇගයීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.

උගුරැස්ස

එක්රැස් කරගන්නා ලද එකතූන් ඇගයීම වසර තුළ අඛණ්ඩව සිදු කෙරේ. වසර තුළ එක් එකතුවක් ගෙඩි කිහිපයක් නිපද වූ අතර අනෙකුත් එකතූන් වල තවමත් මල් පිපීම ආරම්භ වී නොමැත. ඒ පිළිබඳව දත්ත එක්රැස් කරන ලදී. වැඩිදුර ඇගයීම සිදු කෙරෙමින් පවතී.

අඹ

අඹවල විවිධ ග්‍රාහක සහ අතරමැදි ග්‍රාහක සඳහා ගන්නා ප්‍රභේද උල්පොතගම ගොවිපළෙහි ඇගයීමට ලක් කෙරෙමින් පවතී. ඒවායෙහි වර්ධක හැසිරීම පිළිබඳ දත්ත එක්රැස් කරන ලදී. පළමු ඵල දැරීමේදී සමහර ගස්වල ගෙඩි කිහිපයක් ඇති විය. දත්ත එක්රැස් කිරීම සිදු වේ.

ඩ්‍රැගන්ෆෘට්

කණුවක් සඳහා තිබිය යුතු විවිධ රතු ඵල හා සුදු ඵල සහිත ඩ්‍රැගන් ෆෘට් පැළ සංඛ්‍යාවන් ඇගයීමේ කටයුතු ආරම්භ කරන ලදී. මෙම වසර තුළ සමහර පැළ මල් සහ ගෙඩි නිපදවිය. ඒවායෙහි වර්ධන සහ අස්වනු ක්‍රියාකාරීත්වය වාර්තා කරන ලද අතර ඇගයීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.

පටක රෝපණය

පැළෑටි පුනර්වර්ධන ක්‍රම

එළවළු

තක්කාලි*(Lycopersicon esculentum)*

'තිලිණා' තක්කාලි ප්‍රභේදයේ පරාගධානි රෝපණය සඳහා නව කිණාක ජනන මාධ්‍ය අත්හදා බැලෙමින් පවතී. පරාගධානිවලින් ඇති වූ කිණාකවලින් ඒකගුණ පැළ පුනර්වර්ධනය කිරීම පිණිස පර්යේෂණ අඛණ්ඩව සිදු කෙරෙමින් තිබේ.

පලතුරු

කෙසෙල්

කෝලිකුට්ටු කෙසෙල් සඳහා නලස්ථ තාක්ෂණයන් ජනනය

නලස්ථ කෝලිකුට්ටු කෙසෙල් ගුණනය වැඩි කිරීම පිණිස පර්යේෂණ සිදු කෙරිණි. මේ සඳහා යොදාගත් මුල් ශාක කොටසින් කුඩා පැළ 500කට අධික සංඛ්‍යාවක් නිපදවීමට හැකි වූ බව ප්‍රතිඵල මගින් පෙනිණි.

විභාජකරෝපණය මගින් කෙසෙල්වල ව්‍යාධි ජනකවලින් තොර අත්තිවාරම් රෝපණ ද්‍රව්‍ය නිපදවීම පිණිස නලස්ථ තාක්ෂණයන් ජනනය

කෙසෙල්වල විභාජක, ගුණන කටයුතු සඳහා යොදාගත හැකි නමුත් පුනර්වර්ධන අනුපාතය නිෂ්පාදන ක්‍රමයට හඳුන්වාදීමට තරම් ප්‍රමාණවත් නොමැත. කෙසෙල් විභාජක ගුණන අනුපාතය ඉහළ නැංවීම සඳහා තවදුරටත් පර්යේෂණ කිරීම අවශ්‍යය.

මිදි

'තොම්ප්සන්' නමැති බීජ රහිත මිදි ප්‍රභේදය නලස්ථ ප්‍රචාරණය සඳහා හඳුන්වා දෙන ලදී. මෙහිදී ප්‍රරෝහ ගුණනයක් නිරීක්ෂණය කිරීමට ලැබුණු අතර නිසි හෝමෝන සංයෝජන හඳුනා ගැනීම සඳහා විවිධ හෝමෝන ප්‍රමාණයක් අත්හදා බලන ලදී. සම්පූර්ණ ස්වරූපයේ කුඩා පැළපුනර්වර්ධනය සඳහා ගුණනය කරන ලද

ප්‍රරෝහ මුල් ඇදීම සිදුවන මාධ්‍යවලට හඳුන්වා දෙන ලදී.

පැඟිරි

ප්‍රරෝහ අග්‍රස්ථ සහ පර්ව කැබලි යොදා ගනිමින් ආරෝග්‍යා නමැති පැඟරි ප්‍රභේදය සඳහා නලස්ථ ප්‍රචාරණය ප්‍රායෝගික බැව් පර්යේෂණ මඟින් අනාවරණය විය. කෙසේවුවද, මෙහි ප්‍රරෝහ ජනනය ඉතා සෙමෙන් සිදුවිය. පර්යේෂණය අබණ්ඩව සිදු කෙරේ.

බෙලි

'සුපුන්' නමැති බෙලි ප්‍රභේදයේ නලස්ථ මුල් ඇද්දවීමේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා පර්යේෂණ අබණ්ඩව සිදු කෙරෙමින් පවතී.

පටක රෝපිත කුඩා පැළ ක්ෂේත්‍රයේ ඇගයීම

- පටක රෝපිත නේත්‍රාපලම් පැළ ක්ෂේත්‍රයේදී අත්හදා බැලීම සඳහා ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදී. ඇගයීම සිදු කෙරෙමින් පවතී.
- පටක රෝපිත අන්නාසි පැළවලින් ඇති වූ ගෙඩිවල රසය හා තත්ත්වය සම්බන්ධයෙන් යම් යම් ගැටළු මතුව ඇති හෙයින් පටක රෝපිත අන්නාසි පැළ (මුරුසි සහ කිවි යන ප්‍රභේද) ක්ෂේත්‍රයේ රෝපණය කරන ලදී. ඇගයීම අබණ්ඩව සිදු කෙරෙමින් පවතී.

කීට විද්‍යා අංශය

ගෝවා වගාවේ පත්‍ර කන දළඹුවා පාලනය කිරීමට යොදන දේශීය සංස්ලේෂක කොහොඹ කෘමිනාශකයක ක්‍රියාකාරීත්වය

'සිතුමිණ' යන වෙළඳ නාමය සහිත දේශීය සංශ්ලේෂක කොහොඹ නිෂ්පාදනය වත්මන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත කෘමිනාශක සහ කෘමිනාශක පිළියම් නොයෙදූ පාලකය සමඟ ගෝවා පත්‍ර කන දළඹුවාට එරෙහිව අත්හදා බලන ලදී. කොහොඹ නිෂ්පාදනය, පිළියම් නොයෙදූ පාලකයට සාපේක්ෂව ගෝවාවල පත්‍ර කන දළඹු සංඛ්‍යාව අඩු කිරීමේදී සැලකිය යුතු අයුරින් සාර්ථක වූ බව සොයා ගැනිණි. එමෙන්ම ක්ලෝෆ්ලුඅසරන් සහ කොහොඹ බීජ ජලීය නිස්සාරකය යන වත්මන් නිර්දේශ සමඟ සසඳා බැලූවිට මෙහි කෘමිනාශක ක්‍රියාකාරීත්වය සැලකිය යුතු අයුරින් අඩු නොවීය.

අස්වනු ක්‍රියාකාරීත්වය සහ පළිබෝධ හා රෝග වලට දක්වන ප්‍රතිරෝධිතාව සම්බන්ධයෙන් විදේශීය වැටකොළු ප්‍රභේද ඇගයීම

එළිමහනේ පරාගණය වූ කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රභේදය වන 'LA 33' සහ ප්‍රචලිත විදේශීය දෙමුහුම් ප්‍රභේදය වන 'නාග' සමඟ විදේශීය වැටකොළු දෙමුහුම් 08ක් අගයන ලදී. මෙම ප්‍රභේද සමහරක් කන්න 02ක් සඳහා අත්හදා බලන ලද අතර නව වර්ග වීම හේතුවෙන් සමහර ප්‍රභේද එක් කන්නයකදී පමණක් අත්හදා බලන ලදී. බොනැන්සා, සනී සහ 041044 යන ප්‍රභේද යල සහ මහ යන කන්න 02 තුළම අත්හදා බලන ලද අතර එම ප්‍රභේද කන්න දෙකේදීම වඩා වැඩි අස්වනු ගෙනදෙන බව හඳුනා ගැනිණි. LA 33 යන නිර්දේශිත ප්‍රභේදයට සාපේක්ෂව මෙම ප්‍රභේද පළිබෝධ හා රෝගවලට (විශේෂයෙන්ම වයිරස් රෝගවලට සහ කොමඩු මැස්සාට) ඔරොත්තු දෙන බවත් සොයා ගැනිණි. සුලභව වගා කරන 'නාග' නමැති විදේශීය දෙමුහුම් ප්‍රභේදයේ ක්‍රියාකාරීත්වය සමඟ යටෝක්ත ප්‍රභේද 03හි ක්‍රියාකාරීත්වය සසඳා බැලූවිට සැලකිය යුතු වෙනස්කම් දක්නට නොලැබිණි. එමනිසා, වාණිජමය වශයෙන් බිප් ආනයනයට අනුමැතිය ලබාදීම සඳහා යටෝක්ත ප්‍රභේද 3 නිර්දේශ කෙරිණි.

කොල්ලු කහ විචිත්‍ර වයිරස් රෝගයේ ධාරක පරාසය හඳුනා ගැනීම

ශ්‍රී ලාංකිකයන්ගේ ආහාර වේල්වලට ප්‍රධාන වශයෙන්ම එක්කරන එළවළු රනිල වර්ග 04ක් සහ ධාන්‍ය රනිල වර්ග 06ක් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී. බෝංචි *(Phaseolus valgaris)*, මෑ *(Vigna unguiculata* sub sp. *sequipedalis)*, බුෂ්ටා *(Vigna unguiculata* Walp*)* සහ දඹල *(Psophocarpus tetragonolobus)* තෝරාගත් එළවළු රනිලවලට ඇතුළත් වන අතර මුං *(Vigna radiata)*, උඳු *(Vigna mungo)*, කව්පි (*Vigna unguiculata)* සෝයා බෝංචි *(Glycine max)*, රටකජු *(Archis hypogaea)* සහ කොල්ලු *(Marcrotyloma uniflorum)*ධාන්‍ය රනිලවලට ඇතුළත් විය. කෘමීන්ට ඇතුළු විය නොහැකි කූටීරවල තබා තිබූ බඳුන්වල වගා කරන ලද නීරෝගී බෝගවලට රෝගය පතුරුවාලීම සඳහා විද්‍යාගාරයේ බෝ කරන සුදු මැස්සන් යොදා ගන්නා ලදී. අධ්‍යයනය මඟින් පෙන්වා දෙන ලද්දේ බෝංචි, සෝයා බෝංචි සහ කොල්ලු යන බෝග කොල්ලු කහ විචිත්‍ර වයිරසයට ගොදුරු වූ අතර 'බෝංචි' සුදු මැස්සන් වඩාත් ආකර්ශනය වූ රනිල බෝගය විය. සුදු මැස්සන්ට ගොදුරු වූ ආකාරය අනුව බෝංචි පළමු ස්ථානයේ ද සෝයා බෝංචි දෙවන ස්ථානයේ ද කොල්ලු තෙවන ස්ථානයේ ද විය.

යුෂ උරාබොන පළිබෝධයින් පාලනය කිරීම සඳහා කෘමිනාශක පරීක්ෂා කර බැලීම

වම්බටු සහ බණ්ඩක්කා ආසාදනය කරන සුදු මැස්සන් *(Bemisia tabaci)* සහ පත්‍ර කීඩෑවන් *(Amrasca* sp.*)*

දැනට නිර්දේශිත කෘමිනාශකවල නව සම්මිශ්‍රණ 03, නිර්දේශිත සම්මිශ්‍රණයක් (ඇසිටැමිප්‍රිඩ් 20 SP.), ප්‍රතිකම් නොයෙදූ පාලකයක් සහ වම්බටු හා බණ්ඩක්කාවල යුෂ උරා බෝන පළිබෝධ සම්බන්ධයෙන් ගොවීන් අනුගමනය කරන පිළිවෙත් සමඟ එකිනෙකට වෙනස් පර්යේෂණ 02 කදී අගයන ලදී. පර්යේෂණාවල නිරීක්ෂණයන්ට අනුව, ප්‍රතිකම් නොයෙදූ පාලකයට සාපේක්ෂව නව සම්මිශ්‍රණ 03ම (ඇසිටැමිප්‍රිඩ් 20 SL, තයමෙතොක්සම් 75 SG, හා ඉමිඩක්ලෝප්‍රිඩ් 70 WG) ඉහත කී බෝග 02 හි යුෂ උරාබොන ප්‍රධාන පළිබෝධයින් දෙදෙනා සහ සුදු මැස්සා (*Bemisia tabaci*) සහ පත්‍ර කීඩෑවා (*Amrasca Sp.*) පාලනයේදී සැලකිය යුතු අයුරින් ඵලදායී විය. කෙසේ වුවද, තයමෙතොසම් 75 SG සහ ඉමිඩක්ලෝප්‍රිඩ් 70 WG අත්හදා බලන ලද්දේ එක් කන්නයකදී (යල) පමණක් වන අතර එම කෘමිනාශක තවත් කන්නයකදී (මහ) අත්හදා බැලීම අවශ්‍යය. ඇසිටැමිප්‍රිඩ් 20 SL කන්න 02ක් පුරා (යල සහ මහ) අත්හදා බලා ඇති හෙයින් එය සුදු මැස්සන් සහ පත්‍ර කීඩෑවන් පාලනය සඳහා නිර්දේශ කළ හැකිය.

කොල්ලු සහ මොසායික් වයිරසය හේතුවෙන් ඇතිවන බෝංචි කහපැහැවීම පාලනය සඳහා හෝමියෝපතික ස්වාභාවික පළිබෝධනාශක/ පොහොර අත්හදා බැලීම

අත්හදා බලන ලද සංයෝග කිසිවක් කොල්ලු කහ විචිත්‍ර වයිරසය පාලනය කිරීමේදී ඵලදායී නොවිය. ප්‍රතිකම් නොයෙදූ පාලකය හා ප්‍රතිකම් අතර කිසිදු සැලකිය යුතු අස්වනු වෙනසක් දක්නට නොලැබිණි.

මිදි වගාවේ පළිබෝධ හා රෝග කළමනාකරණය සහ 'තොම්ප්සන් සීඩ්ලස්' ප්‍රභේදයේ ගෙඩිවල ප්‍රමාණය කළමනාකරණය (ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම)

දැනට ඇති පළිබෝධ හා රෝග හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් පවත්වන ලදී. හඳුනා ගන්නා ලද රෝග, ව්‍යාධිවේද විෂයය යටතේ වාර්තා කර ඇත.

රතු පැළ මැක්කන් (*Selenothrips rubrocinctus*) සහ රතු මකුළු මයිටාවන් (*Tetranychus urticae*) හඳුනා ගන්නා ලද ප්‍රධාන පළිබෝධයින් විය. මෙම පළිබෝධ පාලනය සඳහා ඵලදායී කෘමිනාශක හඳුනා ගන්නා ලදී. කල්පිටිය ප්‍රදේශයේ මිදි වගාවකින් එක්රැස් කර ගන්නා ලද හානි වූ ඉදුණු මිදි ගෙඩි නියැදිවල පතංග සලබයෙක් දක්නට ලැබිණි. කෙසේ වුවද, සලබයා ගණය/විශේෂය දක්වා හඳුනා ගත යුතුය. ඒ හැරුණුවිට, විශේෂයෙන්ම මයිනා සහ පොළොස් කොට්ටෝරුවා යන පක්ෂීන් ද මිදි ගෙඩිවල පළිබෝධයන් බව ගොවිහු වාර්තා කළහ.

හඳුනා නොගත් හේතූන් මත මිදි වැල් 10ක් පමණ මියගිය බව කල්පිටිය කෘෂිකම් පර්යේෂණ ස්ථානය විසින් වාර්තා කරන ලදී. මෙයට කිසිදු පළිබෝධ සහ රෝග සම්බන්ධයක් තිබූ බවට නිරීක්ෂණය කිරීමට නොලැබුණු හෙයින් එයට කාරක වූ සාධකය සොයා ගැනීම පිණිස විමර්ශන සිදු කෙරෙමින් පවතී. ඒ හැරුණුවිට, වැල් යථා තත්ත්වයට පත්කර ගැනීම පිණිස පසේ ස්වභාවය විවිධ ද්‍රව්‍ය යෙදීම මගින් වෙනස් කර එමඟින් ඇති කරන බලපෑම පිළිබඳ නිරීක්ෂණ වාර්තා කෙරෙමින් තිබේ. යථෝක්ත ව්‍යාපෘති වැඩකටයුතු සඳහා කල්පිටිය කෘෂිකම් පර්යේෂණ ස්ථානයේ නව වගාවක් ස්ථාපිත කිරීම පිණිස ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී 'තොම්සන් සීඩ්ලස්' යන ප්‍රභේදයේ රෝපණ ද්‍රව්‍ය ගුණනය කෙරෙමින් පවතී.

පැෂන් පෘථිවල කඳ ඉදිමීමට කාරක වන සාධක සහ එය කළමනාකරණය කිරීම

සමීක්ෂණයේදී නෙසිඩියොකොරිස් ටෙනුයිස් (*Nesidiocoristenuis*) සහ පයිටොෆගස් කලෙම්බෝලන්ස් (*Phytophagous collembolans*) වශයෙන් සැක කරන ආකාර 02ක් සහ හානි වූ පැෂන් පෘථි වැල් අතර සබඳතාවක් හඳුනා ගන්නා ලදී. මියගිය වැල්වල තිබී දිලිර ව්‍යාධිජනකයක් (*Fusarium* spp.)සොයා ගැනිණි. කෙසේ වුවද, වෙන්කර ගන්නා ලද ව්‍යාධිජනක කෘත්‍රිමව ආක්‍රාමණය කිරීම මගින් රෝග ලක්ෂණ වර්ධනය කරගත නොහැකි විය. එමෙන්ම අත්හදා බලන ලද රසායනික ප්‍රතිකම් මගින් හානි වූ පැළ යථා තත්ත්වයට පත් කරගත නොහැකි විය.

කාබනික නිෂ්පාදන සහ පැළෑටි නිස්සාරක පිළිබඳ විද්‍යාගාර ඇගයීම

මෙම ව්‍යාපෘතිය යටතේ පැළෑටි නිස්සාරක සහ කාබනික නිෂ්පාදන 20ක් උපයෝගී කර ගනිමින් විද්‍යාගාර පෙව් නිර්ණ [කුඩිත්තන් - 4, දියමන්ති පිට සලබයා -14 සහ ක්‍රොසිඩොලොමියා- 3 (*Crocidolomio*)] සිදු කරන ලදී. ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ කොහොඹ පත්‍රවල, ජාපාල බීජ මදයේ(*Croton tiglium*) සහ වදකහ රයිසෝමවල

ජලීය නිස්සාරක දියමන්ති පිට සලබ සුනුඹුලාගේ මරණය සහ ආහාර ගැනීම වැළැක්වීම ඇති කළ බවයි.

සමෝධානික පළිබෝධ කළමනාකරණයට අනුරූපී කෘමිනාශක සහ සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාව

සමෝධානික පළිබෝධ කළමනාකරණයට අනුරූපී පහත සඳහන් කෘමිනාශක, පෙව කාර්යක්ෂමතා අධ්‍යයනවල ප්‍රතිඵල මත පදනම්ව නිර්දේශ කිරීම සඳහා නම් කරන ලදී.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත කෘමිනාශක බොහොමයක් මගින් පාලනය නොවූ වම්බටු කරටි සහ ගෙඩි විදින්නා පාලනය සඳහා ලීටර් 10කට මිලි ලීටර් 1.9ක අනුපාතයෙන් රයිනැක්සිපයර් (කොරජන් 18.5SC) යෙදීම

- ගෝවාවල පතු කන දළඹුවා පාලනය සඳහා ලීටර් 10කට මිලි ලීටර් 1.5ක අනුපාතයෙන් රයිනැක්සිපයර් (කොරජන් 18.5 SC)සහ ලීටර් 10කට මිලි ලීටර් 1ක ප්‍රමාණයෙන් බ්‍රිස්ටිෆ්‍යුරන් 10EC ද යෙදීම.

- බෝංචි කරල් විදින්නා පාලනය සඳහා ලීටර් 10කට මිලි ලීටර් 1.9ක අනුපාතයෙන් රයිනැක්සිපයර් (කොරජන් 18.5 SC) ද හෙක්. 01කට ග්‍රෑම් 69-108ක අනුපාතයෙන් වර්ටකෝ (ලීටර් 10කට ග්‍රෑම් 1.5)ද හෙක්. 01කට මිලි ලීටර් 137-216 ක අනුපාතයෙන් ස්පිනොසැඩ් (ලීටර් 10කට මිලි ලීටර් 3) ද යෙදීම.

- හෙක්. 01කට මිලි ලීටර් 129-210 බැගින් ට්‍රෙසර් 45 SC (ස්පිනොසැඩ් 450 SC- ලීටර් 10කට මිලි ලීටර් 3) ද හෙක්. 01කට මිලි ලීටර් 645-1050 බැගින් බ්‍රිස්ටිෆ්ලූරන් 10 EC (ලීටර් 10කට මිලි ලීටර් 15),ද හෙක්. 01කට ග්‍රෑම් 52-84 බැගින් වර්ටකෝ 40 WG (ලීටර් 10කට ග්‍රෑම් 1.2) ද හෙක්. 01කට ග්‍රෑම් 86-140 බැගින් ෆ්ලූබෙන්ඩයමයිඩ් WG - බෙල්ට් (ලීටර් 10කට ග්‍රෑම් 2)ද හෙක්. 01කට ග්‍රෑම් 129-210 බැගින් රයිනැක්සිපයර් - කොරජන් 18.5 SC(ලීටර් 10කට මිලි ලීටර් 3)තක්කාලි ගෙඩි විදින්නා පාලනයට නිර්දේශයන් වශයෙන් නම් කරන ලදී.

පැගිරිවල පළිබෝධ පාලනය සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් බිහි කිරීම පිණිස ආර්ථිකමය වශයෙන් වැදගත් පළිබෝධ සොයා ගැනීම සඳහා මූලික සමීක්ෂණයක් සිදු කෙරිණි. පත්‍ර කණින්නන්, පත්‍රකන දළඹුවන්, කුඩිත්තන්, පලතුරු මැස්සන් වඩාත්ම වැදගත් පළිබෝධ බව සොයා ගැණිනි. කෙසේ වුවද, ගෙඩි විදින සලබයාද පොතු කෘමීන් සහ මයිටාවන් ද සමහර ප්‍රදේශවල ආර්ථිකමය වශයෙන් වැදගත් වන මට්ටමින් දක්නට ලැබිණි. පැගිරිවල ඇතිවන පළිබෝධයන් සම්බන්ධයෙන් සිදු කළ ප්‍රභේදීය ඇගයීම මගින් පෙන්වාදෙන ලද්දේ කිසිදු ප්‍රභේදයක් කුඩිත්තන්, පත්‍ර කණින්නන් සහ පත්‍ර කන දළඹුවන්ට ප්‍රතිරෝධී නොවුණු බවයි.

කොමඩු මැස්සන් ප්‍රෝටීන් උගුලට හා ලක්ග්‍රෝ උගුලට ආකර්ශනය වීම කෙරෙහි සුනුඹුල් වයස බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනයේ ප්‍රතිඵල මගින් පෙන්වාදෙන ලද්දේ දින 4-10ක් වයසැති සුනුඹුලුන් ප්‍රෝටීන් උගුලට බෙහෙවින් ආකර්ශනය වූ අතර දින 13 ඉක්ම වූ සුනුඹුලුන් එසේ නොවූ බවයි. එමනිසා කොමඩු මැස්සන් සාර්ථකව පාලනය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් ක්‍රියාවට නැංවීමේදී මල් පිපීම ආරම්භ වන අවස්ථාවේම ප්‍රෝටීන් උගුල යෙදීමද ආරම්භ කළ යුතුය.

ස්වාභාවික වාණිජමය පළිබෝධනාශකයක් වන 'ගන්නොරුව පළිබෝධ පාලකය' බිම්මල් වගාවේ පළිබෝධ සම්බන්ධයෙන් අත්හදා බලා බිම්මල් මයිටාවන් පාලනය සඳහා එහි ඵලදායී බව අඩු යැයි සොයා ගන්නා ලදී.

වට්ටක්කාවලට වැළඳී නව වයිරස් රෝගයට කාරක වූ සාධක හඳුනා ගැනීම සහ එය පාලනය කිරීමේ ක්‍රම බිහි කිරීම

වාරියපොළ සහ මාකඳුර (වයඹ පළාත) පැවති රෝග ආසාදිත වට්ටක්කා බෝගයේ පත්‍ර නියැදි වයිරස් වර්ග 05ක් සඳහා (PRSV, ZYMV, TRSV, ToRSV සහ CGMMV) සෘණාත්මක ප්‍රතිඵල පෙන්වීය.

ගන්නොරුවේ (මධ්‍යම පළාත)වූ රෝග ආසාදිත බෝගයේ පත්‍ර නියැදි එක් වයිරසයක් සඳහා (PRSV) ධනාත්මක ප්‍රතිඵල ද වයිරස් වර්ග 06ක් සඳහා (CMV, WMV, ZYMV, ToRSV,ToRSVසහ CGMMV) සෘණාත්මක ප්‍රතිඵල ද පෙන්වීය. අනෙකුත් වයිරස් සම්බන්ධයෙන් 2012 වර්ෂයේදී වැඩිදුර පරීක්ෂා කර බැලෙනු ඇත.

පාලක ප්‍රතිකර්මයට සහ සාමාන්‍ය වගා පිළිවෙත් වලට සම්බන්ධ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශයන්ට සාපේක්ෂව වට්ටක්කාවල පළිබෝධ හා රෝග පාලනය සම්බන්ධයෙන් කුකුර්බිට්ස් බෝගවලට අදාළව දැනට පවතින සමෝධානික

පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාව අත්හදා බැලීම පිණිස මාකඳුර කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී ක්ෂේත්‍ර පරීක්ෂණයක් පවත්වන ලදී.

බෝගය දැඩි ලෙස සුදු මැස්සන් හේතුවෙන් ආසාදනය වී තිබූ අතර එහි පැළ මැක්කන්, කුඩිත්තන් සහ පිපිඤ්ඤා කුරුමිණි ගහනයන් පැවතියේ ඉතා අඩු මට්ටමකිනි. දැනට ඇති සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාව වට්ටක්කා බෝගයේ වයිරස් ආසාදනය අඩු කරලීමේදී එතරම් ඵලදායී නොවූ බව සොයා ගැනිණි.

වට්ටක්කා බෝගයේ සුදු මැසි ආසාදනය සහ වයිරස් ආසාදනය අඩු කිරීම පිණිස ඵලදායී පාලන ක්‍රමයක් වශයෙන් පරාවර්තනය වන පොලිතීන් වසුන් භාවිතය ඵලදායී පාලන ක්‍රමයක් බව සොයා ගැනිණි. එයට අමතරව, පරාවර්තනය වන පොලිතීන් වසුන්වලට වයිරස් ආසාදන ආරම්භය ප්‍රමාද කළ හැකිය. කහ පැහැ ඇලෙන සුළු උගුල් පමණක් යෙදීමේ ඵලදායකත්වය ද අඩුය.

සුදු මැස්සන්, කුඩිත්තන්, පැළ මැක්කන් සහ කීඩෑවන් කලින්ම ආසාදනය වීමෙන් බෝගය රැක ගැනීම සඳහා වට්ටක්කාවලට බීජ ප්‍රතිකර්මය කිරීමට ඵලදායී විකල්පයක් වශයෙන් ඉමිඩක්ලෝප්‍රිඩ් 70% WS සුදුසු බැව් සොයා ගැනිණි. එම ප්‍රතිඵල සනාථ කර ගැනීම පිණිස වැඩිදුර අධ්‍යයන 2012 වර්ෂයේදී සිදු කෙරෙනු ඇත.

ලියාපදිංචිය අපේක්ෂාවෙන් ඇති කෘමිනාශක අත්හදා බැලීම

නව ප්‍රභවයකින් ආ පරීක්ෂණ කෘමිනාශකය වන තයමෙතොක්සම් 25% WDG මාළු මිරිස්වල කුඩිත්තන්, සුදු මැස්සන් හා කොළ කොඩවිමේ සංකීර්ණය ඇති කරන පැළ මැක්කන් පාලනයේදී ඵලදායී වූ බව සොයා ගැනිණි. ඇසිෆේට් 75% SP පත්‍ර කීඩෑවන් පාලනය සඳහා යොදා ගත්විට එය එතරම් ඵලදායී නොවූ බවත් එයින් ඉලක්ක නොකළ කෘමි පළිබෝධයෙකු වන පැළ මැක්කන් ගහනය වර්ධනය වූ බවත් සොයා ගැනිණි. මෙම ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා වැඩිදුර අධ්‍යයන 2012 වර්ෂයේදී සිදු කෙරෙනු ඇත.

කෙසෙල් ගුල්ලන්ට ප්‍රතිරෝධී කෙසෙල් වගා ප්‍රභේද/ප්‍රභේද පරීක්ෂා කර බැලීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම පිණිස විද්‍යාගාර පරීක්ෂණයක් පවත්වන ලදී. එම පරීක්ෂණය තවදුරටත් සිදු කෙරේ.

ඉඟුරුවල ඇති වූ නව පළිබෝධ ගැටළුවට කාරක වූ සාධක හඳුනා ගැනීම සහ එය පාලනය කිරීමේ ක්‍රම බිහි කිරීම

නව පළිබෝධයෙක් වන ඉඟුරු රයිසෝම මැස්සා *(Mimegralla coeruleifrons)* ශ්‍රී ලංකාවේ ඉඟුරු බෝගයට විශාල හානියක් ඇති කරන බව හඳුනා ගැනිණි. පළිබෝධ හානියට ලක් වූ රයිසෝමවල පාංශු දිලිර, නෙමාටෝඩාවන් සහ මයිටාවන් ද දක්නට ලැබූ හෙයින් හානි වූ ක්ෂේත්‍රවල සංකීර්ණ තත්ත්වයක් නිරීක්ෂණය කිරීමට ලැබිණි. ඒ හේතුවෙන් අවසානයේ රයිසෝම කුණුවේ. ඉමිඩක්ලෝප්‍රිඩ්, කාබොසල්ෆේන්, ක්ලෝර්පයිරිෆස්, නෙවැලියුරන් සහ ඉටොෆෙන්ප්‍රොක්ස් පළිබෝධයා පාලනය සඳහා ගොවි ක්ෂේත්‍රවල අත්හදා බලන ලදී. එම කෘමිනාශක කිසිවක් බෝග හානිය පාලනය කිරීමට අසමත් විය.

නිශ්චය කර ගන්නා ලද නව පළිබෝධ හානි

- ශ්‍රී ලංකාවේ පළමු වරට ඉඟුරු බෝගයට හානි කරන ඉඟුරු රයිසෝම මැස්සෙකු *(Mimegralla coeruleifrons)* හඳුනා ගැනිණි.
- බිම්මල්වලට හානි කරන පැළ මැක්කෙකු ද බඹරදෙණියේදී නිරීක්ෂණය කිරීමට ලැබිණි. මෙය ශ්‍රී ලංකාවේ බිම්මල් වගාවට පැළ මැක්කන් හානි කරන බවට ලද පළමු වාර්තාවයි.

පැළෑටි ව්‍යාධිවේද, ක්ෂුද්‍ර ජීව විද්‍යා සහ බිම්මල් අංශය

මෙම අංශයට අයත් ප්‍රධාන කාර්යයන් වන්නේ පැළෑටි රෝග හඳුනා ගැනීම, ඒකාබද්ධ රෝග කළමනාකරණ පිළිවෙත් මාලාවක් බිහි කිරීම දිලිරනාශක අත්හදා බැලීම, බීජවල හා පැළෑටිවල නිරෝගීබව පරීක්ෂා කිරීම, රෝග පාලනය සඳහා උපදේශක සේවා සැපයීම සහ මුතුබෙලි, පිදුරු සහ සූකිරි බිම්මල් සඳහා දියුණු තාක්ෂණයන් ජනනය කිරීමයි. පුහුණු පංති, පැළෑටි සායන, පත්‍රිකා හා පර්යේෂණ පත්‍රිකා මගින් නව තාක්ෂණයන් ප්‍රචාරණය කෙරේ.

බැක්ටීරියා හිටු මැරීමට ප්‍රතිරෝධී වන විදේශීය දෙමුහුම් පරීක්ෂා කර බැලීම

රැල්ස්ටොනියා සොලනේසියාරුම් *(Ralstonia solanacearum)* මගින් ඇතිවන බැක්ටීරියා හිටු මැරීමට ප්‍රතිරෝධී වන ආකාරය දැන ගැනීම සඳහා විවිධ රටවලින් ආනයනයකරන ලද තක්කාලි දෙමුහුම් 21ක්, වම්බටු දෙමුහුම් 12ක් සහ මාළු මිරිස් දෙමුහුම් 03ක් අත්හදා බලන ලදී. විදේශීය තක්කාලි, වම්බටු සහ මාළු මිරිස් දෙමුහුම් සමහරක් බැක්ටීරියා හිටු මැරීමට මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී වන ආකාරයක් පෙන්විය. එම

දෙමුහුම් දේශීය වගාව සඳහා නිර්දේශ කිරීමට පෙර ඒවායෙහි අනුවර්ත්‍යතාව සහ අස්වනු ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් තවදුරටත් අත්හදා බැලෙමින් තිබේ.

බීජ අර්තාපල් තොග පිළිබඳ විමර්ශන කටයුතු හා ඒවා විද්‍යාගාරයේදී පරීක්ෂා කර බැලීම

තොගවල වූ බීජ අර්තාපල් ආකන්දවල රයිසොක්ටොනියා සොලනි *(Rhizoctonia solani)* විසින් ඇතිකරන කළු පටල රෝගය ද හෙල්මින්තොස්පොරියම් සොලනි (*Helminthosporium solani*) විසින් ඇති කරන රිදී පටල රෝගය ද ස්ට්‍රෙප්ටොමයිසස් විශේෂ (*Streptomyces* sp.) විසින් ඇති කරන පොදු හා ජාලාකාර කබොළු රෝගය ද නිරීක්ෂණය කරන ලද අතර පියොටිකම් කැන්ඩිඩම් *(Geotrichum candidum)* විසින් ඇතිකරන රබරි රොට් රෝගයද දක්නට ලැබුණේ කලාතුරකිනි. කෙසේවුවද, රෝග ආසාදනයන් අනුමත සීමාවන් ඉක්මවා නොපැවති හෙයින් සියලුම බීජ තොග ගොවි ක්ෂේත්‍රවල වගා කිරීම සඳහා පිළිගන්නා ලදී.

බෝගවල රෝග පාලනය සඳහා රෝග නිශ්චය කිරීම සහ උපදේශක සේවා සැපයීම

විවිධ ප්‍රභවයන් හරහා ගොවි ක්ෂේත්‍රවලින් හා පෞද්ගලික ගොවිපළවලින් ලද පලතුරු බෝග, එළවළු, ආකන්ද, කුළුබඩු, විසිතුරු පැළෑටි සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග ඇතුළත් රෝගවලින් හානි වූ පැළෑටි නියැදි 375කට අධික සංඛ්‍යාවක රෝග නිශ්චය කිරීම සඳහා සායනිකව පරීක්ෂා කර බලන ලදී. බොහෝ ස්ථානවල පලතුරු සහ එළවළු වගාවන්හි සුලභව නිරීක්ෂණය කිරීමට ලැබුණු දිලිර රෝග වූයේ මුල් කුණුවීම, පත්‍ර පුල්ලි ඇතිවීම, පිටිපුසු සහ ඇන්ත්‍රැක්නෝස්ය. ඇර්විනියා ට්‍රැකිෆිලා *(Erwinia tracheiphila)* හේතුවෙන් කරවිලවල ඇති වූ බැක්ටීරියා හිටු මැරීමේ රෝගය ස්ථාන රැසකින් වාර්තා විය. සැන්තොමොනාස් කැම්පෙස්ට්‍රිස් *(Xanthomonas campestris)* මගින් ඇතිකරන ගෝවාවල පත්‍ර අංගමාරය ගෝවා වගා කරන බොහෝ ප්‍රදේශවල සියලුම ප්‍රභේද තුළින් හඳුනා ගැනීමට ලැබිණි. ස්පොන්ගොස්පෝරා සබ්ටෙරේනියන් *(Spongospora subterranean)* මගින් ඇති කරන පිටි කබලු රෝගය නුවරඑළියේ බීජ අර්තාපල් ගොවිපළවලින් වාර්තා විය. වයිරස් රෝග අතර කුකුර්බිට්ස් වයිරස් සංකීර්ණය (CMV. PRSV, CGMMV), බෝංචි විචිත්‍ර වයිරසය හා පැපොල් මුදු පුල්ලි වයිරසය ස්ථාන බොහොමයකදී සුලභ වශයෙන් නිරීක්ෂණය කිරීමට ලැබිණි. විදේශීය වැටකොළු සහ කරවිල දෙමුහුම්, වයිරස් වර්ග කිහිපයක් (CMV, CGMMV සහ කොළ කොඩවීමේ වයිරසය) හේතුවෙන් උග්‍ර ලෙස ආසාදනය වී තිබූ බව හම්බන්තොට දිස්ත්‍රික්කයේදී නිරීක්ෂණය කිරීමට ලැබිණි.

එලයිසා (ELISA) පරීක්ෂණය මගින් වයිරස් හඳුනා ගැනීම

ආනයනය කරන ලද වැඩි දියුණු කළ දෙමුහුම් බීජ හා රෝපණ ද්‍රව්‍යවල ඇති වයිරස් නිවැරදිව හඳුනා ගැනීම, බීජවල නීරෝගිතාව පරීක්ෂාව සහ බෝග වගාවේ වයිරස් පාලන ක්‍රමෝපාය සඳහා එලයිසා පරීක්ෂාව (ELISA) සිදු කරන ලදී. එලයිසා පරීක්ෂා (ELISA) 75 අතරින් පරීක්ෂා 2ක් ම කුකුර්බිට්ස් බෝග නියැදිවල (CGMMV) වයිරසය තිබූ බවට ධනාත්මක ප්‍රතිඵල පෙන්විය.

කෙසෙල් සිගාටොකා රෝගය පාලනයට නව දිලිරනාශක සතු පෙව කාර්යක්ෂමතාව ඇගයීම

කෙසෙල් සිගාටොකා රෝගයට අදාළව ලීටර් 01කට ග්‍රෑම් 500 බැගින් යොදන ක්ලෝරොතැලනිල් SC (ඩැකොනිල්) සහ ටෙබ්‍යුකොනසෝල් (ෆෝලිකර්) යන දැනට නිර්දේශිත දිලිරනාශක සමග නව දිලිරනාශක 03ක් අගයන ලදී. ලීටර් 10කට මිලි ලීටර් 10ක් වශයෙන් යොදන ෆ්ලුට්‍රිෆෝල් 25 SC, ලීටර් 10කට ග්‍රෑම් 40 බැගින් යොදන කැලික්‍රීන් සහ ලීටර් 10කට මිලි ලීටර් 10 බැගින් යොදන ඇමිස්ටර් යන දිලිරනාශක මෙම රෝගය පාලනය කිරීමේදී ඵලදායී විය.

තක්කාලිවල අංගමාර රෝගය පාලනය කිරීමට නව දිලිරනාශක සතු පෙව කාර්යක්ෂමතාව ඇගයීම

තක්කාලිවල අංගමාර රෝගය සඳහා සංස්ථානික දිලිරනාශක 02ක් අගයා දැනට නිර්දේශිත රිඩොමිල් MZ 72 WP යන දිලිරනාශකය සමඟ සසඳන ලදී. මෙම රෝගය පාලනය කිරීමේදී මොල්ටොවින් (ට්‍රයිබසික් කොපර් සල්ෆේට් ලීටර් 01කට ග්‍රෑම් 345 + සයිමොක්සනිල් ලීටර් 01කට ග්‍රෑම් 35) සහ ටොප්සින් (තයොෆෙනට් මීතයිල් 70% WP) යන දිලිරනාශක 02 සාර්ථක විය.

මාළු මිරිස්වල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය සඳහා නව දිලිරනාශක සතු පෙව කාර්යක්ෂමතාව ඇගයීම

ස්වාභාවික ආසාදනයන් යටතේ මාළු මිරිස්වල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනයට විවිධ නව දිලිරනාශක 06ක් අගයා සසඳන දිලිරනාශකයට (තයොෆනේට් මීතයිල් 70% WP)සාපේක්ෂව පරීක්ෂා කර බලන ලදී.

මෙම රෝගය පාලනය සඳහා සාර්ථකව යොදාගත හැකි දිලිරනාශක 04ක් වන ඇමිස්ටාර් (ලීටර් 10කට මිලි ලීටර් 10 බැගින්), නැටිවෝ 75 WG (ලීටර්

10කට ග්‍රෑම් 06), කැබ්‍රියොටොප් (ලීටර් 10කට ග්‍රෑම් 20) සහ ෆ්ලුසිනම් SC - ලීටර් 01කට ග්‍රෑම් 500 (ලීටර් 10කට මිලි ලීටර් 10) වැඩිදුරටත් ඇගයීම සඳහා නියමු මට්ටමින් අත්හදා බැලීමට නිර්දේශ කරන ලදී.

කුකුර්බිට්සි බෝගවල යටිපුස් රෝගය පාලනය සඳහා නව දිලීරනාශක සතු ඵෙව කාර්යක්ෂමතාව ඇගයීම

නව දිලීරනාශක 02ක් සසඳන දිලීරනාශකයට (රිඩොමිල් MZ 72 WP) සාපේක්ෂව 2011 ඔක්තෝබර් - දෙසැම්බර් අතර කාලයේදී කුකුබිට්සි බෝග වගා කරන මාතලේ වාලවෙලදී අගයන ලදී. කැබ්‍රියොටොප් (මෙටිරාම් 55% + පයිරක්ලොස්ට්‍රොබින් 5%) සහ ඇමිස්ටාර් යන දිලීරනාශක 2කම නිර්දේශිත දිලීරනාශකය වන රිඩොමිල් (මැන්කොසෙබ් 64% WP + මෙටලැක්සිල් 8%) හා සමානව ඵලදායි විය.

මිදි වගාවේ රෝග කළමනාකරණය

ක්ෂේත්‍ර සමීක්ෂණය හා විද්‍යාගාර පරීක්ෂා මගින් පෙන්වා දෙන ලද්දේ කලෙටොට්‍රිකම් විශේෂය *(Colletotrichum* sp.*)*මගින් ඇති කරන ඇන්ත්‍රැක්නෝස් රෝගය, අන්සිනියුලා විශේෂය *(Uncinula sp.)* මගින් ඇති කරන පිටිපුස් රෝගය, ප්‍යුසිනියා විශේෂය *(Puccinia sp.)*මගින් ඇති කරන මලකඩ රෝගය, ෆොමොප්සිස් විශේෂය *(Phomopsic sp.)* මගින් ඇතිකරන කඳ කුණුවීම සහ ෆියුසාරියම් විශේෂය *(Fusarium sp.)*මගින් ඇති කරන මුල් කුණුවීම ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ මිදි වගාව ආශ්‍රිතව පවතින ප්‍රධාන රෝගයන් වන බවයි.

පැෂන් පෑට්වල කඳ ඉදිමීමේ රෝගය කළමනාකරණය

ක්ෂේත්‍ර සමීක්ෂණ සහ විද්‍යාගාර පරීක්ෂාව මගින් පෙන්වා දෙන ලද්දේ දිලීර ව්‍යාධිජනකයක් (*Fusarium* sp.*)*පැෂන්පෑට්වල කඳ ඉදිමීමේ රෝගයට සම්බන්ධ බවයි.

බීජාණු නිෂ්පාදනය සඳහා අඩුපිරිවැයැති තාක්ෂණික ක්‍රමයක්

බීජාණු නිෂ්පාදනය සඳහා ග්ලූකෝස් වෙනුවට සීනි, සහල් වෙනුවට සහල් නිවිඩ්ඩ අන්තර්ගත අඩු පිරිවැයක් යන ක්‍රමයක් බිහි කර ඇත. එය බීජාණු නිෂ්පාදකයින්ට හඳුන්වා දෙන ලදී. අදාළ තොරතුරු ඇතුළත් පත්‍රිකාව ද සකස් කර ඇත.

පිදුරු මාධ්‍යයක් වශයෙන් යොදා ගනිමින් මුතුබෙලි බිම්මල් වගා කරන තාක්ෂණය

සුලභව එමෙන්ම අඩු පිරිවැයකට ලබාගත හැකි පිදුරු මාධ්‍යයක් වශයෙන් යොදා ගනිමින් මුතුබෙලි බිම්මල් වගාව සඳහා තාක්ෂණය ජනනය කර ඇත. එම තාක්ෂණය ගොවීන් 642දෙනෙකුට ලබාදෙන ලදී.

වාර්තා වූ නව රෝගය

ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ඩ්‍රැගන්පෑට් පැළ සමග පැතිරී ගිය නව රෝගය

විශේෂ තාක්ෂණික කමිටුවක් යටෝක්ත ගැටලුව සම්බන්ධයෙන් විමර්ශනය කර රෝගය පාලනය සඳහා අවශ්‍ය නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කර ඇත. පරීක්ෂා කර බලන ලද සියලුම නියැදිවල පැවති මෙම නව රෝගය දිලීර ව්‍යාධිජනකයක් (*Botryosphaeria dothidea*) හේතුවෙන් ඩ්‍රැගන් පෑට් පැළයේ කඳෙහි පුල්ලි ඇතිවීම වශයෙන් හඳුනා ගැනිණි. දැනට නිර්දේශිත දිලීරනාශක මගින් මෙම ව්‍යාධිජනකය පාලනය කිරීම අසීරුය. රෝග ආසාදිත පැළ රැසක සැන්තොමොනාස් විශේෂය *(Xanthomonas* sp.*)* මගින් ඇති කරන බැක්ටීරියා රෝග ලක්ෂණ සහ කලෙට්‍රොටිකම් විශේෂය *(Colletotrichum* sp.*)*මගින් ඇති කරන තවත් දිලීර රෝගයක් දක්නට ලැබිණි. රෝගය උග්‍රව පැවති බවත් වගා බහුතරයක 100%ක ආසාදනයක් පැවති බවත් නිරීක්ෂණය කිරීමට ලැබිණි. පෞද්ගලික සමාගමක් විසින් තායිලන්තයෙන් ආනයනය කරන ලද රෝපණ ද්‍රව්‍ය හරහා මෙම රෝගය පැමිණි බව සැක කෙරේ. එමනිසා අනවසරයෙන් රෝපණ ද්‍රව්‍ය ආනයනය කිරීම වැළැක්වීම සඳහා පැළෑටි නිරෝධායන ක්‍රියාමාර්ග දැඩිලෙස ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ.

කුකුර්බිට්සි බෝගවල බැක්ටීරියා හිටු මැරීම

කරවිල වල අර්විනියා ට්‍රැකිෆිලා (*Erwinia tracheiphila*) විසින් ඇති කරන බැක්ටීරියා හිටු මැරීමේ රෝගය පිළිබඳව ස්ථාන ගණනාවකින් වාර්තා විය. රෝගය පිපිඤ්ඤා කුරුමිණි විශේෂය මගින් බෝවෙන අතර එය ඉදිරියේදී පැතිරී වසංගතයක් බවට පත්වීමේ හැකියාව ඇත.

2011 වර්ෂයේදී ක්‍රියාත්මක කළ පර්යේෂණ ව්‍යාපෘති

ව්‍යාධිජනකමය දිලීර වර්ධනය කෙරෙහි ප්‍රවිකිරණය කරන ලද කයිටින් (කයිටොසාන්) මගින් ඇති කරන බලපෑම

කයිටොසාන් යනු, කෘමීන් සහ ක්‍රස්ටේසියන් සතුන්ගේ ව්‍යුහමය අංගයක් වන කයිටින්වලින් ඇතිවන ස්වාභාවික බහු අවයවකයකි. අණුක බර

70 KDa - 250 KDa අතර පරාසයක පැවති කයිටොසාන් සංයෝග සමහරක ව්‍යාධිජනකමය දිලීරවලට එරෙහිව ක්‍රියා කිරීමේ හැකියාවක් ඇති අතර අනෙකුත් අල්පාංකවල පැළෑටි වර්ධනය ඉහළ නැංවීමේ හැකියාවක් ඇත. මෙම අධ්‍යයනවල අරමුණු වූයේ දේශීය වශයෙන් නිපදවන ලද කයිටොසාන් සංයෝගවල රෝග පාලනය කිරීමේ සහ අස්වැන්න ඉහළ නැංවීමේ හැකියාව විමර්ශනය කර බැලීමයි. සමහර කයිටොසාන් සංයෝග යෙදීමෙන් පැළෑටිවල ව්‍යාධිජනකමය දිලිර විශේෂ බොහොමයක් පාලනය වන බව මෙම පර්යේෂණයෙන් අනාවරණය විය. තෝරාගත් කයිටොසාන් සංයෝග බීජවලට යෙදීමෙන් සහ විකල්පමය වශයෙන් ඉසීමෙන් (ප්‍රශස්ත සාන්ද්‍රණය මිලියනයකට කොටස් 300) පතු පුල්ලි රෝගය පාලනය වී ක්ෂේත්‍රයේ තක්කාලි අස්වැන්න වැඩිවිය.

පේව පාලන කාරකයක් වශයෙන් ට්‍රිකොඩර්මා *(Trichoderma)* සතු කාර්යක්ෂමතාව සහ ආමුකුලන නිෂ්පාදනය

මෙම ව්‍යාපෘති කටයුතුවල අරමුණු වූයේ ට්‍රිකොඩර්මාවල (*Trichoderma*) ඵලදායී පේව පාලන කාරකයා හඳුනාගෙන කාබනික කෘෂිකාර්මික ක්‍රමවලදී වැළඳෙන දිලිර රෝග පාලනය කිරීම සඳහා වාණිජමය පරිමාණයෙන් ට්‍රිකොඩර්මා (*Tricohderma*) ආමුකුලන නිපදවීම පිණිස අදාළ තාක්ෂණය ජනනය කිරීමයි. ට්‍රිකොඩර්මාවල (*Tricohderma*) විසංගත 02ක් පාංශු හා පතු ව්‍යාධිජනකමය දිලිර සඳහා ඵලදායී පේව පාලන කාරකයින් වශයෙන් හඳුනා ගන්නා ලද අතර 2012 වර්ෂයේදී ද මෙම අධ්‍යයන අඛණ්ඩව කරගෙන යාම සඳහා පවුඩර් මූලික කරගත් මාධ්‍යයක ආමුකුලන පැකට් 100ක් පිළියෙල කරන ලදී.

කෘෂිකාර්මික රසායන විද්‍යා අංශය

මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ පාංශු සාරවත්භාවය, පැළෑටි පෝෂක කළමනාකරණය සහ කාබනික ගොවිතැනයි. එයට අමතරව, උද්‍යාන බෝග සඳහා පාංශු පරීක්ෂණ පදනම් කර ගනිමින් පොහොර යෙදීම සඳහා ගොවීන්ව පොළඹවයි. එමෙන්ම, ඉල්ලීම මත, පස, පැළෑටි, ජලය, රසායනික පොහොර පිළිබඳ විශ්ලේෂණාත්මක සේවා ද ඒවා භාවිතය පිළිබඳ උපදේශක සේවා ද සපයයි. ගොවීන්, ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සහ උනන්දුවක් දක්වන සාමාන්‍ය පිරිස් සඳහා පස හා පොහොර, කාබනික ගොවිතැන සහ පාංශු සාරවත්භාවය හා සම්බන්ධ අනෙකුත් මාතෘකා පිළිබඳ පුහුණු වැඩසහන් ද ක්‍රියාත්මක කරයි.

කාබනිකව වගා කරන ඵලවළු බෝගවල පෝෂක කළමනාකරණය

කාබනික ඵලවළු අස්වැන්න කෙරෙහි විවිධ පෝෂක කළමනාකරණ පිළිවෙත් මගින් ඇතිකරන බලපෑම පරීක්ෂා කර බලන ලදී. මාළු මිරිස්වල ඉහළම අස්වැන්න (හෙක්. 1කට ටො. 10.7) කොළ පොහොර + කොම්පෝස්ට් + දියර කොම්පෝස්ට් ඉසීමේ ප්‍රතිකර්මය මගින් ලද අතර දෙවන ඉහළම අස්වැන්න කොළ පොහොර + කොම්පෝස්ට් යෙදීම මගින් ලැබිණි. යල කන්නයේදී ඉහළම ගෝවා අස්වැන්න (හෙක්. 1කට ටො. 49.6) කොළ පොහොර + කොම්පෝස්ට් යෙදීමෙන් ලැබිණි. කොම්පොස්ට්වලට අමතරව, හෙක්. 1කට ටො. 21ක අනුපාතයෙන් කොළ පොහොර යෙදීම කාබනික ගොවිතැනේදී ප්‍රයෝජනවත්ය. කොම්පෝස්ට් හා කොළ පොහොරවලට අමතරව, පිළිස්සූ දහයියා යෙදීමෙන් බෝග අස්වැන්න ඉහළ නංවා ගැනීමට නොහැකි විය.

කොම්පෝස්ට් අඛණ්ඩව යෙදීම

කන්න 23ක් පුරා, නිර්දේශිත නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම් පොහොර, හෙක්. 1කට ටොන් 40 බැගින් කොම්පෝස්ට් සහ නිර්දේශිත නයිට්‍රජන්, ෆොස්ෆරස් හා පොටෑසියම් + හෙක්. 1කට ටොන් 40 බැගින් කොම්පෝස්ට් යොදා පිළියම් යොදන ලද විශාල ක්ෂේත්‍රවල විවිධ ඵලවළු බෝග අඛණ්ඩව වගාකර ඇත. කොම්පෝස්ට් පමණක් යෙදීමේදීට වඩා කොම්පෝස්ට් සමඟ නයිට්‍රජන්, ෆොස්ෆරස් හා පොටෑසියම් පොහොර යන දෙකම යෙදීමෙන් වැඩි අස්වනු ලැබිණි. අකාබනික පොහොර සමඟ කාබනික පොහොර එකට යෙදීමේ අගය පෙන්වා දෙමින් අකාබනික පොහොර පමණක් යෙදීමෙන් අඩුම අස්වැන්න ලැබිණි. කාබනික හා අකාබනික පොහොර එක්ව යෙදීමෙන් පසට පෝෂක සැපයෙනවා පමණක් නොව කාබනික පොහොර මගින් පාංශු-පැළෑටි පද්ධතියට ප්‍රතිලාභ රැසක් ද හිමිවීම මෙයට හේතුවයි.

කාබනින ඵලවළු අස්වැන්න කෙරෙහි විවිධ පෝෂක මූලාශ්‍ර බලපාන ආකාරය

මිශ්‍ර බෝග වගාවේ (ගෝවා, පඳුරු බෝංචි හා බීට්) ඵලවළු අස්වැන්න කෙරෙහි විවිධ පෝෂක මූලාශ්‍ර (ගොම පෙහොර, කුකුල් පොහොර, පණු පොහොර, කොම්පෝස්ට් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම්) ඵලදායී වන ආකාරය පරීක්ෂා කර බලන ලදී. ඵලවළු අස්වැන්න කෙරෙහි කුකුල් පොහොර හෙක්. 1කට ටොන් 20 බැගින් යෙදීම වඩාත්ම ඵලදායී මූලාශ්‍රය බවට පත් වූ අතර හෙ. 1කට ටොන් 40 බැගින් කොම්පෝස්ට් යෙදීම තුළින් ද ඒ හා සමාන ප්‍රතිඵල ලැබිණි. හෙක්. 1කට ටොන් 20 බැගින් පණු පොහොර යෙදීමෙන් ලබාගත්

බෝග අස්වැන්න නිර්දේශිත නයිට්‍රජන්, ෆොස්ෆරස් හා පොටෑසියම් පොහොර යෙදීමෙන් ලබාගත් අස්වැන්නට වඩා අඩුවිය.

කාබනිකව සහ සාමාන්‍ය පරිදි වගා කරන කොළ එළවළුවල අන්තර්ගත නයිට්‍රේට් ප්‍රමාණය සංසන්දනය කිරීම

කාබනික සහ සාමාන්‍ය වගා ක්‍රම යටතේ වගා කළ කොළ එළවළු බෝග සමහරක නයිට්‍රේට් අන්තර්ගතයන් පරීක්ෂා කර බලන ලදී. එහි ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ ක්‍රම 2 යටතේම වගා කරන ලද ගොටුකොළවල නයිට්‍රේට් අන්තර්ගතය නැවුම් සහ වියළි බර පදනම මත සංඛ්‍යානමය වශයෙන් සමාන බවයි. කෙසේ වුවද, කාබනික වගා ක්‍රමයේදීට වඩා සාමාන්‍ය ක්‍රමය යටතේ වගා කළවිට කන්කුන් සහ මුකුණුවැන්නවල සැලකියයුතු අයුරින් ඉහළ නයිට්‍රේට් අන්තර්ගතයක් පැවතිණි. එම සියලුම මට්ටම් පිළිගත් සීමාව තුළ පැවතිණි. අඛණ්ඩව නිරීක්ෂණය කිරීම සහ ඒ අනුව නිසි පොහොර කළමනාකරණ පිළිවෙත් පිළිබඳව ගොවීන්ට උපදෙස් ලබාදීම කොළ එළවළුවල නයිට්‍රේට් මට්ටම් පිළිගත හැකි සීමාවන් තුළ පවත්වාගෙන යෑමට ඉවහල් වනු ඇත.

ශ්‍රී ලංකාවේ භාවිතා කරන ෆොස්ෆේට් පොහොරවල බැර ලෝහ තත්ත්වය පිළිබඳ අධ්‍යයනය

විවිධ රටවලින් ආනයනය කළ ෆොස්ෆේට් පොහොරවල බැර ලෝහ අන්තර්ගතයන් පරීක්ෂා කර බලන ලදී. විවිධ රටවලින් එලෙස ගෙනා ෆොස්ෆේට් පොහොරවල සමහර බැර ලෝහ (යකඩ, කොපර්, මැංගනීස්, සින්ක්, කැඩ්මියම්, ඊයම් සහ ක්‍රෝමියම්) සැලකියයුතු ප්‍රමාණයන්ගෙන් අපද්‍රව්‍ය වශයෙන් අන්තර්ගත විය. එම්ඊටිස්වලින් ආනයනය කළ නියැදිවල යකඩ සහ කොපර් ඉහළම සාන්ද්‍රණය දක්නට ලැබිණි. ලෙබනන පොහොර නියැදිවල ඉහළම සින්ක් අන්තර්ගතය ද ඊජිප්තුවෙන් ආනයනය කළ ට්‍රිපල් සුපර් ෆොස්ෆේට්වල ඉහළම මැංගනීස් අන්තර්ගතය ද වාර්තා විය. ඉහළම කැඩ්මියම්, ඊයම් හා ක්‍රෝමියම් සාන්ද්‍රණයන් ලෙබනනයෙන් ආනයනය කරන ලද නියැදිවල වූ අතර මෙම මූල ද්‍රව්‍ය අඩුම සාන්ද්‍රණය පැවතියේ එම්ඊටිස්වලින් ආනයනිය කළ නියැදිවලය. මෙම අධ්‍යයනය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

කොළ පොහොරවල ඇති ද්විතියික සහ ක්ෂුද්‍ර පෝෂක තත්ත්වය

ශ්‍රී ලංකාවේ සුලභව භාවිතා කරන කොළ පොහොරවල ද්විතියික සහ ක්ෂුද්‍ර පෝෂක අන්තර්ගතයන් නිශ්චය කිරීම පිණිස අධ්‍යයනයක් පවත්වන ලදී. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් ලද විවිධ කොළ පොහොර නියැදි පරීක්ෂා කර බලන ලදී. ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ ගිරිතිල්ල පත්‍රවල ඉහළම යකඩ ප්‍රමාණයක් පැවති බවයි. දෙවනියට වැඩිම යකඩ ප්‍රමාණයක් අන්තර්ගත වූයේ මාර පත්‍රවලයි *(Samania saman)*. ඉහළම කොපර් අන්තර්ගතය කැකුණ පත්‍රවලද *(Aleurites moluccana)* ඉන් අනතුරුව වැඩි කොපර් අන්තර්ගතය වැටඑඬරු පත්‍රවල ද *(Jatropha curcus)*විය. ඉහළම මැංගනීස් සාන්ද්‍රණය කැප්පෙටියා පත්‍රවල ද *(Croton laccifer)*) ඉන් අනතුරුව වැඩි සාන්ද්‍රණයක් ගහල පත්‍රවල ද *(Mikania cordata)* දක්නට ලැබිණි. නත්තසූරිය පත්‍ර *(Tithonia diversifolia)*තුළ ඉහළම සින්ක් ප්‍රමාණය අන්තර්ගත විය. තවදුරටත් නියැදි එක්රැස් කර ගනිමින් විශ්ලේෂණය කිරීම සඳහා මෙම අධ්‍යයනය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

විවිධ බෝග වගා ක්‍රමවලදී පසෙහි ක්ෂුද්‍ර පෝෂක තත්ත්වය අධ්‍යයනය කිරීම

විවිධ බෝග වගා ක්‍රම යටතේ (වී-වී, වී-එළවළු සහ වැඩි යෙදවුම් ප්‍රමාණයක් එක් කර එළවළු වගා කරන ක්‍රම) පසෙහි ක්ෂුද්‍රපෝෂක අන්තර්ගතයන් පිළිබඳව අධ්‍යයනය කරන ලදී. ස්ථාන 03කින් ලද පාංශු නියැදිවලට අනුව,මාරස්සන ප්‍රදේශයේ පසෙහි (වී-එළවළු බෝග වගා ක්‍රමය) ප්‍රයෝජ්‍ය ෆොස්ෆරස් ප්‍රමාණය ඉහළම මට්ටමක ද මාතලේ ප්‍රදේශයේ (වී-එළවළු බෝග වගා ක්‍රමය) අඩුම ප්‍රයෝජ්‍ය ෆොස්ෆරස් ප්‍රමාණය ද පැවතුණි. අධ්‍යයනය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

මුල් හා ආකන්ද බෝග, මල් වගා සහ ගෙවතු වගා අංශය

මුල් හා ආකන්ද බෝග

බතල

- තෝරාගත් බතල ප්‍රභේද (මැලේසියන්, පල්ලේපොල, HORDI C-5 සහ ගන්නොරුව රෙඩ්) අඛණ්ඩව කන්න 2කදී ප්‍රතිවලිත අස්වනු අත්හදා බැලීම් තුළ අගයන ලදී. 'මැලේසියන්' නමැති නව ප්‍රභේදය HORDI C-5 සහ අනෙකුත් සියලුම ප්‍රභේදවලට වඩා වැඩි අස්වනු ගෙනදුණි. පොත්ත ආකර්ශණීය රත් පැහැයෙන් ද මාංසල කොටස සුදු පැහැයෙන් ද යුතු මෙය කෙටි කාලයකින් උසස් තත්ත්වයේ ඉහළ අස්වැන්නක් (හෙක්. 1කට ටො. 350 වැඩි) ලබාදුණි.මෙම ප්‍රභේදය යොදා ගනිමින් ස්ථාන 6කදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහනක් ආරම්භ කර ඇත.

- ඉහළ වියළි ද්‍රව්‍ය ප්‍රමාණයක් සහිත CIP ආර අගයන ලදී. CIP 440186 උසස් තත්ත්වයෙන් යුතු සැලකිය යුතු අන්දමින් වැඩි අස්වැන්නක් ලබාදුණි.

- ලවණතාවට ඔරොත්තු දෙන CIP ආර 11ක් අතරින් ආර 03ක් (199076-1, 440262-1 සහ 440183) ප්‍රභේද පරීක්ෂණ අත්හදා බැලීමකදී වැඩි අස්වනු ලබාදුණි. ලවණතාවෙන් යුතු ප්‍රදේශවලට සුදුසු යැයි බලාපොරොත්තු තබාගත හැකි ආර තෝරා ගැනීම සඳහා මෙම ආර එම ප්‍රදේශවල ප්‍රතිවලිත අස්වනු අත්හදා බැලීම් තුළ අගයනු ඇත.

මඤ්ඤෙදාක්කා

ඉහළ අස්වනු ගෙනදෙන සහ දිගු, මනාව වර්ධනය වූ මුල් ආකන්දයක් පැවතීම සහ පොත්ත ආකර්ශනීය පැහැයකින් යුතුවීම (පිටත පොත්ත දුඹුරු පැහැයෙන් ද ඇතුළත පොත්ත රෝස පැහැයෙන් ද යුතු) අලෙවි කළ හැකි ලක්ෂණ වලින් යුතු වැඩි අස්වනු ගෙනදෙන HORDI -6 යන නව ප්‍රභේදය 2012 ජනවාරි මාසයේදී ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව විසින් නව නාමයකින් (HORDI Mu 1) නිල වශයෙන් නිදහස් කරන ලදී.

මල් වගාව සහ ගෙවතු වගාව

උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ මල් වගා වැඩසටහන මල් වගාවට අදාළ විවිධ අංශ සම්බන්ධ ගැටළුවලට පිළියම් යෙදීම කෙරෙහි අවධානය යොමු කරයි. සාමාන්‍ය ජනයාට (ප්‍රධාන වශයෙන්ම සාම්ප්‍රදායික ගොවීන් නොවන පිරිසට) අනුගමනය කළ හැකි ගෙවතු වගා බෝගවලට අදාළ වගා තාක්ෂණයන් ජනනය කිරීමට සහ ගෙවතු තත්ත්වයන්ට අනුවර්තනය කරගත හැකි බෝග හඳුනා ගැනීම සඳහා ගෙවතු වගා පර්යේෂණ හා සංවර්ධනය වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. එයට අමතරව, ගෙවතු වගාව පිළිබඳ දැනුම බෙදා හැරීම, ගෙවතු වගාව සඳහා විශේෂිත බෝග සංරක්ෂණය සහ ගුණනය, එම බෝගවල රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීම මෙම වැඩසටහනෙහි අරමුණු අතර වේ.

- විසිතුරු පැළෑටි වශයෙන් වගා කළ හැකි 'වන පැළ වෘක්ෂලතාදිය' එක්රැස් කර නඩත්තු කරන ලදී. නව 'වන විසිතුරු පැළෑටි වර්ග 02ක් සහ විදේශීය ජර්බෙරා දෙමුහුම් 04ක් මෙම පැළෑටි එකතුවට එක් කෙරිණි.

- ෆයිනස් (*Pinus*) පතු පොඩිකර සකස් කළ වර්ධන මාධ්‍යයක් අබණ්ඩව වසර 03ක් පුරා, ආරක්ෂිත ගෘහ තුළ සිදු කළජර්බෙරා සහ තක්කාලි වගාව සඳහා සාර්ථකව භාවිතා කරන ලදී. මෙම සොයා ගැනීම් 2012 වර්ෂයේදී ප්‍රකාශයට පත් කිරීමට සූදානම් කර ඇත.

- ගෙවතු වගාව සඳහා සුදුසු බෝග වශයෙන් බෝග 15ක් දැනටමත් හඳුනා ගෙන ඇති අතර ඒවා ගුණනය කර බීජ බෙදා හැරීම සඳහා ගබඩා කර ඇත. බීජ වගී සහ නිපදවන ලද බීජ ප්‍රමාණය පහත දැක්වේ.

වගු අංක 2.2.4: 2011 වර්ෂයේදී නිපදවන ලද බීජ ප්‍රමාණයන්

බෝගය	බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)
යෝධ තම්පලා	4.5
වම්බටු - අකුරැස්ස බටු	2
වම්බටු - බිත්තර බටු	3.4
වම්බටු - සුදු තලන බටු	2.5
වම්බටු - අහස් බටු	1.6
දඹල - දම්	4.5
ආලංගා	2.5
දඹල - කොළ	1.25
දඹල - ඔක්තෝබර්	0.5
බණ්ඩක්කා - ගෙවතු ඇත්දළ	4
බණ්ඩක්කා - රතු	6.5
යෝධ සුදු කොච්චි *(Capsicum fruticens*-white*)*	2.2
යෝධ කොළ කොච්චි *(Capsicum fruticens*-green*)*	1.75
තම්පලා	2.5
ගෙවතු මිරිස්	3.1

- කේශ තෙල කර්මාන්තය සඳහා ජල රෝපණය මගින් සැවැන්දරා මුල් *(Chrysopogon zizanioides)*නිෂ්පාදනය කිරීම පිණිස වගා තාක්ෂණයක් නිපදවා එම තොරතුරු 2011 කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සමුළු වාර්තාවෙහි ප්‍රකාශයට පත් කරන ලදී. (කරුණාකර ප්‍රකාශන ලැයිස්තුව බලන්න)

- පරිමිත සහ අර්ධ පරිමිත වගීවල තක්කාලි ප්‍රභේදවල අස්වැන්න හා බීජ සංඛ්‍යාව කෙරෙහි පැළෑටි වර්ධක යාමක (ක්ලෝරොමැකට් ක්ලෝරයිඩ් මිලියනයකට කොටස් 750) මගින් ඇති කරන බලපෑම අධ්‍යයනය කරන ලදී. ප්‍රතිඵල අනුව, අර්ධ පරිමිත තක්කාලිවල (තිළිණ) අස්වැන්න 8-

10%කින් වර්ධනය වී ඇති නමුත් බීජ සංඛ්‍යාව කෙරෙහි කැපී පෙනෙන බලපෑමක් ඇති නොවීය.

- ගෙවතු වගාව සඳහා පොලිසැක් මලුවල බතල වගා කිරීමේ ක්‍රමය පිළිබඳව අධ්‍යයනය කරන ලදී. වැටී යොදා සාමාන්‍ය පරිදි වගා කිරීමේ ක්‍රමයට වඩා මෙම මලු තුළ බතල වගා කිරීමෙන් (වැල් නැගීමට ආධාරක ලබා දී) 6 ගුණයකින් වැඩි අස්වැන්නක් ලැබිණි.

- ලැබ් බීන් ප්‍රභේද 2ක්, ලීමා බීන් ප්‍රභේද 2ක් සහ කැනවලියා විශේෂයක් වශයෙන් නවබෝග 05ක් ගෙවතු වගා බෝග එකතුවට හඳුන්වා දෙන ලදී.

- වාණිජමය බීජ ආනයනකරුවෙකු විසින් ලබාදෙන ලද නව මිරිස් දෙමුහුම් ප්‍රභේදය ආරක්ෂිත ගෘහ තුළ වගා කිරීම සඳහා එය සතු යෝග්‍යතාව අගයන ලදී. එම ප්‍රභේදය පැළයකට මාසයකට ගෑම් 310ක අස්වැන්නක් ලබාදුන් නමුත් බැක්ටීරියා හිටු මැරීම සඳහා 40%ක ගොදුරුවීමක් පෙන්නුම් කළේය.

ව්‍යාප්ති, ආර්ථික විද්‍යා සහ දත්ත කළමනාකරණ අංශය

මෙම අංශය තාක්ෂණය ලබාදීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ/ඉටු කිරීමේ සහ දත්ත කළමනාකරණය, ආර්ථික විද්‍යාව, භූගෝලීය තොරතුරු පද්ධතිය සහ දුරස්ථ සංවේදනය ඇතුළු තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි.

පර්යේෂණ කටයුතු

ශ්‍රී ලංකාවේ ඌන උපයෝජිත පලතුරු බෝග ගවේෂණය හා සංරක්ෂණය සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය යොදා ගැනීම

ශ්‍රී ලංකාවේ ඇති ඉහළ කෘෂි-පාරිසරික විවිධත්වය, ඉහළ ශාක හා සත්ව විවිධත්වයකට හේතුකාරක වී ඇත. ඒ ඒ භූගෝලීය ප්‍රදේශය පාරිසරික-භූගෝලීය වශයෙන් සුවිශේෂී වන අතර එය එම ප්‍රදේශ ආශ්‍රිත ජානමය විවිධත්ව රටාවන් නිශ්චය කිරීමට හේතු වේ. ඌන උපයෝජිත පලතුරු විශේෂ පිළිබඳ වත්මන් තත්වය සහ සිතියම්ගත කිරීමට හැකි ප්‍රදේශ ඇගයීම සඳහා ක්ෂේත්‍ර විමර්ශන තුළින් එක්රැස් කරගත් පලතුරු විශේෂ 30ක් වූ ස්ථාන 3,219ක්, විවිධ නිලධාරීන් විසින් වාර්තා කරන ලද දත්ත සහ ශාකාගාර වාර්තා උපයෝගී කර ගන්නා ලදී. විභව ප්‍රදේශවල සිතියම් සකස් කිරීම සඳහා අදාළ මෘදුකාංග යොදා ගනිමින් (DIVA GIS සහ Flora Map)BIOCLIM මොඩලය භාවිතා කර එම පලතුරු විශේෂ ව්‍යාප්තව ඇති ආකාරය අනුමාන කෙරිණි (Ecological Niche Modeling). විභව ප්‍රදේශ සිතියම ඒ ඒ පලතුරු විශේෂයේ සම්භාවී ව්‍යාප්තිය සම්භාවිතා අගයක් වශයෙන් දක්වයි. මෘදුකාංග ද්විත්වයම මගින් ජනනය කරන ලද සිතියම් ද්විත්වය පලතුරු විශේෂ බොහොමයක් සඳහා සමාන සම්භාවිතා අගයන් දැක්විය. මෙම තොරතුරු, වැඩිදුර විමර්ශනය සඳහා ප්‍රමුඛතා ගවේෂණ ප්‍රදේශ සොයා ගැනීම, සංරක්ෂණ හා උපයෝජන කටයුතු සැලසුම් කිරීම සහ ඉදිරියේදී ශ්‍රී ලංකාවේ ඌන උපයෝජිත පලතුරු ප්‍රවර්ධනය සඳහා වඩාත් හොඳ තොරතුරු සැපයීම පිණිස යොදාගත හැකිය.

ශ්‍රී ලංකාවේ නුවරඑළිය ප්‍රදේශයේ සිදුකරන අර්තාපල් වගාවේ තාක්ෂණ භාවිතය සහ ලාභදායිත්වය : දර්ශක පදනම් කරගත් ප්‍රවේශයක්

නුවරඑළිය දිස්ත්‍රික්කයේ සිදුකරන අර්තාපල් වගාව තුළ ගොවිපළ මට්ටමින් තාක්ෂණය භාවිතා කරන ආකාරය සහ වගාව ආශ්‍රිත ගැටලු ඇගයීම සඳහා මෙම අධ්‍යයනය සැලසුම් කරන ලදී. එමෙන්ම අර්තාපල් වගාවේ ලාභදායිත්වය ඇගයීම පිණිස මෙම අධ්‍යයනය පුළුල් කරන ලදී. ප්‍රශ්නාවලි 02ක් වෙන් වෙන්ව යොදා ගනිමින් 2011 මැයි-ජූනි අතර කාලයේදී ගොවීන් 55දෙනෙකුගෙන් සහ ව්‍යාප්ති නිලධාරීන් 13දෙනෙකුගෙන් දත්ත එක්රැස් කර ගන්නා ලදී. දත්ත විශ්ලේෂණය පිණිස විස්තරාත්මක මෙන්ම අනුමිතික සංඛ්‍යානයද උපයෝගී කර ගැනිණි. තාක්ෂණය භාවිතා කිරීමේ මට්ටම ඇගයීම සඳහා RTAI දර්ශකය (CompositeRecommended Techonology Adoption Index) යොදා ගන්නා ලද අතර දර්ශකය 0.58-0.79 අතර පරාසයක පැවතීමෙන් අනාවරණය වන්නේ අධ්‍යයන ප්‍රදේශය තුළ අර්තාපල් වගා කරන ගොවීන්ගේ තාක්ෂණ භාවිතය 50%කට වැඩි බවත් එය පුළුල් කිරීමේ ඉඩකඩ පවතින බවත්ය. නුවරඑළිය දිස්ත්‍රික්කයේ අර්තාපල් වගාවේ ලාභදායිත්වය නිශ්චය කිරීම පිණිස එහි පිරිවැයට ප්‍රතිලාභ අනුපාතය අගයන ලද අතර එය ගොවීන්ගෙන් 48%ක් සඳහා ලාභදායී නොවීය. මෙම අධ්‍යයනය තුළින් තාක්ෂණය භාවිත කිරීමේ මට්ටම සහ අර්තාපල් අස්වැන්න අතර සැලකිය යුතු සහසම්බන්ධයක් සොයා ගැනිණි.

බහු-කාලික දුරස්ථ සංවේදන දත්ත (multi-temporal remote sensing data) මගින් බෝග භූමියෙහි ව්‍යාප්තව ඇති ආකාරය සහ බෝග වගා රටාව ඇගයීම

ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් කෘෂිකාර්මික සැලසුම්කරණය සඳහා බෝග වගාකර ඇති ප්‍රදේශයේ අවකාශමය ව්‍යාප්තිය දැන ගැනීම අත්‍යවශ්‍යය. මෙම අධ්‍යයනයේ අරමුණ විවිධ බෝග වගාවන් යටතේ ඇති ඉඩම්වල මායිම්

සලකුණු කිරීම සහ බෝග වගා රටාවන් ඇගයීම සඳහා කාල ශ්‍රේණිමය චන්ද්‍රිකා ඡායා රූප දත්ත සතු හැකියාව ඇගයීමයි. මෙම කරුණ සඳහා මූලික වශයෙන් විවිධ වෘක්ෂලතා දර්ශක වගී යොදා ගැනීමේ හැකියාව පරීක්ෂා කර බැලීම සඳහා නොමිලයේ ලබාගත හැකි චන්ද්‍රිකා ඡායා රූප දත්ත (low resolution free downloadable satellite data) භාවිතා කරනු ඇත. මෙහිදී 2009 සහ 2010 වර්ෂවලට අදාළ චන්ද්‍රිකා දත්ත [(10-day interval MODIS data-1 km resolution) (දිවයිනම ආවරණය කළ චන්ද්‍රිකා ඡායාරූප 72ක්)] අගයන ලදී. මෙහි ප්‍රතිඵල මගින් සොයා ගැනුණේ විශාල භූමි ප්‍රදේශයක (උදා: අම්පාර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක) එක්වර වගා කර ඇති බෝග විශ්ලේෂණය සඳහා කි.මී. 01ක විස්තරාත්මක චන්ද්‍රිකා ඡායාරූප දත්ත (1 km resolution satellite data)සුදුසු වන බවයි.

ශ්‍රී ලංකාවේ නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ සිදුකරන එළවළු වගාව සඳහා නිර්දේශිත කෘෂිකාර්මික පිළිවෙත් යොදා ගැනීම ආශ්‍රිත ගැටළු

නිර්දේශිත තාක්ෂණයන් රුසක් තිබුණද සාමාන්‍ය සහ ලබාගත හැකි අස්වැන්න අතර සැලකිය යුතු පරතරයක් පවතී. නිර්දේශිත තාක්ෂණයන් භාවිතය මඳවීම මෙයට ප්‍රධාන හේතුවක් වශයෙන් සැලකේ. නිර්දේශිත කෘෂිකාර්මික පිළිවෙත් යොදා ගන්නා මට්ටම සොයා ගැනීම සහ එළවළු නිෂ්පාදනය ආශ්‍රිත තාක්ෂණික, ආර්ථික විද්‍යාත්මක සහ සමාජීය ගැටළු ඇගයීම පිණිස දේශගුණික කලාප 3ක් ආවරණය කරන නුවරඑළිය දිස්ත්‍රික්කයේදී මෙම අධ්‍යයනය සිදු කෙරිණි. තාක්ෂණය යොදා ගන්නා මට්ටම් ඇගයීම සඳහා නිර්දේශිත තාක්ෂණය යොදා ගැනීමේ දර්ශකය (RTAI) සකස් කරන ලදී. මෙම අධ්‍යනය මඟින් කැරට්, බීට්, ලීක්ස් සහ ගෝවා යන එළවළු කෙරෙහි අවධානය යොමු කෙරිණි. එම දර්ශකය අනුව, තාක්ෂණය භාවිත කරන සාමාන්‍ය මට්ටම් කැරට්, බීට්, ලීක්ස් සහගෝවා සඳහා පිළිවෙළින් 0.56, 0.599, 0.61 සහ 0.599ක් විය. උඩරට තෙත් කලාපය තුළ ඉහළම තාක්ෂණ භාවිත මට්ටම පැවතිණි. අදාළ දර්ශකය සහ ගොවි අස්වැන්න අතර සැලකිය යුතු මට්ටමේ ධනාත්මක සහසම්බන්ධයක් විය. වැඩිදියුණු කළ තාක්ෂණය පිළිබඳව ගොවීන්ගේ දැනුම වර්ධනය කිරීමට නිසි ක්‍රියාමාර්ග ගැනීම තුළින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ එළවළු නිෂ්පාදනය සහ ගොවීන්ගේ ජීවන මාර්ගය ඉහළ නැංවීමට මග පාදනු ඇත.

මාතලේ දිස්ත්‍රික්කයේ එළවළු ගොවීන්ගේ කෘෂි රසායන භාවිත රටාවන් ඇගයීම

පසුගිය කාලයේදී ශ්‍රී ලංකාවෙන් මෙන්ම අනෙකුත් රටවලින්ද එළවළු වගාවේදී පළිබෝධනාශක සහ පොහොර අනිසි ලෙස භාවිත කිරීම පිළිබඳව වාර්තා විය. කෙසේ වුවද, එළවළු වගාවේදී රසායනික සහ පොහොර භාවිත කරන මට්ටම් පිළිබඳ ප්‍රමාණාත්මක සාක්ෂි සම්බන්ධ තොරතුරු අල්පය. කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශවලට සාපේක්ෂව කෘෂි රසායන සහ පොහොර භාවිත කරන මට්ටම් ඇගයීමට මෙම අධ්‍යයනයෙන් සැලසුම් කෙරිණි. මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කෙට්ඨාස 8කට අයත් එළවළු වගා කරන ගොවීන් 140ක් යොදා ගනිමින් පෙර යෝග්‍යතාව පරීක්ෂා කර බලා තහවුරු කර ගත් ප්‍රශ්නාවලියක් මඟින් ඔස්සේ අධ්‍යයනය සිදු කරන ලදී. ප්‍රතිඵල මඟින් අනාවරණය වුයේ ගොවීන් නිර්දේශිත මාත්‍රාවන්ට වඩා වැඩි ප්‍රමාණයන්ගෙන් පොහොර යොදන බවයි. ගොවීහු ට්‍රිපල් සුපර් ෆොස්ෆේට් සහ මියුරේට් ඔෆ් පොටෑෂ්වලට වඩා යූරියා වැඩි මාත්‍රාවක් යොදති. විශේෂයෙන්ම ආනයනය කරන ලද ප්‍රභේද සඳහා ගොවීහු පොහොර වැඩි ප්‍රමාණයක් යොදති. ආනයනය කරන ලද ප්‍රභේද සඳහා ගොවීන් පළිබෝධනාශක අතිරික්ත ප්‍රමාණයන්ගෙන් යොදා ඇති නමුදු ඉහළ මිල ගණන්වලට ඇති කෘෂි රසායන වැඩි වශයෙන් භාවිත කිරීමට නැඹුරු වී ඇත්තේ අඩුවෙනි. අධ්‍යයන ප්‍රදේශයේ හෙ. 01කට වැඩි වගා බිම් ප්‍රමාණයක් ඇති මහා පරිමාණ ගොවීන් කෘෂි රසායන අතිරික්ත මාත්‍රාවන්ගෙන් භාවිත කිරීම අඩුය.

උපාධි අපේක්ෂක සිසුන්ගේ පර්යේෂණ වාර්තා

වයඹ විශ්ව විද්‍යාලයේ උපාධි අපේක්ෂකයෝ දෙදෙනෙක් තම අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘති සම්පූර්ණ කළහ.

කෘෂිකර්ම කෞතුකාගාරය

මෙම කෞතුකාගාරය සෑම කාර්යාලයීය දිනකම පෙ.ව. 8.30 - ප.ව. 4.15 දක්වා ද ඉල්ලීම පරිදි රජයේ නිවාඩු දිනවල ද විවෘතව තැබේ. මෙහි ප්‍රදර්ශනය කෙරෙන දෑ අතර සාම්ප්‍රදායික කෘෂි උපකරණ, සම්ප්‍රදායක ගබඩා ව්‍යුහයන්හි ආදර්ශ ආදිය ඇතුළත්ය. එවැනි දෑ ප්‍රදර්ශනයට අමතරව, මෙම කෞතුකාගාරය සාම්ප්‍රදායික කෘෂිකර්මය පිළිබඳ තොරතුරු ද ලබා දෙයි. 2011 වර්ෂයේදී 'කමත් භාෂාව' සහ ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කෘෂිකර්මය තුළ භාවිත කළ වදන් ඇතුළත් පත්‍රිකා 2113ක් බෙදා හරින ලදී. විවිධ අවශ්‍යතාවන් මත නරඹන්නෝ රැසක් දිනපතා මෙම කෞතුකාගාරය නැරඹීමට පැමිණෙති.

කෘෂිකර්ම කෞතුකාගාරය නැරඹීමට පැමිණි සංඛ්‍යාව

පාසැල් සිසුන්	-	53,165
පාසැල් ගුරුවරුන්	-	4,218
ගොවීන්	-	15017
රජයේ නිලධාරීන්	-	1,824
විශ්වවිද්‍යාල සිසුන්	-	817
විදේශිකයන්	-	51
වෙනත් පිරිස්	-	1,953

මධ්‍යම පුස්තකාලය

ශ්‍රී ලංකාවේ ප්‍රධාන කෘෂිකාර්මික පුස්තකාලය වන මෙහි දේශීය සහ විදේශීය ජර්නල්වල පැරණි හා නව ප්‍රකාශන ද කෘෂිකාර්මික ක්ෂේත්‍ර රැසකට අදාළ ග්‍රන්ථ ද සීඩී තැටි (CD-Rom) සඳහා ලිපි ලේඛන ලබා ගැනීමේ පහසුකම් ද තිබේ.

- විදේශීය වාර ප්‍රකාශන 251කට වැඩි සංඛ්‍යාවක් වසර පුරාම නොමිලයේ සහ නුවමාරු පදනම මත ලැබිණි. එයට අමතරව, මෙම පුස්තකාලය පොදු රාජ්‍ය මණ්ඩලීය ඡාත්‍යන්තර කෘෂිකර්ම කාර්යාංශයට (CABI) වාර්ෂික දායක මුදල් වශයෙන් ස්ටර්ලිං පවුම් 5,000ක් ගෙවීය.

- පරිශීලකයන් 980කට අධික සංඛ්‍යාවක් තොරතුරු ලබාගැනීම සඳහා මෙම පුස්තකාලයට පැමිණියහ. ග්‍රන්ථ 810ක් පුස්තකාල සාමාජිකයන් අතර සංසරණය විය. නිතිපතා සිදු කරන පාඨක සේවා සපයන ලද අතර පුස්තකාල අතර ග්‍රන්ථ තාවකාලිකව ලබාගැනීමේ ක්‍රමය යටතේ ග්‍රන්ථ 26ක්ද ලබා දුණි.

- පර්යේෂණ නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි පසුගිය කාලයට අදාළ තොරතුරු ගවේෂණ කාර්යයන් 48කට අධික ප්‍රමාණයකද නියැළිණි. ගවේෂණ 28ක් පමණ කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සභායෙන් සිදු කෙරිණි. දෙපාර්තමේන්තුවේ පර්යේෂණ නිලධාරීන් සඳහා පරිශීලක සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

- නිලධාරීහු 150ක් පමණ අන්තර්ජාල පහසුකම් මඟින් අවශ්‍ය තොරතුරු ලබා ගත්හ. කෘෂි තොරතුරු සේවය ද (AGRIS CD- ROM System) ඔවුන්ට කාලීන තොරතුරු ලබා ගැනීමට උපකාරී විය. කෘෂි දත්ත මූලය (WEBAGRISdatabase) කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික ප්‍රකාශනයේ නවතම ශ්‍රී ලාංකික කෘෂිකාර්මික තොරතුරු හා ට්‍රොපිකල් ඇග්‍රිකල්චරිස්ට් ජනර්ල් ලිපි ඇතුළත් කර යථාවත් කරන ලදී. එයට අමතරව 2011 වර්ෂයේදී කෘෂිකර්මීය පිළිබඳ ජාතික ග්‍රන්ථ නාමවලිය සඳහා කෘෂිකාර්මික දත්ත ඇතුළත් කිරීමට ද හැකි විය.

- ඇග්‍රිනෙට් පටුන පිටු බෙදා හැරීම් සේවාව (SDCP) අබණ්ඩව සිදුකරන ලද අතර දෙපාර්තමේන්තුවේ පරිශීලකයන් 120කට අධික සංඛ්‍යාවක් අතර බෙදා හරින ලදී.

- මධ්‍යම පුස්තකාලය විසින් 2011 වර්ෂයේදී දේශීය සහ විදේශීය ආයතනවලට 'ට්‍රොපිකල් ඇග්‍රිකල්චරිස්ට්' සඟරාව (වෙළුම් 157,158) බෙදා හරින ලද අතර ලිපි 800කට අධික සංඛ්‍යාවක් සහ ග්‍රන්ථ 2800ක් PURNA දත්ත මූලයට ඇතුළත් කෙරිණි.

සංවර්ධන සහ තාක්ෂණ ප්‍රචාරණ කටයුතු

එළවළු බෝග අංශය

විදේශීය එළවළු ප්‍රභේද ඇගයීම

වාණිජමය බීජ ආනයනකරුවන් විසින් වාණිජමය වශයෙන් හඳුන්වාදීමේ අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ලද එළවළු ප්‍රභේද රැසක් අගයන ලදී. පළිබෝධ හා රෝගවලට ඔරොත්තු දෙන ආකාරය, අස්වැන්නෙහි තත්ත්වය සහ ප්‍රමාණය අනුව පහත දැක්වෙන ප්‍රභේද පිළිගත හැකි යැයි හෝ පිළිගත නොහැකි යැයි සොයා ගැනිණි.

වගු අංක 2.2.5 : අගයන ලද විදේශීය එළවළු ප්‍රභේද

බෝගය පිළිගත්	ප්‍රතික්ෂේප කළ	
	සංඛ්‍යාව	සංඛ්‍යාව
බටු	2	2
මාළු මිරිස්	8	5
තක්තාලි	5	2
වැටකොළු	4	1
පිපිඤ්ඤා	3	7
කොමඩු	-	3
මස්ක් මෙලන්	-	1
කරවිල	4	-
වට්ටක්කා	1	-
වැල් බෝංචි	1	1
පඳුරු බෝංචි	1	-
කැරට්	-	2
ගෝවා	4	1
සලාද කොළ	4	-
රාබු	2	-
බීට්	1	-

අභිජනන බීජ නිෂ්පාදනය

- රටි සහ ලංකා චෙරි යන තක්කාලි ප්‍රභේද වලද බීරළු යන රාබු ප්‍රභේදයේ ද අභිජනක බීජ නිපදවන ලදී. භාතිය සහ මහේෂ් යන තක්කාලි ප්‍රභේදවල දෙමුහුම් බීජ නිෂ්පාදනය සඳහා අවශ්‍ය මා පිය ආර ද පෞද්ගලික බීජ සමාගම්වලට ලබා දෙන ලදී.
- පොළොන් මෑ සහ හවරි මෑවල පවිත්‍ර බීජ පිළිවෙළින් කි.ග්‍රෑ. 20.5ක් සහ කි.ග්‍රෑ. 4.25ක් බීජ අංශයට බාර දෙන ලදී.

වෙනත් තටයුතු

- ආදර්ශ ගම්මාන වැඩසටහන - ආදර්ශන පැවැත්වීම, වැඩිදියුණු කළ ප්‍රභේදවල බීජ සැපයීම, අනුවර්තන අත්හදා බැලීම් සහ ගොවි පුහුණු පැවැත්වීම මඟින් මාරස්සන, ගලේවෙල, සහ කම්බිලිවැවදී ආදර්ශ ගම්මාන වැඩසටහන්වලට දායක විණි.
- පුහුණුව - සම්පත්දායකයින් වශයෙන් එළවළු නිෂ්පාදනය පිළිබඳ නිලධාරී පුහුණු වැඩසටහන් 8කට දායකවිණි. දේශීය හා විදේශීය නරඹන්නන් වෙනුවෙන් අදාළ කාර්යයන් ආදර්ශනය කිරීමට අමතරව උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව හදාරන සිසුන් දෙදෙනෙකු සඳහා එළවළු පිළිබඳ පර්යේෂණ වලට අදාළ ආයතනික පුහුණුවක් ලබා දෙන ලදී.
- ආදර්ශන, ගොවි ක්ෂේත්‍ර පරීක්ෂා කර බැලීම, වඩා යෝග්‍ය වගා පිළිවෙත් පිළිබඳව උපදෙස් ලබා දීම (ප්‍රතිලාභීන් 100ක් සඳහා), ලිපි හෝ දුරකථනය මඟින් ගොවි විමසුම්වලට පිළිතුරු ලබා දීම.(100), පත්‍රිකා බෙදා හැරීම (2) සහ කෘෂිකාර්මික ප්‍රදර්ශනවලට දායකවීම (2)යනාදිය සංනිවේදනය ආශ්‍රිත වෙනත් කටයුතු තුළ අන්තර්ගත විය. අලුතින් නිදහස් කරන ලද තක්කාලි සහ මාළු මිරිස් ප්‍රභේදවල බීජ නියැදි විශාල සංඛ්‍යාවක් (150) ගොවීන් අතර බෙදා හරින ලදී.
- ස්ථිර බෝග සායන කමිටු වැඩසටහන
  - බෝග සායන කමිටු 36ක් දිස්ත්‍රික්ක 03ක් තුළ ස්ථාපිත කරන ලදී.
  - බෝග සායන 200ක් පමණ පවත්වන ලදී.
- උපාධි අපේක්ෂක සිසුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව - 07
- කෘෂිකර්ම ඩිප්ලෝමා සිසු පුහුණු - 09

තාක්ෂණය ලබා දීමේ කටයුතු

- පර්යේෂණ ප්‍රකාශන - 02
- පුවත්පත් ලිපි - 10
- ගොවි සහ නිලධාරී පුහුණු - 57
- විශේෂ ඉදිරිපත් කිරීම් - 12
- විසඳන ලද ගොවි ගැටළු සංඛ්‍යාව - 75
- ක්ෂේත්‍ර දින පැවැත්වීම - 01
- ප්‍රදර්ශන සඳහා සහභාගි වීම - 02
- ආදර්ශ ගම්මාන පිහිටුවීම - 04
  ගම්පහ දිස්ත්‍රික්කයේ පිටියේගම සහ දියගම යන ගම්මාන සහ වල්පිට හා මීවිටිය යන ගම්මාන

උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ගොවිපළ වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩසටහන

නිලධාරීන් 100දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 5ක් ද සිසුන් සඳහා පුහුණු වැඩසටහන් 4ක් ද ගොවීන් 500දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් 10ක් ද පවත්වන ලදී.

විශ්වවිද්‍යාල සිසුන් දෙදෙනෙකුගේ සහ ඩිප්ලෝමා සිසුවෙකුගේ පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය කරන ලදී.

කඳුරට එෆ් එම් සේවයේ ගුවන් විදුලි වැඩසටහනක් පවත්වන ලදී.

සංවර්ධන කටයුතු

- විශාල පරිමාණයෙන් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා විද්‍යාගාර උපකරණ මිලදී ගැනිණි.
- පටක රෝපණ විද්‍යාගාරය නවීකරණය කර සම්පූර්ණ පහසුකම් සහිත නව රෝපණ කුටියක් ස්ථාපිත කෙරිණි.
- රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා දැල් ගෘහයක් ඉදිකෙරිණි.

පලතුරු සහ පටක රෝපණ අංශය

නලස්ථ ප්‍රචාරණය මඟින් මූලික රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

වගු අංක 2.2.6 : නිපදවන ලද රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණය

බෝගය	ප්‍රභේදය	පැළ සංඛ්‍යාව		
		නල තුළ	පැළෑටි ගෘහය තුළ	එකතුව
කෙසෙල්	ඇම්බන්	246	305	551
	කුරු ඇම්බන්	87	-	87
	පුලතිසි	12	27	39
	රතඹලා	200	46	246
	සීනි කෙසෙල්	-	05 (මවිශාක)	05
	නේත්‍රාපලම්	1,000	67	1,067
	කෝලිකුට්ටුමු	800	-	800
අන්නාසි	රුසි	1,500	2,000	3,500
	කිව්	160	106	266
බෙලි	සුපුන්	420	-	420

පුහුණු කටයුතු

- ව්‍යාපෘති 4ක් අධීක්ෂණය කිරීම (විශ්වවිද්‍යාල සිසුවෙකුගේ සහ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සිසුන් 3දෙනෙකුගේ)
- ගොවීන් 300දෙනෙකු සඳහා පුහුණුව ලබා දීම
- පුද්ගලයන් 152දෙනෙකු සඳහා උපදේශක සේවා සැපයීම
- වගා ගැටළු 150කට අධික සංඛ්‍යාවක් විසඳා මෙම ආයතනයට පැමිණි සහ දුරකථනයෙන් සම්බන්ධ වූ ගොවීන්ට අවශ්‍ය උපදෙස් ලබා දීම

ව්‍යාප්ති කටයුතු

- එක්දින පුහුණු වැඩසටහන් සහ උපදේශාත්මක සේවා - 40දෙනෙකු වෙනුවෙන්
- දේශන - විශ්වවිද්‍යාල සිසුන් සඳහා දේශන 2ක්
- උපදේශක සේවා - 52දෙදෙනෙකු සඳහා
- ව්‍යාපෘති අධීක්ෂණය - එක් ව්‍යාපෘතියක් විශ්වවිද්‍යාල සිසුන් සමඟ සම්පූර්ණ කරන ලදී.
- කෝලිකුට්ටු පිළිබඳ කෙෂුද්‍ර ප්‍රචාරණය සම්බන්ධයෙන් පර්යේෂණ පත්‍රිකාවක් පළ කිරීම, පර්යේෂණ සමුළුව 2011, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය
- ජාතික කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුන් සඳහා ද්වි මාසික පුහුණුව
- ප්‍රදර්ශන - 2011 වර්ෂයේදී බුත්තල සහ කුණ්ඩසාලේ පවත්වන ලද ප්‍රදර්ශන 2 සඳහා ප්‍රදර්ශන ද්‍රව්‍ය සැපයීම

මුල් හා ආකන්ද බෝග

රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතියෙහි අරමුණ නිර්දේශිත මුල් හා ආකන්ද බෝග ප්‍රභේදවල (නව වැඩි දියුණු කරන ලද) උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය ලබා ගැනීමට ඇති හැකියාව වැඩි කිරීමයි.

මෙම ව්‍යාපෘතිය යටතේ එහි ඉලක්කය සපුරා ගැනීම පිණිස මුල් හා ආකන්ද බෝග රෝපණය කර ඇත. දැනටමත් මූලික රෝපණ ද්‍රව්‍ය 35,000කට අධික ප්‍රමාණයක් විවිධ සේවාලාභීන් අතර බෙදා හැර ඇත.

ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය

යෙදවුම් සැපයීම මඟින් සහ ගොවි පුහුණු පංති පැවැත්වීම මඟින් කෑගල්ලෙහි ආදර්ශන ක්ෂේත්‍ර 5ක් සහ දඹුල්ලෙහි ආදර්ශන ක්ෂේත්‍ර 5ක් ස්ථාපිත කිරීම හරහා ආදර්ශ ගම්මාන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රදර්ශන 2 ක් පැවැත්විණි.

දැයට කිරුළ - බුත්තල

ගොවි සතිය - වවුනියාව

ගුවන්විදුලි වැඩසටහන් සහ පුහුණු වැඩසටහන්

මුල් හා ආකන්ද බෝග වගාව පිළිබඳ ගුවන්විදුලි වැඩසටහනක් 2011.10.14 දින ගුවන් විදුලි සංස්ථාවේ ජාතික සේවය (දමිළ) මඟින් ප්‍රචාරය කරන ලදී. ගන්නොරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී සහ රජවක සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී පුර්ව කන්න පුහුණු වැඩසටහන් 2ක් පවත්වන ලදී.

ගොවි ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම සහ වඩා සුදුසු වගා පිළිවෙත් පිළිබඳ උපදෙස් ලබා දීම, ලිපි හෝ දුරකථනය මඟින් ගොවි විමසුම්වලට පිළිතුර ලබා දීම (ප්‍රතිලාභීන් 200) වැනි වෙනත් සන්නිවේදන කටයුතු ද ඉටු කෙරිණි.

සංශෝධනය කිරීමට නියමිත 'ටෙක්නො ගයිඩ්' හිපළකිරීම සඳහා මුල් හා ආකන්ද බෝග

වගාව(මැඳ්ඤෙදාක්කා, බතල, කිරිඅල, ඩයස්කොරියා සහ ඉන්නල) පිළිබඳ නවතම තොරතුරු සහිත මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙළ කරන ලදී.

කීට විද්‍යාව

වගු අංක 2.2.7 : 2011 වර්ෂයේදී සිදුකළ කාර්යයන්හි ප්‍රගතිය

කාර්යය	සංඛ්‍යාව
විද්‍යාගාර රෝග නිශ්චය කිරීම්	147
හඳුනා ගන්නා ලද නව පළිබෝධ ගැටලු	06
රෝග නිශ්චය කිරීම සඳහා සිදුකළ විශේෂ ක්ෂේත්‍ර චාරිකා	11
ගොවීන් සඳහා පුහුණු පංති	22
නිලධාරීන් සඳහා පුහුණු පංති	22
සම්පත්දායකයෙකු වශයෙන් සහභාගි වූ පැළෑටි සායන	04
ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා පිළිතුරු ලියන ලද ලිපි	06
ගැටලුවලට අදාළව පිළිතුරු සපයන ලද දුරකථන ඇමතුම්	89
සමෝධානික පළිබෝධ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණ	05
මී මැසි පාලනය	
ලිපිවලට පිළිතුරු සැපයීම්	21
මීමැසි ජනපද ස්ථාපිත කිරීම්	45
වැඩමුළු පැවැත්වීම්	01
නව මීමැසි ජනපද ස්ථාපිත කිරීමට ගොවීන්ට සහාය වීම	52
පුවත්පත් ලිපි සහ පත්‍රිකා ප්‍රකාශයට පත් කිරීම්	03
කෘෂි උද්‍යානය නැරඹීමට පැමිණි සංඛ්‍යාව	18,534

ව්‍යාධිවේදය සහ බිම්මල්

- බිම්මල් වගාව සම්බන්ධයෙන් 1081දෙනෙකු පුහුණු කරන ලද අතර සුළු පරිමාණ බිම්මල් නිෂ්පාදකයින් වශයෙන් ලියාපදිංචි කර සහතික 190ක් ද නිකුත් කරන ලදී.
- පිදුරු බිම්මල් නිෂ්පාදනය සම්බන්ධයෙන් 70 දෙනෙකුට සහ බිම්මල් බීජ නිෂ්පාදනය සම්බන්ධයෙන් 62දෙනෙකුට පුහුණුව ලබාදෙන ලදී.
- ගොවීන් 28දෙනෙකුට තැපැල් මගින් ද, 984දෙනෙකුට දුරකථනය මගින් ද 649දෙනෙකුට උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට පැමිණි විටද (මුළු පිරිස - 1661) අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදී.
- අ.පො.ස. (උ.පෙළ) සිසුන් 20දෙනෙකුට සිය කේවල ව්‍යාපෘති සඳහා බිම්මල් නිෂ්පාදන තාක්ෂණයන් ලබාදෙන ලදී.
- විශ්වවිද්‍යාල සිසුන් 82 දෙනෙකුට (යාපනය සහ කැළණිය) බිම්මල් වගාව සහ බිම්මල් බීජ නිෂ්පාදනය පිළිබඳ පුහුණුව ලබාදෙන ලදී.
- කෘෂිකර්ම ඩිප්ලෝමාව හදාරන සිසුවෙකුට (අම්පාර) තම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය ලබාදෙන ලදී.
- ප්‍රදර්ශන 02ක් පවත්වන ලදී.
  - දැයට කිරුළ, බුත්තල
  - ගොවි සතිය, වවුනියාව
- මන්නාරම සහ ගම්පහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සහ කුලියාපිටිය උසස් අධ්‍යාපන ආයතනය විසින් පවත්වන ලද ප්‍රදර්ශන 03 සඳහා පෝස්ටර් සහ ප්‍රදර්ශන ද්‍රව්‍ය ලබාදෙන ලදී.
- විවිධ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල සහභාගිත්වය ඇතිව පහත දැක්වෙන පරිදි බිම්මල් වගාව සහ බිම්මල් බීජ නිෂ්පාදනය සම්බන්ධයෙන් ප්‍රායෝගික පුහුණු වැඩමුළු පවත්වන ලදී.
  - කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි ව්‍යාපාර සහ තොරතුරු සේවය - 30දෙනෙකුට පුහුණුව ලබාදිණි.
  - මහ ඉලුප්පල්ලම සේවා සංස්කරණ පුහුණු ආයතනය - 30දෙනෙකුට පුහුණුව ලබාදුණි.
  - කෑගල්ල සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - 41දෙනෙකුට පුහුණුව ලබාදුණි.
  - කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල - 87දෙනෙකුට පුහුණුව ලබාදිණි.
  - මිල්ලෙනිය සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය - 31දෙනෙකුට පුහුණුව ලබාදුණි.
  - හදබිම - 34දෙනෙකුට පුහුණුව ලබාදුණි.
  - උණවටුන ගුරු පුහුණුව - 38දෙනෙකුට පුහුණුව ලබාදුණි.
- විද්‍යුත් මාධ්‍ය හරහා සහභාගිත්ව තාක්ෂණික ප්‍රචාරණ කටයුතු සිදු කිරීම

- ගුවන්විදුලි වැඩසටහන් 03ක් (මුතුබෙලි බිම්මල් වගාව, පිදුරු බිම්මල් වගාව, වියළි බිම්මල් වලින් අගය එකතු කළ නිෂ්පාදන - කඳුරට සේවය - 'අස්වැන්න' සජීවී වැඩසටහන සහ සන්ධ්‍යා සේවය) සහ රූපවාහිනී වැඩසටහනක් (රන් අටුව) ප්‍රචාරය කරන ලදී. පුවත්පත් ලිපියක් (මුතුබෙලි බිම්මල් වගාව) රුපිණ පුවත්පතෙහි පළ කෙරිණි.
- වවුනියාව කෘෂිකර්ම විද්‍යාලයේ බිම්මල් නිෂ්පාදන ඒකකයක් ස්ථාපිත කරන ලදී.
- ගොවීන් අතර පිදුරු බිම්මල් සහ මුතුබෙලි බිම්මල් වගාව ශක්තිමත් කිරීම පිණිස පිදුරු බිම්මල් බීජ පැකට් 294ක්ද මුතුබෙලි බිම්මල් බීජ පැකට් 32ක්ද බෙදා හරින ලදී.

කෘෂිකාර්මික රසායන විද්‍යාව

ශ්‍රී ලංකාවේ විවිධ බෝග වගා ක්‍රම තුළ පසේ සරු බව ඇගයීම

ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන කොට්ඨාස තුළ විවිධ බෝග වගා ක්‍රම ආශ්‍රිත පසේ සරුබව පිළිබඳ පරාමිතියන් තක්සේරු කිරීම පිණිස මෙම අධ්‍යයනය සිදු කරන ලදී. නියැදි එක්රැස් කිරීම මුළුමනින්ම නිම කරන ලද අතර විශ්ලේෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙම අධ්‍යයනය උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පාංශු රසායන අංශය විසින් සම්බන්ධීකරණය කරන ලද අතර පාංශු නියැදි ගැනීම සහ විශ්ලේෂණ කටයුතු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියලුම ආයතන විසින් සිදුකරන ලදී.

විශ්ලේෂණ සේවා

2011 වර්ෂයේදී පාංශු නියැදි 2,000ක්, ජල නියැදි 200ක්, පැළෑටි නියැදි 27ක් සහ කොම්පෝස්ට් නියැදි 100ක් පමණ විශ්ලේෂණය කර වාර්තා ලබාදෙන ලදී. විශ්ලේෂණය සඳහා ලද පාංශු නියැදි සංඛ්‍යාව පෙර වසරවලට සාපේක්ෂව 2011 වර්ෂයේ වැඩි මට්ටමක තිබිණි. විශ්ලේෂණ සේවා මගින් වසර තුළ එක්රැස් කරගත් ආදායම රු. 168,830/= කි.

සිසුන්ගේ ව්‍යාපෘති

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයෝ 2දෙනෙක් සහ සබරගමුව විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙක් තම අවසන් වසර ව්‍යාපෘති නිම කළහ. එයට අමතරව, අම්පාර හාඩි උසස් තාක්ෂණ ආයතනයේ ශිෂ්‍යයෝ 3දෙනෙක් සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරියේ ශිෂ්‍යයෝ 4දෙනෙක් තම ආයතනික පුහුණුව සම්පූර්ණ කළහ.

මල් වගාව

- ගෙවතු වගා බීජ පැකට් 4,500ක් මෙම අංශය විසින් පුහුණු කරන ලද නිලධාරීන් සහ ගොවීන් අතර බෙදා හරින ලදී.
- මහජනයා අතර බෙදා හැරීම පිණිස ගෙවතු වගා බීජ පැකට් 4000කට අදාළ බීජ මෙම අංශයේ ගබඩා කෙරිණි.
- 'දිවිනැගුම' වැඩසටහනෙහි පහසුකම් සලසන්නන් සහ ප්‍රතිලාභීන් සඳහා ගෙවතු වගාව පිළිබඳ පුහුණු වැඩමුළු 42ක් පවත්වන ලදී.
- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ආදර්ශ ගෙවත්ත වසර පුරාම ආකර්ශනීය අයුරින් නඩත්තු කරන ලදී.

ව්‍යාප්ති, ආර්ථික විද්‍යා සහ දත්ත කළමනාකරණ අංශය

තාක්ෂණ ප්‍රචාරණ කටයුතු

- නරඹන්නන් 75,340දෙනෙකු පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු
- තාක්ෂණය පිළිබඳ විමසුම් සඳහා ලිඛිත පිළිතුරු සැපයීම - 312
- පාසැල් සිසුන් - 28,317
- ගොවීන් - 5,982
- ගොවි කණ්ඩායම් පුහුණු වැඩසටහන් - 02
- අනෙකුත් ආයතන සඳහා කණ්ඩායම් වැඩසටහන් සම්බන්ධීකරණය - 05
- විදේශික කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන් - 02
- පාසැල් ගුරුවරුන් - 110
- රජයේ නිලධාරීන් - 60
- උසස් අධ්‍යාපනයෙහි නියැළෙන සිසුන් - 205
- තනි පුද්ගලයින් - 395
- ලිපිවලට පිළිතුරු සැපයීම - 47
- උපදෙස් පත්‍රිකා 5,345ක් නිකුත් කිරීම මගින් නව තාක්ෂණය ප්‍රචාරණය කිරීම
- දුරකථන විමසුම් කළ 903දෙනෙකුට තාක්ෂණික උපදෙස් ලබාදීම

- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පර්යේෂණවල විශේෂ සිදුවීම් රැගත් ග්‍රන්ථය සම්පාදනය කිරීම
- තාක්ෂණික තොරතුරු රැගත් ප්‍රකාශන සහ පත්‍රිකා සැලසුම් කර පිළියෙළ කිරීම -04

2012 වර්ෂය සඳහා සැලැස්ම

එළවළු

තක්කාලි

- දෙමුහුම් දිරිය මගින් තක්කාලි ප්‍රභේද බිහි කිරීම
  - F 1 දෙමුහුම් බිහි කිරීම
  - ප්‍රභේද අත්හදා බැලීම් තුළF 1 දෙමුහුම් පරීක්ෂා කර බැලීම
  - මාපිය ආර නඩත්තු කිරීම
- නුමුහුම් ආර වැඩිදියුණු කිරීම මඟින් තක්කාලි ප්‍රභේද බිහි කිරීම
  - වරණාය සහ ඇගයීම
- හඳුන්වා දෙන තක්කාලි ප්‍රභේද ඇගයීම
  - විදේශීය ප්‍රභේද ඇගයීම
- තක්කාලි ප්‍රභේදවල අභිජනන බීජ නිෂ්පාදනය
- අලුතින් නිදහස් කරන ලද ප්‍රභේද ප්‍රවර්ධනය කිරීම
  - නව ප්‍රභේද පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

මාළුමිරිස්

- දෙමුහුම් දිරිය තුළින් මාළුමිරිස් ප්‍රභේද බිහි කිරීම
  - F1 දෙමුහුම් නිෂ්පාදනය
  - ප්‍රභේද අත්හදා බැලීම් තුළF1 දෙමුහුම් පරීක්ෂා කර බැලීම
  - මාපිය ආර නඩත්තු කිරීම
- බලාපොරොත්තු තැබිය හැකි 'නයි මිරිස්' වර්ග සංශුද්ධ කිරීම සහ ඒවායෙහි බීජ නිෂ්පාදනය

මෑ

- එළිමහනේ පරාගණය වන අපේක්ෂිත ප්‍රභේද වැඩිදියුණු කිරීම
- අපේක්ෂිත දෙමුහුම් බිහි කිරීම

වම්බටු

- අපේක්ෂිත වම්බටු දෙමුහුම් බිහි කිරීම
- නිදහස් කරන ලද සහ බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම්වල මාපිය ආරවල බීජ නිෂ්පාදනය

කොළ එළවළු

විවිධ කොළ එළවළුවල බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

- කරවිල සහ පිපිඤ්ඤා ජනකප්ලාස්ම සංශුද්ධ කිරීම
- කරවිල සහ පිපිඤ්ඤා දෙමුහුම්කරණය
- කරවිල සහ පිපිඤ්ඤා දෙමුහුම් අත්හදා බැලීම
- විවිධ පරිසරයන් තුළ (ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්) බලාපොරොත්තු තබාගත හැකි ප්‍රභේද අත්හදා බැලීම
- විදේශීය කරවිල ප්‍රභේදවල F1 පරම්පරාව ඇගයීම
- වට්ටක්කා ප්‍රභේදය සංශුද්ධ කිරීම
- වට්ටක්කා ප්‍රභේදයේ බීජ ගුණනය සහ එම ප්‍රභේදය ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව වෙත ඉදිරිපත් කිරීම
- මාතලේ ග්‍රීන්, පොළොන් මෑ, හවරි මෑ, සේන සහ පඳුරු මෑවල අභිජනන බීජ නිෂ්පාදනය
- පොළොන් මෑ
- වැටකොළු ජනකප්ලාස්ම ඇගයීම සහ සංශුද්ධ කිරීම
- වැටකොළු දෙමුහුම්කරණය
- වැටකොළු දෙමුහුම් පරීක්ෂා කර බැලීම
- විවිධ පරිසරයන් තුළ (ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්) බලාපොරොත්තු තැබිය හැකි වැටකොළු ප්‍රභේද අත්හදා බැලීම
- බෝංචි මුහුන්වලින් ලබාගත් ගහන නඩත්තු කිරීම

- විවිධ පරිසරයන් තුළ (ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම්) බලාපොරොත්තු තැබිය හැකි වැල් බෝංචි ප්‍රභේද අත්හදා බැලීම
- වැල් බෝංචි පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සිදු කිරීම
- දඹල ජනකප්ලාස්ම පරීක්ෂා කර බැලීම
- බෝංචි ජනකප්ලාස්මවල අණුක ලක්ෂණීකරණය සහ මලකඩ රෝගයට ප්‍රතිරෝධීවීම හා සම්බන්ධ අණුක සලකුණු හඳුනා ගැනීම
- KWR නමැති තක්කාලි ප්‍රභේදයේ බැක්ටීරියා හිටුමැරීමට ප්‍රතිරෝධිතාව ඇති කිරීම හා සම්බන්ධ අණුක සලකුණු හඳුනා ගැනීම
- දඹල ප්‍රභේද 02ක අභිජනන බීජ නිෂ්පාදනය

පලතුරු සහ පටක රෝපණය

- ශ්‍රී ලංකාවේ උගුරැස්ස පිළිබඳ ගවේෂණ, සංරක්ෂණ සහ ප්‍රචාරණ අධ්‍යයන
- ඉහළ අස්වනු සහ උසස් තත්ත්වය සඳහා වඩා යෝග්‍ය මාපිය සංයෝගයක් හඳුනා ගැනීම සඳහා දූරියන් ප්‍රභේද දෙමුහුම් කිරීම
- වැඩි අස්වනු සහ උසස් තත්ත්වයෙන් යුතු ප්‍රභේදයක් වෙනුවෙන් වරකා ජනකප්ලාස්ම ගවේෂණය, සංරක්ෂණය සහ ඇගයීම
- උසස් තත්ත්වයේ වැඩි අස්වනු ගෙනදෙන ප්‍රභේද බිහි කිරීම සඳහා ඩ්‍රැගන් පෘට් දෙමුහුම්කරණය සහ වරණය
- අඹ කුරු කිරීම කෙරෙහි අතරමැදි ග්‍රාහක සහ ග්‍රාහක ප්‍රභේදය මගින් ඇතිකරන බලපෑම
- වැඩි අස්වනු ගෙනදෙන උසස් තත්ත්වයේ ප්‍රභේද හඳුනා ගැනීම සඳහා ඇඹුල් කෙසෙල් එකතූන් ගවේෂණය, සංරක්ෂණය සහ ඇගයීම
- දැනට ඇති නුහුමුම් ආර යොදා ගනිමින් පැපොල් දෙමුහුම් බිහි කිරීම සහ අස්වැන්න සහ අනෙකුත් ලක්ෂණවලට අදාළව දෙමුහුම් ඇගයීම
- ආදර්ශ ගම්මානයක් ස්ථාපිත කිරීම
- පර්යේෂණ ගොවිපළ 02ක් සංවර්ධනය කිරීම සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- ප්‍රේරිත විකෘතිය මගින් වැඩි අස්වනු ගෙනදෙන, උසස් තත්ත්වයේ එමෙන්ම රෝගවලට ප්‍රතිරෝධී කෙසෙල් ප්‍රභේද බිහි කිරීම
- ඉහළ අස්වැන්නක් ලබාදෙන, ගුණාත්මක බවින් ඉහළ සහ රෝගවලට ඔරොත්තු දෙන කෙසෙල් ජනක ප්ලාස්ම වරණය
- ප්‍රේරිත විකෘතිය මගින් ඉහළ අස්වැන්නක් ලබාදෙන ගුණාත්මක බවින් ඉහළ රඹුටන් ප්‍රභේද වැඩි දියුණු කිරීම
- වැඩි අස්වනු ගෙනදෙන උසස් තත්ත්වයේ පැපොල් ප්‍රභේද/දෙමුහුම් බිහි කිරීම
- රඹුටන්වල අස්වැන්න සහ තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා පිළිවෙත් මාලාවක් බිහි කිරීම
- 'ෆාදර් ලෝන්' නමැති වරකා ප්‍රභේදයේ බද්ධ පැළ කෙරෙහි බීජවල ප්‍රමාණය සහ ග්‍රාහකවල වර්ධන මාධ්‍යය මගින් ඇතිකරන බලපෑම අධ්‍යයනය කිරීම
- ආදර්ශ ගම්මාන 04ක් ස්ථාපිත කිරීම
- පර්යේෂණ ගොවිපළ 04 සංවර්ධනය සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

මුල් හා ආකන්ද බෝග සහ මල් වගාව

- බතල සහ මඤ්ඤොක්කා පිළිබඳ ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන් අඛණ්ඩව සිදු කිරීම
- ඉහළ මට්ටමින් ලවණතාවට ඔරොත්තු දෙන, ඉහළ කැරටීන් ප්‍රමාණයක් සහ ඉහළ වියළි ද්‍රව්‍ය ප්‍රමාණයක් අන්තර්ගත බතල CIP ආර පිළිබඳ ප්‍රභේදීය ඇගයීම
- නිර්දේශිත බතල, මඤ්ඤොක්කා, කිරිඅල, කොලකේසියා, ඩයස්කොරියා සහ ඉන්නල ප්‍රභේදවල මූලික රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ දිවයින පුරා සිටින ඉලක්කගත සහ විවිධ ප්‍රතිලාභීන් අතර ඉල්ලීම පරිදි ඒවා බෙදා හැරීම
- සියලුම මුල් හා ආකන්ද බෝගවල ජනකප්ලාස්ම නඩත්තු කිරීම
- මූලික බීජ හා රෝපණ ද්‍රව්‍ය සියලුම ඒකක, ආදර්ශන ක්ෂේත්‍ර, ආදර්ශ ගම්මාන ආදිය ස්ථාපිත කිරීම මගින් සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම මගින් මුල් හා ආකන්ද බෝගවල වැඩිදියුණු කළ නව ප්‍රභේද බෙදා හැරීම
- ප්‍රර්බෙරා දෙමුහුම් සඳහා වගා පිළිවෙත් මාලාවක් සකස් කිරීම
- ගෙවතු වගාව සඳහා යොදා ගැනීම පිණිස නවීන තාක්ෂණයන් ජනනය කිරීම

- ගෙවතු වගාව සඳහා වඩා හොඳ බෝග සංයෝග සහ වගා ක්‍රම හඳුනා ගැනීම
- ගෙවතු සඳහා සුදුසුම බෝග හඳුනා ගැනීම සහ හඳුන්වා දීම
- ආරක්ෂිත ගෘහ තුළ වගා කරන බෝග වර්ග 05ක් සඳහා වගා පිළිවෙත් සකස් කිරීම
- ආරක්ෂිත ගෘහ තුළ වගා කරන බෝග වර්ග 5ක් වැඩිදියුණු කිරීම
- උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ආදර්ශ ගෙවත්ත නඩත්තු කිරීම

කීට විද්‍යාව

- වට්ටක්කාවලට වැළඳෙන පළිබෝධ හා රෝග පාලනය සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් සකස් කිරීම (ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘතිය)
- වට්ක්කාවල වයිරස් වාහකයින් පාලනය සඳහා විකල්ප කෘමිනාශක ප්‍රතිකර්ම අත්හදා බැලීම
- පිපිඤ්ඤාවල පළිබෝධ හා රෝග පාලනය සඳහා දැනට පවතින සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාව වැඩි දියුණු කිරීම උදෙසා විකල්ප පාලන ක්‍රමෝපාය අත්හදා බැලීම
- පිපිඤ්ඤාවල වයිරස් හා රෝග පාලනය සඳහා වැඩිදියුණු කරන ලද සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාව පර්යේෂණ ක්ෂේත්‍ර තුළ ද ගොවි ක්ෂේත්‍ර තුළ ද අත්හදා බැලීම
- ගොවින්ට සහ ව්‍යාප්ති කාර්ය මණ්ඩලයට වැඩිදියුණු කරන ලද සමෝධානික පළිබෝධ කළමනාකරණ තාක්ෂණය ප්‍රචාරණය කිරීම පිණිස ක්ෂේත්‍ර ආදර්ශන පැවැත්වීම
- පැළ මැක්කන් නැවත මතුවීම පාලනය සඳහා ඒසිෆේට් 75% SP මගින් ඇතිකරන බලපෑම ඇගයීම
- කෙසෙල් ගුල්ලන් පාලනය සඳහා කෘමිනාශක පරීක්ෂා කර බැලීම
- අදාළ අරමුණු සපුරා ගැනීම සඳහා මෙම පර්යේෂණ ව්‍යාපෘති අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

පැළෑටි ව්‍යාධිවේදය, ක්ෂුද්‍ර ජීව විද්‍යාව සහ බිම්මල් වගාව

- හිටු මැරීමේ සහ කඳ පාමුල කුණුවීමේ රෝගයට අදාළව වම්බටු, තක්කාලි සහ මාළුමිරිස් ජනකප්ලාස්ම පරීක්ෂා කර බැලීම
- ෆ්‍යුසාරියම් හිටු මැරීමේ රෝගය සඳහා පාලන ක්‍රමයක් ඇති කිරීම
- රෝග නිශ්චය කිරීමේ සහ උපදේශක සේවය
- තක්කාලි සහ මාළුමිරිස්වලට වැළඳෙන පළිබෝධ සඳහා ප්‍රතිරෝධීවීම කෙරෙහි ප්‍රවිකිරණය කරන ලද කයිටින් මගින් ඇති කරන බලපෑම
- ප්‍රවිකිරණය කරන ලද කයිටොසාන්ස් මගින් රඹුටන්වල පිටිපුස් රෝගය කළමනාකරණය කිරීම
- ඉඟුරු රයිසෝම කුණුවීම පාලනය කිරීමේ ක්‍රම බිහි කිරීම
- තවාන් රෝග පෙර විද්‍යාත්මකව පාලනය කිරීමේ ක්‍රම
- වයිරස් මගින් කුකුර්බිටිස් වර්ගවල ඇතිකරන කොළ කොඩවීමේ ගැටළුව පිළිබඳ අධ්‍යයනය
- රෝග විනිශ්චය කිරීම සඳහා ආනයනය කළ බීජ හා රෝපණ ද්‍රව්‍ය පරීක්ෂා කර බැලීම
- ව්‍යාධිජනක දිලීර වර්ධනය සම්බන්ධයෙන් කයිටොසාන් සංයෝග පරීක්ෂා කර බැලීම (නලස්ටව පරීක්ෂා කිරීම)
- මිදිවල රෝග පාලනය පිළිබඳ අධ්‍යයන
- වට්ටක්කාවලට වැළඳෙන රෝග හඳුනා ගැනීම සහ ඒවා පාලනය කිරීම සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් බිහි කිරීම
- පැහිරි පලතුරු බෝගවලට වැළඳෙන ප්‍රධාන රෝග සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් බිහි කිරීම
- පැෂන් පෘට්වල කඳ ඉදිමීම පිළිබඳ අධ්‍යයන
- සුකිනි කහ විවිත්‍ර වයිරසයට අදාළව පිපිඤ්ඤා ජනකප්ලාස්ම පරීක්ෂා කර බැලීම
- ඩ්‍රැගන් පෘට් වගාවේ රෝග හඳුනා ගැනීම
- තක්කාලිවල අංගමාර රෝගය සම්බන්ධයෙන් දිලීරනාශක පරීක්ෂා කර බැලීම

- මාළුමිරිස්වලට වැළඳෙන ඇන්ත්‍රැක්නෝස් රෝගය සම්බන්ධයෙන් දිලීරනාශක පරීක්ෂා කර බැලීම
- කෙසෙල්වල සිගාටොකා රෝගය සම්බන්ධයෙන් දිලීරනාශක පරීක්ෂා කර බැලීම
- කුකුබිටිස් වර්ගවල පිටිපුස් සහ යටිපුස් රෝග සම්බන්ධයෙන් දිලීරනාශක පරීක්ෂා කර බැලීම
- සූකිරි බිම්මල් වගාව සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම
- නව මුතුබෙලි බිම්මල් ප්‍රභේද 02ක් සඳහා වගා ක්‍රම අත්හදා බැලීම
- බිම්මල් නිෂ්පාදනය සඳහා අඩු පිරිවැයැති ක්‍රමයක් බිහි කිරීම
- එළවළු සහ පලතුරු බෝගවල දිලීර මූලික ඇගයීම

පාංශු සාරවත්භාවය කළමනාකරණය කිරීම

- කාබනික ගොවිතැන යටතේ එළවළුවල අස්වැන්න කෙරෙහි විවිධ කාබනික පොහොර මූලාශ්‍ර මගින් ඇති කරන බලපෑම
- නයිට්‍රජන් කළමනාකරණය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් කාබනික එළවළු වගාවේ පෝෂක කළමනාකරණය
- කාබනික එළවළු වගාව කෙරෙහි විවිධ පෝෂක ප්‍රභව සංයෝජන බලපාන ආකාරය
- කාබනික එළවළු අස්වැන්න කෙරෙහි සාමාන්‍ය වගා ක්‍රමය මගින් (බිම් සැකසීමක් හා වසුන් යෙදීමක් නොකර) ඇති කරන දිගුකාලීන බලපෑම
- එළවළු අස්වැන්න සහ පසේ තත්ත්වය කෙරෙහි පසට කොම්පෝස්ට් යෙදීම මගින් ඇතිකරන දිගුකාලීන බලපෑම
- කෙසෙල් වගාවේ පොටෑසියම් කළමනාකරණය
- අන්නාසි වගාවේ පොහොර කළමනාකරණය
- ශ්‍රී ලංකාවේ විවිධ ගොවිජන සේවා මධ්‍යස්ථාන කොට්ඨාසවලට අදාළව පාංශු සාරවත්භාවය ඇගයීමේ අධ්‍යයනය
- එළවළු අස්වැන්න කෙරෙහි නැනෝ පොහොර මගින් ඇති කරන බලපෑම
- විවිධ බෝග රටාවල පසෙහි ක්ෂුද්‍ර පෝෂක තත්ත්වය පිළිබඳ අධ්‍යයනය
- ශ්‍රී ලංකාවේ ෆොස්ෆෝට් පොහොර භාවිතය තුළ බැර ලෝහ පිළිබඳ තත්ත්වය විමර්ශනය කර බැලීම
- විවිධ සත්ව අපද්‍රව්‍ය වර්ගවල බැර ලෝහ පිළිබඳ තත්ත්වය අධ්‍යයනය කිරීම
- කොළ පොහොරවල ද්විතියික සහ ක්ෂුද්‍ර පෝෂක පවතින තත්ත්වය අධ්‍යයනය කිරීම
- ශ්‍රී ලංකාවේ සුලභව පරිභෝජනය කරන ජලජ පැළෑටිවල ආහාරයට ගන්නා කොටස්වල ඇති බැර ලෝහ අන්තර්ගතය පිළිබඳව අධ්‍යයනය කිරීම

මධ්‍යම පුස්තකාලය

- පුස්තකාලයේ ඇති දුර්ලභ ග්‍රන්ථ එකතුව ඩිජිටල් ආකෘතියකින් සංරක්ෂණය කිරීමේ සැලැස්ම
- වෙබ් අඩවිය තුළ මධ්‍යම පුස්තකාල කැටලොගය ප්‍රකාශයට පත් කිරීමේ සැලැස්ම
- අලුතින් ලද පුස්තකාල පොත් සඳහා කැටලොග් කාඩ් මුද්‍රණය කිරීම සැලසුම් කිරීම
- ‘‘ට්‍රොපිකල් ඇග්‍රිකල්චරිස්ට්’’ සඟරාව පරිගණක ගත කිරීම
- ‘‘ට්‍රොපිකල් ඇග්‍රිකල්චරිස්ට්’’ සඟරාව ඩිජිටල් ආකෘතියකින් සකස් කර පසුව අන්තර් ජාලයට එක් කිරීමට අපේක්ෂිතය.
- පුස්තකාලයේ ඇති සියලුම ග්‍රන්ථ පරිගණක ගත කිරීම

කාර්ය මණ්ඩලය

තනතුර	**නිලධාරි/සේවක සංඛ්‍යාව**
අධ්‍යක්ෂ (වැඩබලන)	01
අතිරේක අධ්‍යක්ෂ (වැඩබලන)	01
පර්යේෂණ නිලධාරි	23
පරිපාලන නිලධාරි	02
ජේෂ්ඨ පුස්තකාලයාධිපති	01
පුස්තකාලයාධිපති	02
වැඩසටහන් සහකාර (කෘෂිකර්ම)	09
රාජ්‍ය කළමනාකරණ සහකාර	18
ගොවිපළ ලිපිකරු	05
කෘෂිකර්ම උපදේශක	35
පර්යේෂණ සහකාර	13
පර්යේෂණ උප සහකාර	09
කාර්යාල කාර්ය සහායක	02
රියදුරු	07
ගබඩාකරු	02
යන්ත්‍ර ශිල්පී	02
යන්ත්‍ර ක්‍රියාකරු	01
වඩු කාර්මික	01
වෑද්දුම්කරු	01
විදුලි ශිල්පී	01
තණකොළ කපන යන්ත්‍ර ක්‍රියාකරු/ තෘණ කොළ කපන්නා	01
පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු/ ට්‍රැක්ටර් ක්‍රියාකරු	03
ජල පොම්ප ක්‍රියාකරු	01
මී මැසි ප්‍රදර්ශක	01
බද්ධකරු	01
සංචාරක බංගලා භාරකරු	01
තවාන්කරු	01
සනීපාරක්ෂක කම්කරු	02
නුපුහුණු කම්කරු	110
මුරකරු	25
එකතුව	**282**

2.2.1. පැළෑටි වයිරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය - හෝමාගම

හෝමාගම පිහිටි පැළෑටි වයිරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පරිපාලන යටතේ ක්‍රියාත්මක වේ. මෙම මධ්‍යස්ථානයට පැවරී ඇති වගකීම වන්නේ පැළෑටි වයිරස් සහ වයිරස් වැනි ජීවීන් හඳුනා ගැනීම සඳහා දැනට භාවිතයේ ඇති උසස් තාක්ෂණයන් යොදා ගැනීම, වයිරස් සහ වෙනත් ජීවීන් විද්‍යාගාරයේදී හා ක්ෂේත්‍රයේදී හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ කට්ටල නිෂ්පාදනය, නිරෝධායන කටයුතු, වසංගත විද්‍යාත්මක විමර්ශන, යොදා ගත හැකි පාලන ක්‍රම ඇගයීම, වයිරස්වලින් තොර මූලික රෝපණ ද්‍රව්‍ය හා අන්තිවාරම් තොග නිෂ්පාදනය, වයිරසයේ ප්‍රෝටීනය සඳහා ප්‍රතිරෝධිවීම පිළිබඳ විමර්ශන සිදු කිරීම සහ අනෙකුත් ව්‍යාධිජනක ජීවීන් (දිලීර, බැක්ටීරියා, නෙමටෝඩාවන්, වයිරොයිඩ සහ පයිටොප්ලාස්මා) හඳුනා ගැනීමයි.

අයවැය

වගු අංක 2.2.1.1. වාර්ෂික අයවැය - 2011 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
පුනරාවර්තන	2,856,013	2,694,948	94
මූලධන	2,380,615	2,046,483	86
ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - පැපොල් ව්‍යාපෘතිය	1,000,000	959,280	96
පටක රෝපණ ව්‍යාපෘතිය	3,300,000	2,412,000	73
මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයේ කෘෂිකර්ම ව්‍යාපෘතිය	150,000	131,275	88
ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය (මුල්ලේගම)	100,000	10,639	11
එකතුව	**9,786,628**	**8,254,625**	**84**

ප්‍රගතිය

සාමාන්‍ය පරිදි සිදු කෙරෙන පැළෑටි වයිරස් විද්‍යා කටයුතු

- වැලිගම පොල් වගාවේ පත්‍ර මැලවීමේ රෝගය සඳහා දේශීය වශයෙන් නිපදවන ලද පොලික්ලෝනල් ප්‍රතිමස්තු යොදා ගනිමින් එලයිසා තාක්ෂණය (ELISA) ආධාරයෙන් විවිධ බෝගවල ඇති පයිටොප්ලාස්මා රෝග හඳුනා ගැනීම - අධ්‍යයනය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.
- ඇන්තූරියම් අංගමාර රෝගය හඳුනාගැනීම සඳහා දේශීය වශයෙන් නිපදවන ලද පොලික්ලෝනල් ප්‍රතිමස්තුවල කාර්යක්ෂමතාව ඇගයීම
  ඇන්තූරියම් අංගමාරය සඳහා දේශීය වශයෙන් නිපදවන ලද ප්‍රතිමස්තු සැන්තොමොනාස් ඇක්සොනොපොඩිස් (*Xanthomonas axonopodis* pv *diffenbachae*) රෝග ආසාදනය හඳුනා ගැනීම සඳහා යොදාගත හැකිය. මෙම අධ්‍යයනය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.
- වැලිගම පොල් වගාවේ පත්‍ර මැලවීමේ රෝගය සඳහා දේශීය වශයෙන් සකස් කරන ලද ක්‍රමවේදය (Protocol) ප්‍රශස්ත කිරීම - මෙම අධ්‍යයනය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.
- එලයිසා තාක්ෂණය (ELISA) ආධාරයෙන් වැලිගම පොල් වගාවේ පත්‍ර මැලවීමේ රෝගයේ ධාරක පරාසය හඳුනා ගැනීම
- ආනයනය කරන ලද දෙමුහුම් කුකුඹිට් බෝග බීජවල ඇති බීජ මගින් පැතිර යන වයිරස් රෝග හඳුනා ගැනීම - පරීක්ෂා කරන ලද දෙමුහුම් ප්‍රභේදවල පිපිඤ්ඤු ග්‍රීන් මොට්ල් මොසායික් වයිරසය සහ පිපිඤ්ඤු විචිත්‍ර වයිරසය නොතිබිණි. මෙම අධ්‍යයනය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.
- මස්තු විද්‍යාත්මක ක්‍රම මගින් නිතිපතා සිදු කෙරෙන වයිරස් හඳුනාමේ වැඩසටහන නියැදි3550 ක වයිරස් හඳුනා ගැනීමේ කටයුතු සිදු කෙරිණි.

  භාවිතය : රෝගවලින් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ රෝග තවදුරටත් පැතිරීයාම පාලනය කිරීම සඳහා ව්‍යාධිජනක නිවැරදිව හඳුනා ගැනීම

අණුක වයිරස් විද්‍යාව

- ආර්ටී-පීසීආර් තාක්ෂණය මගින් X අර්තාපල් වයිරසය සහ අර්තාපල් පත්‍ර රෝල්වීමේ වයිරසය හඳුනා ගැනීම

  භාවිතය : නිතිපතා සිදු කෙරෙන වයිරස් හඳුනා ගැනීමේ කටයුතු සඳහා මෙම තාක්ෂණය යොදා ගැනීම, විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ ආයතනවල වයිරස්වලින් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා නිරෝධායන කටයුතු ප්‍රවර්ධනය කිරීම

- ආර්-ටී පීසීආර් තාක්ෂණය මගින් පැඟිරි වගා ප්‍රභේදවල ඇති වයිරස් සහ වයිරොයිඩ රෝග හඳුනා ගැනීම සහ ඩ්‍යුප්ලෙක්ස් හා මල්ටිප්ලෙක්ස් ආර්ටී- පීසීආර් තාක්ෂණය වැඩිදියුණු කිරීම

  වයිරොයිඩ 2ක් හඳුනා ගැනිණි. කෙසේවුවද, අදාළ ක්‍රමවේදය (Protocol) වැඩිදුරටත් සම්පූර්ණ කළ යුතුය.

- පීසීආර් තාක්ෂණය පදනම් කර ගත් ක්‍රමවේදය මගින් පොල් පත්‍ර මැලවීමේ පයිටොප්ලාස්මා රෝගය පතුරුවන ධාරක පරාසය පිළිබඳ අධ්‍යයනය-

  විශේෂිත ප්‍රයිමර් යොදා ගනිමින් වැලිගම පොල් පත්‍ර මැලවීමේ පයිටොප්ලාස්මා රෝගය සම්බන්ධයෙන් මෙම අධ්‍යයනය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත. මෙය තවදුරටත් තහවුරු කර ගැනීම සඳහා ජාන පිහිටා ඇති ආකාරය පිළිබඳ විශ්ලේෂණ කටයුතු සිදු කෙරෙනු ඇත.

  භාවිතය : මෙම රෝගය ව්‍යාප්තවීම පාලනය කිරීම සඳහා රෝගයට ලක්වූ පොල් ශාක හැරුණු විට විකල්ප ධාරක රෝග ආසාදනය නොවූ ප්‍රදේශවලට පිවිසීම සීමා කිරීම.

- පොල් පත්‍ර මැලවීමේ පයිටොප්ලාස්මා රෝගයේ ජාන පිහිටි ආකාරය උපයෝගී කර ගනිමින් පීසීආර් තාක්ෂණය මගින් දැනටමත් හඳුනාගෙන ඇති වයිරස් පිළිබඳ තොරතුරු තහවුරු කර ගැනීම

  මේ පිළිබඳ අධ්‍යයන අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

- ඩීඑන්ඒ පදනම් කරගත් තාක්ෂණය මගින් නිතිපතා සිදු කෙරෙන වයිරස් හඳුනා ගැනීමේ වැඩසටහන
  මෙම ක්‍රමය මගින් වයිරස් හඳුනා ගැනුණු නියැදි සංඛ්‍යාව 876ක් විය.

  භාවිතය : නිතිපතා සිදු කෙරෙන වයිරස් හඳුනා ගැනීමේ කටයුතු සඳහා මෙම තාක්ෂණය භාවිත කිරීම සහ විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ ආයතනවල වයිරස්වලින් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ නිරෝධායන කටයුතු ප්‍රවර්ධනය කිරීම

- කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් අරමුදල් ප්‍රතිපාදිත විශේෂ ව්‍යාපෘති

  පැපොල් වගාවේ ව්‍යාධිජනකමය රෝග හඳුනා ගැනීම සහ ඒ සඳහා සංවේදී හඳුනා ගැනීම් තාක්ෂණික ක්‍රම බිහි කිරීම

වයිරස් වසංගත විද්‍යාව

- තාප ප්‍රතිකර්මය මගින් අන්නාසි හිටු මැරීමේ වයිරසය විනාශ කර දැමීම

  සෙ.60^0ක උෂ්ණත්වයකින් යුත් ජලයේ මිනි. 30ක් පුරා ගිල්වා තැබීම මෙම පරීක්ෂණය සඳහා යෝග්‍යතම උෂ්ණත්ව මට්ටමයි. මෙම ක්‍රමය යොදා ගනිමින් වයිරස්වලින් තොර පටක රෝපිත අන්නාසි පැළ 6,000ක් පමණ නිපදවන ලදී.

- තාප ප්‍රතිකර්මයට ලක් කරන ලද අන්නාසි ක්ෂේත්‍රයේ ඇගයීම

  වයිරස් හඳුනා ගැනීමේ ප්‍රතිඵලවලට අනුව සියලුම පැළ ක්ෂේත්‍රයේ රෝපණය කිරීමෙන් පසු වසර 1 1/2 ක් ගතවන තුරු වයිරස් ආසාදනයෙන් තොර විය. පැළ මෙම පරීක්ෂණ අවධිය තුළ මනාව වර්ධනය විණි.

  භාවිතය : ප්‍රතිකර්මයට ලක් කරන ලද අන්නාසි මොරෙයියන් ගොවි ක්ෂේත්‍ර තත්වය යටතේ අත්හදා බැලෙනු ඇත.

- වාණිජමය වගාව සඳහා මේරියන් ගෝල්ඩ් 3 නමැති අන්නාසි වගා ප්‍රභේදයට ඇති පිළිගැන්ම

  වර්ධන ලක්ෂණ සහ ගෙඩිවල තත්වය අනුව මෙම වගා ප්‍රභේදය දේශීය තත්වයන්ට සුදුසුය. මෙය වාණිජමය වගාව සඳහා සාර්ථකව යොදාගත හැකිය.

  භාවිතය : නව අන්නාසි ප්‍රභේදය ප්‍රචලිත කිරීම සහ එහි අනුවර්තන හැකියාව පරීක්ෂා කිරීම

- ඉඟුරු සමග මිශ්‍ර බෝග වගා කිරීම සහ කොහොඹ තෙල් (ජලය ලී. 1කට කොහොඹ තෙල් මි.ලී. 2, ටීපෝල් මි.ලී. 2) යෙදීම මගින්

පැපොල් වගාවේ මුදු පුල්ලි වයිරසය පාලනය කිරීම

අනෙකුත් ප්‍රතිකර්ම සමග සසඳා බැලූවිට ඉඟුරු සමග පැපොල් මිශ්‍ර බෝග වගාවෙන් ඇති වූයේ අඩු රෝගී පැළ සංඛ්‍යාවක් බව පෙනිණි. පාලකය සමග සසඳා බැලූ විට ඉඟුරු සමග මිශ්‍ර බෝග වගාවෙන් සහ කොහොඹ තෙල් ප්‍රතිකර්මය යෙදීමෙන් රෝග ලක්ෂණ මතුවීම ප්‍රමාද විය.

භාවිතය : පැපොල් මුදු පුල්ලි වයිරසයෙන් තම වගාවන් ආරක්ෂා කර ගැනීම සඳහා මෙම තාක්ෂණය ගොවීන්ට ලබාදෙනු ඇත.

- පැපොල් මුදු පුල්ලි වයිරසය පැතිරෙන විවිධ ක්‍රම සහ තෝරාගත් පැපොල් වගා ප්‍රභේදවල ඇති පයිටොප්ලාස්මා රෝග පිළිබඳව අධ්‍යයනය කිරීම

  යාන්ත්‍රික ක්‍රම සහ කුඩිත්තන් මගින් පැපොල් මුලු පුල්ලි වයිරසය එම්එස් 100, සින්ටා, රත්න, රෙඩ්ලේඩ් සහ දේශීය වගා ප්‍රභේදයට පැතිර යා හැකි බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. සාර්ථකව කඳ සිදුරු කර පැපොල්වලට වැඩිදුරටත් පයිටොප්ලාස්මා ආක්‍රමණය කළ හැකිය.

වෙනත් ව්‍යාධිජනකමය ජීවීන්

- පැළෑටි නිස්සාරක භාවිත කර තම්පලාවල සර්කොස්පෝරා පත්‍ර පුල්ලි රෝගය (*Cercospora* spp.) කළමනාකරණය කිරීම සඳහා පාලන පියවර සකස් කිරීම

  ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා තැටි පරීක්ෂාව (Plate test) යළි යළිත් සිදු කිරීම අවශ්‍යය. ක්ෂේත්‍ර පරීක්ෂණය ඉන්පසුව සිදු කෙරෙනු ඇත.

  භාවිතය : ගොවීන් විසින් කෘෂි රසායන ද්‍රව්‍ය නොයෙදූ කොළ එළවළු නිෂ්පාදනය කිරීම ප්‍රවර්ධනය

- පැළෑටි නිස්සාරක යොදා ගනිමින් මාළුමිරිස්වල ඇන්ත්‍රැක්නෝස (*Colletotrichum* spp.) පාලනය

  ඉඟුරු 20% සාන්ද්‍රණය කලෙටොට්‍රිකම් විශේෂය (*Colletotrichum* spp.) ඇතිවීම වඩාත් සාර්ථකව වළක්වන්නක් වශයෙන් යොදා ගත හැකිය. ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා තැටි පරීක්ෂාව (Plate test) යළි යළිත් සිදු කළ යුතුය. ක්ෂේත්‍ර ඇගයීම් කටයුතු පසුව සිදු කෙරෙනු ඇත.

  භාවිතය : ගොවීන්ගේ කෘෂි රසායන භාවිතය අඩු කිරීම ප්‍රවර්ධනය

- බහු වාර්ෂික බෝගවල පළිබෝධ හා රෝග පාලනය සඳහා ශාක විඳුම් උපකරණ පරීක්ෂා කර බැලීම

  භාවිතය : පළිබෝධ හා රෝග පාලනය සඳහා පාරිසරික වශයෙන් හිතකර ක්‍රම ප්‍රචලිත කිරීම

- නිතිපතා සිදුකරන රෝග නිශ්චය කිරීමේ වැඩසටහන

  රෝග වැළදි නියැදි 143කට අධික සංඛ්‍යාවක රෝග නිශ්චය කර ඇති අතර 2011 වසර සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණය පදනම් පදනම් කරගත් ඵලදායී විසඳුමක් ලබා දිණි. පරීක්ෂා කර බලන ලද නියැදි සංඛ්‍යාව 145කි.

  භාවිතය : රෝග හඳුනා ගැනීම සහ පාලන පියවර ලබාදීම

පටක රෝපණ අංශය

- ක්ෂුද්‍ර ප්‍රචාරණය මගින් වැඩිදියුණු කරන ලදි ඇන්තූරියම් වගා ප්‍රභේද (ලේඩ් ජේන්) බිහි කිරීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් (Protocol) සකස් කිරීම

  මෙම පර්යේෂණය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

- පැපොල් ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා සුදුසු ක්‍රමවේදයක් (Protocol) සකස් කිරීම

  මෙම පර්යේෂණය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

- 'ඉන්දු' නමැති ජම්නාරං ප්‍රභේදයේ අර්ධ ක්ෂුද්‍ර බද්ධ කිරීම සහ වයිරස් හා වයිරස් වැනි රෝග හඳුනා ගැනීම

  බද්ධ කරන ලද පැළ පරීක්ෂා කරන ලද වයිරස්වලින් තොර වූ බව සොයා ගැනිණි.

- විවිධ පටකවලින් (පත්‍ර, නටු, මොරෙයියන්) ලබාගත් පටක රෝපිත එම්ජී3 අන්නාසි පැළ ඒවායෙහි වර්ධනය සහ අස්වනු සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා ක්ෂේත්‍රයේ ඇගයීම

දෙයාකාරයේම පැළ මනා වර්ධනයක් පෙන්වූ අතර රෝපණය කිරීමෙන් මාස 9කට පසු කිසිදු ප්‍රතිකර්මයකින් තොරව මල් හට ගැනිණි. කෙසේ වුවද, ගෙඩිවල අසාමාන්‍යතාවන් කිසිත් දක්නට නොලැබිණි. මෙම අධ්‍යයනය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

- 'කෝලිකුට්ටු' කෙසෙල් ප්‍රභේදය ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් (Protocol) හඳුනා ගැනීම
  මෙම අධ්‍යයනය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

- පටක රෝපණයෙන් ප්‍රචාරය කරන ලද කෙසෙල් සහ අන්නාසි ක්ෂේත්‍රයේ ඇගයීම

  ක්ෂුද්‍ර ප්‍රචාරණය කරන ලද කෙසෙල් සහ අන්නාසිවල වර්ධන සහ අස්වනු පරාමිතියන් ඇගයීම සඳහා මෙම අධ්‍යයනය සිදු කෙරිණි. කැවෙන්ඩිෂ් ඩිවෝෆ්, ඇම්බන්, ආනමාලු, බිංකෙසෙල්, සීනි කෙසෙල්, පුලතිසි, අලු කෙසෙල්, කෝලිකුට්ටු සහ ඇඹුල් යන කෙසෙල් ප්‍රභේද මනා වර්ධනයක් හා අස්වනු ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළ අතර බනානා ස්ට්‍රික් වයිරස් ආක්‍රමණයක් නොවිණි.

- පටක රෝපණය මගින් ප්‍රචාරණය කරන ලද මරිෂස් අන්නාසි ප්‍රභේදයේ වර්ධනය සහ අස්වනු පරාමිතියන්
  - පර්යේෂණ කාල පරිච්ඡේදය තුළ පැළ මනා වර්ධනයක් පෙන්විය.
  - ක්ෂේත්‍රයේ රෝපණය කිරීමෙන් මාස 10කට පසු මල් හට ගැනීම ආරම්භ විය.
  - ගෙඩියක සාමාන්‍ය බර - කි.ග්‍රෑ. 1.78
  - රූපීය වෙනස්කම් කිසිවක් දක්නට නොලැබිණි.
    මෙම පර්යේෂණය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

- ක්ෂුද්‍ර ප්‍රචාරණය තුළින් කෙසෙල් සහ අන්නාසිවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

  ඇම්බන්, ඇඹුල්, සීනි කෙසෙල් යන ප්‍රභේදවල එක් එක් මව් ශාකයකින් පැළ 400 - 500ක් පමණ ලබා ගැනිණි. තවත් පැළ 500- 600ක් පමණ අඟවියරු සහ නේත්‍රාපලම් යන ප්‍රභේදවල එක් එක් මව් ශාකයෙන් ලබා ගැනිණි. කෙසේ වුවද, වෙනත් ප්‍රභේද සමග සසඳා බැලූවිට කෝලිකුට්ටුවල ගුණන අනුපාතය අඩුවිය. මරිෂස් අන්නාසි ප්‍රභේදයෙන් නිපදවන ලද සාමාන්‍ය පැළ ගණන 1,000ක් විය.

තාක්ෂණය ලබා දීම

නව තාක්ෂණයන් ප්‍රචාරණය කිරීම පිණිස ගොවීන්, ගොවි සංවිධාන, ගුරුවරුන්, තරුණ මධ්‍යස්ථානයේ සිසුන්, පාසැල් සිසුන් සහ උපාධි අපේක්ෂයින් සඳහා පුහුණු පංති 17ක් පවත්වන ලදී.

ගුවන්විදුලි වැඩසටහන් 3ක්, රූපවාහිනී වැඩසටහන් 1ක්, පුවත්පත් ලිපි 8ක්, පාසැල් ගෙවතු 3ක්, මුල්ලේගම ආදර්ශ ගෙවතු 01ක්, ක්ෂේත්‍ර චාරිකා 50ක්, බෝග සායන 03ක් වසර තුළ සිදු කෙරුණු කාර්යයන් අතර විය. එයට අමතරව, තම වගාවන් ආශ්‍රිත විවිධ ගැටලු සම්බන්ධයෙන් මෙම මධ්‍යස්ථානයට පැමිණි ගොවීන් / වගාකරුවන් 130දෙනෙකු සඳහා උපදෙස්ද ලබා දිණි.

නාගරික කෘෂිකර්මය පිළිබඳ ආදර්ශයක්ද ගෙවතු ආදර්ශයක්ද මෙම මධ්‍යස්ථානයේ නඩත්තු කරන ලදී.

ප්‍රදර්ශන

ජගත් පරිසර දිනය සැමරීම පිණිස පවත්වන ලද ඩිලීස් ෆෑෂන් එක්ස්පෝරියම් ප්‍රදර්ශනය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් මහරගමදී පවත්වන ලද ප්‍රදර්ශනය, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සම්මාන ප්‍රදානෝත්සවය සඳහා බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලද ප්‍රදර්ශනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් ආයතනය විසින් සංවිධානය කරන ලද නයිවල පැවති ප්‍රදර්ශනය

2012 වර්ෂය සඳහා සැලැස්ම

සාමාන්‍ය පරිදි සිදු කරන පැළෑටි වයිරස් විද්‍යා කටයුතු

- බනානා බන්චි ටොප් වයිරසය සඳහා පොලික්ලෝනල් ප්‍රතිමස්තු නිෂ්පාදනය
- මස්තු විද්‍යාත්මකව වයිරස් හඳුනා ගැනීමේ තාක්ෂණික ක්‍රම භාවිතයෙන් පැපොල් වගාවේ ඇති වයිරස් සහ වයිරස් වැනි රෝග හඳුනා ගැනීම
- වැලිගම පොල් වගාවේ පත්‍ර මැලවීමේ රෝගය හඳුනා ගැනීම සඳහා දේශීය වශයෙන් නිපදවන ලද ප්‍රතිමස්තු යොදා ගනිමින් පොල් හැර අනෙකුත් බෝගවල පයිටොප්ලාස්මා රෝග හඳුනා ගැනීම
- එලයිසා (ELISA) තාක්ෂණයන් මගින්, ආනයනය කරන ලද කුකුර්බිට් දෙමුහුම්

බීජවල ඇති බීජ මගින් පැතිරෙන වයිරස් රෝග හඳුනා ගැනීම

- මස්තූ විද්‍යාත්මකව වසිරස් හඳුනා ගැනීමේ තාක්ෂණික ක්‍රමය යොදූ ගනිමින් අර්ධ වශයෙන් ක්ෂුද්‍ර බද්ධ කරන ලද ජමනාරං පැළවලට සිට්‍රස් ට්‍රිස්ටෙසා වයිරසය සහ සිට්‍රස් ග්‍රීනින් බැක්ටීරියාව වැළඳී ඇත්දැයි පරීක්ෂා කර බැලීම
- ඇන්තූරියම් අංගමාරය සඳහා දේශීය වශයෙන් නිපදවන ලද පොලික්ලෝනල් ප්‍රතිමස්තූවල කාර්යක්ෂමතාව ඇගයීම
- ප්‍රේරිත සංස්ථානික ප්‍රතිරෝධිතාවක් සඳහා රයිසොබැක්ටීරියා යොදා ගැනීම
- නිතිපතා සිදු කෙරෙන වයිරස් හඳුනා ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සහ පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම

අණුක වයිරස් විද්‍යාව

- මස්තූ විද්‍යාත්මකව වයිරස් හඳුනාගැනීමේ ක්‍රම භාවිතා කරමින් පැඟිරිවල ට්‍රිස්ටෙසා වයිරසයට සහ කොළ පැහැ වීමේ බැක්ටීරියාවට අදාළව අර්ධ වශයෙන් ක්ෂුද්‍ර බද්ධ කරන ලද ජමනාරං පැළ පරීක්ෂා කර බැලීම
- අර්තාපල් වගා කරන ප්‍රදේශවල සමීක්ෂණයක් සිදු කිරීම මගින් පිවිවයි අර්තාපල් වයිරසය සඳහා වැඩිදියුණු කරන ලද ආර්ටී-පීසිආර් තාක්ෂණය යොදූ ගැනීම
- විශේෂිත ප්‍රයිමර් සමගින් ආර්ටී-පීසිආර් තාක්ෂණය යොදූ ගැනීම මගින් අර්තාපල් වගාවන්ට වැළඳෙන පත්‍ර රෝල්වීමේ වයිරසය සහ පීවීඑක්ස් වයිරසය හඳුනා ගැනීම
- ආර්ටී-පීසිආර් තාක්ෂණය සහ මල්ටිප්ලෙක්ස් ආර්ටී-පීසිආර් තාක්ෂණය යොදූ ගැනීමෙන් පැඟිරි වගා ප්‍රභේදවල ඇති වයිරස් සහ වයිරොයිඩ රෝග හඳුනා ගැනීම
- පැපොල් වගාවේ ව්‍යාධිජනක රෝග හඳුනා ගැනීම සහ සංවේදී හඳුනා ගැනීමේ තාක්ෂණික ක්‍රම ජනනනය කිරීම
- පීසිආර් තාක්ෂණය මගින් දැනටමත් හඳුනාගෙන ඇති වයිරස් පරීක්ෂා කිරීම සහ ජාන පිහිටා ඇති ආකාරය අනුව එම වයිරස් සනාථ කර ගැනීම
- පීසිආර් තාක්ෂණය පදනම් කර ගත් ක්‍රමය මගින් පොල් පත්‍ර මැලවීමේ රෝගයේ ධාරක පරාසය පිළිබඳව අධ්‍යයනය කිරීම
- පීසිආර් ක්‍රමවේදය මගින් සාමාන්‍ය වයිරස් හඳුනා ගැනීමේ කටයුතු සිදු කිරීම සහ පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම

වයිරස් වසංගත විද්‍යාව

- ගොවි ක්ෂේත්‍රවල (අරංගල, වැලිසර, හා වාද්දූව) උෂ්ණත්ව ප්‍රතිකාරයට ලක් කරන ලද පටක රෝපිත අන්නාසි පැළ ඇගයීම සහ අන්නාසි හිටු මැරීමේ වයිරස් රෝග පිළිබඳව නිරීක්ෂණය කිරීම
- රසායනික නොවන ක්‍රම යොදූ ගනිමින් වට්ටක්කාවල වයිරස් රෝග කළමනාකරණය කිරීම
- අලුතින් නිදහස් කරන ලද පැපොල් ප්‍රභේදය (එම්එස් 100) වයිරස්වලට ඔරොත්තු දෙන ආකාරය ක්ෂේත්‍රයේ අගයා බැලීම
- සුලභ වයිරස් රෝගවල (පැපොල් මුදු පුල්ලි වයිරසය, කෙසෙල් වඳ පීදීමේ වයිරසය, බණ්ඩක්කා නාරටි දැල් විචිත්‍ර වයිරසය, මඤ්ඤෙදක්කා විචිත්‍ර වයිරසය ආදිය) විභව වාහකයින් හඳුනා ගැනීම
    - නෙමටෝඩාවන් වයිරස් වාහකයින් වශයෙන් හඳුනා ගැනීම සඳහා විද්‍යාගාර ක්‍රමවේද
    - වගාකරන්නන් අතර වයිරස් (පැපොල් මුදු පුල්ලි වයිරසය, කෙසෙල් වඳ පීදීමේ වයිරසය. පිපිඤ්ඤවල වයිරස් රෝග, මඤ්ඤෙදක්කා විචිත්‍ර වයිරසය සහ අන්නාසි හිටු මැරීමේ වයිරසය) පාලන ක්‍රමෝපාය ප්‍රචාරණය

වෙනත් ව්‍යාධිජනකමය ජීවීන්

- සුදුසු රසායනික ද්‍රව්‍ය යොදූ ගනිමින් බහු වාර්ෂික බෝගවල පළිබෝධ හා රෝග පාලනය කිරීම පිණිස ශාක එන්නත් උපකරණ පරීක්ෂා කර බැලීම
- පැළෑටි නිස්සාරක යොදා ගනිමින් මාළු මිරිස්වල ඇන්ත්‍රැක්නෝස් පාලනය
- අනෙකුත් ව්‍යාධිජනකමය ජීවීන් හඳුනා ගැනීම සහ පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම

පටක රෝපණය

- විවිධ වර්ධන හෝමෝන වෙනස් කර යෙදීම මගින් කෝලිකුට්ටු කෙසෙල් ප්‍රභේදය ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් (Protocol) හඳුනා ගැනීම
- ක්ෂුද්‍ර ප්‍රචාරණය මගින් තෝරාගත් ඇන්තූරියම් වගා ප්‍රභේද (ලේඩි ජේන් සහ කිරිමැටිය වරණය) ගුණනය කිරීම
- පැපොල් ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා සුදුසු ක්‍රමවේදයක් (Protocol) සකස් කිරීම

- පටක රෝපිත කෙසෙල් පැළ (ඇම්බන්, කෝලිකුට්ටු, සීනි, නේත්‍රාපලම්, අඟවියරු, ඇඹුල්) 20,000ක් සහ අන්නාසි පැළ (එම්පී3 සහ මරිෂස්) 50,000ක් නිපදවීම
- 'ඉන්දු' නමැති ජනාරාං ප්‍රභේදය සඳහා අර්ධ ක්ෂුද්‍ර බද්ධ කිරීම සහ එහි ඇති වයිරස් සහ වයිරස් වැනි රෝග හඳුනා ගැනීම
- විවිධ පටකවලින් ලබාගත් (පත්‍ර සහ නටු මොරෙයියන්) පටක රෝපිත එම්පී3 අන්නාසි පැළ ඒවායෙහි වර්ධනය සහ අස්වනු ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා ක්ෂේත්‍රයේ ඇගයීම

- පටක රෝපිත කෙසෙල් සහ අන්නාසි පැළ ක්ෂේත්‍රයේදී (ගොවි ක්ෂේත්‍රවල) ඇගයීම සහ වයිරස් සඳහා පාලන පියවර අනුගමනය කිරීම

තාක්ෂණය ලබා දීම

- දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් (නිලධාරින්, ගොවි සංවිධාන සඳහා පුහුණුව, උපාධි අපේක්ෂකයින් / පාසැල් සිසුන් / වෙනත් සිසුන් පුහුණු කිරීම සහ ඔවුන්ගේ දැනුම යථාවත් කිරීම, ගොවි සායන, ක්ෂේත්‍ර විමර්ශනය, ගුවන් විදුලි වැඩසටහන්, රූපවාහිනී වැඩසටහන්, ක්ෂේත්‍ර අත්හඳ බැලීම්)
- වගාවන් හා ගෙවතු නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර චාරිකාවන්හි නියැළීම
- පුවත්පත්වල ලිපි ප්‍රකාශයට පත් කිරීම
- නාගරික කෘෂිකර්මය සහ ගෙවතු ආදර්ශ
- විශේෂ වැඩසටහන (ආදර්ශ ගම්මාන ආදර්ශනය) ප්‍රජා පාදක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- පැළෑටි වයිරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානයේ ඉඩමක (අක්. 1.5) එළවළු වගාව ප්‍රවර්ධනය
- ගුවන්විදුලි සහ රූපවාහිනී වැඩසටහන්
- ප්‍රදර්ශන ඒකකය නඩත්තු කිරීම
- දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩා සංකීර්ණයේ කෘෂිකර්ම වැඩසටහන

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරි/ සේවක සංඛ්‍යාව
ස්ථාන භාර පර්යේෂණ නිලධාරි	01
පර්යේෂණ නිලධාරි	05
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි	01
වැඩසටහන් සහකාර	05
පර්යේෂණ සහකාර	04
කෘෂිකර්ම උපදේශක	09
කළමනාකරණ සහකාර සේවය	03
ගබඩාකරු	01
රියදුරු	02
කම්කරු	03
කම්කරු (කොන්ත්‍රාත්)	11
මුරකරු	02
එකතුව	**47**

2.2.2 පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - හොරණ

පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයට පැවරී ඇතිවගකීම වන්නේ මෙරට පලතුරු බෝගවල ඵලදායිතාව සහ නිෂ්පාදනය ඉහළ නැංවීම පිණිස සුදුසු තාක්ෂණය ජනනය කිරීමයි. මෙම ආයතනය පහතරට තෙත් කලාපයේ වගා කරන බෝග කෙරෙහි විශේෂ අවධානය යොමු කරයි. විශේෂයෙන්ම වැඩි අස්වනු ගෙනදෙන උසස් තත්ත්වයේ පලතුරු බෝග ප්‍රභේද බිහි කිරීම, දියුණු බෝග කළමනාකරණ පිළිවෙත් සැකසීම, බෝග සංරක්ෂණය, පැළෑටි පෝෂණය, කාබනික පලතුරු වගාව සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය වැනි අදාළඅංශ කෙරෙහි වත්මන් පර්යේෂණ වැඩසටහන් තුළින් වැඩි අවධානය යොමු කෙරේ. මෙම මධ්‍යස්ථානය කලාපයේ ගොවීන්ගේ අවශ්‍යතා සපුරාලමින් පහතරට තෙත් කලාපීය තත්වයන්ට අනුවර්තනය වන ඵලවළු පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල ද නියැළෙයි.

ප්‍රගතිය

බෝග වැඩි දියුණු කිරීම

කටුඅනෝදා ජනකප්ලාස්ම ඇගයීම

කටුඅනෝදා ඉහළ පෝෂණීයඅගයක් සහිත ප්‍රචලිත පලතුරකි. පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ එක්රැස් කර ඇති වගා ප්‍රභේද අතර බලාපොරොත්තු තැබිය හැකි ලක්ෂණ හඳුනා ගත හැකි විය. උසස් ලක්ෂණ සහිත වගා ප්‍රභේදයක් තෝරා ගැනීමේ අරමුණ ඇතිව 2007 වර්ෂයේදී අධ්‍යයන ආරම්භ කරන ලදී.

2007-2011 අතර කාලයේදී කටු අනෝදා එකතුන් 10 ක් අගයා බලාපොරොත්තු තැබිය හැකි වගා ප්‍රභේද 4 ක් හඳුනා ගැනිණි. ඒ අතරින් උසස් තත්වයේ එමෙන්ම ප්‍රණීත හා යුෂ සපිරි මාංසල සහිත ඉහළ බ්‍රික්ස් අගයකින් යුතු වගා ප්‍රභේදයක් තෝරා ගන්නා ලදී. තෝරාගත් වගා ප්‍රභේදය වසර 7 ක් ගතවූ පසු ගසකට ගෙඩි 26 ක සාමාන්‍ය අස්වැන්නක් (කි.ග්‍රෑ 24.9) නිපදවීමට සමත් විය.

ආයවැය

වගු අංක 2.2.2.1 වාර්ෂික ආයවැය – 2011 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	930,000	1,428,179	154
පුනරාවර්තන	7,092,945	5,806,516	82
කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය	977,470	877,037	90
හොරණ ඝර්ම කලාපීය පලතුරු සහිත පෙව විවිධත්ව උද්‍යානයක් ස්ථාපිත කිරීම	6,621,000	6,232,380	94
ඉහළ අස්වනු ලබාදෙන උසස් තත්වයේ පැපොල් ප්‍රභේද බිහි කිරීම	400,000	153,053	38
පටක රෝපණය තුළින් වැදගත්කමක් සහිත බෝගවල උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය	4,200,000	3,551,004	85
දෙමුහුම් බීජ නිෂ්පාදනය (බණ්ඩක්කා)	325,000	250,588	77
අඹවල අස්වැන්න සහ තත්ත්වය වැඩිදියුණු කිරීම	1,000,000	827,820	83
පැඟිරි (දොඩම් සහ ජම්බුරා) ප්‍රභේද සහ විවිධ කළමනාකරණ පිළිවෙත් ඇගයීම	400,000	244,927	61
වාණිජමය වගාව සඳහා බලාපොරොත්තු තැබිය හැකි දූරියන් ප්‍රභේද බිහිකිරීම	300,000	195,813	65
වැඩි අස්වනු ගෙනදෙන. රෝගවලට සහ ලවණතාවට ඔරොත්තු දෙන කෙසෙල් එකතුන් ඇගයීම	100,000	89,483	89
එකතුව	**21,586,415**	**19,100,872**	**88**

''වැඩි අස්වනු ගෙනදෙන උසස් තත්ත්වයේ පැපොල් ප්‍රභේද බිහි කිරීමේ ව්‍යාපෘතිය'' මගින් අරමුදල් ප්‍රතිපාදිත වැඩසටහන

පැපොල් ප්‍රභේද බිහි කිරීම

හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පැපොල් අභිජනන වැඩසටහනේ ප්‍රධාන අරමුණ ඉහළ අස්වනු ගෙනදෙන උසස් තත්වයේ පැපොල් ප්‍රභේද බිහි කිරීමයි. සලකා බලන ලද ලක්ෂණ 2 කට වඩා පැවති ප්‍රභේද 8 ක් විවිධ ස්ථානවලින් එක්රැස් කර ගැනිණි. 2 වන පරම්පරාව වැඩිදියුණු කර ඉදිරියට ගෙන යාම පිණිස පැළ තෝරා ගැනීම සඳහා බීජවලින් ඇති වූ පැළ 150 ක මූලික ගහනයක් ස්ථාපිත කරන ලදී.

¶ජෛව විවිධත්ව පලතුරු උද්‍යාන ව්‍යාපෘතිය¶ මගින් අරමුදල් ප්‍රතිපාදිත වැඩසටහන්

පැපොල් දෙමුහුම් ඇගයීම

දේශීය පැපොල් ප්‍රභේද යොදා ගනිමින් නව නුමුහුම් 2 ක් (CP- 1 සහ CP - 13) බිහිකර එම නුමුහුම් සහ රත්න ප්‍රභේදය භාවිතා කර නව දෙමුහුම් 4 ක් බිහි කරන ලදී. මා පිය ආර 3 සහ පාලකය (රෙඩ් ලේඩි) සමග මෙම නව දෙමුහුම් 4 ප්‍රතිවලිත අත්හදා බැලීම් කර ඇගයීමට ලක් කෙරිණි. එකම මව්පියන් අන්‍යෝන්‍ය වශයෙන් මුහුන් කිරීමෙන් ලද දෙමුහුම් 2 බලාපොරොත්තු තැබිය හැකි බවට තෝරා ගැනිණි. ඒවායෙහි අස්වනු සහ තත්ත්වමය ලක්ෂණ මාපිය ආරවලට සහ පාලකයට වඩා උසස් මට්ටමක පැවතිණි. තෙත් කලාපීය තත්වය තුළ අස්වැන්න වසරකට ගසකට කි.ග්‍රෑ. 50 කට ආසන්න වූ අතර, ගෙඩියක සාමාන්‍ය බර කි.ග්‍රෑ. 1.5 ක් විය. මධ්‍යස්ථ වශයෙන් තද දීප්තිමත් රත් පැහැති මදයක් සහ ඉහළ බ්‍රික්ස් අගයක් (12 ට වැඩි) සහිත ගෙඩිවල පොත්ත ප්‍රවාහනය සඳහා ප්‍රමාණවත් ඝනකමකින් යුක්ත වේ. 2012 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි පාරිසරික කලාපවලදී දෙමුහුම්වල ක්‍රියාකාරීත්වය ඇගයීම සඳහා මාපිය ආරවල සහ දෙමුහුම්වල බීජ ගුණනය සිදු කෙරෙමින් පවතී.

පැෂන් පෘට් ප්‍රභේද බිහි කිරීම

නුමුහුම් පෙළ කිහිපයක් එක්කර බිහි කරන / සංයුක්ත පැෂන් පෘට් ප්‍රභේදයක් ජනනය කිරීම බීජ මඟින් පැෂන් පෘට් ප්‍රභේදයක් ප්‍රචාරණය කිරීමේ එක් ක්‍රමයකි. එය වාණිජමය ප්‍රභේදයකට වඩාත් අපේක්ෂා කරන ලක්ෂණ එක් කිරීමට උපකාරී වන අතර වැල් කැබලි මඟින් බෝවන වයිරස් චක්‍රය බිඳ දැමීමට ද ඉවහල් වේ. එමනිසා නුමුහුම් පෙළ කිහිපයක් එක්කර බිහිකරන පැෂන් පෘට් ප්‍රභේදයක් ජනනය කිරීම පිණිස පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පැෂන් පෘට් වැඩි දියුණු කිරීමේ වැඩසටහන වැඩි ප්‍රයත්නයක් දැරිය. 2011 වර්ෂයේදී එම ප්‍රභේදයට අදාළ පළමු පරම්පරාවේ බීජ නිෂ්පාදනය සම්පූර්ණ කරන ලද අතර තවදුරටත් වැඩිදියුණු කිරීම සහ ගුණන කටයුතු සඳහා දෙවන පරම්පරාව ස්ථාපිත කරන ලදී.

අඹ දෙමුහුම් ඇගයීම

දැනට වගා කරන ප්‍රභේදවලට අපේක්ෂිත ලක්ෂණ එක් කිරීමේ අරමුණින් 2007 වර්ෂයේදී අඹ දෙමුහුම් බිහි කිරීමට මුල පිරිණි. මෙහිදී කර්තකොළොම්බන්, වෙල්ලි කොළොම්බන්, විලාඩ් සහ නම්ඩොක්මෙයි මා පියන් වශයෙන් යොදා ගැනිණි. මෙම මා පියන්ගේ පුෂ්ප ජෛව විද්‍යාත්මකව කන්න 2 ක් තුළ අධ්‍යයනය කෙරිණි. මෙම මා පියන් යොදා ගනිමින් මුහුන් ද ජනනය කෙරිණි. දෙමුහුම් බීජ පැළ 7 ක් නොනැසී පවතින අතර දැනට එම පැළ ක්ෂේත්‍රයේ ඇගයීමට ලක් කෙරෙමින් පවති. මෙම බීජ පැළ වසර කිහිපයක් ක්ෂෙත්‍රයේ නඩත්තු කළ යුතු හෙයින් ඒවායෙහි දෙමුහුම් කිරීමේ හැකියාව තහවුරු කරගත යුතුය. එමනිසා මෙම බීජ පැළවල දෙමුහුම් කිරීමේ හැකියාව සම්බන්ධයෙන් DNA විශ්ලේෂණය පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය සමඟ සහයෝගයෙන් සිදු කෙරෙනු ඇත.

¶වාණිජමය වගාව සඳහා බලාපොරොත්තු තැබිය හැකි දූරියන් ප්‍රභේද බිහි කිරීමේ ව්‍යාපෘතිය¶ මඟින් අරමුදල් ප්‍රතිපාදිත වැඩසටහන්

දේශීය දූරියන් වර්ග එක්රැස් කිරීම, ඇගයීම සහ වරණය

දූරියන් ප්‍රභේද 68 අතරින් බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද 4 ක් වගාව සඳහා ගොවීන් වෙත නිකුත් කිරීම සඳහා තෝරා ගන්නා ලදී. බද්ධ පැළ ක්ෂේත්‍රයේ අත්හදා බැලීම සඳහා නිෂ්පාදනය කෙරෙමින් පවතී. ජනකප්ලාස්ම 3 ක් එක්රැස් කර පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ජාන බැංකුවේ ස්ථාපිත කරන ලද අතර ජනකප්ලාස්ම 2 ක් ස්ථාපිත කිරීමට නියමිතය. බලාපොරෙත්තු තැබිය හැකි දූරියන් ප්‍රභේද 6 ක ලක්ෂණීකරණය අබණ්ඩව සිදුකෙරේ.

වාණිජමය වගාව සඳහා දූරියන් F 1 දෙමුහුම් බිහි කිරීම

දූරියන් F 1පරම්පරාවේ පැළ 700 ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදී. F 1පැළ 150 ක් රෝපණය කිරීමට නියමිතය.

¶පැඟිරි ප්‍රභේද ඇගයීම සහ විවිධ කළමනාකරණ පිළිවෙත් පිළිබඳ ව්‍යාපෘතිය¶ විසින් අරමුදල් ප්‍රතිපාදිත වැඩසටහන්

දේශීය එකතූන් එක්රැස් කිරීම, ඇගයීම සහ වරණය

බලාපොරොත්තු නැඹිය හැකි ජමනාරං ප්‍රභේද 3 ක් තෝරා ගන්නා ලද අතර ඒවා විවිධ කෘෂි පාරිසරික කලාප තුළ ඇගයීමට ලක් කෙරෙමින් පවතී. ජමනාරං ප්‍රභේද 4 ක්, ජම්බෝල ප්‍රභේද 2 ක්, ග්‍රේප් පෑට් ප්‍රභේද 01 ක්, දෙහි ප්‍රභේද 04 ක් විවිධ ප්‍රදේශ වලින් එක්රැස් කරගෙන ක්ෂේත්‍ර ජාන බැංකුවල ස්ථාපිත කෙරිණි.

ඉහළ අස්වනු ගෙන දෙනදසස් තත්වයේ පැණි දොඩම් හා ජමනාරංවල F1 දෙමුහුම් බිහි කිරීම

දෙමුහුන් 150 ක් බිහි කරන ලද අතර F1පැළ 50 ක් ක්ෂේත්‍රයේ ඇගයෙමින් පවතී.

වැඩි අස්වනු ලබා දෙන උසස් තත්ත්වයේ පැඟිරි බීජ පැළවිකෘත බිහි කිරීම

විකෘත කරන ලද M1පරම්පරාව ක්ෂේත්‍රයේ ඇගයීමට ලක් කෙරෙමින් පවතී.

ජපානයෙන් හඳුන්වාදෙන ලද විදේශීය දොඩම් සහ ජමනාරං ප්‍රභේද ඇගයීම

මෙම ප්‍රභේද දිවයිනේ විවිධ කෘෂි පාරිසරික කලාප 8 ක ස්ථාපිත කරන ලද අතර ඒවායෙහි අනුවර්ත්‍යතාව සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා ඇගයීමට ලක් කෙරෙමින් පවතී. බලාපොරොත්තු නැඹිය හැකි ජමනාරං ප්‍රභේද 03 ක් විවිධ පාරිසරික කලාප තුළ අත්හදා බැලෙමින් තිබේ.

ඌන උපයෝජිත පලතුරු බෝග.වල ජනකප්ලාස්ම එක්රැස් කිරීම, සංරක්ෂණය සහ ලක්ෂණීකරණය

මෙම වැඩසටහන 2002 වර්ෂයේ අග භාගයේදී ආරම්භ කරන ලද අතර 2008 වර්ෂය අවසානය වන විට ක්ෂේත්‍ර ජාන බැංකුවේ හෙ. 3.73 ක ප්‍රදේශයක ජනකප්ලාස්ම එකතූන් 303 ක් ස්ථාපිත කර තිබිණි. මෙම ජාන බැංකුව තුළ බෙලි එකතූන් 24 ක්, පැඟිරි එකතූන් 47 ක්, ලාවුළු එකතූන් 05 ක්, ලොව් එකතූන් 04 ක්, වරකා එකතූන් 32 ක්, වෙරළු එකතූන් 17 ක්, උගුරුස්ස එකතූන් 22 ක්, ගොරක එකතූන් 33 ක්, ගඩුගුඩා එකතූන් 13 ක්, දූරියන් එකතූන් 35 ක්, සැපෝටා එකතූන් 17 ක්, අනෝදා එකතූන් 14 ක්, ජම්බු එකතූන් 26 ක්, ඡෑම් පේර එකතූන් 07 ක් ඇඹුල් පේර එකතූන් 07 ක් අන්තර්ගත විය. බලාපොරොත්තු නැඹිය හැකි ප්‍රභේදනිර්දේශ කිරීමට හඳුනා ගැනීම සඳහා ලක්ෂණීකරණය සහ ඇගයීම අඛණ්ඩව සිදුකෙරෙමින් පවතී.

සැපදිල්ලා (*Manilkara Zapota*)

2007 වර්ෂයේදී පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථාන ගොවිපළෙන් එක්රැස් කරගත් එකතූන් 17 ක් ඇතුළත් ජනකප්ලාස්ම උපයෝගී කර ගනිමින් මෙම පර්යේෂණය ආරම්භ කෙරිණි. සියලුම එකතූන්වල සහ මවු ශාකවල වර්ධන ක්‍රියාකාරිත්වය, අස්වැන්න, ගෙඩිවල තත්ත්වය, ගෙඩිවල ප්‍රමාණය සහ හැඩය ඇගයීමට ලක් කෙරිණි. එකතූන් 17 අතරින්, HoS 2, HoS 12, HoS 13, සාපේක්ෂව වඩා ඉහළ අස්වැන්නක් සහ ශක්තිමත් වර්ධනයක් පෙන්වයි. HoS 2හි ගෙඩිවල ප්‍රමාණය වඩා විශාල වූ අතර මුළු ද්‍රාව්‍ය ඝන ද්‍රව්‍ය ප්‍රමාණය (TSS) 21^0ක් විය. HoS 12 සහ HoS 13හි ගෙඩි මධ්‍යස්ථ ප්‍රමාණයෙන් යුතු වූ අතර මුළු ද්‍රාව්‍ය ඝන ද්‍රව්‍ය ප්‍රමාණය පිළිවෙළින් 20^0ක් සහ17^0ක් විය. ගෙඩි සියල්ල පැණි රසින් යුක්ත වූ අතර, ඒවායෙහි ආම්ලිකතාව අඩු විය. HoS 2, HoS 12,HoS 13 නිකුත් කිරීම සඳහා නම්කර ඇත.

වෙරළු*(Elaeocarpus serratus)*

ක්ෂේත්‍ර ජාන බැංකුව තුළ ගොවි ක්ෂේත්‍රවලින් එක්රැස් කර ගෙන කුඤ්ඤ බද්ධය මඟින් ප්‍රචාරණය කරන ලද එකතූන් 13 ක් වේ. 2003 - 2010 දක්වා කාලය තුළ ඒවායේ වර්ධන ක්‍රියාකාරිත්වය, අස්වැන්න, ගෙඩිවල තත්ත්වය සහ ගෙඩියේ ප්‍රමාණය අගයන ලදී. පැළ ස්ථාපිත කර වසර 03 ක් ගත වන විට ඵල දැරීමට පටන්ගත් අතර HoW 3,4,5,7,12 සහ 13 ඉහළ අස්වනු ලබා දීමට සමත් වූ අතර HoW 9 මධ්‍යස්ථ මට්ටමේ අස්වැන්නක් ද HoW 1 අඩු අස්වැන්නක් ද ලබාදුණි. HoW 13,7,9, සහ 5 පිළිගත හැකි මට්ටමේ තත්ත්වමය ලක්ෂණවලින් සමන්විත විය. HoW 13 හි මුළු ද්‍රාව්‍ය ඝන ද්‍රව්‍ය ප්‍රමාණය සාපේක්ෂව වැඩි අතර ආම්ලිකතාව වඩා අඩුය. එමෙන්ම ප්‍රණීත ස්වභාවය සහ ආම්ලිකතාව අතර මනා තුලනයක් පවතී. ගෙඩි ද මධ්‍යම ප්‍රමාණයෙන් යුතුය. HoW 7 මධ්‍යම ප්‍රමාණයේ ගෙඩිවලින් සමන්විත වූ අතර ඒවායෙහි මතුපිට එකම පැහැයෙන් යුක්ත වේ. මෙය ප්‍රණීත රසයෙන් තරමක් අඩු අතර මධ්‍යස්ථ මට්ටමේ ආම්ලිකතාවයෙන් යුතුය.HoW 9 මධ්‍යස්ථ ප්‍රමාණයේ ගෙඩිවලින් සමන්විතය. එය ආම්ලිකතාවෙන් අඩු අතර සාමාන්‍ය ප්‍රණීත රසයෙන් යුතුය. එමෙන්ම, අනෙකුත් එකතූන්වලට සාපේක්ෂව පිෂ්ටමය පල්පයකින් සමන්විතය. මතුපිට වඩාත් එකම පැහැයෙන් යුතු වන අතර ගෙඩි අනෙකුත්

ප්‍රභේදවලට වඩා තද පැහැතිය. HoW 5 සාපේක්ෂව වඩා විශාල, මතුපිට සමාන පැහැයෙන් හා වඩා හොඳ පෙනුමෙන් යුතු ගෙඩිවලින් සමන්විත වන අතර වඩා ඉහළ වෙළඳපොළ වටිනාකමක් හිමි බව පෙන්වයි. මධ්‍යස්ථ මට්ටමේ ඇඹුල් රසකින් ද පිෂ්ටමය ස්වභාවයකින් ද යුතු මෙහි මුළු ද්‍රාව්‍ය ඝන ද්‍රව්‍ය ප්‍රමාණය අඩුය.HoW 5,7,9 සහ 13 යන ප්‍රභේද නිකුත් කිරීම සඳහා නම් කර ඇත.

ගොරක ජනකප්ලාස්ම එක්රැස් කිරීම, සංරක්ෂණය, ලක්ෂණීකරණය සහ ඇගයීම

ගොරක ජනකප්ලාස්ම එකතූන් 32 ක් ක්ෂේත්‍ර ජාන බැංකුවේ ස්ථාපිත කර ඇත. බලාපොරොත්තු තැබිය හැකි එකතූන් 3 ක් (HoG - 3,8,11) හඳුනාගෙන නිල වශයෙන් නිකුත් කිරීම සඳහා ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුවට භාර දෙන ලදී.

දෙමුහුම් බීජ නිෂ්පාදන (බණ්ඩක්කා) ව්‍යාපෘතිය මඟින් අරමුදල් ප්‍රතිපාදිත වැඩසටහන්

පහතරට තෙත් කලාපයට සුදුසු, අපේක්ෂිත ලක්ෂණ සහිත දෙමුහුම් බණ්ඩක්කා ප්‍රභේද බිහි කිරීම

නුමුහුම් ආර 14 ක් සහ ඒවායේ මුහුන් සංයෝග 91 ක් යොදා ගනිමින් සිදුකරන ලද අධ්‍යයනවලින් දෙමුහුම් ප්‍රභේද 4 ක් තෝරා ගැනිණි. මෙම මුහුන් සංයෝග ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් තුළ අගයන ලදී. දෙමුහුම් ප්‍රභේද 3 ක් (HB 100, HB 95, සහ HB 93) ඒවායෙහි තෙත් කලාපයට සහ අතරමැදි කලාපයට අනුවර්තනය වීමේ හැකියාව සොයා බැලීම සඳහා අත්හදා බලන ලදී. අස්වැන්න, ගුණාත්මක බව සහ පත්‍ර නාරටි විචිත්‍ර වෛරසය සඳහා ඔරොත්තුදෙන ආකාරය මත පදනම්ව HB 100 සහ HB 95 යන ප්‍රභේද වැඩිදුරටත් ඇගයීම සඳහා තෝරා ගන්නා ලදී.

අමුමිරිස් ප්‍රභේද වැඩිදියුණුකර ඒවායෙහි පවිත්‍රතාව පවත්වා ගෙන යාම

ගොවීන්ගේ වරණයන් වන වැරණියා අමු මිරිස් වර්ග 10 ක් අත්හදා බලා එයින් සැර රස සහ බාහිර ලක්ෂණ මත පදනම්ව වර්ග 4 ක් තෝරා ගන්නා ලදී. මෙම වර්ග සංශුද්ධ කර අස්වැන්න සම්බන්ධයෙන් අගයන ලදී. වැරණියා කොළ පැහැති අමුමිරිස් වර්ගය තෝරාගෙන එහි බීජ නිෂ්පාදනය ආරම්භ කරන ලදී. මෙය 2011- 2012 මහ කන්නයේ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් සඳහා ඇතුළත් කෙරිණි.

කෙසෙල් ජනකප්ලාස්ම එක්රැස් කිරීම, ඇගයීම සහ වරණය මඟින් ඉහළ අස්වනු ලබාදෙන උසස් තත්ත්වයේ කෙසෙල් ප්‍රභේද බිහි කිරීම

ඇම්බන් (11), ඇඹුල් (5), රත් කෙසෙල් (5), සීනි කෙසෙල් (7) සහ කෝලිකුට්ටු (5) යන කෙසෙල් එකතූන් වැඩිදුරටත් ඇගයීම සඳහා පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ස්ථාපිත කරන ලදී. සීනි කෙසෙල් (1 කාණ්ඩය), පූවාළු, සුවඳැල්, කෝලිකුට්ටු (2 කාණ්ඩය) සහ ඇම්බන්, බිංකෙසෙල් (3 කාණ්ඩය) පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් 03 ක් ස්ථාපිත කර ඇගයීම් කටයුතු සිදු කරමින් පවතී.

අඹ අස්වැන්න සහ තත්ත්වය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය විසින් අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘතිය

අඹ අස්වැන්න සහ තත්ත්වය වැඩිදියුණු කිරීම

බලාපොරෙත්තු තැබිය හැකි අඹ එකතූන් එක්රැස් කිරීම හා වරණය 2011 වර්ෂයේදී හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී ආරම්භ කරන ලදී. ගොවි ක්ෂේත්‍රවලින් එක්රැස් කර ගන්නා ලද මව් පැළ 25 ක් අතරින් බලාපොරොත්තු තැබිය හැකි එකතූන් 4 ක් හඳුනා ගන්නා ලදී. රජයේ ගොවිපළෙන් බලාපොරොත්තු තැබිය හැකි වගා ප්‍රභේද 4 ක් තෝරා ගැනිණි. දැනට ඇති ශාක කප්පාදු කර පොහොර යොදා සිතියම් ගත කෙරිණි. අදාළ ඇගයීම් කටයුතු සිදු කෙරෙමින් පවතී.

බෝග සංරක්ෂණය

පැපොල්වලට වැළඳෙන පසු අස්වනු දිලීර රෝගය වන ඇන්ත්‍රැක්නෝස් පාලනය

පැපොල්වල ඇන්ත්‍රැක්ස්නෝස් රෝගයට කාරක වන ජීවියා කලෙටොට්‍රිකම් ග්ලොසියස්පොරියෝඩිස් (*Colletotrichum gloeosporioides*) දිලීරය බව හඳුනා ගැනිණි. දිලීරවල මයිසීල වර්ධනය වළක්වන ආකාරය පරීක්ෂා කර බැලීම සඳහා දිලීරනාශක සහ පැළෑටි නිස්සාරක රැසක් අත්හදා බලන ලදී. ක්ලෝරොතැලොනිල් (ඩැකොනිල්) පැපොල්වල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය කිරීම සඳහා වඩාත් ඵලදායි දිලීරනාශකය වශයෙන් තෝරා ගැනිණි. කාබෙන්ඩසිම් (බැවිස්ටින්) සහ මැන්කොසෙබ් වැනි අනෙකුත් දිලීරනාශක රෝගය පාලනය කිරීමේදී එතරම් ඵලදායි නොවිණි. කොපර් දිලීරනාශක දිලීර වර්ධනය වළක්වාලීමේදී ඵලදායි වූ නමුත් පැපොල් ගෙඩියේ පොත්ත ප්‍රදාහය වීම වැනි ශාකයට විෂ වීමක් ඇති කළ බවක් පෙනිණි.

නලස්ටව දිලීර වර්ධනය හොඳින්ම වළක්වාලන්න තෝරා ගැනීම සඳහා පැළෑටි නිස්සාරක රැසක් අගයන ලදී. පැපොල්වල ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය කිරීම සඳහා කුරුඳු තෙල් සහ කුරුඳු පත්‍ර නිස්සාරක එලදායී ශාක නිස්සාරක වශයෙන් තෝරා ගන්නා ලදී.

දිලීරනාශක මඟින් පැෂන් පෘට්වල ෆියුසාරියම් මැලවීමේ රෝගය පාලනය කිරීම

පැෂන් පෘට් වැල් ප්‍රතිමාරයට ලක්වීම පලතුරු උයන්වලට ඇති පොදු ගැටළුවකි. එම දිලීරයේ කාරක ජීවියා කඳ පාමුල කුණුවීම සහ මුල් කුණුවීම ඇති කරන ෆ්‍යුසාරියම් විශේෂයි (*Fusarium* spp). දිලීර මයිසීලියම් වර්ධනය සාර්ථකව අඩුකල හැකි එලදායී දිලීරනාශක හඳුනා ගැනීම සඳහා දිලීරනාශක රැසක් අගයන ලදී. දිලීරනාශක 11 ක් අතරින් බැවිස්ටින්, ඩැකොනිල්, ෆෝලිකර්, ටොප්සින් සහ හොමායි යන දිලීරනාශක රෝගය සාර්ථකව පාලනය කළ බව පෙන්වීය. බුලට්, ඉරේසර්, කොපල් දිලීරනාශක, රිඩොමිල්, මැන්කොසෙබ් හා සල්ෆර් දිලීරනාශක දිලීර වර්ධනය වළක්වා ගැනීමේදී එතරම් සාර්ථකත්වයක් නොපෙන්වීය.

පැඟිරි ප්‍රතිමාර රෝගය පාලනය කිරීම සඳහා කළමනාකරණ පිළිවෙත් මාලාවක්

ප්‍රතිමාර රෝගයේ කාරක ජීවියා බොට්රියෝ ඩිප්ලොයිඩියා *(Botryodiploidia theobromae)* වශයෙන් හඳුනා ගැනිණි. මෙම රෝගය පාලනය කිරීම උදෙසා දිලීරනාශක 11ක් ඇගයීමට ලක් කරන ලදී. මෙම දිලීරනාශක 11 අතරින්, බැවිස්ටින්, ඩැකොනිල්, මැන්කොසෙබ්, බුලට්, ෆෝලිකර්, ටොප්සින්, රිඩොමිල් සහ හොමායි යන 8 රෝගය අඩු කර ගැනීම සඳහා යොදා ගත හැකිය. කොපර් දිලීරනාශක, සල්ෆර් දිලීරනාශක සහ ඉරේසර් රෝගය පාලනය කිරීම සඳහා එතරම් සාර්ථක නොවීය.

ඌන උපයෝජිත පලතුරු බෝගවල රෝග කාරක ජීවීන් හඳුනා ගැනීම

පහත දැක්වෙන රෝග සහ ඒවායේ කාරක ජීවීන් හඳුනා ගැනිණි. ඒ පේර ගෙඩි කුණුවීම *(Cylindrocladium scoparium)*හා පැෂන් පෘට් ගෙඩි කුණු වීම සිදු කරන කාරක ජීවීන් 3 දෙනෙක් *(Colletotrichum gloeosporioides, Botrydiploidia theobromae සහ Fusarium solani)*සහ වෙරළුවල ඇන්ත්‍රැක්නෝස් රෝගය ඇති කරන ජීවියා *(Colletotrichcum gloeosporioides)*වශයෙනි.

මූල ගැටිති නෙමටෝඩාවන්ට ඔරොත්තු දෙන විවිධ පේර ප්‍රභේදවල ක්‍රියාකාරිත්වය ඇගයීම

මූල ගැටිති නෙමටෝඩා ආසාදනය පසුගිය වසරවල පේර වගාවට බලපෑ වඩාත්ම බරපතල ගැටළුව විය. එමනිසා, විවිධ පේර ප්‍රභේද එම ගැටළුවට ඔරොත්තු දෙන මට්ටම් ඇගයීම පිණිස අධ්‍යයනයක් සිදු කෙරිණි. එහිදී හොරණ රෝසි (HRo), ලංකා ජයන්ට් (LG), හොරණ ස්වීට් (HS), රෙඩ් ජයන්ට් (RG), හොරණ වයිට් (HW), හොරණ රෙඩ් (HR), පුබුදු (Pu), කාන්ති (Ka) සහ සිෆිඩා (Sa) යන ප්‍රභේද 9 ට මෙලොයිඩොගයිනී විශේෂයේ (*Meloidogyne* sp.) මූල ගැටිති නෙමටෝඩාවන් ආක්‍රමණය කර පත්‍ර රෝග ලක්ෂණ පෙන්වන කාල සීමාව සහ මූල ගඩු ඇතිවීමේ ප්‍රතිශතය තක්සේරු කර ගැනිණි.

සියලුම ප්‍රභේද මූල ගැටිති නෙමටෝඩාවන්ට ගොඃරු වූ අතර කාන්ති ප්‍රභේදය ඌනතා ලක්ෂණ පිළිබිඹු කිරීමට වැඩි කලක් (සති 15 ක්) ගන්නා ලදී. පුබුදු ප්‍රභේදයට ඒ සඳහා කෙටි කාල සීමාවක් (සති 8 - 10) ගතවිය. ලංකා ජයන්ට්, හොරණ වයිට් සහ කාන්ති යන ප්‍රභේද අඩු ගඩු ඝනත්වයක් ද (60%) සිෆිඩා, රෙඩ් ජයන්ට් සහ හොරණ ස්වීට් යන ප්‍රභේද වැඩි ගඩු ඝනත්වයක් ද පෙන්නුම් කළේය.

අන්නාසි වගාවේ පිටි මකුණන් පාලනය සඳහා නිස්සාරක භාවිතය ඇගයීම

අන්නාසි ප්‍රණීත පලතුරක් හෙයින් ඉහළ ඉල්ලුමකින් යුතුය. කෙසේ වුවද, පිටි මකුණු ආසාදනයන් අලෙවි කළ හැකි අන්නාසි අස්වැන්න කෙරෙහි අහිතකර අයුරින් බලපායි. එනිසා පිටි මකුණන් පාලනය සඳහා විෂ රහිත ශාක නිස්සාරක අත්හදා බලන ලදී. අනෝදා මේරු පත්‍ර හා නොමේරු පත්‍ර, පැඟිරි පත්‍ර හා පැඟිරි මුල්වල ජල නිස්සාරක සහ ඊතයිල් ඇල්කොහොල් (EtOH) නිස්සාරක විද්‍යාගාර තත්වය යටතේ පිටි මකුණන්ට යොදා මර්ත්‍යතාව තක්සේරු කරන ලදී.

පැඟිරි පත්‍ර ජල නිස්සාරකය ඉහළම මර්ත්‍යතා අනුපාතය (47.3%) පෙන් වූ අතර පැඟිරි පත්‍ර (EtOH) නිස්සාරකයේ මර්ත්‍යතා අනුපාතය එයට වඩා තරමක් අඩු විය. පැඟිරි පත්‍රවල සහ අනෝදා නොමේරූ පත්‍රවල ඊතයිල් ඇල්කොහොල් (EtOH) නිස්සාරක, ඒවායෙහි ජල නිස්සාරකවල මර්ත්‍යතා අනුපාතයට සාපේක්ෂව අඩු අනුපාතයක් පෙන්නුම් කළේය. එහෙත් පැඟිරි මුල් සහ අනෝදා මේරූ පත්‍ර ජල නිස්සාරකවලට වඩා ඊතයිල් ඇල්කොහොල් (EtOH) නිස්සාරක සාපේක්ෂව ඉහළ මර්ත්‍යතා අනුපාතයක් ලබා දෙමින් වෙනස් අයුරින් ක්‍රියාකාරී විය.

පාංශු පෝෂක කළමනාකරණය

පැෂන් පෘට්වල කඳ ඉදිමීම

කඳ ඉදිමීම, බීජ පැළ සහ පළිබෝධ සිටින වැල් පැලි යන ආකාරය මඟින් ලක්ෂණීකරණය කෙරේ. මෙම රෝගය හේතුවෙන් හානි සිදු වූ කොටසේ ඉහළ ප්‍රදේශයේ කඳ දුර්වල වීම සහ මිය යාම නිරීක්ෂණය කිරීමට හැකි විණි. ආසාදිත ක්ෂේත්‍රවල පසෙහි කැල්සියම් හා පීඑච් අගය අඩු බව සොයා ගැනිණි.

සමහර ස්ථානවල ඇති පසෙහි ලක්ෂණ මත පදනම්ව කැල්සියම් ඉහළ ප්‍රමාණයන්ගෙන් යෙදීම හෝ බොරැක්ස් පත්‍රවලට ඉසීම මඟින් කඳ ඉදිමීම ඇති වීම ප්‍රමාද විය. මෙම රෝගය ඇති වීම අවම කිරීම සඳහා මෙම පෝෂක යෙදීමට සුදුසු ක්‍රම තවදුරටත් අත්හදා බැලෙමින් පවතී.

පේර සහ පැෂන් පෘට් සඳහා කොම්පෝස්ට් සහ රසායනික පොහොර යෙදූ ගොවි ආදර්ශන

පූර්ව පර්යේෂණ තුළින් තෝරාගත් කොම්පෝස්ට් සහ රසායනික පොහොර සංයෝජන කිහිපයක් වෙන් වෙන්ව යොදමින් ස්ථාන දෙකකදී පේර සහ පැෂන් පෘට් ක්ෂේත්‍ර නඩත්තු කරන ලදී. පැෂන් පෘට් සඳහා වසරකට වැලකට කොම්පෝස්ට් කි.ග්‍රෑ. 10 බැගින් ද පේර සඳහා ඵල හට ගැනුණු පළමු වසරේදී වසරකට පැළයකට කොම්පෝස්ට් කි.ග්‍රෑ. 20 බැගින් ද රසායනික පොහොර සමග යෙදීමෙන් අස්වැන්න කෙරෙහි අහිතකර බලපෑමක් ඇති නොවී නිර්දේශිත රසායනික පොහොර ප්‍රමාණය 25% කින් අඩු කර ගත හැකි බව මනාව ආදර්ශනය කෙරිණි.

අන්නාසි, පැෂන් පෘට්, මැංගුස් සහ පේරවල අස්වැන්න සහ තත්ත්වය කෙරෙහි රසායනික පොහොර සමඟ කොම්පෝස්ට් එක්ව යෙදීම මඟින් ඇති වන බලපෑම

වසරකට හෙ. 01 කට ටො. 10 කින් කොම්පෝස්ට් යෙදූ විට රසායනික පොහොර භාවිතය 25% -50% අතර ප්‍රමාණයකින් අඩුකර ගත හැකිවිය.

පණු පොහොර සකස් කිරීම සහ පණුවන් ඇති කිරීම සඳහා යොදා ගන්නා විවිධ කාබනික ද්‍රව්‍ය මඟින් ඇති කරන බලපෑම පරීක්ෂා කිරීම

ගොම සමඟ 1:1 අනුපාතයෙන් තෘණ, ග්ලිරිසීඩියා සහ කෙසෙල් කඳන් භාවිත කර ගොඩ ක්‍රමය මඟින් නිපදවන පණු පොහොර තුළින් පෙනී ගියේ ග්ලිරිසීඩියා යෙදූ අවසන් පණු පොහොරවල 1.4% ක් වශයෙන් නයිට්‍රජන් ප්‍රමාණය උපරිමව ද තෘණ හා කෙසෙල් කඳන් උපයෝගී කර සෑ¥ පණු පොහොරවල නයිට්‍රජන් ප්‍රතිශතය එයට වඩා අඩු මට්ටමකින් ද පැවති බවයි. ටැංකි ක්‍රමය මඟින් නිපදවන පණු පොහොරවල පැවති නයිට්‍රජන් ප්‍රමාණය ගොඩ ක්‍රමයේ පැවති ප්‍රමාණයට සමාන විය. පණු පොහොර සැකසීමේ ක්‍රියාවලියේදී උපයෝගී කර ගත් එම ද්‍රව්‍යවල උස 30% -50% අතර ප්‍රමාණයකින් අඩු විය.

පැෂන් පෘට් සඳහා කාබනික පොහොර පැකේජයක් සකස් කිරීම

නිර්දේශිත රසායනික පොහොර යෙදීම සමඟ සැසඳීමේදී හෙ. 01 කට ටො. 20 බැගින් පණු පොහොර හෝ හෙ. 01 කට ටො. 20 බැගින් කුකුල් පොහොර කොම්පෝස්ට් වසරකට තෙවරක් යෙදීම කාබනික පැෂන් පෘට් නිෂ්පාදනය සඳහා සුදුසු බව සොයා ගන්නා ලදී.

ගම්පහ දිස්ත්‍රික්කයේ රඹුටන් /අන්නාසි වගා ක්‍රම සඳහා පාංශු කළමනාකරණ තොරතුරු ක්‍රමයක් නිර්මාණය කිරීම

රඹුටන් වගා කරන ගොවීන් 64 දෙනෙකු යොදා ගනිමින් සමාජ ආර්ථික සමීක්ෂණයක් පවත්වන ලදී. එහි ප්‍රතිඵල මඟින් අනාවරණය වූයේ නිවැරදි ශස්‍ය විද්‍යාත්මක පිළිවෙත් සම්බන්ධයෙන් ඔවුන්ට ඇති දැනුම අල්ප බවයි. රඹුටන් වතු 15 ක් තුළ සිදුකරන ලද පසේ සරු බව පිළිබඳසමීක්ෂණයෙන් අනාවරණය වූයේ පසෙහි ෆොස්ෆරස් එක්රැස් වීමේ ප්‍රවනතාවක් පවතින බවය. පීඑච්අගය, විද්‍යුත් සන්නයනතාව, ප්‍රයෝජ්‍ය ෆොස්ෆරස් ප්‍රමාණය, නුවමාරු කරගත හැකි පොටෑසියම් සහ කැල්සියම් ප්‍රමාණය පිළිබඳ ස්ථානීය පාංශු සිතියම් සකස් කරන ලදී.

කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය පිළිබඳ ව්‍යාප්තිය මඟින් අරමුදල් ප්‍රතිපාදිත වැඩසටහන

උසස් තත්ත්වයේ කාබනික පොහොර නිෂ්පාදනය

2009 වසරේ හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී උසස් තත්ත්වයේ කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන ආරම්භ කරන ලද අතර එමඟින් ක්ෂුද්‍ර ජීවීන් සහිත කොම්පෝස්ට් පැකට් 3,486 ක් නිපදවා ගොවීන් අතර බෙදා හරින ලදී.

බෝග කළමනාකරණය

පේරවල මූලගැටිති නෙමටෝඩාආසාදනයට ප්‍රතිරෝධී/ඔරොත්තු දෙන ග්‍රාහක ඇගයීම

මෑත කාලයේ, පේර ශ්‍රී ලංකාව තුළ ප්‍රමුඛ පෙළේ වාණිජමය පලතුරු බෝගයක් බවට පත්වී ඇත. මෙලෙයිඩගයිනි විශේෂය (*Meloidogyne* spp.) වශයෙන් හඳුනා ගන්නා ලද මූල ගැටිති නෙමටෝඩාවන් උග්‍ර ලෙස ආසාදනය වීම පේර වගාවට දැඩි තර්ජනයක් බව වාර්තා විණි.

වායව අතු බැඳීම, බීජ පැළ, පැච් අංකුර බද්ධය සහ ආරුක්කු බද්ධය වැනි විවිධ ක්‍රම මගින් ප්‍රචාරණය කරන ලද පේර පැළ අතර නෙමටෝඩා හානියේ වෙනස්කම් පැවතිණි. අතු බඳින ලද පැළවලට වඩා රිකිලි බද්ධ කරන ලද සහ ආරුක්කු බද්ධ කරන ලද පැළ නොනැසී පවතින ප්‍රමාණය ඉහළ බව නිරීක්ෂණය කිරීමට ලැබිණි. බද්ධ සහ ආරුක්කු බද්ධ පැළවල මනාව වර්ධනය වූ ගැඹුරු මුදුන් මුල් පද්ධතියක් පැවතීම මෙයට හේතුවයි. එමෙන්ම, ග්‍රාහකයක් වශයෙන් යොදා ගැනීම සඳහා නෙමටෝඩාවන්ට ප්‍රතිරෝධී හෝ ඔරොත්තු දෙන ලක්ෂණාවලින් සමන්විත වන පේර වගා ප්‍රභේදයක් හඳුනා ගැනීම වැදගත් වේ. විවිධ පේර එකතූන් 74 ක බීජ එක්රැස් කර බීජ පැළ ඇතිකර ගැනිණි. එම බීජ පැළවලට කෘත්‍රිමව නෙමටෝඩාවන් ආක්‍රාමණය කරනු ඇත'

මැංගුස්වල වර්ධන සහ අස්වනු ක්‍රියාකාරීත්වයන් සඳහා ද්විත්ව ග්‍රාහක බද්ධයන් ඇගයීම

බෝගයේ වර්ධක වර්ධන වේගය සෙමෙන් සිදුවීමත් වසර 8 - 10 ක තරම් දිගු, ඵල හට ගැනීමක් සිu නොවන කාල පරිච්ඡේදයක් පැවතීමත් නිසා මැංගුස් බෝගය ව්‍යාප්ත වී ඇත්තේ මඳ වශයෙනි. එහෙයින් මන්දගාමී වර්ධන වේගය මඟ හරවා ගැනීමේ සහ එමගින් බෝගයේ ඵලදායිතාව ඉහළ නංවා ගැනීමේ අරමුණෙන් 2004 වර්ෂයේ දී අධ්‍යයන ආරම්භ කෙරිණි. ස්ථාපිත කර 7 වැනි වර්ෂයේදී පැළ බද්ධ කිරීමෙන් පසු ක්‍රියාකාරීත්වය ඇගයීමේදී ද්විත්ව ග්‍රාහක බද්ධ, බද්ධයකට ගෙඩි 43 ක් වශයෙන් අස්වනු ලබාදිණි. බද්ධවලට පොදු ලක්ෂණයක් වන නැවුණු වර්ධක වර්ධන ස්වරූපයක් මෙම බද්ධවල නිරීක්ෂණය කිරීමට ලැබිණි. පොදුවේ ගත්කල, අතු පෙන්නුම් කරනුයේ ඒවාට අවේණික තිරස් විහිදුම් රටාවකි. මෙම අතුවලින් අනුප රිකිල් ඉවත් කර ගැනීමෙන් බද්ධ, තිරස්ව නැවුණු වර්ධන ස්වරූපයක් පෙන්නුම් කරමින් තිරස් වර්ධනයකට යොමු වේ. මූලික වර්ධන අදියරවලදී, කෝටු 2 ක් ආධාර කරගෙන කරුවක් වැනි ව්‍යුහයක් සපයා වසර 3-4 ක් ගතවන තුරු පවත්වාගෙන යෑමෙන් ද්විත්ව ග්‍රාහක බද්ධ තිරස්ව වර්ධනය වීම පහසුවෙන් වළක්වා ගත හැකිය. ඉන්පසු, බද්ධ ස්වභාවික අයුරින් වර්ධනයවීමට නැඹුරු වේ.**වැඩි අස්වනු ලබාදීම, රෝග හා ලවණතාවට ඔරොත්තු දීමසම්බන්ධයෙන් කෙසෙල් එකතූන් ඇගයීමේ ව්‍යාපෘතිය මගින් අරමුදල් ප්‍රතිපාදිත වැඩසටහන**

මේ යටතේ, ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් ස්ථාපිත කර දත්ත වාර්තා ගත කෙරෙමින් පවතී.

රඹුටන්වල වර්ධනය හා අස්වැන්න කෙරෙහි පැළඝනත්වය සහ කප්පාදු කරන උස බලපාන ආකාරය.

එකිනෙකට වෙනස් පැළඝනත්ව 3 ක් (මී. 10 x 10 - නිර්දේශය, මී. 10 x 7.5 හාමී. 10 x 5.0) සහ අතු ඇති වූ දෙයාකාර වූ උසක් (සෙ.මී 90 - නිර්දේශය සහ සෙ.මී 30) අනුව ¶මල්වාන ස්පෙෂල්' ප්‍රභේදයේ පැළ 36 ක් ඇගයීමට ලක් කෙරිණි. මෙතෙක් පැළ උස, අතු වියන විහිදී ඇති ආකාරය සහ අස්වැන්න අතර සැලකිය යුතු වෙනසක් දක්නට ලැබී නොමැත. ඇගයීම අඛණ්ඩව සිu කෙරේ.

ඩ්‍රැගන් පෘථි වැල්වල වර්ධනය, අස්වැන්න සහ තත්ත්වය කෙරෙහි වැල් කැබලිවල ප්‍රමාණය සහ පුහුණු කණුවකට ඇති වැල් කැබලි සංඛ්‍යාව මගින් ඇති කරන බලපෑම

අඟල් 12-15 ප්‍රමාණයේ වැල් කැබලිවල වඩා වැඩි වර්ධනයක් (වැලෙහි උසෙහි) නිරීක්ෂණය කිරීමට ලැබිණි. කණුවකට අඟල් 12-15 ප්‍රමාණයේ කැබලි 4 ක් පැවති විට වැඩිම මූලික සහ ද්විතියික අතු සංඛ්‍යාවක් දක්නට ලැබුණු අතර අඩුම අතු සංඛ්‍යාව වාර්තා වූයේ කණුවකට අඟල් 3-4 දිගින් යුතු වැල් කැබලි 1 ක් පැවති විටය (ප්‍රතිකර්ම අංක 1). ප්‍රතිකර්ම කිහිපයක් පමණක් ඵල ලබාදුණි. මේ සම්බන්ධ නිගමනයකට පැමිණීමට පෙර මෙම පැළ මුළුමනින්ම ඵල දරන අවධිය දක්වා පර්යේෂණය අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

ඵලබටු පිළිබඳ බෝග කළමනාකරණ අධ්‍යයන

පැල තවානෙහි අඩු බීජ ප්‍රරෝහණයක් නිරීක්ෂණය කිරීමට ලැබුණු හෙයින් අලුත් බීජ, සති 2ක් වයසැති බීජ සහ මාසයක් ගත වූ පැරණි බීජ යොදා ගනිමින් හරිතාගාර පරීක්ෂණයක් සිදු කෙරිණි. බීජ සුප්තතාවක් නිරීක්ෂණය කිරීමට නොලැබුණු අතර ඉහළ උෂ්ණත්වයක් යටතේ තවාන් බඳුන් තැබූ විට (පාර ජම්බුල කිරණ පිළියම් යෙදූ ගෙජ් 1000 පොලිතීන් තුළ) 100% ක ප්‍රරෝහණයක් ඇතිවිය.

පලතුරු බෝග පිළිබඳ සංවර්ධන කටයුතු

රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

2011 වර්ෂයේදී මෙම මධ්‍යස්ථානය රඹුටන්, අඹ, දූරියන්, වරකා, අලිපේර, කාමරංගා, සැපදිල්ලා, ගොරකා, දෙහි, මැංගුස්, ජම්බු, ලොවි, අනෝදා, පේර, දොඩම්, බෙලි, වෙරළු, ජමනාරං, පැෂන් ෆෘට්, ජෑම් පේර ආදියෙහි බද්ධ පැළඳ (28,034 budded plants,ද 1568grafted plants)බීජ පැළ 2177ක් ද අලෙවි කර රු. 4,504,210.00 ක දළ ලාභයක් උපයා ගත්තේය.

පටක රෝපණය මගින් වැදගත්කමක් සහිත බෝගවල උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවලිත කිරීමේ ව්‍යාපෘතිය මගින් අරමුදල් ප්‍රතිපාදිත වැඩසටහන

කෙසෙල් ක්ෂුද්‍ර ප්‍රචාරණය

මේ වනවිට ඇඹුල්, සීනි, නේත්‍රාපලම් වැනි කෙසෙල් වගා ප්‍රභේද ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීමේ ක්‍රමවේදය පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී ප්‍රශස්ත තත්ත්වයකට පත් කර ඇත. 2011 වර්ෂයේදී කෙසෙල් පැළ 1,500 ක් පමණ නිපදවා ඒවායින් බොහොමයක් ගොවීන් අතර බෙදා හරින ලදී. පටක රෝපිත කෙසෙල් පැළ ඇගයීම පිණිස කෙසෙල් ඇගයීම් ස්ථාන 8ක් ගොවි ක්ෂේත්‍රවල ද පර්යේෂණ ක්ෂේත්‍රවල ද ස්ථාපිත කරන ලදී.

අඹවල කලල වෙන්කර ගැනීමේ ක්‍රමය

නටුවෙන් වැටුණු හෝ නෙළා ගන්නා ලද නොමේරූ ගෙඩි යොදා ගනිමින් දෙමුහුම් කලල වෙන්කර ගැනීමේ තාක්ෂණික ක්‍රමය සාර්ථකව භාවිතා කෙරිණි.

දේශීය අඹ ප්‍රභේදවල කලල වෙන්කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් බිහි කිරීමේ පර්යේෂණ වැඩසටහනක් ආරම්භ කරන ලදී. 2011 වර්ෂයේදී මූලික අධ්‍යයන ආරම්භ කරන ලද නමුත් පසුගිය කන්නයේ දී ගෙඩි හිඟ වීම නිසා වැඩසටහන අත්හැර දැමීමට සිදුවිය. මීළඟ කන්නයේදී වැඩසටහන අඛණ්ඩව සිදු කෙරෙනු ඇත.

ඖෂධ කලාපීය පලතුරු සහිත පෙව විවිධත්ව උද්‍යානයක් ස්ථාපිත කිරීම

හෙ. 15 ක පමණ ඉඩමක් එළිපෙහෙළි කර නව කෙසෙල් පැළ (661), මැංගුස් පැළ (40) සහ අඹ පැළ (59) ස්ථාපිත කරන ලදී. නව වගාව සඳහා පැරණි රබර් වගාව ගලවා ඉවත් කරන ලදී. පැරණි අඹ වගාවේ කප්පාදු කිරීම් කටයුතු ආරම්භ කර අඹ, පේර, කෙසෙල්, සහ මැංගුස් වගාවන්හි වල් පැළඳ පාලනය කෙරිණි. අඹ, දුරියන් පටක රෝපිත කෙසෙල් සහ ජම්බු වගාවන්ට පොහොර ද යොදන ලදී.

බද්ධ රඹුටන් පැළ ද (7862) දූරියන් පැළ ද (1038) වෙරළු පැළ ද (165) අඹ පැළ ද (428) වරකා පැළ ද (1855) නිපදවන ලදී.

ගෙවත්තක් සකස් කර නඩත්තු කිරීම සහ ගෙවතු වගාව සම්බන්ධයෙන් ගොවීන් පුහුණු කිරීම හා පැසැල් සිසුන් දැනුවත් කිරීම

ගෙවතු වගාවේ ප්‍රයෝජනවත් බව ආදර්ශනය කිරීමට සහ පාසල් සිසුන් දැනුවත් කිරීම සඳහා 2005 වර්ෂයේදී හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ ගෙවත්තක් ස්ථාපිත කෙරිණි. 2011 වර්ෂයේදී පැසැල් සිසුනු 3251 දෙනෙක්, ගුරුවරු 138 දෙනෙක් සහ වෙනත් පුද්ගලයෝ 69 දෙනෙක් ගෙවත්තට පැමිණ ගෙවතු වගාව පිළිබඳ දැනුම වර්ධනය කර ගත්හ.

පුහුණු වැඩසටහන්

2011 වර්ෂයේදී පහත සඳහන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි.

- පාසැල් 30 කට අයත් පාසැල් සිසුනු 2951 දෙනෙක් සහ ගුරුවරු 179 දෙනෙක් මෙම මධ්‍යස්ථානයට පැමිණියහ.

- විශ්වවිද්‍යාල සිසුන් සහ කථිකාචාර්යවරුන් 190 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- පුහුණුවන්නන් 726 දෙනෙකු සඳහා පලතුරු වගාව, ගෙවතු වගාව, පටක රෝපණය සහ පැළ තවාන් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන් 16 ක් පවත්වන ලදී.

- ආදර්ශ ගම්මාන වැඩසටහන, යටතේ උසස් තත්ත්වයේ කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් 5 ක් පවත්වා ක්ෂුද්‍රජීවීන් පිරි කොම්පෝස්ට් පැකට් ද අඹ, රඹුටන්, දූරියන්, වරකා සහ හරිත කතුරු මුරුංගා පැළ 1325ක්ද දඹර, හඳුපැල්පොළ, කුඹුක, හාලපිටිය, ගොඩිගමුව යන ගම්මානයන්හි ප්‍රතිලාභීන් 175 දෙනෙකු අතර බෙදා හරිනු ලැබිණි.

- දිවිනැගුම වැඩසටහන යටතේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය පිළිබඳ, පුහුණු වැඩසටහන් 58ක් පවත්වා, ක්ෂුද්‍ර ජීවීන් පිරි කොම්පෝස්ට් පැකට් හොරණ ප්‍රාදේශීය

ලේකම් කොට්ඨාසයේ ප්‍රතිලාභීන් 4200 ක් අතර බෙදා දෙනු ලැබිණි.

- පලතුරු වගාව, පළිබෝධ සහ රෝග පාලනය හා බෝග කළමනාකරණය පිළිබඳ නව තාක්ෂණයන් සම්බන්ධයෙන් හොරණ ප්‍රදේශයේ ගම්මාන 50 ක ගොවීන් 2755 දෙනෙකු සඳහා පුහුණුව ලබාදිණි.

- උපදෙස් සහිත පත්‍රිකා 1615 ක් ගොවීන් අතර බෙදා හරින ලදී.

ගොවීන් සඳහා උපදේශක වැඩසටහන්

- ගොවීන්ගෙන් සහ ව්‍යාප්ති නිලධාරීන්ගෙන් ලද රෝග ආසාදිත නියැදි 78 ක් පරීක්ෂා කර බලා රෝග හඳුනා ගැනීම පිණිස විද්‍යාගාරයේදී ව්‍යාධිජනක වර්ධනය කිරීමෙන් පසු රෝග පාලනය සඳහා නිර්දේශ ලබාදෙන ලදී.

- වසර තුළ පළිබෝධ හා රෝග, ඩ්‍රැගන් පෘට්, දූරියන්, රඹුටන්, අන්නාසි සහ එළවළු වගවන්ට අදාළව ගොවීන් විසින් ඉදිරිපත් කරන ලද ක්ෂේත්‍ර ගැටළු 98 ක් සම්බන්ධයෙන් කටයුතු කර පාලන පියවර පිළිබඳ උපදෙස් ලබාදෙන ලදී.

ජන මාධ්‍ය

පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ නිලධාරීහු මැංගුස්, පේර, දූරියන්, ජම්බු, රඹුටන්, ගෙවතු වගාව හා කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳ රූපවාහිනී වැඩසටහන් 9 කට සහ පලතුරු බෝග වගාව, පළිබෝධ හා රෝග පිළිබඳ ගුවන්විදුලි වැඩසටහන් 4 කට සහභාගි වූහ.

2012 වර්ෂය සඳහා සැලැස්ම

බෝග වැඩිදියුණු කිරීම

- කෙසෙල් ජනකප්ලාස්ම එක්රැස් කර ගැනීම, ඇගයීම සහ වරණය තුළින් වැඩි අස්වනු ගෙනදෙන උසස් තත්ත්වයේ කෙසෙල් ප්‍රභේද බිහි කිරීම

- අලිපේර ජනකප්ලාස්ම එක්රැස් කර ගැනීම, ඇගයීම සහ වරණය තුළින් වැඩි අස්වනු ගෙනදෙන උසස් තත්ත්වයේ අලිපේර ප්‍රභේද බිහිකිරීම

- ලාවුළු ජනකප්ලාස්ම එක්රැස් කිරීම, සංරක්ෂණය සහ ඇගයීම

- ලොවි ජනකප්ලාස්ම එක්රැස් කිරීම, සංරක්ෂණය සහ ඇගයීම

- බලාපොරොත්තු තැබිය හැකි ආනෝදා එකතුන් අස්වනු ලබාදෙන ආකාරය පිළිබඳ අධ්‍යයනය

- වෙරළු ජනකප්ලාස්ම සංරක්ෂණය සහ ඇගයීම

- සැපෝටා ජනකප්ලාස්ම සංරක්ෂණය සහ ඇගයීම

- වරකා ජනකප්ලාස්ම සංරක්ෂණය සහ ඇගයීම

- තෙත් කලාපයේ ඇති අඹ ජනකප්ලාස්ම එක්රැස් කර ගැනීම සහ නඩත්තු කිරීම හා පහත රට තෙත් කලාපයේ වගා කිරීම සඳහා උසස් තත්ත්වයේ ගිරා අඹ සහ පෙට්ටි අඹ යන දේශීය වගා ප්‍රභේද තෝරා ගැනීම

- රඹුටන් ජනකප්ලාස්ම එක් රැස් කිරීම හා ඇගයීම

- පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ දැනට ඇති රඹුටන් ගහනය ලක්ෂණීකරණය කිරීම

- ගොරක ජනකප්ලාස්ම එක්රැස් කිරීම සහ ඇගයීම

- උගුරැස්ස ජනකප්ලාස්ම 17 ක් ලක්ෂණීකරණය කිරීම

- ගඩුගුඩා ජනකප්ලාස්ම එක්රැස් කර ගැනීම, ලක්ෂණීකරණය සහ ඇගයීම

- පේර දෙමුහුම්වල මව් ශාක ගහනය නඩත්තු කිරීම

- වාණිජමය වගාව සඳහා බලාපොරොත්තු තැබිය හැකි දූරියන් ප්‍රභේද තෝරා ගැනීම

- දෙමුහුම්කරණය තුළින් වැඩි අස්වනු ගෙනදෙන උසස් තත්ත්වයේ දූරියන්වල F 1 දෙමුහුම් බිහි කිරීම

- වරණාය තුළින් වැඩි අස්වැන්නක් ලබා දෙන උසස් තත්වයේ ජමනාරං ප්‍රභේද බිහි කිරීම
- දෙමුහුම්කරණය තුළින් වැඩි අස්වනු ගෙනදෙන උසස් තත්ත්වයේ දොඩම් සහ ජමනාරං ප්‍රභේද බිහි කිරීම
- විකෘතියට ලක් කරන ලද දොඩම් සහ නස්නාරං ප්‍රභේද ඇගයීම
- ජපානයෙන් හඳුන්වා දෙන ලද විදේශීය දොඩම් සහ ජමනාරං ප්‍රභේද ඇගයීම
- බෙලි ජනකප්ලාස්ම 8 ක් එක්රැස් කර ස්ථාපිත කිරීම.
- බෙලි ජලකප්ලාස්ම 5 ක් ලක්ෂණීකරණය කිරීම
- වැරණියා, අමු මිරිස් ප්‍රභේදයේ බීජ නිෂ්පාදනය සහ පවිත්‍රතාව නඩත්තු කිරීම
- එළබටු (කුඩා වර්ගය) ජනකප්ලාස්ම එක්රැස් කිරීම සහ ගුණනය
- පැපොල්, පෑෂන් පෘට් සහ අඹ දෙමුහුම් බීහි කිරීම
- ඉහළ අස්වනු ගෙනදෙන උසස් තත්ත්වයේ පැපොල් ප්‍රභේද බිහි කිරීම
- 2012 වර්ෂය සඳහා බණ්ඩක්කා දෙමුහුම් බීජ නිෂ්පාදනය
- වාණිජමය වගාව සඳහා බලාපොරොත්තු තැබිය හැකි දූරියන් ප්‍රභේද බිහි කිරීම
- වැඩි අස්වනු ගෙනදෙන උසස් තත්ත්වයේ පැඟිරි (දොඩම් සහ ජමනාරං) ප්‍රභේද බිහි කිරීම
- දැනට ඇති ජනකප්ලාස්මවලින් වැඩි අස්වනු ගෙනදෙන උසස් තත්ත්වයේ අඹ වගා ප්‍රභේද බිහි කිරීම

බෝග කළමනාකරණය

- ඩ්‍රැගන් පෘට් අස්වැන්න සහ තත්ත්වය කෙරෙහි කඳ කැබලි සංඛ්‍යාව සහ කඳ කැබලිවල ප්‍රමාණය මඟින් ඇති කරන බලපෑම අධ්‍යයනය කිරීම
- පහත රට තෙත් කලාපයේ ඩ්‍රැගන් පෘට් බෝගයේ ක්‍රියාකාරිත්වය ඇගයීම
- රඹුටන් ගෙඩි අර්ධ වශයෙන් පිරීම පිළිබඳ අධ්‍යයන (නිරීක්ෂණ මට්ටමේ)
- අමතර මූල පද්ධතියක් ලබා දීම මඟින් මැංගුස් බද්ධ පැළ සහ බීජ පැළවල වර්ධනය වැඩි කිරීම
- මූල ගැටිති නෙමටෝඩාවන් සිටීදැයි ග්‍රාහක පරීක්ෂා කර බැලීම
- සුදුසු පුහුණු කිරීමේ සහ කප්පාදු කිරීමේ ක්‍රමයක් බිහි කිරීම තුළින් අනෝදා බීජ පැළවල ඵලදායිතාව ඉහළ නැංවීම
- පේර මව් ශාක උද්‍යානය නඩත්තු කිරීම
- ජම්බු එකතූන් 25 ක් නඩත්තු කිරීම
- රඹුටන් සඳහා ලාබදායි බෝග කළමනාකරණ පිළිවෙත් බිහි කිරීම
- වැල් කළමනාකරණය මඟින් පැෂන් පෘට්වල කඳ ඉදිමීම පාලනය කිරීම
- බද්ධ කරන ලද දූරියන් එකතූන් පුහුණු කිරීම සහ කප්පාදු කිරීම
- වෛරස්වලින් තොර පැඟිරි මව් ශාක (දොඩම් සහ ජමනාරං) ඇති කිරීම
- පැඟිරි සඳහා විවිධ ස්ථාපිත කිරීමේ ක්‍රම 3 ක් සහ ශාක කළමනාකරණය කිරීමේ ක්‍රම 2 ක් අත්හදා බැලීම
- පැඟිරි සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්වීම
- බතල පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂණ අත්හදා බැලීම් පැවැත්වීම
- මිරිස් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද පරීක්ෂණ අත්හදා බැලීම් පැවැත්වීම
- පටක රෝපිත කෙසෙල් පැළ ක්ෂේත්‍රයේ ඇගයීම

පැළෑටි පෝෂණය සහ කාබනික පලතුරු නිෂ්පාදනය

- විවිධ කැල්සියම් මට්ටම් සහ ඒවා යොදන ක්‍රම අනුව පැෂන් පෑටිවල කඳ ඉදිමීම ඇතිවන ආකාරයන් මැනීම
- මැංගුස් ගෙඩිය අභ්‍යන්තරයට මැලියම් වෑස්සීමේ රෝගය කෙරෙහි තෝරාගත් පෝෂක යෙදීම මගින් ඇතිවන බලපෑම ඇගයීම
- ඩ්‍රැගන් පෑට් අස්වැන්න කෙරෙහි කාබනික පොහොර යෙදීම මගින් ඇතිවන බලපෑම
- මැංගුස් අස්වැන්න කෙරෙහි රසායනික සහ කාබනික පොහොර යෙදීම මගින් ඇතිවන ඒකාබද්ධ බලපෑම
- පණු පොහොර සැකසීම කෙරෙහි විවිධ කාබනික ද්‍රව්‍ය මගින් ඇති කරන බලපෑම පරීක්ෂා කර බැලීම
- අන්නාසි අස්වැන්න කෙරෙහි පණු දියරපොහොර විවිධ ප්‍රමාණයන්ගෙන් තනුක කර යෙදීම බලපාන ආකාරය පිළිබඳ මූලික අධ්‍යයන සිදු කිරීම
- කෙසෙල් ගෙඩි පැලියාම අවම කර ගැනීම සඳහා කැල්සියම් යෙදිය හැකි ක්‍රම හඳුනා ගැනීම
- පටක රෝපිත කෙසෙල් වගාවට සුදුසු පොහොර යොදන පිළිවෙත් හඳුනා ගැනීම
- කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම

පැළෑටි ව්‍යාධිවේදය

- කෙසෙල්වල සිගාටොකා රෝගය පාලනය කිරීම සඳහා පැළෑටි නිස්සාරක, සාමාන්‍යයෙන් ආරක්ෂිත යැයි පිළිගන්නා සංයෝග සහ දිලීරනාශක අත්හදා බැලීම
- ඇන්ත්‍රැක්නෝස් සහ ප්‍රතිමාරයයන රෝග වලට ප්‍රතිරෝධී හෝ ඔරොත්තු දෙන ප්‍රභේද තෝරා ගැනීම සඳහා අඹ ජනකප්ලාස්ම පරීක්ෂා කර බැලීම
- සාමාන්‍යයෙන් ආරක්ෂිත යැයි පිළිගන්නා සංයෝග, පැළෑටි නිස්සාරක සහ දිලීර නාශක මගින් අඹ ගෙඩි කුණුවීමේ රෝගය පාලනය
- සාමාන්‍යයෙන් ආරක්ෂිත යැයි පිළිගන්නා සංයෝග මගින් පැපොල් ගෙඩි කුණුවීමේ රෝගය පාලනය
- සාමාන්‍යයෙන් ආරක්ෂිත යැයි පිළිගන්නා සංයෝග මගින් පේර කුණුවීමේ රෝගය පාලනය

කීට විද්‍යාව

- පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන්ට ඔරොත්තු දෙන ඒ සඳහා සුදුසු පේර ග්‍රාහක පිළිබඳ අධ්‍යයන
- පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් පාලනය සඳහා පසට විවිධ ද්‍රව්‍ය එක්කර වෙනස්කම් සිදු කිරීම ඇගයීම

පටක රෝපණය

- නිර්දේශිත කෙසෙල් වගා ප්‍රභේද ක්ෂුද්‍ර ප්‍රචාරණය
- අඹවල කලල වෙන්කර ගෙන වෙනම මාධ්‍යයක රෝපණය කිරීම

සමාජ ආර්ථික විද්‍යාව

- 2011 වර්ෂය සඳහා පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයට අදාළINFORM වාර්තාව පිළියෙල කිරීම
- පලතුරු බෝගවලට අදාළ සමාජ ආර්ථික තොරතුරු ඇතුළත් දත්ත මූලය සකස් කිරීම

සංවර්ධන වැඩසටහන

- ස්ථාපිත කර ඇති ආදර්ශ ගෙවත්ත වැඩිදියුණු කිරීම සහ නඩත්තුව
- හොරණ ඝර්ම කලාපීය පලතුරු සහිත පෙව විවිධත්ව උද්‍යානයක් ස්ථාපිත කිරීම

කාර්ය මණ්ඩලය

තනතුර	**නිලධාරි/සේවක සංඛ්‍යාව**
අතිරේක අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිලධාරි	12
ආර්ථික විද්‍යාඥ සහකාර	01
වැඩසටහන් සහකාර	06
සංවර්ධන සහකාර	01
සහකාර අධ්‍යක්ෂ	01
පර්යේෂණ සහකාර	06
කෘෂිකර්ම උපදේශක	14
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	07
රියදුරු	03
ගබඩාකරු	01
මුරකරු	01
බද්ධකරු	01
කම්කරු	30
කම්කරු (කොන්ත්‍රාත්)	80
එකතුව	**165**

2.2.3 ආහාර පර්යේෂණ ඒකකය - ගන්නොරුව

ආහාර පර්යේෂණ ඒකකය උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වේ. පසු අස්වනු තාක්ෂණය පිළිබඳ පර්යේෂණ නිෂ්පාදන බිහි කිරීම සහ බෝග වැඩිදියුණු කිරීමේ වැඩසටහන්වලින් ලබා ගන්නා නියැදිවල තත්වය ඇගයීම හා තාක්ෂණය ලබා දීම මෙම ඒකකය විසින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් අතර වේ.

අයවැය

වගු අංක 2.2.3.1. : වාර්ෂික අයවැය - 2011 (රු:)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	164,500	143,404	87
පුනරාවර්තන	1,552,505	1,353,198	87
ව්‍යාපෘති			
අගය එකතු කිරීම (පලතුරු,එළවළු හා ධාන්‍ය) - ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම	1,000,000	253,140	25
කෘෂි නිපැයුම් අලෙවිකරණය හා වටිනාකම් දාම ස්ථාපිත කිරීම- අපි වවමු - රට නගමු වැඩසටහන	4,000,000	2,878,254	72
ආදර්ශ ගම්මාන ස්ථාපිත කිරීම - අපි වවමු-රට නගමු වැඩසටහන	1,000,000	69,671	7
ව්‍යවසායකත්ව සංවර්ධනය	2,000,000	292,886	15
දේශීය ආහාර පරිභෝජනය වර්ධනය කිරීම අපි වවමු - රට නගමු වැඩසටහන	1,000,000	825,342	83
ආහාර පර්යේෂණ ඒකකයේ කම්හල් ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීම - අපි වවමු - රට නගමු වැඩසටහන	1,000,000	105,450	11
ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම පිණිස ආහාර සැකසුම් කම්හලක් ස්ථාපිත කිරීම - කොරියානු අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘතිය	3,600,000	667,966	19
එකතුව	**15,317,005**	**6,589,311**	**43**

ප්‍රගතිය

පර්යේෂණ

- මිරිස් අච්චාරු පිළියෙල කරගත හැකි ආහාර වට්ටෝරුවක් සකස් කෙරිණි. හැලපීනෝ මිරිස් විනාකිරි දමා ලුණු හා සීනිද එක්කර සාර්ථකව අච්චාරුවක් වශයෙන් සකස් කරගත හැකිය.

- වට්ටක්කා මදය යොදා ගනිමින් සකස් කළ ස්නැක් වර්ගයක් හඳුන්වා දෙන ලදී.

- පාන් සෑදීම සඳහා සහල් පිටි පදනම් කරගත් මිශ්‍රණයක් සාර්ථකව සකස් කරන ලදී.

- මැංගුස් මදය ක්ෂණිකව ආහාරයට ගත හැකි වන සේ සැකසුම් කිරීම පිළිබඳ පර්යේෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී.

- පොටෑසියම් මට්ටම ඉහළ නැංවීම මගින් අඹ වගාවට වැළඳෙන රෝග පාලනය කිරීම සඳහා පර්යේෂණ සිදු කෙරිණි. පොටෑසියම් නිර්දේශිත මාත්‍රාව දෙගුණ කර යෙදීමෙන් අඹ ගස්වල මල් හට ගැනීම සහ ඵල ඇතිවීම විශාල වශයෙන් සිදුවිය. එමෙන්ම ගස්වලින් ගෙඩි නොහැලී රැඳීමද අඹ ගෙඩිවල පොත්තෙහි පැහැය, මදයේ පැහැය වැඩිදියුණු වීමද සිදුවිය.

- පොටෑසියම් නිර්දේශිත මාත්‍රාව දෙගුණ කර යෙදීමෙන් 'රෙඩ් ලේඩ්' නමැති පැපොල් ප්‍රභේදයට ඇන්ත්‍රැක්නෝස් සහ ෆ්‍යුසාරියම් රොට් යන රෝග වැළඳීම සැලකිය යුතු අයුරින් අඩුවිය. එම රෝග බීජ ආක්‍රමණය කරන ලද ගෙඩි මගින්ද එම නිරීක්ෂණය තහවුරු විය.

- පොටෑසියම් මාත්‍රාව දෙගුණ කර යෙදීමෙන් අන්නාසි ගෙඩි අභ්‍යන්තරය දුඹුරු පැහැවීම සැලකිය යුතු අයුරින් අඩුවිය. අධ්‍යයනය මගින් වැඩිදුරටත් පෙන්නුම් කර ඇත්තේ යූරියා වැඩිපුර යෙදීමෙන් අභ්‍යන්තරය දුඹුරු පැහැවීම වැඩි වූ බවයි.

- පටක රෝපිත කෙසෙල්වල අස්වනු නෙළූ පසු ඒවායෙහි තත්වය වැඩිදියුණු කිරීම සඳහා පූර්ව අස්වනු කළමනාකරණ පිළිවෙත් සකස් කරන ලදී. පොටෑසියම් ඉහළ ප්‍රමාණයන් යෙදීම මගින් කෙසෙල් පැළ මුල කොටසෙහි වට ප්‍රමාණය ද කලින් මල් හට ගැනීම ද වර්ධනය විය. පොටෑසියම් නිර්දේශය යොදන ලද පැළවලට වඩා ඉහළ පොටෑසියම් මාත්‍රාවක් යොදන ලද පැළ මනා වර්ධනයක් පෙන්නුම් කළේය.

- පරිණතව ඉදුණු 'වෙරළුවල' ඉහළ ඇන්ටිඔක්සිඩන්ට් ප්‍රමාණයක් පැවති අතර 'මහ වෙරළුවලට' වඩා 'හීන් වෙරළුවල' වැඩි ඇන්ටිඔක්සිඩන්ට් ක්‍රියාකාරිත්වයක් පැවතිණි.

- කොස්වල ඉහළ ඇන්ටිඔක්සිඩන්ට් ප්‍රමාණයක් පැවති අතර විශේෂයෙන්ම බීජය හා මදුළ අතර ඇති සිවිඩිඩෙහි ඉහළ ඇන්ටිඔක්සිඩන්ට් ක්‍රියාකාරිත්වයක් ඇතිවේ.

- කරපිංචා එක්කර තේ බෑග පිළියෙල කිරීමේ තාක්ෂණයක් ජනනය කෙරිණි.

සංවර්ධන කාර්යයන්

- කොරියානු රජයේ අරමුදල් යොදා ගනිමින් සැකසුම් කිරීමේ කම්හලක් ස්ථාපිත කිරීම තුළින් ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. සුළු පරිමාණ සැකසුම් කම්හලක් කුණ්ඩසාලේ ස්ථාපිත කිරීමට නියමිතය. මෙම සැකසුම් කම්හල සැකසුම්කරුවන් පුහුණු කිරීම සඳහා උපයෝගී කර ගැනීමට නියමිතය.

- කෘෂි නිෂ්පාදන අලෙවිකරණ හා වටිනාකම් දාම ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 20ක් හඳුනා ගන්නා ලදහ. ප්ලාස්ටික් කූඩ (2,000ක් පමණ), බර කිරන යන්ත්‍ර සහ නාම පුවරු 50%ක සහනාධාර මිලක් යටතේ ලබාදිණි.

- ආහාර පර්යේෂණ ඒකකයේ කම්හල් ගොඩනැගිල්ල සාර්ථකව අලුත්වැඩියා කරන ලදී.

පුහුණු වැඩසටහන්

- පලතුරු හා එළවළුවල අස්වනු හානි අඩුකර ගැනීම සඳහා තොග වෙළෙඳුන්, ප්‍රවාහනය කරන්නන්, එක්රැස් කරන්නන් හා සිල්ලර වෙළඳුන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

- කෘෂිකර්ම ඩිප්ලෝමාව හදාරන සිසුන් 300දෙනෙකුට, විශ්වවිද්‍යාල සිසුන් 148 දෙනෙකුට, කාර්මික විද්‍යාල සිසුන් 150 දෙනෙකුට පසු අස්වනු තාක්ෂණය සහ ආහාර සැකසුම් කිරීම පිළිබඳ පුහුණුව ලබාදෙන ලදී.

- ආහාර සැකසුම් කිරීම පිළිබඳ විදාතා වැඩසටහන් 30ක් ද පවත්වන ලදී.

- කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවය විසින් අනුග්‍රහය දක්වන ලද පුහුණු වැඩසටහන මගින් පෞද්ගලික අංශයේ සහභාගිත්වය ඇතිව පලතුරු හා එලවළු සැකසුම් කිරීම සහ සහල් පිටි යොදා ගන්නා නිෂ්පාදන පිළිබඳව පුහුණු වැඩසටහන් 2ක් පවත්වන ලදී.

- සහල් පදනම් කරගත් නිෂ්පාදන පිළිබඳ පුහුණු වැඩසටහන් 3ක් ද (125 දෙනෙකු සඳහා) පලතුරු හා එළවළු සැකසුම් කිරීම පිළිබඳ වැඩසටහන් 55ක් ද (790 දෙනෙකු සඳහා) පැවැත්විණි.

තාක්ෂණය ලබා දීම

- කරපිංචා එක්කර තේ බෑග නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය ලිඳුල, ජනපදය, රත්නගිරිය, නොා. 5 දරන ස්ථානයෙහි පිහිටි 'සෑම් ප්‍රොඩක්ට්ස්' ආයතනයට ලබාදෙන ලදී.

- ආහාර පර්යේෂණ ඒකකය විද්‍යාගාර විශ්ලේෂණ පහසුකම් සැපයීම අඛණ්ඩව කරගෙන යයි. පෞද්ගලික අංශයෙන් ලැබුණු ක්ෂණික බීම වර්ග, චට්නි, කෝඩියල්, ජෑම්, විප්ලනය කළ එළවළු, පේස්ට් වර්ග, බයිට්ස් වර්ග, ෆ්‍රෙන්ච් ෆ්‍රයිස් නියැදි ගණනාවක් ඒවායෙහි තත්වය සහතික කිරීම සඳහා විශ්ලේෂණය කරන ලදී.

- එළවළුවලට අදාළ ආහාරවල තත්වමය ඇගයීම් වාර්තා 150ක්, පලතුරු වර්ගපිළිබඳ වාර්තා 6ක් සහ අල වර්ග පිළිබඳ වාර්තා 100ක් අභිජනකයන් වෙත නිකුත් කරන ලදී.

2012 වර්ෂය සඳහා සැලැස්ම

පර්යේෂණ

- මැංගුස් මදය භාවිතා කර බීම වර්ගයක් සකස් කිරීම

- පැපොල් පලතුරු මදය සැකසුම් කිරීමේ ක්‍රමයක් (Papaya Fruit Leather) සකස් කිරීම

- පේලි සෑදීම සඳහා කැහි පිත්තන් (*Cyclea burmanni*) යොදා ගැනීම

- වට්ටක්කා භාවිතා කර 'ස්නැක්' වර්ගයක් පිළියෙල කිරීම

- සහල් පිටි භාවිතා කර කේක් මිශ්‍රණයක් සකස් කිරීම

- පාරිභෝගිකයින්ට වෙළඳපොළෙහි ඇති කැල්සියම් කාබනේට් (CaC_2) යොදන ලද පලතුරු හඳුනා ගතහැකි ක්‍රමයක් බිහි කිරීම

- විවිධ තම්පලා ප්‍රභේද උපයෝගි කර ගනිමින් තම්පලා බීප් එක්කර සහල් පිටිවලින් සකස් කරන ලද බිස්කට් නිපදවා ඒවායෙහි පෝෂණ තත්වයේ වෙනස්කම් පිළිබඳව අධ්‍යයනය කිරීම

- සහල් පිටි සහ පලතුරු යොදා ගනිමින් ''වණ්ඩු'' නැමති කෑම වර්ගය සකස් කිරීම සහ ''වණ්ඩු'' කල් තබා ගැනීමේදී ඒවායෙහි තත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම

- ඩ්‍රැගන් ෆෘට්වලින් රසවත් කෑම වර්ග නිපදවීම

- විවිධ මඤ්ඤොක්කා ප්‍රභේද යොදා ගනිමින් ඒවායෙහි පිටිවල තත්වමය ගුණාංග පිළිබඳව අධ්‍යයනය කිරීම

- විවිධ ප්‍රතිකර්ම සිදුකර තෝරාගත් බතල ප්‍රභේද ගබඩාකරණය පිළිබඳව අධයයනය කිරීම

- විවිධ සැකසුම් ක්‍රම යොදා ගනිමින් තෝරා ගන්නා ලද ඌන උපයෝජිත අල වර්ගවල රසවත්බව වැඩිදියුණු කිරීම

- ලුනු කොළ සඳහා අවම වශයෙන් සැකසුම් කිරීමේ ක්‍රමයක් බිහි කිරීම

- සුපිරි වෙළඳසැල් සහ දේශීය වෙළඳපොළ විසින් යොදා ගන්නා එළවළු අවම වශයෙන් සැකසුම් කිරීමේ ක්‍රමය ඇගයීම සහ එම ක්‍රමය වැඩිදියුණු කිරීම

- මිරිස් කුඩුවල තත්වය වැඩිදියුණු කිරීම සඳහා සුදුසු ප්‍රභේද තෝරා ගැනීම

- වට්ටක්කාවලින් නිෂ්පාදන (ක්ෂණිකව ආහාරයට ගත හැකි කෑම වර්ග, ටොෆි) බිහි කිරීම

- පැපොල් පසු අස්වනු හානිය අඩු කිරීම (ඇන්ත්‍රැක්නෝස් රෝගය පාලනය කිරීම)

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරි/සේවක සංඛ්‍යාව
ඒකක ප්‍රධානි	01
පර්යේෂණ නිලධාරි	03
කෘෂිකර්ම උපදේශක	03
පර්යේෂණ සහකාර	02
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි	01
වැඩසටහන් සහකාර	01
කළමනාකරණ සහකාර	02
විද්‍යාගාර උප සහකාර	02
රියදුරු	01
යන්ත්‍ර ක්‍රියාකරු	01
විදුලි ශිල්පි	01
කම්කරු	06
කම්කරු (කොන්ත්‍රාත්)	07
මුරකරු	02
එකතුව	**33**

2.2.4 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - බණ්ඩාරවෙල

මුහුදු මට්ටමේ සිට මී. 1200කට ඉහළින් උඩරට අතරමැදි කලාපයේ පිහිටි බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ඌව කලාපයේ සහ සබරගමුව පළාතේ බලංගොඩ ප්‍රදේශයේ කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීමට සුදුසු තාක්ෂණයන් ජනනය කිරීමේ වගකීම දරන ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානයයි. එහි උප පර්යේෂණ ස්ථාන 2ක් රහංගල සහ මදුරුකැටිය යන ස්ථානවල ද පර්යේෂණ ගොවිපළ 2ක් බිබිල සහ මුතුකණ්ඩිය යන ප්‍රදේශවල ද පිහිටා ඇත. IU_2, IM_2, IM_3, WM_3, IL_2 සහ WM_3 යන කෘෂි පාරිසරික කලාප බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානයට වගකීම පැවරී ඇති ප්‍රදේශයෙන් ආවරණය වේ. මෙම පර්යේෂණ මධ්‍යස්ථානයේ ප්‍රධාන වගකීම පර්යේෂණ වැඩසටහන් කරගෙන යාම වුවද කෘෂිකර්ම අමාත්‍යාංශයේ මූල්‍යමය සහායෙන් කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන් රැසක්ද ක්‍රියාවට නැංවිණි. ආදර්ශ ගම්මාන බිහි කිරීම, කොම්පෝස්ට් නිෂ්පාදනය හා බෙදාහැරීම මෙන්ම පෙයාර්ස්, පැඟිරි, අලිපේර, අඹ, සහ අර්තාපල්වල උසස් තත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ බෙදා හැරීමද එලෙස ඉටු කළ කාර්යයන් සමහරකි. එවැනි කාර්යයන්හි ප්‍රධාන අරමුණ වූයේ උසස් තාක්ෂණයන් යොදා ගනිමින් ගොවි ප්‍රජාවේ කෘෂිකාර්මික නිෂ්පාදනය ඉහළ නැංවීමයි.

අයවැය

වගු අංක 2.2.4.1 : වාර්ෂික අයවැය - 2011 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
පුනරාවර්තන	8,235,028	7,383,696	90
මූලධන	6,395,223	3,296,790	52
ව්‍යාපෘති			
කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය බණ්ඩාරවෙල			
ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම			
– බෝංචි	400,000	379,347	95
– අර්තාපල්	600,000	499,258	83
– පැඟිරි	200,000	192,846	96
– පළිබෝධ හා රෝග	200,000	139,321	70
– කාබනික පොහොර	900,000	749,386	83
– ආදර්ශ ගම්මාන	300,000	132,713	44
– දෙමුහුම් තක්කාලි බීජ නිෂ්පාදනය	400,000	315,659	79
පටක රෝපණය	3,000,000	1,602,436	53
අභිජනන බීජ නිෂ්පාදනය	250,000	239,333	96
රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය - පලතුරු	227,500	212,600	93
එළවළු නිෂ්පාදනය	150,000	99,520	66
කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - මොණරාගල			
ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම	250,000		
– පැඟිරි	100,000	210,255	84
– කෙසෙල්	600,000	96,130	96
කාබනික පොහොර	200,000	450,308	75
ආදර්ශ ගම්මාන	1,130,000	98,145	49

පලතුරු රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය		477,559	42
කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - රහංගල			
– කාබනික පොහොර	500,000	391,844	78
– දෙමුහුම් බීජ නිෂ්පාදනය	300,000	259,849	87
ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම			
– බෝංචි ප්‍රභේද වැඩිදියුණු කිරීම	300,000	216,983	72
– කෙසෙල්	50,000	34,187	68
– පැඟිරි	200,000	136,374	68
ආදර්ශ ගම්මාන	100,000	95,661	96
එකතුව	**22,287,751**	**11,974,403**	**54**

ප්‍රගතිය

විමසුමට ලක් කරන ලද වසර තුළ සිදු කරන ලද පර්යේෂණ හා සංවර්ධන කටයුතු මගින් එළවළු (බෝංචි, කැරට්, ගෝවා, තක්කාලි), අර්තාපල්, උප ඖර්ම කලාපීය සහ සෞම්‍ය කලාපීය පලතුරු බෝග (පැණි දෙඩම්, ජම්බුනාරං, ඇපල්, පෙයාර්ස්, පීච්, ස්ට්‍රෝබෙරි) සහ මල් බෝග (රෝස, ජර්බෙරා, කපුරු, ඇන්තූරියම්, ඇස්ටර්, මැඩෝනා ලිලී, කානේෂන්, සුපර් ඩේසි) කෙරෙහි අවධානය යොමු කෙරිණි.

බෝග වැඩිදියුණු කිරීම

- දේශීය හා විදේශීය එකතූන් යොදා ගනිමින් බෝංචි ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. සැසඳුම් ප්‍රභේදය වූ කේඩබ්ලිව්පී සමග සසඳා බැලූවිට (හෙ.1කට ටො. - 9.71) බීඑන්16 (හෙ.1කට ටො. 21.21) සහ බිල් -1 (හෙ.1කට ටො. 21.18) යන ප්‍රභේද වැඩි අස්වනු ලබාදිණි.

- 2011 වර්ෂය තුළ වම්බටු සහ තක්කාලි සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හඳ බැලීම් අඛණ්ඩව සිදු කෙරිණි.

- රහංගල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේදී ක්‍රියාත්මක කරන ලද බෝංචි ජනකප්ලාස්ම එක්රැස් කිරීමේ සහ ඇගයීමේ වැඩසටහන මගින් දේශීය ගොවීන්ගෙන් වැල් බෝංචි එකතූන් 63ක් එක්රැස් කර ගැනිණි. ඒ අතරින් ආර 8ක් බලාපොරොත්තු තබාගත හැකි ක්‍රියාකාරිත්වයක් පෙන්වීය.

- දේශීය සහ ජපන් දෙඩම් හා ජම්බුනාරං ප්‍රභේද බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී, මොණරාගල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේදී සහ රහංගල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේදී අගයන ලදී, නිවිනි නිවිගෝ සහ නන්කන් නිවිගෝ යන ප්‍රභේද උසස් තත්වයේ ඵල ලබාදීමට සමත් විය. අනෙකුත් ස්ථාන සමග සසඳා බැලූවිට මෙම ප්‍රභේද බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී ඉහළම ක්‍රියාකාරිත්වය පෙන්වීය.

- සෞම්‍ය කලාපීය පලතුරු බෝග වන ඇපල්, පීච්, පෙයාර්ස්, චීන පේර, නෙක්ටරින්, අලිපේර, කාමරංගා) සහිත මව් පලතුරු ශාක උද්‍යාන මෙම පර්යේෂණ මධ්‍යස්ථානයට අයත් පර්යේෂණ ක්ෂේත්‍රයේ නඩත්තු කෙරිණි.

- බෝංචි ජනකප්ලාස්ම එක්රැස් කිරීමේ සහ ඇගයීමේ වැඩසටහන යටතේ, බදුල්ල, මහනුවර, රත්නපුරය සහ මාතලේ යන දිස්ත්‍රික්කවල බෝංචි වගා කරන ප්‍රදේශවලින් එකතූන් 140ක් එක්රැස් කර ගැනිණි.

- 'භාතිය' නමැති තක්කාලි ප්‍රභේදයේ මාපිය ආරවල බීජ නිපදවන ලද ප්‍රමාණය, ජායාංගී ආරවලින් (P3) ග්‍රෑ. 722.0ක් සහ පුමාංගී ආරවලින් (P4) ග්‍රෑ. 591.0ක් වශයෙන් විය.

ශස්‍ය විද්‍යාව

- අර්තාපල් සමඟ බඩඉරිඟු අතුරු බෝග වගාවෙන් යල කන්නයේදී මුල් ඇදුණු අර්තාපල් කඳ කැබලිවලින් ඉහළම බීජ ආකන්ද අස්වැන්න ලැබිණි. එම ප්‍රතිලාභය ලබා ගැනීම සඳහා බෝග දෙවර්ගයම එකම කාල සීමාවකදී රෝපණය කළ යුතුය.අ

පැළෑටි සංරක්ෂණය

- නියමු මිට්ටමේ අත්හද බැලීම් තුළින් ලද සතුටුදායක ප්‍රතිඵල මත බෝංචි පත්‍රවලට වැළඳෙන රෝග (මලකඩ රෝගය, ඇන්ත්‍රැක්නෝස්) පාලනය කිරීම සඳහා නව දිලිර නාශකයක් වන හෙක්සකොනසෝල් 5% EC නිර්දේශ කර ඇත. නිර්දේශිත රසායන වන ටෙබ්‍යුකොනසෝල් සහ ක්ලෝරොතැලනිල්වලට වඩා මෙම නව දිලිරනාශකය වඩා හොඳ ක්‍රියාකාරිත්වයක් පෙන්වීය.

- විෂ සහිත බව අඩු, පාරිසරික වශයෙන් හිතකර සහ කාබනික වශයෙන් පිළිගත හැකි රසායනයක් වන කැලිග්‍රීන් (පොටෑසියම් බයිකාබනේට්) ආරක්ෂිත ගෘහ තුළ වගා කරන තක්කාලිවල පත්‍ර රෝග පාලනය කරන ආකාරය දැන ගැනීම පිණිස අගයන ලදී. උද්භිද විෂ සහිත බව පෙන්වන ලක්ෂණ ඇති කළ සල්ෆර්වලට සාපේක්ෂව මෙම නිෂ්පාදනය මනා ක්‍රියාකාරිත්වයක් පෙන්වීය.

- දේශීය වෙළඳපොළෙන් ලබා ගත් ගෝවා ප්‍රභේද බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේදී ස්වාභාවික රෝග ඇතිවිය හැකි තත්වය යටතේ කෘත්‍රිමව ආක්‍රමණය කර බැක්ටීරියා රෝගවලට (*Erwinia carotovora* සහ *Xanthomonas campestris*) ප්‍රතිරෝධී වන/ඔරොත්තු දෙන ආකාරය අගයන ලදී. පරීක්ෂා කර බලන ලද ප්‍රභේද 9 අතරින් නින්ජා සහ සමුරායි යන ප්‍රභේද රෝග දෙකටම ඉහළ මට්ටමින් ඔරොත්තු දෙන බව පෙන්වීය.

- ගෝවාවල දළඹු සංකීර්ණය කළමනාකරණය කිරීමේදී නිර්දේශිත කෘත්‍රිම රසායනය (Chlofluazuron ලී. 1කට මි.ලී. 1) සමඟ වාණිජමය කොහොඹ සම්මිශ්‍රණයක් (Nimbacidine 1% ලී. 1කට මි.ලී.1) සහ කොහොඹ බීජ නිස්සාරකය යෙදීම සසඳා බලන ලදී. කොහොඹ සම්මිශ්‍රණය සහ කෘත්‍රිම රසායනය සමාන ක්‍රියාකාරිත්වයක් පෙන්වා පිළිගත හැකි මට්ටමේ ගෝවා ගෙඩි නිපදවා (ගෙඩියක බර කි.ග්‍රෑ. 1.92) අඩු පළිබෝධ හානියක් (1-10 පරිමාණය තුළ 1.93ක උග්‍රඛවක්) වාර්තා කළේය.

- බෝගයක් තනිව වගා කරනවාට වඩා ගෝවා ලීක්ස් සමඟ පෙළට අන්තර් බෝග වගාවෙන් වඩා වැඩි අස්වැන්නක් (ගෝවා ගෙඩියක බර කි.ග්‍රෑ. 1.81 ලැබුණු බව පර්යේෂණ ප්‍රතිඵල මගින් අනාවරණය විය. කෙසේ වුවද, අනුගමනය කළ අන්තර් බෝග වගා ක්‍රම කිසිවක් තුළින් පළිබෝධ හානියේ අඩුවක් නිරීක්ෂණය කිරීමට නොලැබිණි.

- බෝංචි වගාවේ කරල් විදින්නා (*Marucavitrata*) සඳහා ලී. 1කට ග්‍රෑ. 0.5 සහ 0.75 බැගින් යොදා නව කෘමිනාශක සම්මිශ්‍රණ 2ක් (Virtako 40WG සහ Flubendiamide 20WG) පිළිබඳ ඇගයීම් කටයුතු සිදු කෙරිණි. ප්‍රතිකර්ම යෙදූ (ලී. 1කට මි.ලී. 1 බැගින් නොවැල්ලුරොන් 100g/l Ec) සහ ප්‍රතිකර්ම නොයෙදූ පාලක සමඟ සැසඳීමේදී රසායන 2කම තුළින් අඩු පළිබෝධ ඇතිවීමක් වාර්තා විය. කෙසේ වුවද, ඉහළ මාත්‍රාවක් යෙදීම (ලී.1කට මි.ලී. 0.75) අත්හදා බැලීමේදී කරල් අස්වැන්න සැලකිය යුතු අයුරින් අඩු බව පෙනිණි.

උද්‍යාන බෝග වගාව

- කැල්සියම් ක්ලෝරයිඩ් භාවිතයෙන් අලිපේර ඉදීම පමා කිරීම පිණිස විද්‍යාගාර පරීක්ෂණයක් සිදු කෙරිණි. 4%-6% දක්වා සාන්ද්‍රණයෙන් එම රසායන ද්‍රව්‍යයේ පීඩනය එක්වීමෙන් (මිනි. 120ක කාලයක් පුරා මර්කරි මි.මී. 250) ඉහළම ප්‍රතිඵල ලැබිණි.

පටක රෝපණය

- චාන්ඩ්ලර් නමැති ස්ට්‍රෝබෙරි ප්‍රභේදයේ රිකිලි පුනර්වර්ධනය සහ ගුණනය සඳහා පිළිවෙළින් ටීඩීඑස් ලී. 1කට මි.ග්‍රෑ. 01 සහ බීඒපී ලී. 1කට මි.ග්‍රෑ. 1ක් වශයෙන් එක් කරන ලද එම්එස්මාධ්‍යය යෝග්‍යතම මාධ්‍ය වූ බව පෙනිණි.

මල් වගාව

- සෙ.මී. 20 x 10 සහ සෙ.මී. 30 x 10 යන පැළ පරතරයන් තුළින් සුපර් ඩේසි වගාවෙන් උපරිම මල් නිෂ්පාදනයක් ලබා ගත හැකිය.

- ජලය උරා ගැනීම, මලෙහි නැවුම් බර සහ මල පිපෙන ආකාරය සලකා බැලීමේදී AgNo3, STS සහ සුක්‍රෝස් සුපර් ඩේසි මල් කල් තබා ගැනීම සඳහා ද්‍රාවණ වශයෙන් භාවිත කිරීම සුදුසුය.

ජර්බෙරා මල් නෙළා ගැනීමට සුදුසුතම පරිණත අවධිය වන්නේ පුෂ්ප මණ්ඩලය මත පළමු හා දෙවන පරාග වලයන් දක්නට ලැබෙන අවධියයි.

විශේෂ ව්‍යාපෘති

විමසුමට ලක් කෙරෙන කාලය තුළ මෙම මධ්‍යස්ථානයේදී සිදු කරන ලද පර්යේෂණ කටයුතු හැරුණු විට, නව තාක්ෂණයන් ප්‍රචාරණය කිරීම පිණිස මෙම මධ්‍යස්ථානයේ නිලධාරීන් විසින් විශේෂ ව්‍යාපෘති කිහිපයක්ද ක්‍රියාත්මක කරන ලදී. මෙම ව්‍යාපෘති සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් අරමුදල් සැපයිණි. ඒවායෙහි අවසන් අරමුණ වූයේ ඌව පළාතේ ගොවි ප්‍රජාවේ ජීවන තත්වය ඉහළ නැංවීමයි.

මුල් ඇදුණු කඳ කැබලි මගින් අර්තාපල් බීජ ආකන්ද නිෂ්පාදනය

කුඩා ආකන්ද 34,000කට අධික ප්‍රමාණයක් නිපදවා ඉන් 28,000ක් ඌව පළාතේ ගොවි ප්‍රජාව අතර බෙදා හරින ලදී. මෙම වැඩසටහන සාර්ථක වූ අතර සමහර ගොවීහු පර්යේෂණ මධ්‍යස්ථානයෙන් කුඩා ආකන්ද මිලදී ගැනීමට අදහස් කළහ. මුල් ඇදුණු කඳ කැබලි 60,000කට අධික සංඛ්‍යාවක් කුඩා ආකන්ද නිෂ්පාදනය සඳහා මෙම පර්යේෂණ මධ්‍යස්ථානයේ ඇති අතර නිෂ්පාදනය ගොවීන් අතරද පර්යේෂණ කටයුතු සඳහාද බෙදා හැරෙණු ඇත.

ආදර්ශ ගම්මාන වැඩසටහන

- තාක්ෂණික දැනුම ලබා දීම සහ රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීම සඳහා ආදර්ශ ගම්මාන වශයෙන් ගම්මාන 3ක් හඳුනාගෙන ඇත. කෙසේවුවද, ශ්‍රමය සීමිත වීම මත අවසානයේදී එක් ගම්මානයක් මෙම වැඩසටහන සඳහා තෝරා ගැනිණි. නිෂ්පාදනය වර්ධනය කිරීම සහ නිෂ්පාදනයේ තත්ත්වය ඉහළ නැංවීම පිණිස ගොවීන්ට කෘෂිකාර්මික යෙදවුම් සමහරක් සහ තාක්ෂණය ලබා දෙනු ඇත.

රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

- රහංගල වරණාය නමැති පෙයාර්ස් ප්‍රභේදයේ බද්ධ පැළ 250ක් ගොවීන් අතර බෙදා හැරිණි. බද්ධ පැළ නිෂ්පාදනය සඳහා පෙයාර්ස් ග්‍රාහක 1,300ක් කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ පවතී.

- දෙඩම්වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය අබණ්ඩව සිදු කරන ලද අතර 'ආරෝග්‍යා' නමැති ප්‍රභේදයෙන් බද්ධ පැළ 1,000ක් නිපදවා ඉන් 500ක් ගොවීන්ට අලෙවි කරන ලදී. පයිනැපල් ඔරේන්ජ් බද්ධ පැළ 1200ක් නිපදවා ඉන් පැළ 200ක් උල්පතගම උද්‍යාන බෝග ගොවිපළට ලබා දෙන ලදී.

කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය

- පැඟිරි, තක්කාලි සහ බෝංචි සඳහා ඒකාබද්ධ පැළෑටි පෝෂණ පිළිවෙත් මාලාවක් සකස් කිරීමට මුල පිරිණි. එළවළු සඳහා අක්. 1/2ක ඒකාබද්ධ පැළෑටි පෝෂණ ක්‍රමය ආදර්ශනය කරන ක්ෂේත්‍රයක් ස්ථාපිත කෙරිණි. කොම්පෝස්ට් නිෂ්පාදනය අබණ්ඩව සිදු කර මෙ.ටො. 30.5ක් නිපදවිණි.

සේවා

අභිජනන බීජ නිෂ්පාදනය

- කැප්පෙටිපොල නිල් (කි.ග්‍රෑ. 154), ලංකා බටර් (කි.ග්‍රෑ. 60) සහ කේඩබ්ලිව්පී (කි.ග්‍රෑ. 10) සහ සංජය (කි.ග්‍රෑ. 61) හා වේඩ් (කි.ග්‍රෑ. 3) යන පඳුරු බෝංචි ප්‍රභේදවල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීම් සේවය විසින් සහතික කළ අභිජනන බීජ නිපදවන ලදී.

පාංශු පරීක්ෂණ පදනම් කරගත් පොහොර නිර්දේශ වැඩසටහන

- නියැදි 200කට අධික සංඛ්‍යාවක් පරීක්ෂා කර බලා ඒ අනුව පොහොර නිර්දේශ ලබා දෙන ලදී.

තාක්ෂණ ප්‍රචාරණ කටයුතු

ඌව සහ සබරගමුව යන පළාත්වල පවත්වන ලද පළාත් තාක්ෂණික කාර්ය කණ්ඩායම් රැස්වීම් සඳහා මෙම මධ්‍යස්ථානයේ නිලධාරීහු සහභාගි වූ අතර පූර්ව කන්නමය පුහුණු වැඩසටහන්වලදී ව්‍යාප්ති නිලධාරීන්ට තාක්ෂණික පුහුණුවද ලබා දුන්හ.

මල් බෝග, අර්තාපල්, පෙයාර්ස්, සහ අලිපේර වගාව සම්බන්ධයෙන් ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් රැසක් පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන් සමහරක් ගොවි ක්ෂේත්‍රවලදී පැවැත්විණි.

එළවළු, පලතුරු, මල් බෝග සහ අර්තාපල් වගා කරන ගොවීන්ට පළිබෝධ හා රෝග කළමනාකරණය පිළිබඳ උපදෙස් ලබා දිණි.

පාසැල් සිසුන් 1000කට සහ ගොවීන් 150කට අධික සංඛ්‍යාවක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්විණි.

2012 වර්ෂය සඳහා සැලැස්ම

එළවළු

- පඳුරු සහ වැල් බෝංචිවලට අදාළ ජානික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හද බැලීම් සහ ප්‍රභේද අනුවර්තන අත්හද බැලීම්
- අබවලට අදාළ ජානික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හද බැලීම් සහ ප්‍රභේද අනුවර්තන අත්හද බැලීම්
- ආරක්ෂිත ගෘහ තුළ බෙල් පෙපර් වගා කිරීම සඳහා යොදාගත හැකි කාබනික වශයෙන් පිළිගත හැකි වගා මාධ්‍ය පිළිබඳ අධ්‍යයන
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත දෙමුහුම් තක්කාලි සහ වම්බටුවල මාපිය බීජ නිපදවීම
- වැල් බෝංචි ජනකප්ලාස්ම එක්රැස් කිරීම සහ ඇගයීම
- ලංකා කැරට්වල බීජ හා අල (root) නිෂ්පාදනය සඳහා යෝග්‍ය රෝපණ ඝනත්වය හඳුනා ගැනීම

බීජ නිෂ්පාදනය

බෝංචිවල (කැප්පෙටිපොල නිල්, බලංගොඩ නිල්, ලංකා බටර්, කේඩබ්පී, සන්ජය සහ වේඩ්) අභිජනන බීජ නිෂ්පාදනය

අර්තාපල්

- මුල් ඇදුණු කඳ කැබලි මගින් උසස් තත්වයේ බීජ නිෂ්පාදනය
- සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය සමග සහයෝගයෙන් ජානික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හද බැලීම් සහ ප්‍රභේද අනුවර්තන අත්හද බැලීම් පැවැත්වීම
- ජල රෝපණ ක්‍රමය මගින් බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා තාක්ෂණය ජනනය කිරීම
- කුඩා අර්තාපල් ආකන්ද සහ රිකිළි පැළ අස්වැන්න උපරිම කර ගැනීම සඳහා තාක්ෂණය ජනනය කිරීම

උද්‍යාන බෝග වගාව

- මොණරාගල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, රහංගල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය සහ බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය තුළ දේශීය සහ ජපන් දෙඩම් ප්‍රභේද ඇගයීම
- සෞම්‍ය කලාපීය පලතුරු බෝගවල (ඇපල්, පීච්, පෙයාර්ස්, චීන පේර, නෙක්ටරින්, අලිපේර, කැරම්බෝලා ආදි) මව් පැළ නඩත්තු කිරීම
- දෙඩම්වල ග්‍රාහක ප්‍රභේද සහ ග්‍රාහක ආදිය ඇගයීම
- පෙයාර්ස් සහ පීච්වල පසු අස්වනු ගබඩා කාලය ඉහළ නැංවීම
- පැඟිරිවල මල් හට ගැනීම ප්‍රේරණය කිරීම පිළිබඳ අධ්‍යයන

පැළෑටි සංරක්ෂණය

- එළවළු, පලතුරු, අර්තාපල් සහ මල් බෝගවලට වැළඳෙන පළිබෝධ හා රෝග සඳහා දිලිරනාශක සහ කෘමිනාශක පරීක්ෂා කර බැලීම
- ග්‍රේ මෝල්ඩ් රෝගය (*Botrytis cinerea*) සඳහා රෝස ආර ප්‍රතිරෝධී වන / ඔරොත්තු දෙන ආකාරය ඇගයීම
- මෘදු කුණුවීමේ රෝගයට (*Erwinia carotovora*) අදාළව ගෝවා ප්‍රභේද විද්‍යාගාරයේදී හා කෙත්තුයේදී ඇගයීම
- පැඟිරි සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් සකස් කිරීම
- පොහොර යෙදීම මගින් ජී්බෙරාවල ග්‍රේ මෝල්ඩ් රෝගය සහ නටුව කැඩීයාම පාලනය කිරීම
- බෝංචිවල මුල් කුණුවීම පාලනය සඳහා සමෝධානික රෝග කළමනාකරණ පිළිවෙත් මාලාවක් හඳුනා ගැනීම

- එළවළු වගාවේ පිළිබෝධ පාලනය සඳහා නව කෘමිනාශක අත්හදා බැලීම
- කාබනික වගාවේදී මාළුමිරිස්වල යුෂ උරාබොන පළිබෝධ (පැළ මැක්කන්) කළමනාකරණය
- ගෝවා වගාවේ පළිබෝධ ඇතිවීම කෙරෙහි පෙළට අතුරු බෝග වගා කිරීම මගින් ඇතිවන බලපෑම
- මාළුමිරිස් සහ තක්කාලි වගාවන්හි පළිබෝධ ඇතිවීම අඩුකර ගැනීම සඳහා පැළෑටි නිස්සාරක සහ වසුන් යොදා ගැනීම

මල් වගාව

- ජර්බෙරා ප්‍රචාරණ ද්‍රව්‍ය ඇගයීම
- කපුරු මල්වල තත්වය ඉහළ නැංවීම
- සුපර් ඩේසි මල් සඳහා පසු අස්වනු තත්වය කළමනාකරණය කිරීමේ පිළිවෙත් මාලාවක් සකස් කිරීම
- කැපූ මල් වශයෙන් ගැනීමට තත්වයෙන් උසස් රෝස මල් නිපදවීම සඳහා ප්‍රශස්ත පැළඹනත්වය හඳුනා ගැනීම

පටක රෝපණය

- වර්ධන හෝමෝන මගින් ජර්බෙරාවල මොරෙයියන් නිෂ්පාදනය ඉහළ නැංවීම
- ඔක්ස් අයි ඩේසි මල්වල තත්වය වැඩිදියුණු කිරීම සඳහා රසායනික විකෘතිකාරක සහ පාරජම්බුල කිරණ යොදා ගැනීම
- අර්තාපල්, ඇන්තූරියම්, මැඩෝනා ලිලී සහ ජර්බෙරාවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

පාංශු විද්‍යාව

- බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම් පොහොර මට්ටම් ස්ථාපිත කිරීම
- කෙටිකාලීන කෝලිෆ්ලවර් ප්‍රභේද සඳහා පොහොර පිළිබඳ පිළිවෙත් මාලාවක් සකස් කිරීම
- ආරක්ෂිත ගෘහ තුළ පස් යොදා ගනිමින් බෝග වගා කිරීම සඳහා අඩු පිරිවැයැති පොහොර මිශ්‍රණයක් සකස් කිරීම
- බෝංචි, තක්කාලි සහ පැඟිරි සඳහා ඒකාබද්ධ පැළෑටි පෝෂක ක්‍රමයක් සකස් කිරීම
- පැඟිරිවල පෝෂක ඌනතාව නිසා ඇතිවන රෝග ලක්ෂණ පාලනය කිරීම
- ජල රෝපණය සඳහා මුළුමනින්ම ද්‍රාව්‍ය පොහොර මිශ්‍රණයක් සකස් කිරීම

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරි/ සේවක සංඛ්‍යාව
මධ්‍යස්ථාන භාර පර්යේෂණ නිලධාරි	01
පර්යේෂණ නිලධාරි	18
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි	01
ආර්ථික විද්‍යාඥ සහකාර	01
වැඩසටහන් සහකාර	05
පර්යේෂණ සහකාර	12
කෘෂිකර්ම උපදේශක	12
විද්‍යාගාර උප සහකාර	02

රාජ්‍ය කළමනාකරණ සහකාර	09
කාර්යාල කාර්ය සහායක	03
රියදුරු	07
ට්‍රැක්ටර් ක්‍රියාකරු	03
බද්ධකරු	02
පෙදෙරේරු	01
වඩු කාර්මික	01
මුරකරු	13
සංචාරක බංගලා භාරකරු	01
ස්ථිර කම්කරු	83
කම්කරු (කොන්ත්‍රාත්)	74
එකතුව	**249**

2.2.5 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය - මාකඳුර

මාකඳුර කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ගම්පහ, කුරුණෑගල සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතා සපුරාලීමෙහි නියැළෙයි. මෙම මධ්‍යස්ථානයට අයත් කෘෂිකර්ම පර්යේෂණ ස්ථාන දෙකක් කල්පිටිය හා වනාතවිල්ලුව ද උපයෝගිතා පර්යේෂණ ඒකක තුනක් තඹබෝව, ඉගිනිමිටිය සහ වාරියපොල ද පිහිටා ඇත. මෙමගින් සිදු කරන පර්යේෂණ හා සංවර්ධන කටයුතු ප්‍රධාන වශයෙන්ම ප්‍රදේශයේ බෝග ඵලදායිතාව තිරසාර කිරීම සඳහා පොල් වගාව පදනම් කරගත් බෝග රටාවකට අවශ්‍ය තාක්ෂණයන් ජනනය කර ඒකාබද්ධ කිරීම කෙරෙහි යොමු කර ඇත.

අයවැය

වගු අංක 2.2.5.1: වාර්ෂික අයවැය - 2011 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	3,045,226	1,077,156	35
පුනරාවර්තන	4,622,929	4,638,051	100
කොම්පෝස්ට් නිෂ්පාදනය හා ඒකාබද්ධ පැළෑටි පෝෂණ ක්‍රමය ප්‍රවර්ධනය කිරීම	7,770,000	6,881,135	89
ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම	500,000	447,613	90
පටක රෝපණ ව්‍යාපෘතිය	2,000,000	1,517,465	76
පලතුරු බෝගවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය			
අන්නාසි	330,000	327,651	99
රඹුටන්	100,000	84,601	85
මුල් හා ආකන්ද බෝග	70,000	36,000	51
එකතුව	**18,438,155**	**15,009,672**	**81**

ප්‍රගතිය

පර්යේෂණ

පාංශු විද්‍යාව

- කොම්පෝස්ට් නිෂ්පාදකයින් විසින් එවන ලද කොම්පෝස්ට් නියැදි 130ක් ඒවායෙහි තත්ත්වය ඇගයීම සඳහා විශ්ලේෂණය කරන ලද අතර තවත් නියැදි 117ක් පර්යේෂණවල ප්‍රගතිය දැන ගැනීම සඳහා විශ්ලේෂණය කරන ලදී.
- පාංශු පරීක්ෂාව පදනම් කර ගනිමින් පොහොර නිර්දේශ ලබාදීම සඳහා ලැබුණු පාංශු නියැදි 39ක් විශ්ලේෂණය කෙරිණි.
- පැළැටි නියැදි 27ක් සහ ජල නියැදි 96ක් විශ්ලේෂණය කෙරිණි.

මුල් සහ ආකන්ද බෝග

- මඤ්ඤොක්කාවල 20%ක අස්වනු වර්ධනය සම්බන්ධයෙන් හෝමෝන පරීක්ෂා කිරීම
- බතලවලට අවශ්‍ය පොහොර ප්‍රමාණය පිළිබඳව සිදු කරන ලද අධ්‍යයනයෙන් නයිට්‍රජන්, පොස්ෆරස් සහ පොටෑසියම් 60:140:120 අනුපාතයෙන් යෙදීමෙන් ඉහළ කැපී පෙනෙන මට්ටමේ අස්වනු වර්ධනයක් ලැබුණු බව පෙනිණි.

එළවළු

- දේශීය වට්ටක්කා ප්‍රභේද තෝරාගෙන සංශුද්ධ කිරීමෙන් පසු සහහිජාත ආර නිපදවන ලදී. සහහිජාත ආර 2ක් විවිධ කලාපවල ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්වීම සඳහා උපයෝගී කරගනු ඇත.

මල් වගාව

අමිශ්‍ර ඇමෝනියම් සල්ෆේට් සහිත නයිට්‍රජන් පෝෂකයට හෝ කැල්සියම් නයිට්‍රේට් පොහොරවලට වඩා ඇමෝනියම් ($N - NH_4^+$) හා නයිට්‍රේට් ($N - NO_3^-$) 2:1 සහ 1: 2 අනුපාතයෙන් අන්තර්ගත නයිට්‍රජන් පොහොර ඇන්තූරියම් වගාවේ මල් නිෂ්පාදනයට අවශ්‍ය සමස්ත නයිට්‍රජන් සැපයුම ලබාදීමෙහිලා වඩා ඵලදායී විය.

රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

වගු අංක 2.2.5.2 : 2011 වර්ෂයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

ආයතනය	බෝගය	විකිණූ පැළ සංඛ්‍යාව
කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, මාකඳුර	ඩ්‍රැගන් පෘථි	878
	ඇන්තූරියම්	1020
	අන්නාසි	12,400
	කෙසෙල්	956
කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, කල්පිටිය	දෙළුම්	18,321
	මිදි	1,705
	පේර	2,100

තාක්ෂණ ප්‍රචාරණය

පුහුණු වැඩසටහන්

වගු අංක 2.2.5.3: 2011 වර්ෂයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව

වැඩසටහනෙහි නම	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගි වූ සංඛ්‍යාව
කොම්පෝස්ට්	189	11102
බිම්මල්	5	142
අන්නාසි	5	220
මල් වගාව	10	206
ගෙවතු වගාව	110	5,500
මුල් හා ආකන්ද බෝග		විශ්ව විද්‍යාල සිසුන් 4, ඩිප්ලෝමාලාභීන් 2
ඩ්‍රැගන් පෘථි	10	100
එළවළු		විශ්වවිද්‍යාල සිසුන් - 10 ඩිප්ලෝමාලාභීන් - 15 පාසැල් සිසුන් 100

උපදේශක සේවා සැපයීම

වගු අංක 2.2.5.4 : 2011 වර්ෂයේදී උපදේශක සේවා සැපයූ වාර ගණන

විෂය ක්ෂේත්‍රය	උපදේශ සේවා සැපයූ වාර ගණන
කොම්පෝස්ට්	40
බිම්මල්	125
අන්නාසි	60
මල් වගාව	10
ගෙවතු වගාව	30
මුල් හා ආකන්ද බෝග	05
ඩ්‍රැගන් පෘට්	160
ව්‍යාධිවේදය	75
කීට විද්‍යාව	20
වී	120
එළවළු	25
කෙසෙල්	760

2012 වර්ෂය සඳහා සැලැස්ම

පලතුරු පිළිබඳ අභිජනන සහ පටක රෝපණ කටයුතු

- අන්නාසි දෙමුහුම්කරණ වැඩසටහන
- දෙළුම් දෙමුහුම්කරණ වැඩසටහන
- අනෝදාවල (කටු අනෝදා) විකෘති අභිජනන කටයුතු
- පටක රෝපණ තාක්ෂණික ක්‍රම මගින් අන්නාසි සහ කෙසෙල්වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

පලතුරු පිළිබඳ ශස්‍ය විද්‍යාව

- කෙසෙල් ජනකප්ලාස්ම එක්රැස් කිරීම, ඇගයීම සහ ලක්ෂණීකරණය
- ඩ්‍රැගන් පෘට් වගාව සඳහා ප්‍රශස්ත පැළෂනත්වය සොයා ගැනීම
- කෙසෙල් ප්‍රභේද (සීනි කෙසෙල්) ඇගයීම
- කෙසෙල් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම

කීට විද්‍යාව

- කෙසෙල් වගාවේ පළිබෝධ කළමනාකරණය සඳහා යොදා ගන්නා කාබනික හා සම්ප්‍රදායික ක්‍රම සැසඳීම

පාංශු විද්‍යාව

- පාංශු, ජල, කොම්පෝස්ට් සහ පැළෑටි නියැදි විශ්ලේෂණය
- කල්පිටිය අර්ධද්වීපයේ එළවළු සහ පලතුරු සඳහා පොහොර හා ජල සම්පාදන තාක්ෂණයන් භාවිතය පිළිබඳ සමීක්ෂණය
- අන්නාසිවල අකාබනික පෝෂක අවශ්‍යතාව තක්සේරු කිරීම සහ අමතර නයිට්‍රජන් සහ පොටෑසියම් යෙදීම කෙරෙහි අන්නාසි බෝගය ප්‍රතිචාර දක්වන ආකාරය
- ගම්පහ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල වගා කරන අන්නාසි කෙරෙහි මහා පෝෂක සහ ක්ෂුද්‍ර

පෝෂක බලපාන ආකාරය පිළිබඳ සමීක්ෂණය, පසෙහි ආවේණික ධාරිතාව පිළිබඳ අවකාශමය විචලනය සිතියම් ගත කිරීම සහ ඉහළ ප්‍රමාණයේ හා උසස් තත්වයේ නිෂ්පාදනයකට යෝග්‍යතම පෝෂක කළමනාකරණ පිළිවෙතක් සකස් කිරීම

- පොල් වගාව තුළ ග්ලිරිසීඩියා වැටි වගා කිරීම ඇගයීමට ලක් කිරීම
- ගොටුකොළ අස්වැන්න වර්ධනය කිරීම සඳහා පණු පොහොර යෙදීම ඇගයීම
- කොම්පෝස්ට් තත්වය කෙරෙහි විවිධ මට්ටම්වලින් එප්පාවල රොක් ෆොස්ෆේට් එක් කිරීම බලපාන ආකාරය ඇගයීම

එළවළු

- වට්ටක්කාවල එෆ්1 දෙමුහුම් නිෂ්පාදනය කිරීම සඳහා වඩා සුදුසු මාපිය ආර තෝරා ගැනීමට දේශීය වට්ටක්කා ජනකප්ලාස්ම ඇගයීම
- අමු මිරිස් ප්‍රභේදයක් බිහි කිරීම
- අමු මිරිස් ප්‍රභේදයක් සංශුද්ධ කිරීම
- කරවිල ප්‍රභේදයේ අභිජනන බීජ නිෂ්පාදනය
- පතෝල ප්‍රභේදයේ අභිජනන බීජ නිෂ්පාදනය
- වම්බටු පළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්වීම
- පිපිඤ්ඤා පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්වීම
- මිරිස් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්වීම

මල් වගාව

- වැසි ආවරණ තුළ වගාකරන ඇන්තූරියම් සඳහා පොහොර මිශ්‍රිත ජලය ලබාදීම පිළිබඳ ඇගයීම
- කැපූ මල් නිෂ්පාදනයට ඇන්තූරියම් වගා කිරීම සඳහා ජනකප්ලාස්ම එකතුවක් ස්ථාපිත කිරීම සහ අභිජනන වැඩසටහනක් ආරම්භ කිරීම
- ඩ්‍රැසීනාවල (*Dracaena sanderiana*) පැළ වර්ධනය සහ රෝග මර්දනය කෙරෙහි පණු පොහොර මගින් ඇති කරන බලපෑම

ව්‍යාධිවේදය

- පිදුරු බිම්මල් (*Volvariolla volvacea*) සඳහා වගා මාධ්‍යයක් වශයෙන් කෙසෙල් පත්‍ර යොදා ගැනීමේ හැකියාව පරීක්ෂා කර බැලීම
- මුතුබෙලි බිම්මල් (*Pleurotus ostreatus*) සඳහා වගා මාධ්‍යයක් වශයෙන් පිදුරු යොදා ගැනීමේ හැකියාව පරීක්ෂා කර බැලීම
- ඉඟුරුවලට වැළඳෙන බැක්ටීරියා හිටු මැරීම (*Ralstonia solanacearum*) පාලනය කිරීම පිණිස ඇළුහුණු යෙදීම

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරි /සේවක සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	01
පර්යේෂණ නිලධාරි	11
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි	02
වැඩසටහන් සහකාර	04
කෘෂිකර්ම උපදේශක	23
පර්යේෂණ සහකාර	06
ගොවිපළ ලිපිකරු	01
පර්යේෂණ උප සහකාර	01
රියදුරු	03
කාර්යාල කාර්ය සහායක	01
පෙදරේරු	01
මුරකරු	04
යාන්ත්‍රික ශිල්පි	01
තවාන්කරු	01
විශේෂ කම්කරු	02
විදුලි ශිල්පි	01
සංචාරක බංගලා භාරකරු	01
ට්‍රැක්ටර් ක්‍රියාකරු	03
සනීපාරක්ෂක කම්කරු	01
ජල පොම්ප ක්‍රියාකරු	01
තණකොළ කපන්නා	01
කම්කරු	64
එකතුව	**134**

2.2.6. කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - සීතාඑලිය

සීතාඑලිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය අර්තාපල්, උඩරට එළවළු, තෝරාගත් සෞම්‍ය කලාපීය පලතුරු හා මල් බෝගවල ඵලදායිතාව ඉහළ නැංවීමට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම කෙරෙහි ද ආරක්ෂිත කෘෂිකර්මය සඳහා අවශ්‍යතා පාදක කරගත් පර්යේෂණ කටයුතු සිදු කිරීම කෙරෙහි ද අවධානය යොමු කරයි. මෙම මධ්‍යස්ථානය ජාතික අවශ්‍යතාව සැපිරීම සඳහා අර්තාපල්, ස්ට්‍රෝබෙරි, බේබිස් බ්‍රෙත් හා ප්‍රර්බෙරාවල රෝපණ ද්‍රව්‍ය නිපදවීමේ වගකීම ද දරයි. එයට අමතරව, මෙම මධ්‍යස්ථානය රජයේ ගොවිපළවලට, ගොවීන්ට, ව්‍යාප්ති කාර්ය මණ්ඩලයට සහ විවිධ කාණ්ඩවලට අයත් සිසුන්ට පුහුණුව සහ තාක්ෂණික උපදෙස් ද ලබාදෙයි.

අයවැය

වගු අංක: 2.2.6.1. වාර්ෂික අයවැය - 2011 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	1,187,220	1,182,510	100
පුනරාවර්තන	4,477,001	3,185,029	71
බීජ අර්තාපල් නිෂ්පාදනය පුළුල් කිරීම	5,500,000	5,494,367	100
බීජ අර්තාපල් නිෂ්පාදන තාක්ෂණය වැඩිදියුණු කිරීම	1,100,000	674,234	61
දේශීය තත්වයන්ට සුදුසු නව අර්තාපල් ප්‍රභේද බිහි කිරීම	306,000	304,978	100
පැඟිරි ප්‍රභේද ඇගයීම	100,000	85,904	86
බිලැක් කට් වර්ම් පෙව විද්‍යාත්මකව පාලනය කිරීම	200,000	161,093	81
පටක රෝපණය යොදා ගනිමින් වැදගත්කමක් සහිත බෝගවල උසස් තත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම	3,100,000	1,600,077	52
කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය	1,250,000	1,002,311	80
ආදර්ශ ගම්මාන	100,000	70,398	70
එකතුව	**17,320,221**	**13,760,901**	**75**

ප්‍රගතිය

පර්යේෂණ

ශස්‍ය විද්‍යාව

- 2010/11 අතර කාලයේදී, ආනයනය කරන ලද වාණිජමය අර්තාපල් ප්‍රභේද 20ක් පිළිබඳ ඇගයීම් කටයුතු නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්කවලදී සිදු කරන ලද අතර නව ප්‍රභේද 2ක් (YP 03- 107 සහ Toluka) සම්බන්ධයෙන් උඩරට තෙත් කලාපීය තත්වය යටතේ බලාපොරොත්තු තබාගත හැකි බව සොයා ගැනිණි.

- පෝෂක ද්‍රාවණයේ ප්‍රබලතාව වෙනස් කිරීම මගින් ජල රෝපණ ක්‍රමය යටතේ ගෝල්ඩින් ස්ටාර් නමති අර්තාපල් ප්‍රභේදයේ බීජ නිෂ්පාදනය නිම කරන ලදී.

- බීජ ආකන්ද කැබලිවල ක්‍රියාකාරීත්වය පිළිබඳව අධ්‍යයනය කරන ලද අතර 2011 යල කන්නය තුළ උඩරට තෙත් කලාපීය තත්වය යටතේ සමස්ත ආකන්දය සහ ආකන්ද කැබලි අතර ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් සැලකිය යුතු වෙනසක් නොතිබිණි.

- වාණිජමය අර්තාපල් ප්‍රභේද 2ක් (Calwhite සහ Red La Soda) යාපනය දිස්ත්‍රික්කයේ පර්යේෂණ කළමනාකරණ තත්වය යටතේ බලාපොරොත්තු තබාගත හැකි ලක්ෂණ පෙන්වූ බව සොයා ගැනිණි.

පැළෑටි අභිජනනය

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් යටතේ දේශීය වශයෙන් බිහි කරන ලද අර්තාපල් ආර 10ක් පිළිබඳ ඇගයීම් කටයුතු සිදු කෙරිණි.

- දේශීය වශයෙන් බිහි කරන ලද අර්තාපල් ආර 10ක් අතරින් ආර 189ක් පශ්චිම අංගමාරය, පව්ඩර්රි ස්කැබ් සහ බැක්ටීරියා හිටු මැරීම යන රෝගවලට අදාළව පරීක්ෂා කර බලන ලද අතර එහිදී එම රෝග සඳහා ප්‍රතිරෝධී නොවන බව සොයා ගැනිණි.

- දේශීය වශයෙන් බිහි කරන ලද අර්තාපල් ආර 11ක් උසස් මට්ටමේ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් යටතේ ඇගයීමට ලක් කෙරිණි.

- දේශීය වශයෙන් බිහි කරන ලද අර්තාපල් ආර 7ක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් යටතේ ඇගයීමට ලක් කෙරිණි.

පටක රෝපණය

- ලිමෝනියම් ලැටිෆෝලියම් (*Limonium latifolium*) ඝෂුද්‍ර ප්‍රචාරණය කිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් (Protocol) සකස් කෙරිණි.

- ජිප්සොපිලා පැනිකියුලාටා (*Gypsophila Paniculata*) විශාල වශයෙන් නිපදවීම සඳහා අඩු පිරිවැයැති ක්‍රමවේදයක් (Protocol) සකස් කෙරිණි.

පැළෑටි ව්‍යාධිවේදය

- අමිස්ටාර් සහ ෆ්ලූඅසිනම් යන කෘෂි රසායන අර්තාපල් පශ්චිම අංගමාරය සාර්ථකව පාලනය කිරීමට සමත් වූ බව සොයා ගැනිණි.

- නව දිලීරනාශකයක් වන 'රිඩොමිල් ගෝල්ඩ්' ගොවි ක්ෂේත්‍ර තත්වයන් යටතේ අර්තාපල්වල පශ්චිම අංගමාරය සාර්ථකව පාලනය කිරීමට සමත් විය.

- නව අර්තාපල් ප්‍රභේද කිහිපයක් (YP/07/03/, Toluka, Rosarna, AmbitionසහYp/93/104) පශ්චිම අංගමාරයට ඉතා ඉහළින් ඔරොත්තු දුන් අතර කෘෂි රසායන ඉසින ලද තත්වය යටතේ වඩා වැඩි අස්වැන්නක් ලබා දිණි.

- සැන්තොමොනාස් කැම්පෙස්ට්‍රිස්හි (*Xanthomonas campestris* pv. *Campestris*) එකිනෙකට වෙනස් විසංගත 21ක් විවිධ කෘසිඥේ බෝග කෙරෙහි විවිධ මට්ටමේ හානි ඇති කළ බව පෙනිණි.

- 'ෆ්‍යුට්‍රිෆෝල්'සුකිනි බෝගයට වැළඳි පිටිපුස් රෝගය සාර්ථකව පාලනය කළ බව සොයා ගැනිණි.

- අර්තාපල්වලට වැළඳෙන විවිධ රෝග සම්බන්ධයෙන් පහත සඳහන් අයුරින් නව අර්තාපල් ආර පරීක්ෂා කර බලන ලදී.

- පශ්චිම අංගමාරය සම්බන්ධයෙන් ආර 150

- පව්ඩර්රි ස්කැබ් රෝගය රෝගය සම්බන්ධයෙන් ආර හා ප්‍රභේද 21

- බැක්ටීරියා හිටුමැරීම සම්බන්ධයෙන් ආර 18

කීට විද්‍යාව

- ගොවි ක්ෂේත්‍ර තත්වයන් යටතේ ලිරියොමයිසා හ්‍යුඩොබ්‍රෙන්සිස් (*Liriomyza huidobrensis*) කීට අවධිවලදී පාලනය කිරීම සඳහා ඇබමෙක්ටින් EC නව සම්මිශ්‍රණය ලී 1.ට ග්‍රෑ.36 බැගින් යෙදීමට නිර්දේශ කරන ලදී.

- අර්තාපල්වල සුදු මැස්සන් සහ පැළ මැක්කන් පාලනය සඳහා තයමෙතොක්සම් 75 WG හෙ. 1ට ග්‍රෑ. 50 බැගින් යෙදීමට නිර්දෙශ කෙරිණි.

- එළවළු පත්‍ර කණින්නාගේ (*Liriomyza huidobrensis*) කීට අතුරුරුවට අදාළ පෙව විද්‍යාව පිළිබඳව අධ්‍යයනය කරන ලද අතර පළමු, දෙවන සහ තෙවන කීට අවධි වර්ධනයට ගතවන කාලය හඳුනා ගන්නා ලදී.

- ඇග්‍රියොටිස් ඉප්සිලන් (*Agriotis ipsilon*) විසින් ඇති කරන හානිය ක්ලෝරැන්ට්‍රනිලිප්‍රෝල් SC ලී. 1ට ග්‍රෑ. 200 සහ වර්ටකෝ 20 WG (ක්ලෝරැන්ට්‍රනිලිප්‍රෝල්+තයමෙතොක්සම්) මගින් වඩා හොඳින් පාලනය විය.

පාංශු විද්‍යාව

- ජල රෝපණ ක්‍රමය සඳහා නව සම්මිශ්‍රණ 2ක් සකස් කර ඇල්බට්ගේ ද්‍රාවණය සමග සසඳා බලන ලදී.එක් සම්මිශ්‍රණයක් ඇල්බර්ට්ගේ ද්‍රාවණයට සමාන නමුදු ඒ සඳහා නවීකරණයන් කිරීම අවශ්‍යය.

එළවළු

- ග්‍රීන් ලේක්, ස්කයි ලයින් සහ බ්‍රොන්කෝ නමැති ගෝවා ප්‍රභේද 3 උඩරට තෙත් කලාපීය තත්වය යටතේ මනා ක්‍රියාකාරිත්වයක් දැක්වූ අතර ඒවා ආනයනය කිරීම නිර්දේශ කරන ලදී.

- බ්‍රිකෝරෙස් නමැති නව බීට් ප්‍රභේදය උඩරට තෙත් කලාපීය තත්වය යටතේ ඉහළ අස්වැන්නක් ලබා දුන් අතර පළිබෝධ හා රෝගවලට ද ඔරොත්තු දිණි. මෙම ප්‍රභේදය ආනයනය කිරීමට නිර්දේශ කෙරිණි.

- රූබෙක්ස් (රෙඩ් ලොලෝ රෝසා වර්ගය), ඔපෙල් (රෙඩ් ලොලෝ රෝසා වර්ගය), මාබිල් සහ ජේඩ් යන සලාද කොළ ප්‍රභේද උඩරට තෙත් කලාපීය තත්වය යටතේ මනා ක්‍රියාකාරිත්වයක් දැක්වූ අතර ආනයනය සඳහා නිර්දේශ කෙරිණි.

සංවර්ධන කාර්යයන්

ශස්‍ය විද්‍යාව

- පීං කුඩා ආකන්ද 402,330ක් නිපදවා එයින් ආකන්ද 252,330ක් ආරක්ෂිත ගෘහ තුළ සහ විවෘත ක්ෂේත්‍රයේ බීජ නිෂ්පාදනය සඳහා ගොවීන්ට නිකුත් කරන ලදී. ඉතිරි ප්‍රමාණය 2013 වර්ෂයේදී බෙදා හැරීම සඳහා ගබඩා කර තැබිණි.

- කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල් ව්‍යාපෘතිය යටතේ ගොවි ක්ෂේත්‍රයේ ජල රෝපණ ඒකක 7ක් ස්ථාපිත කෙරිණි.

- සීතා එළියේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථාන ඒකකය සඳහා වායු රෝපණ ඒකකයක් (ව.මී. 300) ඉදිකරන ලදී.

- කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල් ව්‍යාපෘතිය යටතේ පර්යේෂණ ස්ථානයේ නව ජල රෝපණ ඒකකයක් (ව.මී. 44) ඉදි කෙරිණි.

පටක රෝපණය

රෝගවලින් තොර නලස්ථ පැළ නිෂ්පාදනය

අර්තාපල්

ගැනෝලා ප්‍රභේදයේ නලස්ථ පැළ 1,906ක් නිල බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන සඳහා නිකුත් කරන ලද අතර තවත් නලස්ථ පැළ 2,953ක් පර්යේෂණ කටයුතු සඳහා නිකුත් කෙරිණි.

ස්ට්‍රෝබෙරි

නලස්ථ පැළ 432ක් සහ නලස්ථව ජනනය කළ රෝපණ ද්‍රව්‍ය 10,037ක් සෘජුව සහ නුවරඑළිය පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා ගොවීන්ට ලබාදෙන ලදී. පැළ 1,121ක් පර්යේෂණ ස්ථානයේ ධාවක නිෂ්පාදනය සඳහා භාවිත කෙරිණි.

මල් බෝග

බේබිස් බ්‍රෙත් පැළ 3430ක්, මැඩෝනා ලිලී පැළ 3007ක් සහ ජර්බෙරා පැළ 100ක් නිපදවා පෞද්ගලික වගාකරුවන් සඳහා නිකුත් කරන ලදී.

කීට විද්‍යාව

රජයේ බීජ අර්තාපල් ගොවිපළවලින් ලද පාංශු නියැදි 1,384ක් විශ්ලේෂණය කරන ලද නමුත් රන්වන් කෝෂ්ඨ වපණුවන් දක්නට නොලැබිණි.

ව්‍යාධිවේදය

- බැක්ටීරියා හිටු මැරීමට අදාළව පාංශු නියැදි 1,384ක් විශ්ලේෂණය කරන ලදී.

- රෝග නිශ්චය කර ගැනීම සඳහා පැළෑටි නියැදි 15ක් ලැබුණු අතර ඒවා සඳහා නිර්දේශ ලබා දෙන ලදී.

- මුතු බෙලි බිම්මල් බීජ කි.ග්‍රෑ. 12ක් සහ බොත්තම් බිම්මල් බීජ කි.ග්‍රෑ. 3ක් ගොවීන් අතර බෙදා හරින ලදී.

පාංශු විද්‍යාව

- පොහොර නිර්දේශ සඳහා පාංශු පරීක්ෂා කිරීම

  පීඑච් අගය - 242
  ෆොස්ෆරස් - 99
  පොටෑෂ් - 99

- කොම්පෝස්ට් මෙ.ටො. 60ක් නිපදවන ලදි.

තාක්ෂණය බෙදා හැරීම

ගොවීන්	-	200
කෘෂිකර්මය හා සම්බන්ධ නිලධාරීන්	-	250
විශ්වවිද්‍යාල සිසුන්	-	155
කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුන්	-	221
වෘත්තීය පුහුණුව ලබන සිසුන්	-	04
පාසැල් සිසුන් (කෘෂිකර්මය)	-	67
පාසැල් සිසුන්	-	392

වෙනත් කාර්යයන්

ආදර්ශ ගම්මාන වැඩසටහන

ස්ට්‍රෝබෙරි, අර්තාපල් හා මල් බෝග සහ බිම්මල් වගා කිරීම සඳහා මීපිලිමාන, ජයලංකා හා කටුමාන යන ගම්මාන 3න් ගොවිනු 64දෙනෙක් තෝරා ගන්නා ලදහ. පුහුණු වැඩසටහන් 9ක් පවත්වා ආදර්ශන 6ක්ද සිදු කෙරිණි.

2012 වර්ෂය සඳහා සැලැස්ම

පර්යේෂණ

ශස්‍ය විද්‍යාව

- වාණිජමය අර්තාපල් ප්‍රභේද 4ක් ඇගයීම
- පූර්ව මූලික සහ මූලික බීජ නිෂ්පාදනය සඳහා නව තාක්ෂණයන් ජනනය කිරීම
- කුඩා ආකන්ද සහ බීජ ආකන්දවල විවිධ පරම්පරාවලට අදාළ ගබඩා අධ්‍යයන
- උඩරට තෙත් කලාපීය තත්වය යටතේ අර්තාපල් ආකන්ද කැබැලිවල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කර බැලීම

පැළෑටි අභිජනනය

- අධික උෂ්ණත්වයට ඔරොත්තු දෙන වාණිජමය ප්‍රභේද ඇගයීම
- සුදුසු ලක්ෂණවලින් සමන්විත වන්නේදැයි දැන ගැනීම සඳහා නව අර්තාපල් ආර ඇගයීම
- නව අර්තාපල් ප්‍රභේද බිහි කිරීම
- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් / ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්

පටක රෝපණය

- පෙයාර්ස් සහ පැඟිරිවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ අධ්‍යයනය
- බැක්ටීරියා හිටු මැරීමට ප්‍රතිරෝධී ප්‍රභේද බිහි කිරීම සඳහා අර්තාපල්වල විකෘති අභිජනනය
- අර්තාපල්වල පරාගධානි රෝපණය
- පැළයකට ක්ෂුද්‍ර ආකන්ද සංඛ්‍යාව වැඩි කර ගැනීම සහ සුදුසු ගබඩා තත්වයන් හඳුනා ගැනීම

පැළෑටි ව්‍යාධිවේදය

- පව්ඩර්රි ස්කැබ්, පශ්චිම අංගමාරය සහ බැක්ටීරියා හිටු මැරීම යන රෝගවලට අදාළව අර්තාපල් ප්‍රභේද පරීක්ෂා කර බැලීම
- අර්තාපල් වගාවට වැළඳෙන පව්ඩර්රි ස්කැබ්, පශ්චිම අංගමාරය සහ බැක්ටීරියා හිටු මැරීම යන රෝගවලට ප්‍රතිරෝධී අභිජනන ආර පරීක්ෂා කර බැලීම
- පශ්චිම අංගමාරය සඳහා දිලීරනාශක පරීක්ෂා කර බැලීම
- කෘසිෆෙරේ කුලයේ බෝගවල සැන්තොමොනාස් (*Xanthomonas*) ආසාදන කළමනාකරණය
- බැක්ටීරියා හිටු මැරීම සම්බන්ධයෙන් පාංශු නියැදි පරීක්ෂා කර බැලීම
- රජයේ ගොවිපළවල සහ ගොවි ක්ෂේත්‍රවල පව්ඩර්රි ස්කැබ් අසාදනය පිළිබඳ තක්සේරුවත් කිරීම
- සුකිනි බෝගය සඳහා කෘෂි රසායන පරීක්ෂා කර බැලීම
- අර්තාපල් නලස්ථ පැළවල ඇති වයිරස් හඳුනා ගැනීම

- ගෝවවල ඇතිවන මයිකොස්පේරෙල්ලා (*Mycosphaerella*) ආසාදන පාලනයට දිලීරනාශක පරීක්ෂා කර බැලීම

- අර්තාපල් වගා ක්ෂේත්‍රවල රැල්ස්ටොනියා සොලෙනේසියාරුම් (*Ralstonia solanacearum*) ගහනය කෙරෙහි කුකුල් පොහොර මගින් ඇති කරන බලපෑම

කීට විද්‍යාව

- බිලැක් කට් වර්ම් පේව විද්‍යාත්මකව පාලනය කිරීම

- ඩිග්ලිපස් අයිසේ (*Diglyphu isaea*) විශාල වශයෙන් බෝ කිරීම සහ වර්ධනය කර ගැනීම

- රජයේ බීජ ගොවිපළවල අර්තාපල් වගාවේ සිටින රන්වන් කෝෂ්ඨ වට පණුවන් පිළිබඳව නිරීක්ෂණය කිරීම

- බීටි බැක්ටීරියාව යොදා ගනිමින් සුදු කම්බිලි පණුවන් පේව විද්‍යාත්මකව පාලනය කිරීම

- බිලැක් කට් වර්ම් පාලනය සඳහා නව කෘමිනාශක පරීක්ෂා කර බැලීම

- දියමන්ති පිට සලබයා පේව විද්‍යාත්මකව පාලනය කිරීම

- අර්තාපල් වගාවේ යුෂ උරාබොන පළිබෝධ සංකීර්ණය පාලනයට නව කෘමිනාශක පරීක්ෂා කර බැලීම

- පේර වගාවේ මූල ගැටිති නෙමටෝඩාවන් කළමනාකරණය කිරීම

පාංශු විද්‍යාව

- ජල රෝපණ හා වායු රෝපණ ක්‍රම සඳහා පෝෂක සහිත විවිධ ද්‍රාවණ පරීක්ෂා කර බැලීම

- පෝෂක කළමනාකරණය සහ ක්ෂුද්‍ර ජීවී ක්‍රියාකාරීත්වය මගින් ඵලදායිතාව ඉහළ නැංවීම

- බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා නව පොහොර මිශ්‍රණයක් පරීක්ෂා කර බැලීම

- පරිභෝජනයට ගන්නා අර්තාපල් නිෂ්පාදනය සඳහා නව පොහොර මිශ්‍රණයක් පරීක්ෂා කර බැලීම

- අර්තාපල් වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි නයිට්‍රජන් යොදන කාලය මගින් ඇති කරන බලපෑම

- ඉඩම් වැඩිදියුණු කිරීම සහ පාංශු සංරක්ෂණය

එළවළු

- කැරට් සහ බීට් සඳහා බීජ නිෂ්පාදන තාක්ෂණයන් ජනනය කිරීම

- විදේශීය එළවළු ප්‍රභේද ඇගයීම (කැරට්, ගෝවා, ලීක්ස්)

- ලංකා බෝල රාබුවල අභිජනන බීජ නිෂ්පාදනය

සංවර්ධන කාර්යයන්

ශස්‍ය විද්‍යාව

- පූර්ව මූලික බීජ මිලියන 2ක් නිෂ්පාදනය කර ගොවීන් අතර බෙදා හැරීම

- පර්යේෂණ ස්ථානයේ නව වායු රෝපණ ඒකකයක් ස්ථාපිත කිරීම

- ගොවිපළ අංශයේ ජල රෝපණ ඒකකයක් ස්ථාපිත කිරීම

පටක රෝපණය

- අර්තාපල්වල රෝගවලින් තොර නලස්ථ මව් පැළ නිෂ්පාදනය

- චාන්ද්ලර් නමැති ස්ට්‍රෝබෙරි ප්‍රභේදයේ තත්වයෙන් උසස් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

- මල් බෝග එක්රැස් කිරීම සහ නඩත්තු කිරීම (බේබිස් බ්‍රෙත්, මැඩෝනා ලිලී, ජර්බෙරා හා ලිමෝනියම්)

- අර්තාපල්වල රෝගවලින් තොර ක්ෂුද්‍ර ආකන්ද නිෂ්පාදන

කාර්ය මණ්ඩලය

තනතුර	**නිලධාරි / සේවක සංඛ්‍යාව**
ස්ථාන භාර පර්යේෂණ නිලධාරී	01
පර්යේෂණ නිළධාරී	09
වැඩසටහන් සහකාර	03
පර්යේෂණ සහකාර	04
කෘෂිකර්ම උපදේශක	05
පර්යේෂණ උප සහකාර	02
රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය	04
මුරකරු	01
කම්කරු	18
කම්කරු (කොන්ත්‍රාත්)	39
එකතුව	86

2.2.7 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල

මාතර දිස්ත්‍රික්කයේ ස්ථානගත කර ඇති තෙලිජ්ජවිල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය යටතේ පවතින උප ආයතනයකි. මෙය දකුණු පළාතේ ඇති කෙෂ්ත්‍ර ගැටලුවලට පිලියම් යෙදීම සඳහා අවශ්‍ය පර්යේෂණ කටයුතුවල නියැළීමේ වගකීම දරයි. පලතුරු සහ බිම්මල්, මුල් හා ආකන්ද බෝග ඇතුළු එළවළුවලට අදාළ ශස්‍ය විද්‍යාව හා පැළෑටි සංරක්ෂණය මෙහි ප්‍රධාන පර්යේෂණ කෙෂ්ත්‍ර වේ. එයට අමතරව, සංවර්ධන වැඩසටහන් යටතේ ආදර්ශ ගම්මාන, කාබනික පොහොර නිෂ්පාදනය සහ ප්‍රචලිත කිරීම, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ ගොවිපළ සංවර්ධනය ආදී කටයුතු ද ක්‍රියාවට නැංවිණි.

අයවැය

වගු අංක 2.2.7.1 : වාර්ෂික අයවැය - 2011 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
පුනරාවර්තන	3,247,222	3,205,315	99
මූලධන	1,192,540	1,048,021	88
ව්‍යාපෘති			
○ කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය	200,000	199,110	100
○ පලතුරු පැළ නිෂ්පාදන වැඩසටහන	600,000 500,000	594,286 495,979	99 99
○ ආදර්ශ ගම්මාන වැඩසටහන	2,379,000	2,333,562	98
○ ගොවිපළ සංවර්ධන සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය			
එකතුව	**8,118,762**	**7,876,273**	**97**

ප්‍රගතිය

අන්නාසි වගාවන්හි වල් පැළෑටි පාලනය කිරීම සඳහා සුදුසු ආවරණ බෝග හඳුනා ගැනීම

සාර්ථක සහ පාරිසරික වශයෙන් හිතකර වල් පැළෑටි පාලන තාක්ෂණික ක්‍රම බිහි කරන ලදී. මුකුණුවැන්න අමතර ආදායමක් ජනනය කරන අතරම භූමිය සඳහා සාර්ථක ආවරණයක් සැපයීමට සමත් විය. එයට අමතරව, මෙම තාක්ෂණික ක්‍රමය තුළින් මතු වූ ප්‍රායෝගික ගැටලු හඳුනා ගැනිණි.

රෝපණ ද්‍රව්‍ය ආසාදනය කරන අන්නාසි හිටු මැරීමේ වයිරසය කෙරෙහි පිටි මකුණා තුරන් කර දමන තාප ප්‍රතිකර්මය මගින් ඇති කරන බලපෑම පරීක්ෂා කර බැලීම

තාප ප්‍රතිකර්මයට ලක් කරන ලද (මිනි. 3 - 4ක කාලයක් පුරා සෙ. 60°ක උෂ්ණත්වයේ) මව් කරඬු, රෝපණ ද්‍රව්‍ය වශයෙන් පිටි මකුණාගෙන් සහ අන්නාසි මැලවීමේ වයිරසයෙන් තොර (විද්‍යාගාර පරීක්ෂාව තුළින් සනාථ කරන ලද) මොරෙයියන් නිපදවීමට සමත් විය.

අන්නාසිවල හා කෙසෙල්වල පත්‍ර වර්ගඵලය තක්සේරු කිරීම සඳහා හානිකර නොවන ක්‍රමයක් බිහිකිරීම

පත්‍රවලට හානියක් නොවන පරිදි අන්නාසි සහ කෙසෙල්වල පත්‍ර වර්ගඵලය තක්සේරු කිරීම සඳහා වඩාත්ම සුදුසු සංඛ්‍යානමය ශ්‍රිතයක් නිර්මාණය කෙරිණි.

මුතු බෙලි බිම්මල් වගාව සඳහා යොදාගත් මාධ්‍යය පසුව සිදු කෙරෙන වගාව සඳහා භාවිත කිරීමේ හැකියාව

බිම්මල් වගාව සඳහා සාමාන්‍යයෙන් භාවිත කරන මාධ්‍යයට මුතුබෙලි බිම්මල් වගාව සඳහා භාවිතා කළ මාධ්‍යය 50%ක

ප්‍රමාණයෙන් එක් කිරීමෙන් බිම්මල් අස්වැන්න දෙගුණයකින් වැඩි වූ බව හඳුනා ගැනීමට හැකිවිය.

මුතුබෙලි බිම්මල් වගාව සඳහා එකිනෙකට වෙනස් ඉවත ලන ද්‍රව්‍ය වර්ග 4ක් භාවිත කිරීමේ හැකියාව

බිම්මල් වගාව සඳහා සාමාන්‍යයෙන් යොදා ගන්නා මාධ්‍යයට දහයියා එක් කිරීම මගින් මාධ්‍යයේ පෝව විද්‍යාත්මක කාර්යක්ෂමතාව වර්ධනය වේ.

ෆ්‍යුසේරියම් මැලවීමේ රෝගයට ප්‍රතිරෝධිතාව/ඔරොත්තුදීමේ හැකියාව ඇති කිරීම සඳහා කෙසෙල්වල නලස්ථ විකෘති ජනනය

'අග්‍රා' නමැති වගා ප්‍රභේදයේ රෝපිත ස්ථාපිත කරන ලදී.

තුඹ කරවිල ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීම

ප්‍රභේද 3ක රෝපිත මාධ්‍ය 2ක් තුළ ස්ථාපිත කරන ලදී.

මෑ සහ වම්බටු පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහන්

අදාළ ක්ෂේත්‍ර ඇගයීම් සිදු කෙරෙමින් පවතී.

විශේෂ ව්‍යාපෘති ප්‍රගතිය

පලතුරු පැළ නිෂ්පාදන වැඩසටහන

- සාමාන්‍ය ක්‍රමයෙන් කෙසෙල් මොරෙයියන් 8,200ක් පමණ නිපදවා දිවි නැගුම වැඩසටහන් සඳහා බෙදා හරින ලදී.

- අන්නාසි මොරෙයියන් 47,000ක් පමණ නිපදවා ආදර්ශ ගම්මාන වැඩසටහන් යටතේ වගාකරුවන්ගේ ඉල්ලීම පරිදි ව්‍යාප්ති අංශය වෙත නිකුත් කරන ලදී.

ආදර්ශ ගම්මාන වැඩසටහන

- ආදර්ශ ගම්මාන 6ක් ස්ථාපිත කෙරිණි.
- වාණිජමය පරිමාණයේ පැළ තවාන් 2ක් හා වාණිජමය පරිමාණයේ කොම්පෝස්ට් සැකසුම් ඒකක 2ක් ස්ථාපිත කෙරිණි.
- ගොවීන් 65දෙනෙකුට පමණ රෝපණ ද්‍රව්‍ය සහ වෙනත් යෙදවුම් ලබා දිණි.
- පුහුණු පංති 6ක් පවත්වන ලදී.

කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය

- කොම්පෝස්ට් ටො. 25ක් පමණ නිපදවිණි.
- මුහුන් ටො. 3ක් නිපදවා කි.ග්‍රෑ. 5 මුහුන් මලු 400ක් බෙදා හරින ලදී.

ගොවිපළ සංවර්ධනය සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

- රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

අන්නාසි	-	25,000
වැල් දෙඩම්	-	1,000
කිරි අල	-	16,000
මඤ්ඤොක්කා	-	මී. 500
කෙසෙල්	-	10,000
කොළ එළවළු	-	ග්‍රෑ. 250

- කි.මී. 1ක් පමණ දිග වැටක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගන්නා ලදී.
- පුවක් ගස් 2000ක් රෝපණය කරන ලදී.
- බද්ධ කොස් පැළ 50ක් සහ බීජ පැළ 450ක් ස්ථාපිත කරන ලදී.
- රෝගී පොල් ගස් 305ක් ගලවා දමන ලදී.
- මායිමේ පිහිටි පොල් ගස් 1000කට පමණ පොහොර යොදන ලදී
- හෙ. 5ක පමණ ගොවිපළ ඉඩම් සංවර්ධනය කරන ලදී.
- බඳුන්ගත කිරීමේ ගෘහයක් සහ කෙෂ්තු ගබඩාවක් අර්ධ වශයෙන් ඉදි කෙරිණි.
- බිම්මල් නිෂ්පාදන ඒකකය සඳහා ගබඩා කාමරයක් අර්ධ වශයෙන් ඉදි කෙරිණි.
- ළිඳක් කැණා ජල සම්පාදන පද්ධතියක් ස්ථාපිත කරන ලදී.

යටිතල පහසුකම් සංවර්ධනය

- වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් නිම කෙරිණි.
- වාහන 2ක් අලුත්වැඩියා කෙරිණි.
- කම්කරුවන් සඳහා විවේකාගාරයක් ඉදි කෙරිණි.
- ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු නිම කෙරිණි.
- අත්පත් කර ගැනීමෙන් පසු ගොවිපළ ඉඩම් සඳහා විධිමත් පිඹුරක් සකස් කෙරිණි.

2012 වර්ෂය සඳහා සැලැස්ම

- කෙසෙල්, අන්නාසි, අඹ, කිරිඅල, පැඟිරි, පේර, ඌන උපයෝජිත පලතුරු බෝග, බිම්මල් සහ එළවළු සම්බන්ධයෙන් දැනට කෙරීගෙන යන පර්යේෂණ වැඩසටහන් අඛණ්ඩව සිදු කිරීම
- අන්නාසි සඳහා ඵලදායී පෝෂක සංයෝගයක් සකස් කිරීම
- කෙසෙල්වල ඵලදායිතාව සහ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා පෝෂක (පොටෑසියම්) කළමනාකරණය
- ෆ්‍යුසේරියම් මැලවීමේ රෝගයට ඔරොත්තු දීමේ හැකියාව ඇති කිරීම සඳහා කෙසෙල්වල නලස්ථ විකෘති ජනනය
- තුඹ කරවිල ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීම
- එළවළු සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පැවැත්වීම
- එළවළු සඳහා අභිජනන වැඩසටහන් පැවැත්වීම
- මුතුබෙලි බිම්මල් වගාවට යොදා ගැනීම සඳහා පෙර භාවිත කළ මාධ්‍ය වර්ග 4ක් පරීක්ෂා කර බැලීම
- ප්‍රමාදව මුදා හැරෙන පෝෂක යොදා ගනිමින් මුතුබෙලි බිම්මල් වගාව සඳහා මාධ්‍ය සකස් කිරීම
- මුතු බෙලි බිම්මල් වගාව සඳහා වර්ධන මාධ්‍යය ප්‍රශස්ත කිරීම

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරි/සේවක සංඛ්‍යාව
ස්ථාන භාර පර්යේෂණ නිලධාරි	01
පර්යේෂණ නිලධාරි	02
කෘෂිකර්ම උපදේශක	06
පර්යේෂණ සහකාර	02
පර්යේෂණ උප සහකාර	01
වැඩසටහන් සහකාර	03
රාජ්‍ය කළමනාකරණ සහකාර	03
රියදුරු	02
මුරකරු	04
සනීපාරක්ෂක කම්කරු	01
කම්කරු	04
කම්කරු (කොන්ත්‍රාත්)	35
එකතුව	**64**

2.2.8 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - ගිරාඳුරුකෝට්ටේ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් 1980 වර්ෂයේදී ස්ථාපිත කරන ලද ගිරාඳුරුකෝට්ටේ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය කෘෂිකාර්මික පර්යේෂණ හා සංවර්ධන කටයුතුවල නිරතවීමේ සහ විශේෂයෙන්ම මහවැලි 'සී' කලාපයේ ගොවි ප්‍රජාව විසින් සිදු කරන බෝග නිෂ්පාදනයට අදාළ ක්ෂේත්‍ර ගැටලුවලට පිළියම් යෙදීමේ වගකීම දරයි. පර්යේෂණ සහ නිෂ්පාදන වැඩසටහන්වලට අමතරව, මෙම පර්යේෂණ ස්ථානය විසින් නිලධාරීන්, ගොවීන් සහ ශිෂ්‍යයින් සඳහා නිතිපතා පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

අයවැය

වගු අංක 2.2.8.1 : වාර්ෂික අයවැය - 2011 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	2,566,243	2,238,813	87
පුනරාවර්තන	2,945,929	2,874,652	98
ව්‍යාපෘති			
○ දෙමුහුම්, බඩ ඉරිඟු ('සම්පත් ප්‍රභේදය') බීජ නිෂ්පාදන වැඩසටහන	300,000	275,880	92
○ කාබනික පොහොර නිෂ්පාදන හා ප්‍රවර්ධන ව්‍යාපෘතිය	500,000	450,392	90
○ කෙසෙල් පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම	50,000	49,667	99
○ ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම - පැඟිරි වගා ව්‍යාපෘතිය	100,000	99,685	100
○ බිත්තර වී නිෂ්පාදනය - බීපී - 250	400,000	359,294	90
○ බිත්තර වී නිෂ්පාදනය - බීපී - 366	630,000	303,590	48
○ පැපොල් බීජ නිෂ්පාදන වැඩසටහන (රත්න ප්‍රභේදය)	400,000	225,209	56
○ ආදර්ශ ගම්මාන වැඩසටහන	100,000	63,5444	64
එකතුව	**7,992,172**	**6,940,726**	**87**

පර්යේෂණ

පලතුරු

- දේශීය හා හඳුන්වා දෙන ලද පැඟිරි ප්‍රභේද පිළිබඳ ප්‍රභේදීය ඇගයීම් කටයුතු අඛණ්ඩව සිදු කිරීම

  - දේශීය ප්‍රභේද 7 - ආරෝග්‍යා, බිබිල ස්වීට්, එම්කේඩී, රහංගල වරණය, එච්ඕසිආර් 23, එච්ඕසිආර් 25 සහ එච්ඕසිආර් 29

  - ජපානයෙන් හඳුන්වා දෙන ලද ප්‍රභේද : එන්සීඑන්, එම්වයිජී, ඕටිඒ්, එන්ඒඑන්, කේවයිඑම්, එස්ආර්ඩී සහ වයිඑස්ඩී

- පැපොල් සහ අන්නාසිවල වර්ධන මට්ටම කෙරෙහි විවිධ කාබනික සහ රසායනික සංයෝග මගින් ඇති කරන බලපෑම

වී (ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම්)

මාස 2 1/2, මාස 3, මාස 31/2 වයස් කාණ්ඩවලට අයත් ප්‍රභේද 2011 වර්ෂයේදී පරීක්ෂා කර බලන ලදී.

එළවළු

- පහත සඳහන් එළවළු වර්ගවලට අදාළව ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම් පවත්වන ලදී.
  - වම්බටු - ප්‍රභේද 5
  - මෑ - ප්‍රභේද 7

- බණ්ඩක්කා ප්‍රභේද 4ක් සඳහා ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පවත්වන ලදී.

බීජ නිෂ්පාදන වැඩසටහන

දෙමුහුම් බඩ ඉරිඟු බීජ නිෂ්පාදනය

හෙ. 1ක දෙමුහුම් බඩ ඉරිඟු බීජ නිෂ්පාදන ක්ෂේත්‍රයක් ස්ථාපිත කර නිපදවන බීජ පැල්වෙහෙර ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරයාට බාර දෙන ලදී. ඉන් බීජ කි. ග්‍රෑ. 22ක් අලෙවි කෙරිණි.

බිත්තර වී නිෂ්පාදනය

2011 වර්ෂයේදී බීජී 250 ප්‍රභේදයේ බිත්තර වී මෙ.ටො. 28.6ක් නිපදවන ලදී.

රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

වගු අංක 2.2.8.2 : 2011 වර්ෂයේ නිපදවන ලද රෝපණ ද්‍රව්‍ය

බෝගය	ප්‍රභේදය	නිෂ්පාදනය
කෙසෙල්	සීනි කෙසෙල්, ඇඹුල් කෙසෙල්, කෝලිකුට්ටු, අළු කෙසෙල්, කණ්ඩුල සහ වෙනත් ප්‍රභේද	මොරෙයියන් 683ක්
පැපොල්	රත්න	බඳුන්ගත පැළ 499
අන්නාසි	මරිෂස්	බඳුන්ගත පැළ 1,452
කිරිඅල	ඉසුරු	පැළ 300
මඤ්ඤෙදුක්කා	කිරිකවඩි සහ ජැෆ්නා වරණය	මී. 518ක දඬුකැබලි
බතල	ගන්නෝරුව සුදු රණබිම අමා	වැල් කැබලි කි.ග්‍රෑ. 55

ඇඹරුල්ලා ඩ්‍රැගන්පෘට් පැෂන්පෘට්	ධවල කෙටි	බඳුන්ගත පැළ 10 බඳුන්ගත පැළ 07 බඳුන්ගත පැළ 200

කොම්පෝස්ට් නිෂ්පාදන සහ ප්‍රවර්ධන වැඩසටහන

කොම්පෝස්ට් මෙ.ටො. 41ක් නිපදවන ලදී. එමෙන්ම නිපදවන ලද මුහුන් කි.ග්‍රෑ. 4,000න් කි.ග්‍රෑ. 1,990ක් බෙදා හරින ලදී. පුද්ගලයින් 398දෙනෙකුට කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳ පුහුණුව ලබාදිණි.

තාක්ෂණප්‍රචාරණය

2011 වර්ෂය තුළ ගිරාඳුරුකෝට්ටේ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේදී පුහුණු වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදී.

- ආදර්ශ ගම්මන වැඩසටහන (20 දෙනෙකු සඳහා වැඩසටහන් 2)
- කෙසෙල් සහ අන්නාසි මිශ්‍ර වගා ක්ෂේත්‍ර ආදර්ශනය

පාසැල් සිසුහු, ගොවීහු සහ රජයේ නිලධාරීහු 150ක් තොරතුරු ලබා ගැනීම සඳහා මෙම ආයතනයට පැමිණියහ.

2012 වර්ෂය සඳහා සැලැස්ම

- තෝරාගත් එළවළු වර්ග සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදබැලීම් පැවැත්වීම
- ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හද බැලීම් පැවැත්වීම
- තෝරාගත් ආකන්ද බෝග සහ වෙනත් ක්ෂේත්‍ර බෝග පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදබැලීම් පැවැත්වීම.
- කාබනික පොහොර නිෂ්පාදන සහ ප්‍රවර්ධන වැඩසටහන
- 'රත්න' පැපොල් ප්‍රභේදයේ මූලික සහ සම්මත බීජ නිෂ්පාදනය
- බීපී 250 සහ බීපී 366 යන ප්‍රභේදවල බිත්තර වී නිෂ්පාදනය
- මුල් හා ආකන්ද බෝග, පලතුරු සහ එළවළුවල බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- පාසැල් සිසුන් සහ ගොවීන් සඳහා ව්‍යාපෘති සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම

කාර්ය මණ්ඩලය

තනතුරු	නිලධාරී / සේවක සංඛ්‍යාව
ස්ථාන භාර පර්යේෂණ නිලධාරී	01
පර්යේෂණ නිලධාරී	04
කෘෂිකර්ම උපදේශක	06
පර්යේෂණ සහකාර	02
පර්යේෂණ උප සහකාර	02
රාජ්‍ය කළමනාකරණ සහකාර (III වන ශ්‍රේණිය)	01
ට්‍රැක්ටර් ක්‍රියාකරු	01
ගබඩාකරු	01
වඩු කාර්මික	01
මුරකරු	04
නුපුහුණු කම්කරු (III වන ශ්‍රේණිය)	26
කම්කරු (කොන්ත්‍රාත්)	27
එකතුව	77

2.2.9 උද්‍යාන බෝග පර්යේෂණ ඒකකය - 2, ගන්නොරුව

ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ ඒකකය -2 පලතුරු බෝග සම්බන්ධයෙන් විශේෂීකරණය වූ පර්යේෂණ හා සංවර්ධන ස්ථානයයි. මෙය පේරාදෙණිය හන්දියේ සිට කි.මී. 2ක් පමණ දුරින් ගන්නොරුව - කටුගස්තොට මාර්ගයෙහි උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය සමීපයෙහි පිහිටා ඇති අතර එහි පරිපාලනය යටතේ ක්‍රියාත්මක වේ.

සෙංකඩගල රජුගේ විනෝද උයන මෙන්ම උද්‍යාන බෝග පැවති උයනද මෙම පරිශ්‍රය තුළ පිහිටීම හේතුවෙන් මෙම පර්යේෂණ ඒකකයට කීර්තිමත් ඉතිහාසයක් ඇත. මුළු දිවයිනම බ්‍රිතාන්‍ය පාලනයට නතුවීමෙන් පසු ලංකාවේ ආණ්ඩුකාරයා වූ ශ්‍රීමත් එඩ්වඩ් බාන්ස් විසින් (1824 - 1831) මෙහි පෞද්ගලික උයනක් සහ අශ්වයින් ඇති කරන ස්ථානයක් ස්ථාපිත කරන ලදී. ඔහු විසින් සිදු කළ තේ, රබර්, කුළුබඩු බෝග, පලතුරු බෝග සහ තෘණ වගාවන් 1916 දක්වාම පැවතිණි. ඉන්පසු ප්‍රථම කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා වූ ආර්. එල්. ලින් මෙම ගොවිපළ පවරාගෙන 1912 වර්ෂයේදී අලුතින් පිහිටුවන ලද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බෝග පර්යේෂණ ගොවිපළ බවට පත් කළේය. ඉන්පසු ගත වූ සිය වසර තුළ සිදු වූ ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන් කිහිපයකින් පසු මෙම ගොවිපළ උද්‍යාන බෝග පර්යේෂණ ඒකකය වශයෙන් නම් කර උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය යටතේ සම්පූර්ණයෙන්ම පලතුරු බෝග පර්යේෂණ ස්ථානයක් බවට පරිවර්තනය කරන ලදී.

වර්තමානයේ මෙම පර්යේෂණ ඒකකය හෙ. 25.2ක් පුරා පැතිර ඇත. මෙමගින් රඹුටන්, දූරියන්, අලිපේර, අඹ, පැණි, දෙඩම්, වරකා, ජමනාරං, සැපදිල්ලා, කෙසෙල් මෙන්ම බෙලි, මසං, ජම්බු, වෙරළු ආදිය ඇතුළු ඌන උපයෝජිත පලතුරු බෝග රැසක් පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු ද නාක්ෂණය සම්බන්ධ කටයුතු ද සිදු කෙරේ. ප්‍රභේද වැඩිදියුණු කිරීම (දේශීය සහ විදේශීය ප්‍රභේද වරණය හා ඇගයීම), ප්‍රචාරණ ක්‍රම, පැළ තවාන් කළමනාකරණය, පලතුරු උයන් ස්ථාපිත කිරීම, මල් හට ගැනීම පේරණය කිරීම, අවාරයේ පලතුරු නිෂ්පාදනය කළමනාකරණය කිරීම සහ ඵලදායිතා වර්ධනය මෙම ඒකකයේ ප්‍රධාන කාර්ය ක්ෂේත්‍ර වේ

ආයවැය

වගු අංක 2.2.9.1 : වාර්ෂික ආයවැය - 2011 (රු:)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
පුනරාවර්තන	3,220,715	3,043,683	95
ව්‍යාපෘති			
අඹවල අස්වැන්න සහ තත්වය වැඩිදියුණු කිරීම	425,000	343,546	81
ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය	200,000	150,369	75
පටක රෝපණ ව්‍යාපෘතිය (කෙසෙල් සහ අන්නාසි)	250,000	235,370	94
රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය	470,000	301,382	64
බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය	183,000	185,804	102
ශ්‍රී ලංකා - ඒ.ජ ආධාර ව්‍යාපෘතිය	250,000	183,324	73
දැයට කිරුළ	1,000,000	800,000	80
සියවස් සැමරුම්	300,000	300,000	100
කොම්පෝස්ට් ව්‍යාපෘතිය	100,000	95,000	95
එකතුව	**6,398,715**	**5,638,478**	**88**

ප්‍රගතිය

පර්යේෂණ

දූරියන් ජනකප්ලාස්ම එකතුව නඩත්තු කිරීම

දූරියන් ජනකප්ලාස්ම එකතුව සහිත අක්. 1.5ක ක්ෂේත්‍රයක් සංවර්ධනය කරන ලදී. අලුතින් නිදහස් කරන ලද ප්‍රභේද (අඹතැන්න සහ කසුන්) සහ විභවයක් සහිත අනෙකුත් ජනකප්ලාස්ම එකතුන් මෙම ක්ෂේත්‍රයේ රෝපණය කර ඇත(වගු අංක 2.2.9.2). ක්ෂේත්‍ර ශ්‍රමය, ජල සම්පාදන පහසුකම් සහ අනෙකුත් යෙදවුම් හිඟවීම හේතුවෙන් මෙම ස්ථානය නඩත්තු කිරීමේ දුෂ්කරතා මතුව ඇත. කෙසේ වුවද, ක්ෂේත්‍රයේ රෝපණය කරන ලද බද්ධ පැළවලට හානිවී තිබීම හේතුවෙන් මෙහි ප්‍රගතිය මන්දගාමී වී ඇත.

වගු අංක 2.2.9.2: ජනකප්ලාස්ම වගා ක්ෂේත්‍රයේ ඇති දූරියන් ප්‍රභේද සහ ජනකප්ලාස්ම එකතුන්

ජනකප්ලාස්ම එකතුවෙහි අංකය	වරණ නාමය	පැළ සංඛ්‍යාව	පැළවල තත්වය
ඩී - 06	කසුන්	12	පැළ 4ක් හොඳින් වර්ධනය වේ පැළ 2ක් මියගිය අතර නව පැළ ඒ වෙනුවට සිටුවන ලදී.
ඩී - 11	අඹතැන්න	12	පැළ 9ක් හොඳින් වර්ධනය වේ.
ඩී - 3	ගන්නෝරුව - 3	3	පැළ සියල්ල හොඳින් වර්ධනය වේ.
ඩී - 1	ගන්නෝරුව - 1	3	පැළ සියල්ල සෙමෙන් වර්ධනය වේ.
ඩී - 2	වරණය	2	පැළ සියල්ල සෙමෙන් වර්ධනය වේ.
ඩී - 5	වරණය	1	පැළ මුල් වර්ධනය අදියරෙහි පවතින අතර වර්ධනය සෙමෙන් සිදුවේ. පැළ වර්ධන අදියරෙහි පවතින අතර වර්ධනය සෙමෙන් සිදුවේ.
ඩී - 4	වරණය	4	පැළ මිය ගියේය.
ඩී - 31	වරණය	1	පැළ හොඳින් වර්ධනය වේ. නව පැළ 2ක් රෝපණය කෙරිණි.
ඩී - 32	වරණය	1	
රත්නපුර ඩබ්ලිව්	වරණය	6	

තත්වය : ඉදිරියේදී බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද තෝරා ගැනීමේ අරමුණ ඇතිව මෙම පැළ නඩත්තුව අඛණ්ඩව සිදු කෙරේ.

අලිපේර ජනකප්ලාස්ම එකතුව නඩත්තු කිරීම

මෙය 1987/88 අතර කාලයේදී ආහාර හා කෘෂිකර්ම සංවිධාන/කෘෂිකර්ම දෙපාර්තමේන්තු උද්‍යාන බෝග ව්‍යාපෘතිය විසින් ස්ථාපිත කරන ලද ප්‍රථම විදේශීය අලිපේර ජනකප්ලාස්ම ක්ෂේත්‍රයයි. මෙය ඉදිරි අධ්‍යයන කටයුතු සඳහා නඩත්තු කෙරෙමින් පවතී. මෙහි බොහෝ පැළ පළිබෝධ ආසාදනයට ලක්ව ඇති හෙයින් පුනරුත්ථාපනය හෝ යළි ගුණනය කල යුතුය. වගු අංක 2.2.9.3න් මෙම ක්ෂේත්‍රයෙහි පවතින තත්වය දැක්වේ.

වගු අංක 2.2.9.3 : ජනකප්ලාස්ම ක්ෂේත්‍රයේ ඇති අලිපේර ප්‍රභේද

ප්‍රභේදය	ශාක සංඛ්‍යාව	ශාකවල තත්වය
ෆෝර්ටේ	6	ශාක පුනරුත්ථාපනය අඛණ්ඩව සිදු කරන කෙරේ
ටවර් 2	3	
බූත් 7	6	පහත සඳහන් ශාක දිලීර රෝග හේතුවෙන් මිය ගියේය.
සයිමන්ඩ්ස්	4	(උදා :- කඳ පාමුල කුණු වීම (*Phytopthora*)
බූත් 8	4	හෑස් බද්ධ පැළ 10

චොආකැටි	4	ෆෝර්ටේ බද්ධ පැළ 01
මොන්රෝ	2	සයිමන්ඩිස් බද්ධ පැළ 01
හෑස්	4	ටවර් 2 බද්ධ පැළ 01
වැල්ඩින්	7	හෑස් ප්‍රභේදයේ බද්ධ පැළ 15ක් පමණ මෙම ඒකකයේ
රිඩ්	4	වෙනත් ස්ථානයක ස්ථාපිත කෙරිණි.එම පැළ මනාව
බෘක්ස් ලේට්	5	වර්ධනය වෙමින් තිබේ. ෆෝර්ටේ, ටවර් 2, හෑස්, බූත් 7
පොලොක්	2	සහ වැල්ඩින් යන ප්‍රභේද එල දරමින් තිබේ.
නේබල්	4	
ෂෙපර්ඩ්	4	
පින්කර්ටින්	4	
එඩ්‍රනෝල්	2	

ඉදිරියේදී බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද තෝරා ගැනීමේ අරමුණෙන් අනෙකුත් ප්‍රභේද නඩත්තුව අඛණ්ඩව සිදු කෙරෙමින් තිබේ.

සාම්ප්‍රදායික අලිපේර වර්ධක ප්‍රචාරණ ක්‍රම වැඩිදියුණු කිරීම

ඒකාකාරී අනුප විශාල පරිමාණයෙන් ලබා ගැනීමේ හැකියාව සීමාසහිත වීමෙන් වාණිජමය රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කෙරෙහි බලපෑමක් ඇතිවන හෙයින් කුඤ්ඤ බද්ධයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම අවශ්‍යය. අනුප්යේ දිග, පරිණතභාවය, අග්‍රයක් පැවතීම යන කරුණු පොලිතීන් මලු තුළ වර්ධනය කරන ලද මසක් වයසැති පැරණි ග්‍රාහක බීජ පැළවලට කුඤ්ඤ බද්ධ කරන ලද අංකුරය ග්‍රහණය කර ගැනීමේ කාර්යක්ෂමතාව කෙරෙහි බලපාන බව නිරීක්ෂණ අධ්‍යයන තුළින් අනාවරණය විය. කුඤ්ඤ බද්ධ කිරීමට පෙර අනුප අග්‍රය ඉවත් කළ විට පරිණත අනුප්යේ දිග සෙ.මී. 5-10ක් පමණ වීම වඩා සුදුසු බව පෙනේ. මේ සම්බන්ධ ප්‍රතිවලිත අධ්‍යයන මීළඟ වසරේදී සිදු කිරීමට සැලසුම් කර ඇත. බද්ධ කිරීමෙන් දින 20කට පසු 85%ක පමණ සාර්ථකත්වයක් නිරීක්ෂණ අත්හද බැලීම් තුළින් ලැබිණි. මෙය ළපටි ග්‍රාහක සඳහා අනුප වශයෙන් පරිණත රිකිළි යොදු ගැනීමට මග පෑදීය.

බහුස්ථානීය අත්හද බැලීම් සඳහා 'සුරත්'නමැති ජම්බෝල ප්‍රභේදය ගුණනය කිරීම

බද්ධ ජම්බෝල පැළ 300ක් පමණ බෙදා හැරීම සඳහා සුදුනම් කර ඇත. බද්ධ පැළ 25ක් මව් ශාක වශයෙන් පෞද්ගලික පැළ තවාන් අතර බෙදා හැර ඇත. තවත් බද්ධ පැළ 100ක් ඉදිරියේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා මෙම පර්යේෂණ ඒකකයේ ස්ථාපිත කර ඇත. අනෙක් පැළ බහු ස්ථානීය ඇගයීම් කටයුතු සඳහා පර්යේෂකයින් වෙනුවෙන් වෙන්කර තබා ඇත.

පටක රෝපිත නේත්‍රාපලම් කෙසෙල්වල ක්ෂේත්‍ර ක්‍රියාකාරීත්වය

සාමාන්‍ය පරිදි ලබා ගන්නා මොරෙයියන් මනා ශක්තිමත් වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර පටක රෝපිත නේත්‍රාපලම් මොරෙයියන් පළමු මාස 4 තුළ සෙමෙන් සහ තරමක් දුර්වල පරිදි වර්ධනය විය. කෙසේවුවද, රෝපණය කිරීමෙන් මාස 7කට පසු ප්‍රතිකර්ම දෙක තුළම පැළ උස, වට ප්‍රමාණය සහ මතු වූ පත්‍ර සංඛ්‍යාව සමාන විය. ප්‍රතිකර්ම දෙක තුළම කෙසෙල් කැන් අස්වැන්න සමාන විය. (කි.ග්‍රෑ.5.975). නේත්‍රාපලම් කෙසෙල් ගුණනය සඳහා පටක රෝපණ තාක්ෂණය යොදාගත හැකිය. කෙසේවුවද, සාමන්‍ය පරිදි සිදු කරන වගාව සමග මෙම වගාව සසඳා බැලීම සඳහා නව අත්හද බැලීම් ස්ථාපිත කෙරෙනු ඇත.

මොර (*Euphoria longana*) ප්‍රමුඛ ලක්ෂණ සහිත වගා ප්‍රභේද තෝරා ගැනීම

මෙම වරණය විශාල ප්‍රමාණයේ (ග්‍රෑ. 4.8 -7) හා බ්‍රික්ස් අගය 18 -20ක් වන උසස් ත්ත්වයේ ගෙඩි වලින් සමන්විතය. මේ සම්බන්ධ වැඩිදුර අධ්‍යයන අඛණ්ඩව සිදු කෙරේ.

මොර, ජම්බු සහ ගඩුගුඩා සඳහා ප්‍රචාරක තාක්ෂණයන් සම්පූර්ණ කිරීම

ගඩුගුඩාවල වර්ධක ප්‍රචාරණය අඛණ්ඩව සිදු කෙරේ. ජම්බුවල කඳ කැබලි මුල් ඇද්දවීම සඳහා බඳුන්ගත කිරීමේ මාධ්‍යය වශයෙන් කොම්පෝස්ට් හා වැලි 1:1 අනුපාතයෙන් යෙදීම වඩාත් සුදුසු විය. ගඩුගුඩා කුඤ්ඤ බද්ධය මගින් සාර්ථකව ප්‍රචාරණය කළ හැකිය.

මසංවලට (*Ziziphus mauritiana*සහ *Z. jujube*) වැළඳෙන පළිබෝධ හා රෝග පිළිබඳ අධ්‍යයන

මසංවල ඇතිවන පලතුරු මැසි විශේෂ 2ක් (*Bactrocera pyrifoliae*) හඳුනා ගැනිණි.

සංවර්ධන කාර්යයන්

උද්‍යාන බෝග පර්යේෂණ ඒකකය විසින් මහනුවර දිස්ත්‍රික්කය තුළ පලතුරු බෝග සඳහා ආදර්ශ ගම්මාන 2ක් ස්ථාපිත කර ඇත (වගු 2.2.9.4).

වගු අංක 2.2.9.4 : ස්ථාපිත කරන ලද ආදර්ශ ගම්මාන

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	කෘෂි උපදේශක කොට්ඨාසය	ග්‍රාම නිලධාරී කොට්ඨාසය	ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව	පලතුරු බෝග	ලබාදුන් වෙනත් ප්‍රතිලාභ
තෙල්දෙනිය	උඩිස්පත්තුව	රන්වල	ගොවි පවුල් 40	මැන්ඩරින්, රඹුටන්, පැණි දෙඩම්, අඹ, දූරියන්, වරකා	කෘෂි තාක්ෂණික ක්‍රම සහ කුඩා උපකරණ (පලතුරු නෙළන උපකරණ), පැරණි පලතුරු ශාක 70ක් පුනරුත්ථාපනය කරන ලදී. බද්ධ 162ක්ද ස්ථාපිත කෙරිණි. උපකරණ 20ක් බෙදා හැරිණි.
උඩුනුවර	තලවතුර	වේගිරිය	ගොවි පවුල් 40	ජම්බු, රඹුටන්, අලිපේර, බෙලි, දූරියන්, අඹ, පේර	

රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

බද්ධ පලතුරු පැළ, බීජ පැළ, මොරෙයියන් සහ මුල් ඇදුණු අතු කැබලි පර්යේෂණ අංශයේදී සහ ගොවිපළ අංශයේදී වෙන් වෙන් වශයෙන් නිපදවන ලදී.

වගු අංක 2.2.9.5: රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

බෝගය	පර්යේෂණ අංශය	ගොවිපළ අංශය	එකතුව	විස්තර
අලිපේර	600	1,596		
රඹුටන්	-	8,796		බද්ධ පැළ, බීජ පැළ,
දූරියන්	-	407		මුල් ඇදුණු අතු
අඹ	-	2,247		කැබලි සහ අතු
පැණි දෙඩම්	-	203		බැඳීම් ඇතුළත් වේ.
ජම්බු	-	284		
වෙනත් (ප්‍රෞඪ භාවිත පලතුරු ද ඇතුළුව)	2,600	13,250		අලිපේර, මසං සහ බෙලි ප්‍රධාන වශයෙන්ම පර්යේෂණ

				අංශයේදී නිපදවිණි. කාමරංගා, පේර සහ වරකා ගොවිපළ අංශයට ඇතුළත්ය. බද්ධ පැළ සහ ග්‍රාහක බීජ පැළ ද ඇතුළත්ය.
එකතුව	**3,200**	**26,783**	**29,983**	

තාක්ෂණය ලබා දීම

නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයේ පලතුරු බෝග උද්‍යානයක් ස්ථාපිත කිරීමේ කටයුතු නිම කෙරිණි. එහි පලතුරු විශේෂ 50-55ක් පමණ ද පැළ 200ක් පමණද රෝපණය කෙරිණි.

කොම්පෝස්ට් නිෂ්පාදන වැඩසටහන

මෙම වැඩසටහන මගින් කොම්පෝස්ට් ටො. 10ක් නිපදවන ලද අතර ඒවා පර්යේෂණ ක්ෂේත්‍ර සඳහා යොදා ගන්නා ලදී. මේ වැඩසටහන පුළුල් කිරීම පිණිස අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ.

පුහුණු සහ ව්‍යාප්ති කටයුතු

2011 වර්ෂයේදී පලතුරු වගාව හා පැළ තවාන් තාක්ෂණයන්ට අදාළව පහත සඳහන් පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලදී.

- උපාධි අපේක්ෂකයින් 2දෙනෙකු සඳහා මාස 6ක පුහුණු වැඩසටහන
- ඩිප්ලෝමා සිසුන් 2 දෙනෙකු සඳහා මාස 4ක පුහුණු වැඩසටහන
- පාසැල් සිසුන් 2,000 දෙනෙකු සඳහා 1 දින පුහුණු වැඩසටහන
- පළාත් සභා කෘෂිකර්ම දෙපාර්තමේන්තු කෘෂිකර්ම උපදේශකයින්, විෂයානුගත නිලධාරීන්, කෘෂිකර්ම නිලධාරීන් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඇතුළු 60 දෙනෙකුගෙන් යුත් පිරිසක් සඳහා විශේෂ පුහුණුව
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශකයින්, කෘෂිකර්ම නිලධාරීන් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් ඇතුළු 350දෙනෙකුගෙන් යුතු පිරිසක් සඳහා නිල /කන්න සහ විශේෂ පුහුණුව

කන්න පුහුණු වැඩසටහන

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන් සඳහා පහත දැක්වෙන ක්ෂේත්‍ර අළලා පුහුණු වැඩසටහන් 3ක් පැවැත්විණි.

- වාණිජමය පලතුරු වගාව, ඒ හා සම්බන්ධ ගැටලු, තාක්ෂණයන් සහ එහි විභවය
- පලතුරු බෝගවල ඵලදායිතාව ඉහළ නැංවීම
- අවාරයේ පලතුරු නිෂ්පාදනය

විශේෂ පුහුණු වැඩසටහන්

පහත දැක්වෙන ක්ෂේත්‍රවලට අදාළව විශේෂ පුහුණු වැඩටහන් 8ක් පවත්වන ලදී.

- මධ්‍යම පළාත් ව්‍යාප්ති කාර්ය මණ්ඩලය (60 දෙනෙකු) සඳහා පලතුරු බෝගවල පත්‍රවලට පෝෂක යෙදීමේ හැකියාව
- ශ්‍රී ලංකාවේ පලතුරු කර්මාන්තයේ වත්මන් තත්වය, ගැටලු සහ විභවය: කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය : අලුතින් බඳවා ගන්නා ලද ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ නිලධාරීන් (4 දෙනෙකු) සඳහා වැඩසටහන් 5ක් පවත්වන ලදී.
- වාණිජමය උද්‍යාන බෝග පැළ තවාන්වල ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා පලතුරු බෝග ප්‍රචාරණය සහ පැළ තවාන් කළමනාකරණය : කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළවල සහ බීජ සහතික කිරීමේ සේවයේ තවාන්කරුවන් සහ තවාන් භාර නිලධාරීන් සඳහා වැඩසටහන් 2ක් පැවැත්විණි.

එක් දින පුහුණු වැඩසටහන්

- පාසැල් සිසුන් මෙම පර්යේෂණ ඒකකයට පැමිණි විට ඔවුන් වෙනුවෙන් එක්දින වැඩසටහන් 6ක් පවත්වන ලදී.
- එක් විශ්ව විද්‍යාල ශිෂ්‍යාවක වෙනුවෙන් මාස 4ක විශේෂිත වෘත්තීය පුහුණු වැඩසටහක්

පවත්වන ලදී. බාහිර අධීක්ෂක වශයෙන් ඇය මගේ අධීක්ෂණය යටතේ අලිපේර ප්‍රචාරණය පිළිබඳ උසස් පර්යේෂණ සිදු කළාය.

රූපවාහිනී වැඩසටහන්

පහත දැක්වෙන අංශ සම්බන්ධයෙන් රූපවාහිනී වැඩසටහන් 3ක් විකාශනය කෙරිණි.

- පලතුරු බෝග පැළ තවාන් කළමනාකරණ තාක්ෂණික ක්‍රම
- වැඩි අස්වනු සඳහා රඹුටන් ශාක පුහුණු කිරීම සහ කප්පාදු කිරීම
- අලිපේර නිෂ්පාදනය : ප්‍රයෝජන, විභවය සහ වැදගත් අංශ

ගුවන් විදුලි වැඩසටහන්

පහත දැක්වෙන අංශ සම්බන්ධයෙන් ගුවන්විදුලි වැඩසටහන් 6ක් පවත්වන ලදී. ජාතික මට්ටමේ / සියලුම සිංහල නාලිකාවල සමාගාමීව ප්‍රචාරය කිරීම : පුවත් වැඩසටහන

- අවාරයේ පලතුරු නිෂ්පාදනය: විභවය සහ සුදුසු තාක්ෂණික ක්‍රම
- ගෙවත්තෙහි ඇති පලතුරු ශාකවල ඵලදායිතාව ඉහළ නැංවීම
- කඳුරට එෆ්එම්: සිකුරාදා දිනවල අස්වැන්න වැඩසටහන
- ගෙවත්තෙහි ඇති පලතුරු ශාකවල ඵලදායිතාව ඉහළ නැංවීම
- ගෙවතු සැලැස්ම, එහි පලතුරු ශාක පිහිටි ආකාරය සහ පුනරුත්ථාපන තාක්ෂණයන්
- ගෙවතුවල ඇති පලතුරු ශාකවල මල් පිපීම සහ ඵලහට ගැනීම සම්බන්ධ ගැටලු
- පලතුරු ගම්මාන නඩත්තු කිරීම : ගැටලු සහ පිළියම්

පුවත්පත් හා වාර ප්‍රතාශනවල ලිපි පළ කිරීම

- වාණිජමය පැපොල් වගාව පිළිබඳ එක් ලිපියක් පළ කෙරිණි.

  කෘෂිකර්මය පිළිබඳ වාර ප්‍රකාශනවල / සඟරා වල ලිපි 6ක් පළ කෙරිණි.

  - වාණිජමය කෙසෙල් වගාව: ගොවි ගෙදර, 2011 අප්‍රේල් - ජූනි
  - පලතුරු සහ ඇට වර්ග (nuts) පිළිබඳ පර්යේෂණ කිරීම අවශ්‍යයි. ඇග් ටෙක්, කෘෂිකර්ම දෙපාර්තමේනතුව, 2011 මාර්තු - අප්‍රේල්
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කටයුතුවලට අදාළ කුඩා පොත් 4ක් සහ ක්ෂේත්‍ර උපදේශක සටහන් සංස්කරණය කිරීම - අන්නාසි, අඹ, පැපොල්, සහ පැඟිරි

2012 වර්ෂය සඳහා සැලැස්ම

පර්යේෂණ

- අලිපේර වගාවේ කුඤ්ඤ බද්ධ කිරීමේ ක්‍රමය වැඩිදියුණු කිරීම
- අලිපේර, අඹ සහ රඹුටන් ශාකවල මල් හට ගැනීම රසායනිකව ප්‍රේරණය කිරීම
- පටක රෝපිත නේත්‍රාපලම් කෙසෙල් වගාව පිළිබඳ ඇගයීම් කටයුතු කිරීම
- නව තාක්ෂණය භාවිතයෙන් අලිපේර වගාව ජානමය වශයෙන් වැඩිදියුණු කිරීම
- කොස් සඳහා විවිධ බද්ධ ක්‍රම මගින් ඇතිවන බලපෑම
- වාණිජමය නිෂ්පාදනය අරමුණු කර ගනිමින් ඌන උපයෝජිත පලතුරු බෝග කිහිපයක් වැඩිදියුණු කිරීම
- තෝරාගත් ඌන උපයෝජිත පලතුරු බෝග සඳහා ප්‍රචාරණ තාක්ෂණයන් ජනනය කිරීම
- පලතුරු බෝග ප්‍රචාරණය සඳහා කොහු බඳුන් තුළ කලින් බද්ධ කිරීමේ ක්‍රමය වැඩිදියුණු කිරීම
- අලිපේර, අඹ, සහ රඹුටන්වල බීජ රහිත ස්වභාවයක් ඇති කිරීම පිළිබඳ අධ්‍යයන
- අන්නාසි වගාවේ බිමට පොහොර යෙදීම වෙනුවට පත්‍රවලට පෝෂක යෙදීම ආරම්භ කිරීම
- පැපොල් වගාවේ මුදු පුල්ලි වයිරස් රෝග ලක්ෂණ මර්ධනය කිරීම සඳහා පත්‍රවලට පෝෂක සැපයීමේ හැකියාව

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරි /සේවක සංඛ්‍යාව
ස්ථාන භාර පර්යේෂණ නිලධාරි	01
පර්යේෂණ නිලධාරී	01
වැඩසටහන් සහකාර	01
කෘෂිකර්ම උපදේශක	05
කළමනාකරණ සහකාර	01
ගොවිපළ ලිපිකරු	02
රියදුරු	01
මුරකරු	06
බද්ධකරු	02
වෑද්දුම්කරු	01
ට්‍රැක්ටර් ක්‍රියාකරු	01
කම්කරු	15
කම්කරු (කොන්ත්‍රාත්)	44
එකතුව	**81**

2.3 වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය - බතලගොඩ

ගොවීන්ට තමන් වගා කරන වී ප්‍රභේදවල අස්වනු විභවයන් ලබා ගැනීමට ඉවහල් වනු පිණිස ඉහළ අස්වනු ගෙනදෙන වී ප්‍රභේද නිදහස් කිරීමෙන් සහ වැඩිදියුණු කළ වී නිෂ්පාදන හා සංරක්ෂණ තාක්ෂණයන් හඳුන්වා දීමෙන් වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය දිවයිනේ වී වගා ක්ෂේත්‍රය තුළ අඛණ්ඩව ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි. මෙම ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන නිෂ්පාදන පිරිවැය අඩුකර ගන්නා අතරම ගොවිපළ ඵලදායිතාව වැඩිකර ගැනීම කෙරෙහි මෙන්ම ධාන්‍යවල තත්වය වැඩිදියුණු කිරීම හා පාරිභෝගිකයින්ට දැරිය හැකි මිලකට සහල් සැපයීම කෙරෙහි ද අවධානය යොමු කරයි.

2011 වර්ෂයේදී, ශ්‍රී ලංකාව විදේශ වෙළඳපොළ සඳහා සහල් අපනයනය කිරීමේ විභවය සොයා බලමින් නව මංපෙතකට පිවිසිණි. පසුගිය වසර 2කදී සහල් අපනයනය ආරම්භ කර තිබුණ ද ශ්‍රී ලංකාව සතු සහල් අපනයනය කිරීමේ හැකියාව මෑත ඉතිහාසයේදී විමර්ශනයට ලක්කර නොතිබිණි. 2009 වර්ෂයේ සිට සහල් අපනයනය මෙ.ටො.4,000 (2009) සිට මෙ.ටො. 10,000 (2010) දක්වා වැඩිවී ඇත.

ආයවැය

වගු අංක 2.3.1 . වාර්ෂික අයවැය. - 2011 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	32,548,601	9,627,818	30
පුනරාවර්තන	29,555,800	27,613,024	93
විශේෂ ව්‍යාපෘතිය	152,000,000	7,319,451	5
විදේශ අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘති			
වල් පැළෑටි විද්‍යාව (අන්තර්ජාතික වී පර්. ආයතනය	300,000	228,900	76
ග්‍රීන් සුපර් රයිස්	2,619,843	599,846	23
ව්‍යාපෘති (දේශීය)			
දෙමුහුම් බීජ නිෂ්පාදනය	2,700,000	1,954,642	72
කාබනික පොහොර	4,510,000	2,965,000	66
ආදර්ශ ගම්මාන	300,000	263,533	88
ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (පැළ ජලයෙන් යටවන තත්වය)	2,000,000	1,600,215	80
ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (පොහොර භාවිතය)	4,200,000	3,421,489	81
ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (වල් පැළෑටිමය වී)	1,400,000	1,369,863	98
ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම (නියඟ)	3,000,000	2,143,699	71

ප්‍රගතිය

වී ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන

වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය සහ එයට අයත් උප පර්යේෂණ ස්ථාන සාම්ප්‍රදායික අභිජනන ක්‍රමය සහ දෙමුහුම් දිරිය තුළින් වී ප්‍රභේද වැඩිදියුණු කිරීම අඛණ්ඩවම සිදු කළේය. පෙවිය සාධක රැසකට ප්‍රතිරෝධී පුළුල් ජානමය පදනමකින් යුතු වී ප්‍රභේද සහ ප්‍රමුඛ ලක්ෂණ සහිත ආර බිහි කිරීම මගින් 2011 වර්ෂයේදී, සැලකිය යුතු අන්දමේ ප්‍රතිලාභ ලබා ගැනිණි. ගැඹුරු ජලයට සහ ලවණතාව පිළිබඳ අභිතකර තත්වයට ඔරොත්තු දෙන ආර හඳුනාගෙන තව දුරටත් අත්හදා බැලෙමින් පවතී.

නව නිර්දේශිත වී ප්‍රභේද

2011 වර්ෂයේදී, නව වී ප්‍රභේද 2ක් (Bw367 සහ Ld 368) වාණිජමය වගාව සඳහා නිදහස් කරන ලදී.

Bw 367

මෙය මාස 3.5 වයස් කාණ්ඩයේ සුදු සම්බා ප්‍රභේදයකි. කෙටි ගෝලාකාර ධාන්‍ය ඇට සහිත මෙම ප්‍රභේදය තෙත් කලාපයේදී දින 107කින් පරිණත වන අතර දිවයින පුරා වගාව සඳහා සුදුසුය. හෙ. 1කට ටො. 7.9ක අස්වනු විභවයකින් යුතු මෙය, කායික විද්‍යාත්මක රෝගයක් වන යකඩ විෂවීමට මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී වේ. දැනට ඇති සම්බා ප්‍රභේදවලට වඩා මෙම ප්‍රභේදය පැළ නමා වැටීමට වැඩි වශයෙන් ඔරොත්තු දෙයි. ගෙල පාළුවට ඔරොත්තු දීම මෙය සතු තවත් වැදගත් ලක්ෂණයකි.

Ld 368

මෙය මාස 3.5 වයස් කාණ්ඩයට අයත් වේ. තෙත් කලාපීය තත්වය යටතේ දින 105කින් පරිණත වන මෙම ප්‍රභේදය දිවයින පුරා වගා කිරීම සඳහා නිදහස් කර ඇත. ධාන්‍ය ඇටය රතු පැහැති මෙය කෙටි ගෝලාකාර හැඩයෙන් යුක්ත වේ. මෙමගින් හෙ. 1කට ටො. 7කටද අධික අස්වැන්නක් ලබා ගැනීමේ හැකියාව ඇත. එමෙන්ම, කොළ පාළුවට හා ගෙළ පාළුවට ප්‍රතිරෝධී වන අතර බැක්ටීරියා පත්‍ර අංගමාරයට, වී ගොක් මැස්සාට සහ දුඹුරු පැළ කීඩෑවාට මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී වේ. මෙම ප්‍රභේදයේ පැළ නමා වැටීමට ලක් නොවන අතර ධාන්‍ය අවපැහැවීමක් ද සිදු නොවේ.

අභිජනන වැඩසටහන

මාස 4- 4.5 වයස් කාණ්ඩය

2011 වර්ෂයේදී, විවිධ මුහුන් සංයෝග 55ක් බිහි කරන ලද අතර ඇගයීම සඳහා ක්ෂේත්‍රයෙන්F1 ගහන 41ක් තෝරා ගන්නා ලදී. ඒ අතරින් F1 ගහන 24ක් තව දුරටත් වැඩිදියුණු කර ඉදිරියට ගෙන යාම සඳහා තෝරා ගැනිණි. එයට අමතරව, ඇගයීම සහ පෙර මුහුන්වලින් තෝරා ගැනීම සඳහා F2, F3 සහ F4යන පරම්පරාවලින් පිළිවෙළින් සාමූහික ගහන 17ක්, 13ක් සහ 10ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කෙරිණි. F5 පරම්පරාවේ සිට ඉදිරියට, වැඩිදියුණු කරන ලද ගහන 43කට අයත් ප්‍රජනිත 1132ක් 2010 /11 මහ සහ 2011 යල කන්නවලදී වැඩිදුරටත් ඇගයීම සහ තෝරා ගැනීම සඳහා ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදී. මූලික අස්වනු අත්හදා බැලීම් සහ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම්වලදී ධාන්‍ය අස්වැන්න සහ ධාන්‍යවල තත්වමය ලක්ෂණ සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා **Bg** 379-2 සම්මත ප්‍රභේදය වශයෙන් යොදා ගනිමින් ප්‍රමුඛ ලක්ෂණ සහිත ආර 18ක් ඇගයීමට ලක් කරන ලදී.

මාස 3 1/2 වයස් කාණ්ඩය

මාස 3 ½ වී ප්‍රභේද කිහිපයක අස්වනු ලබාදීමේ හැකියාව මාස 4 වී ප්‍රභේද හා සමාන හෝ ඒවාට වඩා වැඩිවිය. වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ වී ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන ඉහළ අස්වනු ගෙනදෙන, ධාන්‍යවල තත්වය පිළිගත හැකි මට්ටමින් යුතු එමෙන්ම, ප්‍රධාන ගණයේ අභිතකර පෙව හා අපෙව තත්වයන්ට ප්‍රතිරෝධී වන මාස 3 ½ වයස් කාණ්ඩයේ වී ප්‍රභේද බිහි කිරීම තම ප්‍රමුඛ අභිජනන අරමුණ බවට පත් කරගෙන ඇත. 2011 වර්ෂයේදී, නව F1 මුහුන් 32ක් බිහි කරන ලද අතර ඒවායින් F1 පරම්පරා 28ක් ස්ථාපිත කරන ලදී. පෙර සිදුකළ මුහුන් වලින් ජනිත F2 ගහන 14ක්, එෆ්3 ගහන 9ක් සහ F4 ගහන 2ක් පූර්ව විසංගත ගහන මගින් හඳුනා ගන්නා ලදී. මුහුන් 19කින් ඇතිවූ ප්‍රජනිත 153ක් පමණ පරම්පරා වැඩිදියුණු කර ඉදිරියට ගෙනයාම සඳහා තෝරා ගන්නා ලදී.

මූලික අස්වනු අත්හදා බැලීම් සහ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම්වලින් ප්‍රමුඛ ලක්ෂණ සහිත ආර 16ක් තෝරාගෙන අස්වනු විභවය, පළිබෝධ හා රෝගවලට ප්‍රතිචාර දක්වන ආකාරය හා ධාන්‍යවල

තත්වය සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා,Bg 357 හා Bg 358 සම්මත ප්‍රභේද වශයෙන් යොදා ගනිමින් අගයන ලදී. එමෙන්ම ප්‍රමුඛ ලක්ෂණ සහිත ආර 4ක්, බලාපොරොත්තු තැබිය හැකි ආර වශයෙන් ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහන සඳහා නම් කරන ලදී.

Bg 3R නැමති බලාපොරොත්තු තැබිය හැකි ආර දීප ව්‍යාප්ත මට්ටමින් විශාල පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වැඩසටහන තුළ අත්හදා බැලෙමින් පවතී.

මාස 3 වයස් කාණ්ඩය

වර්ෂාපතන රටාව වෙනස්වන සුළු වීමත් වගා කන්නය වඩා කෙටිවීමත් සමග මෙම වයස් කාණ්ඩයට අයත් වී ප්‍රභේදවල වැදගත්කම ඉහළයමින් තිබේ. එමනිසා, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ අභිජනන වැඩසටහන මෙම වයස් කාණ්ඩය කෙරෙහි ද ඉහළ අස්වනු ලබාදෙන හා තත්වයෙන් වඩා ඉහළ එමෙන්ම දුඹුරු පැළ කීඩෑවාට, වී ගොක් මැස්සාට, බැක්ටීරියා පත්‍ර අංගමාරයට හා කොළ පාළුවට දිගුකලක් ප්‍රතිරෝධී වන වී ආර හඳුනා ගැනීම කෙරෙහි ද ප්‍රමුඛතාව ලබාදෙයි.

මාස 2.5 වයස් කාණ්ඩය

ධාන්‍ය අස්වනු විභවය වැඩිකිරීමේ සහ දුඹුරු පැළ කීඩෑවාට, වී ගොක් මැස්සාට, බැක්ටීරියා පත්‍ර අංගමාරයට, කොළ පාළුවට හා පැළ මැක්කාට බහුවිධ ප්‍රතිරෝධීතාව ඇති කිරීමේ අරමුණු ඇතිව ඉතා කෙටි කාලීන වී ප්‍රභේද බිහි කිරීම පිණිස වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී 2011 වර්ෂය තුළ ද අභිජනන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. නව ප්‍රභේද ජනනය කිරීම පිණිස මුහුන් 45ක් බිහිකරන ලදී. බල්ක් ගහන 11ක් සහ ප්‍රජනිත 370ක් වැඩිදියුණු කර තව දුරටත් ඉදිරියට ගෙන යන ලදී. මින් පෙර බිහි කළ කෙටි ගෝලාකාර ධාන්‍ය ඇට සහිත ආර 5ක් (10 - 2891, 2902, 2881, 2884, 2913) යොදා ගනිමින් මූලික අස්වනු අත්හදා බැලීම් ස්ථාපිත කරන ලදී. යටෝක්ත ප්‍රභේද 5 අතරින් 4ක් සුදු නිවිඩු වර්ගයේ ද 1ක් රතු නිවිඩු වර්ගයේ ද විය. මෙහිදී බීජී 250 සම්මත ප්‍රභේදය වශයෙන් යොදා ගැනිණි. ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම්, ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් සහ විශාල පරිමාණයේ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සංශුද්ධ කරන ලද බීජ සැපයීම පිණිස ප්‍රමුඛ ලක්ෂණ සහිත ආර ගුණනය (Bg 10-2907) අඛණ්ඩව සිදු කෙරිණි.

අභිජනන ගහන වැඩිදියුණු කර ඉදිරියට ගෙන යාම

අස්වනු විභවය වැඩි කිරීම, ප්‍රධාන පළිබෝධ (දුඹුරු පැළ කීඩෑවා හා වී ගොක් මැස්සා) හා රෝගවලට (කොළ පාළුව හා බැක්ටීරියා පත්‍ර අංගමාරය) ප්‍රතිරෝධීතාව ඇති කිරීම, ධාන්‍යවල තත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඇති කිරීම අරමුණු කර ගනිමින් 2011 වර්ෂයේදී මුහුන් 60ක් ඇති කෙරිණි. එම මුහුන් 60 අතරින් F1 ගහන 48ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලද අතර ගහන 13ක් පරම්පරාව ඉදිරියට ගෙන යාම සඳහා තෝරා ගැනිණි. එයට අමතරව, මුහුන් 28ක බල්ක් ගහන ස්ථාපිත කර පෙර ඇතිකළ මුහුන්වලින් F5 පරම්පරාවේ සිට ඉදිරියට වූ මුහුන් 22ක් තෝරා ගැනිණි. ප්‍රජනිත 812කට ආසන්න සංඛ්‍යාවක් පළිබෝධ හා රෝගවලට ප්‍රතිරෝධී වන ආකාරය සහ ඒවායෙහි ධාන්‍ය අස්වැන්න සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා අගයන ලදී.

Bg 300 සම්මත ප්‍රභේද වශයෙන් යොදා ගනිමින්, මූලික අස්වනු අත්හදා බැලීම් සහ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් තුළ ප්‍රමුඛ ලක්ෂණ සහිත ආර 9ක් ඒවායෙහි අස්වනු විභවය සහ ධාන්‍යවල තත්වය සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා අත්හදා බලන ලදී. එහිදී ආර 5ක් බලාපොරොත්තු තැබිය හැකි ආර වශයෙන් තෝරා ගැනිණි.

2011 වර්ෂයේදී, ආර 3ක් ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් සඳහා නම් කරන ලදී

විකෘතිය මගින් සම්ප්‍රදායික වී ප්‍රභේද වැඩිදියුණු කිරීම

සාම්ප්‍රදායික ප්‍රභේද පිළිබඳ පර්යේෂණ කටයුතුවල අරමුණු වූයේ සාම්ප්‍රදායික වගා ප්‍රභේදවලින් පැළ නමා වැටීමට ප්‍රතිරෝධී එමෙන්ම, පිළිගත හැකි මට්ටමේ තත්වයෙන් යුතු ධාන්‍ය සහිත ප්‍රභේද බිහි කිරීමයි. පසුගිය කාලයේදී සුදුරු සම්බා සහ සුවඳ සම්බා ප්‍රභේද ගැමා විකිරණය යොදා ගනිමින් විකෘතියට ලක් කෙරිණි. තවදුරටත් තෝරා ගැනීම් කිරීමේදී වැඩිදියුණු කරන ලද සාමුහික ගහන ක්‍රමය අනුගමනය කෙරිණි. SW 25, SSR 8 හා SSR 26 යන වැඩිදියුණු කර ඉදිරියට ගෙන එන ලද ආර 3හි බීජ ගුණනය කර සංශුද්ධ කරන ලදී. එමෙන්ම 2011 වර්ෂයේ කන්න 2ක් තුළ නිරීක්ෂණ අස්වනු අත්හදා බැලීම් ද සිදු කෙරිණි.

දුරස්ථ ඥාතීත්වයක් සහිත වී (*Oryza nivara*) සහ වගා කරන වී විශේෂ (*Oryza Sativa*) දෙමුහුම් කිරීම

දුඹුරු පැළ කීඩෑවාට ප්‍රතිරෝධී වී ප්‍රභේදයක් බිහි කිරීම පිණිස ඔරයිසා නිවාරා (*Oryza nivara* – WR ac 04) මව් ආර වශයෙන් ද බිජී 380 පිය ආර වශයෙන් ද ගෙන මින් පෙර දෙමුහුම් සිදු කෙරිණි. තෝරාගත් ආර 2ක් (WH 20 සහ WH 48) මාස 3 ½ අස්වනු අත්හදා බැලීමක ස්ථාපිත කරන ලද අතර මෙම ආර ඒවායෙහි වැඩිදුර අස්වනු ඇගයීම් කටයුතු සඳහා ගුණනය කරන ලදී.

ජනකප්ලාස්ම ගුණනය, ලක්ෂණීකරණය සහ සංරක්ෂණය

මින් පෙර සිදු කළාක් මෙන් 2011 වර්ෂයේදී වී ජනකප්ලාස්ම එකතූන් 1,500ක් (සම්ප්‍රදායික වගා ප්‍රභේද, හඳුන්වාදීම් සහ වැඩිදියුණු කරන ලද ආර ඇතුළු) ගුණනය කර වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ඇති කෙටි කාලීන සංරක්ෂණ ඒකකය තුළ සංරක්ෂණය කරන ලදී. ඉල්ලීම් පරිදි ගොවීන්, පාසැල් සිසුන්, විශ්වවිද්‍යාල, රාජ්‍ය නොවන සංවිධාන සහ උනන්දුවක් දක්වන වෙනත් කණ්ඩායම් අතර බීජ නියැදි බෙදා හරින ලදී.

පෛව තාක්ෂණය

ප්‍රචලිත දේශීය වී ප්‍රභේදවලට 'සබ් 1' ජානය හා ලවණතාවට ඔරොත්තුදීමේ ලක්ෂණය අන්තර්ග්‍රහණය කිරීම පිණිස 2011 වර්ෂයේදී ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ ප්‍රතිපාදිත අරමුදල් යොදා ගනිමින් අණුක සලකුණු සහායක පිළි දෙමුහුම් අභිජනන වැඩසටහන ආරම්භ කෙරිණි. පැළ ජලයෙන් යටවීමට හා නියඟයට ඔරොත්තු දීමේ හැකියාව ඇති කරන සලකුණු සමහරක් හඳුනාගෙන ඒවා යොදා ගනිමින් මුහුන් ගණනාවක් ජනනය කෙරිණි. එම මුහුන් ගණනාව අතරින් 6ක් සාර්ථක විය. ප්‍රචලිත ප්‍රභේදවල දුඹුරු පැළ කීඩෑවාට ප්‍රතිරෝධී වීමේ හැකියාව වැඩිදියුණු කිරීම පිණිස පිළි දෙමුහුම් වැඩසටහන ද ආරම්භ කරන ලදී. පළමු පිළි දෙමුහුමෙහි F1 පරම්පරාව (BC1F1 of Bg 250/IRBB60// Bg 250) ක්ෂේත්‍රයේ වර්ධනය කර ගැනිණි.

2011 වර්ෂයේදී Bg 250 සහ Bg 352 යන ප්‍රභේදයන්හි බීජ කලලවලින් ජනිත කිණක යොදා ගනිමින් නියඟයට සහ ලවණතාවට ඔරොත්තු දෙන විකෘත බිහි කිරීමට ප්‍රයත්න දරන ලදී. පරිණත වීමට ගතවන කාලය සහ වඩා හොඳ ශස්‍ය විද්‍යාත්මක ලක්ෂණවලට (පැළවල ස්වරූපය, පඳුරු දැමීම, ධාන්‍යවල ස්වභාවය සහ බීජ වර්ණය) අදාළව තෝරා ගැනීම සඳහා පැළ තනි පෙළ ප්‍රජනිත (G1) වශයෙන් වර්ධනය කර ගැනිණි. සූදුරු සම්බා, රත්ඇල්, සුදු හීනැට් සහ සුවඳැල් වැනි සම්ප්‍රදායික ප්‍රභේදවල කුරුබව ප්‍රේරණය කිරීමට ඉවහල් වන ජන්මාණු සෛල විකෘතිකරණය ප්‍රේරණය කිරීම සඳහා පරාගධානි රෝපණ තාක්ෂණය යොදාගෙන කැලස ලබා ගැනිණි.

වල් වී විශේෂවල දක්නට ලැබෙන වැදගත් ලක්ෂණ, ප්‍රමුඛ ලක්ෂණ සහිත වී ප්‍රභේදවලට එක් කිරීම පිණිස යොදාගත හැකි ඵලදායී තාක්ෂණ ක්‍රමයක් නම් කලල වෙන් කරගෙන වෙනම මාධ්‍යයක වගා කිරීම මගින් දුරස්ථ ඥාතීත්වයක් සහිත විශේෂ දෙමුහුම් කිරීමයි. එමනිසා, 2011 වර්ෂයේදී ඔරයිසා සැටයිවා (*Oryza sativa*)/ ඔරයිසා රයිසොමටිස් (*Oryza rhyzomatis*) මුහුන් කිරීමෙන් ලද පැළයක් එෆ් 2 පරම්පරාව දක්වා වැඩිදියුණු කර ඉදිරියට ගෙන එන ලදී. වී පැළ මැක්කන් (දහනල/සූදුරු සම්බා), ජලයට යටවීම (Bg 300/ගොඩ හීනැට්) හා ලවණතාව (At 354/ Bg 352) පිළිබඳ ජානමය අධ්‍යයන සඳහා සිතියම් ගත කිරීමේ ගහන වශයෙන් යොදා ගැනීම පිණිස සංයුක්ත නුමුහුම් ආර ජනනය කෙරෙමින් පවතී.

දෙමුහුම් වී

සම්ප්‍රදායික අභිජනන වැඩසටහනට අමතරව වී වර්ග දෙමුහුම් කිරීම අස්වනු පරතරයන් පියවා ගැනීමේ හා අස්වනු විභවය ඉහළ නංවා ගැනීමේ අරමුණු සඵල කර ගැනීමට යොදා ගත හැකි ප්‍රධාන තාක්ෂණයකි. වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය දෙමුහුම් බීජ නිෂ්පාදනය වැඩිදියුණු කිරීම පිණිස දෙමුහුම් දිරිය යොදා ගන්නා පර්යේෂණ වැඩසටහන් රැසක් පවත්වාගෙන යයි.

2011 වර්ෂයේදී, මාස 3 - 3.5 වයස් කාණ්ඩය යටතේ වැඩිදියුණු කරන ලද, වැඩි අස්වැන්නකින් සහ බලාපොරොත්තු තැබිය හැකි ලක්ෂණවලින් යුතු ප්‍රභේදයක් වන BgHR-8හි බීජ නිෂ්පාදනය කෙරිණි. BgHR-8 ප්‍රභේදයට අමතරව, කලින් පරිණත වන නව දෙමුහුම් වී සංයෝග 15ක් වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී ජනනය කෙරිණි. මෙම ප්‍රභේද සැසඳුම් ප්‍රභේදවලට (Bg 357, Bg 300) වඩා ඉහළ අස්වනු ගෙනදෙන බව තහවුරු විය. මෙම ප්‍රභේදයන්හි ධාන්‍යවල තත්වය සහ පළිබෝධ හා රෝග කෙරෙහි දක්වන ප්‍රතිරෝධිතාව පිළිබඳ ලක්ෂණ සම්බන්ධයෙන් දැන ගැනීම පිණිස වැඩිදුර අධ්‍යයන පවත්වනු ඇත.

මාපිය ආර (ප්‍රකෘතිකාරක සහ සෛල ප්ලාස්මීය පුං වන්ධ්‍ය ආර) වැඩිදියුණු කිරීම දෙමුහුම් වී වැඩසටහන මගින් සිදු කරන වැදගත් කාර්යයකි. නව සෛල ප්ලාස්මීය පුං වන්ධ්‍ය ආර සහ ප්‍රකෘතිකාරක ආර බිහි කිරීම පිණිස නව පරීක්ෂණ මුහුන් (325ක්) සිදු කෙරිණි. ඒ අතරින් ආර 150ක් සෛල ප්ලාස්මීය පුං වන්ධ්‍ය ආර තවදුරටත් වැඩිදියුණු කිරීම පිණිස පිළි දෙමුහුම් තවාන සඳහා තෝරා ගන්නා ලදී. එම ආර සංශුද්ධ කර 2011 වර්ෂයේදී ඒවායෙහි බීජ අවශ්‍ය ප්‍රමාණයෙන් නිපදවන ලදී.

Bg 407 H ප්‍රභේදයේ බීජ නිෂ්පාදනය කර F1 බීජ කි.ග්‍රෑ. 90ක අස්වැන්නක් ද 2011 වර්ෂයේදී ලබා ගැනිණි. ගොවීන් අතර දෙමුහුම් වී වගාව ප්‍රචලිත කිරීමේ සහ ඒ සඳහා ඔවුන්ගෙන් ප්‍රතිපෝෂණය ලබා ගැනීමේ අරමුණ ඇතිව මෙම බීජ ත්‍රිකුණාමලය, පොළොන්නරුව සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්කවල ගොවීන් අතර බෙදා හරින ලදී.

2011 වර්ෂයේදී ඉහළ අස්වනු ගෙනදෙන නුමුහුම් සැසඳුම් ප්‍රභේද 2ක් (Bg 300, Bg 357) ඇතුළුව දේශීය දෙමුහුම් ආර සමඟ ඉන්දියානු දෙමුහුම් ආර 4ක් (CRH501, CRH 502, PAC 832 සහ ස්වර්ණ 02) පරීක්ෂා කර බලන ලදී. ස්වර්ණ 02 සහ PAC 832 යන ආර අනෙකුත් ඉන්දියානු ආර 2ට වඩා වැඩි අස්වනු ගෙන දිණි.

2011 වර්ෂයේදී බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් ආරවල මූලික බීජ නිෂ්පාදනය අඛණ්ඩව සිදු කෙරිණි. ස්වභාවික පර-පරාගණය මගින් මුහුන් 300ක් ජනනය කර සෛල ප්ලාස්මීය පුං වන්ධ්‍ය ආර බීජ කි.ග්‍රෑ. 26ක් ලබා ගැනිණි. ස්වභාවික පර පරාගණය මගින් 4A සහ 4B අතර දෙමුහුන් 300ක් සිදුකර යටෝක්ත සෛල ප්ලාස්මීය පුං වන්ධ්‍ය ආරවලින් බීජ ක්‍රි.ග්‍රෑ 4ක් ලබා ගැනිණි. එයට අමතරව, 4A සහ 4B අතර සංකලන 50ක් මූලික බීජ නිෂ්පාදනය සඳහායොදා ගන්නා ලද අතර දෙමුහුන් 250ක් ද බිහි කරන ලදී.

රෝග කළමනාකරණය

වීවල ධාන්‍ය අවපැහැ ගැනීම කෙරෙහි විවිධ පොහොර වර්ග මගින් ඇති කරන බලපෑම

දිළිර විශේෂ සංකීර්ණයක් මගින් වීවල ඇති කරන ධාන්‍ය අවපැහැ වීම 2011 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ හානිකර ක්ෂේත්‍ර ගැටලුවක් බවට පත් වෙමින් තිබිණි. එමනිසා කාබනික පොහොර, අකාබනික පොහොර, අකාබනික පොහොර+25% කාබනික පොහොර සහ 75% අකාබනික පොහොර+25% කාබනික පොහොර යොදා ගනිමින් පොහොර නොයෙදූ වගාව පාලකය වශයෙන් ගෙන වීවල ධාන්‍ය අවපැහැ ගැනීම කෙරෙහි විවිධ පොහොර වර්ග යෙදීම මගින් ඇති කරන බලපෑම පරීක්ෂා කර බලන ලදී. අකාබනික පොහොර පමණක් යෙදීම සමඟ සසඳා බලන විට 75% නිර්දේශිත අකාබනික පොහොර+ 25% කාබනික පොහොර සංයෝගය යෙදීමෙන් අවපැහැ ගැනීමේ ප්‍රමාණය අඩුවිය.

වීවල ධාන්‍ය අවපැහැගැනීම සහ කොළ පාළු රෝගය පාලනය කිරීම කෙරෙහි ඔලිගොකයිටොසාන් මගින් ඇති කරන බලපෑම

ඔලිගොකයිටොසාන් යනු ඉස්සන් ආදී සතුන්ගේ බාහිරාවණයෙන් (shrimp shells) ලබා ගන්නා කයිටොසාන් ද්‍රාවණයක් ප්‍රවිකිරණය කිරීම මගින් සකස් කර ගන්නා අණුක බර අඩු සංයෝගයකි. මෙම නිපැයුම පේව අනාවරකයක් (biotic elicitor) සහ පැළ වර්ධනය සහ අස්වැන්න ප්‍රවර්ධනය කරන්නක් වශයෙන් ඵලදායි වේ.නමුත් ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන ලද්දේ ධාන්‍ය අවපැහැ ගැනීම පාලනය කිරීමෙහිලා ඔලිගොකයිටොසාන් මගින් සැලකිය යුතු බලපෑමක් ඇති නොවන බවයි. වී වගාවේ කොළ පාළු රෝගය පාලනය කිරීමෙහිලා ඔලිගොකයිටොසාන් මගින් ඇති කරන බලපෑම පරීක්ෂා කර බැලීම සඳහා එය බීජ ප්‍රතිකර්මයක් වශයෙන් යොදන ලදී. බීජ ප්‍රතිකර්මයක් වශයෙන් යෙදූවිට එමගින් වී වගාවේ කොළ පාළුව පාලනය කිරීමෙහිලා සැලකිය යුතු බලපෑමක් ඇති නොවිණි.

වී වගාවේ කොළ පාළුවට ප්‍රතිරෝධී වන අකාරය දැන ගැනීම සඳහා වී වර්ග පරීක්ෂා කර බැලීම

වී වගාවට වැළදෙන දිළිර රෝගයක් වන කොළ පාළුව මගින් එම වගාවට දැඩි හානියක් සිදුවේ. එමනිසා, වැඩිදියුණු කර ඉදිරියට ගෙන එන ලද ප්‍රජනිතවලින් සමන්විත පරීක්ෂණ දර්ශ සියලුම අස්වනු අත්හදා බැලීම්, සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් සඳහා ඇතුළත් වූ පරීක්ෂණ දර්ශ කොළ පාළුවට දක්වන ප්‍රතිරෝධීතාව සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලිණි. 2010/11 මහ කන්නයේදී පරීක්ෂා කර බලන ලද පරීක්ෂණ දර්ශ සංඛ්‍යාව 1,624ක් වූ අතර 2011 යල කන්නයේදී එම සංඛ්‍යාව 1,502ක් විය. පරීක්ෂා කර බලන ලද ආර අතරින් 2010/11 මහ කන්නයේදී වී වර්ග 1,269ක් ද 2011 යල කන්නයේදී වී වර්ග 1,277ක් ද කොළ පාළුවට

ප්‍රතිරෝධී හෝ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බව සොයා ගැනිණි.

බැක්ටීරියා අංගමාරයට ප්‍රතිරෝධී වන අකාරය දැන ගැනීම සඳහා වී ආර පරීක්ෂා කර බැලීම

බැක්ටීරියා පත්‍ර අංගමාරය වී වගාවට වැළඳෙන ආර්ථිකමය වශයෙන් වැදගත් බැක්ටීරියා රෝගයකි. කෘෂි රසායන මගින් මෙම රෝගය පාලනය කිරීම තවමත් අපහසු කාර්යයකි. එමනිසා මෙම රෝගයට ප්‍රතිරෝධිතාව සහිත ප්‍රමුඛ ලක්ෂණ සහිත ආර අභිජනනය වඩාත්ම ඵලදායි හා පාරිසරික වශයෙන් හිතකර විකල්පය වේ. සියලුම අස්වනු අත්හදා බැලීම්වලට හා සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම්වලට ඇතුළත් වූ වී ආර බැක්ටීරියා පත්‍ර අංගමාරයට ප්‍රතිරෝධී වන ආකාරය සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලදී. මෙහිදී 2010/11 මහ කන්නයේදී ආර 138ක් ද 2011 යල කන්නයේදී ආර 137ක් ද පරීක්ෂා කර බලන ලදී. පරීක්ෂා කර බලන ලද ආර අතරින් 2010/11 මහ කන්නයේදී ආර 52ක් ද 2011 යල කන්නයේදී ආර 48ක් ද 'ප්‍රතිරෝධී' හෝ 'මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී' බවට වර්ගීකරණය කෙරිණි.

පළිබෝධ කළමනාකරණය

පළිබෝධ සඳහා ප්‍රතිරෝධිතාව පරීක්ෂා කර බැලීම

දුඹුරු පැළ කීඩෑවා සහ වී ගොක් මැස්සා වී වගාවේ ඇතිවන වඩාත්ම වැදගත් පළිබෝධ වේ. 2010/11 මහ කන්නයේදී පරීක්ෂණ දර්ශ 1,513ක් වී ගොක් මැස්සාට සහ දුඹුරු පැළ කීඩෑවාට ප්‍රතිරෝධී වන ආකාරය පිළිබඳව පරීක්ෂා කර බලන ලදී. පරීක්ෂණ දර්ශ 1,023ක් හා 940ක් පිළිවෙළින් වී ගොක් මැස්සාගේ හා දුඹුරු පැළ කීඩෑවාගේ හානියට 'ප්‍රතිරෝධී' හෝ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී වන බවට හඳුනා ගැනිණි. 2011 යල කන්නයේදී පරීක්ෂණ දර්ශ 1,323ක් අතරින් දර්ශ 706ක් වී ගොක් මැස්සාට ද ප්‍රභේද555ක් දුඹුරු පැළ කීඩෑවාට ද 'ප්‍රතිරෝධී' බැව් හඳුනා ගැනිණි.

වී වගාවේ පළිබෝධ පාලනය සඳහා නව කෘමිනාශක

දුඹුරු පැළ කීඩෑවා සහ වී පත්‍ර හකුළුවන්නා වී වගාවේ සැලකිය යුතු අස්වනු හානියක් ඇති කරයි. යථෝක්ත පළිබෝධයින් දෙදෙනා සඳහා ක්‍රියාකාරී වන ආකාරය විවිධ එමෙන්ම ක්ෂීරපායින්ට විෂ සහිත බව අඩු කෘමිනාශක හඳුනා ගැනීමේ අවශ්‍යතාවක් පවතී. 2011 වර්ෂයේදී දුඹුරු පැළ කීඩෑවා හා වී පත්‍ර හකුළුවන්නා පාලනයට යොදා ගත හැකි වඩාත්ම සාර්ථක කෘමිනාශක වශයෙන් තයමෙතොක්සම් හා ක්ලෝරැන්ට්‍රනිලිප්‍රෝල් හඳුනා ගන්නා ලදී

වී වගාවේ පළිබෝධ පාලනයට පෙර විද්‍යාත්මක නිපැයුම්(ඔලිගොකයිටොසාන්) යොදා ගත හැකි ආකාරය පරීක්ෂා කර බැලීම

2011 වර්ෂයේ ඔලිගොකයිටොසාන් පෙර අනාවරකයක් වශයෙන් අත්හදා බලන ලදී. එම නිපැයුම් මිලියනයකට කොටස් 50ක සාන්ද්‍රණයෙන් යුතුව භාවිත කිරීමෙන් දුඹුරු පැළ කීඩෑවන් සහ පැළ මැක්කන් සාර්ථකව පාලනය වන බැව් සොයා ගැනිණි.

වල් පැළ කළමනාකරණය

පැළෑටිනාශක ඉසීම සඳහා භාවිතා කරන ඉසින උපකරණ සහ ප්‍රමිතිගත නොසල ඇගයීම

වී වගා කර ඇති කුඹුරුවල ඇති වල් පැළ පාලනය පිණිස යොදන පැළෑටිනාශකවල කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා සුදුසු ඉසින උපකරණයක් සහ නොසලයක් තෝරා ගැනීම අවශ්‍ය වේ. මෙහිදී නැප්සැක් ඉසින වර්ග 3ක් (ඔසාටු ඉසිනය, ස්වෑන් ඉසිනය සහහේඩ්ස්ප්‍රේයර්) බලවේග ඉසිනයක් සහ නොසල වර්ග 3ක් අගයන ලදී. නැප්සැක් ඉසින 3 මගින් සමාන වල් පැළ පාලන කාර්යක්ෂමතාවක් (70% - 80%) පෙන්වන ලදී. එහෙත් ඔසාටු ඉසිනයට අවශ්‍ය වූයේ අඩු පැළෑටිනාශක ප්‍රමාණයකි. බලවේග ඉසිනය මගින් පූර්ව මෙන්ම පශ්චාත් නිර්ගමන පැළෑටිනාශක යෙදීමේදී පෙන්නුම් කරන ලද වල් පැළ පාලන කාර්යක්ෂමතාව බෙහෙවින් දුර්වල විය. එයට අමතරව, ෆ්ලැට් ෆෑන් හා හොලෝ කෝන් නොසලවලට වඩා ඩිෆ්ලෙක්ටිව් නොසල වර්ගය යොදා ගැනීමේදී වල් පැළ පාලනයේ වැඩි කාර්යක්ෂමතාවක් ඇති වූ බව නිරීක්ෂණය කෙරිණි.

වල් පැළෑටිමය වී වර්ගවල එක් කරලකින් ඇතිවූ ප්‍රජනිතවල රූපවිද්‍යාත්මක ප්‍රභේදනය

රූපවිද්‍යාත්මකව, වල් පැළෑටිමය වී, වගා කරන වීවල ලක්ෂණ පෙන්නුම් කරයි. මාතර දිස්ත්‍රික්කයේ 'හත්අමුණ යායෙන්' ලබාගත් වල් පැළෑටිමය වීවල රූපීය වශයෙන් වෙනස් පේව ආකාර හතෙහි කරල් නියැදි කර 2011 වර්ෂයේදී වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් සකස් කරන ලද ලක්ෂණීකරණ විස්තර ඇතුළත් ග්‍රන්ථය උපයෝගී කර ගනිමින් එක් එක් පේව ආකාරය හඳුනා ගන්නා ලදී. සාමාන්‍ය රේඛීය ආකෘති සකස් කර සමූහ විශ්ලේෂණය ද සිදු කෙරිණි. එකම කරලෙන් තෝරාගත් බීජවලින් හටගත් ප්‍රජනිතවල, පුළුල් වියුක්තවීමේ හේතුවෙන් සැලකිය යුතු රූප විද්‍යාත්මක ප්‍රභේදනයක් ඇති බව සාමූහික කුලක සටහන් සැසඳීමෙන් පෙනිණි. කරල් සහ ධාන්‍යවල ලක්ෂණ මත පදනම්ව, වල් පැළෑටිමය වී කාණ්ඩ 112කට බෙදී ගිය බව ප්‍රතිඵල මගින් වැඩිදුරටත් දැක්වේ. වගා කරන වීවලට වඩා වල් පැළෑටිමය වීවල පුෂ්පිකාව විවෘතවීමට ගතවන කාලය වැඩිය. එමනිසා එය පර-පරාගණය සඳහා වැඩි ඉඩකඩක් සපයයි. වල් පැළෑටිමය වීවල වඩා වැඩි පර-පරාගණයක් පැවතීමෙන් අවබෝධ වනුයේ වල් පැළෑටිමය වී ආසාදිත කුඹුරුවල වෙනත් හඳුනාගත හැකි ප්‍රභේද ඉහළ මට්ටමින් පවතින බවකි.

විවිධ තෙතමන අනුක්‍රමණයන් යටතේ වල් පැළෑටිවල ගතික තත්වයන් සහ පෝෂක උරා ගැනීම

ජලය සහ වල් පැළෑටි අතර නිරන්තර සමීප සබැඳියාවක් පවතී. වල් පැළ ප්‍රජාවේ සහ වර්ධනයේ වෙනස්කම් කෙරෙහි වී පැළයේ වර්ධනය හා අස්වැන්න කෙරෙහි විවිධ තෙතමන අනුක්‍රමණයන් (වැඩි ජල ප්‍රමාණයක් පවතින, සංතෘප්ත, මාරුවෙන් මාරුවට ජලය සැපයීම කරන සහ වියළෙන්නට හරින හා 50% සංතෘප්ත තත්වයන්) බලපාන ආකාරය ඇගයීම පිණිස අධ්‍යයනයක් පවත්වන ලදී. එහි ප්‍රතිඵල මගින් පෙන්වා දෙන ලද්දේ මාරුවෙන් මාරුවට කුඹුරට ජලය සැපයෙන හා එය වියැළෙන්නට හරින තත්වය තුළ ඇති වූ වල් පැළ නෙළා දැමූවිට වී පැළ මගින් වඩා වැඩි නයිට්‍රජන්, ෆොස්ෆරස් හා පොටෑසියම් ප්‍රමාණයක් අවශෝෂණය කර ගැනීමෙන් ඉහළම අස්වැන්න ලැබුණු බවයි. මාරුවෙන් මාරුවට කුඹුරට ජලය සැපයෙන සහ එය වියැළෙන්නට හරින තත්වය තුළ ද 50% සංතෘප්ත තත්වය තුළ ද තෘණ වර්ග වැඩි වශයෙන් දක්නට ලැබුණු අතර වැඩි ජල ප්‍රමාණයක් පවතින තත්වය තුළ පුළුල් පත්‍ර හා පන් වර්ග සුලභ විය. වැඩි ජල ප්‍රමාණයක් පවතින හා සංතෘප්ත තත්වයන් තුළ අශ්ව වලිග (*Leptochloa chinesis*), වෙල් කරාබු (*Ludwigia octovalvis*) සහ දිය හබරල (*Monochoria vaginalis*) වඩාත් සුලභව දක්නට ලැබුණු වල් පැළෑටි වූ අතර මාරුවෙන් මාරුවට කුඹුරට ජලය සැපයෙන හා වියළෙන්නට හරින තත්වය තුළ බහු වාර්ෂික වල් පැළෑටි වන ගිරා තණ (*Paspalum Spp.*) සයනඩන් ඩැක්ටිලන් (*Cyanadon dactylon*) සහ බටදැල්ල (*Isachne globosa*) බහුල විය.

වල් පැළෑටිමය වී වර්ග සහ වගා කරන වී වර්ග අතර තරඟකාරීත්වය හේතුවෙන් ඇතිවන ප්‍රතිඵල

වල් පැළෑටිමය වී වර්ග සහ වගා කරන වී වර්ග අතර තරඟකාරීත්වය හේතුවෙන් ඇතිවන ප්‍රතිඵල ඇගයීම සඳහා Bg 379-2 නමැති වගා කරන වී ප්‍රභේදය (*Oryza sativa*) හා වල් පැළෑටිමය වී වර්ගයට අයත් මාතර දිස්ත්‍රික්කයෙන් එක්රැස් කරගත් පොත්ත කළු පැහැති පේවමය ආකාරයක් අතර පැවති තරඟකාරීත්වයේ ප්‍රතිඵල පරීක්ෂා කර බලන ලදී. මේ සඳහා බඳුන් පරීක්ෂණයක් පවත්වන ලද අතර එහිදී Bg 379-2 ප්‍රභේදයේ බීජ සෙ.මී. 15ක පරතරයකින් යුතුව ස්ථාපිත කරන ලදී. මේවා ප්‍රතිකර්මය ප්‍රකාරව බඳුනකට වල් පැළෑටිමය වී පැළ 0ක්, 1ක්, 2ක්, 3ක්, 4ක්, සහ 5ක් සමග වර්ධනය කර ගැනිණි. වල් පැළෑටිමය වී වර්ගයේ පැළඝනත්වය Bg 379-2 ප්‍රභේදයේ පැළ උස, පත්‍ර සංඛ්‍යාව, පඳුරු සංඛ්‍යාව, පේව ස්කන්ධ නිෂ්පාදිතය, අස්වැන්න සහ අස්වනු ප්‍රමාණය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. වල් පැළෑටිමය වී වර්ගයේ ඉහළ පැළඝනත්වයක් (වර්ග මීටරයට පැළ 55) පැවැති විට පාලකයට සාපේක්ෂව Bg 379 - 2 ප්‍රභේදයේ 78%ක ධාන්‍ය අස්වනු හානියක් ඇතිවිය. වල් පැළෑටිමය වී වර්ගයේ පැළඝනත්වය වර්ග මීටරයට 44ක්, 33ක්, 22ක් සහ 11ක් වූ විට අස්වනු හානිය පිළිවෙළින් 71%ක්, 66%ක්, 53%ක් හා 42%ක් විය. වගා කරන Bg 379-2 වී ප්‍රභේදයේ වර්ධනය සහ ධාන්‍ය අස්වැන්න කෙරෙහි වල් පැළෑටිමය වී වර්ගයේ පොත්ත කළු පැහැති පේව දර්ශය මගින් දැඩි අහිතකර බලපෑමක් ඇති කළ බව අධ්‍යයනයේ ප්‍රතිඵල මගින් පැහැදිලිව පෙන්වා දෙයි. මෙම ප්‍රතිඵල යොදා ගනිමින් ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ කුඹුරුවල වල් පැළකළමනාකරණය කිරීමට ගොවීන් සතු හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා තොරතුරු

සැපයිය හැකිය. විශේෂයෙන්ම මෙම ප්‍රතිඵල වල් පැළෑටිමය වී වර්ග ඇතිවීම වළක්වා ගැනීමේ සහ ඒවා පාලනය කිරීමේ පියවර සඳහා යන පිරිවැය පිළිබඳ මග පෙන්වීමක් හා සාධාරණීකරණයක් ලබා දෙනු ඇත.

ශ්‍රී ලංකාවේ මඩට වී බීජ වපුරන ලද තත්වය තුළ වල් පැළෑටිමය වී වර්ග කළමනාකරණය කිරීම (ජාතික කෘෂිකර්මික පර්යේෂණ සැලැස්ම යටතේ ඇති ව්‍යාපෘතිය)

මෙරටෙහි තිරසාර සහ ලාභදායී වී වගාවක් කිරීම අරමුණු කර ගනිමින් වල් පැළෑටිමය වී වර්ග කළමනාකරණය කිරීම සඳහා මෙම අධ්‍යයනය මගින් ඒකාබද්ධ ප්‍රවේශයක් සකස් කරන ලදී. වල් පැළෑටිමය වී වර්ග කළමනාකරණය කිරීම පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම සඳහා කුරුණෑගල, පුත්තලම, පොළොන්නරුව, අම්පාර, රත්නපුරය, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්ක ඇතුළු ස්ථාන 10කදී දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් පවත්වන ලදී. කුරුණෑගල, පොළොන්නරුව, අම්පාර, රත්නපුරය, ගාල්ල, මාතර, හා හම්බන්තොට පිහිටි වල් පැළෑටිමය වී ආසාදනය අධිකව පැවති කුඹුරුවල ආදර්ශන අත්හදා බැලීම් 13ක් පැවැත්විණි.

නිසි පරිදි බිම් සැකසීම, වල් පැළෑටිමය බීජ වලින් තොර බිත්තර වී භාවිතය, පූර්ව නිර්ගමන පැළෑටිනාශක (පෙට්ලක්ලෝර් හෙ. 1කට ලී 1.6 බැගින්) යෙදීම ඇතුළු ඵලදායී ඒකාබද්ධ පාලන පිළිවෙත් මාලාවක් හඳුනාගෙන එම පිළිවෙත් වී බෝගය ස්ථාපිත කිරීමේ විවිධ ක්‍රම (පැළ උදුරා සිටුවීම, බීජ පැළ සිටුවීම, ඩ්‍රම් බීජ වප්කරය භාවිතයෙන් පෙළට බීජ වැපිරීම සහ අහඹු ලෙස බීජ වැපිරීම) යටතේ කුරුණෑගල, පොළොන්නරුව, අම්පාර, රත්නපුරය, ගාල්ල, මාතර, සහ හම්බන්තොට පිහිටි ආදර්ශන බිම් 13ක ඇති ගොවි ක්ෂේත්‍රවල ආදර්ශනය කරන ලදී. එහිදී, ඒ ඒ පරීක්ෂණ ක්ෂේත්‍රය තුළ එම ඵලදායී කළමනාකරණ පිළිවෙත් ගොවීන් විසින් අනුගමනය කරන පිළිවෙත් සමග සසඳා බලන ලදී. ගොවීන් විසින් අනුගමනය කරන ලද පිළිවෙත් සමග සසඳා බලන විට, යථෝක්ත කළමනාකරණ පිළිවෙත් අනුගමනය කරමින් පැළ උදුරා සිටුවීම, බීජ පැළ සිටුවීම හා පෙළට බීජ වැපිරීම හේතුවෙන් වල් පැළෑටිමය වී පැළ මතුවීම ද ඒවායෙහි වර්ධනය ද බෙහෙවින් අඩු වූ අතර වල් පැළෑටිමය වී වර්ග හේතුවෙන් ඇතිවන අස්වනු හානිය ද අඩුවිය.

මඩට බීජ වැපිරීමේ අත්හදා බැලීම් සඳහා ජාතික සම්බන්ධීකරණ පැළෑටිනාශක පරීක්ෂණ අත්හදා බැලීම් පැවැත්වීම

අබණ්ඩව සිදුකරන තීව්‍ර පළිබෝධනාශක භාවිතය තුළින් වල් පැළෑටි ගහනය එයට හුරුවී භාවිත කරන පාලන පියවරවලට ඔරොත්තු දෙන වල් පැළෑටි විශේෂ ස්ථාපිත කිරීමකට තුඩු දෙයි. එමනිසා, පුළුල් පරාසයක පැළෑටි විනාශ කර දැමීමේ හැකියාව, වැඩි කාල පරතරයකින් යුතුව යෙදීමට හැකිවීම සහ විෂ සහිත බව අඩුවීම වැනි ප්‍රමුඛ ලක්ෂණවලින් යුක්ත අලුතින් හඳුන්වා දෙන ලද පැළෑටිනාශක ඇගයීම කාලීන අවශ්‍යතාවක් වී ඇත. 2011 වර්ෂයේදී මඩබිම් තත්වයන් යටතේ ලියාපදිංචිය අපේක්ෂාවෙන් ඇති පැළෑටිනාශක 7ක් අත්හදා බලන ලද අතර ඉන් පැළෑටිනාශක 4ක් (බ්‍යුටක්ලෝර්, ප්‍රොපයිරිසල්ෆියුරන්, බිස්පයිරිබැක් සෝඩියම්+මෙටමිෆොප්, බෙන්සල්ෆියුරන් මීතයිල්+ බිස්පයිරිබැක් සෝඩියම්) ගොවි ක්ෂේත්‍රවල නියමුමට්ටමින් අත්හදා බැලීම සඳහා තෝරා ගන්නා ලදී.

වියළි බීජ ස්ථාපනය සඳහා පැළෑටිනාශක පරීක්ෂණ අත්හදා බැලීම්

දැනටමත් නිර්දේශ කර ඇති පැළෑටිනාශක 8ක් වියළි බීජ ස්ථාපනය සඳහා සුදුසුදැයි අත්හදා බලන ලදී. ඒ අතරින් 3-4 DPAවලට පසු MCPA යෙදීම ද ක්ලින්චර්වලට පසු MCPA සහ සොලිටෝ යෙදීම ද වියළි බීජ ස්ථාපනය සඳහා සුදුසු බවට තෝරා ගැනිණි.

පාංශු විද්‍යාව

ලවණතාවට ඔරොත්තු දෙන වී ප්‍රභේද

ලවණතාවට ඔරොත්තු දෙන වී ප්‍රභේද බිහි කිරීමේ පර්යේෂණ 2003 වර්ෂයේදී ආරම්භ කරන ලද අතර මේ වනවිට එවන් ප්‍රභේද 17ක් හඳුනාගෙන ඇත. පුත්තලම හා පොළොන්නරුව දිස්ත්‍රික්කවල පිහිටි ගොවි ක්ෂේත්‍රවල ඇති ලවණතා තත්වයන් තුළ වඩා ඉහළ අස්වනු (හෙ.1 කට ටො. 7) ලබා දුන්Bg 11-139 හා Bg 5-110 යන ලවණතාවට ඔරොත්තු දෙන වී ආර 2011 වර්ෂයේදී විවිධ පාරිසරික තත්වයන් යටතේ දීප ව්‍යාප්තව අත්හදා බැලීම සඳහා ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහනට හඳුන්වා දෙන ලදී.

රසායනික පොහොරවලට ප්‍රතිචාර දැක්වීම

පාංශු සාරවත්භාවය අඩු මට්ටම යටතේ හොඳින් වර්ධනය වන වී ප්‍රභේද බිහි කිරීම වී වගාවේ රසායනික පොහොර භාවිතය අඩුඅකර ගත හැකි විකල්පයකි. මින් පෙර සිදු කරන ලද පර්යේෂණ තුළින් Bg 352,Bg 358,Bg 305, At 353,At 354,At362,Bg 379-2, මුරුංගකායන්, සුදු හීනැටි,F4,F7 සහ F10 පාංශු සාරවත්භාවය අඩු තත්වයන්ට සුදුසු බව හඳුනා ගැනිණි. පසෙහි නොස්ෆරස් අඩු තත්වයන් තුළ යථෝක්ත ප්‍රභේද ක්‍රියා කරන ආකාරය තහවුරු කර ගැනීම සඳහා 2011 වර්ෂයේදී ආරම්භ කරන ලද පර්යේෂණ තව දුරටත් සිදු කෙරෙමින් පවතී.

දේශීය තත්වයන් යටතේ පොටෑසියම් පොහොර යෙදීම කෙරෙහි වී බෝගය ප්‍රතිචාර දක්වනුයේ කලාතුරකිනි. මූලික පොහොරක් වශයෙන් ද වී කරල් ඇතිවන අවධියේදී ද කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත සම්පූර්ණ පොටෑසියම් පොහොර ප්‍රමාණයම යෙදූ තත්වය සමග සසඳා බැලූ විට වී කරල් ඇතිවන අවධියේදී පමණක් පිදුරු ආපසු කුඹුරට යොදූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත පොටෑසියම් ප්‍රමාණයෙන් අඩක් ද යෙදීම මගින් ඒ හා සමාන ප්‍රතිඵල ලැබුණු බව වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී පවත්වන ලද දිගු කාලීන පර්යේෂණය යටතේ 2011 වර්ෂයේදී ලබාගත් දෙවන හා තෙවන කන්න ප්‍රතිඵල තුළින් අනාවරණය විය. ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ වූ ව්‍යාපෘතිය හරහා 2011 වර්ෂයේදී කළුතර, පොළොන්නරුව, කුරුණෑගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක 4හි ස්ථාන 37කදී පවත්වන ලද එම පර්යේෂණයේම පළමු කන්න ප්‍රතිඵල මගින් ද යථෝක්ත සොයා ගැනීම් සනාථ වී ඇත. මෙහි දිගු කාලීන බලපෑම් නිශ්චය කර ගැනීම සඳහා සියලුම ස්ථානවලදී අධ්‍යයන සිදු කරමින් පවතී.

ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්මට අදාළ ව්‍යාපෘතිය යටතේ 2011 වර්ෂයේදී කළුතර, පොළොන්නරුව, කුරුණෑගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක 4හි ස්ථාන 37කදී පවත්වන ලද පර්යේෂණාවලින් අනාවරණය වූයේ පත්‍ර වර්ණ සටහන් පදනම් කර ගනිමින් නයිට්‍රජන් පොහොර යෙදීමෙන් ස්ථානය කවරක් වුවද අස්වැන්න අඩුවීමකින් තොරව නයිට්‍රජන් පොහොර භාවිතය 25% - 33%කින් අඩු කර ගැනීමට හැකි වන බවයි. එමෙන්ම වත්මන් කෘෂිකර්මදෙපාර්තමේන්තු නිර්දේශය සමග සසඳා බැලීමේදී පත්‍ර වර්ණ සටහන් මත පදනම්ව නයිට්‍රජන් පොහොර යෙදීම මගින් 5%ක අමතර අස්වනු වර්ධනයක් ලබාගත හැකි බව පොළොන්නරුව දිස්ත්‍රික්කයේදී නිරීක්ෂණය කිරීමට ලැබිණි.

වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී පොහොර සම්බන්ධයෙන් පවත්වන ලද දිගු කාලීන පර්යේෂණයකදී පසේ සරුබව පිළිබඳ පරීක්ෂා සිදු කෙරිණි. වී අස්වැන්න සහ පසේ සරුබව වර්ධනය කර ගැනීම සඳහා රසායනික පොහොර සහ කාබනික පොහොර එකට යෙදීම එම පොහොර වෙන වෙනම යෙදීමට වඩා සුදුසු බව අනාවරණය විය. කුඹුරුවලට යළි යළිත් රසායනික පොහොර හෝ කාබනික පොහොර යෙදුව ද දිගු කාලීන වශයෙන් තීරණාත්මක මට්ටම්වලට වඩා පසේ සරුබවක් ඇති නොවේ. එසේ වුවද, කාබනික සහ රසායනික යන පොහොර වර්ග දෙකම කන්නමය වශයෙන් යෙදීමෙන් පසේ සරුබව ප්‍රශස්ත මට්ටම්වලින් ඇතිවන බව තහවුරු වී ඇත.

විවිධ ක්‍රම යොදූ ගනිමින් නොස්ෆරස් පොහොර යෙදීමේ දිගු කාලීන බලපෑම නිරීක්ෂණය කිරීම පිණිස වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී දිගු කාලීන ක්ෂේත්‍ර පරීක්ෂණයක් ස්ථාපිත කරන ලදී. 2011 වර්ෂයේදී එක්රැස් කර ගන්නා ලද 4වන කන්නයේ නියැදි මගින් අනාවරණය වූයේ නොස්ෆරස් යෙදූ ක්ෂේත්‍ර අතර සැලකිය යුතු අස්වනු වෙනසක් දැක ගැනීමට නොලැබුණු බවයි. කන්නයක් පාසා නොස්ෆරස් යොදන ලද ක්ෂේත්‍ර අතර 4වන කන්නයෙන් පසුව වුවද සැලකිය යුතු අස්වනු වෙනසක් නිරීක්ෂණය කිරීමට නොලැබිණි. ධාන්‍ය අස්වැන්න කෙරෙහි කන්නයක් හැර කන්නයකදී නොස්ෆරස් පොහොර යෙදීම මගින් ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම පිණිස ජාතික කෘෂිකර්මික පර්යේෂණ සැලැස්මට අදාළ ව්‍යාපෘතිය යටතේ 2011 වර්ෂයේදී පොළොන්නරුව, කුරුණෑගල, කළුතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක 4හි ස්ථාන 37කදී ඒ හා සමාන පරීක්ෂණ ක්ෂේත්‍ර ස්ථාපිත කරන ලදී. එහිදී නොස්ෆරස් පොහොර භාවිත නොකිරීමෙන් අස්වැන්නෙහි සැලකිය යුතු අඩුවීමක් ඇති නොවූ බව පළමු කන්නයේ ප්‍රතිඵල මගින් අනාවරණය විය. කන්නයක් හැර කන්නයක් තුළ නොස්ෆරස් පොහොර යෙදීමෙන් ධාන්‍ය අස්වැන්න අඩු නොවන අතර නොස්ෆරස් පොහොර භාවිතය අඩුකර ගත හැකිය. මෙම තොරතුරු තව දුරටත් නිශ්චය කර ගැනීම සඳහා පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී.

වී වගාවේදී සිදුවන පොහොර අපතේ යෑම අඩුකර ගත හැකි විකල්ප ක්‍රියාමාර්ගයක් වන්නේ සෙමෙන් ක්ෂේත්‍රයට මුසුවන පොහොර හඳුන්වාදීමයි. නයිට්‍රජන්, නොස්ෆරස් සහ පොටෑසියම්වල විවිධ නැනෝ සම්මිශ්‍රණ 2011 වර්ෂයේදී වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ ඇති හරිතාගාර තත්වයන් තුළ අත්හදා බලන ලදී. ඒ අතරින් එක් නයිට්‍රජන් සම්මිශ්‍රණයක් හා එක් පොටෑසියම් සම්මිශ්‍රණයක්

බලාපොරොත්තු තැබිය හැකි ප්‍රතිඵල පෙන්වීය. 2011/12 මහ කන්නයේදී ක්ෂේත්‍ර තත්වයන් යටතේ බලාපොරොත්තු තැබිය හැකි සම්මිශ්‍රණ අත්හදා බලන ලද අතර එහිදී පොහොර භාවිතය අඩුකර ධාන්‍ය අස්වැන්න වැඩිකර ගැනීමේදී නයිට්‍රජන් සම්මිශ්‍රණවලට වඩා පොටෑසියම් සම්මිශ්‍රණ යෝග්‍ය බව අනාවරණය විය. නයිට්‍රජන් හා පොටෑසියම් සැපයීමේ හැකියාව පරීක්ෂා කර බැලීම සඳහා සම්මිශ්‍රණ දෙකම 2වන කන්නයට ද අත්හදා බැලෙමින් පවතී.

ජල කළමනාකරණය සහ භූගෝලීය තොරතුරු ක්‍රමය

වී බෝගයේ තීරණාත්මක අදියරේදී ජලය හිඟ තත්වය තුළ පොටෑසියම් ප්‍රයෝජ්‍යතාව කෙරෙහි පිදුරු මගින් ඇති කරන බලපෑම

වී බෝගයේ තීරණාත්මක වර්ධන අදියරේදී ජලය හිඟවීම වී වගා කරන පරිසර පද්ධති බොහොමයක අඩු ඵලදායිතාවට ප්‍රධාන හේතුවකි. ජල හිඟයේ බලපෑම වඩාත්ම තීරණාත්මක වන්නේ මල් පිපීමට සතියකට පෙර හා පසු අදියරේදී බව 2011 වර්ෂයේදී පවත්වන ලද පරීක්ෂණවලදී අනාවරණය විය. ජලය හිඟ තත්වයන් තුළ වී පැළෑටිය පොටෑසියම් අවශෝෂණය සීමා කරන බව වැඩිදුරටත් නිරීක්ෂණය කිරීමට ලැබිණි. පොටෑසියම් යනු නිෂ්පාදිතයේ තත්වය හා ප්‍රමාණය නිශ්චය කරන වඩාත්ම වැදගත් කායික විද්‍යාත්මක හා පෙව රසායන කාර්යයන්ට ඉවහල් වන අත්‍යවශ්‍ය මූල ද්‍රව්‍යයකි. එහෙයින් අඩු පොටෑසියම් මට්ටම් හේතුවෙන් පැළයකට ශුකිකා සංඛ්‍යාව හා කරල් සංඛ්‍යාවත් පිරුණු ධාන්‍ය ප්‍රතිශතයත් බීජ 1000ක බරත් අඩුවේ. ඒ අනුව වී පැළයේ තීරණාත්මක වර්ධන අදියරේදී නිසි තෙතමන තත්වයක් පවත්වාගෙන යෑම වැදගත් බව මෙම ප්‍රතිඵල මගින් හැඟවේ. පිදුරු යනු පසෙහි ඇති තෙතමනය රැක ගැනීම සඳහා යොදා ගත හැකි සුලභව පවතින ද්‍රව්‍යයකි. මෙම අධ්‍යයනය තුළින් වී බෝගයේ තීරණාත්මක වර්ධන අදියරවලදී ජලය හිඟ තත්වයන් පවතින විට පසෙහි ඇති උපයෝජ්‍ය පොටෑසියම් ප්‍රමාණය කෙරෙහි පිදුරු මගින් ඇතිවන බලපෑම නිශ්චය කර ගැනීමට අපේක්ෂා කරන ලදී.

ප්‍රධාන ප්‍රතිකර්ම 2ක් සහ උප ප්‍රතිකර්ම 2ක් යොදා ගනිමින් පරීක්ෂණයක් පවත්වන ලදී. වගා කන්නය පුරාම ජල හිඟයක් නොපැවතීම සහ වී බෝගයේ වඩාත්ම තීරණාත්මක අදියරේදී ජල හිඟයක් පැවතීම ප්‍රධාන ප්‍රතිකර්ම දෙක විය. නයිට්‍රජන් හා ෆොස්ෆරස් පමණක් යෙදීම, නයිට්‍රජන්, ෆොස්ෆරස් හා පොටෑසියම් යෙදීම, නයිට්‍රජන්, ෆොස්ෆරස් හා පොටෑසියම් පිදුරු සමඟ යෙදීම වශයෙන් විවිධ පොහොර මට්ටම් භාවිත කිරීම උප ප්‍රතිකර්ම හතර විය. ජල හිඟයක් නොමැති විට පොහොර පිළිබඳ ප්‍රතිකර්ම 4 අතර සැලකිය යුතු අස්වනු වෙනසක් නොවූ බව ප්‍රතිඵල මගින් අනාවරණය විය. ජල හිඟයක් පැවති විට පොහොර මට්ටම් 4 අතර සැලකිය යුතු අස්වනු වෙනසක් නිරීක්ෂණය කරන ලදී. නයිට්‍රජන්, ෆොස්ෆරස් හා පොටෑසියම් සමග පිදුරු යෙදූ විට හෙ. 1කට ටො. 5.1ක ඉහළම අස්වැන්න වාර්තා වූ අතර නයිට්‍රජන් හා ෆොස්ෆරස් ප්‍රතිකර්මය මගින් හෙ.1 කට ටො. 3.4ක අඩුම අස්වැන්න ලැබිණි. එමනිසා වී බෝගයේ තීරණාත්මක වර්ධන අදියරේදී ජල හිඟයක් ඇති වූ විට අස්වැන්න සැලකිය යුතු මට්ටමින් පොටෑසියම් හා පිදුරු යෙදීම කෙරෙහි ප්‍රතිචාර දක්වන බව නිරීක්ෂණය කිරීමට ලැබිණි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජල සම්පාදිත හා වර්ෂාපෝෂිත කුඹුරු ඉඩම්වල සීමා මායිම් ලකුණු කිරීම

කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා සුදුසු වී ප්‍රභේද සහ අස්වැන්න වෙනස්වීම අඩු කර ගැනීම සඳහා කළමනාකරණ පිළිවෙත් මාලාවක් හඳුන්වාදීමේ අරමුණ ඇතිව වර්ෂාපෝෂිත හා ජල සම්පාදිත කුඹුරු ඉඩම්වල සීමා මායිම් ලකුණු කිරීම පිණිස ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්මට අදාළ ව්‍යාපෘතිය යටතේ අධ්‍යයන පවත්වන ලදී. 2011 වර්ෂයේදී ගොවිජන සේවා මධ්‍යස්ථාන 55 අතරින් මධ්‍යස්ථාන 12කට අදාළව ඩිජිටල් සිතියම් තුළ ජල සම්පාදිත හා වර්ෂාපෝෂිත කුඹුරුවල ක්ෂේත්‍ර සීමා ලකුණු කරන ලදී. මහනානේරිය, ඉබ්බාගමුව සහ අලව්ව යන ගොවිජන සේවාමධ්‍යස්ථානවලට අයත් වර්ෂාපෝෂිත කුඹුරු, කුඩා ජල සම්පාදන යෝජනා ක්‍රම යටතේ ඇති කුඹුරු වශයෙන් සිතියම් සකස් කරන ලදී. ව්‍යාපෘතියේ මීළඟ පියවර වශයෙන් වර්ෂාපෝෂිත කුඹුරුවල ජලය පවතින ප්‍රමාණය නිශ්චය කිරීම පිණිස තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 3ක වර්ෂාපතන දත්ත හා පසෙහි භෞතික ලක්ෂණ විශ්ලේෂණය කෙරෙනු ඇත.

ශස්‍ය විද්‍යාව

තෙතමනය සීමිත පරිසර තත්වයන්ට සුදුසු ප්‍රභේද ඇගයීම

තෙතමනය සීමිත තත්වයන් සඳහා සුදුසු වී ප්‍රභේද තෝරා ගැනීම පූර්ව අවශ්‍යතාවකි. පෙර වර්ෂයේදී

වියළි තත්වයන් තුළ අත්හද බැලීමෙන් පසු තෝරා ගන්නා ලද වී ප්‍රභේද 17ක් 2011 වර්ෂයේදී අන්තර්ජාතික වී පර්යේෂණ ආයතන / කෘෂිකර්ම දෙපාර්තමේන්තු සහයෝගිතා පර්යේෂණ වැඩසටහන යටතේ ස්වායු මෙන්ම වියළි යන තත්වයන් දෙකම තුළ ඇගයීමට ලක් කෙරිණි. ඒ අතරින් තෙතමනය සීමිත තත්වයන් යටතේ වගාව සඳහා DSN 11,DSN 22,DSN 37 හා DSN 56 යන ප්‍රභේද සම්බන්ධයෙන් බලාපොරොත්තු තැබිය හැකි බව සොයා ගැනිණි.

නියඟයට ඔරොත්තු දෙන බවට මින් පෙර හඳුනා ගන්නා ලද CNI9024 හා CNI 9028 යන ප්‍රභේද දෙක 2011 වර්ෂයේදී ඒවායෙහි අනුවර්ත්‍යතාව හා ගොවීන්ගේ පිළිගැන්ම සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා අතරමැදි කලාපයේ පිහිටි ගොවි ක්ෂේත්‍ර වලදී අත්හදා බලන ලදී. එහිදී එම ප්‍රභේද එම තත්වයන්ට අනුවර්තනය වන බව ද ඒවා සඳහා ගොවීන්ගේ පිළිගැන්මක් ඇති බව ද සොයා ගැනිණි.

ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හද බැලීම් වැඩසටහන

2011 වර්ෂයේදී මාස 3න් හා මාස 3 $^{1}/_{2}$ න් පරිණත වන වයස් කාණ්ඩ යොදා ගනිමින් ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හද බැලීම් වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මාස 3 වයස් කාණ්ඩයේ නව වී ආර 9ක් ද මාස 3 $^{1}/_{2}$ වයස් කාණ්ඩයේ නව වී ආර 8ක් ද සම්මත සැසඳුම් ප්‍රභේද සමග සම්පූර්ණයෙන්ම පර්යේෂක විසින් කළමනාකරණය කරන ලද තත්වයන් යටතේ ස්ථාන 8කදී අත්හදා බලන ලදී.

ප්‍රභේද අනුවර්තන අත්හද බැලීම් වැඩසටහන යටතේ ගොවි ක්ෂේත්‍රතුළ වැඩිදුරටත් පරීක්ෂා කර බැලීම සඳහා පහත සඳහන් ආර තෝරා ගන්නා ලදී.

Bg 5 - 110 : මාස 3 $^{1}/_{2}$ වයස් කාණ්ඩයේ ලවණතාවට ඔරොත්තු දෙන ආර

Bg 11 - 139 : මාස 3 $^{1}/_{2}$ වයස් කාණ්ඩයේ ලවණතාවට ඔරොත්තු දෙන ආර

Bg 8 - 2398 : මාස 3 $^{1}/_{2}$ වයස් කාණ්ඩයේ මධ්‍යස්ථ කෙටි ධාන්‍ය සහිත ආර

ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වැඩසටහන

At 7-800, At 6-631, Bw 5-1621, Bg 7- 997 සහ Bg 6-1350 නමැති ප්‍රමුඛ ලක්ෂණ සහිත නව ආර 5ක අනුවර්ත්‍යතාව පරීක්ෂා කර බැලීමේඅත්හදා බැලීම් 2011 වර්ෂයේදී වියළි, අතරමැදි සහ තෙත් කලාපවල පිහිටි ස්ථාන 75කට අධික සංඛ්‍යාවකදී පවත්වන ලදී. අත්හදා බලන ලද ආර අතරින්, At 7-800 (මාස 3 වයස් කාණ්ඩයට අයත් සුදු නිව්ඩු) සම්මත සැසඳුම් ප්‍රභේදවලට වඩා උසස් ලක්ෂණ පෙන්නුම් කළේය.

විශාල පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වැඩසටහන

2011 වර්ෂයේදී At 4-486 (මාස 3 වයස් කාණ්ඩයේ මධ්‍යස්ථ කෙටි හැඩැති, සුදු ධාන්‍ය සහිත), At 6-650 (මාස 3 $^{1}/_{2}$ රතු සම්බා) සහ Ld 3-6-12 (මාස 3 $^{1}/_{2}$ සුදු සම්බා) යන ප්‍රමුඛ ලක්ෂණ සහිත නව ආර 3 ඒවාට ඇති ගොවීන්ගේ පිළිගැන්ම සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා විශාල ගොවි ක්ෂේත්‍රවලදී අත්හදා බලන ලදී. ආර 3ම බලාපොරොත්තු තැබිය හැකි ලක්ෂණ පෙන්නුම් කළේය.

බිත්තර වී සහිත කුඩා මලු ලබාදීම මගින් මෙම ආර ඉදිරියේදී ගොවීන් අතර ප්‍රචලිත කෙරෙනු ඇති අතර මේවා ජාතික මට්ටමින් නිදහස් කිරීම සලකා බැලීමට පෙර ගොවීන්ගේ ප්‍රතිචාරය ලබා ගැනෙනු ඇත.

ඒකාබද්ධ පැළෑටි පෝෂණ ක්‍රමය සහ කාබනික පොහොර නිෂ්පාදන හා ප්‍රවර්ධන වැඩසටහන

කාබනික පොහොර භාවිතයෙන් අකාබනික පොහොර භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ යන අතර එමගින් අමතර අත්‍යවශ්‍ය පෝෂක ප්‍රමාණයක් පසට සැපයීමද සිදු වේ. මෙම සංසිද්ධිය අස්වැන්න කෙරෙහි බලපෑමක් ඇති නොකර වී වගාවේ අකාබනික පොහොර භාවිතය අඩුකර ගැනීමට උපයෝගි කර ගත හැකිය. විවිධ අකාබනික හා කාබනික පොහොර සංයෝග යොදා ගනිමින් 2011 වර්ෂයේදී කන්න 2ක් පුරා පවත්වන ලද අත්හදා බැලීමකින් අනාවරණය වූයේ හෙ. 1කට පිදුරු ටො. 4ක් සහ හෙ. 1කට කොම්පෝස්ට් ටො.2ක් සමග රසායනික පොහොර යෙදීමෙන් පොහොර භාවිතයේ කාර්යක්ෂමතාව වැඩිවන බවයි. ඒ අනුව, පහත රට අතරමැදි කලාපයේ වගා කරන වීවල අස්වැන්න කෙරෙහි බලපෑමක් ඇති නොකර රසායනික පොහොර භාවිතය 25%කින් අඩුකර ගත හැකිය.

මෙය විශාල පරිමාණ ක්ෂේත්‍ර අත්හදා බැලීම් යටතේද පරීක්ෂා කර බලන ලද අතර එමගින් පෙන්වා දෙන ලද්දේ රසායනික පොහොර භාවිතය 85%කින් අඩු කළ ද එමගින් අස්වැන්න කෙරෙහි බලපෑමක් ඇති නොවූ බවයි.

වී වගාවේ ධාන්‍ය අස්වැන්න කෙරෙහි විවිධ කොම්පෝස්ට් මට්ටම් බලපාන ආකාරය

කොම්පෝස්ට් යොදන ප්‍රමාණය හා කාලය ගොවීන්ට තම බෝග අස්වැන්න වැඩිකර ගැනීමට උපකාරී වෙයි. විශේෂයෙන්ම කාබනික වශයෙන් සිදු කරන වී වගාවේදී කාබනික පොහොරවල පෝෂක සැපයීමේ හැකියාව සහ වී බෝගය කොම්පෝස්ට් යෙදීමට ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳව නොදන්නා හෙයින් පහතරට අතරමැදි කලාපයේ සිදු කරන වී වගාවෙන් ඉහළ අස්වැන්නක් ලබා ගැනීම පිණිස කොම්පෝස්ට් යෙදිය යුතු ප්‍රමාණය සහ කාලය නිශ්චය කර ගැනීම පිණිස 2011 වර්ෂයේදී පරීක්ෂණයක් පවත්වන ලදී. කාබනික වශයෙන් වගා කරන ලද බෝගය සඳහා හෙ. 1කට කොම්පෝස්ට් ටො. 2,4,6,8 සහ 10 යන ප්‍රමාණයන්ගෙන් යොදා (සම්පූර්ණ ප්‍රමාණයම එක් වරකට වශයෙන්, මූලික පොහොර වශයෙන් පමණක් සහ මුලින්ම සහ පඳුරු දමන අවධියේදී සමාන ප්‍රමාණවලින් දෙවරක් වශයෙන්) අත්හදා බලන ලදී. ප්‍රතිඵල මගින් අනාවරණය වූයේ වැඩි කොම්පෝස්ට් ප්‍රමාණයක් යෙදීමෙන් වැඩි ධාන්‍ය අස්වැන්නක් ලැබෙන බවත් එක්වරම මුළු කොම්පෝස්ට් ප්‍රමාණයම යොදනවාට වඩා කොටස් වශයෙන් යෙදීම වඩා ප්‍රයෝජනවත් වන බවත්ය.

කොම්පෝස්ට් නිෂ්පාදනය සහ ප්‍රවර්ධනය

2011 වර්ෂයේදී පිදුරු, තෘණ වර්ග, එළවළු බෝග අවශේෂ, ග්ලිරිසීඩියා, සෙස්බනියා, කෙසෙල් බෝග අවශේෂ, රොක් ෆොස්ෆේට් සහ ගොවිපළෙහි වූ අනෙකුත් පැළෑටි අවශේෂ උපයෝගී කර ගනිමින් කොම්පෝස්ට් ටො. 191ක් නිපදවන ලදී. එයට අමතරව, කොම්පෝස්ට් නිෂ්පාදනයේදී උපයෝගී කර ගැනීම සඳහා උසස් තත්වයේ මුහුන් ටො.11ක් ද නිපදවා ගොවීන් අතර බෙදා හරින ලදී. වසර තුළ අක්. 3.75ක ග්ලිරිසීඩියා වගාවක් ඇති කර අක්. 2.5ක පැවති පැගිරි වගාවක් නඩත්තු කරන ලදී. සෙස්බනියා බීජ කි.ග්‍රෑ. 250ක් සහ සන්හෙම්ප් බීජ කි.ග්‍රෑ. 240ක් නිපදවා සෙස්බනියා බීජ කි.ග්‍රෑ 50ක් කොළ පොහොර ප්‍රවර්ධන වැඩසටහන යටතේ බීජ නිපදවීම සඳහා ගොවීන් අතර බෙදා දෙන ලදී. කාබනික ද්‍රව්‍ය විවිධ ප්‍රමාණ යොදා ගනිමින් විවිධ කොම්පෝස්ට් වර්ග 30ක් නිපදවා ඒවායෙහි පෝෂක අන්තර්ගත ප්‍රමාණයන් දැන ගැනීම සඳහා විශ්ලේෂණය කරන ලදී. එයින් වර්ග 8ක් ප්‍රමිතියට අනුකූල විය. මෙම කාබනික ද්‍රව්‍ය සහ මිශ්‍රණ අනුපාතය කොම්පෝස්ට් නිෂ්පාදනයේ නියැළි ගොවීන් සඳහා නිර්දේශ කළ හැකිය. 2011 වර්ෂයේදී ගොවීන්, ශිෂ්‍යයින් හා නිලධාරීන් ඇතුළු 3,000ක පිරිසකට පමණ කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය පිළිබඳ පුහුණුව ලබාදෙන ලදී. මුහුන් සහ සෙස්බනියා බීජ මෙම පුහුණුවන්නන් අතර බෙදා දෙන ලදී.

අභිජනන බීජ නිෂ්පාදනය

ජාතික බිත්තර වී නිෂ්පාදන වැඩසටහන සඳහා ජානමය පවිත්‍රතාවෙන් හා උසස් තත්වයෙන් යුතු බිත්තර වී සැපයීම සහතික කිරීම සඳහා සියලුම වයස් කාණ්ඩවලට අයත් නිර්දේශිත ප්‍රභේදවල අභිජනන බීජ නිෂ්පාදනය අබණ්ඩවසිදුකෙරිණි

වගු අංක 2.3.2 : 2010/11 මහ කන්නයේ සහ 2011 යල කන්නයේදී අභිජනන බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)

වයස් කාණ්ඩය/ප්‍රභේදය	නිපදවන ලද අභිජනන බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)		
	2010/11 මහ	2011 යල	එකතුව
මාස - 5-6			
Bg 3-5	40	-	40
Bg 745	40	-	40
මාස 4			
Bg 379-2	160	120	280
Bg 450	120	80	200
Bg 403	100	-	100
Bg 454	-	40	40
Bg 406	60	160	220
මාස 3.5			
Bg 94-1	80	160	240
Bg 352	80	260	340
Bg 357	80	60	140
Bg 358	140	280	420
Bg 359	160	200	360
Bg 360	60	140	300
Bg 366	200	160	360
මාස 3			
Bg 300	140	240	380
දින 80			
Bg 250	40	40	80

පහත රට තෙත් කලාපීය වී වගාවේ ඵලදායිතාව ඉහළ නැංවීම

වී වගාවේ ඵලදායිතාව සහ ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමේ අරමුණ ඇතිව කෘෂිකර්ම අමාත්‍යාංශයේ විශේෂ මග පෙන්වීම යටතේ 2011 වර්ෂයේදී පහත රට තෙත් කලාපීය දිස්ත්‍රික්කවල (කළුතර,ගාල්ල, මාතර, ගම්පහ, කොළඹ, රත්නපුරය සහ කෑගල්ල) විශේෂ වැඩසටහනක් දියත් කරන ලදී. මෙම ව්‍යාපෘතිය පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ රේඛීය ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියාත්මක කෙරෙනු ඇත. ප්‍රදේශයේ ගොවීන්ගේ දැවෙන ගැටලු පිළිබඳව සොයා බැලීම පිණිස අදාළ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් ඉලක්ක කණ්ඩායම් සමඟ මූලික සාකච්ඡා පවත්වන ලදී. සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය සමඟ පාද මූලික සමීක්ෂණයක් පැවැත්වෙනු ඇති අතර ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ඉඩම් ලක්ෂණීකරණ අධ්‍යයනයක් සිදු කරනු ඇත.

තාක්ෂණ ප්‍රචාරණය

වී නිෂ්පාදන තාක්ෂණ පුහුණු මධ්‍යස්ථානය නිල වශයෙන් ආරම්භ කිරීමත් සමඟ වී පර්යේෂණ හා සංවර්ධන ආයතන පරිශ්‍රයේදී තාක්ෂණ ප්‍රචාරණ ක්‍රියාවලිය ආරම්භ විය. 2011 වර්ෂයේදී අදාළ පාර්ශ්වකරුවන් හා නිශ්චය කර ගන්නා ලද තාක්ෂණයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පූර්ණ දින පුහුණු වැඩසටහන් පැවැත්විණි. ක්ෂේත්‍ර ව්‍යාපෘති කාර්ය මණ්ඩලය, ගොවීන්, කෘෂිකර්ම ගුරුවරුන්, විශ්වවිද්‍යාල සිසුන්, පාසැල් සිසුන් සහ පෞද්ගලික අංශයේ පිරිස් සඳහා 2011 වර්ෂයේදී පුහුණු වැඩසටහන් 4,192ක් පවත්වන ලදී. පුහුණු වැඩසටහන් සඳහා පාසැල් සිසුන් 809දෙනෙකු සහභාගි වූ අතර කෘෂිකර්ම පාසැල්වල සිසුන් 288දෙනෙකුට සහ විශ්වවිද්‍යාල සිසුන් 57දෙනෙකුට තම පර්යේෂණ ව්‍යාපෘති

සම්පූර්ණ කිරීමට අවශ්‍ය පුහුණුව හා සහාය ලබාදිණි. 2011 වර්ෂයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලයේ සහ වෙනත් දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහභාගිත්වය ඇතිව පර්යේෂණ ව්‍යාප්ති කටයුතු පිළිබඳ සාකච්ඡා සහ කන්න රැස්වීම් පවත්වන ලදී. ගරු කෘෂිකර්ම අමාත්‍යතුමන්ගේ, වෙනත් නිලධාරීන්ගේ සහ ගොවීන්ගේ සහභාගිත්වයෙන්, පුහුණු මධ්‍යස්ථානයට අනුබද්ධව ඉදිකළ නේවාසිකාගාර සංකීර්ණය විවෘත කිරීමේ උළෙලට සමගාමීව පර්යේෂණ හා සංවර්ධන කටයුතු ආදර්ශනය කිරීම පිණිස ක්ෂේත්‍ර දිනයක් ද සංවිධානය කෙරිණි.

ආදර්ශ ගම්මාන වැඩසටහන

2010 වර්ෂයේදී ආරම්භ කරන ලද ආදර්ශ ගම්මාන වැඩසටහන කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද විශේෂ ප්‍රතිපාදන යොදා, ගනිමින් 2011 වර්ෂයේදී තවත් ගම්මාන 3කට (අටල්ල, බක්මීවැව සහ මානපහ) ව්‍යාප්ත කරන ලදී. මෙම වැඩසටහනෙහි අරමුණ ගොවීන් වෙනුවෙන් තාක්ෂණය ප්‍රචාරණය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කරන අතරම ගොවිපළ ආදායම ඉහළ නැංවීමයි. 2010/11 මහ කන්නයේදී සහ 2011 යල කන්නයේදී ගම්මාන 3ක ක්ෂේත්‍ර ආදර්ශන ස්ථාපිත කිරීම මගින් වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය වී වගාවට අදාළ තෝරා ගත් තාක්ෂණයන් (පැරෂුට් ක්‍රමය, ඒකාබද්ධ පැළෑටි පෝෂණ ක්‍රමය, ශූන්‍ය බිම් සැකසුම , විශාල පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම්) ප්‍රචාරණය කිරීමට කටයුතු කළේය. බීජ ගුණනය කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක කරන ලද අතර එය, ගොවීන් විසින් සිදුකරන ස්වයං බීත්තර වී නිෂ්පාදනයට උපකාරී වන තිරසාර ක්‍රමයක් පවත්වාගෙන යාමේ ප්‍රයත්නයකි.

වී පර්යේෂණ ස්ථානය - අම්බලන්තොට

අම්බලන්තොට වී පර්යේෂණ ස්ථානයේ ප්‍රධාන අරමුණු වන්නේ දියුණු රතු නිව්ඩු වී ප්‍රභේද, ලවණතාවට ඔරොත්තු දෙන ප්‍රභේද සහ ධාන්‍ය වල තත්වය වැඩිදියුණු කරමින් සහ කෘමි පළිබෝධවලට හා රෝගවලට ප්‍රතිරෝධී වීමේ ලක්ෂණය අන්තර්ග්‍රහණය කරමින් ඉහළ අස්වනු ගෙනදෙන කෙටි කාලීන වී ප්‍රභේද බිහි කිරීමයි.

ප්‍රභේද වැඩිදියුණු කිරීම

දෙමුහුම් සහ වරණ වැඩසටහන

වසර තුළ දෙමුහුම්කරණය හා වරණය අරමුණු කර ගනිමින් මුහුන් 100ක් පමණ බිහි කෙරිණි. සාමුහික ගහන 106ක පමණ ඇගයීම් කටයුතුසිදුකර ඉන් 87ක් වැඩිදුර ඇගයීම සඳහා තෝරා ගැනිණි. එෆ්5 පරම්පරාවේ සිට ඉදිරියට ප්‍රජනිත 1,474ක් පමණ ස්ථාපිත කර ඉන් 221ක් ප්‍රජනිත වශයෙන් තවදුරටත් ඇගයීම සහ අස්වනු අත්හදා, බැලීම් තුළ පරීක්ෂා කිරීම පිණිස තෝරා ගැනිණි.

අස්වනු ඇගයීම

ආර 26ක් පමණ මූලික අස්වනු අත්හදා බැලීම් සඳහා තෝරා ගන්නා ලද අතර වසර තුළ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම්වලදී ඇගයීම සඳහා මූලික අස්වනු අත්හදා බැලීම්වලින් ආර 16ක් ද තෝරා ගැනිණි.

ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහන

At 08-593,At 08-617, At 08-648,At09-854,At 09-861 සහ At 09-1078 යන අලුතින් බිහි කරන ලද වී ආර 6 පිළිබඳ වැඩිදුර ඇගයීම් කටයුතු සිදු කෙරිණි.

- At 08-593: මාස 3, රතු, බාස්මති ආකාරයේ වී ආර
- At 08-617: මාස 3, සුදු, දිගු මධ්‍යස්ථ ප්‍රමාණයේ ධාන්‍ය ඇට සහිත වී ආර
- At 08-648: මාස 3, රතු, දිගු සිහින් ධාන්‍ය ඇට සහිත වී ආර
- At 09-854: මාස 3, සුදු, කුඩා ගෝලාකාර ධාන්‍ය ඇට සහිත වී ආර
- At 09-861: මාස 3, සුදු, කුඩා ගෝලාකාර ධාන්‍ය ඇට සහිත වී ආර
- At 08-1078: මාස 3 $^{1}/_{2}$, රතු, මධ්‍යස්ථ කෙටි ධාන්‍ය ඇට සහිත වී ආර

ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වැඩසටහන

කන්න 2ක් පුරා මාතර සහ හම්බන්තොට යන දිස්ත්‍රික්කවල ස්ථාන 11කදී ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පවත්වන ලදී. පහත දැක්වෙන අලුතින් බිහිකරන ලද ආර 3 ප්‍රභේද අනුවර්තන

අත්හඳ, බැලිම් වැඩසටහන තුළ වැඩිදුරටත් අගයන ලදී.

- At 07-800: මාස 3, සුදු, මධ්‍යස්ථ කෙටි ධාන්‍ය ඇට සහිත වී ආර
- At 07-695: මාස 3 $^{1}/_{2}$, සුදු, කුඩා ගෝලාකාර ධාන්‍ය ඇට සහිත වී ආර
- At 06-631: මාස 3 $^{1}/_{2}$, සුදු, කුඩා ගෝලාකාර ධාන්‍ය ඇට සහිත, පිසූවිට සුවඳැති එමෙන්ම ආහාරයට ප්‍රිය උපදවන ස්වභාවයෙන් යුතු වී ආර

විශාල පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හඳ බැලිම් වැඩසටහන

At 05-1382 නමැති බලාපොරොත්තු තැබිය හැකි ආර විශාල පරිමාණයේ ප්‍රභේද අනුවර්තන අත්හඳ බැලිම් තුළ තවදුරටත් ඇගයීම සඳහා ප්‍රභේද අනුවර්තන අත්හඳ බැලිම්වලින් තෝරා ගන්නා ලදී. At 06- 650 සහ At 06-486 නමැති අලුතින් බිහිකළ ආර 2 පිළිබඳ වැඩිදුර ඇගයීම් කටයුතු ද සිදු කෙරිණි.

අභිජනන බීජ නිෂ්පාදනය

ජාතික බිත්තර වී වැඩසටහන සඳහා At 306, At 307,At 308 At 353, සහAt 362 යන ප්‍රභේදවල අභිජනන බීජ පහත දැක්වෙන ප්‍රමාණවලින් නිපදවන ලදී.

වගු අංක 2.3.3: 2010/11 මහසහ 2011 යල කන්න තුළ නිපදවන ලද අභිජනන බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)

ප්‍රභේදය	2010/11 මහ කන්නයේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)	2011 යල කන්නයේ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)	එකතුව (කි.ග්‍රෑ.)
At 362	180	160	340
At 308	40	100	140
At 307	-	140	140
At 353	20	20	40
At 306	-	40	40
At 405	120	-	120

සහල්වල තත්වය පිළිබඳ පර්යේෂණ

ආහාර වේලට ප්‍රයෝජ්‍ය පෝෂක එක් කිරීමේ අරමුණ ඇතිව සෞඛ්‍ය සම්පන්න ආහාරයක් වශයෙන් දිනපතා පරිභෝජනයට පැළ වූ දුඹුරු සහල් හඳුන්වාදීම පිණිස එම සහල් සංවේදක ඉන්ද්‍රියයන්ට පිළිගත හැකි මට්ටමින් පවතීදැයි දැන ගැනීම සඳහා අධ්‍යයනයක් පවත්වන ලදී. රතු සහල් ප්‍රභේද 2ක් (At 361/At 362) සහ සුදු සහල් ප්‍රභේද 2ක් (At 307/ At 308) යොදා ගනිමින් නිවිඩිඩ ඉවත් නොකළ දුඹුරු සහල් විවිධ ප්‍රමාණයන්ගෙන් නිවිඩිඩ ඉවත් කළ සහල්වලට එක් කිරීමේ හැකියාව අත්හඳ බලන ලදී. රතු නිවිඩු සහ සුදු නිවිඩු සහල් පැළවීම සඳහා ගත වූ කාලය පිළිවෙළින් පැය 24ක් සහ 28කි. නිවිඩිඩ ඉවත් කරන ලද සහල් සඳහා ඉහළම සමස්ත පිළිගැනීම ලැබුණු අතර නිවිඩිඩ ඉවත් නොකළ දුඹුරු සහල්වලට වඩා පැළ වූ දුඹුරු සහල් සඳහා වැඩි පිළිගැන්මක් හිමිවිය. රතු සහ සුදු සහල් වශයෙන් පැළ වූ දුඹුරු සහල් හා නිවිඩිඩ ඉවත් කළ සහල් මිශ්‍ර කිරීමට සුදුසුම අනුපාත පිළිවෙළින් 1:6ක් සහ 1:7ක් විය. බත් ආහාරයට ගන්නා ජනයාගේ දෛනික පෝෂණ හා සෞඛ්‍ය තත්වය වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ගේ දෛනික ආහාර වේලට පැළ වූ දුඹුරු සහල් බත් හඳුන්වාදීම ප්‍රයෝගික වශයෙන් සුදුසු විකල්පයක් බව මෙම ප්‍රතිඵල මගින් පෙන්නුම් කරන ලදී.

සමහර සහල් ප්‍රභේදවල පේලටිනීකරණ උෂ්ණත්වය හා පිසීමට එක්කරන ජල ප්‍රමාණය අනුව ඒවා පිසීමේදී පෙන්නුම් කරන ස්වභාවය ඇගයීමේ පරීක්ෂණයක් සිදු කෙරිණි. අඩු (Bg 403 හා At 405), මධ්‍යස්ථ (Bg 379-2 හා At 306) සහ ඉහළ (At 307 හා At 593) වශයෙන් පේලටිනීකරණ උෂ්ණත්ව කාණ්ඩ 3කින් යුත් සහල් ප්‍රභේද 6ක් ගන්නා ලද අතර එක් එක් කාණ්ඩය තුළ පළමුව සහ දෙවනුව දක්වා ඇති ප්‍රභේදවල ධාන්‍ය ඇට පිළිවෙළින් මධ්‍යස්ථ කෙටි හා දිගු සිහින් හැඩයෙන් හා ප්‍රමාණයෙන් යුතු විය. පිසීම සඳහා එක් කරන ජල පරිමාව වැඩි කිරීමත් සමග පිසින ලද බතෙහි බර, අවශෝෂණය කරගත් ජලයෙහි බර, බර වැඩි වූ ප්‍රතිශතය සහ පිසීමට ගතවූ කාලයද වැඩිවිය. සහල් පිසීමේදී ජලය අවශෝෂණය කර ගැනීම හා බර වැඩි වන ප්‍රතිශතය කෙරෙහි බලපෑමක් ඇති කිරීමට හැකි වන්නේ වී බීජ 1000ක බර (Thousand Grain weight), සහල් බර හෝ ධාන්‍යවල ප්‍රමාණය සහ ප්‍රභේදයක හැඩය මගින් නොව පේලටිනීකරණ උෂ්ණත්වය සහ ඒ හා සම්බන්ධව සහල්වලට ජලය යොදන අනුපාතය මගිනි.

වී පර්යේෂණ ස්ථානය - සමන්තුරේ

සමන්තුරේ වී පර්යේෂණ ස්ථානය ස්ථාපිත කර ඇත්තේ නැගෙනහිර ප්‍රදේශය තුළ වී වගාවේ අවශ්‍යතා සපුරාලීම සඳහායි. මෙම පර්යේෂණ ස්ථානය වී අස්වැන්න උපරිම කර ගැනීම සඳහා බලාපොරොත්තු තැබිය හැකි ප්‍රමුඛ ලක්ෂණ සහිත වී වගා ප්‍රභේද තෝරා ගැනීමේ සහ සුදුසු ශස්‍ය විද්‍යාත්මක පිළිවෙත් මාලා සකස් කිරීමේ වගකීම දරයි. 2011 වර්ෂයේදී ජාතික සම්බන්ධීකරණ පරීක්ෂණ ප්‍රභේද අත්හදා බැලීම්, ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් සහ විශාල පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වැනි වී ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් පරීක්ෂණ ක්ෂේත්‍ර තුළ ද ගොවි ක්ෂේත්‍ර තුළ ද සිදු කෙරිණි.

තාක්ෂණ ප්‍රචාරණය

වී වගාව පිළිබඳ තාක්ෂණයන් ප්‍රචාරණය කිරීමේ අරමුණ ඇතිව ගොවීන්, ශිෂ්‍යයින් සහ පෞද්ගලික අංශයේ පිරිස් සඳහා පුහුණු වැඩසටහන් 3ක් පවත්වන ලදී. කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන යටතේ ගොවීන් 820දෙනෙකුගේ සහභාගිත්වය ඇතිව පුහුණු වැඩසටහන් 11ක් පවත්වා ඔවුන්ට කොම්පෝස්ට් මුහුන් ලබාදෙන ලදී. ඒකාබද්ධ පැළෑටි පෝෂක වැඩසටහනට අනුව, ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරන ලද අතර කලාපයේ පවතින වල් පැළෑටිමය වී වර්ග පිළිබඳ ගැටලුව අවම කර ගැනීම පිණිස ගොවීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වන ලදී. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ සහයෝගයෙන් 2011 යල කන්නයේදී අඩිඩලව්චේන, බුද්ධංගල හාමල්වත්ත යන ප්‍රදේශවල ක්ෂේත්‍ර දින 3ක් සංවිධානය කරන ලදී.

කාබනික පොහොර නිෂ්පාදන සහ ප්‍රවර්ධන වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ කොම්පෝස්ට් කි.ග්‍රෑ. 15,000ක් නිෂ්පාදනය කරන ලදී. ගොඩබිමෙහි වැවෙන කොළ පොහොර ශාක (ග්ලිරිසිඩියා සහ කදුරු) දඬු 1,600ක් නඩත්තු කරන ලදී

2012 වර්ෂය සඳහා සැලැස්ම

වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය ඉහළ අස්වනු ගෙනදෙන ප්‍රභේද බිහි කිරීමේ ප්‍රයත්නයෙහි අඛණ්ඩව නියැළුණු අතර එය මෙරට සහලින් ස්වයංපෝෂිත කරවීමට මග පෑදීය. ඵලදායිතාව වර්ධනය කිරීමේ අභිජනන වැඩසටහන් හා සමානව සහල්වල තත්වය වැඩිදියුණු කිරීමේ පර්යේෂණ ද විශේෂ අවධානයක් දෙමින් සිදු කෙරෙනු ඇත. සාමාන්‍ය පාරිභෝගිකයින් ප්‍රිය කරන සුවඳ, මොළොක් බව වැනි තත්වමය ගුණාංගයන්ගෙන් සහ සිහින් දැගැට්ට හැඩයෙන් යුතු සහල් සහිත වී වර්ග නිපදවීම කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ඇත. එවැනි සහල් වර්ගවලට වෙළඳපොළේදී ඉහළ මිලක් ලබාගැනීමට හැකිය. තෝරාගත් ප්‍රභේද සමහරක් (ජැස්මින් රයිස්, බාස්මති 370, බාස්මති 217, බාස්මති 9-95, බාස්මති ලාමෝ, සීරග සම්බා, සුවඳැල්, රත්ඇල්, සූදුරු සම්බා, කේඩීඑම්එල් 105,At 405,At 306,At 362,Bg 300,Bg 352,Bg 357,Bg 359,Bg 360,Bg 94-1,IR 07A127) යොදා ගනිමින් වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී උසස් තත්වයේ සහල් පිළිබඳ වැඩසටහන ක්‍රියාත්මක කෙරෙනු ඇත.

සම්ප්‍රදායික වී වගා ප්‍රභේදවල ඇති රසය හා පෝෂණීය අගය වැනි ගුණාංග හේතුවෙන් ඒවාට ඇති ඉල්ලුම ඉහළ යන හෙයින් තෝරාගත් එවැනිවගා ප්‍රභේද සංශුද්ධ කර ගුණනය කිරීමට සැලසුම් කෙරේ. එහෙත් වගාව සඳහා උසස් තත්වයේ බීජ ආදිය ප්‍රමාණවත් පරිදි සොයා ගැනීම දැනට ගැටලුවක්ව ඇත. එහෙයින් තෝරාගත් සම්ප්‍රදායික වගා ප්‍රභේද (සුදු හීනැට්ටි, දෙස්තර හීනැට්ටි, සුවඳැල්, කුරුළු තුඩ, රත්ඇල්, හේරත් බණ්ඩා, සුලායි, පච්ච පෙරු මාල්, කළු හීනැට්ටි, වෙද හීනැට්ටි) වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේදී සංශුද්ධ කෙරෙනු ඇත.

දැනට ක්‍රියාත්මක පර්යේෂණ වැඩසටහන යෝග්‍ය නවීකරණයන් සහිතව අඛණ්ඩව සිදු කෙරෙනු ඇත. ගොවීන් වෙත ප්‍රමාණවත් සැපයුමක් කළ නොහැකි වාණිජමය බිත්තර වී නිෂ්පාදනය කිරීමේ වැඩසටහන වැඩි කැපවීමකින් අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත. ගරු කෘෂිකර්ම අමාත්‍යතුමන්ගේ ඉල්ලීම පරිදි පහත රට තෙත් කලාපයේ ඵලදායිතාව වැඩි කිරීමේ නව සැලසුම් සකස් කර ඇත. එම කලාපයේ කාබනික වී නිෂ්පාදනය ඉහළ නැංවීමේ සැලසුමක් ද පවතී. එමෙන්ම තාක්ෂණ ප්‍රචාරණය හා යටිතල පහසුකම් සංවර්ධනය තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇත.

ගෝලීය වී පර්යේෂණ පිළිබඳ සහයෝගිතාව (GRISP) යටතේ අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනය විසින් අරමුදල් ප්‍රතිපාදන ව්‍යාපෘතියක් වන බහුවිධ පාරිසරික වී ප්‍රභේද පරීක්ෂණ වැඩසටහන (MET) හරහා අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනය සමඟ ඇති පර්යේෂණ සහයෝගිතාව තවදුරටත් ශක්තිමත් කෙරෙනු ඇත. මෙම පර්යේෂණ අධ්‍යයනයන්ගේ ප්‍රධාන අරමුණ අභිජනන ආර නම් කිරීම, වැඩිදියුණු කර ඉදිරියට ගෙන යාම සහ ඉවත් කිරීම සඳහා සාමූහික ක්‍රියාපටිපාටියක් සකස් කිරීම හා ජනකප්ලාස්ම නුවමාරුව සඳහා පහසුකම් සැලසීමයි.

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරී / සේවක සංඛ්‍යාව
අධ්‍යක්ෂ	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
සහකාර අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිලධාරී	28
කෘෂිකර්ම නිලධාරී	01
කෘෂි ආර්ථික විද්‍යාඥ	01
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරී	01
වැඩසටහන් සහකාර	04
කෘෂිකර්ම උපදේශක	21
පර්යේෂණ සහකාර	11
පර්යේෂණ උප සහකාර	03
විද්‍යාගාර සහායක	06
රියදුරු	09
මුරකරු	13
කම්කරු	70
කම්කරු (කොන්ත්‍රාත්)	143
එකතුව	**314**

2.3.1 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බෝඹුවල

බෝඹුවල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සහ බෙන්තොට හා ලබුදූවෙහි පිහිටි එහි උප කෘෂිකර්ම පර්යේෂණ ස්ථාන දෙක පහත රට තෙත් කලාපයට අයත් පරිපාලන දිස්ත්‍රික්ක වන කළුතර, කොළඹ, ගම්පහ, ගාල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කයේ කොටසක වී වගාවේ ඵලදායිතාව වර්ධනය කිරීම පිණිස තාක්ෂණයන් ජනනය කර ප්‍රචාරණය කිරීමේ නියැළෙයි. මෙම මධ්‍යස්ථානය විශේෂයෙන්ම යකඩ විෂවීමට ඔරොත්තු දෙන හා වැඩි අස්වනු ගෙනදෙන වී ප්‍රභේද බිහි කිරීම කෙරෙහි ද ලබුදූව කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය ප්‍රධාන වශයෙන්ම රතු නිවුඩු සම්බා වර්ගයේ වී ප්‍රභේද බිහි කිරීම කෙරෙහි ද අවධානය යොමු කරයි. බෙන්තොට කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය ගංවතුරට සහ ලවණතාවට ගොදුරුවන ප්‍රදේශ සඳහා සුදුසු වී ප්‍රභේද බිහි කිරීමට ප්‍රයත්න දරයි.

අයවැය

වගු අංක 2.3.1.1 : වාර්ෂික අයවැය - 2011 (රු:)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	5,042,492	4,942,952	98
පුනරාවර්තන	11,182,000	10,493,146	94
ව්‍යාපෘති			
• කාබනික පොහොර නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ භාවිතය	850,000	735,442	87
• ආදර්ශ ගම්මාන වැඩසටහන්	300,000	157,576	53
එකතුව	17,374,492	16,329,116	94

ප්‍රගතිය

ප්‍රභේද වැඩිදියුණු කිරීම

මාස $3\ ^{1}/_{2}$ වයස් කාණ්ඩයට අයත් සුදු නිවිඩු සම්බා වර්ගයේ නව වී ආරක් (BW 04 - 992) 2012 ජනවාරි මාසයේ පැවැත්වීමට නියමිත ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුවේ අනුමැතිය සඳහා නම් කර ඇත. මාස $3\ ^{1}/_{2}$ වයස් කාණ්ඩයට අයත් රතු නිවුඩු ආරක් ද (BW05 -16210) ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන තුළ අත්හදා බලන ලදී. පහත දැක්වෙන බලාපොරොත්තු තැබිය හැකි ආර 6 ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහනට නම් කිරීම සඳහා තෝරාගෙන ඇත.

වගු අංක 2.3.1.2: ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් සඳහා තෝරා ගන්නා ලද බලාපොරොත්තු තැබිය හැකි ආර

ආර	ලක්ෂණ	වයස් කාණ්ඩය
BW03 - 1198	රතු, මධ්‍යස්ථ වශයෙන් දිගැති ධාන්‍ය ඇට	මාස 3 $^{1}/_{2}$
BW09 - 906	රතු, දිගු හැඩැති ධාන්‍ය ඇට	මාස 3 $^{1}/_{2}$
BW09 - 840	රතු මධ්‍යස්ථ කෙටි ධාන්‍ය ඇට	මාස 3 $^{1}/_{2}$
BW07 - 676	සුදු, මධ්‍යස්ථ	මාස 3 $^{1}/_{2}$
BW09 - 1125	රතු, මධ්‍යස්ථ කෙටි ධාන්‍ය ඇට	මාස 3
BW09 - 1127	සුදු, මධ්‍යස්ථ කෙටි ධාන්‍ය ඇට	මාස 2 $^{1}/_{2}$

ඉහත දක්වන ලද ආර සියල්ලම යකඩ විෂවීමට සහ ප්‍රධාන පළිබෝධ හා රෝගවලට ඔරොත්තු දෙයි.

අභිජනන බීජ නිෂ්පාදනය

BWප්‍රභේදවල අභිජනන බීජ පහත දැක්වෙන ප්‍රමාණවලින් නිපදවන ලදී.

BW272 - 6b - කි.ග්‍රෑ. 30

BW363 - කි.ග්‍රෑ. 20

BW361 - කි.ග්‍රෑ. 60

BW364 - කි.ග්‍රෑ. 40

ශස්‍ය විද්‍යාව

දෙමුහුම් වී සෘජුව වැපිරීම

පහත රට තෙත් කලාපීය තත්වය යටතේ හෙ. 1කට කි.ග්‍රෑ. 30ක ප්‍රමාණයෙන් දෙමුහුම් බීජ සෘජුව වගා කිරීම නව තාක්ෂණයක් වශයෙන් නිර්දේශ කිරීමට පෙර දැනට ගොවීන් යොදවා ගනිමින් අත්හදා බලන අදියරෙහි පවතී. පහත රට තෙත් කලාපීය වගුරු පසෙහි වී බෝගය ස්ථාපිත කිරීමේ ක්‍රමයක් වශයෙන් ශූන්‍ය බිම් සැකසුම යොදා ගැනීම පිළිබඳ පර්යේෂණය දිගින් දිගටම දිරි ගන්වන සුළු ප්‍රතිඵල පෙන්නුම් කර ඇත. මෙම තාක්ෂණයද ගොවීන් යොදවා ගනිමින් අත්හදා බලන අදියරෙහි පවතී. වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් සම්බන්ධීකරණය කරන ලදුව නැවත නැවතත් සිදු කළ ඒකාබද්ධ පැළෑටි පෝෂණ ක්‍රම අත්හදා බැලීම් තුළින් පෙන්වා දී ඇත්තේ වැලි මිශ්‍ර මැටි සහිත පාංශු තත්වයන් යටතේ රසායනික පොහොර යෙදීම 25%කින් අඩු කළ හැකි බවයි.

ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් සහ ජාතික ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වැඩසටහන්

මාස 2 $^{1}/_{2}$, මාස 3 සහ මාස 3 $^{1}/_{2}$ යන වයස් කාණ්ඩ යටතේ (සම්බා සහ මධ්‍යස්ථ වශයෙන් දිගු ධාන්‍ය සහිත) ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා නම් කරන ලද ආර 24ක් (දීප ව්‍යාප්ත මට්ටමින්) මෙහිදී ඇගයීමට ලක් කෙරිණි. ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වැඩසටහන් යටතේ කොළඹ, ගම්පහ, කළුතර සහරත්නපුර යන දිස්ත්‍රික්ක තුළ බලාපොරොත්තු තැබිය හැකි ආර 6ක් (දීප ව්‍යාප්ත මට්ටමින්) අත්හදා බලන ලදී. ඒ අතරින් At 07 - 695 (මාස 3 $^{1}/_{2}$ සම්බා) සහ BW05-16213 (මාස 3 $^{1}/_{2}$, රතු නාඩු) බලාපොරොත්තු තැබිය හැකි බැව් පෙන්නුම් කළ අතර ගොවීන්ගේ ප්‍රසාදයද හිමිකර ගත්තේය.

වල් පැළෑටි විද්‍යාව

වල් පැළ රසායනිකව කළමනාකරණය කිරීම

වසර තුළ මඩට බීජ වැපිරූ ක්ෂේත්‍රවල වල් පැළෑටි නාශක ගණනාවක් අත්හදා බලන ලදී. වල් පැළෑටිනාශක 3ක් සම්බන්ධයෙන් දිරි ගන්වන සුළු ප්‍රතිඵල ලැබිණි.

ඒකාබද්ධ වල් පැළෑටි කළමනාකරණය

ඒකාබද්ධ වල් පැළෑටි කළමනාකරණ පිළිවෙත් මාලාවක් සකස් කිරීම පිණිස සිදු කෙරෙමින් පවතින අධ්‍යයනයකදී බෝග ස්ථාපිත කිරීමේ ක්‍රම ගණනාවක් පරීක්ෂා කර බලන ලදී. වැපිරීමට ආසන්නව හෝ ඉන් පසුව වසුන් වශයෙන් පිදුරු යෙදීමෙන් විශේෂයෙන්ම බෝගයේ මුල් අදියරේදී සාර්ථකව වල් පැළ පාලනය වන බව දක්නට ලැබිණි. වැපිරීමෙන් පසු යතු කුඩු හා යතු කැබලි වසුන් වශයෙන් යෙදීමෙන්ද ඒ හා සමාන ප්‍රතිඵල ලැබිණි. පැරෂුට් ක්‍රමය මගින් බෝගයක් ස්ථාපිත කිරීමේදී රෝපණයට පෙර මෙම ද්‍රව්‍ය 2කම වසුන් වශයෙන් යොදාගත හැකිය. අතිරේකව වසුන් තුළින් මතුවන වල් පැළ නෙළීමෙන් මෙම ක්‍රමවේදයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු වනු ඇත.

කීට විද්‍යාව

කෘමීන් සම්බන්ධයෙන් කෘමිනාශක හා ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහන

දුඹුරු පැළ කිඩෑවා සහ පත්‍ර හකුළුවන්නා පාලනය කිරීම සඳහා වර්ටකෝ 40WG නමැති නව රසායනය(Thiamethoxam 20+ chlorantraniliprole 20) බෙහෙවින් ඵලදායී වූ බව සොයාගෙන ඇත.

නිතිපතා සිදු කරන පරීක්ෂණ වැඩසටහනේදී හරිතාගාර සේම ක්ෂේත්‍ර තත්වයන් ද යටතේ වී ගොක් මැස්සාට ප්‍රතිරෝධී අභිජනන ආර 20ක් ද දුඹුරු පැළ කිඩෑවාට ප්‍රතිරෝධී ආර 7ක් ද හඳුනාගෙන ඇත. වෙනත් පරීක්ෂණ අත්හදා බැලීමකදී, සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් සඳහා නම් කළ ආර 26ක් වී ගොක් මැස්සාට සහ දුඹුරු පැළ කිඩෑවාට ප්‍රතිරෝධී වන ආකාරය දැන ගැනීම පිණිස පරීක්ෂා කර බලන ලදී. මේවා අතරින් ප්‍රභේද 11ක් වී ගොක් මැස්සාට මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී වන බව සොයා ගන්නා ලද අතර ප්‍රභේද 2ක් මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී හෝ ප්‍රතිරෝධී වන බැව් දක්නට ලැබිණි,

ක්ෂේත්‍ර තත්වයන් යටතේ විවිධ පෙව පළිබෝධනාශක වීවල කොපු මයිටාවා (*Steneotarsonemus spinkii* Smiley) පාලනයට යොදා ගැනීම සම්බන්ධයෙන් ඇගයීමට ලක් කෙරිණි. බලාපොරොත්තු තැබිය හැකි ප්‍රතිඵල පෙන්නුම් කළ 'මිල්බෙමෙක්ටින්' (ස්වාභාවික දිලීර මගින් නිපදවෙන විෂ රසායන හා සමානව නිපදවන ලද කෘත්‍රිම රසායනයක් - Fungal derivative) වැඩිදුරටත් පරීක්ෂා කර බැලීම සඳහා තෝරා ගන්නා ලදී

ව්‍යාධිවේදය

වී වගාවේ කොළ පාළුව සම්බන්ධයෙන් වී ප්‍රභේද පරීක්ෂා කර බැලීම

වී වගාවේ වර්ධනය සහ වැදගත්කමක් සහිත රෝග කළමනාකරණය කෙරෙහි විකිරණය කරන ලද කයිටොසාන් සම්මිශ්‍රණ බලපාන ආකාරය ඇගයීම පිණිස විශේෂ ව්‍යාපෘතියක් (විකිරණය කරන ලද බහු අවයවක ද්‍රව්‍ය කෘෂිකර්මය හා පරිසරය වෙනුවෙන් යොදා ගැනීම පිළිබඳ ව්‍යාපෘතිය) යටතේ පර්යේෂණ කටයුතු සිදු කෙරිණි. මෙයට අමතරව, සාමාන්‍ය පර්යේෂණ වැඩසටහන සිදු කරන ලද අතර ඒ යටතේ Bw ආර 72ක් වී කොළ පාළු රෝගය සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලදී. මේ අතරින් ආර 56ක් කොළ පාළුවට ප්‍රතිරෝධී බවට හඳුනා ගන්නා ලදී.

පාංශු විද්‍යාව

2011 වර්ෂයේදී පාංශු නියැදි 283ක් ද කොම්පෝස්ට් නියැදි 33ක් ද මෙම අංශය විසින් විශ්ලේෂණය කරන ලදී. මෙයට අමතරව, සාමාන්‍ය පර්යේෂණ වැඩසටහන ද ක්‍රියාත්මක කරන ලදී.

ගොවි ක්ෂේත්‍ර සඳහා කාර්යක්ෂමව පොහොර භාවිතා කිරීමේ තාක්ෂණයන් අනුවර්තනය කර ගැනීමේ හැකියාව අත්හදා බැලීම (ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම)

යල කන්නයේදී ක්‍රියාත්මක කරන ලද ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ වූ ව්‍යාපෘතිය තුළින් පහත රට තෙත් කලාපයේ පොහොර අවශ්‍යතාවන් පිළිබඳ වැදගත් තොරතුරු රැසක් එක්රැස් කර ගැනිණි. ඒ අනුව, පහත රට තෙත් කලාපයේ නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම් පොහොර භාවිතය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුකර ගත හැකි බව පෙනේ. මේ සම්බන්ධ අත්හදා බැලීම් නැවත නැවතත් සිදු කරමින් පවතී.

කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම

මෙම ව්‍යාපෘතිය යටතේ කොම්පෝස්ට් ටො. 30කට අධික ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලදී. පාර්ශ්වකරුවන් 601දෙනෙකු සඳහා පුහුණු පංති 13ක් සහ ක්ෂේත්‍ර දින 3ක් පවත්වන ලදී, කෘෂිකර්ම දෙපාර්තමේන්තු පොහොර නිර්දේශයෙන් 10%ක් කාබනික පොහොර යොදා ගනිමින් සංශෝධනය

කර ඒ අනුව පොහොර යෙදූ මහා පරිමාණ ආදර්ශන ක්ෂේත්‍ර 2ක්ද ස්ථාපිත කෙරිණි.

ආදර්ශ ගම්මාන වැඩසටහන - 2011

නව තාක්ෂණය (පහත රට තෙත් කලාපයට යෝග්‍ය ප්‍රභේද) ප්‍රචාරණය කිරීම පිණිස ආදර්ශ ගම්මාන වැඩසටහන ආරම්භ කරන ලද අතර ඒ යටතේ Bwප්‍රභේදවල (Bw361,Bw363,Bw 364,Bw272-6b, Bw04 - 992 හා Bw05- 1621) බීජ බු. 18ක් ගොවීන් 56දෙනෙකු අතර බෙදා හරින ලදී. බිත්තර වී බු. 200ක් ද නිපදවා ව්‍යාප්ති අංශය හරහා ගොවීන්ට ලබාදෙන ලදී. බීඩබ්ලිව් ප්‍රභේද වගාව සඳහා යොදා ගැනීමේ වැදගත්කම සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කරමින් ක්ෂේත්‍ර දින 2ක් ද පැවැත්විණි.

වී පර්යේෂණ ආයතනය - ලබුදූව

ලබුදූව වී පර්යේෂණ ස්ථානය පහත රට තෙත් කලාපයේ දකුණු කොටසෙහි ඇති ඉහළ විභවයක් සහිත කුඹුරු ඉඩම් සඳහා වැඩි අස්වනු ගෙනදෙන වී ප්‍රභේද සහ රතු සම්බා ප්‍රභේද බිහි කිරීම වැනි තාක්ෂණයක් ජනනය කිරීමේ වගකීම දරයි. මෙම පර්යේෂණ ආයතනය පැළෑටි සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ කටයුතුවල ද නිරත වේ.

වී අභිජනනය

නව ප්‍රභේද බිහි කිරීම

Ld3-12-50 නමැති ආර (මාස 3 $^{1}/_{2}$, රතු සම්බා) ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුව වෙත නම් කරන ලදී. විශාල පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් යටතේ එක් ප්‍රභේදයක් ද (Ld3-6-12, මාස 3 $^{1}/_{2}$, සුදු සම්බා) ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් යටතේ වර්ග 2ක්ද(Ld7-6-2, මාස 3 $^{1}/_{2}$, සුදු දිගු හැඩැති Ld8-6-7, මාස 3 $^{1}/_{2}$, රතු කෙටි/ ගෝලාකාර) විශේෂත්ව, ඒකාත්මිකතා සහ ස්ථායිතාපරීක්ෂණය යටතේ එක් වර්ගයක් ද (Ld1-5-15, මාස 3 $^{1}/_{2}$, සුදු සම්බා) පවතී.

අභිජනන බීජ නිෂ්පාදනය

අභිජනන බීජ පහත දැක්වෙන ප්‍රමාණවලින් නිෂ්පාදනය කරන ලදී.

Ld 365 - කි.ග්‍රෑ. 140

Ld408 - කි.ග්‍රෑ. 21.5

පැළෑටි සංරක්ෂණය

පිලිපීනයේ අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් ලද බැක්ටීරියා පතු අංගමාරයට ප්‍රතිරෝධී ප්‍රභේද 100 අතරින් ආර 5ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින තත්වයන් යටතේ බලාපොරොත්තු තබාගත හැකි බව සොයා ගැනිණි. පළිබෝධ පාලනයට පැළෑටි තෙල් වර්ග භාවිතා කිරීම අත්හදා බැලීමේ වැඩසටහන තුළින් බලාපොරොත්තු තැබිය හැකි තෙල් වර්ග 2ක් වී වගාවේ කුඩිත්තන් සහ මකුණන් පාලනයට යොදා ගැනීම සම්බන්ධ වැඩිදුර අත්හදා බැලීම් කිරීම සඳහා හඳුනාගෙන ඇත.

වල් පැළෑටි විද්‍යාව

ජාතික සම්බන්ධීකරණ වල් පැළෑටිනාශක පරීක්ෂණ අත්හදා බැලීම් සහ ජාතික කෘෂිකාර්මික පර්යේෂණ සැලැස්ම යටතේ වූ ව්‍යාපෘති කටයුතු තුළින්, පිළිවෙළින් බලාපොරොත්තු තැබිය හැකි වල් පැළෑටිනාශක 4ක් සහ බෝග ස්ථාපිත කිරීමේ ක්‍රම 4ක් හඳුනා ගන්නා ලදී.

ව්‍යාප්ති කටයුතු

නිතිපතා සිදු කෙරෙන ව්‍යාප්ති කටයුතු හැරුණු විට ගොවි ක්ෂේත්‍රවලදීම ගොවීන් සඳහා වල් පැළෑටිමය වී වර්ග සම්බන්ධයෙන් ක්ෂේත්‍ර දින 2ක් පවත්වන ලදී

කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - බෙන්තොට

ගංවතුරට ඔරොත්තු දෙන ප්‍රභේද පරීක්ෂා කිරීමේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි. කළුතර හා ගම්පහ යන දිස්ත්‍රික්ක තුළ විශේෂිත වගා තත්වයන් යටතේ Bg 96-741, Bw364, Bg357 සහ Bg 5ආර් නැමති ආර සමග අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනය විසින් තෝරාගෙන ඇති ආර 5ක් (IR 119, සබ් 1 සම්බා මෘදු, සබ් 1 IR64, ස්වර්ණ සබ් 1, IR7F 290) අත්හදා බලන ලදී. එහි ප්‍රතිඵල අනුව, Bg 96 - 741 සහ Bg 364 විදේශීය වී ප්‍රභේදවලට වඩා හොඳ ක්‍රියාකාරිත්වයක් පෙන්වා ඇත. ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් හා ජාතික ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වැඩසටහන් අදාළ ක්ෂේත්‍ර තත්වයන් නියෝජනය කරන ගොවි ක්ෂේත්‍රවල අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

කාබනික පොහොර නිෂ්පාදන සහ ප්‍රවර්ධන වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටතේ කොම්පෝස්ට් කි.ග්‍රෑ. 15,000ක් නිපදවන ලදී. ගොඩබිමෙහි වැවෙන කොළ පොහොර ශාකවල (ග්ලිරිසීඩියා සහ කඳුරු) දඬු 1600ක් නඩත්තු කරන ලදී.

තාක්ෂණ ප්‍රචාරණය

බෝඹුවල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ සම්මන්ත්‍රණ වැඩසටහන - 2011

වසර තුළ මෙම මධ්‍යස්ථානයේදී සම්මන්ත්‍රණ වැඩසටහන් 44ක් පවත්වන ලදී.

කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ බෝඹුවල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේදී පුහුණුවන්නන් 601දෙනෙකුට (කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන්, ගුරුවරුන් හා සිසුන්) කොම්පෝස්ට් නිෂ්පාදනය සහ භාවිතය පිළිබඳ පුහුණුව ලබා දෙන ලදී. එයට අමතරව,විසර තුළ පුහුණුවන්නන් 124දෙනෙකුට වී වගාවේ විවිධ අංශ සම්බන්ධයෙන් ද පුහුණුව ලබාදෙන ලදී.

මෙම මධ්‍යස්ථානයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය විසින් ජනනය කරන ලද නව තාක්ෂණයන් පිළිබඳ රූපවාහිනී වැඩසටහන් 2ක් සහ ගුවන්විදුලි වැඩසටහන් 4ක් විකාශනය කෙරිණි. එමෙන්ම, මෙම මධ්‍යස්ථානයේදී ක්ෂේත්‍ර දින 3ක් (කාබනික පොහොර ව්‍යාපෘතිය යටතේ) සහ ගොවි ක්ෂේත්‍රවලදී ක්ෂේත්‍ර දින 2ක් (ආදර්ශ ගම්මාන ව්‍යාපෘතිය යටතේ) පැවැත්විණි. මෙම මධ්‍යස්ථානය ප්‍රදර්ශන 5කට සහභාගි වූ අතර කළුතර දිස්ත්‍රික් කෘෂිකාර්මික කමිටුව අවස්ථා 12කදී උපදේශක මට්ටමින් නියෝජනය කළේය.

2012 වර්ෂය සඳහා සැලැස්ම

වර්තමානයේ සිදු කෙරෙමින් පවතින පර්යේෂණ වැඩසටහන් යෝග්‍ය නවීකරණයන් සහිතව අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත. ගොවීන්ට ප්‍රමාණවත් සැපයුමක් ලබාදීමට අපහසු වූ වාණිජමය බිත්තර වී නිෂ්පාදන වැඩසටහන ද වැඩි කැපවීමක් දරා අඛණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

ගරු කෘෂිකර්ම අමාත්‍යතුමන්ගේ මැදිහත්වීමෙන් පහතරට තෙත් කලාපයේ ඵලදායිතාව ඉහළනැංවීම පිණිස නව සැලැසුම් සකස් කර ඇත. වී පර්යේෂණ තීරයේ පිහිටි වගුරු බිම් පෙදෙස සංවර්ධනය කිරීමේ සැලසුම් ද පවතී. බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ උපදෙස් අනුව තාක්ෂණ ප්‍රචාරණය සහ යටිතල පහසුකම් සංවර්ධනය තව දුරටත් ශක්තිමත් කෙරෙනු ඇත.

කායර්ී මණ්ඩල ලැයිස්තුව

තනතුර	නිලධාරී/සේවක සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිලධාරී	13
කෘෂිකර්ම නිලධාරී	01
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරී	04
වැඩසටහන් සහකාර	08
කෘෂිකර්ම උපදේශක	14
පර්යේෂණ සහකාර	12
ගොවිපොළ කළමනාකරු	01
මුරකරු	05
සනීපාරක්ෂක කම්කරු	01
කම්කරු (II වන පංතිය)	26
කම්කරු (III වන පංතිය)	08
කම්කරු (කොන්ත්‍රාත්)	53
එකතුව	147

3.1 බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නොරුව

බීජ සහතික කිරීමේ සේවය, පැළෑටි ආරක්ෂණ සේවය, ජාතික පැළෑටි නිරෝධායන සේවය, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය සහ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය යන ආයතන වල ප්‍රධාන කළමනාකරණ ආයතනය වනුයේ බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයයි. මෙම මධ්‍යස්ථානය ගොවීන් සඳහා ගුණාත්මයෙන් ඉහළ බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම, පැළෑටි ආරක්ෂණය සහ කෘෂිකර්මික පළිබෝධනාශක පාලනය වැනි වැදගත් සේවාවන් ඉටු කිරීම සම්බන්ධයෙන් මෙන්ම ආහාර බෝග වල පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය කිරීම සහ පැළෑටි නිරෝධායන කටයුතු සම්බන්ධයෙන් වගකීම දරයි. තවද පහත දැක්වෙන පනත් වලට අදාළ නියාමන කටයුතුද සිදු කරනු ලබයි.

1. 1999 අංක 35 දරන පැළෑටි ආරක්ෂණ පනත
2. 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත
3. 2003 අංක 22 දරන බීජ පනත

මෙම මධ්‍යස්ථානය ජාතික පැළෑටි සංරක්ෂණ සංවිධානය (NPPO) ලෙස සහ ශ්‍රී ලංකාවේ උද්භිද ස්වස්ථතා කටයුතු සඳහා ජාතික විමසුම් ස්ථානය වශයෙන් කටයුතු කරයි.

අයවැය

වගු අංක 3.1.1. වාර්ෂික අයවැය - 2011 (රු:)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
මූලධන	33,051,000	24,670,288	75
පුනරාවර්තන	45,598,000	41,375,607	91
එකතුව	**78,649,000**	**66,045,895**	**84**

ප්‍රගතිය

ආනයන බලපත්‍ර

2011 වසරේදී පහත දැක්වෙන අයිතම සඳහා ප්‍රවේශ කොන්දේසි සඳහන් කර ආනයන බලපත්‍ර නිකුත් කරන ලදි.

වගු අංක 3.1.2: 2011 වසරේදී නිකුත් කරන ලද ආනයන බලපත්‍ර

බලපත්‍ර වර්ගය	අංකය
එළවළු බීජ	979
නැවුම් පලතුරු	686
පැළෑටි සහ පැළෑටි ද්‍රව්‍ය	618
පැළෑටි නිෂ්පාදන	263
බීජ අර්තාපල්	33

සත්ත්ව ආහාර	135
ආගමික කටයුතු සඳහා කැපූ මල්	20
මිනිස් පරිභෝජනය සඳහා නිෂ්පාදන	54
පෙව විද්‍යාත්මක කාරකයන්	02
එකතුව	**2790**

බීජ අර්තාපල් ආනයනය

වගු අංක 3.1.3: 2011 වසරේ බීජ අර්තාපල් ආනයනය

රට	ආනයනික ප්‍රමාණය(මෙ.ටො)	නිදහස් කළ ප්‍රමාණය(මෙ.ටො)	රසායනාගාර පරීක්ෂණ/ තොග
නෙදර්ලන්තය	700	700	50
ඇමරිකා එක්සත් ජනපදය	75	75	05
ප්‍රංශය	23	23	10
ජර්මනිය	50	50	01
එකතුව	**848**	**848**	**66**

ආනයනික බීජ අර්තාපල් තොග සඳහා ප්‍රවේශ ස්ථාන පරීක්ෂා කිරීම් 20ක් සිදු කෙරුණු අතර ප්‍රතික්ෂේප වීම් කිසිවක් නොවීය. පශ්චාත් ප්‍රවේශ නිරෝධායන ඇගයීම සඳහා සෑම තොගයකින්ම ලබා ගත් නියැදියක් සීතා එළිය පශ්චාත් පාලන ක්ෂේත්‍රයේ කරන රෝපණය ලදී.

එළවළු සහ පලතුරු බීජ ආනයනය

2011 වසරේදී නිකුත් කරන ලද එළවළු බීජ ආනයන බලපත්‍ර 979 යටතේ ආනයන කළ එළවළු සහ පලතුරු බීජ ප්‍රමාණයන් වගු අංක 3.1.4. හි දැක්වේ. ආනයනය කෙරෙන එළවළු බීජ පිළිබඳ වැදගත් තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා ජාතික දත්ත මූලයන් සකස් කෙරෙමින් පවතින අතර මෙමගින් නිකුත් කරන ලද බලපත්‍ර වලට අදාළ තොරතුරු සහ 2004 වර්ෂයේ සිට වරාය සහ ගුවන්තොටුපළපැළෑටි නිරෝධායන ඒකක හරහා ආනයනය කරන ලද බීජ පිළිබඳ තොරතුරු ලබා ගත හැකි වනු ඇත.

වගු අංක 3.1.4 2011 වසරේදී ආනයනය කරන ලද එළවළු සහ පලතුරු වර්ග

භෝගය	ප්‍රවේශ ස්ථානය - ප්‍රමාණය(කි.ග්‍රෑ)		මුළු ප්‍රමාණය (කි.ග්‍රෑ)
	ගුවන් තොටුපල	වරාය	
හාතාවාරිය	0.98		0.98
බෝංචි		247,750.5	247,750.5
බීට්	500.00	20583.1	21083.08
බෙල් පෙපර්	6.00		6.0
කරවිල	282.02	3666.5	3948.52
ලබු	0.01		0.01
ගෝවා	493.08	1563.9	2056.98
කැරට්	55.5	40531.7	40587.20
මල්ගෝවා	47.5	208.8	256.30
සැල්දිරි		3.0	3.0
මිරිස්	510.16		510.16
චීන ගෝවා		45.0	45.0
චීන බ්‍රොකලි		266.0	266.0
චීන රාබු		1160.0	1160.0
පිපිඤ්ඤා	1494.8	4583.7	6078.48
වම්බටු	63.02	697.5	760.53
කංකුං		655.0	655.0
කොල්රාබි	1,200	2110.0	3310.0
ලීක්ස්	165	11080.0	11245.0
සලාද කොළ	0.5	315.0	315.5
මෑ		15662.0	15662.0
වැටකොළු	410	5385.65	5795.65
බඩ ඉරිඟු	154	790,450	790604.0
කොමඩු		50.07	50.07
බණ්ඩක්කා	535.07	603.00	1138.07
ලූණු	5,668		5,668
පැකොයි		30.00	30.00
පැපොල්		15.03	15.03
පාර්ස්ලි	1.5		1.5

ගම්මිරිස්	857.17	7662.01	8519.18
වට්ටක්කා	1,428	9,801.24	11,229.24
රාබු	202	17,212.35	17,414.35
පතෝල		3.00	3.0
ස්ක්වොෂ්		5,975.00	5975.0
ස්වීට් කෝන්	24	4.00	28.0
තක්කාලි	377.08	1164.57	1541.65
ටර්නිප්	3		3.00
දිය ලබු	673.36	11,478.28	12,151.64
සුකිනි	2.5		2.5
මුළු ප්‍රමාණය	**15,154.24**	**1,200,715.87**	**1,215,870.11**

1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනතට නව රෙගුලාසි

1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනතට එක් කිරීම සඳහා නව රෙගුලාසි සකස් කර නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කර ඇති අතර එහි කටයුතු අවසන් අදියරේ පවතී.

පශ්චාත් නිරෝධායන පරීක්ෂණ

බලපත්‍ර කොන්දේසි සපුරා තිබෙන්නේදැයි පරීක්ෂා කර බැලීම සඳහා පශ්චාත් නිරෝධායන පරීක්ෂණ දෙකක් සිදු කෙරිණී.

වගු අංක 3.1.5: සිදු කරන ලද පශ්චාත් නිරෝධායන පරීක්ෂණ

ස්ථානය	වර්ගය
ජා-ඇල	සත්ත්ව ආහාර සඳහා තිරිඟු තොග සැකසුම් කිරීමේ පහසුකම්
වැලිමඩ- නුවර එළිය	ආනයනික අර්තාපල් වගා කරන ලද අර්තාපල් වගා බිම්

අපනයන සහතිකකරණය

අපනයන තොග සහතික කිරීම පහසු කිරීම සඳහා මිනුවන්ගොඩ,දඹුල්ල,වැලිමඩ,මීරිගම සහ පන්නල ප්‍රදේශ වල පිහිටි අපනයන සමාගම් වල කර්මාන්ත ශාලා පරිශ්‍රයේ පහසුකම් සහ පැළ සහ පැළ නිෂ්පාදන සැකසුම් පරීක්ෂා කරන ලදි.

මාධ්‍ය වැඩසටහන්

පහත සඳහන් වැඩසටහන් හරහා බීජ පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳව රූපවාහිනිය,

ගුවන්විදුලිය, පුවත්පත් සහ අනෙකුත් සන්නිවේදන ක්‍රම මගින් ජනතාව දැනුවත් කිරීම සඳහා

දෙසැම්බර් 18 - 25 දින දක්වා මාධ්‍ය සතියක් මෙහෙයවන ලදි.

රූපවාහිනී වැඩසටහන්

- ගොවි බිමට අරුණාළු
- මිහිකත දිනුවෝ
- කෙටි දැන්වීම්

ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවාව හරහා සිදු කළ වැඩසටහන්

- මහ ගෙදරින් ගොවි ගෙදරට
- ගොවිතැනට පැයක්
- කලවිට
- අස්වැන්න
- වයඹ ගෙවත්ත
- රුහුණු ගෙවත්ත

පෝස්ටර්

පෝස්ටර් වර්ග දෙකකින් පිටපත් 6000ක්

පුවත්පත් දැන්වීම්

බීජ පනත පිළිබඳව ලංකාදීප සහ රිවිර පුවත්පත් වල පුවත්පත් අතිරේක සහ කෙටි දැන්වීම් පළ කිරීම

කමත (ස්වර්ණාවාහිනී) සහ රන් අටුව(ITN) වැඩසටහන් මගින් පැළෑටි නිරෝධායනය පිළිබඳව මාධ්‍ය වැඩසටහන් සිදු කෙරිණි.

ක්ෂේත්‍ර පරීක්ෂණ

නුවරඑළිය ප්‍රදේශයේ අර්තාපල් වගා බිම් වල නිරෝධායන පළිබෝධ පිළිබඳ පරීක්ෂා කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කෙරුණු අතර මෙම දත්ත පාදකව පළිබෝධ පරීක්ෂා කිරීමේ වැඩසටහන් නුදුරේදී ආරම්භ කරනු ඇත. පුත්තලම ප්‍රදේශයේ ස්භාවික පරිසරයේ රෝපණය කරන ලද ආනයනික තේක්ක පැළ තවානක පරීක්ෂණ සිදු කෙරිණි.

අපනයන තොග රඳවා ගැනීම

2011 වසරේදී අත්‍යවශ්‍ය උද්හිද ස්වස්ථතා ක්‍රියාමාර්ග සපුරා නොමැති බැවින් ඒවා ලද රටවල් වලින් තොග 10ක් රඳවා ගත් බවට වර්තා කරන ලදි. 2010 වර්ෂය හා සංසඳනාත්මකව අපනයන තොග රඳවා ගැනීම් 23% ක අඩුවීමක් පෙන්නුම් කරන අතර ඉදිරි අපනයන තොග සම්බන්ධයෙන් නිරෝධායන කටයුතු වලට අනුකූලව ක්‍රියා කරන ලෙස අපනයන කරුවන්ට විධිමත්ව දැනුම් දෙන ලදී.

අපනයන තොග රඳවා තබා ගැනීම් පිළිබඳ පරීක්ෂණ

වියට්නාම නිරෝධායන බලධාරීන්ගේ ඉල්ලීමට අනුව ප්‍රීමා ආයතනය මගින් යවන ලද තිරිඟු නිවුඩ්ඩ අනුසාරයෙන් සකස් කරන කැට කැබලි (Pellets)දැඩි සෝදිසි කිරීමකට ලක් කරන ලදි. ත්‍රිකුණාමලය ගුල්ලන්ගේ ආසාදනයට ලක් ව තිබීම හේතුවෙන් නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ අදියර වලින් ලබාගත් නියැදි පරීක්ෂාවට ලක් කෙරුණු අතර පරීක්ෂණ වාර්තාව කටුනායක ජාතික පැළෑටි නිරෝධායන සේවයෙන් ලබා ගන්නා ලදි. කම්හල් පරිශ්‍රයේ සිට වියට්නාමයට නැව් ගත කරන අවස්ථාව තෙක්ම මෙම නිෂ්පාදනය කිසිදු ආකාරයක ආසාදනයකට ලක් වී නොමැති බැව් අනාවරණය විය.

ඕස්ට්‍රේලියානු ධූමකරණ සහතික ලබා දීමේ ක්‍රමය(AFAS) ක්‍රියාත්මක කිරීම

ඕස්ට්‍රේලියානු ධූමකරණ සහතිකයලබා දීමේ ක්‍රමය පිළිබඳ පුහුණුව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමෙන් පොදුවේ ධූමකරණ කටයුතු වල තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒමට ඉවහල් වනු ඇත. මෙම පුහුණුව ලබා දීමේ ප්‍රධාන පරමාර්ථය වනුයේ මෙතිල් බ්‍රෝමයිඩ් ධූමකරණයට සම්බන්ධ ලේඛනගත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා බෙහෙවින් උපකාරී වන නිරෝධායන නිළධාරීන්ගේ පුහුණුවේ වැදගත් අංගයක් සපුරාලීමයි.මෙම පුහුණුව මගින් පොදුවේ ධූමකරණ ප්‍රතිකර්ම කටයුතු උසස් තත්ත්වයකට පත් කරන අතරම විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ සහ ඕස්ට්‍රේලියාවේ වෙළඳ කටයුතු වලට විශාල පහසුවක් සලසනු ඇත. එමෙන්ම මෙමගින් මෑත කාලයේදී ඕස්ට්‍රේලියාවට යැවීමට තිබූ තොග රඳවා ගැනීම වැනි සිද්ධීන් ඉදිරියේදී අවම වනු ඇත.

පළමු අදියරයේදී, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය, ජාතික පැළෑටි නිරෝධායන සේවය, වරාය සහ ගුවන්තොටුපළ ප්‍රවේශ ස්ථානයන්හි පිහිටුවා ඇති පැළෑටි නිරෝධායන ඒකක, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය, ගන්නෝරුව සහ අඟුණකොළපැලැස්ස සේවා සංස්කරණය අභ්‍යාස ආයතනය යන විවිධ අංශ වලට අනුයුක්ත නිළධාරීන් 25 දෙනෙකු සඳහා නිරෝධායන කටයුතු සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු නිරෝධායන පරීක්ෂණ සේවාවේ ධූමකරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙතිල් බ්‍රෝමයිඩ් පිලිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙන ලදි. මීට අමතරව ධූමකරණ සේවය ලබා දෙන පෞද්ගලික අංශයේ 25 දෙනෙකු සඳහාද ඉහත පුහුණුව ලබා දෙන ලදී.

2011 මාර්තු මාසයේදී සාර්ථකව මෙහෙය වූ ධූමකරණ පුහුණුවක් අධීක්ෂණය කිරීමෙන් පසු කෘෂිකර්ම,ධීවර සහ වන සම්පත් දෙපාර්තමේන්තුවේ (DAFF) පේව සුරක්ෂිතතා නිළධාරීන් ඕස්ට්‍රේලියානු ධූමකරණ සහතිකය ලබාදීමේ ක්‍රමයේ විගණන පුහුණුව ලබාදීම සඳහා 2011 මැයි මස නැවත කොළඹට පැමිණෙන ලදි. මෙම පාඨමාලාව දින තුනක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 20 දෙනෙකු සඳහා ලබා දීමෙන් පසු DAFF පේව සුරක්ෂිතතා නිළධාරීන් ශ්‍රී ලංකා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමඟ එක්ව කොළඹ ධූමකරණ සමාගම් වල විගණන පරීක්ෂණ කීපයකටද සහභාගි විය.

දේශීය ධාන්‍ය නිෂ්පාදනය දිරි ගැන්වීම

දේශීය බඩඉරිඟු නිෂ්පාදනය ඉහළ මට්ටමක පවතින කාල සීමාවේදී විදේශ රටවලින් බඩඉරිඟු බීජ ආනයනය කිරීම සීමා කරමින් දේශීය ධාන්‍ය නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා පියවර ගත් අතර ආනයන බලපත්‍ර නිකුත් කිරීමේදී කෘෂිකර්ම අමාත්‍යාංශයේ එකඟත්වය ලබාගන්නා ලදි.

පැළෑටි නිරෝධායනය පිළිබඳ සම්මන්ත්‍රණ / දැනුවත් කිරීමේ වැඩසටහන් / පුහුණු වැඩසටහන්

පැළෑටි නිරෝධායනය පිළිබඳව රේගු නිළධාරීන් සහ නිරෝධායන නිළධාරීන් 60 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙය විය. අදාළ රාජකාරී කටයුතු වලදී නිරෝධායන නිළධාරීන් සහ රේගු නිළධාරීන් අතර පවතින අන්‍යෝන්‍ය අවබෝධය ඉහළ නැංවීම මෙහි පරමාර්ථය විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අළුතින් බඳවා ගන්නා ලද කෘෂිකර්ම උපදේශකවරුන් 32 දෙනෙකුටද පැළෑටි නිරෝධායනය පිළිබඳ පුහුණුව ලබා දුන් අතර අඟුණකොළපැළැස්ස සේවා සංස්කරණ හා අභ්‍යාස ආයතනයේදී කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලීය සිසුන් සහ විශ්ව විද්‍යාලවල සිසුන් 40 දෙනෙකුට මෙම පුහුණුව ලබා දෙන ලදි.

බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ සේවය, ජාතික පැළෑටි නිරෝධායන සේවය සහ වරාය සහ ගුවන්තොටුපල ප්‍රවේශ ස්ථාන දෙක යන අංශවලින් නිළධාරීන් 26 දෙනෙකු නුවරඑළිය ගොවි ක්ෂේත්‍ර සහ අඹේවෙල කොන්ත්‍රාත් වගාකරුවන්ගේ වගා බිම් කීපයක අර්තාපල් පළිබෝධ නිරීක්ෂණය කිරීමේ පුහුණුව සඳහා සහභාගි විය. ඔවුන්ට මෙම පුහුණුවේදී අර්තාපල් නිෂ්පාදන ක්‍රියාවලියේ බෝගය ස්ථාපිත කරන අදියරේ සිට අස්වනු නෙලන අදියර දක්වා දෘෂ්‍ය නිරීක්ෂණ පුහුණුව ලබා දුණී.

2012 වසර සඳහා සැලැස්ම

- පැළෑටි හා පැළෑටි නිෂ්පාදන සුරක්ෂිතතා විධිවිධාන වලට අනුකූලව ආනයනය හා අපනයනය පහසු කිරීම සඳහා අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීම
- ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ බීජ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයට අදාළ යෝග්‍ය සැලැස්ම හා ප්‍රතිපත්ති තීරණ සකස් කිරීම.
- දිවයිනේ බීජ ව්‍යවසායන් සංවර්ධනය කිරීම
- දිවයිනේ ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම
- ජාතික මට්ටමින් උද්භිද ස්වස්ථතාව පවත්වාගෙන යාමේ හැකියාවන් ශක්තිමත් කිරීම
- තාක්ෂණික හැකියාවන් ඉහළ නැංවීම
- නියාමන ක්‍රියාමාර්ගයන්හි අනුරූපිතාවය ඇති කිරීම
- වඩාත් කාර්යක්ෂම සහ ආරක්ෂිත පළිබෝධ පාලන ක්‍රමෝපායන් ප්‍රවර්ධනය කිරීම.

කායික්‍ෂ මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
අධ්‍යක්ෂ	
පර්යේෂණ නිළධාරි	01
කෘෂිකර්ම නිළධාරි	01
වැඩසටහන් සහකාර(කෘෂිකර්ම)	02
කෘෂිකර්ම උපදේශක	03
පරිපාලන නිළධාරි	02
රාජ්‍ය කළමනාකරණ සහකාර	01
ගබඩා භාරකරු	12
කාර්යාල කාර්ය සහායක	01
රියදුරු	02
කම්කරු(අනියම්)	03
කම්කරු(කොන්ත්‍රාත්)	02
	04
එකතුව	**34**

3.1.1 බීජ සහතික කිරීමේ සේවය - ගන්නෝරුව

බීජ සහතික කිරීමේ සේවය ගොවීන්ට උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම සහතික කිරීමට අදාළ නියාමන කටයුතු වල නිරත වේ.

අයවැය

වගු අංක 3.1.1.1: වාර්ෂික අයවැය - 2011 (රු:)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
පුනරාවර්තන	18,530,000	16,910,000	91
මූලධන	13,440,000	12,300,000	92
ව්‍යාපෘති - බීජ නිෂ්පාදන ගම්මාන	3,190,000	840,000	26
බීජ පනත	20,000,000	15,500,000	78
එකතුව	**55.16**	**45.55**	**83**

ප්‍රගතිය

- බීජ නිෂ්පාදනය කිරීම සඳහා වගා කරන ලද වී හෙ.6364 ක්, වෙනත් ක්ෂෙත්‍ර බෝග හෙ.581 ක් එළවළු සහ පලතුරු හෙ.126 ක් අර්තාපල් හෙ.76ක් පරීක්ෂා කර බලන ලදී.

- බිත්තර වී මෙ.ටො.7999 ක් වෙනත් ක්ෂෙත්‍ර බෝග මෙ.ටො. 216 ක් එළවළු මෙ.ටො. 27 ක් සහ බීජ අර්තාපල් මෙ.ටො. 312 ක් නියෝජනය කරමින් බීජ නියැදි 13234 ක් පරීක්ෂා කර බලන ලදී.

- සහතික කළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරනු ලබන උද්‍යාන බෝග පැළ තවාන් 240 ක් ලියාපදිංචි කර පරීක්ෂා කරනු ලැබූ අතර බද්ධ පලතුරු පැළ 260,048 ක ගුණාත්මය සහතික කර ලේබල් කරන ලදී.

- විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පරීක්ෂා කිරීමේ වැඩසටහන යටතේ වී ප්‍රභේද 13 ක්, වෙනත් ක්ෂෙත්‍ර බෝග 19 ක් සහ එළවළු ප්‍රභේද 10 ක් ඇගයීමට ලක් කෙරිණි.

- ගන්නෝරුව, සීතාඑළිය, සහ මහ ඉලුප්පල්ලම පිහිටා ඇති පශ්චාත් පාලන අංක 01- 04 ක්ෂෙත්‍ර වලදී වී, වෙනත් ක්ෂෙත්‍ර බෝග, එළවළු සහ අර්තාපල් නියැදි 526ක් පරීක්ෂාවට ලක් කෙරිණි.

- බීජ පනත යටතේ බීජ හසුරුවන්නන් 918 දෙනෙකු ලියාපදිංචි කිරීමත් 410 දෙනෙකුගේ ලියාපදිංචිය නැවත අළුත් කිරීමත් සිදු කෙරිණි.

- බීජ පනත යටතේ රජයේ නිළධාරීන් සහ බීජ ගොවීන් 604 දෙනෙකු පුහුණු කෙරිණි.

- රූපවාහිනි/ගුවන්විදුලි වැඩසටහන් 15 ක් සහ දැන්වීම් 5 ක් ඇතුළත් මාධ්‍ය සතියක් බීජ පනත යටතේ සාර්ථකව සිදු කෙරිණි.

- පලතුරු පැල අවශ්‍යතාවය සපුරා ගැනීමට සහ ඌණපූර්ණය කිරීම සඳහා වැඩමුළුවක් "දිවි නැගුම" වැඩසටහන යටතේ සාර්ථකව සිදු කෙරිණි. සියළුම දිස්ත්‍රික්ක නියෝජනය කරමින් පෞද්ගලික පැල තවාන්කරුවන් 250 දෙනෙකුද, කෘෂිකර්ම දෙපාර්තමෙන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය අංශයේ සහ අනෙකුත් දෙපාර්තමේන්තු වල (හදබිම ආදි) ගොවිපළවල්, පලාත් 09 හි සැලසුම් අධ්‍යක්ෂවරු, දිස්ත්‍රික් ලේකම්වරු 04 දෙනෙක් සහ පලාත් අධ්‍යක්ෂවරු 09 දෙනෙක් මෙම වැඩමුළුවට සහභාගී විය. දිස්ත්‍රික්ක මට්ටමින් "ගෙවතු මිලියන 10කට බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයීම සඳහා ජාතික වැඩසටහන" නමින් අත්පොතක් සහ සංයුක්ත තැටියක් මෙම වැඩසටහන යටතේ නිකුත් කෙරිණි.

- වී මෙ.ටො. 119 ක්,වෙනත් ක්ෂෙත්‍ර බෝග මෙ.ටො. 1.6 ක් සහ එළවළු මෙ.ටො. 1.9 ක් නියෝජනය කරමින් වී හෙ.337 ක් වෙනත් ක්ෂෙත්‍ර බෝග හෙ.100 ක් සහ එළවළු හෙ.14 ක් බීජ නිෂ්පාදන ගම්මාන වැඩසටහන් යටතේ ලියාපදිංචි කරන ලදී.

- අන්තර්ජාල පහසුකම් සැපයීම තුළින් බීජ සහතික කිරීමේ සේවයේ මූලස්ථාන, සියළුම කලාපීය බීජ සහතික කිරීමේ සේවා කාර්යාල සහ බීජ පරීක්ෂා කිරීමේ රසායනාගාර 4 එකට සම්බන්ධ කෙරිණි.

- ක්ෂේත්‍ර නිලධාරීන්ට පහසුවෙන් හා කාර්යක්ෂමව දත්ත ලබා ගැනීමටත්යෝග්‍යපරිදි දත්ත කළමනාකරණය කිරීමට සහ බීජ රසායනාගාර වාර්තා ක්‍රමවත්ව මුද්‍රණය කර ගැනීම සඳහා බීජ රසායනාගාරයට මෘදුකාංගයක් හඳුන්වා දෙන ලදී.

බිත්තර වී සහතික කිරීම

2011 වසරේදී බිත්තර වී නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි කළ මුළු වපසරිය හෙ.6364 ක් වූ අතර මේ සඳහා 69% ක් පෞද්ගලික අංශයේ දායකත්වය ලැබිණි. විවිධ මූලාශ්‍ර සහ බීජ පන්ති යටතේ සහතික කළ බිත්තර වී නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි කළ බිම් ප්‍රමාණයන් පිළිබඳව වගු අංක 3.1.1.2. හි දැක්වේ. 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වසරේදී සියළුම බීජ නිෂ්පාදන මූලාශ්‍ර වල දායකත්වය ඉහළ යාම හේතුවෙන් බිත්තර වී නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි කළ ඉඩම් ප්‍රමාණයේ 38% ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

වගු අංක 3.1.1.2: 2010 සහ 2011 වසර වලදී බිත්තර වී නිෂ්පාදනය යටතේ පැවති බිම් ප්‍රමාණය

මූලාශ්‍රය	බීජ පන්තිය	2010		2011		
		ලියාපදිංචි වපසරිය (හෙ.)	පරීක්ෂා කරන ලද වපසරිය (හෙ.)	ලියාපදිංචි වපසරිය (හෙ.)	පරීක්ෂා කරන ලද වපසරිය (හෙ.)	පිළිගත් %
පර්යේෂණ ස්ථාන	අභිජනක	5.2	5.2			
රජයේ ගොවිපළ	අත්තිකාරම්	53.0	42.0	65.0	47.0	98
	ලියාපදිංචි	459.0	431.0	618.0	369.0	100
	සහතික කළI	132.0	106.0	299.0	212.0	100
	සහතික කළII	3.5	3.5.0	53.0	43.0	100
කොන්ත්‍රාත් වගාකරුවන්	ලියාපදිංචි	12.0	12.0	31.0	25.0	100
	සහතික කළI	598.0	551.0	759.0	543.0	99
	සහතික කළII	74.0	67.0	120.0	75.0	100
පෞද්ගලික වගාකරුවන්	ලියාපදිංචි	29.0	27.0	420.0	138.0	97
	සහතික කළI	3416.0	2974.0	3459.0	2131.0	99
	සහතික කළII	422.0	371.0	540.0	307.0	98
එකතුව		**5203.7**	**4589.7**	**6364.0**	**3890.0**	

2011 වසරේදී. බිත්තර වී නිෂ්පාදනය මෙ.ටො.7999 ක් වූ අතර මෙ.ටො. 3869 ක ගුණාත්මක ප්‍රමිතිය රසායනාගාර පරීක්ෂණ මගින් පිළිගන්නා ලදී.(වගු අංක 3.1.1.3) කොන්ත්‍රාත් වගා වැඩසටහන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපළවල් මෙ.ටො.3140 ක් (39%) නිපදවූ අතර පෞද්ගලික අංශයේ වගාකරුවන් මෙ.ටො. 4857 ක් (61%) නිපදවිය.

වගු අංක 3.1.1.3: 2010 සහ 2011 වසර වලදී පරීක්ෂාවට ලක් කෙරුණු බිත්තර වී ප්‍රමාණ සහ පිළිගන්නා ලද(%) ප්‍රතිශතය

මූලාශ්‍රය	2010		2011	
	පරීක්ෂා කරන ලද ප්‍රමාණය (මෙ.ටො.)	පිළිගන්නා ලද ප්‍රතිශතය	පරීක්ෂා කරන ලද ප්‍රමාණය (මෙ.ටො.)	පිළිගන්නා ලද ප්‍රතිශතය
පර්යේෂණ ස්ථාන	3.7	79		
රජයේ ගොවිපළ	2672.0	92	2480	90
කොන්ත්‍රාත් වගාකරුවන්	1476.0	95	661	85
පෞද්ගලික වගාකරුවන්	6969.0	71	4858	23
එකතුව	**11127.7**		**7999**	

වෙනත් ක්ෂෙත්‍ර බෝග බීජ සහතික කිරීම

වෙනත් ක්ෂෙත්‍ර බෝග බීජ නිෂ්පාදනය යටතේ ලියාපදිංචි මුළු වපසරිය හෙ.581 ක් වන අතර මේ සඳහා කොන්ත්‍රාත් වගාකරුවන්ගේ දායකත්වය 66% ක් විය. මෙම වැඩසටහනට බඩඉරිඟු, මුං, රටකජු, තල, කව්පි, කුරක්කන්, උඳු, සෝයා බෝංචි සහ තෝර පරිප්පු ඇතුළත් වූ අතර විවිධ මූලාශ්‍ර සහ පන්ති යටතේ බීජ නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි කළ වපසරිය වගු අංක 3.1.1.4 හි දැක්වේ. 2010 වසර හා සංසඳනාත්මකව වෙනත් ක්ෂෙත්‍ර බෝග බීජ නිෂ්පාදනය සඳහා ලියාපදංචි කරන ලද වපසරිය 16%ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

වගු අංක 3.1.1.4: 2010 සහ 2011 වසර වල වෙනත් ක්ෂෙත්‍ර බෝග බීජ නිෂ්පාදනය යටතේ පැවති වපසරිය

මූලාශ්‍රය	බීජ පන්තිය	2010			2011	
		ලියාපදිංචි කළ වපසරිය හෙ.	පරීක්ෂා කරන ලද වපසරිය (හෙ.)	ලියාපදිංචි කළ වපසරිය (හෙ.)	පරීක්ෂා කරන ලද වපසරිය (හෙ.)	පිළිගත් %
පර්යේෂණ	අභිජනක	2.8	2.7			
ස්ථාන රජයේ	අත්තිවාරම්	33.2	30		9.3	100
ගොවිපළ	ලියාපදිංචි	17	14.6	12	16.3	100
	සහතික කළI	7.9	7.9		13.2	100
	දෙමුහුම්			32.5		
				35.7	0.75	100
	අත්තිකාරම්	0.9	0.9	0.75		
කොන්ත්‍රාත්	ලියාපදිංචි					

වගාකරුවන්	සහතික කළI	58	53.8			
	සහතික කළII	328	306		1.0	100
		49.8	46	1.0	56.5	100
				75.0	178.8	100
	අත්තිවාරම්				18.0	93
පෞද්ගලික	ලියාපදිංචි	2.0	2.0	355.9		
වගාකරුවන්	සහතික කළI			36.6		
	සහතික කළII		20.4		7.8	100
		21	0.8		3.8	100
		0.8		10.5	4.9	100
				12.7	0.4	100
				8.7		
				0.4		
එකතුව		**521.4**	**485.1**	**581.8**	**310.8**	

2011 වසරේදී, වෙනත් ක්ෂෙත්‍ර බෝග බීජ නිෂ්පාදිත මුළු ප්‍රමාණය මෙ.ටො.216 ක් වූ අතර ඉන් 89% ක් සහතික කරන ලදී. විවිධ මූලාශ්‍ර වලින් පරීක්ෂා කරන ලද ප්‍රමාණයන් සහ පිළිගත් ප්‍රතිශතය වගු අංක 3.1.1.5 හි දැක්වේ.

වගු අංක 3.1.1.5 2010 සහ 2011 වසර වලදී පරීක්ෂා කරන ලද වෙනත් ක්ෂෙත්‍ර බෝග බීජ ප්‍රමාණයන්

මූලාශ්‍රය	2010		2011	
	පරීක්ෂා කරන ලද ප්‍රමාණය (මෙ.ටො.)	පිළිගත් ප්‍රතිශතය	පරීක්ෂා කරන ලද ප්‍රමාණය (මෙ.ටො.)	පිළිගත් ප්‍රතිශතය
පර්යේෂණ ස්ථාන	1.9	98		
රජයේ ගොවිපළ	22.1	78	27.4	88
කොන්ත්‍රාත් වගාකරුවන්	236.9	96	168.1	90
පෞද්ගලික වගාකරුවන්	6.6	85	20.8	93
එකතුව	**267.5**		**216.3**	

එළවළු බීජ නිෂ්පාදනය සහතික කිරීම

එළවළු බීජ නිෂ්පාදනය කිරීම සඳහා ලියාපදිංචි කළ වපසරිය හෙ. 126 ක් වූ අතර ඊට පෞද්ගලික වගාකරුවන්ගේ දායකත්වය 54% කි.විවිධ මූලාශ්‍ර සහ බීජ පන්ති යටතේ ලියාපදිංචි කළ ඉඩම් ප්‍රමාණය වගු අංක 3.1.1.6 හි දැක්වේ. මෙම බීජ නිෂ්පාදන වැඩසටහනට තක්කාලි, බණ්ඩක්කා, මිරිස්, පතෝල, බෝංචි, වම්බටු, කරවිල,රාබු, වැටකොළු, මාළුමිරිස්, මෑ. පිපිඤ්ඤ, වට්ටක්කා, තම්පලා, එළවළු කව්පි, දඹුල, කොමඩු, සහ පැපොල් ඇතුළත්වේ.

වගු අංක 3.1.1.6 2010 සහ 2011 වසර වලදී එළවළු බීජ නිෂ්පාදනය කරන ලද වපසරියේ සාරාංශය

මූලාශ්‍රය	බීජ පන්තිය	2010			2011	
		ලියාපදිංචි කළ වපසරිය (හෙ.)	පරීක්ෂා කරන ලද වපසරිය (හෙ.)	ලියාපදිංචි කළ වපසරිය (හෙ.)	පරීක්ෂා කරන ලද වපසරිය (හෙ.)	පිළිගත් %
පර්යේෂණ ස්ථාන	අභිජනක	1.4	1.3	0.2	0.2	100
රජයේ ගොවිපළ						
	මූලික	23.5	21.3	6.7	5.1	100
	සම්මත	27.1	26	26.0	23.0	100
	දෙමුහුම්			0.24	0.24	100
කොන්ත්‍රාත් වගාකරුවන්						
	මූලික	2.8	1.7	0.2	0.2	100
පෞද්ගලික වගාකරුවන්	සම්මත	53.9	49.4	21.5	14.0	100
	සම්මත	88.5	74.2	71.4	51.5	100
එකතුව		**197.2**	**170.2**	**126.3**	**94.3**	

මෙම වසරේදී නිෂ්පාදිත එළවළු ප්‍රමාණය මෙ.ටො.28.5 ක් වූ අතර ඉන් මෙ.ටො.27 ක් සහතික කරන ලදී.විවිධ මූලාශ්‍ර වලින් පරීක්ෂා කරන ලද ප්‍රමාණ සහ පිළිගත් ප්‍රතිශතය වගු අංක අංක 3.1.1.7 හි දැක්වේ.

වගු අංක 3.1.1.7 2010 සහ 2011 වසර වලදී එළවළු බීජ නිෂ්පාදනය

මූලාශ්‍රය	2010		2011	
	පරීක්ෂා කරන ලද ප්‍රමාණය (මෙ.ටො.)	පිළිගන්නා ලද ප්‍රතිශතය	පරීක්ෂා කරන ලද ප්‍රමාණය(මෙ.ටො.)	පිළිගන්නා ලද ප්‍රතිශතය
පර්යේෂණ ස්ථාන	0.4	82	0.027	100
රජයේ ගොවිපළ	9.4	99	5.6	95
කොන්ත්‍රාත් වගාකරුවන්	24.2	84	7.05	91
පෞද්ගලික වගාකරුවන්	36.2	68	15.86	96
එකතුව	**70.02**		**28.54**	

බීජ අර්තාපල් සහතික කිරීම

විවිධ බීජ අර්තාපල් පංති වලින් වගා කරන ලද බිම් ප්‍රමාණ පිළිබඳව වගු අංක 3.1.1.8 හි දැක්වේ.බීජ අර්තාපල් වගාව යටතේ පැවති වපසරිය හෙ.72 ක් වූ අතර ජනප්‍රිය අර්තාපල් ප්‍රභේදයක් වන (ග්‍රැනෝලා) ප්‍රභේදයේ බීජ අර්තාපල් මෙ.ටො. 312 ක් සහතික කරන ලදී. ඊට අමතරව, විශේෂ බීජ අර්තාපල් වැඩසටහන යටතේ ආරක්ෂිත ගෘහ තුළ නිෂ්පාදිත කුඩා ආකන්ද 76535 ක් සහතික කරන ලදී.

වගු අංක 3.1.1.8: 2010 සහ 2011 වසර වලදී බීජ අර්තාපල් නිෂ්පාදනය යටතේ පැවති වපසරිය

මූලාශ්‍රය	පන්තිය	2010		2011	
		ලියාපදිංචි කළ වපසරිය (හෙ.)	පිළිගත් වපසරිය (හෙ.)	ලියාපදිංචි කළ වපසරිය (හෙ.)	පිළිගත් වපසරිය (හෙ.)
රජයේ ගොවිපළ	පූර්ව මූලික	0.10	0.10	0.12	0.08
	මූලික	13.28	12.28	43.01	41.81
	සහතික කළ	25.87			10.23
			24.01	10.23	
පෞද්ගලික වගාකරුවන්	සහතික කළ	13.00	12.90	19.35	18.83
එකතුව		**52.25**	**49.29**	**72.71**	**70.95**

බීජ පරීක්ෂා කිරීම

පේරාදෙණිය, මහ ඉලුප්පල්ලම, අළුත්තරම, සහ බටඅත පිහිටා ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ පර්යේෂණ රසායනාගාර වලදී තත්ත්වය සහතික කිරීම සඳහා බීජ නියැදි 13,234 ක් පරීක්ෂා කරන ලදී.

රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම

රජයේ සහ පෞද්ගලික අංශයේ පැළ තවාන් වල නිෂ්පාදිත පලතුරු පැළ 60,048 ක් සහතික කර ලේබල් කරන ලදි (වගු අංක 3.1.1.9) මෙම ප්‍රමාණය 2011 වසර හා සංසඳනාත්මකව 22% ක වර්ධනයකි.

වගු අංක 3.1.1.9: 2010 සහ 2011 වලදී සහතික කරන ලද බද්ධ පලතුරු පැළ සංඛ්‍යාව

විශේෂ	සහතික කළ පලතුරු පැළ සංඛ්‍යාව	
	2010	2011
අඹ- බද්ධ කළ	99,565	146,979
රඹුටන්- බද්ධ කළ	63,960	27,116
දොඩම්- බද්ධ කළ	30,572	82,162
ජම්බුනාරං	6,854	-
අලිපේර	580	918
දූරියන්	304	282
වරකා	441	2,591
එකතුව	**202,276**	**260,048**

තවාන් ලියාපදිංචි කිරීම

2011 වසර තුළදී පැළ තවාන් 240ක් ලියාපදිංචි කරන ලදී.

මව් පැළ සහතික කිරීම

අඹ, රඹුටන්, පැඟිරි. පෙයාර්ස්, දූරියන්. සහ කොස් මව් පැළ 1307 ක් තෝරා ගන්නා ලදුව ලියාපදිංචි කරන ලදී.

වගු අංක 3.1.1.10: 2010 සහ 2011 වසර වලදී ලියාපදිංචි කරන ලද මව් පැළ සංඛ්‍යාව

විශේෂය	ලියාපදිංචි කළ පැළ සංඛ්‍යාව
අඹ - බද්ධ කළ	450
රඹුටන් - බද්ධ කළ	357
පැගිරි	415
පෙයාර්ස්	77
දුරියන්	1
කොස්	12
එකතුව	**1307**

පශ්චාත් පාලන පරීක්ෂාව

බීජ නියැදි 526 ක් ඇගයීම සඳහා පශ්චාත් පාලන පරීක්ෂාව සිදු කෙරුණු අතර මේ සඳහා විවිධ බෝග ප්‍රභේද වල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහතික බීජ නියැදි සහ ආනයනික බීජ ඇතුළත් වේ. විවිධ බෝග කාණ්ඩ යටතේ සිදු කරන ලද පශ්චාත් පාලන පරීක්ෂණ සංඛ්‍යාව වගු අංක 3.1.1.11 හි දැක්වේ.

වගු අංක 3.1.1.11 පශ්චාත් පාලන පරීක්ෂණ නියැදි සංඛ්‍යාව

බෝග කාණ්ඩය	පරීක්ෂා කරන ලද තොග සංඛ්‍යාව
වී	165
වෙනත් ක්ෂේත්‍ර බෝග	189
එළවළු	165
පලතුරු	7
එකතුව	**526**

විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පරීක්ෂා කිරීම

විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව සම්බන්ධයෙන් ගන්නොරුව පශ්චාත් පාලන ක්ෂේත්‍රයේදී වී ප්‍රභේද 13 ක් (BW 04-992, At 676, Ld3-6-12, Bg 3R, At 06-631, Bg 465, පොකුරු සම්බා, Ld 1-5-15, CIC 3-1, Bg 5-15-31, BG 4-2236, Bg 11-139, Bg 5-110) මෙන්ම එළවළු ප්‍රභේද 14 ක් සහ වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රභේද 19 ක් පරීක්ෂා කර බලන ලදි. වී ප්‍රභේද 8 ක එළවළු ප්‍රභේද 8 ක සහ වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රභේද 05 ක විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පිළිබඳ සොයා බැලීමේ පරීක්ෂණ කටයුතු මෙම වසර තුලදී සම්පූර්ණ කෙරිණි.

වගු අංක 3.1.1.12 විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව සම්බන්ධයෙන් සිදුකරන ලද පරීක්ෂණ ගණන

බෝග කාණ්ඩය	සිදුකළ පරීක්ෂණ සංඛ්‍යාව	සම්පූර්ණ කරන ලද පරීක්ෂණ ගණන
වී	13	8
වෙනත් ක්ෂේත්‍ර බෝග	19	5
එළවළු	14	8
එකතුව	**46**	**21**

බීජ පනත ක්‍රියාත්මක කිරීම

මෙරට කෘෂිකර්මාන්තයේ වැදගත් අංශයක් වන බීජ කර්මාන්තයට හානියක් විය හැකි අයථා කටයුතු වලින් ගොවීන් මෙන්ම බීජ හසුරුවන්නන් ආරක්ෂා කිරීමේ පරමාර්ථයෙන් 2008 සිට 2003 අංක 22 දින දරන බීජ පනත ක්‍රියාත්මක කෙරිණි. මෙම පනත යටතේ 2011 වසරේදී බීජ

බීජ පනතේ විධිවිධාන පිළිබඳව බීජ හසුරුවන්නන් දැනුවත් කිරීම සඳහා පුවත්පත් දැන්වීම් 5 ක් (ලංකාදීප - 3, රිවිර- 1, තිනකරන් -1) රූපවාහිනී වැඩසටහන් 4ක් (රූපවාහිනී - 3, ස්වර්ණවාහිනී - 1) රූපවාහිනී දැන්වීම් 2ක් (රූපවාහිනී තත්පර 30 බැගින් 21 වතාවක්, ස්වර්ණවාහිනී තත්පර 30 බැගින් 14 වතාවක්) ගුවන් විදුලි දැන්වීම් ප්‍රචාර(සිටි එෆ් එම්.තත්පර 30 බැගින් 28 වතාවක්, වෙළඳ සේවය තත්පර 30 බැගින් 28 වතාවක් ,රන් එෆ් එම්, තත්පර 30 බැගින් 40 වතාවක්, නෙත් එෆ් එම් තත්පර 30 බැගින් 65 වතාවක්, ලක්හඬ තත්පර 30 බැගින් 15 වතාවක්, ශ්‍රී එෆ් එම්, තත්පර 30 බැගින් 15 වතාවක්, ශක්ති එෆ් එම්. තත්පර 30 බැගින් දැන්වීම් 14 වතාවක්, සිරස එෆ්.එම්, 10 වතාවක්) ඇතුළත් සතියක ජන මාධ්‍ය වැඩසටහන් ව්‍යාපාරයක් දියත් කරන ලදි.

පර්යේෂණ සහ සංවර්ධන කාර්‍යයන්

හසුරුවන්නන් 918 දෙනෙක් ලියාපදිංචි කළ අතර 410 දෙනෙකුගේ ලියාපදිංචිය නැවත අළුත් කරන ලද අතර පැමිණිලි 12 ක් විභාග කර බීජ පනත උල්ලංඝනය කළ බීජ හසුරුවන්නන්ට එරෙහිව නිසි ක්‍රියාමාර්ග ගන්නා ලදී.පරීක්ෂණ 15 ක් සිදු කර ශ්‍රී ලංකාවේ බීජ කර්මාන්තය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනිණි

පහත දැක්වෙන විෂයන් සම්බන්ධයෙන් පර්යේෂණ අධ්‍යයන සිදුකරන ලදී,

- ඇසුරුම් කළ එළවළු බීජ සඳහා කල් ඉකුත් වීමේ දිනය
- පලතුරු පැළ සහතික කිරීමේ වැඩසටහන් සම්බන්ධයෙන් නීතිපතා පැන නගින ගැටළු සඳහා විද්‍යාත්මක විසඳුම්
- ආනයන බීජ තොග ආශ්‍රිත අවදානම
- විවිධ ඇසුරුම් ද්‍රව්‍ය වලින් ජල වාෂ්ප ගමන් කරන ආකාරය

පුහුණු වැඩසටහන්

ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳව නිළධාරීන්ගේ සහ බීජ හසුරුවන්නන්ගේ දැනුම වර්ධනය කිරීම පිණිස බීජ සහතික කිරීමේ සේවය මගින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී

වගු අංක 3.1.1.13 පුහුණුව ලද අභ්‍යාසලාභීන් සංඛ්‍යාව

පුහුණු වැඩසටහන	අභ්‍යාසලාභීන් සංඛ්‍යාව
බීජ ගොවීන් /තවාන්කරුවන්	60
රජයේ නිළධාරීන්	544
එකතුව	**604**

බීජ සහතික කිරීමේ සේවයේ තෙරතුරු සේවා ක්‍රමය

දත්ත ආපසු ලබා ගැනීම සහ තොරතුරු කළමනාකරණය පහසු කිරීම සහ කාර්‍යක්ෂම කිරීම පිණිස දිවයින පුරා පිහිටි ප්‍රාදේශිය බීජ සහතික කිරීමේ සේවා ස්ථාන 22, බීජ පරීක්ෂණ විද්‍යාගාර 4 සහ පශ්චාත් පාලන ඒකක 4 සම්බන්ධ කිරීම මගින් බීජ සහතික කිරීම පිළිබඳ දත්ත මූලය වැඩිදියුණු කිරීම අඛණ්ඩවම සිදු කෙරිණි. තවද, ප්‍රධාන කාර්යාලයේ, කලාපීය ඒකක වල, විද්‍යාගාරවල, සහ පශ්චාත් පාලන ඒකක වල සේවය කරන සියළුම කාණ්ඩ වල සියළුම කාර්‍යය මණ්ඩල සාමාජිකයින්ගේ පෞද්ගලික දත්ත සහිත නව දත්ත මූලයක් සකස් කිරීමේ කටයුතු නිම කෙරිණි.

2012 වසර සඳහා සැලැස්ම

- සහනික කළ බීජ මගින් ජාතික බිත්තර වී අවශ්‍යතාවෙන් 31% ක් සපුරා ගැනීමේ ඉලක්කය සපුරා ගැනීම සඳහා බීජ සහතික කිරීමේ සේවය බල ගැන්වීම.

- බීජ මගින් ඇති වන ව්‍යාධිජනක හඳුනා ගැනීම තුළින් බීජ ස්වස්ථතාව වර්ධනය කිරීම සඳහා නව බීජ ස්වස්ථතා ඒකකයක් ස්ථාපිත කිරීම.

- බීජ හසුරුවන්නන් විශේෂයෙන් මුහුණාපාන පශ්චාත් අස්වනු ගැටළු වන බීජ ඇසුරුම් කිරීම,ගබඩා කිරීම සහ කල් ඉකුත් වීමේ දින සම්බන්ධයෙන් බීජ පර්යේෂණ සිදුකිරීම සඳහා බීජ පර්යේෂණ ඒකකයක් ස්ථාපිත කිරීම.

- දූෂ්‍ය කාරක වල් පැළෑටි බීජ හඳුනා ගැනීම, නව ආක්‍රමණ පැළෑටි සම්බන්ධයෙන් අවදානම තක්සේරු කිරීම සහ විශේෂයෙන්ම ආනයනය කරන බීජ හරහා ආක්‍රමණශීලි වල් විශේෂ පැමිණීම වැලැක්වීම සඳහා ආක්‍රමණශීලි සහ හානිකර වල් පැළෑටි පිළිබඳව අධ්‍යයනය කිරීම. සඳහා වල් පැළෑටි විද්‍යා ඒකකයක් ස්ථාපිත කිරීම.

- ජනතාවගේ දැනුවත්භාවය සඳහා බීජ සහතික කිරීමේ වැඩසටහන පිළිබඳ තොරතුරු පතුරුවාලීම වැඩිදියුණු කිරීමට සහ අපගේ සේවාව කාර්‍යක්ෂමව සහ පහසුවෙන් ලබා ගැනීමට හැකියාව සලසමින් බීජ සහතික කිරීමේ සේවයේ වෙබ් අඩවිය සකස් කිරීම.

- බීජ කර්මාන්තයේ අයථා කටයුතු වලක්වාලමින් ගුණාත්මයෙන් ඉහළ බීජ

- හා රෝපණ ද්‍රව්‍ය සුලභ කිරීම සඳහා රජයේ සහ පෞද්ගලික අංශයේ බීජ හසුරුවන්නන් අතර බීජ නිෂ්පාදන ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම සඳහා බීජ පනත ක්‍රියාත්මක කිරීම.

- සියළුම බීජ හසුරුවන්නන් අතර බෙදා දීම සඳහා ගුණාත්මක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම පිළිබඳ උපදේශාත්මක කරුණු සකස් කිරීම.

- සෑම වගා කන්නයකම බීජ නිෂ්පාදකයන්ගේ නාමාවලිය සහ රෝපණ ද්‍රව්‍ය නිපදවන්නන්ගේ නාමාවලිය සකස් කර බෙදා හැරීම.

- බීජ හසුරුවන්නන් සඳහා බෝග පිළිබඳ උපදෙස් මාලාවක් ප්‍රකාශයට පත් කිරීම.

- නව සංශෝධිත බීජ පනත් සහ නියාමන කටයුතු අවසන් කර ප්‍රකාශයට පත් කිරීම

- නව බීජ පරීක්ෂණාගාරයක් සහ කාර්යාල සංකීර්ණයක් පරන්තන්හි ඉදි කිරීම, කුණ්ඩසාලේ, මාතර, යාපනය සහ කරඩියනාරු යන ප්‍රදේශ වල කලාපීය බීජ සහතික කිරීමේ සේවා ගොඩනැගිලි ඉදිකිරීම සහ කඩියනාරු සහ බටඅත ප්‍රදේශයන්හි පශ්චාත් පාලන ක්ෂේත්‍ර ස්ථාපිත කිරීම.

- කාර්‍ය්‍ය මණ්ඩලය සහ උපකරණ මගින් සියළුම බීජ සහතික කිරීමේ සේවා ඒකක ශක්තිමත් කිරීම.

කාර්‍ය්‍ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	නිලධාරි/සේවක සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිළධාරී	02
කෘෂිකර්ම නිළධාරී	09
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරී	04
වැඩසටහන් සහකාර	03
කෘෂිකර්ම උපදේශක	102
පර්යේෂණ සහකාර	01
පර්යේෂණ උප සහකාර	04
රාජ්‍ය කළමනාරණ සහකාර	09

රියදුරු	14
විදුලි කාර්මික	01
මුරකරු	16
කම්කරු	65
බීජ කාර්මික	10
බීජකරු	01
සනීපාරක්ෂක කම්කරු	01
එකතුව	**243**

3.1.2. පැළෑටි සංරක්ෂණ සේවය - ගන්නෝරුව

පැළෑටි සංරක්ෂණ සේවයට ගොවි ක්ෂෙත්‍ර තත්ත්වයන් යටතේ කෘෂිකාර්මික බෝග සඳහා පාරිසරික වශයෙන් හිතකර ආර්ථික වශයෙන් වාසිදායක සහ ප්‍රායෝගිකව භාවිතා කළ හැකි පළිබෝධ පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීමේ වගකීම පැවරී ඇත.

දැනට භාවිතා කෙරෙන පළිබෝධ කළමණාකරණ ක්‍රම වැඩිදියුණු කිරීම,පළිබෝධ හා රෝග පැතිරීම පාලනය කිරීම,බීජ හා පංශු ධූමායනය සහ කෘෂිකාර්මික හා ජලජ පරිසරයන් තුළ ආගන්තුක ආක්‍රමණශීලි විශේෂ ඇතුළු හානිකර ඇතැම් ආක්‍රමණශීලි වල් පැළෑටි කළමනාකරණය කිරීමේ කටයුතු සිදු කරන අතරම ක්ෂෙත්‍ර මට්ටමේ සමෝධානික පළිබෝධ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මෙහෙය වීම. සහ ඇගයීම තුළින් මෙම පුළුල් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිතය.

විශේෂ පළිබෝධ පැතිරීම සහ ගෘහ පළිබෝධ පාලනය කිරීම සඳහා උපදෙස් ලබා දීමද මෙම ආයතනයෙන් සිදු කෙරේ. මෙම කාර්‍යයන් "1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත" මගින් පැවරී ඇති වගකීමෙහි විශාල කොටසක් ආවරණය කරයි. නව පළිබෝධනාශක නියමු මට්ටමින් ගොවි ක්ෂෙත්‍රවල ඇගයීම තුළින් 1981 පළිබෝධනාශක පනත ක්‍රියාත්මක කරමින් පැළෑටි සංරක්ෂණ සේවය අතිරේක කාර්‍යභාරයක්ද ඉටු කරයි.

අයවැය

වගු අංක 3.1.2.1. වාර්ෂික අයවැය - 2011 (රු)

වැය විෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
පුනරාවර්තන	1,822,000	1,696,522	93
මූලධන	2,045,000	1,832,842	90
ආදර්ශ ගම්මාන	100,000	73,872	74
වී වගාව වැඩි දියුණු කිරීම (සමෝධානික පළිබෝධ කළමනාකරණය)	140,000	97,863	70
එකතුව	**4,107,000**	**3,701,099**	**90**

ප්‍රගතිය

සමෝධානික පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම (IPM)

මේ යටතේ පැළෑටි සංරක්ෂණ සේවය වී, එළවළු සහ කොළ එළවළු සම්බන්ධයෙන් සමෝධානික පළිබෝධ කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කරයි.

වී සඳහා සමෝධානික පළිබෝධ කළමණාකරණය

මහනුවර,මොණරාගල සහ කළුතර දිස්ත්‍රික්ක වල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 70 දෙනෙකු සඳහා කන්නය පුරාම සමෝධානික පළිබෝධ කළමනාකරණය පිළිබඳ විධිමත් පුහුණු වැඩසටහන් සිදු කෙරිණි.

එළවළු සඳහා සමෝධානික පළිබෝධ කළමණාකරණය

කෘෂි රසායනික භාවිතය අවම කරමින් ශ්‍රී ලංකාවේ වගා කෙරෙන ප්‍රධාන එළවළු බෝග වල පළිබෝධ පාලනය කිරීමේ නිවැරදි ක්‍රමෝපායන් ප්‍රවර්ධනය කිරීම සඳහා පැළෑටි සංරක්ෂණ සේවය මගින් වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන සමෝධානික පළිබෝධ කළමනාකරණ සංරචකයන් වන පෙව විද්‍යාත්මක පාලන කාරක ප්‍රවර්ධනය කිරීම සහ කෘත්‍රිම රසායනික ආදිය සඳහා විකල්පයක් ලෙස උද්භිදාංග යොදා ගැනීම පාදක කර ගන්නා ලද්දකි. මෙම සංරචකය යටතේ

2011 වසරේදී පහත සඳහන් කාර්‍යයන් නිම කෙරිණි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා එළවළු පිළිබඳ සමෝධානික පළිබෝධ කළමනාකරණ පුහුණුව

- ත්‍රිකුණාමලයේ දිස්ත්‍රික්ක පුහුණු මධ්‍යස්ථානයේදී එළවළු පිළිබඳ දින තුනක සමෝධානික පළිබෝධ කළමනාකරණ පුහුණු වැඩසටහනක් පැවැත්වූ අතර එම වැඩසටහනට ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ව්‍යාප්ති නිලධාරීන් 44 දෙනෙකු සහභාගී විය.

- පැළෑටි සංරක්ෂණ සේවයේ මගින් මඩකලපුවේ ව්‍යාප්ති නිලධාරීන් සඳහා එළවළු පිළිබඳ සමෝධානික පළිබෝධ කළමනාකරණ වැඩසටහනක් මෙහෙය වූ අතර එම වැඩසටහනට නිලධාරීන් 39 දෙනෙකු සහභාගී විය.

- උතුරු සහ නැගෙනහිර පලාත් හැර අනෙකුත් සියළුම පලාත් වල ව්‍යාප්ති නිලධාරීන් 54 දෙනෙකුට එළවළු සඳහා සමෝධානික පළිබෝධ කළමණාකරණය පිළිබඳව ගන්නෝරුවේදී පුහුණුව ලබා දෙන ලදී.

- දකුණු පලාතේ ව්‍යාප්ති නිලධාරීන් 52 දෙනෙකු සඳහා අගුණකොළපැළැස්ස සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී පුහුණු වැඩසටහනක් මෙහෙය විය.

ගොවීන් සඳහා එළවළු පිළිබඳ සමෝධානික පළිබෝධ කළමනාකරණ පුහුණු වැඩසටහන

- කොත්මලේ ප්‍රදේශයේ ගොවීන් 50 දෙනෙකු සමෝධානික පළිබෝධ කළමනාකරණය පිළිබඳව පුහුණු කරන ලදී.

- පැළෑටි සංරක්ෂණ සේවයේ උපදෙස් අනුව නවගත්තේගම, වීරකැටිය, ගිරාඳුරුකෝට්ටේ/රත්කිඳ සහ දෙහිඅත්තකන්ඩිය යන ප්‍රදේශ වල ගොවීන් 450 දෙනෙකු සමෝධානික පළිබෝධ කළමණාකරණ ක්‍රමෝපායන් අනුගමනය කරන ලදී.

කොළ එළවළු සඳහා සමෝධානික පළිබෝධ කළමණාකරණය

- කොළ එළවළු සඳහා සමෝධානික පළිබෝධ කළමණාකරණය ව්‍යාප්ත කිරීමේ කටයුතු තවදුරටත් සිදු කරන ලදුව කොළඹ දිස්ත්‍රික්කයේ කොළ එළවළු වගාකරුවන් සඳහා, විශේෂයෙන්ම, වටපණුවන් පාලනය කිරීමට තාක්ෂණික සහාය ලබා දෙන ලදී. මෙම සංරචකය යටතේ ගොටුකොළ සහ මුකුණුවැන්නා වගා වල වටපණුවන් සහ මයිටාවන් පාලනය කිරීම, පොහොර නිවැරදිව යොදන ආකාරය පිළිබඳ පුහුණු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් කීපයක් මෙහෙය විය.

පළිබෝධනාශක නියමු මට්ටමින් පරීක්ෂා කර බැලීම

පේව සඵලත්වය සම්බන්ධයෙන් පහත දැක්වෙන පැළ නාශක ගොවි ක්ෂෙත්‍ර තත්ත්වයන් යටතේ අගයන ලදි. මෙම පැළෑටි නාශක වඩාත් ඉලක්ක විශේෂිත වීම සහ සාපේක්ෂව යොදන ප්‍රමාණය අඩුවීම හේතුවෙන් නිර්දේශිත පැළෑටි නාශක වලට වඩා අමතර වාසි වලින් යුක්තය.

වී වගාවේ වල් පාලනය සඳහා පැළෑටි නාශක

- ෆෙනොක්සිප්‍රොප් - පී- එතිල් 69g/Eඊ මඩට වපුරන වී වගාවේ වල් පැළෑටි පාලනය කිරීම සඳහා නිර්දේශ කර තිබෙන ෆෙනොක්සිප්‍රොප් - පී එතිල් (රයිස්ටාර්) සංයෝගයට විකල්පයක් ලෙස යොදා ගැනීම සඳහා නිර්දේශ කරන ලදි.

- මෙටාමිෆොප්10EC - මඩට වපුරන වී වගාවේ වාර්ෂික වල් පැළෑටි පාලනය කිරීම සඳහා නිර්දේශ කෙරිණි.

- මෙෆනසෙට් + බෙන්සල්ෆ්‍යුරොන් මෙතිල් (බෙන්සිනේට් 53WP) - මඩට වපුරන වී වගාවේ වල් පැළෑටි, පන් වගී සහ පුළුල් පත්‍ර පාලනය කිරීම සඳහා ''වන් ෂොට්'' වල් නාශකයක් ලෙස නිර්දේශ කෙරිණි.

- මෙට්සල්ෆ්‍යුරොන් මෙතිල් 20WP - මඩට වපුරන වී වගාවේ පන් වගී සහ පුළුල් පත්‍ර වල් පැළෑටි පාලනය කිරීම සඳහා නිර්දේශ කරන ලදි.

- බිස්පයිරිබැක් සෝඩියම් 20% WP (කෙන්සෝලෝ) වී වගාවේ වල් පැළෑටි, පන් වර්ග සහ පුළුල් පත්‍ර පාලනය කිරීම සඳහා දැනට නිර්දේශ කර තිබෙන බිස්පයිරිබැක් සෝඩියම් (නොමිනි) වලට විකල්පයක් ලෙස නිර්දේශ කෙරිණි.

බඩඉරිඟු වගාවේ වල් පාලනය කිරීම සඳහා පැළෑටි නාශක

- ටොප්රාමෙසොන් - බඩඉරිඟු වගාවේ වාර්ෂික වල් පැළෑටි පාලනය කිරීම සඳහා පශ්චාත් නිර්ගමන වල් නාශකයක් ලෙස නිර්දේශ කෙරිණි. මෙම සංයෝගයේ කායීක්ෂම ප්‍රතිඵල ලබා ගැනීම සඳහා හෙ.ට මි.ලී. 100 ක් බෝගය වපුරා දින 15කට පමණ පසුව යෙදීම නිර්දේශ කෙරේ.

- ඩයියුරොන් 80% WP - අන්නාසි වගාවේ සියළුම පැළෑටිමය වල් පාලනය කිරීම සඳහා දැනට නිර්දේශිත ඩයියුරොන් 80% WP සංයෝගයට විකල්පයක් ලෙස නිර්දේශ කරන ලදී.

පේව විද්‍යාත්මක පාලන වැඩසටහන

ඉල්ලීම සහ අවශ්‍යතාවය මත නිදහස් කිරීම සඳහා විශේෂයෙන්ම ආක්‍රමණශීලි ජලජ පැළෑටි පාලනය කිරීම සඳහා පැළෑටි සංරක්ෂණ සේවය මගින් පේව විද්‍යාත්මක පාලන කාරක ඒකක නඩත්තු කෙරේ.

සැල්වීනියා පේව විද්‍යාත්මකව පාලනය කිරීම (සැල්වීනියා මොලස්ටා)

සයිටොබගස් සැල්වීනියේ (*Cyrtobagus Salviniae*) පේව විද්‍යාත්මක පාලන කාරකය උතුරු මැද පලාතේ ජලාශ 5කට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජලාශ 5 කට , පොළොන්නරු දිස්ත්‍රික්කයේ ජලාශ 2 කට මාතලේ දිස්ත්‍රික්කයේ ජලාශ 2 කට මහනුවර දිස්ත්‍රික්කයේ ජලාශ 2 කට හඳුන්වා දෙන ලදී.

ජපන් ජබර පේව විද්‍යාත්මකව පාලනය කිරීම (*Eichornia Crassipes*)

ජපන් ජබර පේව විද්‍යාත්මක පාලන කාරක (*Neochetina bruchi* සහ *Neochetina eichchorniae*) අනුරාධපුර, මාතලේ, සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ප්‍රධාන ජලාශ 6 කට හඳුන්වා දෙන ලදී.

අළුතින් හඳුන්වා දෙන ලද පළිබෝධ පාලන වැඩසටහන

කොළඹ දිස්ත්‍රික්කයේ මාගම්මන වැල්මිල්ල ප්‍රදේශයේ ගොවීන් සඳහා පැපොල් පිටි මකුණා පාලනය කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය.

පේර සලඹයා පාලනය කිරීම(*Dichocrocis Punctiferalis*)

පැළෑටි සංරක්ෂණ සේවය මගින් පේර සලඹයා ''හඳුනා ගැනීම සහ පාලනය කිරීම" පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් උතුරු මැද පලාතේදී සිදු කරන ලද අතර ඊට ගොවීන් 25 දෙනෙකු සහභාගි විය.

කෙසෙල් පිටි මකුණා පාලනය කිරීම(*Dysmicocus neobrevipus*)

- උතුරු මැද පලාතේ අන්තර් පලාත් ප්‍රදේශ වල ව්‍යාප්ති නිළධාරීන් 38 දෙනෙකු පැපොල් පිටි මකුණා පාලනය කිරීම පිළිබඳව පුහුණු කරන ලදී.

- උතුරු මැද පලාතේ ගොවීන් 65 දෙනෙකු සඳහා කෙසෙල් පිටි මකුණා හඳුනා ගැනීම සහ පාලනය කිරීම පිළිබඳව පුහුණු වැඩසටහන් පැවැත්විය.

- පැළෑටි සංරක්ෂණ සේවය අනුරාධපුර දිස්ත්‍රික්කයේ නිළධාරීන් 45 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් මෙහෙය විය.

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂකවරු 19 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය.

ඩ්‍රැගන් ෆෘට් රෝග පාලනය කිරීම

- උතුරු මැද පලාතේ ඩ්‍රැගන් ෆෘට් වගාකරුවන් සහ තවාන්කරුවන් 23 දෙනෙකු ඩ්‍රැගන් ෆෘට් රෝග හඳුනාගැනීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් පුහුණු කරන ලදී.

- ඩ්‍රැගන් ෆෘට් වගාවේ කඳ පුල්ලි රෝගය (Stem Spot disease) සහ පාලනය කිරීම. අනුරාධපුර දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිළධාරීන් 45 දෙනෙකු ඩ්‍රැගන් ෆෘට් කඳ පුල්ලි රෝගය හඳුනා

ගැනීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් පුහුණු කරන ලදි.

බීජ ධූමායනය

බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධනය මධ්‍යස්ථානයේ සහ පෞද්ගලික අංශයේ ගොවිපළ වල ඉල්ලීම මත බීජ ධූමායනය කිරීම පැළෑටි සංරක්ෂණ සේවය මගින් ඉටු කරන ප්‍රධාන කායීයන්ගෙන් එකකි.

2011 වසරේදි රජයේ ගොවිපළ වල බීජ පහත දැක්වෙන ප්‍රමාණයන්ගෙන් ධූමායනය කරන ලදී

බීජ වර්ග	ප්‍රමාණය(මෙ.ටො)
• බිත්තර වී	• 903
• පරිභෝජනය සඳහා වී	• 408
• වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ (බඩඉරිඟු,කව්පි ආදිය)	• 07
• එළවළු බීජ	• 0.30

ගෘහ පළිබෝධ පාලනය

2011 වසරේදී පැළෑටි සංරක්ෂණ සේවය මගින් රජයේ ගොඩනැගිලි සංකීර්ණ කීපයකට අයත් ප්‍රධාන ස්ථාන 06 ක පැවති වේ උවදුර පාලනය කිරීමේ කටයුතු වල නිරත විය.

මීයන් පාලනය කිරීම

වී වගා කරන බොහෝ ගොවීන් ඔවුන්ගේ කුඹුරුවල සිටින මීයන් පාලනය කර ගැනීමේ දුෂ්කරතාවයන්ට මුහුණු පා සිටී. මෙම වසරේදී පැළෑටි සංරක්ෂණ සේවය මගින් ඉල්ලීම මත ප්‍රධාන ගොවිපළවල් 6 ක මී උවදුරු සාර්ථකව පාලනය කරන ලදි.

කොළඹ සහ කළුතර දිස්ත්‍රික්ක වල වී ගොවීන් 60 දෙනෙකු සහ බොඹුවල පර්යේෂණ ස්ථානයේ නිළධාරීන් 30 දෙනෙකු පුහුණු කරන ලදී

වෙනත් කායීයන්

- උතුරු මැද පලාතේ පේර වගාවල මූල ගැටිති නෙමටෝඩාවන් හඳුනා ගැනීම සහ පාලනය කිරීමට අමතරව මෙම ඒකකය මගින් ප්‍රදේශයේ සේවා නියුක්ත තාක්ෂණික නිළධාරීන් 55 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් මෙහෙය විය.
- පේර වගාකරුවන් සහ පැළ තවාන් හිමිකරුවන් 85 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් මෙහෙය විය.

වීඩියෝ වැඩසටහන්

- පේර වගාවේ මූල ගැටිති නෙමටෝඩා හානිය . "ගොවි බිමට අරුණාළු" ශ්‍රී ලංකා රූපවාහිනිය
- වීරකැටියේදී එළවළු සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණය පිළිබඳ සිදු කරන ලද වැඩසටහන ශ්‍රී ලංකා රූපවාහිනී නාලිකාව ඔස්සේ ප්‍රචාරය කරන ලදි.
- "ඩ්‍රැගන් ෆෘට් රෝගය කළමනාකරණය" පිළිබඳ වැඩසටහන රූපවාහිනී නාලිකාව ඔස්සේ ප්‍රචාරණය කරන ලදී.
- "වස විස නැති කෘෂිකර්මය " නැමැති රූපවාහිනී වැඩසටහන ITN නාලිකාව ඔස්සේ ප්‍රචාරය කෙරිණී.

2012 වසර සඳහා සැලස්ම

- පැළෑටි ආරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම.
- වී සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම.
- එළවළු සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම.
- කොළ එළවළු සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම.
- වී සහ එළවළු වගාවේ පළිබෝධ පිළිබඳව දිස්ත්‍රික්ක මට්ටමින් දත්ත බැංකුවක් බිහි කිරීම.
- ආක්‍රමණශීලි ප්ලප වල් පෑළෑටි පේව විද්‍යාත්මකව පාලනය කිරීම.
- කෘෂිකාර්මික පරිසර වලට ආගන්තුක ආක්‍රමණශීලි වල් පැළෑටි පාලනය කිරීම.

- වල් නාශක නියමු මට්ටමින් පරීක්ෂා කිරීම
- බීජ ධුමායනය
- ආදර්ශ ගම්මාන ස්ථාපිත කිරීම
- රජයේ ගොඩනැගිලිවල පැතිර පවතින වේ පාලනය වැනි වෙනත් විශේෂ කාර්‍යයන්
- ගන්නෝරුව කෘෂි උද්‍යානයේ ස්ථිර ප්‍රදර්ශන ඒකකයක් ස්ථාපිත කිරීම

කාර්‍ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිලධාරි	01
කෘෂිකර්ම නිලධාරි	03
වැඩසටහන් සහකාර	01
කෘෂිකර්ම උපදේශක	08
රාජ්‍ය කළමණාකරණ සහකාර	04
රියදුරු	04
ගබඩා කම්කරු	01
ලොරි පවිත්‍රකරු	01
කම්කරු	05
එකතුව	**29**

3.1.3. ජාතික පැළෑටි නිරෝධායන සේවය - කටුනායක

ශ්‍රී ලංකා පැළෑටි නිරෝධායන සේවයට පැවරී ඇති වගකීම වන්නේ මෙරට කෘෂිකර්මය හා ඒ ආශ්‍රිත කර්මාන්ත වල සංවර්ධනය සඳහා පළිබෝධ රහිත ආනයන හා අපනයන සඳහා පහසුකම් සැලසීමයි. මෙය සපුරා ගැනීම සඳහා පර්යේෂණ සහ සේවා අරමුණු කරගත් නිරෝධායන කටයුතු කෙරෙහි අවධානය යොමු කරන ලදි.

උද්භිද ස්වස්ථතා සහතිකකරණය, ආනයනය හා අපනයනය කරන පැළෑටි සහ පැළෑටි නිෂ්පාදන පරීක්ෂාකර බැලීම හා ඒවා සඳහා ප්‍රතිකර්ම යෙදීම සහ උනන්දුවක් දක්වන කණ්ඩායම් සඳහා පුහුණුව සහ දැනුවත් කිරීමේ වැඩසහන් හරහා පැළෑටි නිරෝධායනයේ විවිධ අංශ සම්බන්ධයෙන් දැනුම බෙදා දීම මෙම ආයතනයෙන් සිදු කෙරෙන ප්‍රධාන කාර්යයන් වේ.එමෙන්ම මෙය තම කටයුතු කරගෙන යාමේදී ජාතික පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතන සහ මධ්‍යස්ථාන සමග නිරන්තරයෙන්ම සහයෝගීතාවෙන් යුතුව කටයුතු කරයි.2011 වසරේදී මූල්‍ය, තාක්ෂණික සහ සේවා පාදක කරගත් වැඩකටයුතු සම්බන්ධයෙන් අත්කරගත් කාර්යඵල මෙම වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ.

අයවැය

පුනරාවර්තන, මූලධන සහ ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 3.1.3.1 හි දැක්වේ.

වගු අංක 3.1.3.1 : වාර්ෂික අයවැය - 2011 (රු:)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
මූලධන	6,811,0000	3,410,038	5
පුනරාවර්තන	6,208,0000	5,431,464	9
ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම් ව්‍යාපෘති	3,000,0000	650,069	2
එකතුව	**160,190,000**	**9,491,571**	**6**

ප්‍රගතිය

පැළෑටි නිරෝධායන මෙහෙයුම් කටයුතු

2011 වසරේදී පැළෑටි නිරෝධායන මෙහෙයුම් අංශය මගින් සිදු කරන ලද කටයුතු පිළිබඳව වගු අංක 3.1.3.2. හි දැක්වේ.

වගු අංක 3.1.3.2 : 2011 වසරේදී ඉටු කරන ලද කාර්යයන්

කාර්යය	කාර්යඵලය
1. රඳවා තබා ගැනීම් ලියාපදිංචි කිරීම	301
2. රඳවා තබා ගන්නා ලද වාර්තා යැවූ සංඛ්‍යාව	297
3. පරීක්ෂණ ලියාපදිංචි කිරීම්	689
4. ප්‍රවේශ ස්ථාන වෙත යවන ලද පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව	677
5. පරීක්ෂා කිරීම සඳහා කොහු නිෂ්පාදන ලියාපදිංචි කිරීම	159
6. පරීක්ෂා කරන ලද කොහු නිෂ්පාදන සඳහා වාර්තා	144
7. පරීක්ෂා කිරීම සඳහා යොමු කරන ලද නියැදි ලියාපදිංචි කිරීම	27
8. උද්භිද ස්වස්ථතා සහතික නිකුත් කිරීම්	03
9. විනාශ කරන ලද තොග සංඛ්‍යාව	1102

පැළෑටි නිරෝධායන මෙහෙයුම් වලට අදාළ මෙම කාර්‍යයන්ට අමතරව පැළෑටි නිරෝධායන කටයුතු සහ ක්‍රියාමාර්ග පිළිබඳ පුළුල් පුහුණු වැඩසටහන් 14 ක් මෙම අංශය මගින් සිදු කරන ලදී.

කීට විද්‍යාව

අපනයන සහ ආනයන තොග ව්‍යාධිජනක සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම

අ) අපනයන

- විචිත්‍ර පත්‍රික පැළෑටි අපනයනය කරනු ලබන පැළ තවාන් 15 කින් එක්රැස් කර ගත් විචිත්‍ර පත්‍රික පැළ නියැදි 10539 ක් පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලදුව නියැදි 403 කට පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් ආසාදනය වී ඇති බැව් අනාවරණය කර ගන්නා ලදී.

- අපනයනය කරනු ලබන විචිත්‍ර පත්‍රික පැළ සහ ස්ට්‍රෝබෙරි නියැදි 5026 ක් කෘමි පළිබෝධ සහ මයිටාවන් සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලදී. ආසාදනය වීම් කිසිවක් වාර්තා නොවීය.

- කොහු නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලා 13 කින් එක් රැස් කර ගත් අපනයනය කරන කොහු නියැදි 79 ක් කෘමි පළිබෝධ, මයිටාවන්, පාංශු දූෂක සහ පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලදී. ආසාදන කිසිවක් වාර්තා නොවීය.

- විචිත්‍ර පත්‍රික පැළ අපනයනය කරනු ලබන පැළ තවාන් වලින් ඉදිරිපත් කෙරුණු වෙනත් විශේෂ නියැදි 157 ක් පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් සහ කෘමි පළිබෝධ සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලදී.

ආ) ආනයන

- ආනයනය කරන ලද බීජ අර්තාපල් තොග 76 ක් වරායේදී පරීක්ෂා කරන ලදී. මෙම බීජ අර්තාපල් තොග වලින් ලබා ගත් නියැදි කෘමි පළිබෝධ සහ පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් සම්බන්ධයෙන් පරීක්ෂා කෙරුණු අතර කිසිදු ආසාදනයක් වාර්තා නොවීය.

- දෙමුහුම් බඩ ඉරිඟු, රටකජු, කජු, ජීර්ණක පාසි (*Sphagnum peat moss*) ලිලියම් බල්බ, පැසවන ලද කොකෝ ඇට ආදිය ඇතුළු ආනයනික රෝපණ ද්‍රව්‍ය 359ක් කෘමි පළිබෝධ, මයිටාවන් සහ පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් සම්බන්ධයෙන් පරීක්ෂා කරන ලදුව නියැදි 07 ක පොදු ගබඩා පළිබෝධ ආසාදන තත්ත්වයන් අනාවරණය කර ගන්නා ලදී. තවද ඉන්දුනීසියාවෙන් ආනයනය කරන ලද තොගයකට බීට්ල් නට් වීවිල් (*Araecerus fasciculatus*) ආසාදනය වී ඇති බැව්ද සොයා ගැනිණි.

පුහුණු කිරීම්

විශ්ව විද්‍යාල, තාක්ෂණික විද්‍යාල සහ පාසැල් සිසුන් විශාල සංඛ්‍යාවක් කීට විද්‍යා අංශය යටතේ පුහුණු කෙරිණි.

ව්‍යාධිවේදය

අපනයන සහ ආනයන තොග ව්‍යාධිජනක සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම.

අ) අපනයන

පත්‍ර සහ කොහු

නියැදි 2098 ක් පරීක්ෂාවට ලක් කෙරුණු අතර මියුකර් විශේෂය, (*Mucor Sp,*)ඇස්පර්ජිලස් විශේෂය (*Aspergillus*), තීලවියොප්සිස් පැරඩොක්සා (*Thelaviopsis paradoxa*) මැක්රොෆොමිනා විශේෂය (*Macrophomina Sp.*) රයිසොෆස් විශේෂය (*Rhigopus Sp*) සහ සැන්තොමොනාස් (*Xanthomonas SP.*) සොයා ගන්නා ලදී. ඉන් තීලවියොප්සිස් පැරඩොක්සා (*Thalaviopsis paradoxa*) නිරෝධායනික වැදගත්කමකින් යුත් පළිබෝධයක් ලෙස සැලකේ.

පටක රෝපිත පැළ

පරීක්ෂණ 69 කින් පැළ 1,350,547 ක් පරීක්ෂාවට ලක් කෙරුණි. ආසාදිත තොග ප්‍රතික්ෂේප කළ අතර නිෂ්පාදන වල ගුණාත්මය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී.

ආ) අපනයන

බීජ අර්තාපල්

බීජ අර්තාපල් නියැදි 77 ක් පරීක්ෂාවට ලක් කෙරුණු අතර සිල්වර් ස්කර්ෆ් (*Silver Scurf*), පොදු කබොළු (*Common Scab*), මෘදු කුණුවීම (*Soft rot*), බ්ලැක් ස්කර්ෆ් (*Black Scurf*), නෙටඩ් ස්කැබ් (*Netted Scab*), සහ අර්විනියා කැරොටොවොරා (*Erwinia Carrotovora*) යන ව්‍යාධිජනක අනාවරණය කර ගැනිණි. නිරෝධායන ව්‍යාධිජනක කිසිවක් නොතිබුණි.

බීජ සහ අනෙකුත් පැළෑටි ද්‍රව්‍ය

නියැදි 379 ක් පරීක්ෂාවට ලක් කළ අතර නිරෝධායන ව්‍යාධිජනක කිසිවක් අනාවරණය නොවිණි.

ඉදිරිපත් කරන ලද නියැදි පරීක්ෂා කිරීම

නියැදි 12 ක් පරීක්ෂා කර වගකිව යුතු පාර්ශ්ව වලට යෝජනා/ සොයා ගැනීම් ලබා දෙන ලදි.

පුහුණු කිරීම්

පුහුණු වැඩසටහන් තුනක් සහ වැඩමුළු 5 ක් මෙහෙය වූ අතර උපාධි අපේක්ෂක සහ ඩිප්ලෝමා සිසු කණ්ඩායම් දෙකක් අධීක්ෂණය කරන ලදි.

පර්යේෂණ වැඩසටහන්

තාප ප්‍රතිකර්මය මගින් ටී.පැරඩොක්සා (*T.Paradoxa*) පාලනය කිරීමේ පර්යේෂණයක් සිදු කළ අතර ලද ප්‍රතිඵල අනුව උපරිම උෂ්ණත්වය සෙ. 70° ක් (70°C) සහ කාලය විනාඩි 5 ක් විය.

වල් පැළ පාලනය

අපනයන සහ ආනයන තොග ව්‍යාධිජනක සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම

අ) අපනයන

අපනයනය සඳහා වූ කොහු බත් නිෂ්පාදන තොග 155 ක් පරීක්ෂා කිරීමේදී ඉන් තොග 41 කට ජීව්‍ය බීජ කලවම් වී ඇති බැව් සොයා ගැනිණි.

ආ) ආනයනය

ආනයන තොග 37 ක් පරීක්ෂා කිරීමේදී ආසාදිත තොග 05ක් අනාවරණය කර ගත් අතර ලූණු බීජ නියැදියක පාර්තීනියම් හිස්ටෙරොෆොරස් (*Parthenium hysterophorus*) බීජ කීපයක් සොයා ගැනිණි.

පුහුණු කිරීම්

විශ්වවිද්‍යාල, තාක්ෂණික විද්‍යාල සහ පාසැල් සිසුන් විශාල සංඛ්‍යාවක් වල් පැළෑටි විද්‍යා අංශය යටතේ පුහුණු කෙරිණි.

පර්යේෂණ වැඩසටහන්

බීජ වල ජීව්‍යතාව විනාශ කරන සාධක (උෂ්ණත්වය සහ කාල සීමාවන්) පිළිබඳව ඇගයීම සඳහා පර්යේෂණාක් සිදු කෙරිණි. වල් වී විශේෂ 8ක් කොහු බත් (කි. ග්‍රෑ. 01) සමඟ මිශ්‍ර කර සවිවර ලෝහ බඳුනකට දමා ලෝහ බඳුනකින් නිකුත් කරන ජල වාෂ්ප වලට අනාවරණය කෙරිණි. මෙහි උපරිම උෂ්ණත්වය සෙ. 90° ක් (90°C) වූ අතර බීජ වල ජීව්‍යතාව විනාශ වීමට ගත් කාලය විනාඩි 10 ක් විය.

විමර්ශන එකතුව නඩත්තු කිරීම

- නව වල් විශේෂ 44ක් එක්රැස් කර ගන්නා ලදුව සංරක්ෂණය කෙරිණි.
- නව වල් බීජ විශේෂ 14 ක් එක්රැස් කර ගන්නා ලදුව සංරක්ෂණය කෙරිණි.

ප්‍රතිකර්ම තාක්ෂණය

වාණිජ ධූමකරණය

- විවිධ සමාගම් වලින් අපනයනය කරනු ලබන පැළෑටි සහ පැළෑටි නිෂ්පාදන තොග 214ක් මෙතිල් බ්‍රෝමයිඩ් යොදා ජාතික පැළෑටි නිරෝධායන සේවා ස්ථානයේ දී ධූමකරණය කරන ලදි.
- මිශ්‍රිත මල් තොග 13ක්, කරදමුංගු තොග 02 ක්, බීජ සහ වියළි පැළෑටි තොග 02 ක් සහ එක් නත්තල් ගසක් ගුවන්තොටුපල පැළෑටි නිරෝධායන ඒකකය මගින් රඳවා ගන්නා ලදුව ආනයනකරු වෙත මුදා හැරීමට පෙර ධූමකරණය කෙරිණි.

වගු අංක 3.1.3.3. 2011 වසරේදී කටුනායක ජාතික පැළෑටි නිරෝධායන සේවා ස්ථානයේදී සිදු කරන ලද වාණිජ ධුමකරණ

භාණ්ඩ වර්ගය	ධුමකරන සංඛ්‍යාව
කොහු සහ කොහු නිෂ්පාදන	100
දැව සහ දැවමය භාණ්ඩ	29
ප්ර්බෙරා	07
මල්	21
වියළි පැළැටි	02
බීජ්	02
කුළුබඩු	10
වෙනත්	17
එකතුව	**214**

නිරෝධායන ප්‍රතිකර්ම අධීක්ෂණය කිරීම

අපනයන කරුවන්ගේ ඉල්ලීම මත දැව ඇසුරුම් ද්‍රව්‍ය සඳහා පෞද්ගලික අංශයෙන් සිදු කළ ධුමකරණ 37 ක සහතිකකරණ කටයුතු සඳහා ප්‍රතිකර්ම නාක්ෂණ අංශයේ නිළධාරීන් විසින් අධීක්ෂණය කෙරිණි.

2012 වසර සඳහා සැලැස්ම

ගුණාත්මක පැළෑටි හා පැළෑටි නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය කිරීම

- අපනයන පැළ තවාන් පරීක්ෂා කිරීම
- අපනයන පැළෑටි හා පැළෑටි නිෂ්පාදන කම්හල් පරීක්ෂා කිරීම්
- කෘෂිකර්මය ආශ්‍රිත අනෙකුත් අපනයන පරීක්ෂා කිරීම් (වෙන් වෙන් වශයෙන් පටක රෝපිත පැළපරීක්ෂා කිරීම්)
- නියැදීම්
- ලේඛන පරීක්ෂා කිරීම්
- පැළෑටි ව්‍යාධි පිළිබඳ රසායනාගාර පරීක්ෂණ
- පැළෑටි කෘමීන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂණ
- නෙමටෝඩාවන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂණ
- වල් පැළෑටි පිළිබඳ විද්‍යාගාර පරීක්ෂණ
- අවසන් වාර්තා ඉදිරිපත් කිරීම

ආනයනික බීජ අර්තාපල් වල ගුණාත්මය පරීක්ෂා කර බැලීම

- බීජ අර්තාපල් ප්‍රවේශ ස්ථානයේදී පරීක්ෂා කිරීම
- නියැදීම
- ලේඛන පරීක්ෂා කිරීම
- පැළෑටි ව්‍යාධිජනක පිළිබඳ විද්‍යාගාර පරීක්ෂණ
- පැළෑටි කෘමීන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂණ
- නෙමටෝඩාවන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂණ
- අවසන් පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම

ආනයනික පැළෑටි හා පැළෑටි නිෂ්පාදන වල ගුණාත්මය පරීක්ෂා කර බැලීම

- ප්‍රවේශස්ථානයේදී පරීක්ෂා කිරීම
- නියැදීම
- ලේඛන පරීක්ෂා කිරීම
- ජාතික පැළෑටි නිරෝධායන සේවය වෙත ප්‍රවේශ ස්ථාන මගින් ඉදිරිපත් කෙරෙන නියැදි භාරගැනීම
- පැළෑටි ව්‍යාධිජනක පිළිබඳ විද්‍යාගාර පරීක්ෂණ
- පැළෑටි කෘමීන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂණ
- නෙමටෝඩාවන් පිළිබඳ විද්‍යාගාර පරීක්ෂණ
- වල් පැළෑටි පිළිබඳ විද්‍යාගාර පරීක්ෂණ
- පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- අවසන් පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- මුද්‍රා හැරීම
- ප්‍රතිකර්ම නිර්දේශ කිරීම
- නැවත අපනයනය හෝ විනාශ කිරීම

ආනයනික බීජ, පලතුරු සහ එළවළු වල ගුණාත්මය පරීක්ෂා කිරීම

- ප්‍රවේශ ස්ථානයේදී පරීක්ෂා කිරීම
- නියැදීම
- ලේඛන පරීක්ෂා කිරීම
- ප්‍රවේශ ස්ථාන මගින් ජාතික පැළෑටි නිරෝධායන සේවය වෙත ඉදිරිපත් කරන නියැදි භාර ගැනීම
- පැළෑටි ව්‍යාධිවේද පිළිබඳ විද්‍යාගාර පරීක්ෂණ
- පැළෑටි කෘමීන් පිළිබඳ රසායනාගාර පරීක්ෂණ
- නෙමටෝඩාවන් පිළිබඳ රසායනාගාර පරීක්ෂණ
- වල් පැළෑටි පිළිබඳ විද්‍යගාර පරීක්ෂණ
- පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- අවසන් පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- මුද්‍රා හැරීම
- ප්‍රතිකර්ම නිර්දේශ කිරීම
- ප්‍රති අපනයනය හෝ විනාශ කිරීම

උද්භිද ස්වස්ථතා සපුරා නොමැති ආනයන වැලැක්වීම

- ලේඛන පරීක්ෂා කිරීම
- නියැදීම
- රඳවා තබා ගන්නා ලද පැළවල ව්‍යාධිජනක නිබේදැයි පරීක්ෂා කිරීම
- රඳවා තබා ගන්නා ලද පැළ කෘමි පළිබෝධ සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීම
- පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම
- වල් පැළෑටි සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම
- පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- අවසන් පරීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම
- ප්‍රතිකර්ම නිර්දේශ ලබා දීම
- ප්‍රතිකර්ම පිළිබඳ අධීක්ෂණය
- ප්‍රති අපනයනය
- විනාශ කිරීම

පශ්චාත් ප්‍රවේශ නිරෝධායනය

- ක්ෂේත්‍ර පරීක්ෂණ
- කෘෂිකර්ම දෙපාර්තමේන්තු පරිශ්‍රයේ පැළ නඩත්තු කිරීම
- වාර්තා / නිර්දේශ
- අවසන් වාර්තා ඉදිරිපත් කිරීම

ආනයන හා අපනයන පැළ සහ පැළෑටි නිෂ්පාදන වලින් සොයා ගත් පළිබෝධ තුරන් කිරීම සඳහා ප්‍රතිකර්ම

- ජාතික පැළෑටි නිරෝධායන සේවයේදී ධූමකරණය කිරීම
- ජාතික පැළෑටි නිරෝධායන සේවයෙන් පිටතදී සිදු කරන ධූමකරණ අධීක්ෂණය කිරීම
- ධූමකරණ වාර්තා නිකුත් කිරීම

විමර්ශන එකතුන් නඩත්තු කිරීම

- වල් විශේෂ සහ වල් බීජ විශේෂ
- කෘමීන්
- මළ නියැදි
- සජීවී ප්ලප් පැළෑටි

පාර්ශ්වකරුවන් සඳහා පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

- පුහුණු කිරීම්
- උපාධි අපේක්ෂක / ඩිප්ලෝමා සිසුන් අධීක්ෂණය
- දැනුවත් කිරීමේ වැඩසටහන්
- වැඩමුළු
- සම්මන්ත්‍රණ

නිරෝධායනය ආශ්‍රිත පර්යේෂණ

- පළිබෝධ විමර්ශනය
- පළිබෝධ අවදානම් විශ්ලේෂණය
- වල් පැළ පාලන පර්යේෂණ
- ව්‍යාධිවේද පර්යේෂණ
- කීට විද්‍යා පර්යේෂණ
- නිරෝධායන ප්‍රතිකර්ම පර්යේෂණ

පැළ තවාන් ලියාපදිංචි කිරීම

- තෝරා ගන්නා ලද රටවල් වලට පැළ අපනයනය කිරීම
- ක්ෂේත්‍ර පරීක්ෂණ
- විගණනය
- වාර්තා ඉදිරිපත් කිරීම

ප්‍රතිකර්ම ලබා දෙන්නන් සතු පහසුකම් ඇගයීම

- වැඩබිම් පරීක්ෂා කිරීම
- විගණනය
- උද්භිද ස්වස්ථතා සහතික නිකුත් කිරීම

කාර්ය මණ්ඩල ලැයිස්තුව

ජාතික පැළැටි නිරෝධායන සේවය කටුනායක

තනතුර	සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිළධාරි	08
පරිපාලන නිළධාරි(රාජකාරි ආවරණය කිරීම)	01
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි	05
වැඩසටහන් සහකාර	06
පර්යේෂණ සහකාර	05
කෘෂිකර්ම උපදේශක	12
කළමනාකරණ සහකාර	09
රියදුරු	04
විදුලි ශිල්පි	01
කා.කා.ස	03
මුරකරු	02
කම්කරු(විශේෂ)	01
කම්කරු	05
කම්කරු(කොන්ත්‍රාත්)	04
එකතුව	**67**

පැළැටි නිරෝධායන සේවය, වරාය

තනතුර	සංඛ්‍යාව
ස්ථාන භාර නිළධාරි (කෘෂිකර්ම නිළධාරි)	01
කෘෂිකර්ම නිළධාරි	01
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි	03
පර්යේෂණ සහකාර	06
කෘෂිකර්ම උපදේශක	12
කළමනාකරණ සහකාර	02
කම්කරු	01
එකතුව	**26**

පැළැටි නිරෝධායන සේවය, ගුවන්තොටුපළ

තනතුර	සංඛ්‍යාව
ස්ථාන භාර නිළධාරි (කෘෂිකර්ම නිළධාරි)	01
කෘෂිකර්ම නිළධාරි	01
පර්යේෂණ සහකාර	03
කෘෂිකර්ම උපදේශක	17
කළමනාකරණ සහකාර	01
කම්කරු	02
එකතුව	**25**

3.1.4 පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය - පේරාදෙණිය

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයට පැවරී තිබෙන වගකීම වන්නේ 1980 අංක 33 දරන පළිබෝධ පාලන පනතේ ව්‍යවස්ථාපිත විධිවිධාන ක්‍රියාත්මක කිරීමයි. පළිබෝධනාශක ආනයනයේ සිට පළිබෝධනාශක පිළියම් යෙදූ බෝග අළෙවි කිරීම දක්වා මෙරට පළිබෝධනාශක ජීවන චක්‍ර කළමනාකරණ ක්‍රියාදාමයේ ප්‍රධානතම අංගය පළිබෝධනාශක ලියාපදිංචි කිරීමයි. ආරක්ෂාව, සාර්ථකත්වය සහ පාරිසරික කරුණු වලට අදාළව පිළිගත හැකි බව සහතික කරමින් ජාත්‍යන්තර මාර්ගෝපදේශ සහ පරීක්ෂණ වලට අදාළව තිබිය යුතු තත්ත්වයන්ට අනුකූලව නව ලියාපදිංචි කිරීම් 69ක් සහ නැවත ලියාපදිංචි කිරීම් 182 ක් වසර තුළ නිම කෙරිණි. ලියාපදිංචි කිරීමේ හා නැවත ලියාපදිංචි කිරීමේ ගාස්තු හරහා රු. මිලියන 3.8 ක මුදලක් ආදායම් වශයෙන් එක් රැස් කර ගෙන ඇත. ආනයන අනුමැති ලබා දෙනුයේ මෙරටට ප්‍රවේශ වන පළිබෝධනාශක නිපැයුම් සඳහා යම් යම් තත්ත්ව සහතික කිරීම් අවශ්‍යතා සපුරාලීම මතය. යථෝක්ත කාල පරිච්ඡේදය තුළ පටිපාටිමය පාලන ක්‍රියාමාර්ග වලට අමතරව අළෙවියට පෙර ආනයනය කරන ලද තොග 376ක් ආවරණය කරමින් සම්මිශ්‍රණ විශ්ලේෂණ 1,534 ක් සිදු කර ඇත. බාහිර පාර්ශ්වයන් සමඟ කෙරෙන සියළුම කටයුතු ඵලදායී පළිබෝධනාශක නියාමන අවශ්‍යතාව සපුරාලීම පිණිස ඒකාබද්ධ කරන ලද අතර ඒ යටතේ අළෙවිකරු පුහුණු 32ක් සහ නිළධාරී පුහුණු 07 ක් පවත්වන ලදී. ක්ෂේත්‍රය තුළ වඩා හොඳ පළිබෝධ නාශක කළමනාකරණයක් සහතික කිරීම සඳහා තොරතුරු කළමනාකරණ හා නුවමාරු විකල්පයක් වශයෙන් පළිබෝධනාශක ලේබල් (354) සහ ප්‍රචාරණ ද්‍රව්‍ය (193) අනුමත කිරීම යන ක්‍රියාමාර්ග කාර්යක්ෂමව යොදා ගැනිණි.

ආයවැය

වගු අංක 3.1.4.1. වාර්ෂික අයවැය - 2011 (රු:)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් ප්‍රතිශතය%	ආදායම
මූලධන	3,830,000	3,368,490	88	-
පුනරාවර්තන	3,303,000	2,760,579	84	-
ලියාපදිංචි කිරීමේ හා නැවත ලියාපදිංචි කිරීමේ ගාස්තු	-	-		3,121,150
අළෙවිකරු සහතික කිරීමේ ගාස්තු	-	-		740,8500
එකතුව	**7,133,000**	**6,129.029**	**86**	**3,862,000**

ප්‍රගතිය

පළිබෝධනාශක ලියාපදිංචිය

පළිබෝධනාශක ලියාපදිංචි කිරීම මගින් මෙම වසරේදී එක්රැස් කර ගත් ආදායම රු: 3,121,150 ක් විය. පළිබෝධනාශක තාක්ෂණික උපදේශක කමිටුව යටතේ පළිබෝධනාශක ආංශික උප කමිටු(උදා: කෘෂිරසායන උප කමිටුව, ගෘහාශ්‍රිත සහ මහජන සෞඛ්‍ය උප කමිටුව හා කර්මාන්ත උප කමිටුව) පත් කිරීමෙන් ලියාපදිංචි කිරීමේ අංශ ක්‍රමවත් කිරීම පිණිස මෙන්ම තීරණ ගැනීමේදී පුළුල් සහභාගිත්වයක් ලබා ගැනීම පිණිස අදාළ අමාත්‍යංශ හා ආයතන වලින් සෘජුවම හෝ වක්‍රාකාරව පළිබෝධනාශක හා සම්බන්ධව

වැඩකටයුතු කරන ප්‍රවීනයන්ගේ උපදේශකත්වය ලබා ගනිමින් සිටී.

පළිබෝධනාශක නැවත ලියාපදිංචි කිරීම

නිෂ්පාදනයක ලියාපදිංචිය වලංගු වන්නේ වසර තුනක් ගත වන තුරු පමණි. ඉන්පසු නව ප්‍රමිති, නව සොයා ගැනීම් සහ සුරක්ෂිතතාව පිළිබඳ කරුණු මත පදනම්ව නිෂ්පාදනයෙහි තත්ත්වය යළි තක්සේරු කෙරේ. වසර තුළ මෙම කාණ්ඩය යටතේ අයදුම්පතු 182 ක් පිරිසකසන ලද අතර උපයා ගන්නා ලද මුළු ආදායම රු: 910,000 ක් විය. පළිබෝධනාශක නැවත ලියාපදිංචි කිරීම සඳහා නව නීතියක් ලෙස, සුරක්ෂිතතාව පිළිබඳ නව අවශ්‍යතාවන් සපුරාලීම සඳහා 2000 වසරට පෙර ලියාපදිංචි කළ සියළුම පළිබෝධනාශක නිෂ්පාදන අළුතින් ලියාපදිංචි කිරීමට ලේඛන ඉදිරිපත් කළ යුතුය.

පළිබෝධනාශක නිපැයුම් ඇගයීම් සහ නව පළිබෝධනාශක ලියාපදිංචි කිරීම

දේශීය අත්හදා බැලීම් සඳහා යොදා ගැනීම පිණිස පළිබෝධනාශක නිෂ්පාදන පූර්ව ඇගයීම් ක්‍රියාවලියට ලක් කිරීමේදී සුරක්ෂිත සහ පරිසරයට හිතකර පළිබෝධනාශක හඳුනාගෙන ප්‍රවර්ධනය කෙරිණි. එය වෙළඳපලෙහි ඇති අනතුරුදායක නිෂ්පාදන ඉවත් කිරීමටද උපකාරවේ. ලේඛනාදිය කාර්‍යක්ෂමව හා කඩිනම්ව ඇගයීම පිණිස පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ ලේඛනාදිය ඇගයීමේදී සම්මන්ත්‍රණ ආකාරයේ ප්‍රවේශයක් හඳුන්වා දීමට පියවර ගන්නා ලදි. මෙම ප්‍රවේශයෙහි එක් වාසියක් ලෙස දක්වන ලද්දේ ඵලදායීව පළිබෝධනාශක ඇගයීම සඳහා විවිධ විෂය ක්ෂේත්‍ර අතර දැනුම හුවමාරු කර ගැනීමට හැකි වීමයි. වසර තුළ සම්මිශ්‍රණ 69 කට අධික සංඛ්‍යාවක් ඇගයීමට ලක් කර ඉන් පහත දැක්වෙන සම්මිශ්‍රණ 3 ක් ලියාපදිංචි කරන ලදි.

1. පෙනොක්සියුලම් 24%
2. මෙටාමිපො
3. ෆ්ලූසෙටොසල්ෆියුරොන්

ආනයන අනුමැති

මෙම ක්‍රියාවලිය මගින් අවශ්‍ය තත්ත්ව ප්‍රමිති වලට අනුකූලව නිවැරදි සැපයුම් මූලාශයන්ගෙන් නිෂ්පාදන ආනයනය කිරීම සහතික කර අතිරික්ත ප්‍රමාණයන්ගෙන් ආනයනය කිරීම වළක්වයි. වසර තුළ ආනයන අනුමැති නිකුත් කිරීමට පෙර, ආනයනකරුවන් විසින් ඉදිරිපත් කරන ලද තත්ත්ව සහතික 740 ක් මෙම කරුණ අරභයා ඇගයීමට ලක් කෙරිණි.

ලේබල් හා ප්‍රචාරක ද්‍රව්‍ය ආදිය පරීක්ෂා කර බැලීම

ලේබල අනුමත කිරීමේ ක්‍රියාපටිපාටිය මගින් අවසන් උපයෝජක වෙත නිසි තොරතුරු ලබාදීමට හැකියාව ලැබේ. මෙම ක්‍රියාවලියට උපකාරී වීම සඳහා ලේබල් වල අඩංගු කරුණු වල තත්ත්වය වැඩි දියුණු කිරීමට සියළුම කාණ්ඩවල කෘෂිකාර්මික පළිබෝධනාශක සඳහා ලේබල් ආකෘති සකස් කෙරිණි. වසර තුළ ලේබල් 350 කට හා ප්‍රචාරක ද්‍රව්‍ය 190 කට අධික සංඛ්‍යාවක් පරීක්ෂා කර බලන ලදි. පළිබෝධනාශක නිර්දේශ මෑතකදී උත්ශ්‍රේණිගත කිරීම හේතුවෙන් වසර තුළ ලේබල් අනුමත කිරීමේදී සිදු කරන නිවැරදි කිරීමේ ප්‍රයත්න සංඛ්‍යාව දෙගුණ විය. ඒ අනුව, පළිබෝධනාශක ලේබල් වල "මාත්‍රා කොටසට" පරිශීලක කෘමි උපදෙස් වඩාත් වැඩියෙන් හඳුන්වා දෙන ලදී,

ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක කිරීම

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය, ක්‍රියාත්මක වෙමින් පවතින වැඩසටහනක් වශයෙන් පළිබෝධනාශක අලෙවිකරුවන් සහතික කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අබණ්ඩවම පළාත්, අන්තර් පළාත් හා මහවැලි අධිකාරියේ ක්ෂේත්‍ර කාර්‍ය්‍ය මණ්ඩලය සමග සහයෝගයෙන් කටයුතු කරන ලදි. පවත්නා නීතිය යටතේ අලෙවි සැල් සහතික කිරීම සම්බන්ධයෙන් පළිබෝධනාශක අලෙවිකරුවන් සඳහා එක් දින පුහුණු පන්ති 32 ක් පවත්වන ලදි. පළිබෝධනාශක අලෙවිකරු සහතික විශේෂ හේතු මත අවලංගු නොකළේ නම් වසරක කාලයක් සඳහා වලංගුවේ . සහතිකයක් නිකුත් කිරීම සඳහා නියාමන අවශ්‍යතාවන්ගේ කොටසක් ලෙස ගාස්තුවක් අය කරන අතර මේ යටතේ උපයා ගත් මුළු ආදායම රු: 740,850 කි.

පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

අලෙවිකරුවන් (32) හා නිළධාරීන් (07) සඳහා වසර තුළ පුහුණු පන්ති කීපයක් පවත්වන ලද අතර 2011 වසරේදී පුහුණු සහතික 1470 ක් හා අලෙවිකරු සහතික 1347 ක් නිකුත් කෙරිණි.

විද්‍යාගාර කටයුතු

පළිබෝධනාශක විශ්ලේෂණ කටයුතු

පළිබෝධනාශක සඵලත්වය හා එමගින් පරිසරයට හා මානව සෞඛ්‍යයට ඇති කරන බලපෑම තීරණය කරන ප්‍රධානතම සාධකය වනුයේ පළිබෝධනාශක සතු ගුණාත්මක තත්ත්වයයි. සියළුම ලියාපදිංචි

පළිබෝධනාශක ආහාර හා කෘෂිකර්ම සංවිධානය හා ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි ජාත්‍යන්තර නියෝජිත ආයතන මගින් ප්‍රකාශයට පත් කර ඇති භෞත - රසායනික සම්මත වලට අනුගත විය යුතුය. ඒ අනුව දේශීය පරීක්ෂණ මගින් තහවුරු වුවහොත් එක් එක් තොගය අලෙවිය සඳහා නිදහස් කෙරේ. වසර 2011 දී කාණ්ඩ 376 ක සම්මන්ත්‍රණ විශ්ලේෂණ 1534 ක් පවත්වන ලද අතර එමගින් කි.ග්‍රෑ. 859,455.0 ක් හා ලීටර් 5,275,914.8 ක එකතුවක් නිදහස් කෙරිණි.

විශේෂ කටයුතු

පළිබෝධනාශක පාලන පනතේ 26වන වගන්තිය යටතේ ඇති රෙගුලාසි

රට තුළ පළිබෝධනාශක භාවිත කිරීමේදී ආරක්ෂිතභාවය පිළිබඳව සහතික වීම සහ සාර්ථකව භාවිතා කිරීමේ සමාජ වගකීම හඳුනා ගනිමින් අතිගරු ජනාධිපතිතුමා විසින්

"මහින්ද චින්තන ඉදිරි දැක්ම" (පිටුව 50) තුළින් දිවයිනේ සෑම පළිබෝධනාශක අලෙවිසැලක් සඳහාම නිසි පුහුණුව ලද අලෙවි හා තාක්ෂණ සහායකයෙකු යෙදවීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත. ඒ අනුව 2011 ජූලි 23 සිට බලපැවැත්වෙන පරිදි පළිබෝධනාශක අලෙවිසැල් සඳහා කෘෂි රසායන අලෙවි හා තාක්ෂණ සහායකයින් බඳවා ගැනීම පිළිබඳව 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත යටතේ නව රෙගුලාසි පනවා ඇත. (2011 ජූලි 23 වන දින අංක 1716/23 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය.)

ජාත්‍යන්තර සම්මත සඳහා , ජාතික ආධුනිකත්ව හා කර්මාන්ත පුහුණු ආයතනයේ අධීක්ෂණය යටතේ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පුහුණු පාඨමාලාවක් සංවිධානය කරන ලදි. මේ හා සමගාමීව හය මාසික පුහුණු වැඩසටහන සාර්ථකව නිම කරන අභ්‍යාසලාභීන් සඳහා ජාතික රැකියා යෝග්‍යතා ක්‍රමයේ IV වන මට්ටමට සමාන ජාත්‍යන්තරව පිළිගත් සහතිකයක් පිරිනැමීමට අදහස් කෙරේ. පළිබෝධනාශක සම්බන්ධයෙන් විශේෂයෙන් අවධාරණය කරමින් ආරක්ෂිතව හා ඵලදායිව කෘෂිරසායන භාවිතාකිරීම පිළිබඳ අදාළ සියළු ප්‍රවිණයන් විමසා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශය විසින් පුහුණු කරුවන් පුහුණු කිරීම සඳහා වූ පුහුණු මොඩියුල 11 ක් සකස් කර ඇත.

වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු ලේකම්වරු සමඟ මධ්‍යම, සබරගමුව, නැගෙනහිර , උතුරු නැගෙනහිර හා උතුරු මැද පළාත් වලදී මූලික සාකච්ඡාවත්වන ලදි.

පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශක කමිටුවට නියෝජිතයින් පත් කිරීම

ගරු කෘෂිකර්ම අමාත්‍යතුමන් විසින් ඉහත කමිටුවේ වැඩකටයුතු විධිමත් කිරීම සඳහා 2011.08.25 වන දින අංක 1720/34 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශක කමිටුවට නව සාමාජිකයින් 5 දෙනෙකු පත් කරන ලදී.ඉහත කමිටුවේ ප්‍රධාන කාර්‍යය වන්නේ පළිබෝධනාශක විධිමත් කිරීම සම්බන්ධයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයාට උපදෙස් ලබා දීමයි. පළිබෝධනාශක හා සම්බන්ධ කටයුතු වල නිරතව සිටින විවිධ රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන වලින් නිල ලත් සාමාජිකයන් දස දෙනෙකු සහිතව මුළු සාමාජිකයන් 15 දෙනෙකු මෙම කමිටුවේ සේවය කරයි.

රට තුළ පළිබෝධනාශක ආනයනය, බෙදා හැරීම හා අලෙවි කිරීම පිණිස තනි පුද්ගල/සංස්ථාපිත ආයතන පිළිගැනීම සඳහා වන මාර්ගෝපදේශ

ශ්‍රී ලංකාව තුළ පළිබෝධනාශක ලියාපදිංචි කිරීම සඳහා යෝජනා කෙරෙන නව සංස්ථා පිළිගැනීම සඳහා අනිවාර්‍ය වන පූර්ව අවශ්‍යතා පිළිබඳව නව මාර්ගෝපදේශ සකස් කරන ලදි. මෙම යෝජනා ක්‍රමය යටතේ පරීක්ෂා කර බලා ලේඛන ගත කිරීමට ආයතනය පිළිබඳ සම්පූර්ණ විස්තරයක් මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශ්ව වලින් ඉදිරිපත් කළ යුතුවෙයි. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් වරයා විසින් පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශක කමිටුව විමසා අයදුම්කරු පිළිගැනීම සම්බන්ධයෙන් තීරණය කරනු ඇත. මෙම මාර්ගෝපදේශ, පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශක කමිටුව විසින් අනුමත කර ක්ෂණිකව ක්‍රියාවට නංවයි.

කෘෂි රසායනික උප කමිටු ක්‍රියාත්මක කිරීම

කෘෂි පළිබෝධනාශක, ගෘහාශ්‍රිත පළිබෝධනාශක හා කර්මාන්ත ආශ්‍රිත පළිබෝධනාශක වල කාණ්ඩ 3 ක පළිබෝධනාශක ලියාපදිංචි කිරීම විධිමත් කිරීම පිණිස පළිබෝධනාශක පාලන පනතේ විධිවිධාන යටතේ උප කමිටු 3ක් පත් කරන ලදී.

වෙළඳනාම සඳහා නව ප්‍රතිපත්තිය

වෙළඳනාම බහුල වීම හා වෙළඳ පළිබෝධනාශක සම්බන්ධයෙන් ගොවීන් අතර පැටලිලි සහගත තත්ත්ව ඇතිවීම සැලකිල්ලට ගනිමින් සියළු කෘෂි

පළිබෝධනාශක වෙළඳනාම, සමාගම් නාමය හා පොදු නාමය බවට පත් කිරීමට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ලදි. පළිබෝධ නාශක තේරීමේදී ගොවීන් විසින් නිවැරදි තීරණ ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රොටර්ඩෑම් සම්මුතිය යටතේ ඇලක්ලෝර් තහනම් කිරීම හා අනෙකුත් පළිබෝධනාශක ක්‍රමවත් කිරීමේ තීරණය.

රොටර්ඩෑම් සම්මුතියේ තුන්වන ඇමිණුමෙහි ලේඛනගත පළිබෝධනාශකයක් වන ඇලක්ලෝර් වල් පැළෑටි නාශකය තහනම් කිරීමට පළිබෝධ නාශක තාක්ෂණික උපදේශක කමිටුව විසින් තීරණය ගන්නා ලදී.

දැනටමත් තහනම් කර ඇති හෝ රට තුළ භාවිතයෙහි නොමැති අනෙකුත් පළිබෝධනාශක කීපයක් සඳහා "අනුමැතිය රහිතයි" යන තීරණය ලැබිණි. ඒවා නම් DNOC ලවණ, එතිලින් ඔක්සයිඩ් , එතිලින් ඩයික්ලෝරයිඩ්, මොනොක්‍රොටොෆොස්, පැරතියන්, ට්‍රයිබියුටයිල් - ටින් සංයෝග, ඇල්ඩිකාර්බ්, එන්ඩොසල්ෆාන් , බෙනොමිල්(7% න් ඉහළ) , කාබොෆියුරාන්(10% න් ඉහළ) තිරාම්(15% ඉහළ).

පළිබෝධනාශක වල ආසනික් හා විෂ සහිත බැර ලෝහ

පළිබෝධනාශක සම්මිශ්‍රණ වලට ආසනික් මිශ්‍ර වීම පිළිබඳව පාරිසරික සංවිධාන වලින් මෑතකදී මතු වූ ව්‍යාකූල තත්ත්වයට ප්‍රතිචාර වශයෙන් ආනයනික බඩු තොග වල තාක්ෂණික දූෂක පිළිබඳ සොයා බැලීමට දැඩි නීති ක්‍රියාත්මක කෙරිණි. මෙම කටයුත්තේ දී පළිබෝධනාශක වල රසදිය, ආසනික්, ක්‍රෝමියම්, කැඩ්මියම්, ඊයම්, නිකල්, කොබෝල්ට්, ටින් සහ තැලියම් වැනි බැර ලෝහ 09 ක් හා සයනයිඩ් තිබේ දැයි පරීක්ෂා කර බලා ප්‍රමිතිගත කරන ලදි.

අතිශය අන්තරාදායක පළිබෝධනාශක සම්මිශ්‍රණ නිරීක්ෂණය ඇරඹීම

2011 වසරේ සැප්තැම්බර් මාසයේදී , උපායමාගී සාකච්ඡා කිරීමට හා පිනීවාහි රොටර්ඩෑම් සම්මේලන ලේකම් කාර්යාලය සමග සහයෝගීතාවයෙන් රෝහල් වල හා ගොවි බිම් වල අධ්‍යයන වැඩසටහනක් සාර්ථකව සැලසුම් කිරීම පිණිස සමාරම්භක වැඩමුළුවක් සංවිධානය කරන ලදී. නියාමක බලධරයකු වශයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් අතිශය අන්තරායකර පළිබෝධනාශක සම්මිශ්‍රණ සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී අනුදැනුමකින් තොරව සිදුවන විෂවීම් වල විස්තරාත්මක වාර්තා හා සායනික අධ්‍යයන වලින් ලැබෙන තහවුරු කිරීමේ දත්ත මගින් මඟ පෙන්වීමක් ලබා ගනු ඇතැයි අදහස් කෙරේ.

දකුණු ආසියානු සායනික ධූලකවේද පර්යේෂණ සහයෝගීතාව සහ රොටර්ඩෑම් සම්මුතිය සමඟ එක්ව අනුරාධපුරය , කුරුණෑගල , හම්බන්තොට සහ නුවරඑළිය දිස්ත්‍රික්ක වල ගොවි ප්‍රජාව සහ රෝගීන් අතර නියමු අධ්‍යයනයක් සිදු කිරීම සඳහා සැලසුම් කෙරෙමින් පවති.

හිස් පළිබෝධනාශක බහාලුම් කළමණාකරණය කිරීම

"ස්භාවික පරිසරයට සිදු කරන ලද හානියට වගකිව යුතු පාර්ශ්වය විසින් ගෙවීමේ" පදනම මත හිස් පළිබෝධනාශක බහාලුම් එක්රැස් කිරීමේ වැඩසටහනක් ආරම්භ කිරීම සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය පරිසර අමාත්‍යංශය සමඟ එක්ව කටයුතු කරන ලදී. මෙම වැඩසටහන ක්ෂේත්‍ර මට්ටමින් හිස් පළිබෝධනාශක බහාලුම් මගින් සෞඛ්‍යයට සහ පරිසරයට ඇතිවන බලපෑම අවම කිරීම සඳහා ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමට බේසල් සම්මුතිය(Basel Convention) යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘතියේ කොටසකි.

මේ වන විට ක්‍රමෝපායන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ශ්වකරුවන් සමඟ රැස්වීම් පහක් පවත්වා ඇති අතර

අ) බහාලුම් අපහරණය කිරීම සඳහා විසඳුමක

අවශ්‍යතාවය

ආ) වගකිව යුතු සියළුම පාර්ශ්වයන්ගේ සාමාජිය

වගකීම සහ

ඇ) විදුරු සහ ප්ලාස්ටික් බහාලුම් මුළුමනින්ම විනාශ කිරීම සහ/ හෝ ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා තාක්ෂණික ශක්‍යතාව පිළිබඳව සොයා බැලීම පිළිබඳව සියල්ලන්ගේම එකඟතාවය පළ කෙරිණි. ගොවීන්/පළිබෝධනාශක අලෙවිකරුවන්/

වෙළඳුන් සහ ජනතාව පිළිබඳව වෙන් වෙන් වශයෙන් සමීක්ෂණ සිදු කෙරිණි.

කර්මාන්ත මට්ටමින් විශාල වශයෙන් එක්රැස් වන පළිබෝධනාශක බහාලුම්

හිස් පළිබෝධනාශක බහාලුම් පළිබෝධනාශක කර්මාන්ත භූමියෙහි එක්රැස් වීම බරපතල ගැටළුවක් බවට පත්ව ඇති අතර මෙමගින් විවිධ පාරිසරික සහ සෞඛ්‍ය ගැටළු මතුවිය හැකි සේම අනිසි ලෙස භාවිතයට ගැනීමටද බොහෝ දුරට සිදුවිය හැක්කකි. නියමිත අවසන් නිෂ්පාදනය

අනුව බරපතල සෞඛ්‍යමය ප්‍රතිවිපාක ඇති කිරීමට මෙම තත්ත්වය මුල් වනු ඇති බැවින් හිස් පළිබෝධනාශක බහාලුම් අපහරණය කිරීම සඳහා දැනට පවතින එකම විකල්පය වනුයේ ඉහළ උෂ්ණත්වයන් තුළදී දවාලීමයි.

වර්තමානයේ , පූර්ව ආරක්ෂක ක්‍රියාමාර්ගයක් ලෙස පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය හිස් බහාලුම් අපහරණය කිරීම සඳහා කළමනාකරණ ක්‍රමෝපායක් ක්‍රියාත්මක කරනු ලබයි . ඒ අනුව සකස් නොකළ යකඩ නිපදවීම සඳහා තනුකකාරක ලෙස ලෝහ බහාලුම් ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ රජයේ හෝ නගර සභා/ පලාත් සභා අනුග්‍රහය ලද කොම්පෝස්ට් සහ / හෝ කසල එක්රැස් කිරීමේ ව්‍යාපෘති සඳහා ප්ලාස්ටික් බහාලුම් නැවත භාවිතා කිරීම සඳහා ලබා දීම සිදු කරනු ලැබේ. එමෙන්ම සෞඛ්‍ය සහ පරිසරය සුරක්ෂිත කිරීම සඳහා අදාළ ගැටළු වලට විසඳුම් සෙවීමට පවත්නා සියළුම විකල්පයන් පිළිබඳව සොයා බැලීම කෙරෙහි අඛන්ඩ අවධානය යොමු කර ඇත.

වගු අංක 3.1.4. 2. 2011 වසරේදී සිදු කරන ලද කායීයන්හි ප්‍රගතිය

උප කායීය	වාර්ෂික භෞතික ඉලක්කය	කායීඵලය	%
අයදුම් පත්‍ර පරීක්ෂා බැලීමෙන් පසු සහ අංක වෙන් කර දීමෙන් පසු ලියාපදිංචිය සඳහා අයදුම් පත්‍ර පිළිගැනීම	150	288	119
මුල් ලියාපදිංචි අයදුම්පත් ඇගයීම	60	69	112
නෙවන පාර්ශ්වයේ ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ඇගයීම	140	73	67
නැවත ලියාපදිංචි කිරීම් අයදුම්පත් ඇගයීම	140	182	101
දේශීය අත්හදා බැලීම් සඳහා දත්ත ඇගයීම	30	39	173
ආනයන අනුමැති නිකුත් කිරීම	1300	1231	136
පළිබෝධනාශක තත්ත්ව සහතික ඇගයීම	1300	740	91
අනුමැතිය සඳහා ලේබල් පරීක්ෂා කර බැලීම	700	354	75
අනුමැතිය සඳහා ප්‍රචාරණ ද්‍රව්‍ය පරීක්ෂා කර බැලීම	225	193	86
කම්හල් පරීක්ෂා කිරීම	12	08	67
අනුමත යලි ඇසුරුම් කිරීම් සහ ගබඩා පරීක්ෂා කිරීම	02	13	650
ධූමකරණ පරිශ්‍ර සහ ගෘහස්ථ පළිබෝධ පාලන කටයුතු වල යෙදෙන්නන් පරීක්ෂා කිරීම සහ සහතික කිරීම	12	14	117
වගකීව යුතු පදනමක් මත නිරෝධායන සහ පූර්ව නැවිගත කිරීම් ප්‍රතිකර්ම සඳහා එතිලීන් බ්‍රෝමයිඩ් ලබා ගැනීමේ අනුමැතිය ලබා දීම.	50	58	116
සීමා කරන ලද පළිබෝධනාශක මිළදී ගැනීම සඳහා බලයලත් ආයතන වලට අනුමැතිය ලබා දීම	100	35	35
ඉල්ලුම් පත්‍ර පිළිගැනීම සඳහා යෝග්‍යතාව පිළිබඳ පරීක්ෂණ වාර්තා ලබා ගැනීම පිණිස වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ කාර්මික තාක්ෂණික ආයතනය වෙත නියැදි යැවීම	25	25	100
තොග පදනම මත සිදු කරන නියැදි වල තත්ත්ව විශ්ලේෂණයට අනුව නිපැයුම් ඇසුරුම් කිරීම් සඳහා අනුමැතිය ලබා දීම	700	376	54
අලෙවි සැල් පරීක්ෂා කිරීම	40	85	213
පුවත් ලිපිය ප්‍රකාශයට පත් කිරීම	04	00	00
නිළධාරි පුහුණු පන්ති	05	07	140
පාසැල් සිසුන් සඳහා සම්මන්ත්‍රණ	08	01	13
අලෙවිකරු පුහුණු පන්ති	26	32	123

අලෙවිකරු පුහුණු සහතික නිකුත් කිරීම	1050	1470	139
අලෙවිකරු සහතික නිකුත් කිරීම	2000	1347	67
ක්ෂේත්‍ර පැමිණිලි	10	20	200
නෛතික ක්‍රියාමාර්ග	04	00	00
තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම්	06	03	50
සම්මිශ්‍රණ විශ්ලේෂණය	700	1534	219
අවශේෂ විශ්ලේෂණය	210	00	00
තත්ත්වය සහතික කිරීම සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් නියැදි එක්රැස් කිරීම	12	03	25
කල් ඉකුත් වූ තොග අපහරණය	04	01	25
දෙපාර්තමේන්තුව තුළ හෝ දෙපාර්තමේන්තු අතර ආයතනික රැස්වීම් සඳහා තාක්ෂණික විශේෂඥයින්/සාමාජිකයින්/සම්පත් දායකයින් ලෙස සේවය කිරීම හෝ සහභාගි වීම	31	35	113
අනෙකුත් ආයතන වලින් ලැබෙන ආරාධනා වලට අනුව සම්පත් දායකයින් ලෙස සහභාගී වීම	10	21	210
ආනයන සංඛ්‍යා ලේඛන එක්රැස් කිරීම, සම්පාදනය කිරීම සහ බෙදා හැරීම (මහ බැංකුව, විශ්ව විද්‍යාල , පර්යේෂකයින්. රජයේ ආයතන ආදිය.)	40	16	40
ක්ෂේත්‍ර සමීක්ෂණ වැනි අනෙකුත් කටයුතු	04	00	00

2012 වසර සඳහා සැලැස්ම

තාක්ෂණික කාර්‍ය සැලැස්ම - 2012

වැඩසටහන: පළිබෝධනාශක ලියාපදිංචි කිරීම

අංකය	අයිතමය/ කාර්‍යය	වාර්ෂික භෞතික ඉලක්කය	කාර්තුව සඳහා සමුච්චිත භෞතික ඉලක්කය				අපේක්ෂිත ප්‍රතිලාභ
			1st	2nd	3rd	4th	
1.	අයදුම් පත්‍ර පරීක්ෂා කර බැලීමෙන් පසු සහ අංක වෙන්කර දීමෙන් පසු ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර පිළිගැනීම	30	05	15	25	30	නිෂ්පාදන මගින් හානිකර බලපෑම් ඇති නොවන්නේදැයි සොයා බලා කෘෂිකාර්මික යෙදවුම් පිරිවැය අවම කිරීමට තීරණයකට එළඹීම
2.	ලියාපදිංචිය සඳහා ලද මුල් අයදුම්පත්‍ර ඇගයීම	30	05	15	25	30	
3.	නෙවන පාර්ශවයේ ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍ර ඇගයීම්	140	35	70	105	140	
4.	නැවත ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍ර	140	35	70	105	140	

	ඇගයීම						
5.	දේශීය අත්හදා බැලීම් සඳහා දත්ත ඇගයීම	30	05	15	25	30	මිනිසාට සහ පරිසරයට හිතකර සංයෝග මුදා හැරීම
6.	ආනයන අනුමැති නිකුත් කිරීම	1400	300	550	1000	1400	නිෂ්පාදන ආනයනය කිරීම නිවැරදි සැපයුම් ප්‍රභවයෙන් සිදු කෙරෙන බවට තහවුරු කිරීම සහ අනවශ්‍ය ප්‍රමාණයන්ගෙන් ආනයන කිරීම වැලැක්වීම.
7.	පළිබෝධනාශක තත්ත්ව සහතික ඇගයීම	1400	300	550	1000	1400	හොඳ තත්ත්වයේ පළිබෝධනාශක ආනයනය කිරීම සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ පිරිවිතර වලට අනුකූල බැව් සහතික කිරීම
8.	අනුමැතිය සඳහා ලේබල් පරීක්ෂා කර බැලීම	750	100	300	500	750	හිතකර භාවිතය සහ ආරක්ෂාව පිළිබඳව නිවැරදි පණිවිඩය ගොවීන් සහ අදාළ අනෙකුත් අධිකාර වලට ලබා දීම
9.	අනුමැතිය සඳහා ප්‍රචාරණ ද්‍රව්‍ය පරීක්ෂා කර බැලීම	250	50	100	200	250	
10.	කම්හල් පරීක්ෂා කිරීම	12	3	6	9	12	සත්‍ය වශයෙන්ම කම්හල් ප්‍රමිතීන් අනුගමනය කරන්නේදැයි සහතික කිරීම
11.	අනුමත යලි ඇසුරුම් කිරීමේ පහසුකම් සහ ගබඩා පරීක්ෂා කර බැලීම	2	1	2	2	2	ප්‍රමිතීන්ට අනුව ඇසුරුම් කිරීමේ කාර්‍යීයන් ඉටු කරන්නේදැයි පරීක්ෂා කර බැලීම සහ එමගින් නිෂ්පාදනයේ ගුණාත්මය පවත්වා ගැනීම.
12.	ධූමකරණ පරිශ්‍ර සහ ගෘහස්ථ පළිබෝධ පාලන කටයුතු වල	30	5	10	20	30	ධූමකරණ කටයුතු විධිමත් කිරීම සහ

	යෙදෙන්නන් පරීක්ෂා කිරීම සහ සහතික කිරීම						එමගින් අපනයන ප්‍රතික්ෂේප වීම් වැළැක්වීම
13.	පළිබෝධ පාලන සේවා සහතික කිරීම	30	5	10	20	30	මෙම කර්මාණ්තයට නුපුහුණු පුද්ගලයින්ගේ පැමිණීම වැළැක්වීම සඳහා පළිබෝධ පාලන කටයුතු විධිමත් කිරීම.
14.	වගකිව යුතු පදනමක් මත නිරෝධායන සහ පූර්ව නැව්ගත කිරීම් ප්‍රතිකර්ම සඳහා CH3Br ලබා ගැනීමේ අනුමැතිය ලබා දීම	60	15	30	45	60	
15.	අලෙවිසැල් පරීක්ෂා කිරීම	140	30	75	110	140	නිෂ්පාදනය බාල කිරීම වැලැක්වීම සහ ව්‍යාප්ත නිෂ්පාදන වැලැක්වීම
16.	ඉල්ලුම් පත්‍ර පිළිගැනීම සඳහා යෝග්‍යතාව පිළිබඳ පරීක්ෂණ වාර්තා ලබා ගැනීම පිණිස නියැදි වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ කාර්මික තාක්ෂණික ආයතනය වෙත යැවීම.	25	7	15	20	25	වෙළඳපලේ ගුණාත්මක නිෂ්පාදන සුලභ කිරීම
17.	තොග පදනම මත සිදු කරන නියැදි වල තත්ත්ව විශ්ලේෂණයට අනුව නිපැයුම් ඇසුරුම් කිරීම සඳහා අනුමැතිය ලබා දීම	800	200	400	650	800	
18.	මාධ්‍ය වැඩසටහන්						
	I. රූපවාහිනි	2	-	1	1	2	
	II. ගුවන්විදුලි	6	2	4	5	6	පුහුණුකරුවන් පුහුණු කිරීම සහ ජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම
	III. මුද්‍රිත මාධ්‍ය	4	2	2	3	4	
19.	කෘෂි රසායනික අලෙවිකරුවන් සහ තාක්ෂණික සහායකයින් පුහුණු කිරීම සහ සහතික කිරීම	25	5	10	20	25	
20.	දැනුවත් කිරීමේ ප්‍රදර්ශන	4	1	2	3	4	
21.	අලෙවිකරුවන් පුහුණු කිරීමේ පන්ති	30	5	12	24	30	පළිබෝධනාශක අලෙවිය පුහුණුව ලද පුද්ගලයන් සහ සහතික කරන ලද වෙළඳ සැල් හරහා පමණක් සිදු කෙරෙන බව සහතික කිරීම
22.	අලෙවිකරු පුහුණු සහතික නිකුත් කිරීම	1100	200	500	850	1100	
23.	අලෙවිකරු සහතික නිකුත් කිරීම	2000	500	1000	1500	2000	
24.	ක්ෂේත්‍ර පැමිණිලි	4	0	1	2	4	පනතේ විධිවිධාන හෝ රෙගුලාසි කඩකරන පුද්ගලයින්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග
25.	නෛතික ක්‍රියාමාර්ග	2	0	1	2	2	

							ගැනීම
26.	තාක්ෂණික උපදේශක සහ කමිටු රැස්වීම්	6	2	3	5	6	පළිබෝධනාශක පාලන පනතට අදාළ සියළුම කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම
27.	පළිබෝධනාශක තාක්ෂණික සහ උපදේශක කමිටුවේ තීරණ දැනුම් දීම සඳහා කර්මාන්ත නියෝජිතවරුන් සමඟ රැස්වීම් පැවැත්වීම	6	2	3	5	6	නිර්දේශ කිරීමට අදාළ කරුණු සහ කර්මාන්ත අංශයේ පළිබෝධනාශක භාවිතය පිළිබඳ පරීක්ෂා කර බැලීම.
28.	උප කමිටු තුනේ පළිබෝධනාශක අනුකමිටු රැස්වීම්	9	3	6	9	9	සෞඛ්‍ය , මහජන සෞඛ්‍ය සහ ගෘහස්ථ පළිබෝධ පාලන අංශ සඳහා පළිබෝධනාශක භාවිතයේ ප්‍රයෝජනය සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලීම.
29.	සංයෝග විශ්ලේෂණය	800	150	350	625	800	පළිබෝධනාශක වල ගුණාත්මය සහ ආහාරවල සහ ජලයේ පළිබෝධනාශක අවශේෂ පිළිබඳව විශ්ලේෂණය කිරීම.
30.	පළිබෝධනාශක අපද්‍රව්‍ය පිළිබඳව සසම්භාවී පරීක්ෂණ	12	4	8	12	12	
31.	උපරිම අවශේෂ මට්ටම පිළිබඳ විශ්ලේෂණය කිරීම						කෘෂිකාර්මික නිෂ්පාදන වල පවතින අවශේෂ මට්ටම් සහතික කිරීම
32.	ප්‍රතිරෝධිතාව වර්ධනය වීම අධීක්ෂණය කිරීම						ප්‍රතිරෝධිතාව වර්ධන වීම සහ ආහාර වලට අදාළව පළිබෝධනාශක වල ඉලක්ක නොවන බලපෑම් හඳුනාගැනීම සහ එවැනි බලපෑම් අවම කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම
33.	පළිබෝධනාශක වල ඉලක්ක නොවූ බලපෑම						
34.	හිස් බඳුන් අපහරණය කිරීම සඳහා වැඩසටහන් පිළියෙළ කිරීම සහ ක්‍රියාත්මක කිරීම	2	1	1	2	2	පරිසර දූෂණය අවම කිරීම

35.	දෙපාර්තමේන්තුව තුළ සහ දෙපාර්තමේන්තු අතර පැවැත්වෙන ආයතනික රැස්වීම් සඳහා තාක්ෂණික විශේෂඥයින් /සාමාජිකයින් / සම්පත් පුද්ගලයන් ලෙස සහභාගී වීම	27	5	12	19	27	
36.	අනෙකුත් ආයතන වලින් ලැබෙන ඇරයුම් පරිදි සම්පත් පුද්ගලයන් ලෙස සහභාගි වීම	10	2	5	8	10	සෞඛ්‍ය සහ පාරිසරිකව බලපෑම් ඇති කරන පළිබෝධනාශක භාවිතය අඩු කිරීම
37.	වැදගත් සංඛ්‍යා ලේඛන එක්රැස් කිරීම, සම්පාදනය කිරීම සහ බෙදා හැරීම (මහ බැංකුව, විශ්ව විද්‍යාල, පර්යේෂකයින්, රජයේ ආයතන ආදිය)	40	10	20	30	40	
38.	පළිබෝධනාශක/ පේවනාශක ලියාපදිංචි කිරීම සඳහා සංශෝධනය කරන ලද උපදෙස් මාලා සහ පළිබෝධනාශක අලෙවිකරණයේ නවකයින් සඳහා උපදෙස් මාලා ප්‍රකාශයට පත් කිරීම.	4	1	2	3	4	
39.	වෙනත් කායර්යන්	4	1	2	3	4	

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්	01
නියෝජ්‍ය පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්	00
සහකාර පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්	00
පර්යේෂණ නිළධාරි	04
කෘෂිකර්ම නිළධාරි	01
කෘෂිකර්ම උපදේශක	06
පර්යේෂණ සහකාර	04
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි	02
වැඩසටහන් සහකාර(කෘෂිකර්ම)	02
පර්යේෂණ උප සහකාර	01
කළමණාකරණ සහකාර සේවය	06
රියදුරු	02
මුරකරු	02
කම්කරු(කොන්ත්‍රාත්)	02
කා.කා. ස.	01
කම්කරු	02
එකතුව	**36**

3.1.5 පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය - ගන්නෝරුව

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය මෙරට එළවළු බෝග වල පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වැඩසටහන් සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ සහ වත්මන් සහ අනාගත පරපුරේ යහපත සඳහා ඒවා ප්‍රයෝජනයට ගැනීම ප්‍රවර්ධනය කිරීමේ වගකීම දරයි. මෙය සාක්ෂාත් කර ගැනීම උදෙසා පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය විසින් ආහාර බෝග සහ එම බෝග ආශ්‍රිත විශේෂ වල ජානමය විවිධත්වය ගවේෂණය කිරීම, එක්රැස් කිරීම, හඳුන්වා දීම, සංරක්ෂණය කිරීම, ඇගයීම සහ ලේඛන ගත කිරීම සිදු කරනු ලබයි.

මෙම මධ්‍යස්ථානය විසින් පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය, උපයෝජනය, සකස් කිරීම සහ ශක්‍යතා වර්ධනය යන කටයුතු වලට අදාළව කාය්‍යයන් 20ක් සම්බන්ධයෙන් දත්ත එක්රැස් කිරීමේ වැඩසටහන සම්බන්ධීකරණය කරන ලදී.

අයවැය

වගු අංක 3.1.5.1 වාර්ෂික අයවැය - 2011 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
පුනරාවර්තන	10,746,000	10,099,211	94
මූලධන	3,480,000	2,765,849	79
ව්‍යාපෘති			
ආහාර හා කෘෂිකර්ම සංවිධානය - ජාතික තොරතුරු හුවමාරු යාන්ත්‍රණය - ගෝලීය ක්‍රියාකරී සැලැස්ම ව්‍යාපෘතිය	2,139,960	2,085,932	97
එකතුව	**16,365,960**	**14,950,992**	**91**

ජනක ප්ලාස්ම ගවේෂණය සහ එක්රැස් කිරීම

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ ගවේෂණ ඒකකය විසින් සියළුම බෝග වල සම්ප්‍රදායික ප්‍රභේද සහ ඒවයෙහි වන දර්ශ පිළිබඳ ගවේෂණය සහ එක්රැස් කිරීම විවිධ වැඩසටහන් යටතේ අඛණ්ඩවම සිදු කරන ලබයි. යාපනය දිස්ත්‍රික්කයේ (නියැදි 81) ක් සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ(නියැදි 36 ක්) වෙන වෙනම ක්ෂේත්‍ර ගවේෂණ මෙහෙයුම් 4 ක් සහ මොණරාගල දිස්ත්‍රික්කයේ (නියැදි 77 ක්) සිදු කරන ලද මෙහෙයුම් 2ක් හරහා නියැදි 194 ක් එක්රැස් කර ගන්නා ලදි. මොණරාගල දිස්ත්‍රික්කයේ ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ නියැදි 36 ක් ද පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය ක්ෂේත්‍ර සහ පැළ ගෘහ ඇගයීමෙන් උප නියැදි ලෙස පැළෑටි ජාන සම්පත් 28 ක් ද එක්රැස් කර ගන්නා ලදී. මහඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයෙන් සහ බෝඹුවල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙන් ලද මුළු නියැදි සංඛ්‍යාව 12 කි. මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය හරහා හඳුන්වාදීම් ලෙස ඉන්දියාවේ ICRISAT වෙතින් රටකජු නියැදි 25ක්, මෙක්සිකෝවේ CYMMIT වෙතින් බඩඉරිඟු නියැදි 6ක් සහ ඉන්දුනීසියාවෙන් බඩඉරිඟු 6ක් වශයෙන් නියැදි 37ක් ලැබුණි.

වර්ධක ප්‍රචාරණය කරන ලද ද්‍රව්‍ය නලස්ථ සංරක්ෂණ ඒකකය සහ ක්ෂේත්‍ර ජාන බැංකුව වෙත භාර දෙන තෙක් ක්ෂේත්‍රයේ සහ පැළ ගෘහයේ කාලිකව රෝපණය කෙරිණි. එක් රැස් කරගත් බීජ නියැදි පරිබාහිරව සංරක්ෂණය කිරීම සඳහා ජාන බැංකුව වෙත යවන ලදී.

ක්ෂේත්‍ර දත්ත

ක්ෂේත්‍ර දත්ත සටහන් 80ක් පැළෑටි ජාන සම්පත් මධයස්ථානයේ දත්ත කළමණාකරණ ඒකකය වෙත යවන ලදි,

ගොවිපළ තුළ සංරක්ෂණය කිරීම සහ ආදර්ශ ගම්මාන වැඩසටහන

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ ගවේෂණ ඒකකය මගින් සිදු කරන ලද ආදර්ශ ගම්මාන වැඩසටහන හරහා ගොවිපළ තුළම සංරක්ෂණය කිරීමේ වැඩසටහන මොණරාගල දිස්ත්‍රික්කයේදී සිදු කෙරිණි. බඩල්කුඹුර කෘෂිකර්ම උපදේශක කොට්ඨාශයේ ගලමූණ සහ තුන්වෙනි ගම්මානය මේ සඳහා තෝරා ගත් ගම්මාන වේ. සම්ප්‍රදායික ප්‍රභේද සහ වෙනත් රෝපණ ද්‍රව්‍ය ලබා දීමෙන් ගෙවතු 31ක් ස්ථාපිත කෙරුණු අතර විෂය ප්‍රවීණ නිළධාරීන් විසින් ගොවීන් පුහුණු කිරීම සහ ගොවීන් සහ නිළධාරීන් සඳහා ක්ෂේත්‍ර දින දෙකක් පැවැත්වීම සිදු කෙරිණි.

බීජ ද්‍රව්‍ය සංරක්ෂණය කිරීම

2011 වසරේදී නව එකතූන් 95ක් සහ ගුණනය කරන ලද නියැදි 191 ක් ජාන බැංකුවේ සංරක්ෂණය කෙරිණි. මෙම වසර අවසානයේදී ජාන බැංකුවේ පැවති මුළු ජාන සම්පත් එකතූන් සංඛ්‍යාව 12, 907 ක් වූ අතර ජාන සම්පත් සංරක්ෂණ තත්ත්වය වගු අංක 3.1.5.2. හි දැක්වේ.

වගු අංක 3.1.5.2 ජාන බැංකුවේ සංරක්ෂණ තත්ත්වය

බෝග කාණ්ඩය	එකතූන් සංඛ්‍යාව
වී සහ ආශ්‍රිත විශේෂ	4538
වෙනත් ධාන්‍ය සහ ආශ්‍රිත විශේෂ	1640
ධාන්‍ය රනිල සහ අශ්‍රිත විශේෂ	2038
එළවළු රනිල බෝග	1300
සොලනේසියේ කුලයේ එළවළු සහ කුළුබඩු සහ ආශ්‍රිත විශේෂ	1206
කුකුබිට් කුලයේ එළවළු	777
බ්‍රැසිකේසියේ කුලයේ එළවළු	31
ලූණු	20
වෙනත් එළවළු	371
කොළ එළවළු	166
මුල් හා ආකන්ද බෝග	09
අඹ සහ ආශ්‍රිත විශේෂ	124
තෙල් බෝග	431
කෙඳි සහිත බෝග	66
ඖෂධීය පැළෑටි	27
පලතුරු	163
එකතුව	**12,907**

ජනක ප්ලාස්ම බෙදා හැරීම

විවිධ බෝග ප්‍රභේද වල නියැදි 913 ක් ඉල්ලීම මත දේශීය පර්යේෂණ ආයතන, රජයේ නොවන ආයතන, ගොවීන් සහ විශ්වවිද්‍යාල වලට ලබා දෙන ලදි.

විදේශ රටවලින් ජනක ප්ලාස්ම ආනයනය කිරීම

පර්යේෂණ කටයුතු සඳහා අඟුණාකොළපැළැස්ස මාෂ සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය කළ ඉල්ලීමකට අනුව ඉන්දියාවේ ICRSAT ආයතනයෙන් රටකජු (*Arachis hylpogaea L.*) එකතූන් 25ක් ආනයනය කරන ලදි.

ඕස්ට්‍රේලියාවේ ඕස්ට්‍රේලියානු සෞම්‍ය කලාපීය ක්ෂෙත්‍ර බෝග එකතුව සඳහා අඹ (*Brassica juncea L.*) එකතූන් 26ක් අපනයනය කරන ලදී.

බීජ හැසිරීම පිළිබඳ පර්යේෂණ

1989 සිට ජාන බැංකුවේ තිබෙන සක්‍රිය එකතුවේ ජීව්‍යතාවය සොයා බැලීම සඳහා අත්හදා බැලීම් ගණනාවක් සිදු කළ අතර එකතූන් 2943 ක ජීව්‍යතාවය සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කෙරිණි. වී සහ මුං වල ජීව්‍යතාව ප්‍රරෝහණය ආරම්භයේදී එක සමාන බැව් සක්‍රිය එකතුවේ ප්‍රතිඵල මගින් අනාවරණය විය.

ආදර්ශ ගම්මාන වැඩසටහන

මහනුවර කාසල් මිල්ක් සහ නියංගම ගම්මාන දෙකේ ආදර්ශ ගෙවතු වැඩසටහනක් සිදු

කරන ලදුව එක් ගමකින් ගොවීන් පස්දෙනා බැගින් තෝරා ගන්නා ලදි. මෙම ගෙවතු වගා වැඩසටහන සඳහා සම්ප්‍රදායික ඵළවළු ප්‍රභේද පහක් යොදා ගන්නා ලදි. කොල්ලු (*Macrotyloma uniflorum*), වඳුරු මෑ (*Mucuna pruriens*), දාර දඹල (*Phaseolus lunatus*), හාල් මැස්සන් දඹල (*lablab purpureus*), අවර (*Canavalia gladiate*), දඹල (*psophocarpus tetragonalobus*), වට්ටක්කා (*Cucurbita moschata*), නයි මිරිස් (*capsicum frutescens*) යන බෝග වර්ග ගොවීන් දහ දෙනා විසින් සාර්ථකව වගා කරන ලදි.

ජනක ප්ලාස්ම ගුණනය කිරීමේ සහ ඇගයීමේ ඒකකය

තක්කාලි එකතූන් 100ක් වැටකොළු එකතූන් 106 ක් සහ වම්බටු එකතූන් 102ක් ලක්ෂණීකරණය කළ අතර වර්ගීකරණයන් ප්‍රකාශනය කිරීමට අවශ්‍ය සියළුම කටයුතු සම්පාදනය කෙරිණි. වී (එකතූන් 31ක්), වට්ටක්කා (එකතූන් 11ක්) පිපිඤ්ඤා (එකතූන් 26ක්) , කව්පි(එකතූන් 42ක්) සහ අඹ (එකතූන් 4ක්) ගුණනය /පුනර්වර්ධනය කර සංරක්ෂණය කිරීම සඳහා ජාන බැංකුව වෙත ඉදිරිපත් කරන ලදි. බතල එකතූන් 30ක් ලක්ෂණීකරණය කළ අතර BT 4 කෙරෙහි බලාපොරොත්තු තැබිය හැකි බැව් අනාවරණය විය. කව්පි එකතූන් 30ක් මෘදු කුණු වීම සම්බන්ධයෙන් (*Sclerotium rolsfii*) පරීක්ෂා කරන ලදුව 008366, 008390, 008847, 009155, 009542 යන එකතූන් සහ C 2009-03-152 සහ C 2009- 03-33 යන එකතූන් දෙක ව්‍යාධිජනක වලට වඩාත් ඔරොත්තු දෙන බැව් ප්‍රතිඵල මගින් අනාවරණය විය.

ජාන පදනම පුළුල් කිරීමේ අරමුණින් *mermodica dioica X M. charantia* මුහුම් කිරීම් සහ පරස්පර මුහුම් කිරීම් සිදු කරන ලදි. ගැහැණු මාපියෙක් ලෙස *Memordica diocia* යොදා ගත්විට F1 බීජ ලබා ගත හැකි විය. කෙසේ වුවද බීජ වල සුප්තතාවය පෙන්නුම් කෙරුණු අතර F1 පැළ ලබා ගැනීම සඳහා සුප්තතාව බිඳ හෙළීමේ ප්‍රතිකර්ම වලට භාජනය කරන ලදි. ගැහැණු මාපියකු ලෙස කරවිල යොදා ගත් විට පරාගනය කර දින 8ක් පමණ ගත වීමෙන් පසු කලලයට හානිවීම නිරීක්ෂණය විය. කලල වෙන්කර වර්ධනය කිරීමේ තාක්ෂණය මඟින් F1 පැළ බිහි කිරීමට ප්‍රයත්න දරනු ලබන අතර "හරිත" බණ්ඩක්කා වගා ප්‍රභේදයේ ජාන පදනම පුළුල් කිරීම සඳහා *Abelmoschus anguloses*වන ප්‍රභේදය සමග මුහුම් කර F1 බීජ ලබා ගන්නා ලදි.

පැළෑටි ජාන සම්පත් තොරතුරු කළමණාකරණ ක්‍රමය

පැළෑටි ජාන සම්පත් දත්තමූලය

වත්මන් දත්ත මූලයට එකතූන් 12,778 ක ක්ෂේත්‍ර දත්ත සහ වී, බඩ ඉරිඟු, කුරක්කන්. තණහාල්, ඉඳල් ඉරිඟු, කව්පි, මුං, උඳු, සෝයා බෝංචි, තෝර පරිප්පු, රටකජු, බෝංචි, දඹල, මෑ, වම්බටු, තක්කාලි, මාළු මිරිස්, බණ්ඩක්කා, වට්ටක්කා, පතෝල, කරවිල, තම්පලා, නියං වැටකොළු, අඹ සහ තල ඇතුළු බෝග 25 ක ලක්ෂණීකරණ දත්ත ඇතුළත් වේ.

"ශක්‍යතා වර්ධනය, කලාපීය සහයෝගීතාව , සංරක්ෂණය ඉහළ නැංවීම සහ ආසියාවේ පැළෑටි ජාන සම්පත් තිරසාරව යොදා ගැනීම" පිළිබඳ ආහාර හා කෘෂිකර්ම සංවිධාන ව්‍යාපෘතිය (GCP/RAS/240/JPN)

ශ්‍රී ලංකාවේ දෙවන වරට ක්‍රියාත්මක කරන ලද මෙම ව්‍යාපෘතියට දත්ත එක්රැස් කිරීම 2011 වසරේදී ආරම්භ කෙරිණි. ගෝලීය ක්‍රියාකාරී සැලැස්මට අදාළ ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු එම ව්‍යාපෘතියට සම්බන්ධ පාර්ශවකරුවන්ගේ ආයතන 29 කින් එක්රැස් කර ගැනුණු අතර එම ආයතන අතරට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පලාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (උතුරු පලාත), තේ පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය, රටකජු පර්යේෂණ ආයතනය, තල් සංවර්ධන මණ්ඩලය,CIC කෘෂි ව්‍යාපාර මධ්‍යස්ථානය, ද ග්‍රීන් මූව්මන්ට් ඔෆ් ශ්‍රී ලංකා යන ආයතන ඇතුළත් වේ.

පෙව් තාක්ෂණය

දුඹුරු පැළ කීඩෑවා කෙරෙහි වී ජනක ප්ලාස්ම සතු ප්‍රතිරෝධිතාව විශ්ලේෂණය කිරීම

දුඹුරු පැළ කීඩෑවාට ප්‍රතිරෝධී වී ජනකප්ලාස්ම ඇගයීම සහ හඳුනා ගැනීමත් ප්‍රතිරෝධී ප්‍රභේද බිහි කිරීමට යොදා ගැනීම සඳහා දුඹුරු පැළ කීඩෑවාට ප්‍රතිරෝධී ජාන ලක්ෂණීකරණය කිරීමත් මෙහි පරමාර්ථය විය. මෙම අධ්‍යයනයෙන් වී ජනක ප්ලාස්ම 64 ක් පරීක්ෂා කරන ලදුව ඉන් 37ක් දුඹුරු පැළ කීඩෑවාට පාත්‍රී බවත්, 19 ක් මධ්‍යස්ථ ප්‍රතිරෝධිතාවෙන් යුත් බවත් අංක 3177 එකතුව ඉහළ ප්‍රතිරෝධිතාවෙන් යුත් බවත් හඳුනා ගැනිණි. මෙම ප්‍රතිඵල පදනම්ව ප්‍රතිරෝධී ජාන වල ඉදිරි අණුක ලක්ෂණීකරණ

කටයුතු සිදු කෙරේ. දුඹුරු පැළ කිඩෑවාට එරෙහිව ඉදිරි පරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා නව වී එකතුන් 70 ක් පමණ ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදි.

නියඟය සම්බන්ධයෙන් වී ජනක ප්ලාස්ම වල රූපානුදර්ශ සහ අණුක ලක්ෂණීකරණය

මෙම අධ්‍යයනයේ පරමාර්ථයන් වනුයේ තෝරාගත් වී එකතුන් ලක්ෂණීකරණය කිරීම සහ සලකුණු ආධාරක තෝරා ගැනීම සඳහා නියඟයට ඔරොත්තු දෙන සහල් ප්‍රභේද සහ නියඟයට ඔරොත්තු දීම හා බැඳුණු සලකුණු වැඩිදියුණු කිරීම සඳහා දායක හඳුනා ගැනීමයි. SSR සලකුණු 10 ක් මගින් වී එකතුන් 40 ක (දේශීය සහ විදේශීය එකතුන් ඇතුළුව) අණුක ලක්ෂණීකරණය සම්පූර්ණ කෙරිණි.

විදේශික සහ දේශීයව බිහි කළ බඩ ඉරිඟු සහහිජාත ආර අතර පවතින සම්බන්ධතාවය පිළිබඳ අධ්‍යයනය

මෙම අධ්‍යයනය දේශීය සහ CIMMYT ජනක ප්ලාස්ම වලින් තෝරා ගත් සහහිජාත ආර 37ක් යොදාගනිමින් අබණ්ඩවම සිදු කෙරිණි. DNA නිස්සාරණය කිරීම සම්පූර්ණ කෙරුණු අතර SSR සලකුණු කිරීම් මගින් අණුක විවිධත්වය පිළිබඳව විශ්ලේෂණය කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලදි. දෙමුහුම් බිහි කිරීම සඳහා අණුක විවිධත්වය පදනම්ව දුරස්ථ මාපියන් වරණය කිරීම සිදු කෙරේ.

රාම්පූර් ලූණු ප්‍රභේදය, තක්කාලි. වම්බටු, සහ බඩ ඉරිඟු වල බීජ තොග 3ක ජානමය පාරිශුද්ධතාවය පරීක්ෂා කිරීම සඳහා සුදුසු පිළිවෙත් බිහි කිරීම

PCR වර්ධක යොදා ගෙන සිදු කළ පරීක්ෂණයකදී RAPD මූලික 10කින් 2ක් (OPD 03 සහ OPD 10) රාම්පූර් ලූණු ප්‍රභේද වල බීජ තොග 3ක DNA අතර බහුරූපීතාව ලබා දුණි. ඒවායේ වර්ධනය කර ගත් කොටස් සම්බන්ධව සිදු කළ විශ්ලේෂණය මගින් රාම්පූර් රෝස් ප්‍රභේදයේ නියැදි 2ක් අතර සමීප ජානමය පරතරයක් සහ රාම්පූර් රෝස් සහ රාම්පූර් රෙඩ් ප්‍රභේදය අතර දුරස්ථ ජානමය පරතරයක් පෙන්නුම් කෙරිණි. එමෙන්ම මෙම විශ්ලේෂණයේදී ඒවා පාරිශුද්ධ ප්‍රභේද නොවන බව දක්වමින් ප්‍රභේද තුන අතර ඉහළ ජානමය විචල්‍යතාවයක් පෙන්නුම් කරන ලදි. මෙම මූලික දෙක රාම්පූර් ලූණු ප්‍රභේද වල පාරිශුද්ධතාව පරීක්ෂා කිරීම සඳහා යොදා ගනු ඇත. SSR මූලික 20 සඳහා PCR විශ්ලේෂණය මගින් තක්කාලි දෙමුහුම් 2 ක මාපිය සහ F1 දෙමුහුම් වල DNA පරීක්ෂා කරන ලදී . ඉන් මාපිය සහ F1 දෙමුහුම් අතර බහුරූපීයතාව නොපෙන්විය. දෙමුහුම් වම්බටු ප්‍රභේද 2ක සහහිජාත මාපිය ආර වල සහ F1 දෙමුහුම් වල විශාල නියැදි වලින් DNA නිස්සාරණය කර ගැනුණු අතර PCR විශ්ලේෂණය සඳහා SSR මූලික වල තොරතුරු එක්රැස් කර ගන්නා ලදි. ඉදිරි විශ්ලේෂණ කටයුතු සඳහා පිළිවෙත් සමුදායක් ඇති කිරීමට බහුරූපී යුගල තෝරා ගැනීම සිදු කෙරෙන අතර සම්පත් දෙමුහුම් බඩ ඉරිඟු ප්‍රභේදයේ මාපියන් සහ F1 හි DNA මගින් SSR මූලික 10ක් යොදා ගෙන PCR විශ්ලේෂණය සිදු කෙරේණි. ප්‍රතිඵල මගින් මාපිය 2ක් සහ දෙමුහුම් අතර බහුරූපීයතාව ඇති මූලික දෙකක් ලබා දී ඇත. මෙම මූලික දෙක සම්පත් දෙමුහුම් ප්‍රභේදයේ පාරිශුද්ධතාව පරීක්ෂා කිරීම සඳහා සුදුසු පිළිවෙත් බිහි කිරීමට තෝරා ගැනිණි.

නලස්ථව සහ පැළ ගෘහ තත්ත්වයන් යටතේ වැල් අල, බතල සහ කෙසෙල් විශේෂ වල පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය කිරීම

මෙම අංශය වැල් අල විශේෂ වල එකතුන් 60 ක් විද්‍යාගාරය තුළ නලස්ථව සහ පැළ ගෘහය තුළ බඳුන් ගතවද බතල එකතුන් 104ක් නලස්ථව මෙන්ම එකතුන් 114 ක් පැළ ගෘහ තත්ත්වයන් යටතේද අර්තාපල් එකතුන් 15ක් සහ කෙසෙල් එකතුන් 7ක් නලස්ථවද නඩත්තු කරන ලදි. මෙම ජනක ප්ලාස්ම ඉල්ලීම මත අභිජනන වැඩසටහන් සඳහාද නිකුත් කෙරිණි.

පැණි දොඩම් සහ කෙසෙල් ප්‍රභේද වල රෝග වලින් තොර රෝපණ ද්‍රව්‍ය නිපදවීම.

පැණි දොඩම් ප්‍රභේද වල බද්ධ සිදු කිරීම සඳහා හීන් නාරන් සහ පිලිපීන් රෙඩ් ලෙමන් වල බීජ විවිධ ප්‍රදේශ වලින් එක්රැස් කර ගන්නා ලදුව සංරක්ෂණය කෙරිණි. ඉදිරි වැඩසටහන් වලදි ග්‍රාහක ලෙස බීජ යොදා ගැනීම සඳහා හීන් නාරන් පැළ 20ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදි. පිළිවෙළින් නලස්ථ ක්ෂුද්‍ර බද්ධ කිරීම සහ අඩ දළ බද්ධ කිරීම මගින් හීන් නාරන්, ඇඹුල් දොඩම්, පිලිපීන් රෙඩ් ලයිම් සහ ලීමා දෙහි වල බද්ධ 118 ක් සහ 75ක් සිදු කෙරිණි. මෙම බද්ධ පැළ වලින් පැළ 78ක් දැඩි කෙරෙමින් පවතින අතර පරිසරයට හුරු කිරීමේ අදියරේ පවති.

විවිධ ප්‍රදේශ වලින් එක්රැස් කර ගත් ප්‍රභේද 10කට පමණ අයත් කෙසෙල් පැළ 92ක් මව් පැළ ලෙස යොදා ගැනීම සඳහා පර්යේෂණ

ක්ෂේත්‍රයේ ස්ථාපිත කෙරිණි. පුලතිසි, කණ්ඩුල, සීනි කෙසෙල් සහ ඇම්බම් ප්‍රභේද වල නලස්ථ රෝපිත ආරම්භ කෙරිණි. එම රෝපිත උප රෝපණය , ගුණනය, දැඩි කිරීම සහ පරිසරයට හුරු කිරීමට ලක් කෙරුණු අතර 2011 වසර අවසන් වන විට ඉන් 12 ක් මුල් අදින අදියරයේද, 17ක් දැඩි කිරීමේ අදියරේද පැළ 152 ක් පරිසරයට හුරු කිරීමේ අදියරේද පැවතුණි. පරීක්ෂණ කටයුතු සඳහා පටක රෝපිත පැළ 220 ක් පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ පර්යේෂණ ක්ෂේත්‍රයේ රෝපණය කළ අතර මේ වන විට පැළ 186 ක් බෙදා දීම සිදු කළ අතර පැළ 133 ක් බෙදා දීමට සුදානම් කර ඇත. මීට අමතරව , ක්ෂුද්‍ර ප්‍රචාරණය මගින් රෝග වලින් තොර පැළ ග්‍රාහක නිපදවීම සඳහා සුදුසු පිළිවෙත් සමුදායක් පිළිබඳව පරීක්ෂා කර බැලීමේ සහ ප්‍රශස්ත කිරීමේ කටයුතු සිදු කෙරිණි.

පුහුණු කිරීමේ සහ දැනුවත් කිරීමේ වැඩසටහන

ගවේෂණ ඒකකය මගින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව සහ උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව සමඟ එක්ව 2011 වසරේදී "ජනක ප්ලාස්ම සංරක්ෂණයේදී ගෝලීය තොරතුරු ක්‍රමය" යොදා ගැනීම පිළිබඳව නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනක් මෙහෙය විය. මෙම වැඩසටහන ස්ථානීය සහ පරිබාහිර සංරක්ෂණය, ගෝලීය තොරතුරු ක්‍රම සහ වනාන්තර වර්ග පිළිබඳව සිදු කරන ලද්දකි. අනෙක් ඒකක වල සහාය සහිතව ගවේෂණ ඒකකය මගින් විවිධ පාසැල් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 40 ක් සංවිධානය කළ අතර විශ්ව විද්‍යාල සිසුන්, ගුරුවරුන් සහ සේවාරම්භක ආධුනිකයින් සහ ගොවීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක් මෙහෙය විය.

කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව හදාරණ සිසුන් තිදෙනෙකු සහ උපාධි අපේක්ෂක සිසුන් 4 දෙනෙකු පෙව තාක්ෂණය පිළිබඳ ආයතනික පුහුණුව ලැබූ අතර පශ්චාත් උපාධිය හදාරන සිසුන් තිදෙනෙකු සහ උපාධි අපේක්ෂක සිසුන් 4 දෙනෙකු පර්යේෂණ ව්‍යාපෘති පිළිබඳ දිගු කාලීන පුහුණුව ලබන ලදි. මෙම අංශය මගින් උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධිය හදාරන සිසුන් 120 දෙනෙකු සහ අනුරාධපුරයේ රජරට විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කායීය මණ්ඩලය සඳහා පැළෑටි ජාන සම්පත් සහ පෙව තාක්ෂණය පිළිබඳ පූර්ණ දින වැඩසටහනක් මෙහෙය වූ අතර කණ්ඩායම් 3 කින් ගුරුවරුන් 189 දෙනෙකු , කණ්ඩායම් 32 කින් පාසැල් සිසුන් 1492 දෙනෙකු, කෘෂිකර්ම විද්‍යාලීය සිසු කණ්ඩායම් දෙකක් සහ වෙනත් පුද්ගල කණ්ඩායම් 10 ක් සඳහා ආදර්ශන කටයුතුද සිදු කරන ලදි.

ඇගයීම් ඒකකයේ ප්‍රධානියාගේ අධීක්ෂණය යටතේ උපාධි අපේක්ෂක සිසුන් දෙදෙනෙක් සිය උපාධි පාඨමාලාවට අදාළ ඔවුන්ගේ පර්යේෂණ කටයුතු සම්පූර්ණ කරන ලදි.

2012 වසර සඳහා සැලැස්ම

- පැළෑටි ජාන සම්පත් පිළිබඳ ගවේෂණය සහ එක්රැස් කිරීම් කටයුතු අඛණ්ඩවම සිදු කිරීම
- ගවේෂණය සහ එක් රැස් කිරීමේ ඒකකය මගින් බීජ ද්‍රව්‍ය සැකසුම් කිරීම සහ සංරක්ෂණය කිරීම
- සංරක්ෂණය කරන ලද ද්‍රව්‍ය වල ජීව්‍යතාව පිළිබඳව අත්හදා බැලීම් අඛණ්ඩවම සිදු කිරීම
- පැළෑටි ජාන සම්පත් නලස්ථව සංරක්ෂණය කිරීම
- පැළෑටි ජාන සම්පත් ලක්ෂණීකරණය , ගුණනය කිරීම සහ පුනර්වර්ධනය කිරීම
- වත්මන් දත්ත කළමනාකරණ ක්‍රමය නඩත්තු කිරීම සහ වැඩි දියුණු කිරීම
- පැළෑටි ජාන සම්පත් සම්බන්ධයෙන් අණුක ලක්ෂණීකරණය
- අණුක තාක්ෂණික ක්‍රම යොදා ගනිමින් බෝග වැඩි දියුණු කිරීම සඳහා පැළෑටි ජාන සම්පත් යොදා ගැනීම
- ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් අඛණ්ඩවම සිදු කිරීම

කායීය මණ්ඩල ලැයිස්තුව

තනතුර	නිලධාරී/සේවක සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිළධාරී	09
වැඩසටහන් සහකාර	02
කෘෂිකර්ම උපදේශක	03
පර්යේෂණ සහකාර	04
පර්යේෂණ උප සහකාර	05
කළමනාකරණ සහකාර	07
ගබඩා භාරකරු	01
කාර්යාල කාර්‍ය්‍ය සහයක	01
රියදුරු	03
ලොරි පවිත්‍රකරු	01
විදුලි ශිල්පි	03
සංචාරක බංගලා භාරකරු	01
මුරකරු	05
සිනමා යන්ත්‍ර ක්‍රියාකරු	01
කම්කරු (I ශ්‍රේණිය)	13
කම්කරු (II ශ්‍රේණිය)	06
කම්කරු (කොන්ත්‍රාත්)	19
එකතුව	**85**

3.2. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය - පේරාදෙණිය

අස්වැන්න ඉහළ නැංවීම සඳහා වඩාත්ම වැදගත් යෙදවුම් උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය වන අතර එමගින් නිෂ්පාදන පිරිවැයද අවම වේ. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය දිවයින පුරා බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේදී සහ බෙදා හැරීමේදී වැදගත් කාර්‍යභාරය ඉටු කරයි. වී . වෙනත් ක්ෂේත්‍ර බෝග , එළවළු සහ අර්තාපල් වල දේශීයව නිර්දේශිත සියළුම ප්‍රභේද වල අවශ්‍ය බීජ ප්‍රමාණයන් සහ ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන අභියෝගයන් වේ. බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන කිරීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය සතු ගොවිපළවල් 18 ක් පවතී. එහෙත් , වී , එළවළු සහ වෙනත් ක්ෂේත්‍ර බෝගයන්හි සහතික කරන ලද බීජ තෝරා ගත් කොන්ත්‍රාත් වගාකරුවන් හරහා නිෂ්පාදනය කෙරේ.

වගු අංක 3.2.1. වාර්ෂික අයවැය - 2011 (රු . මිලියන)

වැය ශීර්ෂය/ව්‍යාපෘතිය	**මුළු ප්‍රතිපාදනය**	**මුළු වියදම**	**වියදම් ප්‍රතිශතය**
මූලධන	35.323	29.058	82
පුනරාවර්තන	46.301	44.585	96
විශේෂ ව්‍යාපෘති			
බීජ නිෂ්පාදනය සහ මිළදී ගැනීම	486.3	473.4	97
ප්‍රජා පාදක බීජ නිෂ්පාදනය	5.0	4.61	92
කොම්පෝස්ට් නිෂ්පාදනය	6.0	5.05	84
දෙමුහුම් බඩ ඉරිඟු බීජ නිෂ්පාදනය	1.05	1.05	100
දෙමුහුම් එළවළු බීජ නිෂ්පාදනය	0.375	0.293	78
පරන්තන් සහ මුරුන්කන්හි රජයේ බීජ ගොවිපළවල් නැවත ක්‍රියාත්මක කිරීම (JAICA)	100.0	97.7	98
කඩිනමින් බීජ ගොවිපළ සංවර්ධන වැඩසටහන	200.00	85.0	43
එකතුව	**895.3**	**740.7**	**83**

ප්‍රගතිය

බිත්තර වී නිෂ්පාදනය සහ සැපයුම

රජයේ බීජ ගොවිපළ වල මූලික බිත්තර වී නිෂ්පාදනය

නිර්දේශිත වී ප්‍රභේද 28ක අත්තිවාරම් බිත්තර වී සහ ලියාපදිංචි කළ බිත්තර වී රජයේ බීජ ගොවිපළ 07ක නිෂ්පාදනය කරන ලදි. 2011 වසරේදී නිෂ්පාදිත ලියාපදිංචි කළ බිත්තර වී ප්‍රමාණය බුසල් 112794 ක් (මෙ.ටො. 2312.3) වූ අතර එය 2010 වසරේ නිෂ්පාදිතය හා සංසඳනාත්මකව 7.17% ක වර්ධනයක් විය.

මූලික බිත්තර වී නිෂ්පාදනය සඳහා යොදා නොගත් කුඹුරු භාවිතයට ගනිමින් බීජ ගොවිපල් වලදී සහතික කළ බිත්තර වී බුසල් 14617 ක් (මෙ.ටො. 299.7) නිපදවිය.

අංක 3.2.2. : 2011 වසරේදී රජයේ බීජ ගොවිපළ වල මූලික බිත්තර වී නිෂ්පාදිත ප්‍රමාණය

බීජ ගොවිපළ	2010/11 මහ (මෙ.ටො)			2011 යල(මෙ.ටො)			එකතුව(මෙ.ටො)		
	අත්තිවාරම් බිත්තර වී	ලියාපදිංචි බිත්තර වී	සහතික කළ බිත්තර වී	අත්තිවාරම් බිත්තර වී	ලියාපදිංචි බිත්තර වී	සහතික කළ බිත්තර වී	අත්තිවාරම් බිත්තර වී	ලියාපදිංචි බිත්තර වී	සහතික කළ බිත්තර වී
අළුත්තරම	11.0	111.2	7.5	18.2	116.7	31.1	29.2	227.8	38.6
අම්බලන්තොට	1.9	57.3	5.2	3.0	70.9	14.1	4.9	128.1	19.3
බටඅත	5.2	29.6	13.0	1.5	6.1	2.1	6.6	35.7	15.1
කන්තලේ	6.4	102.0	9.8	12.6	246.5	2.6	19.0	348.5	12.4
මහ ඉලුප්පල්ලම	15.0	258.2	17.9	24.2	391.6	0.5	39.2	649.8	18.3
මල්වත්ත	3.3	60.5	14.0	5.2	108.7	66.6	8.5	169.1	80.6
පොළොන්නරුව	9.2	218.6	31.8	11.3	399.8	0.7	20.5	618.4	32.6
මුරුන්කන්	0.9	42.0	-	-	-	-	0.9	42.0	-
පරන්තන්	2.4	36.1	5.8	4.7	47.6	-	7.1	83.7	5.8
කරඩියනාරු	-	4.3	36.1	-	4.7	40.5	-	9.0	76.6
එකතුව (මෙ.ටො)	**55.3**	**919.7**	**141.2**	**80.6**	**1392.5**	**158.4**	**136.0**	**2312.3**	**299.7**
එකතුව(බුසල්)	**2699**	**44865**	**6889**	**3933**	**67929**	**7728**	**6632**	**112794**	**14617**

කොන්ත්‍රාත් වගා වැඩසටහන හරහා සහතික කළ බිත්තර වී නිෂ්පාදනය

මෙම වැඩසටහන යටතේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය 2010/2011 මහ කන්නයේදී සහ 2011 යල කන්නයේදී බුසල් 70,000ක් (එක් කන්නයේකින් බුසල් 35,000ක්) මිළදී ගැනීමට ඉලක්ක කරන ලදි. 2011 වසරේදී පැවති හිතකර කාළගුණික තත්ත්වයන් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අස්වැන්න සඳහා ඉහළ මිළක් ගොවීන්ට ලබා දීම හේතුවෙන් වගු අංක 3.2.3 හි පෙන්නුම් කරන පරිදි සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාප 09කින් බුසල් 107,030ක් මිළදි ගන්නා ලදි.

වගු අංක 3.2.3 (i) කොන්ත්‍රාත් වගා වැඩසටහන යටතේ මිළදී ගත් සහතික කළ බිත්තර වී ප්‍රමාණය - 2011

සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපීය	මිළදී ගත් ප්‍රමාණය		එකතුව (මෙ.ටො)	එකතුව (බුසල්)
	2010/11 මහ(මෙ.ටො)	2011 යල (මෙ.ටො)		
අළුත්තරම	121.8	201.8	323.6	15785
අම්පාර	153.4	186.6	340.0	16584
බටඅත	25.7	103.4	129.1	6297
කන්තලේ	78.0	203.3	281.2	13718
මහ ඉලුප්පල්ලම	147.8	112.4	260.2	12691
නිකවැරටිය	108.9	147.2	256.2	12496
පැල්වෙහෙර	146.6	138.9	285.5	13927
පොළොන්නරුව	62.9	208.3	271.3	13233
කිලිනොච්චි	15.4	11.4	26.8	1308
වවුනියාව	20.3	-	20.3	991
එකතුව(මෙ.ටො)	**880.7**	**1313.4**	**2194.1**	
එකතුව(බුසල්)	**42962**	**64068**		**107030**

හදිසි බිත්තර වී බෙදා දීමේ වැඩසටහන - 2011

බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධනය මධ්‍යස්ථානය මගින් මෙහෙයවන ලද විශේෂ බීජ නිෂ්පාදන වැඩසටහන මගින් හදිසි බිත්තර වී බුසල් 236195 ක් මිළදී ගන්නා ලදුව එම වී 2010/11 මහ කන්නයේදී ගං වතුර තර්ජනයට ලක්වූ ගොවීන්ට 2011 යල සහ 2011/12 මහ කන්න වගා කිරීම සඳහා නොමිලයේ ලබා දෙන ලදී.

වගු අංක 3.2.3 (ii) මිළදී ගත් හදිසි බිත්තර වී ප්‍රමාණය - 2011

සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපීය	මිළදී ගත් ප්‍රමාණය		එකතුව (මෙ.ටො)	එකතුව (බුසල්)
	2010/11 මහ(මෙ.ටො)	2011 යල (මෙ.ටො)		
අළුත්තරම	234.9	37.1	272.0	13268
අම්පාර	556.1	698.4	1254.5	61195
බටඅත	504.5	10.9	515.4	25142
කන්තලේ	261.5	353.1	614.6	29981
මහ ඉලුප්පල්ලම	292.9	254.7	547.6	26712
නිකවැරටිය	240.0	202.4	442.4	21581
පැල්වෙහෙර	91.2	157.8	249.0	12146
පොළොන්නරුව	205.7	192.1	397.8	19405
කිලිනොච්චි	62.1	143.3	205.4	10019
වවුනියාව	105.5	213.3	318.8	15551
කොළඹ	24.5	-	24.5	1195
එකතුව(මෙ.ටො)	**2578.9**	**2263.1**	**4842.0**	
එකතුව(බුසල්)	**125800**	**110395**		**236195**

වාණිජ වගාව සඳහා ගුණාත්මක බිත්තර වී යොදා ගැනීම ඉහළ නැංවීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය මගින් පෞද්ගලික අංශයේ සංවිධාන ඇතුළු නියෝජිතායතන කීපයක සහභාගිත්වයෙන් යුතුව ගුණාත්මක බිත්තර වී නිෂ්පාදන කිරීමේ සහයෝගිතා වැඩසටහනක් මෙහෙය විය. මෙම වැඩසටහන යටතේ ලියාපදිංචි කළ බිත්තර වී අදාළ නියෝජිතායතන වෙත නිකුත් කළ අතර සිදු කරන ලද වී වගාවන් සහ බීජ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවය මගින් සහතික කෙරිණි. තවදුරටත් ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනය සහතික කිරීම සඳහා ද්විතීය බීජ ගොවිපළ වැඩසටහන යටතේ ගොවීන් වෙත ලියාපදිංචි කළ බිත්තර වී නිකුත් කරන ලදි.

රජයේ සහ පෞද්ගලික අංශයේ විවිධ සංවිධාන මගින් නිපදවන ලද සහතික කරන ලද බීජ ප්‍රමාණයන් පිළිබඳව වගු අංක 3.2.4 හි දැක්වේ. ඇතැම් සමාගම් සතුව ඔවුන්ගේම තත්ත්ව පාලන ක්‍රම පැවතිම මත නිල බීජ සහතිකකරණ වැඩසටහනට සහභාගි නොවීම හේතුවෙන් පෞද්ගලික අංශයේ සත්‍ය බීජ නිෂ්පාදනය නිකුත් කරන ලද ප්‍රමාණයට වඩා වැඩිවිය. 2011 වසරේදී නිල සහතිකකරණ වැඩසටහන් යටතේ නිපදවන ලද සහතිකකරණ ලද බිත්තර වී ප්‍රමාණය මෙ.ටො. 17,624.18 ක් (බුසල් 934,362) වූ අතර (වගු අංක 3.2.4) එය දිවයිනේ සමස්ථ බිත්තර වී අවශ්‍යතාවයෙන් 17% කට සමානය.2010 වර්ෂයට සාපේක්ෂකව මෙය 1.37% ක වර්ධනයකි. සමස්ථ බීජ අවශ්‍යතාවෙන් 15% ක් පමණ සහතික කළ බීජ මගින් සපුරා ගැනීම සතුටුදායක තත්ත්වයක් ලෙස සැලකේ.

වගු අංක 3.2.4: සහතික කරන ලද බිත්තර වී නිෂ්පාදන සහයෝගිතා වැඩසටහන - 2011

ආයතනය	2010/11 මහ		2011 යල		2011 වසරේ නිෂ්පාදිතය			
	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිකුත් කළ ප්‍රමාණය (මෙ.ටො)	සහතික කළ වපසරිය (මෙ.ටො)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිකුත් කළ ප්‍රමාණය (මෙ.ටො)	සහතික කළ වපසරිය (අක්කර)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිකුත් කළ ප්‍රමාණය (මෙ.ටො)	සහතික කළ වපසරිය (අක්කර)	මෙ.ටො.	බුසල්
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව							2194.60	107030
පළාත්	69.97	1547.5	63.84	1331.5	133.8	2879.0	3836.27	187135
අන්තර පලාත්	41.33	716.0	34.71	687.0	76.03	1403.0	1869.50	91195
ගොවිජන සේවා	37.08	691.8	3.10	74.6	40.18	766.4	1021.23	49816
මහවැලි	29.79	723.6	14.80	326.0	44.59	1049.6	1398.59	68224
සමුපකාර	10.95	245.5	7.71	314.2	18.66	559.7	745.80	36381
ගොවි සංවිධාන	119.47	2091.5	75.46	2476.7	194.93	4568.2	6087.13	296933

ගොවීන්	39.98	754.9	20.97	463.5	60.95	1218.4	1623.52	79196
පෞද්ගලික අංශයේ සමාගම	22.49	478.4	60.41	1108.7	82.90	1587.1	2114.81	103162
වෙනත්	5.45	139.1	10.39	204.3	15.58	343.4	457.58	22321
එකතුව	**376.50**	**7388.30**	**291.39**	**6986.50**	**667.89**	**14374.8**	**19154.42**	**934362**

බිත්තර වී නිකුත් කිරීම

2011 වසරේදී බීජ නිෂ්පාදනය සහ වාණිජමය වගාව සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මුළු බිත්තර වී ප්‍රමාණයන් වගු අංක 3.2.5. හි දැක්වේ පසුගිය කන්නයේ අභිජනන බීජ වලින් නිපදවා ගන්නා ලද අත්තිවාරම් බීජ රජයේ බීජ ගොවිපළවල ලියාපදිංචි බීජ නිපදවීම සඳහා යොදා ගන්නා ලදි.සහතික කළ බීජ නිපදවීම සඳහා කොන්ත්‍රාත් වගාකරුවන්ට මෙන්ම පෞද්ගලික අංශයේ ආයතන ඇතුළු පෞද්ගලික බීජ වගාකරුවන්ටද ලියාපදිංචි කළ බීජ ලබා දුණි. 2011 වසරේදී මුළු ලියාපදිංචි කළ බීජ සැපයුම මෙ.ටො.1984.4 ක් (බුසල් 96,802) වූ අතර සහතික කළ බිත්තර වී සැපයුම මෙ.ටො. 2197ක් (බුසල් 107,215) විය.

වගු අංක 3.2.5 : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද බිත්තර වී ප්‍රමාණයන්(මෙ.ටො)

කන්නය	වැඩසටහන	අත්තිවාරම් බීජ	ලියාපදිංචි බීජ	උප එකතුව	සහතික කළ බීජ	මුළු එකතුව	
						මෙ.ටො	බුසල්
2011 යල	ගොවිපළ	22.45	23.84	46.29	0.08	46.37	2262
	කොන්ත්‍රාත් වගාව	1.68	54.00	55.68.	12.14	67.81	3308
	පෞද්ගලික ව්‍යාප්ති	1.46	395.94	397.39	49.08	446.47	21779
		2.50	348.36	350.86	1120.10	1470.96	71754
උප එකතුව (මෙ.ටො)		**28.09**	**822.13**	**850.22**	**1181.39**	**2031.61**	**99103**
උප එකතුව(බුසල්)		**1370**	**40104**	**41474**	**57629**	**99103**	
2011/12 මහ	ගොවිපළ	21.63	14.80	36.41	0.12	36.53	1782
	කොන්ත්‍රාත් වගාව	2.58	85.44	88.03	0.68	88.70	4327
	පෞද්ගලික ව්‍යාප්ති	1.76	326.95	328.72	29.50	358.22	17474
		1.19	735.13	736.32	986.21	1722.53	84026
උප එකතුව(මෙ.ටො)		**27.16**	**1162.31**	**1189.47**	**1016.51**	**2205.98**	**107609**
උප එකතුව(බුසල්)		**1325**	**56698**	**58023**	**49586**	**107609**	
2011 සඳහා නිකුත් කිරීම්	ගොවිපළ	44.08	38.62	82.70	0.21	82.90	4044
	කොන්ත්‍රාත් වගාව	4.26	139.44	143.71	12.81	156.52	7635
	පෞද්ගලික ව්‍යාප්ති	3.22	722.89	726.11	78.58	804.69	39253
		3.69	1083.49	1087.18	2106.31	3193.49	155780
උප එකතුව(මෙ.ටො)		**55.25**	**1984.44**	**2039.69**	**2197.91**	**4237.60**	**206712**
උප එකතුව(බුසල්)		**2695**	**96802**	**99497**	**107215**	**206712**	

වෙනත් කෙෂත්‍ර බෝග නිෂ්පාදනය සහ බෙදා හැරීම

2011 වසරේදී විවිධ බීජ පන්ති 4 ක බීජ (අත්තිවාරම් , ලියාපදිංචි , සහතික කළ සහ වාණිජ බීජ) නිපදවීම සඳහා වෙනත් කෙෂත්‍ර බෝග ප්‍රභේද 30ක් යොදා ගැනිණි.

මූලික බීජ (අත්තිවාරම් සහ ලියාපදිංචි බීජ) නිෂ්පාදනය

2011 වසරේදී රජයේ බීජ ගොවිපළ වල නිපදවන ලද. අත්තිවාරම් බීජ ප්‍රමාණයන් සහ රජයේ ගොවිපළ සහ කොන්ත්‍රාත් බීජ ගොවිපළ යටතේ නිපදවූ ලියාපදිංචි බීජ ප්‍රමාණයන් වගු අංක 3.2.6 හි දැක්වේ. මෙම වසරේදී නිපදවූ මුළු මූලික බීජ ප්‍රමාණය (අත්තිවාරම් සහ ලියාපදිංචි) කි.ග්‍රෑ.85,520 ක් වූ අතර එම නිෂ්පාදිතය පසුගිය වසරේ නිෂ්පාදිත ප්‍රමාණය 33% කින් (කි.ග්‍රෑ. 64,369 ක්) ඉක්ම වූවකි. මිරිස් , සෝයා බෝංචි සහ

රටකජු හැර අනෙක් සියළුම බෝග වලින් (කව්පි, උඳු , තල, මුං ,බඩඉරිඟු සහ කුරක්කන්.) මූලික බීජ ඉහළ ප්‍රමාණයක් නිපදවීම මෙයට ප්‍රධාන හේතුව වන අතර මෙම ජයග්‍රහණයට කොන්ත්‍රාත් ක්‍රමයට ලියාපදිංචි බීජ නිෂ්පාදනය කිරීමේ වැඩසටහන පුළුල් කිරීමෙන් සැලකිය යුතු දායකත්වයක් ලැබීම හේතුවිය.

සහතික කළ බීජ නිෂ්පාදනය

වෙනත් ක්ෂේත්‍ර බෝග වල සහතික කළ බීජ ප්‍රධාන වශයෙන්ම කොන්ත්‍රාත් බීජ ගොවිපළ හරහා නිපදවීය. කෙසේ වුවද , " සම්පත්" බඩ ඉරිඟු ප්‍රභේදයේ දෙමුහුම් බීජ ප්‍රධාන වශයෙන්ම මහ ඉලුප්පල්ලම, අළුත්ගම සහ බට අත පිහිටා තිබෙන රජයේ බීජ ගොවිපළ වලදී නිපදවන ලදි. 2011 වසරේදී නිපදවන ලද සහතික කරන ලද මුළු බීජ ප්‍රමාණය මෙ.ටො. 321.5 ක් වූ අතර එය 2010 වසරේ නිෂ්පාදිතයට වඩා 14.71% ක වර්ධනයකි.(වගු අංක 3.2.7). මෙම වසරේදී මුං සහ රටකජු බීජ කොන්ත්‍රාත් වැඩසටහන් පුළුල් කිරීම මෙයට ප්‍රධාන හේතුව වේ. කෙසේවුවද , මිරිස් බෝගයේ වර්ධනය අවධියේදී සහ අස්වනු නෙලන සමයේදී පැවති අහිතකර කාලගුණික තත්ත්වයන් සහ කරල් හටගන්නා අවධියේදී දිවයින පුරා පැවති අමු මිරිස් මිළ ගණන් ඉහළ වීම හේතුවෙන් කොන්ත්‍රාත් ක්‍රමයට මිරිස් බීජ නිපදවීමට ඉලක්ක කළ ප්‍රමාණය සපුරා ගත නොහැකි විය. රජයේ බීජ ගොවිපළ වල සහ පර්යේෂණ ස්ථාන වල කොළ පොහොර බෝගයක් ලෙස යොදා ගැනීම සඳහා සන්හෙම්ප් කොළ පොහොර බෝගයේ වාණිජ බීජ සීමිත ප්‍රමාණයක් නිපදවිය.

2011 වසරේ වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිකුතුව

2011 වසරේදී නිෂ්පාදිත මූලික (අත්තිවාරම් සහ ලියාපදිංචි) සහ සහතික කළ බීජ ප්‍රමාණයන් වගු අංක(3.2.8 හි දැක්වේ. මෙම වසරේදී නිකුත් කළ වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ වල මුළු ප්‍රමාණය මෙ.ටො. 268 ක් පමණ වූ අතර එය පසුගිය වසරට වඩා තරමක් ඉහළ ප්‍රමාණයක් වන අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසර26 ටම වඩා නිකුත් කළ ඉහළම ප්‍රමාණයයි.

වගු අංක 3.2.6 වෙනත් ක්ෂේත්‍ර බෝග වල මූලික බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ) - 2011

බෝගය	අත්තිවාරම්			ලියාපදිංචි						උප එකතුව	මුළු බීජ නිෂ්පාදනය
	බීජ ගොවිපළ			බීජ ගොවිපළ			කොන්ත්‍රාත් වැඩසටහන				
	2010/11 මහ	2011 යල	එකතුව	2010/11 මහ	2011 යල	එකතුව	2010/11 යල	2011 යල	එකතුව		
උඳු	268	1106	1374	187	1235	1422	313	18761	19074	20496	21870
මිරිස්	109	226	335	-	-	-	-	-	-	-	335
කව්පි	1540	274	1814	2279	787	3066	977	3059	4036	7102	8916
තල	253	-	253	148	527	675	306	779	1084	1759	2012
මුං	162	310	472	674	666	1340	203	16168	16371	17711	18183
රටකජු	346	751	1097	1387	1071	2458	85	540	625	3083	4179
කුරක්කන්	408	-	408	1586	687	2273	885	-	885	3158	3565
බඩ ඉරිඟු (සභාවිකව පරාගනය කළ)	121	1189	1310	1414	3618	5032	2037	9373	11410	16442	17752
සෝයා බෝංචි	67	665	732	432	447	879	2098	5000	7098	7976	8708
එකතුව	**3274**	**4521**	**7795**	**8106**	**9038**	**17144**	**6902**	**53681**	**60582**	**77726**	**85521**

වගු අංක : 3.2.7. රජයේ බීජ ගොවිපළ වල සහ කොන්ත්‍රාත් වගාව යටතේ නිෂ්පාදිත සහතික කරන ලද බීජ සහ වාණිජ බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ) - 2011

බෝගය	කොන්ත්‍රාත් වැඩසටහන							බීජ ගොවිපළ							
	2010/11 මහ			2011 යල				2010/11 මහ			2011 යල				
	සහතික බීජ කළ	වාණිජ බීජ	එකතුව	සහතික බීජ කළ	වාණිජ බීජ	එකතුව	උප එකතුව	සහතික බීජ කළ	වාණිජ බීජ	එකතුව	සහතික බීජ කළ	වාණිජ බීජ	එකතුව	උප එකතුව	එකතුව මුළු
උඳු	7474	1908	9381	8420	4662	13081	22462	0	0	0	0	0	0	0	22462
මිරිස් බීජ	0	0	0	437	112	549	549	0	0	0	0	0	0	0	549
කව්පි	4050	676	4726	6048	1060	7107	11833	0	0	0	0	0	0	0	11833
තල	672	0	672	2785	1025	3810	4482	149	0	149	0	0	0	149	4631
මුං	3891	1683	5573	77202	94684	171886	177459	8	283	291	606	0	606	897	178356
රටකජු	5592	2242	7834	18016	20939	38955	46788	0	231	231	0	0	0	231	47019
කුරක්කන්	774	544	1318	399	0	399	1717	1398	117	1515	0	0	0	1515	3232
බඩ ඉරිගු (සභාවිකව පරාගනය කළ)	15059	899	15953	11991	0	11991	27948	0	0	0	0	0	0	0	27948
බඩ ඉරිගු (සම්පත්)	0	0	0	0	0	0	0	2865	0	2865	0	0	0	2865	2865
සෝයා බෝංචි	6318	0	6318	13768	0	13768	20086	0	0	0	0	0	0	0	20086
සන්හෙම්ප්	-	-	-	-	-	-	-	0	315	315	0	2269	2269	2584	2584
සෙස්බනියා	-	-	-	-	-	-	-	0	0	0	0	0	0	0	0
එකතුව	**43830**	**7952**	**51782**	**139066**	**122482**	**261548**	**313326**	**4420**	**946**	**5366**	**606**	**2269**	**2875**	**8241**	**321567**

වගු අංක 3.2.8 : 2011 වසරේදී වෙනත් බෝග බීජ නිකුත් කළ ප්‍රමාණය(කි.ග්‍රෑ)

බෝගය	2011 යල						2011/12 මහ						2011 වසර					
	අභිජනක බීජ	අත්තිවාරම් බීජ /මූලික බීජ	ලියාපදිංචි කළ බීජ	සහතික කළ/සම්මත බීජ	වාණිජ බීජ	එකතුව	අභිජනක බීජ	අත්තිවාරම් බීජ /මූලික බීජ	ලියාපදිංචි කළ බීජ	සහතික කළ/සම්මත බීජ	වාණිජ බීජ	එකතුව	අභිජනක බීජ	අත්තිවාරම් බීජ /මූලික බීජ	ලියාපදිංචි කළ බීජ	සහතික කළ/සම්මත බීජ	වාණිජ බීජ	මුළු එකතුව
උඳු	37	957	655	1176	1415	4240	18	242	7376	14051	1640	23306	55	1198	8031	15206	3056	27546
මිරිස් බීජ	3	143		0		146	2	68		5		75	6	210	0	5	0	221
කව්පි	6	511	5234	2199	3284	11234	79	725	2559	2302	1031	6696	85	1235	7794	4501	4315	17931
තල	0	78	1153	3846	535	5611	0	18	126	1388	901	2432	0	95	1278	5234	1436	8043
මුං	51	491	5606	14236	12104	32487	60	156	6135	30782	50801	87935	111	647	11741	45018	62905	12042
රටකජු	154	589	1710	5626	2610	10889	167	2049	1617	18983	15761	38577	321	2638	3326	24809	18371	49465
කුරක්කන්	0	41	455	343	117	957	6	56	750	1059	3	1874	6	97	1206	1403	120	2831
බඩ ඉරිඟු බීජ (එළිමහනේ පරාගනය කළ)	0	430	3143	3739	0	7312	3	349	3944	16364	1040	21699	3	780	7087	20103	1040	29012
බඩ ඉරිඟු (දෙමුහුම්)				16		16				3664		3664	0	0	0	3680	0	3680
සෝයා බෝංචි	35	453	1895	3426	14	5823	11	89	845	358	0	1302	46	542	2740	3784	14	7125
සන්හෙම්ප්					1896	1896					563	563					2459	2459
සෙස්බනියා					0	0					0	0					0	0
එකතුව	**287**	**3692**	**19850**	**34806**	**21975**	**80610**	**346**	**3751**	**23352**	**88935**	**71739**	**188122**	**633**	**7443**	**43202**	**123741**	**93715**	**268733**

එළවළු බීජ නිෂ්පාදනය සහ සැපයුම

මූලික බීජ නිෂ්පාදනය

මෙරට වගා කරන එළවළු බෝග 18 ක කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත ප්‍රභේද 50 ක් තිබෙන අතර ඇතැම් ප්‍රභේද වල මූලික බීජ නිෂ්පාදනය කිරීම රජයේ බීජ ගොවිපළ 07 ක (වගු අංක: 3.2.9) සිදු කෙරේ. 2011 වසරේ නිෂ්පාදිත ප්‍රමාණය 2010 වසරට වඩා අඩු ප්‍රමාණයකි. 2011 වසරේ පැවති අහිතකර කාලගුණික තත්ත්වය සහ ප්‍රමාණවත් තරම් තොග පැවති බැවින් සුළු ප්‍රමාණයක් නිපදවීම මෙයට හේතුවිය.

වගු අංක: 3.2.9: රජයේ ගොවිපළ වල එළවළු මූලික බීජ නිෂ්පාදනය - 2011

බෝගය	නිෂ්පාදිත ප්‍රමාණය (කි ග්‍රෑ)		
	2010 /11 මහ	2011 යල	එකතුව
බෝංචි	1629.7	371.1	2000.8
කරවිල	-	74.4	74.4
වම්බටු	18.1	53.95	72.1
බුෂිටාවො	-	10.6	10.6
මෑ	129.5	6.8	136.3
බණ්ඩක්කා	-	240.9	240.9
පතෝල	186.9	23.2	210.1
දඹල	21.2	-	21.2
තක්කාලි	3.8	69.8	73.55
මාළු මිරිස්	-	37.6	37.6
වට්ටක්කා	7.2	-	7.2
රාබු	57.2	-	57.2
තිබ්බටු	2.97	-	2.97
තම්පලා	-	191.8	191.8
එකතුව	**2056.52**	**1080.15**	**3136.67**

සම්මත එළවළු බීජ නිෂ්පාදනය

රාජ්‍ය සහ පෞද්ගලික අංශ දෙකේම සංවිධාන මගින් සම්මත බීජ නිෂ්පාදනයෙහි නිරත වූ අතර බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය මගින් රජයේ ගොවිපළ වල සහ කොන්ත්‍රාත් වගා වැඩසටහන යටතේ නිෂ්පාදනය කරන ලද බීජ ප්‍රමාණයන් වගු අංක 3.2.10 හි දැක්වේ. 2011 වසරේදී නිෂ්පාදිත මූළු සම්මත බීජ ප්‍රමාණය මූලික බීජ නිෂ්පාදනය හා සමාන ප්‍රවණතාවයක් දක්වමින් කලින් වසරට වඩා බෙහෙවින් අඩු (54% ක් පමණ) ප්‍රමාණයක් විය. කොන්ත්‍රාත් වගාව යටතේ අඩු නිෂ්පාදනයක් ඇති වීමට ප්‍රධාන හේතුව වූයේ එම වැඩසටහන යටතේ අඩු බෝංචි බීජ ප්‍රමාණයක් මිළදි ගැනීමයි.

වගු අංක 3.2.10 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සම්මත එළවළු බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.) - 2

බෝගය	ගොවිපළ වැඩසටහන			කොන්ත්‍රාත් වැඩසටහන			
	2010/11 මහ	2011 යල	එකතුව	2010/11 මහ	2011 යල	එකතුව	මුළු එකතුව
බෝංචි	-	-	-	6435	446.0	6881	6881.0
කරවිල	90.3	125.8	216.1	102.1	278.4	380.5	596.6
වම්බටු	174.0	178.3	352.3	-	-	-	352.3
බුෂිටාවෝ	407.8	119.1	526.9	124.0	129.2	253.2	780.1
මාළුමිරිස්	109.2	308.1	417.3	-	15.5	15.5	432.8
පිපිඤ්ඤා	13.7	53.2	66.9	28.5	65.9	94.4	161.3
වැටකොළු	264.0	7.5	271.5	138.5	-	138.5	410.0
මෑ	658.5	143.5	802.0	304.0	607.6	911.6	1713.6
බණ්ඩක්කා	549.9	1600.1	2150.0	-	1044.0	1044.0	3194.0
නිවිති	86.1	90.0	176.1				176.1
පතෝල	25.9	334.5	360.4	48.6	339.0	387.6	748.0
පැණි කොමඩු	10.3	-	10.3	-	20.1	20.1	30.4
තක්කාලි	5.3	22.3	27.6	-	-	-	27.6
තම්පලා	39.3	-	39.3	-	-	-	39.3
දඹුල	569.8	-	569.8	90.5	408.8	499.3	1069.1
රාබු	-	44.9	44.9	128.4	-	128.4	173.3
එකතුව	**3004.1**	**3027.3**	**6031.4**	**7399.6**	**3354.5**	**10754.1**	**16785.5**

වම්බටු ප්‍රභේද දෙකක සහ තක්කාලි ප්‍රභේද දෙකක F1 දෙමුහුම් බීජ ගොවිපළ වලදී සාර්ථකව නිපදවිය. (වගු අංක 3.2.11). වම්බටු කුණ්ඩසාලේ , අඹේපුස්ස සහ අළුත්තරම ගොවිපළ වලදී සහ තක්කාලි බීජ කුණ්ඩසාලේ ගොවිපළින් පමණක් නිපදවිය. තක්කාලි බීජ නිෂ්පාදනය 2010 වසරට වඩා අඩු වැඩි වශයෙන් සමාන වූ අතර වම්බටු බීජ නිෂ්පාදනය වඩා ඉහළ ප්‍රමාණයක් විය.

වගු අංක 3.2.11 රජයේ ගොවිපළ වල එළවළු දෙමුහුම් බීජ නිෂ්පාදනය(කි.ග්‍රෑ)

බෝගය	2010/11	2011	එකතුව
තක්කාලි	4.0	8.18	12.18
වම්බටු	16.7	28.03	44.73
එකතුව	**20.7**	**36.21**	**56.91**

එළවළු බීජ බෙදා හැරීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තු අලෙවිසැල් සහ ලියාපදිංචි අලෙවිකරු ජාලය හරහා එළවළු බීජ බෙදා හරින ලදි. මෙම අලෙවිකරු ජාලයට ගොවිජන සේවා මධ්‍යස්ථාන සමූපකාර සමිති. ගොවි සංවිධාන, පලාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු සහ පෞද්ගලික ලියාපදිංචි බීජ අලෙවිකරුවන් ඇතුළත් වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයන ලද එළවළු බීජ ප්‍රමාණයන් වගු අංක 3.2.12 හි දැක්වේ.

2011 වසරේ සම්මත බීජ සැපයුම 2010 වසරට සාපේක්ෂකව තරමක් වැඩි වූ අතර මූලික බීජ සැපයුම බෙහෙවින් අඩු විය. කෙසේ වුවද , සමස්ත බීජ සැපයුම 2010 වසරට වඩා තරමක් වැඩි විය.

වගු අංක 3.2.12 . කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සපයන ලද එළවළු බීජ ප්‍රමාණයන් - 2011

බෝගය	සපයන ලද ප්‍රමාණය (කි .ග්‍රෑ)						
	මූලික බීජ			සම්මත බීජ			මුළු එකතුව
	2011 යල	2011/12 මහ	එකතුව	2011 යල	2011/12 මහ	එකතුව	
තම්පලා	45	0.75	**2.2**	180.83	21.42	**202.25**	**204.45**
බෝංචි	05.5	320.0	**1425.50**	9144.79	6422.70	**15567.49**	**16992.99**
කරවිල	85.65	38.30	**123.95**	224.87	189.95	**414.82**	**538.77**
වම්බටු	1.45	1.90	**3.35**	56.01	38.37	**94.38**	**97.73**
බුෂිටාවෝ	95.60	205.0	**300.60**	668.85	323.72	**992.57**	**1293.17**
මාළුමිරිස්	5.05	5.93	**10.98**	214.47	155.08	**369.55**	**380.53**
පිපිඤ්ඤා	6.10	8.00	**14.10**	174.70	211.70	**386.40**	**400.50**
වැටකොළු	14.70	22.80	**37.50**	391.60	318.28	**772.88**	**810.38**
මෑ	146.90	137.00	**283.90**	1389.11	650.00	**2039.11**	**2323.01**
බණ්ඩක්කා	106.50	176.75	**283.25**	215.07	821.45	**1036.52**	**1319.77**
වට්ටක්කා	112.35	3.78	**116.13**	3.06	-	**3.06**	**119.19**
රාබු	36.50	79.25	**43.00**	139.15	206.50	**345.65**	**388.65**
පතෝල	119.68	6.50	**198.93**	530.28	451.05	**981.33**	**1180.26**
නිවිති	3.15	2.00	**5.15**	124.75	253.11	**377.86**	**383.01**
පැණිකොමඩු		0.20	**0.20**	21.30	28.60	**49.90**	**50.10**
තක්කාලි	38.78	7.86	**46.64**	215.36	21.85	**237.21**	**283.85**
දඹල	69.00	38.00	**107.00**	849.21	349.23	**1198.44**	**1305.44**
එකතුව	**1948.36**	**1054.02**	**3002.38**	**14543.41**	**10547.43**	**25090.84**	**28093.22**

2011 වසරේ බීජ අර්තාපල් නිෂ්පාදනය සහ සැපයුම

2011 මහ කන්නයේදී ග්‍රැනෝලා ප්‍රභේදයේ පූර්ව මූලික බීජ(Go), මූලික බීජ (G1,G2,G3) සහ සහතික කළ බීජ නිපද වූ ප්‍රමාණයන් පිළිවෙළින් මෙ.ටො. 0.75 ක්. මෙ.ටො. 78.26 ක් සහ මෙ.ටො. 23. 42ක් විය.

2011 වසරේදී ග්‍රැනෝලා ප්‍රභේදයේ පූර්ව මූලික, මූලික සහ සහතික කළ බීජ නිපදවූ ප්‍රමාණයන් පිළිවෙළින් මෙ.ටො. 284.14 ක් සහ මෙ.ටො.126.23 ක් විය. 2011 වසරේදී නිපදවූ මුළු ප්‍රමාණය මෙ.ටො. 518.4ක් වූ අතර සහතික කළබීජ මෙ.ටො. 422.93 ක් අර්තාපල් වගාකරුවන් වෙත ලබා දෙන ලදි.

2011 වසරේ අස්වැන්න 2010 වසරට සාපේක්ෂව 1.4% ක වැඩිවීමකි.මෙම අස්වනු වර්ධනයට කාලානුරූපව වගා කිරීමසහ අර්තාපල් වගාව සඳහා කාබනික පොහොර ඉහළ ප්‍රමාණයක් යෙදවීම හේතුවිය.

පූර්ව මූලික බීජ ප්‍රමාණය අඩු බැවි පෙනුනද එයට බීජ ආකන්ද සැලකිය යුතු විශාල ප්‍රමාණයක් අයත් විය.

වගු අංක 3.2.13 : 2011 වසරේදී නිෂ්පාදිත පූර්ව මූලික (Go) සහ මූලික (G1,G2,G3) බීජ අර්තාපල් ප්‍රමාණය (මෙ.ටො)

ප්‍රභේද	පූර්ව මූලික බීජ			මූලික බීජ		
	2010/11 මහ	2011 යල	එකතුව	2010/11 මහ	2011 යල	එකතුව
ග්‍රැනෝලා	0.75	0.62	1.37	78.26	284.14	362.40
ඩිසයිරි	-	-	-	5.03	-	5.03
එකතුව	**0.75**	**0.62**	**1.37**	**83.29**	**284.14**	**367.43**

වගු අංක 3.2.14 2011 වසරේදී නිෂ්පාදිත සහතික කළ බීජ අර්තාපල් ප්‍රමාණය- (මෙ.ටො)

ප්‍රභේදය	2010/11 මහ	2011 යල	එකතුව
ග්‍රැනෝලා	23.42	126.23	149.65
එකතුව	**23.42**	**126.23**	**149.65**

වගු අංක 3.2.15 : 2011 වසරේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සපයන ලද බීජ අර්තාපල් ප්‍රමාණය (මෙ.ටො)

ප්‍රභේදය	2011 යල	2011/12 යල	එකතුව
ග්‍රැනෝලා	128.38	294.55	422.93

2011 වසරේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ සැපයුම

පලතුරු ශාක වල රෝපණ ද්‍රව්‍ය සඳහා මෙරට ඉල්ලුම සපුරාලීම සඳහා බද්ධ පැල,රිකිලි පැළ සහ කඳ කැබලි මෙන්ම මෙරෙයියන් යන කාණ්ඩ යටතේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ලදි.2011 වසරේදී, බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය යටතේ ඇති බීජ ගොවිපළ 10 කදී සහ උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතන යටතේ ඇති උද්‍යාන බෝග ගොවිපළ 8 කදී රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩසටහන් මෙහෙයවන ලදී. ඒ අනුව පලතුරු බෝග 20 කට අයත් ප්‍රභේද 30 ක පලතුරු පැළ 230,000ක් නිපදවා බෙදා හරින ලදි.

වගු අංක 3.2.16 : 2011 වසරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ සැපයුම

බෝගය	නිෂ්පාදිතය	සැපයුම
බද්ධ පැල		
අලිගැට පේර	11203	7698
බෙලි	1151	948
දූරියන්	7764	8289

පේර	753	448
වරකා	8590	5108
උගුරැස්ස	439	384
දෙහි	2200	2103
අඹ	162825	130351
ජම්නාරං	1715	1637
මැංගුස්	470	67
දොඩම්	6504	6123
රඹුටන්	51352	38103
සැපතිල්ලා	1053	702
කාමරංගා	1609	1191
වෙනත්	9951	16808
උප එකතුව	**267579**	**219960**
කඳු කැබලි පැළ		
මිදි	196	658
ජම්බු	2277	1837
දෙළුම්	1020	854
ලෙමන්	5169	2164
ඩ්‍රැගන් ෆෘට්	3413	1446
වෙනත්	12417	9021
උප එකතුව	**24492**	**15980**
බීජ පැළ		
ඇඹරැල්ලා	16104	11154
කාමරංගා	2044	1115
පැපොල්	8946	10301
දෙළුම්	32932	18293
පේර	5432	5016
කතුරුමුරුංගා	2692	1590
මැංගුස්	3786	2390
දෙහි	18809	10163
මිටි මුරුංගා	15936	3341
අනෝදා	1008	800
වැල් දොඩම්	5404	4851
වෙනත්	21175	11778
උප එකතුව	**134268**	**80792**
එකතුව	**426339**	**316732**
එළවළු බඳුන්	**606714**	**60549**

වගු අංක 3.2.17 වෙනත් නිෂ්පාදන

නිෂ්පාදනය	ප්‍රමාණය
කෙසෙල්(කි.ග්‍රෑ)	27408.4
අඹ (කි.ග්‍රෑ)	5562,5
පැපොල්(කි.ග්‍රෑ)	1857,8
මිදි(කි.ග්‍රෑ)	24.7
අන්නාසි(කි.ග්‍රෑ)	92.7
පේර(කි.ග්‍රෑ)	198.5
රඹුටන්(කි.ග්‍රෑ)	648.0
පරිභෝජනයට ගන්නා අර්තාපල් (කි.ග්‍රෑ)	84282.5
පරිභෝජනයට ගන්නා එළවළු (කි.ග්‍රෑ)	73126.7
මඤ්ඤොක්කා(කි.ග්‍රෑ)	504.0
පොල්(ගෙඩි)	24510.0
තැඹිලි (ගෙඩි)	3923.0
සත්ත්ව නිෂ්පාදන	
කිරි(ලී)	31935.0
මුදවප් කිරි(හට්ටි)	1341.0
කොම්පෝස්ට්(කි.ග්‍රෑ)	673000.0
නිෂ්පාදනය	**ප්‍රමාණය**
පරිභෝජනයට ගන්නා වෙනත් ක්ෂෙත්‍ර බෝග	
බඩඉරිඟු (කි.ග්‍රෑ)	2033.4
අමු බඩඉරිඟු (සංඛ්‍යාව)	2565.0
වියලි මිරිස් (කි.ග්‍රෑ)	596.5
මුං (කි.ග්‍රෑ)	468.4
කව්පි (කි.ග්‍රෑ)	1589.2
තල (කි.ග්‍රෑ)	449.5
සෝයා බෝංචි(කි.ග්‍රෑ)	510.0
කුරක්කන් (කි.ග්‍රෑ)	1304.0
උඳු (කි.ග්‍රෑ)	669.9
රටකජු (කි.ග්‍රෑ)	1202.0

අත්තිකාරම් ගිණුම් ක්‍රියාකාරීත්වය - 2011

අත්තිකාරම් ගිණුම යටතේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන සිදු කෙරිණි.වසර තුළ මෙම ගිණුමේ ක්‍රියාකාරීත්වය වගු අංක 3.2.18 හි දැක්වේ.

වගු අංක 3.2.18 අත්තිකාරම් ගිණුම් ක්‍රියාකාරීත්වය

ගොවිපළ	ආදායම	වියදම
අළුත්ගම	6,347,974.28	32,401,476.71
අම්බලන්තොට	1,443,866.75	9,489,056.57
බටඅත	1,240,043.13	26,002,035.69

කන්තලේ	1,442,985.80	20,854,087.05
මහඉලුප්පල්ලම	13,581.685.81	55,989,144.14
මල්වත්ත	1,432,985.80	19,994,031.38
පොළොන්නරුව	6,740,386.11	38,250,988.99
අඹේපුස්ස	4,132,580.39	14,921,154.30
කුණ්ඩසාලේ	3,308,134.40	15,260,136.72
මිද්දෙණිය	1,758,294.50	11,329,124.91
පිඳුරුතලාගල	4,421,907.00	16,127,695.83
සීතාඑළිය	2,101,619.90	22,147,141.80
උඩරැල්ල	1,018,915.00	10,285,817.92
මීපිලිමාන	1,757,455.00	10,622,928.29
කරඬියනාරු	-	8,034,407.98
කඳපොළ	810,693.60	11,661,484.21
මුරුන්කන්	256,554,54	2,614,786,25
පරන්තන්	260,607.40	4,321,495.05

කාය්‍ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
අධ්‍යක්ෂ	
නියෝජ්‍ය අධ්‍යක්ෂ	
කෘෂිකරම නිළධාරි	30
ගණකාධිකාරි	01
කෘෂිකර්ම උපදේශක	114
ගොවිපළ යන්ත්‍ර උපදේශක	01
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි	03
වැඩසටහන් සහකාර	02
පරිපාලන නිළධාරි	01
කළමණාකරණ සහකාර	87
ගොවිපළ ලිපිකරු	18
රියදුරු	43
ට්‍රැක්ටර් ක්‍රියාකරු	15
විදුලි ශිල්පි	03
යන්ත්‍ර ක්‍රියාකරු	09
පෙදරේරු	01
වඩුබාස්	04
බද්ධකරු	03
සංචාරක බංගලා භාරකරු	03
කා.කා.ස	05
ගබඩාකරු	10
මුරකරු	59
ලොරි පවිත්‍රකරු	09
විශේෂ ගබඩා කම්කරු	01
සනීපාරක්ෂක කම්කරු	04
කම්කරුකැ(III ශ්‍රේණිය)	377
එකතුව	**803**

3.3. සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය - පේරාදෙණිය

සමාජ ආර්ථික පර්යේෂණ සහ කෘෂිකාර්මික ප්‍රතිපත්ති විශ්ලේෂණ කටයුතු සිදු කිරීම මෙම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්‍යයන් වන අතර කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන තොරතුරු සම්පාදනය කිරීම සඳහා සංඛ්‍යා ලේඛන ඒකකයක්ද පවත්වාගෙන යනු ලබයි.එමෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දේශීය සහ විදේශීය අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘති වල සම්බන්ධීකරණ කටයුතද මෙම මධ්‍යස්ථානය මගින් සිදු කෙරේ.

අයවැය

වගු අංක 3.3.1: වාර්ෂික අයවැය - 2011 (රු)

වැය විෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
මූලධන	3,243,450	1,897,137	58
පූනරාවර්තන	3,239,000	3,091,818	95
එකතුව	**6,482,450**	**4,988,955**	**77**

ප්‍රගතිය

අධ්‍යයන

බෝග නිෂ්පාදන පිරිවැය සහ ලාභය

2009/2010 මහ කන්නයේ සහ 2010 යල කන්නයේ වී සහ අතිරේක ආහාර බෝග, මුල් සහ ආකන්ද බෝග සහ එළවළු සඳහා වූ පිරිවැය සහ ලාභය පිළිබඳ අධ්‍යයනය පිළිවෙළින් 2011 පෙබරවාරි සහ අගෝස්තු මාස වලදී ප්‍රකාශයට පත් කරන ලදී. සාමාන්‍ය අස්වැන්න, දළ සහ ශුද්ධ අදායම්, මුළු නිෂ්පාදන පිරිවැය සහ ඒකක පිරිවැය සහ ගොවිපළ මිළ ගණන් මෙම දත්ත වලට අන්තර්ගතය.

ශ්‍රී ලංකාවේ නව වී ප්‍රභේද වල අනුවර්තනය

වී පර්යේෂණ සහ සංවර්ධන ආයතන මගින්දී ඇති වී ප්‍රභේද වල ව්‍යාප්තිය පිළිබඳ දත්ත ඇසුරු කර ගනිමින් අළුතින් මුදා හරින ලද වී ප්‍රභේද ගොවි ක්ෂෙත්‍ර වලට අනුවර්තනය වීම, අළුතින් මුදා හරින ලද ආදේශක නව ප්‍රභේදවල අනුවර්තන සීඝ්‍රතාව යනාදිය සම්බන්ධයෙන් මෙම අධ්‍යයනය සිදු කරන ලදි. පිළිවෙළින් Bg 94-1, Bg 300, සහ Bg 352 යන ප්‍රභේද 1970,1980 සහ 1990 වසර වල සිට පැවත එන ප්‍රභේද බවත් Bg 358, Bg 359 සහ Bg 362 පුළුල් ලෙස වගා කෙරෙන නව ප්‍රභේද බවත් දත්ත මගින් අනාවරණයවේ. වැඩිදියුණු කරන ලද පැරණි ප්‍රභේද සහ සම්ප්‍රදායික ප්‍රභේද වගා කිරීමේ සැලකිය යුතු අඩු වීමක් සහිතව 1960 ගණන් වල මැද භාගයේ සිට මුදා හරින ලද වැඩිදියුණු කළ නව වී ප්‍රභේද ප්‍රචලිතව වගා කෙරිණි. වී අභිජනනය කිරීමේ පර්යේෂණ සහ ව්‍යාප්ත කිරීමේ වත්මන් ප්‍රයත්නයන් කෙරෙහි අබණ්ඩ සහයෝගය සහ ධෛර්ය ලබාදීමට ප්‍රතිපත්ති සම්පාදකයන් දිරිමත් කරන අතරම ගොවීන්ට බීජ ලබා ගැනීමට පවතින හැකියාව සහ නව වී ප්‍රභේද පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා වූ ප්‍රවේශ්‍යතාවය පිළිබඳව වැඩි අවධාරණයක් සහිතව ප්‍රභේද මුදා හැරීමේ සහ ව්‍යාප්ත කිරීමේ ප්‍රතිපත්තිය ශක්තිමත් කළ යුතුය.

ශ්‍රී ලංකාව සඳහා ශීත ගබඩා පහසුකම් අවශ්‍යතාව ඇගයීම

කලින් කලට වෙළඳපළට සැපයෙන එළවළුවල අතිරික්තය සඳහා ප්‍රතිකර්මයක් ලෙස ශීත ගබඩාකරණ පහසුකම් ස්ථාපිත කිරීමටමේ වන විට අවධානය යොමු වී ඇත. මෙමගින් කෘෂිකාර්මික නිෂ්පාදන වලනැවුම් කාලය දීර්ඝ කර ගත හැකි වුවද ඍර්ම කලාපීය පලතුරු සහ එළවළු වල, විශේෂයෙන්ම, ඍර්ම කලාපීය එළවළු ශීත ගබඩාකරනැබිය හැකි කාලය සාපේක්ෂකව අඩු කාලයක් වන බැවින් මෙම ප්‍රතිකර්මය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අභියෝගයකි. ශ්‍රී ලංකාවේ ශීත ගබඩා ස්ථාපිත කිරීම පසුගිය අත්දැකීම් අනුව බෙහෙවින්ම අසාර්ථක ක්‍රියාදාමයක් විය. ශීත ගබඩාවක් ස්ථාපිත කිරීමේ සැබෑ අවශ්‍යතාව නිමානය කිරීම සඳහා සෞම්‍ය කලාපීය පලතුරු සහ එළවළු ගබඩා කිරීමේ තාක්ෂණික ශක්‍යතාව සමඟම ආර්ථික ශක්‍යතාවද ඇගයීමට සවිස්තරාත්මක පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කළ යුතුය.

සහල් වල තත්ත්ව ගුණාංග කෙරෙහි පාරිභෝගික රුචිකත්වය: ඒකාබද්ධ විශ්ලේෂණයක්

වාර්ෂික සාමාන්‍ය ඒක පුද්ගල පරිභෝජනය කි.ග්‍රෑ. 110 කින් යුතුව මේ වන විටත් ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදනය ස්වයං පෝෂිත තත්ත්වයට පත්ව ඇත. මේ අතර ආදායම ඉහළ යාම සහ නාගරීකරණවීම වැනි ශ්‍රී ලාංකීය සමාජයේ ඇති ව්‍යුහාත්මකවසිදු වී ඇති වෙනස්කම් සහල්වල ගුණාත්මය කෙරෙහි වූ රුචිකත්වය සම්බන්ධයෙන්ද බලපා ඇත. මේ හේතුවෙන් ඒකාබද්ධ ක්‍රමවේදය පාදකව සහල්වල විවිධ තත්ත්ව ගුණාංග කෙරෙහි වූ පාරිභෝගික රුචිකත්වය අගයන ලදී. සහල් වර්ගය, වර්ණය සහ සංශුද්ධතාව වැදගත් වූ නමුත් මිළ වැදගත් නොවූ බව ANOVA ප්‍රතිඵල මගින් පෙන්වා දේ. සහල් වර්ගයක් තෝරා ගැනීමේදී වඩාත් වැදගත් ගුණාංගය සහල් වල සංශුද්ධතාව බැව් අනාවරණය වේ.

කන්නමය මිළ විචල්‍යතාව සහ ශ්‍රී ලංකාවේ සහල් වෙළඳපලේ වෙළඳපළ ඒකාබද්ධතාවය.

පාරිභෝගිකයන් මිළ උච්චාවචනය නොවී ස්ථායි මිළ ගණන් පැවතීම සම්බන්ධයෙන් රුචිකත්වයක් දක්වයි. සතිපතා මිළ ගණන් පිළිබඳ දත්ත උපයෝගී කර ගනිමින් ශ්‍රී ලාංකීය සහල් වෙළඳපලේ ඒකාබද්ධ වීමේ මට්ටම මෙම අධ්‍යයනයෙන් සමීක්ෂණය කෙරේ. මෙම ප්‍රතිඵල අනුව වෙළඳපළ ඒකාබද්ධතාවය දැඩිව පවතින බව සහ වෙළඳපළ අතර මිළ සංඥාවන් කාර්යක්ෂමව සිදු වන බව පෙන්නුම් කෙරේ.

වෘත්තියක් ලෙස ගොවිතැන පිළිබඳ තරුණ පරපුරේ ආකල්පය: පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සිදු කරන ලද සිද්ධි අධ්‍යයනය

වගා කිරීමේ අගය පිළිබඳ තරුණ පරපුර දරන ආකල්ප, ගොවිතැන් කටයුතු වල නිරතවීමෙහිලා ඔවුන් පොළඹවනු ලබන සාධක සහ කෘෂිකර්මාන්තය කෙරෙහි ඔවුන් දක්වන රුචිකත්වය සොයා බැලීම සඳහා මෙම අධ්‍යයනය සිදු කළ අතර මේ සඳහා 2011 වසරේදී පොළොන්නරුව දිස්ත්‍රික්කයේදී සිදු කරන ලද මූලික සමීක්ෂණයක් පාදක කර ගන්නා ලදි. නියැදියේ මුළු විශාලත්වය අවු: 15 - 29ත් අතර වයසේ පසුවන තරුණයින් 144 කින්සමන්විත විය. පවතින කෘෂිකර්මික බිම් ප්‍රමාණය, නිපුණතාවයන් සහ පුහුණුව යනාදිය වගාකරුවකු වීම සඳහා පෙළඹීමක් ඇති කරන බැවින් තරුණ ප්‍රජාව වගා කටයුතු කෙරෙහි උනන්දු කිරීමට වෘත්තිය පුහුණු වැඩසටහන්, විශේෂ කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන් සහ මනාව සැලසුම් කරන ලද කෘෂිකාර්මික ඉඩම් ප්‍රතිපත්ති හඳුන්වා දීම නිර්දේශ කෙරේ.

පැඟිරි වගාව පිළිබඳ සමාලෝචනය.

"බිබිල සහ මොණරාගල දිස්ත්‍රික්කවල පැඟිරි වගාව වැඩිදියුණු කිරීම" සඳහා 2006 - 2008 කාල පරිච්ඡේදය තුළද ක්‍රියාත්මක කෙරුණු ව්‍යාපෘතියේ ආරම්භක වසර තුන තුළදී ගොවි ක්ෂෙත්‍ර මටටමේ කාය්‍ය සාධනය සම්බන්ධව සංවේදිතා විශ්ලේෂණය සහ සාර්ව ආර්ථික විචල්‍යතාවන්ගේ වෙනස්වීම් ඇගයීම සහ දරිද්‍රතාව පිටු දැකීමේ ජාතික ඉලක්ක කෙරෙහි විභව දායකත්වයන්ගේ වෙනස්වීම් පිළිබඳව මෙන්ම විදේශ විනිමය ඉතුරුම් පිළිබඳවද බහිර්නිවේශනය කරන ලදී. කාබනික නොවන පොහොර සහ කාබනික පොහොර භාවිතා කිරීම, සෙවන පාලනය කිරීම, කප්පාදු කිරීම සහ පැළ පුහුණු කිරීමේ කටයුතු සාපේක්ෂකව පවතිනුයේ පහළ මට්ටමකය. ව්‍යාපෘතිය මගින් ඉහළ නංවන ලද නිෂ්පාදනය සහ මෑත වසරවලදී ඇති වූ ඩොඩම් වගා වපසරියේ ජාතික වර්ධනය මගින් ගොවිපළ මට්ටමේ මිළ ගණන් පාලනය වනු ඇත. අළෙවිකරණය සංවිධානය සහ පොහොර සහනාධාර ලබාදීම වැනි ව්‍යාපෘති සංරචක ව්‍යාපෘතියට ඇතුළත් කිරීමෙදී ව්‍යාපෘති පිරිවැය වැඩි වුවද එම සංරචක තුළින් ගොවීන්ගේ ආදායම ඉහළ නංවාලීමේ සහ දරිද්‍රතාව පිටුදැකීමේ මෙන්ම විදේශ විනිමය ඉතිරි කර ගැනීමේ ඉලක්ක කෙරෙහි ඉහළ ශුද්ධ දායකත්වයක් ලබා දෙනු ඇත.

බෝග ව්‍යාපාර අයවැය(වී, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු බෝග)

තෝරා ගන්නා ලද පලතුරු බෝග(දොඩම්, දෙහි, කෙසෙල්, වැල් දොඩම්, අන්නාසි, රඹුටන්, පැපොල්, කජු, දොඩම්, ඩ්‍රැගන් ෆෘට්, පෙයාර්ස් , අඹ සහ දූරියන්) සහ මල් බෝග(ඇන්තූරියම්, ඇල්ට්‍රෝමේරියා, ජර්බෙරා, කානේෂන් සහ මැඩෝනා ලිලී) සම්බන්ධයෙන් බෝග ව්‍යාපාර අයවැය සකස් කළ අතර එම ලේඛනය පළ කිරීමට නියමිතය. නිර්දේශිත තාක්ෂණයට අනුව මෙම බෝගවල වාණිජ වගාවේ ප්‍රතිලාභ පිරිවැය මෙයට අන්තර්ගතවේ. යෙදවුම් ප්‍රමාණ, පිරිවැය, ආදායම්, ප්‍රතිලාභ පිරිවැය අනුපාත සහ වත්මන් ශුද්ධ අගයන් වැනි ආර්ථික තොරතුරු ඉදිරිපත් කර ඇති අතර පලතුරු බෝග වගාව සඳහා ප්‍රතිලාභ පිරිවැය අනුපාතයන් පිළිබඳව පහත දැක්වෙන වරහන් වල දැක්වේ. දොඩම්(3.59), දෙහි(2.25), කෙසෙල් - ඇම්බම්(3.59), වැල් දොඩම් (1.92), අන්නාසි (4.4), රඹුටන් (5.9), පැපොල්(1.3), කජු(1.9), දොඩම්(6.6), ඩ්‍රැගන් ෆෘට්(16.74), පෙයාර්ස්(5.98), අඹ(1.69)

ප්‍රකාශන

ඇගස්ටැට් 2011

ආහාර බෝග අංශයේ වැදගත් තොරතුරු රැගත් කෘෂිකාර්මික සංඛ්‍යාලේඛන අත්පොත් සකස් කර 2011 අගෝස්තු මාසයේදී ප්‍රකාශයට පත් කළ අතර සමාජ ආර්ථික දත්ත, ඉඩම් පරිහරණ විධි, වපසරිය සහ නිෂ්පාදනය, ආනයනය සහ අපනයනය, ඒක පුද්ගල ප්‍රමාණය, තොග සහ සිල්ලර මිළ ගණන් වැනි තොරතුරු මෙම ඇගස්ටැට් 2011 - VIII වැනි වෙළුමට අන්තර්ගත කර ඇත.

බෝග පුරෝකථනය

සමාජ ආර්ථික සහ සැලසුම් මධ්‍යස්ථානය මගින් මාසිකව නිකුත් කරන ප්‍රකාශයක් වන ''බෝග පුරෝකථනය'' මගින් වී, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු යන වගාවන්හි මාසික ප්‍රගතිය නිරීක්ෂණය කර ඒවායෙහි නිෂ්පාදන මට්ටම් පුරෝකථනය කරන අතර බෝග වගාව, නිෂ්පාදන පුරෝකථනය, කලාපීය බෙදා හැරීම, අස්වනු නෙලන සමය, අහිතකර කාලගුණික සිදුවීම්, පළිබෝධ සහ රෝග ආදියෙහි වත්මන් තත්ත්වය යනාදියට අදාළ තොරතුරුද ඉදිරිපත් කෙරේ.

සංවිධානය කරන ලද වැඩමුළු සහ සම්මන්ත්‍රණ

කෘෂිකාර්මික ප්‍රතිපත්ති පර්යේෂණය පිළිබඳව කුසලතා වර්ධනය කිරීමේ අන්තර්ජාතික වැඩමුළුවක් නිරසාර කෘෂිකර්මය හරහා දරිද්‍රතාව පිටුදැකීමේ මධ්‍යස්ථානය (CAPSA) සමඟ එක්ව සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුව 30 දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව(දේශීය පුද්ගලයන් 28 දෙනෙක් සහ විදේශිකයන් දෙදෙනෙක්) 2011 නොවැම්බර් මස 14-18 යන දිනයන්හිදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨ සභා ශාලාවේ පැවැත්විය.

වෙනත් කාර්‍යයන්

ආදර්ශ ගම්මාන වැඩසටහන

සමාජ ආර්ථික සහ සැලැසුම් මධ්‍යස්ථානය මගින් ගිරාගම ගොවිජන සේවා කොට්ඨාශයට අයත් ඉඹුල්මල්ගම සහ ගිරාගම යන ගම්මාන දෙකේදී "ආදර්ශ ගම්මාන වැඩසටහන" පැවැත් වූ අතර ගම් සංවර්ධනය කිරීම සඳහා ගම්වල චාරිකා සිදුකර SWOT විශ්ලේෂණයක් කරන ලදී. මෙම වැඩසටහන සඳහා ඉඹුල්මල්ගමින් ගොවීන් 15 දෙනෙකු සහ ගිරාගමින් ගොවීන් 13 දෙනෙකු හඳුනා ගැනිණි.

- කෘෂිකර්ම අමාත්‍යංශය මගින් අරමුදල් ප්‍රතිපාදිත සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතන සහ මධ්‍යස්ථාන මගින් ක්‍රියාත්මක කරන ලද " කාබනික පොහොර භාවිතය සහ ඉහළ නැංවීම " යන ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විනය වැඩ කණ්ඩායම් රැස්වීම් සම්බන්ධීකරණය කිරීම.

2012 වසර සඳහා සැලැස්ම

වගු අංක 3.3.2. විවිධ කාණ්ඩ යටතේ පවතින මුළු ව්‍යාපෘති සංඛ්‍යාව

කාණ්ඩය	අංකය
සමාජ ආර්ථික පර්යේෂණ	12
කෘෂිකාර්මික ප්‍රතිපත්ති විශ්ලේෂණය	06
නිෂ්පාදනය සහ අළෙවිකරණය	05
කෘෂිකාර්මික තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය කිරීම සහ පළ කිරීම	07
ව්‍යාපෘති මෙහෙයවීම සහ සැලසුම් කිරීම	04
මානව සම්පත් සංවර්ධනය	02
විශේෂ වැඩසටහන	01
සුළු පරිමාණ ව්‍යාපෘතිය	01
එකතුව	**38**

කායර්ී මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
අධ්‍යක්ෂක	01
නියෝජ්‍ය අධ්‍යක්ෂක	01
කෘෂි ආර්ථික විද්‍යාඥ	11
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි	01
ආර්ථික විද්‍යඥ සහකාර	09
වැඩසටහන් සහකාර	05
කෘෂිකර්ම උපදේශක	02
කළමණාකරණ සේවය	08
රියදුරු	05
කම්කරු	03
කාර්යාල කායර්ී සහායක	01
එකතුව	**47**

3.4 ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය - පේරාදෙණිය

ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියළුම ආයතන සහ මධ්‍යස්ථාන මගින් ඉටු කරනු ලබන කාර්‍ය සාධන වාර්තාව, වාර්ෂිකක්‍රියාකාරී සැලැස්ම, වාර්ෂික කාර්‍ය සාධන වාර්තාව, මාසික ප්‍රගති වාර්තා සහ කෘෂිකර්ම අමාත්‍යංශය සහ අනෙකුත් ආයතන සඳහා අදාළ අනෙකුත් වාර්තා සකස් කිරීමේවගකීමද දරන අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්‍යයන් විධිමත් කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම්ද පවත්වනු ලබයි.

අයවැය

වගු අංක: 3.4.1. වාර්ෂික අයවැය - 2011 (රු:)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
මූලධන	651,000	331,523	51
පුනරාවර්තන	1,293,315	896,109	69
එකතුව	**1,944,315**	**1,227,632**	**63**

ප්‍රගතිය

ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම

පහත සඳහන් කාණ්ඩ යටතේ 2011 වසර සඳහා ක්‍රියාකාරී සැලසුම් සකස් කරන ලදී.

- මූලධන වියදම
- පුනවරාවර්තන වියදම
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් අරමුදල් සම්පාදිතවිශේෂ ව්‍යාපෘති
- කෘෂිකර්ම අමාත්‍යංශය මගින් අරමුදල් සම්පාදිත විශේෂ ව්‍යාපෘති
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික වැඩසටහන්
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රසම්පාදන සැලසුම

මූලධන සහ පුනරාවර්තන වියදම් පිළිබඳ ප්‍රගතිය මෙහෙයවීම

2011 වසරේදී මූලධන කාර්‍යයන්ගේ පුනරාවර්තන වියදම්හි භෞතික සහ මූල්‍ය සහ ප්‍රගතිමෙහෙයුම් කටයුතු අබණ්ඩවම සිදු කළ අතර සෑම මූලධන සහ පුනරාවර්තන වියදමක් සඳහාම මාසික ප්‍රගති වාර්තා සකස් කර කෘෂිකර්ම අමාත්‍යංශය වෙත ඉදිරිපත් කරන ලදී.

වගු අංක: 3.4.2. 2011 වසර තුළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රගති සාරාංශය

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
මූලධන	193.7	116.7	60
පුනරාවර්තන	1,765.2	1,666.4	94
කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ සිදු කෙරෙන ව්‍යාපෘති	884.8	685.4	77
අමාත්‍යංශ වැය ශීර්ෂ යටතේ සිදු කෙරෙන ව්‍යාපෘති	615.59	441.97	72
එකතුව	**3,459.29**	**2,910.47**	**84**

විශේෂ ව්‍යාපෘති වල ප්‍රගතිය මෙහෙයවීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ කෙරෙන විශේෂ ව්‍යාපෘති

කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ සිදු කරනු ලබන විශේෂ ව්‍යාපෘති 12ක ප්‍රගති මෙහෙයුම් කටයුතු සිදු කළ අතර භෞතික සහ මූල්‍ය ප්‍රගතිය ඇතුළු මාසික වාර්තා සකස් කර කෘෂිකර්ම අමාත්‍යංශය වෙත ඉදිරිපත් කරන ලදි.කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ යටතේ වූ විශේෂ ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය පිළිබඳව වගු අංක 3.4.3 හි දැක්වේ.

වගු අංක :3.4.3. 2011 වසරේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ වූ විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය

ව්‍යාපෘතිය	ආයතනය	ප්‍රතිපාදනය (රු: මිලියන)	වියදම (රු: මිලියන)	වියදම %
දෙමුහුම් බීජ බිහි කිරීම	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය/ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය/ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය	9.3	8.1	87
රෝපණ ද්‍රව්‍ය නිපදවීම සඳහා පටක රෝපණ රසායනාගාර පහසුකම්	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	20.0	13.9	69
සුළු පරිමාණයේ කෘෂිකාර්මික පර්යේෂණ	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය/වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය	6.2	6.0	97
යටිතල පහසුකම් සංවර්ධනය	වී පර්යෙෂණ හා සංවර්ධන ආයතනය	49.0	19.4	40
මාධ්‍ය වැඩසටහන	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	20.0	19.9	99
කෘෂිකර්ම විද්‍යාලීය ගොවිපළ සංවර්ධන වැඩසටහන	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	17.0	15.7	92
පුහුණු කිරීම් සහ නිපුණතා වර්ධනය	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	10.0	9.7	97
කෘෂි නාක්ෂණික උද්‍යාන	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	4.5	4.2	94
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික සමුළුව	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	2.5	2.15	86
බීජ නිෂ්පාදනය සහ මිළදී ගැනීම	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	452.0	452.0	100

කඩිනම් බීජ ගොවිපළ සංවර්ධන වැඩසටහන	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	200.0	152.2	76
ප්‍රජා පාදක බීජ නිෂ්පාදන වැඩසටහන	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	20.0	8.64	43
බීජ පනත ක්‍රියාතමක කිරීම	බීජ සහතික කිරීමේ සේවය	15.0	10.8	54
ශ්‍රී ලංකා ඒ. ජ. සංවර්ධන ආධාර ජනකප්ලාස්ම	පැළැටි ජාන සම්පත් මධ්‍යස්ථානය	4.3	1.1	26
ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම (NARP)		50.0	34.5	69
එකතුව		**884.8**	**758.9**	**86**

අමාත්‍යංශ වැය ශීර්ෂ යටතේ සිදු කෙරෙන විශේෂ ව්‍යාපෘති

කෘෂිකර්ම අමාත්‍යංශ වැය ශීර්ෂ යටතේ ක්‍රියාත්මක කෙරෙන විශේෂ ව්‍යාපෘති 25ක ප්‍රගතිය මෙහෙය වූ අතර භෞතික සහ මූල්‍ය ප්‍රගතිය ඇතුළු මාසික වාර්තා අමාත්‍යංශයට ඉදිරිපත් කෙරිණි. අමාත්‍යංශ වැය ශීර්ෂ යටතේ වූ විශේෂ ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය පිළිබඳව වගු අංක 3.4.4. හි දැක්වේ.

වගු අංක: 3.4.4 අමාත්‍යංශ වැය ශීර්ෂ යටතේ ක්‍රියාත්මක කෙරෙන විශේෂ ව්‍යාපෘති වල ප්‍රගතිය

ව්‍යාපෘතිය	ආයතනය	ප්‍රතිපාදනය (රු:මිලියන)	වියදම (රු: මිලියන)	වියදම %
කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	41.07	32.07	78
	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	7.50	6.43	88
	කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය /මාකඳුර	8.0	3.77	47
	කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය/බණ්ඩාරවෙල	0.90	0.58	64
	කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය /සීතාඑලිය	1.15	1.0	87
	කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය /තෙලිප්පිල	0.20	0.2	100
	පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	0.97	0.8	82

ව්‍යාපෘතිය	ආයතනය	ප්‍රතිපාදනය (රු:මිලියන)	වියදම (රු:මිලියන)	වියදම %
	සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය	1.50	0.24	29
	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	6.0	3.07	51
	කෙෂත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	2.0	1.13	64
	ධාන්‍ය රනිල හා තෙල් බෝග පර්යේෂණ ආයතනය	1.0	0.86	86
එළවළු වගාව- ගොවි හාර අරමුදල	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	1.61	0.80	50
බඩ ඉරිඟු වගාව	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	0.36	0.27	75
ලොකු ඵෑණු බීජ නිෂ්පාදනය	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	8.53	6.38	75
ඉඩම් සංවර්ධනය - කෘෂිකර්ම විද්‍යාල	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	0.50	0.45	79
මාධ්‍ය වැඩසටහන	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	10.0	9.15	92
ක්ෂුද්‍ර ජල සම්පාදනය	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	9.0	7.66	85
කන්නය මැද රනිල වගාව	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	13.0	12.06	93
ආදර්ශ ගම්මාන	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	28.10	16.6	59
	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	4.70	1.55	33
	වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය	1.20	0.95	79
	කෙෂත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	0.70	0.07	10
	බීජ සහතික කිරීමේ හා පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය	0.70	0.22	31
	ස්භාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය	0.30	0.1	33
	සමාජ ආර්ථික සැලසුම් මධ්‍යස්ථානය	0.20	0.1	49
ජාතික ගොවි සතිය	ව්‍යාප්ති හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානය	5.13	5.13	100

ව්‍යාපෘතිය	ආයතනය	ප්‍රතිපාදනය (රු:මිලියන)	වියදම (රු:මිලියන)	වියදම %
අවාරයේ රතු ලූණු/ලොකු ලූණු නිෂ්පාදනය	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	4.07	2.46	60
සහල් ඵලදායිතාව ඉහළ නැංවීම	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	1.0	0.88	88
වවුනියාව කෘෂිකර්ම විද්‍යාලය	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	8.0	6.63	83
වවුනියාව කෘෂිකර්ම විද්‍යාලය-ජල සම්පාදන පහසුකම්	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	1.5	1.44	96
වවුනියාව කෘෂිකර්ම විද්‍යාලය - කෞතුකාගාරය	ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය	0.82	0.82	100
ඉඩම් සංවර්ධනය	ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	2.0	1.8	90
	ධාන්‍ය රනිල හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	3.0	2.8	99
කෘෂි නිෂ්පාදන අළෙවිය	ආහාර පර්යේෂණ ඒකකය	4.0	3.0	75
කෘෂි ව්‍යවසාය සංවර්ධනය	ආහාර පර්යේෂණ ඒකකය	2.0	0.3	0.15
දේශීය ආහාර පරිභෝජනය ඉහළ නැංවීම	ආහාර පර්යේෂණ ඒකකය	1.0	0.83	83
කර්මාන්තශාලා වැඩිදියුණු කිරීම	ආහාර පර්යේෂණ ඒකකය	1.0	0.11	11
බිත්තර වී නිෂ්පාදනය	කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය/ගිරාඳුරුකෝට්ටේ	0.40	0.4	100
පෙව විවිධත්ව උද්‍යානය	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	6.62	4.19	86
මහින්ද රාජපක්ෂ ක්‍රීඩාගාර සංකීර්ණය	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	0.15	0.11	73
පාර්ලිමේන්තු පරිශ්‍රය	ව්‍යාප්ති හා පුහුණු අංශය	0.20	0.19	95
බීජ අර්තාපල් නිෂ්පාදනය	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	5.37	4.6	93
පලතුරු රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	10.0	6.89	69
පර්යේෂණ ගොවිපළ වැඩිදියුණු කිරීම	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	5.0	1.53	79
පස සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම	ස්භාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය	2.70	1.09	40

ව්‍යාපෘතිය	**ආයතනය**	**ප්‍රතිපාදනය (රු:මිලියන)**	**වියදම (රු:මිලියන)**	**වියදම %**
ප්‍රජා පාදක බීජ නිෂ්පාදන ගම්මානය	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	20.0	4.7	24
	ව්‍යාප්ති හා පුහුණු අංශය	6.0	3.04	51
	බීජ සහතික කිරීමේ හා පැළැටි සංරක්ෂණ මධ්‍යස්ථානය	3.2	0.89	28
පරන්තන් /මුරුන්කන් ගොවිපළ සංවර්ධනය	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	100	48.5	49
බිත්තර වී මිළදී ගැනීම	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	231.8	209.26	90
පලතුරු පැල නිෂ්පාදනය	කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය /තෙලිජ්ජවිල	2.38	1.9	80
මුඩු බිම් වගා කිරීම	ධාන්‍ය රනිල හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	4.0	2.04	62
	පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	7.38	6.86	93
	උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනය	1.0	0.46	46
	දිස්ත්‍රික්ක කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - පොළොන්නරුව	0.2	0.2	100
	සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය අඟුණකොළපැලැස්ස	1.6	0.04	2
ජල සම්පාදනය වැඩිදියුණු කිරීම - කෘෂි ළිං	ගොවිපල් යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය	1.4	1.4	100
	කෘෂිකර්ම විද්‍යාලය /අඟුණකොළපැළැස්ස	1.4	1.4	100
දැයට කිරුළ ගෙවීම	ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානය	1.4	1.4	100
ඉඩම් සංවර්ධනය -බටඅත	කෘෂි උද්‍යානය	0.38	0.38	100
දිවිනැගුම	ව්‍යාප්ති හා පුහුණු අංශය	6.88	2.57	37
එකතුව		**615.59**	**441.97**	**72**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කායීඵල

පාර්ලිමේන්තු අයවැය කතාවට අදාළ ප්‍රගති වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සහ වාර්ෂික මහ බැංකු වාර්තාව සඳහා 2011 වර්ෂයට අදාළ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යඵල වාර්තා සකස් කර කෘෂිකර්ම අමාත්‍යාංශය සහ මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලදි.

වාර්ෂික කායීී සාධන වාර්තාව

2010 වර්ෂය සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කායීී සාධන වාර්තාව සම්පාදනය කර පාර්ලිමේන්තුව, අදාළ සියළුම අමාත්‍යාංශ, විශ්වවිද්‍යාල, පුස්තකාල සහ අදාළ අනෙකුත් ආයතන වෙත බෙදා හැරිණි.

වෙනත් වාර්තා

"මහින්ද චින්තනය" යටතේ සිදු කෙරෙන කායීයන් සහ මුළු ඇස්තමේන්තු පිරිවැය රු: මිලියන 50 ඉක්මවන ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා සම්පාදනයකර කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කෙරිණි.

2012 වසර සඳහා සැලැස්ම

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩසටහන් සඳහා ක්‍රියාකාරී සැලැසුම් සකස් කිරීම.
- මූලධන සහපුනරාවර්තන කාර්යයන්හි සහ විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය මෙහෙය වීම.
- භෞතික සහ මූල්‍ය ප්‍රගතිය පිළිබඳ මාසික සමාලෝචනය රැස්වීම් පැවැත්වීම.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කායීී සාධන වාර්තාව සම්පාදනය කිරීම.
- මහ බැංකු වාර්තාව සහ අයවැය කතාව සඳහා තොරතුරු සැපයීම.
- රු:මිලියන 50 ඉක්මවන ව්‍යාපෘති වල ප්‍රගති වාර්තා සම්පාදනය කිරීම.

කායීී මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ	02
භාෂා පරිවර්තක	02
වැඩසටහන් සහකාර	02
කෘෂිකර්ම උපදේශක	01
කළමණාකරණ සහකාර සේවය	02
රියදුරු	03
කාර්යාල කායීී සහායක	01
කම්කරු	03
මුරකරු	01
එකතුව	**17**

3.5 ස්වාභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය - පේරාදෙණිය

ස්වාභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානයේ ප්‍රයත්නය වනුයේ පරිසරයට සිදුවන හානිය අවම කර තිරසාර අයුරින් ජාතික ඵලදායිතාව වැඩිදියුණු කිරීමෙහිලා විද්‍යාත්මක පදනමකින් යුතුව ඉඩම් සහ ජල සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීමයි. මෙම මධ්‍යස්ථානය සතු කායීයන් වලට පාංශු සහ ජල සංරක්ෂණය පිළිබඳ පර්යේෂණය, ජලාධාර කළමනාකරණය, ඉඩම් යෝග්‍යතාව පිළිබඳ ඇගයීම, බෝග නිරීක්ෂණය සහ පුරෝකථනය, කෘෂි කාලගුණික සහ දේශගුණික විපර්යාස පිළිබඳ අධ්‍යයනය , ඉඩම් ඵලදායිතාව නංවාලීම, පාංශු සහ ජල තත්ත්වය සහ ගොවිපළ ජල සම්පාදන කළමනාකරණය ඇතුළත්ය. දිවයිනේ කෘෂි කාලගුණ නිරීක්ෂණ ජාලය පවත්වාගෙන යාම, පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම, තාක්ෂණය පතුරුවාලීම සහ අදාළ විෂයන් සම්බන්ධයෙන් සේවාදායකයන්ට තාක්ෂණික සහාය ලබාදීම සහ විවිධ සංවර්ධන ව්‍යාපෘතිවල පාරිසරික ඇගයීම මෙම මධ්‍යස්ථානය සතු අනෙකුත් වගකීම් වේ.

අයවැය

වගු අංක :3.5.1 : වාර්ෂික අයවැය - 2011 (රු:)

වැය ශීර්ෂ	**ප්‍රතිපාදනය**	**වියදම**	**වියදම %**
මූලධන	3,965,000	1,904,604	48
පුනරාවර්තන	2,545,000	2,112,304	83
ව්‍යාපෘති			
වැසිදිය සංරක්ෂණ ව්‍යාපෘතිය	1,810,000	1,039,141	57
පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම	2,700,000	1,871,414	69
ජාතික කෘෂිකර්ම පර්යේෂණ සැලසුම	3,400,000	3,205,384	94
ආදර්ශ ගම්මාන	3 00,000	128,075	43
වාරි පුබුදුව	100,000	35,764	36
කළු ගඟ (මහවැලි H කලාපය)	77, 297	77,298	96
හොරණ පලතුරු උද්‍යානය ස්ථාපිත කිරීම	171,000	146,620	86
එකතුව	**15,071,273**	**10,520,603**	**70**

ප්‍රගතිය

පර්යේෂණ

කන්නමය ලක්ෂණ හඳුනා ගැනීම මගින් දේශගුණික විපර්යාසයන්ට අනුවර්තනය වීම.

කෘෂිකර්මාන්තය දේශගුණික විපර්යාසයන්ට අතිශයින්ම පාත්‍ර වන අතර අනුවර්තනය වීම තුළින් එම විපර්යාස හේතුවෙන් ඇතිවන අවිනිශ්චිතතාවයන්ට මුහුණ දීමට ගොවින්ට හැකිවනු ඇත. එබැවින්, විශාල වශයෙන් වී වගාව සිදු කෙරෙන වියළි සහ අතර මැදි කලාපවල කන්නමය වර්ෂාපතනයේ ලක්ෂණ හඳුනා ගැනීම සඳහා අධ්‍යයනයන් සිදු කරන ලදි. කන්නයේ වර්ෂාපතනය ආරම්භක කාලයේ අවකාශ ව්‍යාප්තිය සහ යල සහ මහ කන්නවල දීර්ඝත්වය පිළිබඳව සතිපතා ලබා ගන්නා ලද වර්ෂාපතන දත්ත අනුසාරයෙන් නිර්ණය කෙරුණු අතර කන්නය තුළ වියළි කාලගුණ තත්ත්වයක් පැවති සති ගණන හඳුනා ගැණිනි. කන්නමය ලක්ෂණ පාදකව වියළි සහ අතරමැදි කලාපවල එක් එක් කෘෂි පාරිසරික

කලාපයන්හි කෙටි කාලීන බෝග සඳහා බෝග වගා දින දර්ශන සකස් කරන ලදී.

යල සහ මහ කන්නවල ආරම්භක කාලයේ ඉහළ විචල්‍යතාවයක් පවතින බව සිදු කරන ලද අධ්‍යයනයෙන් අනාවරණය විය. වියළි කලාපයේ යල කන්න වර්ෂාපතනය ඉහළ විචල්‍යතාවයකින් යුතු වන අතර කන්නයේ දීර්ඝතාව බොහෝවිට ආරම්භක කාලයේ සිට සති 4ක් නොඉක්මවයි. යල කන්නයේදී එම කලාපයේ බොහෝ කෘෂි පාරිසරික කලාප සහ අතරමැදි කලාපයේ කෘෂි පාරිසරික කලාප වල විශේෂ වෙනසක් නොමැති අතර එම කලාප දෙකේ මහ කන්නයේ වී වගා බිම් සියල්ලම පාහේ වගා කිරීම සඳහා අවශ්‍ය පමණ ජලය පවතී.

බෝග වගා දින දර්ශන සකස් කිරීම සඳහා යෝජනා කර ඇති අතර එම දින දර්ශන වගා කටයුතු වල බිම් සකස් කිරීමේ මුල් අවධියේ සිට අස්වනු නෙලන අවධිය සහ ඊළඟ වගා චක්‍රය සඳහා මෙවලමක් ලෙස යොදා ගත හැකි වනවාසේම එම තොරතුරු මගින් අදාළ අධිකාරිවල වාරි ජල සම්පාදන කළමනාකරුවන්ට පුළුල් දෝෂ සීමාවන්ගෙන් තොරව ඒ ඒ කලාපවල ජලාශ වලින් ජලය සැපයීමට සහාය සැලසේ. එසේම අදාළ රෝපණ සමයේදී ඒ ඒ කෘෂි පාරිසරික කලාපයට විශේෂ වී ප්‍රභේද වල ගුණාත්මක බීජ ලබා ගැනීමට මෙය උපකාරී වන අතර වර්ෂාපෝෂිතව සිදු කෙරෙන වගාවන් සැලසුම් කිරීමේදී තීරණ ගැනීමට සහායක මෙවලමක් ලෙසද යොදා ගත හැකිය. බෝග වගා කන්නයේදී ඇතිවන වියළි කාළගුණික තත්තවයන් පිළිබඳව ගොවි ප්‍රජාව දැනුවත්වී සිටීමත් දීර්ඝ කාලීනව වී නිෂ්පාදනය කිරීමේදී ඉදිරියේදී ඇති වන ජල හිඟයට අනුවර්තනය වීමත් අවශ්‍ය වන අතර බෝග වගා දින දර්ශන වරින් වර පරීක්ෂා කර සංශෝධනය කිරීම නිර්දේශ කෙරේ.

DL_{1a} කෘෂිපාරිසරික කලාපවල කන්න අතර වගා කිරීම සඳහා යෝග්‍ය ප්‍රදේශ හඳුනා ගැනීම.

ආහාර සඳහා දිනෙන් දින ඉහළ යන ඉල්ලුම සපුරාලීම පිණිස ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවිය යුතු අතර ඉහළ අස්වනු ගෙන දෙන ප්‍රභේද වගා කිරීමෙන් සහ යෝග්‍යතම ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් අනුගමනය කිරීමෙන් මෙම අවශ්‍යතාව සපුරාගත හැකිවනු ඇත. කෙසේවුවද, දිවයිනේ බොහෝ ප්‍රදේශවල ගොවීන් දැනටමත් මේ සම්බන්ධයෙන් විශිෂ්ට මට්ටමක සිටින බැවින් ඉඩම් ඵලදායිතාව ඉහළ නංවාලීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බැලිය යුතුව ඇත.

කෘෂි පාරිසරික සිතියම මගින් අනාවරණය වන පරිදි දිවයිනේ ඇතැම් ප්‍රදේශ වලට සැලකිය යුතු වර්ෂාපතනයක් ලැබෙන අතර කන්න දෙකඅතර වගා කිරීමේ විභවයක් සහිතව යහපත් පාංශු තෙතමන තත්ත්වයන් පවතී. එබැවින්, යල සහ මහ කන්න අතර සම්ප්‍රදායිකව බෝග වගා නොකරන කාල සීමාව තුළදී කෙටි කාලීන බෝගයක් වගා කිරීම සඳහා DL_{1a} කෘෂි පාරිසරික කලාපයේ ගොවි කෙෂත්‍රයන්හි තෙතමනය ශේෂව පවතිනසහ වර්ෂාව ලැබෙන ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා අධ්‍යයනයක් සිදු කෙරේ. මහ සහ යල කන්න වලට පසුව බෝග වගා නොකරන කාලය ආරම්භ වීමේ සම්මත සතිය පිළිවෙළින් 6 සහ 32 ලෙස සැලකිල්ලට ගෙන DL_{1a} කෘෂි පාරිසරික කලාපයේ සහ ආසන්න ප්‍රදේශ වල ස්ථාන 15 ක සතිපතා වර්ෂාපතන දත්ත විශ්ලේෂණය කෙරිණි. සම්භාවිතාව 50% දී සතිපතා සමුච්චිත වර්ෂාපතනය ගණනය කෙරුණු අතර බෝග වගා නොකරන කාල සීමාවේ ආරම්භවීම සහ කාල පරාසය සොයා බැලීමට DL_{1a} කෘෂි පාරිසරික කලාපයේ කන්න දෙක අතර මැදදී වගා කිරීමට සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීමට එය යොදා ගැනුණි. Arc- view 3.2a මෘදුකාංගය ඇසුරෙන් කන්න දෙක අතර වගා නොකරන කාල සීමාවන් දෙකම සඳහා සකස් කෙරුණු සිතියම් ප්‍රයෝජනයට ගැනීම සඳහා ලබා ගත හැකිය.

ශ්‍රී ලංකාවේ මැදරට තෙත් කලාපයේ වගා කෙරෙන කෙසෙල් ප්‍රභේද දෙකේ වර්ධනය සහ අස්වනු ක්‍රියාකාරිත්වය සඳහා විවිධ තෙතමන තත්ත්වයන් ඇගයීම

විවිධ කෙසෙල් ප්‍රභේදවල වර්ධනය සහ අස්වනු ක්‍රියාකාරිත්වය කෙරෙහි වර්ෂාපතන ව්‍යාප්තියේ කාලීනසහ අවකාශමය විචල්‍යතාව සහ භූගත ජලය පිළිබඳ සිදු කළඅධ්‍යයනයට අනුව පාංශු පැතිකඩ තුළ රැඳී පවතින තෙතමනයේ විචල්‍යතාව වැදගත්වේ.

එකිනෙකට වෙනස් කෙසෙල් ප්‍රභේද දෙකෙහි (ඇඹුල් සහ ඇම්බම්) වර්ධනය සහ අස්වනු ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් විවිධ තෙතමන තත්ත්වයන් ඇගයීම සඳහා මැදරට WM_{2b}කෘෂි දේශගුණික කලාපයේ ගන්නෝරුව ප්‍රදේශයේ දියළු පසෙහි සිදු කරන ලද කෙෂත්‍ර අත්හද බැලීම නිම කරන ලදී. පැළ වර්ධනය, කෙසෙල් ගෙඩිවල බාහිර පෙනුම, අස්වනු නෙලන කාලය, කෙසෙල් කැන්වල බර, ගෙඩියේ දිග සහ වට ප්‍රමාණය සම්බන්ධයෙන් නිරීක්ෂණ සහ දත්ත එක්රැස් කිරීම සිදු කෙරිණි. මීට අමතරව, ජල සම්පාදන සහ ජල පරිවහන අවශ්‍යතාවයන්, ජලයපිරිමසාගැනීම සහ ඵලදායිතාව සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා මූල කලාපයේ ජල තුලනය පිළිබඳව ඇගයීමක් සිදු කෙරිණි. විශ්ලේෂණ සහ වාර්තාව ලිවීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

පාංශු තෙතමන සංචිතය සහ එහි අවකාශමය ව්‍යාප්තිය කෙරෙහි වැසිදිය සංරක්ෂණය කිරීම මගින් ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම.

වියළි කලාප තත්ත්වයන් යටතේ පාංශු තෙතමන සංචිතය ඉහළ නැංවීම සහ භූගත ජලය නැවත සංනෘප්ත කිරීම කෙරෙහි වැසිදිය සංරක්ෂණය කිරීම මගින් ඇතිවන බලපෑම අධ්‍යයනය කෙරිණි. ප්‍රධාන වශයෙන්ම රතුවන් දුඹුරු පසක් සහ කෘෂි දේශගුණික තත්ත්වයන්ගෙන් සමන්විත DL_{1b} කලාපයේ හුරුළුවැව දිස්ත්‍රික් ලේකම් කොට්ඨාශයේ පලුගස්වැව ප්‍රදේශයේ 2010 දී ආරම්භ කෙරුණු පර්යේෂණ කටයුතු අඛණ්ඩවම සිදු කෙරිණි. දැඩි වර්ෂාපතනය යටතේ පළමු සෙ.මී. 75 ක පාංශු ගැඹුරෙහි තෙතමන සංචිතය කෙරෙහි වැසිදිය සංරක්ෂණ ක්‍රම වලින් ඇතිවන බලපෑමේ සුවිශේෂත්වයක් නොමැති බැව් 2011 යල කන්නයේදී එක් රැස් කෙරුණු දත්ත විශ්ලේෂණයෙන් අනාවරණය වේ. මෙම පාංශු පැතිකඩ ගැඹුරේ තෙතමන ව්‍යාප්තියේ අවකාශමය විචල්‍යතාවෙහි සුවිශේෂත්වයක් නොමැත. මද වැසි සහිත කාලවලදී (RF> 10mm) පළමු සෙ.මී. 25 ක පාංශු ගැඹුරෙහි තෙතමන සංචිතය සහ එහි අවකාශමය ව්‍යාප්තිය කෙරෙහි, ක්‍රියාත්මක කරන ලද විවිධ වැසිදිය සංරක්ෂණ ක්‍රම වලින් බලපෑමක් ඇති නොවුන මුත් වර්ෂාපතනය මි.මී. 15 - 50ත් අතර පැවති විට ප්‍රතිකර්මයක් සිදු නොකළ භූමිය හා සංසඳනාත්මකව හෙල්මළු සහ සමෝච්ඡ රේඛා අනුව සැකසූ ඉවුරුවල පාංශු තෙතමනය 85% ක් ඉක්මවූ ඒකාකාරී ව්‍යාප්තියක් සහ පාංශු තෙතමන සංචිතයේ වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

බෝග ඵලදායිතාව කෙරෙහි වැසිදිය සංරක්ෂණය මගින් ඇති වන බලපෑම අධ්‍යයනය කිරීම

වර්ෂාපතනය අඩු ප්‍රදේශ වල බෝග අස්වනු කෙරෙහි වැසිදිය සංරක්ෂණය මගින් ඇති වන බලපෑම ප්‍රමාණය කිරීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කෙරිණි. පසුගිය මහ කන්නයේදී(2010/2011) එක්රැස් කෙරුණු දත්ත වලට අනුව මහ කන්නය ආරම්භයේ පැවති අඩු වර්ෂාපතනය බෝග කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී.

වවුනියාව දිස්ත්‍රික්කයේ බෝග වගාව කෙරෙහි නොගැඹුරු ජලය ඇගයීම

වවුනියාව දිස්ත්‍රික්කයේ බෝග නිෂ්පාදනය සඳහා නොගැඹුරු ජලයේ ගුණාත්මක තත්ත්වය පිළිබඳව ඇගයීම සඳහා 2011 මහ කන්නයේදී සමීක්ෂණයක් ආරම්භ කෙරිණි. එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයකින් ජල නියැදි ලබා ගත් අතර විශ්ලේෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී. මෙම වැඩසටහන අනෙකුත් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ වල 2012 වසරේදී අඛන්ඩවම සිදු කෙරෙනු ඇත.

ගෙවතු වගාව යටතේ එළවළු වගාව ඉහළ නැංවීම සඳහා එළවළු වගා ව්‍යුහයක් සකස් කිරීම

ගෙවතු වල එළවළු නිෂ්පාදනයටගෙවත්තේ ඉඩකඩ, හිරුඑළිය සහ තෙතමනය සීමාවීම සහ කුඩා සතුන්ගෙන් වන හානි මගින් බාධා පැමිණෙන බැවින් 2011 වසරේදී එළවළු වගා ව්‍යුහයක් සකස් කර පරීක්ෂාවට ලක් කරන ලදි. බෝග වගා කිරීම සඳහා මෙම ව්‍යුහයේ තට්ටු තුනක(ඉහළ, මැද සහ පහළ) බඳුන් 32ක් රැඳවිය හැකි අතර සලාද කොළ වගා කර ඒවායේහි ක්‍රියාකාරිත්වය අගයන ලදී.එක් බඳුනකින් ග්‍රෑම් 82 ක අස්වැන්නක් සහ රැක් එකකින් කි. ග්‍රෑ. 2.6 ක් එක් වරකට ලබා ගත හැකි වූ අතර ඉහළම තට්ටුවේ බඳුන් වලින් ඉහළ කොළ අස්වැන්නක්ද, මැද තට්ටුවෙන් මධ්‍යස්ථ අස්වැන්නක්ද ලබා ගත හැකි වූ අතර පහළම තට්ටුවේ බෝග අස්වැන්න කෙරෙහි සෙවන බලපා ඇති බව දක්නට ලැබිණි.

වියළි කලාපයේ කුඩා ජලාශ පද්ධති ආශ්‍රිතව යාය පදනම් කරගත් පාංශු පරීක්ෂණය

වැදගත් පාංශු පරාමිතීන් සඳහා යාය පදනම් කරගත් පාංශු පරීක්ෂණ කටයුතුද යාය බෝග සඳහා නිර්දේශ සකස් කිරීමද අඛන්ඩවම සිදු කෙරිණ.හුරුළුවැව ප්‍රදේශයේ මරදන්කැල්ල ජලාශ පද්ධතිවල කුඹුරු සඳහා වූ ක්‍රමවේදය තවදුරටත් සකස් කෙරුණු අතර සෙ.මී. 0- 20 ත් අතර ගැඹුරින් පාංශු නියැදි 30ක් මීටර් 90 කට්ටි පරතර වලින් එක්රැස් කර ගන්නා ලදුව එම නියැදිPH අගය, විද්‍යුත් සන්නායකතාව, ප්‍රයෝජ්‍ය ෆොස්ෆරස්, පොටෑසියම්, කැල්සියම් සහ මැග්නීසියම් වල නුවමාරු කළ හැකි කොටස් සින්ක්, කොපර්, සහ සල්ෆර් වල ප්‍රයෝජ්‍ය කොටස් සම්බන්ධයෙන් විශ්ලේෂණය සිදු කළ අතර තේමාගත සිතියම් සකස් කරන ලදී. ජලාශ පද්ධතිවල යායේ ඉහළ සහ පහළ කොටස් සඳහා පොහොර නිර්දේශ දෙකක් ලබාදීමේ හැකියාව පවතින බව සිතියම් මගින් අනාවරණය වූ අතර යාය ඉහළ කොටසේ සින්ක් සීමිත බවත් පහළ කොටසේ ෆොස්ෆරස් සීමිත බවත් අනාවරණය විය. මීට අමතරව, පහළ කොටසේ කැල්සියම්, මැග්නීසියම් සහ පාංශු ලවණතා ප්‍රමාණයෙන් අධික බැව් සොයා ගැනුණි. නාය යාමෙන් නිරාවරණය වූ ඉඩම් වල මතුපිට පෘෂ්ටය ආරක්ෂා කිරීම සඳහා යෝග්‍ය අඩු පිරිවැයැති ක්‍රම වේදයක් දැනට ශ්‍රී ලංකාවේ නොමැති බැවින් අඩු පිරිවැයැති ක්‍රමයක් බිහි කර 2010 වසරේ සිට පේරාදෙණිය නගරයේ නාය යන ප්‍රදේශ වල පරීක්ෂාවට ලක් කෙරිණි. මෙම අඩු පිරිවැයැති ක්‍රමයට සෙ.මී. 15ක ගැඹුරින් යුත් වර්ධන මාධ්‍යයකින් කැපුම් බෑවුම් ආවරණය කිරීම,

වර්ධන මාධ්‍ය මතුපිට පිදුරු වසුන යෙදීම, ලෝහ දැලකින් වර්ධන මාධ්‍ය සහ වසුන භූමිය මතුපිට ස්ථාපිත කිරීම, එම මාධ්‍ය මතුපිට වැල් වර්ග වර්ධනය කිරීම සහ පොහොර ජලය ආදිය යෙදීමෙන් පැළෑටි ආවරණය නඩත්තු කිරීම අයත්වේ.හදුන්වාදෙන ලද මෙම ක්‍රමය සාර්ථක වූ අතර අත්හද බැලීම 2011 වසරේදී නඩත්තු කෙරිණි. ජල සම්පාදනය, වල්පැළැටි කළමණාකරණය භූමිය මතුපිට ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙලේ ප්‍රධාන කාර්‍යයන්වේ.

සංවර්ධනය

වට්ටප්පල, පානබොක්ක සහ යක්කල ප්‍රදේශ වල ආදර්ශ ගම්මාන සංවර්ධන වැඩසටහන

2010 වසරේදී ආදර්ශ ගම්මාන සංවර්ධන වැඩසටහනක් ආරම්භ කෙරුණු අතර එම වැඩසටහන 2011 වසරේදී වට්ටප්පල, පානබොක්ක සහ යක්කල ප්‍රදේශ වල අඛන්ඩවම ක්‍රියාත්මක කෙරිණි. වට්ටප්පල සහ පානබොක්ක ප්‍රදේශවල ගොවීන් අතර කොස් සහ රඹුටන් පැළ බෙදු දුන් අතර බිම්මල් නිෂ්පාදනය, ගෙවතු වගාව සහ පාංශු සංරක්ෂණය පිළිබඳ පුහුණුව, ගොවිපළේදී කොම්පෝස්ට් සකස් කිරීමේ ආදර්ශනය, කුට්ටි කාණු සහ වෑස්සුම් කුහර ස්ථාපිත කිරීම සිදු කරන ලදී. එසේම එම ගොවීන් අතර ගුණාත්මක බිත්තර වී බෙදු දෙන ලදී. මරඳන්කඩවල ප්‍රදේශයේ ගොවීන් බුලත් සහ ගම්මිරිස් වගාව, මිරිස්වල පළිබෝධ කළමණාකරණය, අපනයන කෘෂි කාර්මික බෝග වගා කිරීම, පොහොර නිර්දේශ සඳහා පාංශු පරීක්ෂණය, පාංශු සංරක්ෂණය, කොම්පෝස්ට් සකස් කිරීම සහ සහනික කළ බීජ නිෂ්පාදනය සම්බන්ධයෙන් පුහුණු කර ඔවුන් අතර ගුණාත්මක බිත්තර වී බෙදු දෙන ලදී.

තාක්ෂණය පතුරුවාලීම

පාංශු සහ ජල සංරක්ෂණය සහ අදාල විෂයන් පිළිබඳ පුහුණු කිරීම්

- කෑගල්ල දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා වාගොල්ල ගොවිපලේදී පාංශු සංරක්ෂණය සහ ජලාධාර කළමණාකරණය පිළිබඳව දින පහේ පුහුණු දෙකක්ද, මාවිල්මඩ දුම්කොළ සමාගමේ ක්ෂෙත්‍ර නිළධාරීන් සඳහා පුහුණුවක්ද මෙහෙය විය.

- පාංශු සංරක්ෂණය පිළිබඳව ගන්නෝරුව ප්‍රදේශයේ ගොවීන් සඳහා දින තුනක පුහුණු වැඩසටහන් දෙකක්ද වගාකරුවන් සඳහා ජලාධාර කළමණාකරණය පිළිබඳ පුහුණුවක්ද කොත්මලේ ගොවීන් සඳහා පුහුණුවක්ද ලබා දෙන ලදී.

- ශ්‍රී ලංකා හඳබිම අධිකාරියේ තාක්ෂණික නිළධාරීන් සඳහා දින දෙකක වැඩසටහනක් සිදු කෙරිණි.

- මහනුවර, උකුවෙල, ඉඹුල්ගොඩයාගම, මීපිලිමාන, මුරුතලාව, නුගවෙල සහ ගම්පල යන ප්‍රදේශවලදී ක්ෂෙත්‍ර නිළධාරීන්, ගොවීන්, පාසැල් සිසුන් සහ ගුරුවරුන් සඳහා එක් දින පුහුණු වැඩසටහන් 28ක් මෙහෙය විය.

- මහව විද්‍යාලීය සිසුන් සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ පුහුණු වැඩසටහනක් මෙහෙයවිය.

- ගන්නොරුව සේවා සංස්කරණ හා අභ්‍යාස ආයතනයේදී ගුරුවරුන් සිය දෙනෙකු සඳහා ශ්‍රී ලංකාවේ පාංශු පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්විය.

- දෙළුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ප්‍රදේශවාසීන් සඳහා IFAD ව්‍යාපෘතිය යටතේ පුහුණු වැඩසටහනක් සිදු කරන ලදී.(වැඩසටහන් 5ක් සහ නිළධාරීන් 65ක්)

- රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සිසුන් සඳහා වැසිදිය සංරක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහනක් මෙහෙය විය.(සිසුන් 27)

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සඳහා ගෙවතු වගාවේදී තෙතමනය සංරක්ෂණය කිරීම පිළිබඳව පුහුණු වැඩසටහන් 2ක් සිදු කරන ලදී.(නිළධාරීන් 63)

වැඩමුළු

- 2011 මාර්තු 23 වැනි දින ගන්නෝරුව සේවා සංස්කරණ හා අභ්‍යාස ආයතනයේදී නාගරික ප්‍රජාව සඳහා ජලය යන තේමාව යටතේ ලෝක ජල දින වැඩමුළුව සාර්ථකව පැවැත්වූ අතර මෙම වැඩසටහන සඳහා 128 දෙනෙකු සහභාගි විය.

- 2011 ජූනි 06 වැනි දින බුත්තල උණවටුන පන්සලේදී ගොවීන් 78 දෙනෙකු රජයේ නිළධාරීන් සහ රජයේ නොවන සංවිධාන

වල සහභාගිත්වයෙන් ලෝක පරිසර දින වැඩසටහන සිදු කරන ලදී.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිළධාරීන් 34 දෙනෙකු සඳහා වර්ෂාපෝෂිතව වගා කෙරෙන ගොඩ ඉඩම්වල ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා හෙල්මළු සකස් කිරීම පිළිබඳ වැඩමුළු දෙකක් පැවැත්වීය.

- ගන්නෝරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී පාංශු සංරක්ෂණය පිළිබඳ වැඩමුළුවක් පැවැත්වූ අතර විවිධ පාර්ශව වල නිළධාරීන් 56 දෙනෙකු වැඩසටහනට සහභාගි විය.

- කුරුණෑගල පලාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිළධාරීන් සහ ගොවීන් (40) සඳහා වැසි දිය සංරක්ෂණය සහ ළිං ජල සම්පාදනය පිළිබඳ වැඩමුළුවක් පැවැත්විය.

පාංශු සහ ජල සංරක්ෂණය පිළිබඳ ආදර්ශන

- **ගන්නොරුව පාංශු සංරක්ෂණ ආදර්ශනය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම**

2011 වසරේදී ගන්නෝරුව කෘෂි තාක්ෂණික උද්‍යානයේ පාංශු සංරක්ෂණ ආදර්ශන භූමියේ වල් පැළෑටි පාලනය, පාංශු සංරක්ෂණ ව්‍යුහවල රොන් මඩ ඉවත් කිරීම, ජෛව විද්‍යාත්මක ව්‍යුහවල පුරප්පාඩු පිරවීම, ශෂ්‍ය විද්‍යාත්මක ව්‍යුහ නඩත්තු කිරීම වැනි වාර්ෂික නඩත්තු කටයුතු සම්පූර්ණ කෙරිණි.

- **වෙනත් ප්‍රදේශ වල සිදු කරන ලද පාංශු සංරක්ෂණ ආදර්ශන**

අනුරාධපුරයේ යකල්ල ප්‍රදේශයේදී සහ මහනුවර දිස්ත්‍රික්කයේ වට්ටප්පල සහ පානබොක්ක යන ප්‍රදේශ වලදී පාංශු සංරක්ෂණ ආදර්ශන සිදු කෙරිණි.

- **ගුවන් විදුලි වැඩසටහන්**

පාංශු සංරක්ෂණය, නාය යාමේ අවදානම අවම කිරීම, පාංශු සංරක්ෂණය පිළිබඳ සමෝධානික ප්‍රවේශය සහ ගොවි ක්ෂේත්‍රවල පාංශු සංරක්ෂණ ව්‍යුහ නඩත්තු කිරීම පිළිබඳ ගුවන් විදුලි වැඩසටහන් 4ක් මෙහෙය විය.

- **රූපවාහිනී වැඩසටහන්**

උඩරට ප්‍රදේශයේ ගෙවතු වල ඵලවළු වගාව ඉහළ නැංවීම සඳහා OK තාක්ෂණය (Over Knee Technology), පාංශු සංරක්ෂණය, ඉහළ වටිනාකමකින් යුත් පලතුරු වගාව ඉහළ නැංවීම සහ එම ගෙවතුවල විවිධත්වය සම්බන්ධයෙන් රූපවාහිනී වැඩසටහන් 04ක් සකස් කර රූපවාහිනී නාලිකාවේ රට නගන ගොවි ගෙදර වැඩසටහනින් විකාශනය කෙරිණි.

- **පාංශු සංරක්ෂණ පනත පිළිබඳව දැනුවත් කිරීම සඳහා දැන්වීම් පුවරු**

පාංශු සංරක්ෂණ පනත පිළිබඳව දැනුවත් කිරීම සඳහා සංරක්ෂණ ප්‍රදේශය තුළ ස්ථාන 6ක දැන්වීම් පුවරු 6ක් ස්ථාපිත කරන ලදී..

- **තාක්ෂණික සහාය**

සේවාදායකයින් සඳහා තාක්ෂණික සහාය ලබා දීම සහ නොයෙක් නියෝජිතායතන වල සංවර්ධන කටයුතු සඳහා සහාය සේවා ලබා දීම මෙම මධ්‍යස්ථානයේ එක් ප්‍රධාන කාර්‍යයක් වන අතර 2011 වසරේදී පහත දැක්වෙන තාක්ෂණික සහායන් සහ සේවාවන් ලබා දෙන ලදී.

- අඹේපුස්ස බීජ නිෂ්පාදන ගොවිපලේ ජල සම්පාදන කාර්‍යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා දැනට සිදු කෙරෙන ඇල මාර්ගයෙන් ජල සම්පාදනය කිරීම වෙනුවට හෝස් බට යොදාගෙන ජල සම්පාදනය කිරීම සිදු කෙරිණි. මෙම ක්‍රමය වගා බිම් වල තිබෙන හෙල්මළු සහ පාංශු වර්ග පාදකව සකස් කෙරුණු අතර වගා බිම්වල, විශේෂයෙන්ම, ගොවිපලේ දියළු පසේ කලින් කලට ඇති වන ජලාපවහන ගැටළු වලට විසඳුමක් ලෙස පිටාර ජල කළමනාකරණ සැලැස්මක් සහ ක්ෂේත්‍ර අගල් සැලසුම් කරන ලදී. ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා කාර්‍යක්ෂම පාංශු සංරක්ෂණ ක්‍රම හඳුනා ගැනීම සහ සීමා මායිම් ලකුණු කළ අතර කාර්‍යක්ෂම ජල කළමනාකරණය වැඩිදියුණු කිරීම සිදු කෙරිණි.

- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) මගින් තෝරාගත් රජයේ නොවන සංවිධාන තුනක් හරහා අන්තර්ජාතික සංවර්ධනය සඳහා ඕස්ට්‍රේලියානු නියෝජිතායතනයෙන්(AUS

Aid) ලබා දුන් මූල්‍යාධාර යොදා ගනිමින් UNDP/SGP වැඩසටහනේ දේශගුණික විපර්යාසයන්ට ප්‍රජා පාදක අනුවර්තනය වීමේ ව්‍යාපෘතිය යටතේ පහත දැක්වෙන ව්‍යාපෘති සාර්ථකව සම්පූර්ණ කර ගැනීම සඳහා තාක්ෂණික සහාය ලබා දුණි.

වගු අංක :3.5.2: - 2011 වසරේදී සිදු කරන ලද ව්‍යාපෘති

ව්‍යාපෘතිය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	පිරිවැය රු.මිලියන
IL_3කෘෂි පාරිසරික කලාපයේ වැවක් පුනරුත්තාපනය කිරීම කුරුණෑගල	200	3.5
IM1 c කෘෂිපාරිසරික කලාපයේ පාංශු සහ ජල සංරක්ෂණය මගින් ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීම සහ හායනය වූ ඉඩම් වලට විකල්ප ජීවනෝපාය ක්‍රම සපයා දීම නුවර එළිය	100	4.0
WL_{1a} කෘෂි කාලගුණික කලාපයේ ජල ගැල්මට ලක්වන කුඹුරු ඉඩම් වල ඵලදායිතාව ඉහළ නැංවීම - රත්නපුරය	400	4.1

- නිල්ලඹ රජයේ ගොවිපලේ ඉඩම් සංවර්ධනය සහ පාංශු සංරක්ෂණය සඳහා තාක්ෂණික උපදෙස් ලබා දෙන ලදී.
- අඹේපුස්ස ගොවිපළ සඳහා පාංශු සංරක්ෂණ සැලැස්ම සකස් කෙරිණි.
- කන්තලේ ගොවිපලේ ඉඩම් සංවර්ධනය සඳහා සැලැස්මක් සහ ඇස්තමේන්තුවක් සකස් කෙරිණි.
- ගල්කුලම ගොවිපලේ ඉඩම් සංවර්ධනය සහ ඉඩම් යෝග්‍යතා සමීක්ෂණය සම්පූර්ණ කෙරිණි.
- උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ උල්පොතගම ගොවිපළට කෘෂි ළිඳක් ස්ථාපිත කිරීම සඳහා ස්ථානයක් සොයා ගැනීමට තාක්ෂණික සහාය ලබා දුන් අතර සැලැස්මක් නිර්මාණය කරන ලදී.
- බණ්ඩාරගම වාණිජ ගොවිපළක් සඳහා ඉඩම් යෝග්‍යතා සමීක්ෂණය සම්පූර්ණ කළ අතර බෝග නිර්දේශ වාර්තාවක් සකස් කරන ලදී.
- මොරගහකන්ද/ කළුගඟ ව්‍යාපෘතියේ නිරාවිය සහ මොරගහකන්ද ගොවිපළ සඳහා පාංශු සහ ඉඩම් යෝග්‍යතා සමීක්ෂණය සම්පූර්ණ කර බෝග නිර්දේශ කිරීමේ වාර්තාව සකස් කරන ලදි.
- IFAD ව්‍යාපෘතිය මගින් දොළුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ සඳහා ඉඩම් යෝග්‍යතා සමීක්ෂණය සම්පූර්ණ කෙරිණි.
- හොරණ පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ පාංශු සහ ඉඩම් යෝග්‍යතා සමීක්ෂණය සම්පූර්ණ කළ අතර පාංශු සිතියම් සහ බෝග නිර්දේශ වාර්තා සකස් කෙරිණි.
- කන්තලේ සහ මීපිලිමාන ගොවිපළ සඳහා බෝග නිර්දේශ වාර්තා සකස් කෙරිණි.
- ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානයේ ඉල්ලීම මත අන්තර්පලාත් ප්‍රදේශ වල විස්තර සංඛ්‍යාංකනය කරන ලද සිතියම් සකස් කෙරිණි.

ප්‍රදර්ශන

- ප්‍රදර්ශන භාණ්ඩ සහ පාංශු සංරක්ෂණය පිළිබඳ සහ ස්භාවික සම්පත් කළමනාකරණ නිළධාරීන් ප්‍රදර්ශන තුනකට සහභාගි විය. බුත්තල දැයට කිරුළ වැඩසටහන, පාංශු සංරක්ෂණය සම්බන්ධව රත්තොට මහ විද්‍යාලය සහ මහනුවර සීතාදේවී පාසැල

වෙනත් කාර්‍යයන්

පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම

මෙම මධ්‍යස්ථානයේ දැනට භාවිතයේ තිබෙන පාංශු සංරක්ෂණ පනත වෙනුවට නව පනතක් ඉදිරිපත්

කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර නව පනතේ කෙටුම්පත මේ වන විට සම්පූර්ණ කර ඇත. ''පාංශු සංරක්ෂණ සහ ඉඩම් ඵලදායිතා ආරක්ෂණ පනත'' මැයින් වූ නව පනත මුල් පනත හා සංසඳනාත්මකව පුළුල් කාර්‍ය පරාසයක් ආවරණය කරනු ලබයි. අදාළපාර්ශව වල නියෝජිතායතනයන්හි පුද්ගලයන් 50 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ගන්නෝරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී එක්දින වැඩමුළුවක් පැවැත් වූ අතර එහිදී ඉදිරිපත් කෙරුණු යෝජනා කෘෂිකර්ම අමාත්‍යංශය හරහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා සූදානම් කර ඇත.

කෘෂි කාලගුණික නිරීක්ෂණ ජාලය නඩත්තු කිරීම.

ජාතික ප්‍රමිතියට අනුකූලව දිවයින පුරා පිහිටුවා ඇති වර්ෂාමාපන ස්ථාන 85 ක් සහ කෘෂි කාලගුණික නිරීක්ෂණ ස්ථාන 29ක් අයත් කෘෂි කාලගුණික නිරීක්ෂණ ජාලය නඩත්තු කෙරිණි.

තාක්ෂණික කමිටු තුළ නියෝජනය කිරීම

2011 වසරේදී ස්භාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානයේ කාර්‍ය මණ්ඩලය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් ලෙස පහත දැක්වෙන කමිටු වලට සහභාගි විය.

- ජාතික තේමාගත පර්යේෂණ වැඩසටහන (NTRP) - දේශගුණික විපර්යාස, ජාතික විද්‍යා පදනම
- නියඟය මගින් ඇතිවන බලපෑම අවම කිරීම සඳහා වූ ජාතික සැලැස්ම සකස් කිරීම පිළිබඳ උපදේශක කමිටුව, ආපදා කළමණාකරණ අමාත්‍යංශය
- යොජිත උමා ඔය බහු කාර්‍ය සංවර්ධන ව්‍යාපෘතියේ තාක්ෂණික ඇගයීම් කමිටුව
- මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය, කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය, ගැටඹේ කුඩා ජල ව්‍යාපෘතිය, හල්දුම්මල ගොල්ෆ්පිටිය සහ විලා ව්‍යාපෘතිය, ගොහාගොඩ ඝන අපද්‍රව්‍ය ඉවත් කිරීමේ සංවර්ධන ව්‍යාපෘතිය, ඉඩම් කට්ටි කිරීම සහ හෝටල් ව්‍යාපෘති (35), ගල් වලවල් (40), කුඩා ජල විදුලි බල ව්‍යාපෘති (25), සහ ගස් කැපීමේ ව්‍යාපෘති (27) වැනි විවිධ ජාතික සහ කලාපීය ව්‍යාපෘති සඳහා පාරිසරික අනුමැතිය ලබා දීමේ කමිටු

2011 වසර සඳහා සැලැස්ම

පර්යේෂණ

- කන්න දෙකේදීම එකම ඉඩම් වගා කිරීම සඳහා කාර්‍යක්ෂම ජල කළමණාකරණ පිළිවෙත් හඳුන්වා දීම.
- කන්න අතර වගා කිරීම සඳහා යෝග්‍ය ඉඩම් හඳුනා ගැනීම.
- බෝග නිර්දේශයේ සංඛ්‍යාංක පිටපත සකස් කිරීම
- ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා තෙත් කලාපයේ කුඹුරු ඉඩම් සිතියම්ගත කිරීමට හඳුනා ගැනීම.
- ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් බෝග පුරෝකථන ඇගයීම
- යෝග්‍ය ස්භාවික සම්පත් කළමණාකරණ ශිල්ප ක්‍රම බිහි කිරීම
- ශ්‍රී ලංකා පාංශු සිතියම වැඩිදියුණු කිරීම(උතුරු පලාතේ සංඛ්‍යාංක පාංශු ශ්‍රේණි සිතියම)
- පහත රට තෙත් කලාපයේ ජලාපවහන කළමනාකරණ පිළිවෙත් ඇගයීම
- වවුනියාව දිස්ත්‍රික්කයේ නොගැඹුරු ජලය සහ ජල තත්වය ඇගයීම
- නියඟය මගින් ඇතිවන බලපෑම අවම කිරීම සඳහා භූමිය පාදක ශිල්පක්‍රම බිහි කිරීම
- පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම

තාක්ෂණය පතුරුවා ලීම

- පාංශු ජල සංරක්ෂණ ශිල්ප ක්‍රම පතුරුවාලීම.
- ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික කලාප සිතියමේ (2003) දෙවන පිටපතෙන් පිටපත් 3,000 ක් නැවත මුද්‍රණය කෙරිණි.
- ''ශ්‍රී ලංකාවේ වර්ෂාපතනය සහ කෘෂි පාරිසරික කලාප''(2008)නම් වූ සිංහල පොතේ පිටපත් 2,500 ක් නැවත මුද්‍රණය කෙරිණි.

- පාංශු සංරක්ෂණය සහ අනෙකුත් ස්භාවික සම්පත් කළමණාකරණය පිළිබඳ නිළධාරීන් සහ ගොවීන් පුහුණු කරන ලදී.

- පාංශු සංරක්ෂණ සහ ජල සංරක්ෂණ ක්‍රම ආදර්ශනය

තාක්ෂණික සහාය

- සංවර්ධන ව්‍යාපෘති සඳහා පාංශු සංරක්ෂණ සහ පිටාර ජල සහ ජලාපවහන කළමනාකරණ සැලැසුම් සකස් කිරීම.

- විවිධ නියෝජිතායතන වලට පාංශු සහ ජල සංරක්ෂණය පිළිබඳව තාක්ෂණික සහාය ලබා දීම.

වෙනත් කාර්‍යයන්

- පාංශු පනත ක්‍රියාත්මක කිරීම

- කෘෂි කාලගුණික නිරීක්ෂණ ජාලය නඩත්තු කිරීම

- සංවර්ධන ව්‍යාපෘති සහ පාරිසරික මෙහෙයුම් කමිටු සඳහා පාරිසරික අනුමැතිය ලබාදීමේ තාක්ෂණික කමිටුවල නියෝජනය කිරීම

කාර්‍ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
අතිරේක අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිළධාරි	09
කෘෂිකර්ම නිළධාරි	02
විෂයානු බද්ධ විශේෂඥ	01
පර්යේෂණ සහකාර	02
කෘෂිකර්ම උපදේශක	08
වැඩසටහන් සහකාර	03
පස් සමීක්ෂක	05
පර්යේෂණ උප සහකාර	01
කළමනාකරණ සහකාර සේවය	07
කාර්යාල කාර්‍ය සහායක	01
රියදුරු	06
මුරකරු	02
කම්කරු	03
එකතුව	**51**

3.6 ව්‍යාප්ති සහ පුහුණු අංශය - පේරාදෙණිය

ව්‍යාපෘතිය, පුහුණුව, සන්නිවේදනය සහ කෘෂිකර්ම අධ්‍යාපනය හා විභාග යන ප්‍රධාන අංශ 4 කෙරෙහි මෙම අංශයේ කාර්‍යභාරය කේන්ද්‍රගත කර ඇති අතර අදාළ ඒකක මගින් මෙම අංශයේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා පහත සඳහන් කාර්‍යයන් ඉටු කරනු ලැබේ.

- අන්තර් පලාත් ඒකක 6 විසින් ප්‍රධාන ජල සම්පාදන කාලාපවල සිදු කරන සෘජු ව්‍යාප්ති වැඩසටහන්
- පලාත් සහ මහවැලි ප්‍රදේශ සමඟ එක්ව සිදු කරන සහයෝගිතා ව්‍යාප්ති වැඩසටහන්
- ව්‍යාප්ති කාර්‍ය මණ්ඩලය, ගොවීන්, ව්‍යවසායකයින්, සහ අනෙකුත් පුද්ගලයන් සඳහා සේවා සංස්කරණ අභ්‍යාස මධ්‍යස්ථාන තුනෙහි,දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන දෙකෙහි සහ ගොවිපළ යාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථානයෙහි පුහුණු වැඩසටහන් පැවැත්වීම
- කුණ්ඩසාලේ, පැල්වෙහෙර, අඟුණකොළ පැලැස්ස, වවුනියාව සහ කරපිංච කෘෂිකර්ම විද්‍යාලවල දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම
- ගුවන් විදුලි ගොවි සේවා ඒකක 4, ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය, මුද්‍රණාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් විද්‍යුත් සහ මුද්‍රිත මාධ්‍ය උපයෝගී කරගෙන තොරතුරු එක්රැස් කිරීම කළමණාකරණය සහ බෙදා හැරීම.
- ජංගම ව්‍යාප්ති වැඩසටහන් සහ තරුණ ගොවි සමාජ කටයුතු පැවැත්වීම
- මී මැසි සංවර්ධන ඒකක දෙකෙහි කෘෂිකර්ම සංවර්ධන කටයුතු කිරීම
- පැළෑටි පෝෂණය සහ කාබනික කෘෂිකර්ම ඒකකය විසින් කාබනික වගා වැඩසටහන් මෙහෙයවීම
- කෘෂි ව්‍යාපාර සංවර්ධන, වෙනත් ක්ෂේත්‍ර බෝග සංවර්ධන වැඩසටහන් සහ කාන්තා කෘෂි ව්‍යාප්ති කටයුතු කිරීම
- විශේෂ පුහුණු මධ්‍යස්ථාන වලින් කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහායකවරුන් සඳහා පුහුණු වැඩසටහන් මෙහෙය වීම.

අයවැය

වගු අංක :3.6.1 වාර්ෂික අයවැය - 2011 (රු .මිලියන)

වැය ශීර්ෂය	**ප්‍රතිපාදනය**	**වියදම**	**වියදම %**
මූලධන	82.21	60.27	73
පුනරාවර්තන	136.98	128.89	94
කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ සිදුකෙරෙන විශේෂ ව්‍යාපෘති			
• පුහුණුව සහ කුසලතා වර්ධනය	10.00	10.00	100
• කෘෂිකාර්මික පුහුණු ගොවිපළ	17.00	15.33	90
• මාධ්‍ය වැඩසටහන්	20.00	19.93	100
අමාත්‍යංශ වැය ශීර්ෂය යටතේ සිදුකෙරෙන විශේෂ ව්‍යාපෘති			
‘‘අපි වවමු රට නගමු’’ වැඩසටහන			
• ‘‘අපි වවමු රට නගමු’’ වැඩසටහන යටතේ මාධ්‍ය වැඩසටහන්	10.00	9.15	91
• සහල් ඵලදායිතාව ඉහළ නැංවීම	1.00	0.88	88
• කෘෂිකර්ම විද්‍යාලවල මුඩු බිම් වගා කිරීමෙන් දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම	0.50	0.45	90
• පලතුරු සහ එළවළු වගා වලින් ඉහළම අස්වනු නෙලා ගැනීම සඳහා	9.00	7.66	85
• බීජ නිෂ්පාදනය සඳහා බඩඉරිඟු වගා කිරීම	0.36	0.27	75

• කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය	41.07	31.05	76
• වවුනියාව කෘෂිකර්ම විද්‍යාලීය සංවර්ධන වැඩසටහන	10.26	8.89	87
• නව ප්‍රදේශ වල සහ අවාරයේදී ලොකු ලූණු සහ රතු ලූණු වගා කිරීම	4.07	2.46	60
• අන්තර් පලාත් ප්‍රදේශ වල රනිල බෝගය කන්න අතර වගා කිරීම	13.00	12.06	93
• අන්තර් පලාත් ප්‍රදේශ වල වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීම	6.61	2.90	44
• ආදර්ශ ගම්මාන වැඩසටහන්	28.1	9.92	35
එකතුව	**390.16**	**350.11**	**90**

ප්‍රගතිය

විශේෂ ව්‍යාපෘති

1. පුහුණුව සහ කුසලතා වර්ධනය

- කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහායක පුහුණු මධ්‍යස්ථානයන්හි පුහුණු කිරීම් සහ කුසලතා වර්ධනය

  2011 වසරේදී,සිසුන් 270 දෙනෙකු එක් අවුරුදු ප්‍රායෝගික කෘෂිකර්ම පුහුණුව සමත් වූ අතර (කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහාකාරවරුන් සඳහා වූ පුහුණුව) සිසුන් 229 දෙනෙකු පුහුණු කෙරෙමින් පවතී.

- කෘෂිකර්ම විද්‍යාලයන්හි පුහුණු කිරීම් සහ කුසලතා වර්ධනය

මෙම ව්‍යාපෘතිය යටතේ කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉගැන්වීමේ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා රු:මිලියන 1.417 ක් වටිනා නව ආම්පන්න සහ පුස්තකාල පොත් ලබාදුන් අතර අළුතින් බඳවා ගත් ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ නිලධාරීන්ගේසේවාරම්භක පුහුණුව සඳහා රු මිලියන 1.583ක් වැය කෙරිණි.

- නිලධාරීන් 11 දෙනෙකු සඳහා විදේශ පුහුණු වැඩසටහන් (තායිලන්තයේ) සිදු කෙරිණි.

2. කෘෂිකාර්මික පුහුණු ගොවිපළ

කෘෂිකර්ම විද්‍යාල,සේවා සංස්කරණ අභ්‍යාස ආයතන සහ දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයන්හි ගොවි බිම් වැඩිදියුණු කිරීම සඳහා රු. මිලියන 17ක් වැය කෙරිණි.

3. මාධ්‍ය වැඩසටහන

මෙම ව්‍යාපෘතිය යටත් රූපවාහිනී වැඩසටහන් 99ක නිෂ්පාදනය, සංස්කරණය සහ විකාශනයත්,ගුවන් විදුලි වැඩසටහන් 1277ක නිෂ්පාදනය, සංස්කරණය සහ විකාශනයත්, තාක්ෂණික ප්‍රකාශන පොත් වර්ග 3ක් (පිටපත් 4825ක්), තාක්ෂණික අත්පත්‍රිකා- එක් වර්ගයකින් (පිටපත් 6000ක්), පෝස්ටර්-එක් වර්ගයකින් (පිටපත් 6000ක්), සහ අත්පත්‍රිකා වර්ග දෙකක්(පිටපත් 10500ක්) සහ වෙනත් මුද්‍රණ/දෙකකින් පත්‍රිකා(පිටපත් 3080ක්) මුද්‍රණය කර බෙදා හරින ලදී

4. කෘෂි තාක්ෂණික උද්‍යාන- ගන්නෝරුව සහ බට අත

කෘෂි උද්‍යාන පහත දැක්වෙන පරමාර්ථයන් සඳහා නඩත්තු කෙරේ

- සජීවී නියැදි හරහා ගොවීන් වෙත තාක්ෂණය ලබා දීම.
- නව සහ පැරණි කෘෂිකාර්මික තාක්ෂණික ශිල්ප ක්‍රම ආදර්ශනය කිරීම.
- දේශිය සහ විදේශිය සංචාරකයන් සඳහා කෘෂි සංචරණය ප්‍රවර්ධනය කිරීම.
- කෘෂිකර්මය පිළිබඳ තාක්ෂණික තොරතුරු සහ උපදෙස් බෙදා හැරීමේ වැඩසටහනක් ලෙස කටයුතු කිරීම.

2011 වසර තුළදී, ගන්නෝරුව සහ බටඅත කෘෂි උද්‍යාන නැරඹීම සඳහා පුද්ගලයින් 138,301 දෙනෙකු පැමිණි අතර රු මිලියන 2.13 ක ආදායමක් උපයා ගන්නා ලදී.

5. සහල් සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් අරමුදල් ප්‍රතිපාදනය කරන ලද අතර රු: මිලියන එකක් අන්තර් පලාත් ප්‍රදේශ වල සිදු කෙරෙන වී වගාවේ ඵලදායිතාව හා වර්තමානයේ බෙහෙවින් වැදගත් අදාළ විෂයන් කීපයක් සඳහා යොදවන ලදී. වසර අගදී රු:මිලියන 0.89 ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා විය.

වගු අංක :3.6.2. සහල් සංවර්ධන වැඩසටහන යටතේ සිදු කරන ලද කාර්‍යයන්ගේ ප්‍රගතිය

විෂය	මූල්‍ය ප්‍රගතිය (රු:මිලියන)
කොපු මයිටාවන් පාලන වැඩසටහන	0.141
නිළධාරීන් සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පුහුණුව	0.129
නව අභිජනන ආර සඳහා අනුවර්ත්‍යතා පරීක්ෂණ	0.099
නව තාක්ෂණය බෙදා හැරීමේ කටයුතු	0.510
එකතුව	**0.879**

6. කෘෂිකර්ම විද්‍යාලවල මුඩුබිම් වගා කිරීම මගින් දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීම

වගා නොකරන ලද ඉඩම් අක්කර 6ක් මෙම ව්‍යාපෘතිය යටතේ වගා කරන ලදී

7. පලතුරු සහ එළවළු වගා වලින් ඉහළ අස්වනු ලබා ගැනීම සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරීම

ක්ෂුද්‍ර ජල සම්පාදන තාක්ෂණය හඳුන්වාදීම මගින් පලතුරු සහ එළවළු වගාවන්හි ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා සහන මිළ ගණන් යටතේ ගොවීන්ට ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති 145ක් ලබා දුන් අතර නිලධාරීන් සහ ගොවීන් සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් 25ක් සිදු කෙරිණි.

8. බීජ නිෂ්පාදනය සඳහා බඩ ඉරිඟු නිෂ්පාදනය කිරීම

බඩ ඉරිඟු අක්කර 7ක් මෙම ව්‍යාපෘතිය යටතේ වගා කරන ලදී.

9. කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය

මෙම වැඩසටහන යටතේ ඒකාබද්ධ පැළෑටි පෝෂණ ක්‍රියාවලිය පිළිබඳ ආදර්ශන 3314ක් ස්ථාපිත කළ අතර පුහුණු වැඩසටහන් 50ක් සහ පාංශු නියැදි 6625 ක පරීක්ෂණ සිදු කෙරිණි. එසේම රූපවාහිනී වැඩසටහන් 14ක් සහ ගුවන්විදුලි කෙටි පණිවිඩ 5520ක් විකාශනය කරන ලදී.

10. වවුනියාවේ කෘෂිකර්ම විද්‍යාල සංවර්ධන වැඩසටහන

වවුනියාවේ කෘෂිකර්ම විද්‍යාලයේ සංවර්ධන කටයුතු සඳහා රු:මිලියන 8.89ක්ද ගොවි සතිය සඳහා ප්‍රදර්ශන භූමිය සංවර්ධනය කිරීමට රු: මිලියන 0.815 ක්ද වැය කරන ලදී.

11. ලොකු ලූනු සහ රතු ලූනු වගා කිරීම

නව ප්‍රදේශ වල සහ අවාරයේදී මෙම විශේෂ ව්‍යාපෘතිය යටතේ අක්කර 9.5 කට රතු ලූනු සහ අක්කර 2කට රතු ලූනු බීජ සැපයූ අතර රතු ලූනු ආදර්ශන 197ක් සහ බී ලූනු ආදර්ශන 194ක් ස්ථාපිත කිරීමත් අක්කර 13. 625 කට බී ලූනු සත්‍ය බීජ සැපයීමත් සිදු කරන ලදී.

12. අන්තර් පලාත් ප්‍රදේශ වල කන්නය මැද රනිල වගා කිරීම

මෙම වැඩසටහන යටතේ හෙ. 7,524ක් වගා කෙරිණි. මුං,සෝයා බෝංචි සහ මෙන්රි වගා කළ ප්‍රධාන බෝගයන්ය.

13. අන්තර් පලාත් ප්‍රදේශ වල වෙනත් ක්ෂේත්‍ර බෝග වගාව

මෙම වැඩසටහන යටතේ හෙ:7,524ක් සඳහා බීජ සහ අනෙකුත් යෙදවුම්ද තාක්ෂණික සහායද ලබා දෙනලදී.

14. ආදර්ශ ගම්මාන වැඩසටහන්

ආදර්ශ ගම්මාන 281ක් ස්ථාපිත කළ අතර ගොවීන් 13,981 දෙනෙකුට බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා දීම

සහ ආදර්ශන 5,252ක් ස්ථාපිත කිරීම මෙන්ම පුහුණු පංති/ ක්ෂෙත්‍ර දින/ ක්ෂෙත්‍ර චාරිකා 2,247ක්ද මෙම වැඩසටහන යටතේ සිදු කෙරිණි.

අන්තර් පලාත් වල ව්‍යාප්ති කටයුතු

අනුරාධපුර,පොළොන්නරුව, අම්පාර, මොණරාගල, හම්බන්තොට සහ මහනුවර යන අන්තර් පලාත් හය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පුහුණු අංශය යටතේ ක්‍රියාත්මක වන අතර 2011 වසරේදී සාක්ෂාත් කර ගන්නා ලද කාර්‍යඵල පිළිබඳව පහත දැක්වේ.

- 2010/2011 මහ සහ 2011 යල කන්නයේ දී වී වගා වපසරිය පිළිවෙළින් හෙ.194,612 ක් සහ හෙ 141,886 විය. අන්තර් පලාත් ප්‍රදේශ වල 2009/2010 මහ සහ යල කන්න වලට සාපේක්ෂව මෙම කන්න දෙකේ වී වගා වපසරියේ පිළිවෙළින් හෙ:33,887 ක සහ හෙ.15,620 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

- 2010/2011 මහ සහ 2011 යල කන්න වලදී රතු ලූනු, ලොකු ලූනු, බඩ ඉරිඟු. මුං, රටකජු, තල. කව්පි, සෝයා බෝංචි, මිරිස්, කුරක්කන් සහ උඳු යන ක්ෂෙත්‍ර බෝග පිළිවෙළින් හෙ. 43,547 ක සහ හෙ.11,344 ක වගා කෙරිණි. අන්තර් පලාත් ප්‍රදේශ වල 2009/2010 මහ සහ යල කන්න වලදී වගා සිදු කළ වපසරිය පිළිවෙළින් හෙ.1909ක් සහ හෙ. 21.496ක් විය. මෙම සුවිශේෂී සාධනයට හේතු වූයේ තුන්වැනි වගා කන්නයක් වගා කිරීමයි.

- 2011 වසරේදී යල සහ මහ කන්න වල අතර මැද ප්‍රධාන වශයෙන් මුං වගාව කේන්ද්‍ර කරගෙන තුන්වන බෝග වගා කන්නයක් සිදු කෙරිණි. බෝග නිෂ්පාදනයේ නවමු මානයක් ලබා දෙමින් මෙම බෝග වගා කන්නයේදී හෙ.ට කි. ග්‍රෑ. 750ක සාමාන්‍ය අස්වැන්නක් ගෙන දුණි.

සහල් අංශය සංවර්ධනය කිරීමේ වැඩසටහනේ ප්‍රගතිය

2011 වසරේදී ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනය මෙ.ටො. මිලියන 3.8 ක් ලෙස වාර්තා විය. මේ සඳහා 2010/11 මහ කන්නයෙන් මෙ.ටො. මිලියන 2.0 කින් සහ 2011 යල කන්නයෙන් මෙ.ටො. 1.8 කින් දායකත්වය ලැබුණි. 2010/11 මහ කන්නයේ සහ 2011 යල කන්නයේ වී වගා කළවපසරිය පිළිවෙළින් හෙ.613,492 ක් සහ හෙ. 477,577ක් විය. 2010 යල කන්නය හා සාපේක්ෂව 2011 යල කන්නයේ වී වගා වපසරියේ 13.9% ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

එහෙත් ප්‍රධාන වශයෙන්ම වී නිෂ්පාදනය කරන ප්‍රදේශ වල,විශේෂයෙන්ම, නැගෙනහිර, උතුරු සහ උතුරු මැද පලාත් වලට 2011 වසරේ මුල් මාසවලදී(ජනවාරි සහ පෙබරවාරි) ඇද හැලුණු අධික වර්ෂාව, ගංවතුර තත්ත්වයන්ට හේතු විය. ගං වතුරින් හානියට පත් වපසරිය හානියට පත් තීව්‍රතාව අනුව 100% ,75% ,50, සහ 25% ක් වන අතර පිළිවෙළින් මෙය හෙ. 146,451ක්, හෙ: 25,602ක්, හෙ:26,030ක්, සහ හෙ: 17,802ක් වේ.ගංවතුර හේතුවෙන් සෘජුවම මෙ.ටො. මිලියන 0.15ක වී අස්වැන්නක් හානියට පත් වූ අතර තවත් මෙ.ටො. මිලියන 0.36ක වී අස්වැන්නක් අහිතකර කාළගුණික තත්ත්වයන් හේතුවෙන් විනාශයට පත්විය.

සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය ගන්නෝරුව

ගන්නෝරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය ජාතික මට්ටමේ ප්‍රධාන කෘෂිකාර්මික අභ්‍යාස ආයතනය වන අතර කෘෂිකර්ම නිලධාරීන්, ව්‍යවසායකයින්,ගොවීන් සහ කෘෂිකර්මාන්තය කෙරෙහි උනන්දුවක් දක්වන වෙනත් පාර්ශ්වකරුවන්ගේ දැනුම, හැකියාවන්සහ ආකල්ප වර්ධනය කිරීමේ වගකීම දරයි.

2011 වසරේදී පුහුණු වැඩසටහන් 328ක් (මිනිස් දින 22.713ක්) සිදු කළ අතර මෙයට නිලධාරීන් සඳහා වැඩසටහන් 70ක් (මිනිස් දින 11,251ක්), ගොවීන් සඳහා වැඩසටහන් 10ක් (මිනිස් දින 577ක්) සහ ක්ෂෙත්‍ර පුහුණු වැඩසටහන් 101 ක් (මිනිස් දින 2,085) ඇතුළත් විය. එමෙන්ම, වැඩමුළු/ සම්මන්ත්‍රණය/රැස්වීම්/සාකච්ඡා 124ක්(මිනිස් දින 8,507ක්) සහ ආයතනයෙන් පිටත පුහුණු කිරීම් 3ක් (මිනිස් දින 293ක්) සිදු කෙරිණි.

සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - අඟණකොළපැලැස්ස

මෙම ආයතනය මගින් ගාල්ල,මාතර ,හම්බන්තොට, යන පලාත් දිස්ත්‍රික්කවල සහ හම්බන්තොට අන්තර් පලාතේ, නිලධාරීන්,ව්‍යවසායකයින්,ගොවීන් සහ කෘෂිකර්මය පිළිබඳ උනන්දුවක් දක්වන අනෙකුත් පුද්ගලයන් සඳහා සේවාස්ථ පුහුණුව ලබාදේ.මෙම වසරේදී පුහුණු වැඩසටහන් 91ක්(මිනිස් දින 4633) මෙහෙය වූ අතර ඊට නිලධාරීන් සඳහා වැඩසටහන් 33ක්(මිනිස් දින 2808) සහ ගොවීන් සඳහා වැඩසටහන් 41 ක් (මිනිස් දින 935 ක්), ඇතුලත් විය. එසේම , වැඩමුළු /සම්මන්ත්‍රණ / රැස්වීම්/ සාකච්ඡා 3 ක් (මිනිස් දින 94), ක්ෂෙත්‍ර පුහුණු වැඩසටහන් 11ක් (මිනිස් දින 688ක්) සහ

ආයතනයෙන් පිටත පුහුණු පන්ති 3ක්(මිනිස් දින 108ක්) පැවැත්විය.

මීට අමතරව, සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයෙහි ස්ථාපිත කර තිබෙන පසු අස්වනු සහ සැකසුම් ඒකකය මගින් නිළධාරීන්, සහ සුළු සහ මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින් සඳහා ආහාර තාක්ෂණය ලබා දේ.

සේවා සංස්කරණ අභ්‍යාස ආයාතනය, හංසයාපාලම - අරලගංවිල

මෙම ආයතනය විශේෂයෙන්ම මහවැලි බී,සී, ඩී සහ ජී කලාප වල ගොවීන් සහ නිලධාරීන් සඳහා සේවය ලබා දේ. එමෙන්ම මහවැලි කෘෂිකාර්මික ප්‍රදේශඅම්පාර, පොළොන්නරුව මහියංගනය සහ මඩකලපුව යන ප්‍රදේශවල විශේෂයෙන් හඳුනාගත් ගැටළු නිරාකරණය කිරීම සඳහා වැඩසටහන් මෙහෙයවනු ලබයි. 2011 වසරේදී, පුහුණු වැඩසටහන් 67ක් (මිනිස් දින 2514) මෙහෙය වූ අතර ඊට නිළධාරීන් සඳහා වැඩසටහන් 31ක් (මිනිස් දින 1324ක්), ගොවීන් සඳහා වැඩසටහන් 03ක් (මිනිස් දින 122 ක් සහ ක්ෂෙත්‍ර පුහුණු වැඩසටහන් 33ක් (මිනිස් දින 1068ක්) ඇතුළත් වේ.

ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය(FMTC)

අනුරාධපුරයේ පිහිටුවා තිබෙන ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය ගොවිපළ යාන්ත්‍රීකරණය පිළිබඳ මෙරට ජාතික මට්ටමේ තිබෙන එකම පුහුණු ආයතනයයි.

මෙම මධ්‍යස්ථානය වෙත පැවරී තිබෙන පුහුණු කිරීමේ කටයුතු ප්‍රධාන වශයෙන් පහත දැක්වෙන අංශ කේන්ද්‍ර කරගනී.

- රෝද හතරේ ට්‍රැක්ටර් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම - දින 10
- රෝද දෙකේ ට්‍රැක්ටර් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම - දින 052
- වතුර පොම්ප ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම - දින 02
- ඉසින යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම - දින 02
- සංයුක්ත අස්වනු නෙලන ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම - දින 02
- ක්ෂුද්‍ර ජල සම්පාදන හඳුන්වා දීමේ පාඨමාලාව - දින 02ක්
- ක්ෂුද්‍ර ජල සම්පාදනය සැලසුම් කිරීමේ පාඨමාලාව - දින 05
- කෘෂිකාර්මික අත් ආවුධ
- ගෙවතු වගාව

ඉලක්ක කෙරුණු කණ්ඩායම් වනුයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් , අනෙකුත් ආයතන වල නිලධාරීන්, ගොවීන් සහ පාසැල්, විශ්වවිද්‍යාල, කෘෂිකර්ම විද්‍යාල සහ තාක්ෂණික විද්‍යාල සිසුන්ය.

2011 වසරේදී ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය මගින් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 14ක්(මිනිස් දින 652ක්),ගොවීන් සඳහා වැඩසටහන් 12ක්(මිනිස් දින 426ක්), විශ්වවිද්‍යාල, පාසැල්, තාක්ෂණික විද්‍යාල සහ කෘෂිකර්ම විද්‍යාලීය සිසුන් සඳහා පුහුණු වැඩසටහන් 54ක් මෙහෙය විය.

මෙම මධ්‍යස්ථානය ගොවිපළ යාන්ත්‍රීකරණයට අදාළව්‍යාප්ති කටයුතු ඉටු කිරීම සඳහා ක්ෂේත්‍ර ව්‍යාප්ති කාර්‍ය මණ්ඩලයට සහයෝගය ලබාදීමත් ඊට අමතරව අවශ්‍ය අවස්ථාවන්හිදී ආයතන සඳහා ගොවිපළ යාන්ත්‍රීකරණය පිළිබඳව උපදේශක සේවාවන් ලබා දීමත් සිදු කරයි.

දිස්ත්‍රික් කාර්මික පුහුණු මධ්‍යස්ථානය - විරවිල

2011 වසරේදී මෙම මධ්‍යස්ථානය ගොවීන් සඳහා පුහුණු කිරීම් 15ක් සහ (512 දෙනෙකු සහභාගී විය).නිලධාරීන් සඳහා පුහුණු කිරීම් 11ක් (512 දෙනෙකු සහභාගී විය)මෙහෙය වූ අතර 2011 සැප්තැම්බර් 07 වැනි දින කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරුවන් 21 දෙනෙකු සඳහා එක් අවුරුදු පුහුණු වැඩසටහනක් ආරම්භ කරන ලදී.

දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - අම්පාර

මෙම වරරේදී පුහුණු වැඩසටහන් 33ක් (මිනිස් දින 3324ක්)මෙහෙය වූ අතර ඊට නිලධාරීන් සඳහාපුහුණු 13ක් (මිනිස් දින 512 ක්) ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් 18ක් (මිනිස් දින 608ක්),වෙනත් තාක්ෂණික පුහුණු 05ක් (මිනිස් දින 232ක්, වැඩමුළු 06ක් (මිනිස් දින 139ක්) සහගොවි ක්ෂෙත්‍ර චාරිකා 16ක් (මිනිස් දින 111 ක්), සහ ගොවීන් සඳහා මධ්‍යස්ථානයෙන් පිටත පුහුණු 06ක්(මිනිස් දින 228ක්) ඇතුළත් වේ.

කාන්තා කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන(WAE)

කාන්තා කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහනේ මෙහෙවර වනුයේ පවුල් ඒකකවල ජීවන තත්ත්වය සහ පෝෂණ මට්ටම ඉහළ නංවාලීම තුළින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා කාන්තාවන්ගෙන් ලැබෙන දායකත්වය ඉහළ නැංවීමයි. යහපත් නිවාස පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සහ කාන්තාව කේන්ද්‍ර කර ගනිමින් නිවාස සඳහා ආදායම් උත්පාදන කටයුතු ආරම්භ කිරීම අරමුණු කර ගත් මෙම වැඩසටහන එක් එක් කෘෂිකාර්මික පරිපාලන දිස්ත්‍රික්ක වල නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාල වලට අනුයුක්ත කාන්තා කෘෂිකර්මික ව්‍යාප්ති නිලධාරීන් මගින් මූලික මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබයි.

2011 වසරේදී සිදු කරනු ලැබූ ව්‍යාප්ති කටයුතු

කාන්තා කෘෂිකාර්මික ව්‍යාප්ති වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක ව්‍යාප්ති නිලධාරීන් 2986 දෙනෙක් පුහුණු කළ අතර ආහාර සහ පෝෂණය සහ ව්‍යවසායකත්ව සංවර්ධනය පිළිබඳව, ගොවි කාන්තාවන් 16,069 ක් පුහුණු කරන ලදී. ඊට අමතරව කාන්තා සංවිධාන 229 ක් (සාමාජිකයින් 11,148ක්) ස්ථාපිත කෙරිණි. ගෙවතු වගාව සහ මුළුතැන්ගෙයි තත්ත්වය ඉහළ නැංවීමෙන් නිවාස 3394 ක් සංවර්ධන කළ අතර ලිපි 38ක් මුද්‍රණය කිරීම, රූපවාහිනී වැඩසටහන් 01 ක් විකාශනය කිරීම, ක්ෂේත්‍ර දින 31ක්, ප්‍රදර්ශන 07 ක් සහ අධ්‍යයන චාරිකා 20ක් සිදු කරන ලදී.

කෘෂි ව්‍යවසාය සංවර්ධනය සහ තොරතුරු ඒකකය

කෘෂි ව්‍යවසාය සංවර්ධනය සහ තොරතුරු සේවාව වෙත පැවරී තිබෙන වගකීම වනුයේ කෘෂි පාදක ව්‍යවසාය ප්‍රවර්ධනය කිරීම සඳහා සහාය ලබා දීම වන අතර මෙම ඒකකය විසින් පහත දැක්වෙන කාර්යයන් ඉටු කරනු ලබයි.

- විභව ව්‍යවසායකයින් සඳහා කෘෂි ව්‍යාපාර ආශ්‍රිත දැනුවත් කිරීමේ සහ හැකියා සංවර්ධනය කිරීමේ කෙටි කාලීන පුහුණු වැඩසටහන් මෙහෙය වීම.

- විශේෂඥ කණ්ඩායමක්විසින් කෘෂිකාර්මික දේපල හිමිකරුවන් සහ ආයෝජකයින් සඳහා ගොවිපළ මට්ටමේ තාක්ෂණික උපදේශක සේවාව ලබා දීම.

- ව්‍යවසායකයින් සඳහා අවශ්‍ය තාක්ෂණික තොරතුරු සහ දත්ත සැපයීම සහ අදාළ පාර්ශ්වකරුවන් සමඟ ඔවුන් සම්බන්ධ කිරීම.

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික සහාය ලබා ගනිමින් ගොවීන් වෙත විශ්වාසදායී යෙදවුම් සහ සේවාවන් සපයනු ලබන කෘෂිකාර්මික සේවා මධ්‍යස්ථාන (කෘෂි සේවා පියස) ස්ථාපිත කිරීම.

- ගොවි ව්‍යාපාර පාසැල් (FBS) ප්‍රවේශය හඳුන්වා දෙමින් සහ අදාළ පුහුණු කිරීම් සිදු කිරීම මගින් ගොවීන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන්ට සහාය ලබා දීම.

2011 වසරේදී මෙහෙය වූ ව්‍යාප්ති වැඩසටහන්

අ. කෘෂි ව්‍යාපාරය ආශ්‍රිත පුහුණු වැඩසටහන්

වගු අංක :3.6.3. මෙහෙයවන ලද කෘෂි ව්‍යාපාර ආශ්‍රිත පුහුණු වැඩසටහන්

විෂය	කාලය (දින)	අභ්‍යාසලාභීන් සංඛ්‍යාව
බිම්මල් නිෂ්පාදනය සහ ආශ්‍රිත සේවා	02	36
කාබනික පොහොර නිෂ්පාදනය	02	10
උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය	02	16
මීපැණි නිෂ්පාදනය සහ ආශ්‍රිත සේවා	03	14
ගෙවතු වගාව සහ ආශ්‍රිත සේවා	02	27
වාණිජ ගොවිපළවල් ලෙස කෘෂිකාර්මික ඉඩම් සංවර්ධනය කිරීම	03	15
පලතුරු සහ එළවළු ආශ්‍රිත අගය එක්කළ නිෂ්පාදන	03	12

ආරක්ෂිත කෘෂිකර්මය සමඟින් වටිනාකමින් ඉහළ බෝග වගාව සහ ආශ්‍රිත සේවා	05	21
සහල් පිටි පාදක අගය එක් කළ නිෂ්පාදන	02	14
ක්ෂුද්‍ර ජල සම්පාදනය	03	10
2011 වසරේ මුළු අභ්‍යාසලාභීන් සංඛ්‍යාව		**175**

ආ. ගොවිපලේදී තාක්ෂණික උපදේශක සේවාව ලබාදීම

මීරිගම,බණ්ඩාරගම සහ ගල්කුලම යන ප්‍රදේශ වලින් දේපල හිමිකරුවන් තිදෙනෙකු සඳහා අක්කර 46 ක කෘෂිකාර්මික දේපල සංවර්ධනය කිරීම සඳහා සේවය ලබා දෙන ලදී.

ඇ. නව කෘෂි සේවා පියස ස්ථාපිත කිරීම

මාස්පොත,දන්කොටුව, විජයබාහුපුර, පුබ්බෝගම, ජයන්තිපුර, අතුරුගිරිය, වැලිවේරිය සහ උකුවෙල යන ප්‍රදේශ වල නව කෘෂි සේවා පියසි අටක් විවෘත කෙරිණි.

ඈ. ව්‍යාප්ති නිළධාරීන් සහ ගොවීන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් ප්‍රවර්ධනය කිරීම.(ගොවි ව්‍යාපාර පාසැල්)

දිස්ත්‍රික්ක 10 ක ව්‍යාප්ති නිළධාරීන් 48ක් දෙනෙකු ගොවි පුහුණු පාසැල් වල පුහුණුකරුවන් ලෙස පුහුණු කළ අතර එම නිළධාරීන් ඒ ඒ දිස්ත්‍රික්කවල 2011/12 මහ කන්නයේ සිට තෝරාගත් ගොවි කණ්ඩායම් සඳහා ගොවි ව්‍යාපාර පැසැල් මෙහෙයවනු ලබයි.

මී මැසි සංවර්ධන ඒකකය, බිදුණු වැව - බණ්ඩාරවෙල

ගොවීන් අතර මී මැසි පාලනය සංවර්ධනය කිරීම සහ ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් වගකීම දරන මෙම ඒකකය විසින් නවීන මී මැසි පාලන තාක්ෂණය පතුරුවාලීම සඳහා පහත දැක්වෙන පහසුකම් සපයනු ලබයි.

- ගොවීන්,නිළධාරීන්, සිසුන් සහ මී මැසි පාලනය පිළිබඳ උනන්දුවක් දක්වන වෙනත් පුද්ගලයින් පුහුණු කිරීම.
- මී මැසි පාලන උපකරණ නිෂ්පාදනය.
- මී මැසි පාලන උපකරණ නිපදවන්නන් පුහුණු කිරීම සහ ලියාපදිංචි කිරීම සහ සහතික කිරීම.
- මී මැසි පාලන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ සහ රජයේ නොවන සංවිධාන සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
- පර්යේෂණ කටයුතු

මෙම වසරේදී ඒකකය විසින් මී පැණි කි.ග්‍රෑ. 375ක්, මී මැසි ජනපද 240ක්, මී මැසි පෙට්ටි 911ක්, දුම් ගසන 280ක්, පිලා රාමු 780ක්, මී පැණි රාමු 740ක් සහ ක්වීන් ගාඩ් 1263 නිපදවූ අතර මී මැසි පාලනය පිළිබඳව පුහුණු වැඩසටහන් 20ක්ද මෙහෙය විය.

තරුණ ගොවි සමාජය(YFC) සහ ජංගම, ව්‍යාප්ති සේවා ඒකකය

තරුණ ගොවි සමාජ 100ක් පමණ පිහිටුවා ඇති අතර ඉන් තුනෙන්එකක් ප්‍රධාන කායර්ාලයේ ලියාපදිංචි කර ඇත. 2011 වසරේදී, කෘෂිකර්මය ව්‍යාප්ත කිරීමෙහිලා තරුණ ගොවි පරපුරේ සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩසටහන් මෙහෙය වන ලදුව නිළධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 03ක් සහ තරුණ ගොවි සමාජයේ සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් 75ක් සිදු කෙරිණි. තරුණගොවි සමාජය මගින් සංස්කෘතික වැඩසටහන් 103ක් ආගමික වැඩසටහන් 150 ක්,අධ්‍යාපනික වැඩසටහන් 95ක් සහ සමාජීය වැඩසටහන් 92ක්සිදු කරන ලදී.

ජල සම්පාදන කළමනාකරණයසහවැඩිදියුණු කළකෘෂිකාර්මික කළමනාකරණ ඒකකය

මෙම ඒකකය පහත දැක්වෙන විෂයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

- ජල සම්පාදනය සහ ජලසම්පාදන කළමනාකරණය
- ක්ෂුද්‍ර ජල සම්පාදන කළමනාකරණය සහ පොහොර මිශ්‍රිත ජලසම්පාදනය
- පාලිත පරිසර කෘෂිකර්මය(ආරක්ෂිත කෘෂිකර්මය)

- වාර්ෂික සහ බහු වාර්ෂික බෝග සඳහා වාණිජ වගාව(වැඩි දියුණු කරන ලද වාණිජ ගොවිපළ)

- වැඩිදියුණු කළ තවාන් කළමනාකරණය

2011 වසරේදී, ගොවි ප්‍රතිලාභීන් අතර (ගොවි පවුල් 500ක්) ප්‍රධාන වශයෙන් ක්ෂුද්‍ර ජල සම්පාදන උපකරණ බෙදා දීම සඳහා රු: මිලියන 9ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කෙරුණු අතර දිවි නැගුම වැඩසටහන යටතේ වැසි ආවරණ එළවළු වගාව සඳහා තාක්ෂණික සහාය ලබා දෙන ලදී.(සැලසුම් කිරීම සහ ශෂ්‍ය විද්‍යාව)

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානයේ විශාල ගොවිපළවල් (හෙ.100) 6ක් සංවර්ධනයකිරීමට සහ ක්ෂුද්‍ර ජලසම්පාදන තාක්ෂණය හා සම්බන්ධ සැලසුම් කිරීම් සහ ශෂ්‍ය විද්‍යාත්මක සංරචක පිළිබඳව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට තාක්ෂණික සහාය ලබා දෙන ලදී.

සැලසුම් සහ ප්‍රගති මෙහෙයුම් ඒකකය

සැලසුම් සහ ප්‍රගති මෙහෙයුම් ඒකකය මගින් ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, මූල්‍ය සහ තාක්ෂණික කටයුතු අධීක්ෂණය කිරීම, සහ ඇගයීමද ව්‍යාප්ති හා පුහුණු අංශය මගින් මෙහෙයවනු ලබන විශේෂ ව්‍යාපෘති සම්බන්ධයෙන්ද කටයුතු කරනු ලබයි.

ගුවන් විදුලි ගොවි සේවාව

මෙම ඒකකයේ ප්‍රධාන පරමාර්ථය වනුයේ කෘෂිකාර්මික තාක්ෂණිකක්‍රම, වෙළඳපල තත්ත්වයන්, කෘෂිකාර්මික භාණ්ඩ මිළ ගණන් ,කෘෂිකර්මාන්තය පිළිබඳ වත්මන් කටයුතු සහ ඉල්ලුම සහ රජයේ ප්‍රතිපත්ති පිළිබඳ දැනුවත්භාවය ඇතිකිරීම සහ ජනතාවගේ ආදායම ඉහළ නංවා ගැනීම සඳහා මෙම තොරතුරු උපයෝගි කර ගැනීමට උනන්දු කරවීම සහ ගොවීන් මුහුණපාන ගැටළු නිරාකරණය කිරීමයි. මෙම ගොවි වැඩසටහන් භාෂා තුනෙන්ම විවිධ ගුවන් විදුලි නාලිකා ඔස්සේ දිවයින පුරා ශ්‍රවණය කළ හැකිය.

වගු අංක :3.6.4. ගුවන් විදුලි ගොවි සේවා වැඩසටහන් වල ප්‍රගතිය- 2011

කාර්‍ය්‍ය	උප කාර්‍ය්‍ය	ප්‍රගතිය
ගුවන් විදුලි වැඩසටහන්	සරුකෙත	48
	රජරට ගෙවත්ත(සජීවී)	36
	සජීවී සාකච්ඡාව	1
	වයඹ ගෙවත්ත	12
	වයඹ ගෙවත්ත	36
	තුනැත්ත	49
	අත්වැල(කෙටි පණිවුඩ)	125
දිනපතා ප්‍රචාරය වන ගුවන් විදුලි වැඩසටහන් කොළඹ ඒකකය	ගොවි ගෙදර	47
	ගොවිතැනට පැයක්(සජීවී)	52
	සාර භූමි	51
	අඬහැරය	768
	ගොවි පැණ	52
	සෙයිලම	49
	ඉසුරු පියස	72
	ගොවි ගෙදරින් මහ ගෙදරට	13
	සරුබිමට අරුණළු (කෙටි පණිවිඩ)	4240
	කෙටි පණිවිඩ	138
දෙමළ කොළඹ ඒකකය	වීට්ටු තෝට්ටම්(සජීවී)	48
	වන්න මරදම්	44
	උලවර් ඉල්ලම්	44
	වලමාන බෝමික්කු පුදිය උදයම්	1020
	කෙටි පණිවිඩ	178
	සාකච්ඡාව	23
ගුවන් විදුලි ගොවි සේවාව	පුහුණුව	5
	උපදේශක	515
දිනපතා ප්‍රචාරය වන ගුවන් විදුලි වැඩසටහන්(සිංහල) කඳුරට ඒකකය	කන්කාරිය	45
	ගොවිබිම	53

	අස්වැන්න(සජීවී)	50
	ඉසුරු සොයා	47
	කලවිට	726
	රසමුසුව	22
කඳුරට දෙමළ	කුරිච්චි මරල්හල්	47
	මහඩුහල්	48
(සිංහල)	දිවි මඟට අත්වැලක්	49
	රුහුණු ගෙවත්ත(සජීවී)	45
	ගොවි දෑතට අපේ සවිය	181
	හත් අඩිය	49
	කවි කොළය	51
	සළුපාලිය	41
	කඩමල්ල(රුහුණු බිමයි - ගොවි දෑතයි)	49
	රුහුණු බිමයි ගොවි දෑතයි	47

ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය

ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මාධ්‍ය ඒකකයයි. මෙම මධ්‍යස්ථානයපුළුල් පරාසයකින් යුත් උපදේශාත්මක මාධ්‍ය වැඩසටහන් නිෂ්පාදනය කරනු ලබන අතර එම කායර්යන්ට අමතරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ මට්ටම්වලින් කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන් සඳහා පුහුණු වැඩසටහන් මෙහෙයවනු ලබයි.

ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානයේ කෘයර්යන්

- සතිපතා රූපවාහිනි වාර්තා වැඩසටහන් දෙක නිෂ්පාදනයකිරීම (ඉරිදා ප.ව. 6.25ට ගොවිබිමට අරුණාළු සහ සිකුරාදා ප.ව. 6.15 ට මිහිකත දිනුවෝ)
- කෘෂිකාර්මික ප්‍රකාශන, අත්පත්‍රිකා, පෝස්ටර්, විශාල පුවරු, බැනර් ආදිය නිර්මාණය සහ නිෂ්පාදනය
- ගන්නෝරුව කෘෂි තාක්ෂණ උද්‍යානය කළමනාකරණය
- කලාපිය සහ ජාතික මට්ටමින් කෘෂිකාර්මික ප්‍රදර්ශන සංවිධානය කිරීම
- ගොවි සහන සරණ සේවය. කෘෂිකාර්මික උපදේශක සේවාව(කෙටි සංකේතය 1920)
- කෘෂිකාර්මික තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික කටයුතු (වෙබ් අඩවි, IMMCDs, සයිබර් ව්‍යාප්ති සහ ජාලගත කිරීම)
- ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය සම්බන්ධයෙන් පුහුණු පැවැත්වීම(ඉදිරිපත් කිරීමේ තාක්ෂණය)
- ජාතික කෘෂිකාර්මික තොරතුරු ජාලය සහ කෘෂිකාර්මික තොරතුරු සහ සන්නිවේදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ කටයුතු

2011 වසරේදී සිදු කරන ලද කායර්යන්හි ප්‍රගතිය පහත දැක්වේ

පුහුණු කිරීම්

පුහුණු වැඩසටහන් 11(මිනිස් දින- 1056)

ග්‍රැෆික් සන්නිවේදනය

තාක්ෂණික ප්‍රකාශන	16
අත්පත්‍රිකා	76
පුවරු /ප්‍රදර්ශන පුවරු	15
පුවත්පත් අතිරේක/ඕෆ්සෙට් මුද්‍රණය සඳහා පෝස්ටර්	29
ඩෙස්ක්ටොප් ප්‍රසන්ටේෂන්	28
වර්ණ පිටු/ආරාධනා/සුභ පැතුම් පත්	135

ලේබල්/ ස්ටිකර්ස්/නාම පුවරු	4203
බැනර්	36

වීඩියෝ /ඡායාරූපකරණය

මිහිකත දිනුවෝ	50
ගොවි බිමට අරුණාළු	49
අනෙකුත් චාර්තා වැඩසටහන්	02
රූපවාහිනී වැඩසටහන්	12
වීඩියෝ වැඩසටහන් පිටපත්කරණය	232
ඩිජිටල් ඡායාරූපකරණය	11,034

තොරතුරු තාක්ෂණය

IMM CD ROMs	03
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය(යාවත්කාලීන කරන ලද)	521
RKB වෙබ් අඩවිය (යාවත්කාලීන කරන ලද)	594
විකිපීඩියා වෙබ් අඩවිය(යාවත්කාලීන කරන ලද)	50
නව දත්ත මූලය සකස් කිරීම	02(පැය ගණන- 332)
ගාස්තු රහිත උපදේශන(ප්‍රශ්න සංඛ්‍යාව)	40,834
නව සයිබර් ඒකක	17
ජාලගත කිරීම(LAN)	11
දෘඩාංග මෘදුකාංග නඩත්තු කිරීම	102

ප්‍රදර්ශන

ප්‍රදර්ශන 05

කෘෂි උද්‍යාන

නැරඹීමට පැමිණි සංඛ්‍යාව - වැඩිහිටියන්	46,574
නැරඹීමට පැමිණි සංඛ්‍යාව - පාසැල් සිසුන්	67,048
ආදායම	රු. 1,235,995

තොරතුරු මධ්‍යස්ථානය

මෙම ඒකකයේ වගකීම වනුයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුද්‍රිත ප්‍රකාශන බෙදා හැරීමයි. ප්‍රධාන අළෙවි මධ්‍යස්ථානය පේරාදෙණියේද උප අළෙවි මධ්‍යස්ථාන 34ක් දිවයින පුරාද පිහිටුවා ඇති අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි තාක්ෂණික උද්‍යානය නැරඹීමට පැමිණෙන්නන් සඳහා 2007, ජූලි මාසයේදී නව අළෙවි මධ්‍යස්ථානයක් ගන්නෝරුවේ ස්ථාපිත කරන ලදී.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලය

පහත සඳහන් ප්‍රකාශන 2011 වසරේදී මුද්‍රණය කෙරිණි.

පොත්	පිටපත් 4825
ඇග්ටෙක් නිව්ස් ලෙටර්	පිටපත් 6000
අත්පත්‍රිකා	පිටපත් 2500
කර්මිකචාර්‍යවරුන් සඳහා අත්පත්‍රිකා	පිටපත් 8000
පෝස්ටර්/සහතික /ආරාධනා සහ දැන්වීම්	පිටපත් 17080

කෘෂිකර්ම අධ්‍යාපනය

කුණ්ඩසලේ, පැල්වෙහෙර, අඟුණාකොළපැලැස්ස, වවුනියාව සහ කරපිංච පිහිටි කෘෂිකර්ම විද්‍යාල පහ දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව ලබා දේ. ලබුදූව, වාරියපොල සහ අනුරාධපුරයේ පිහිටි කෘෂිකර්ම පාසැල් විශේෂ පුහුණු මධ්‍යස්ථාන ලෙස කටයුතු කරන අතර කෙටිකාලීන කෘෂිකර්ම පාඨමාලා පවත්වයි.

කෘෂිකර්ම පාසැල් වල ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වගු අංක 3.6.5 හි දැක්වේ.

වගු අංක :3.6.5. කෘෂිකර්ම විද්‍යාල වල සිසුන් සංඛ්‍යාව - 2011

කෘෂිකර්ම විද්‍යාලය	වර්ෂය	මාධ්‍ය						එකතුව	මුළු එකතුව
		සිංහල		දෙමළ		ඉංග්‍රීසි			
		පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු		
කුණ්ඩසාලේ	1 වසර	45	25	6	11	13	15	115	221
	2 වසර	33	27	16	12	08	10	106	
අඟුණාකොළපැලැස්ස	1 වසර	28	19					47	70
	2 වසර	22	1					23	
පැල්වෙහෙර	1 වසර	35	14					49	89
	2 වසර	29	11					40	
වවුනියාව	1 වසර			27	08			35	52
	2 වසර			09	08			17	
කරපිංච	1 වසර							21	21
	2 වසර	21							
		213	**97**	**68**	**39**	**21**	**25**	**453**	**453**

කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරු සඳහා එක් අවුරුදු කෘෂිකාර්මික ප්‍රායෝගික පුහුණු පාඨමාලාව

ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අනුයුක්ත කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරු මෙම පාඨමාලාවේ ඉලක්ක කෙරුණු කණ්ඩායම වන අතර 2005 වසරේදී පුහුණු මධ්‍යස්ථාන අටක ආරම්භ කරන ලද මෙම පාඨමාලාව කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරු පාඨමාලාව සම්පූර්ණ කරන තෙක් මෙහෙයවනු ලබයි. පළමු කණ්ඩායමේ 676 දෙනෙකු 2006 වසරේදීද දෙවන කණ්ඩායම (246) 2008 වසරේදී සහ තුන්වැනි කණ්ඩායම (278) 2011 වසරේදී පුහුණුව සම්පූර්ණ කරන ලදී. 2011/2012 වසරේදී පුහුණු කරන ලද කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරු පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගු අංක : 3.6.6. 2010/2011 වසරේදී සිදු කරන ලද පුහුණු වැඩසටහන් වල ප්‍රගතිය

පුහුණු මධ්‍යස්ථානය	පුහුණු කරන ලද කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරු සංඛ්‍යාව		පුහුණු කරන ලද මුළු සංඛ්‍යාව
	1 වැනි කණ්ඩායම 2011/I	2 වැනි කණ්ඩායම 2012/II	
කෘෂිකර්ම විද්‍යාලය අනුරාධපුර	18	-	18
කෘෂිකර්ම විද්‍යාලය - වාරියපොළ	25	-	25
කෘෂිකර්ම විද්‍යාලය - ලබඳූව	13	24	37
දිස්ත්‍රික්ක කෘෂිකර්ම පුහුණු - මධ්‍යස්ථානය - වීරවිල	22	20	42
උද්‍යාන බෝග වගා පුහුණු කිරීමේ සහ සංවර්ධන මධ්‍යස්ථානය - බිබිල	39	24	54
එකතුව	**117**	**68**	**185**

විභාග ඒකකය

2011 වසරේදී ඒකකය මගින් පවත්වන ලද විභාග පිළිබඳව පහත දැක්වේ.

- කෘෂිකර්ම විද්‍යාල සඳහා නව ප්‍රවේශ(අයදුම්කරුවන් සංඛ්‍යාව - 270)
- ඩිප්ලෝමා පාඨමාලා විභාග(සිසුන් සංඛ්‍යාව - 1740)
- කෘෂිකර්ම උපදේශකවරුන් සඳහා දෙපාර්තමේන්තුමය විභාග (කෘෂිකර්ම උපදේශකවරු සංඛ්‍යාව - 380)
- කෘෂිකර්ම විද්‍යාලවල පළමු වසර පාඨමාලාව සඳහා විභාග - (කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකරවරු සංඛ්‍යාව - 552)
- ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවා නිළධාරීන්, කෘෂිකර්ම ඉංජිනේරුවරුන් සඳහා කායික්ෂමතා කඩඉම් විභාග
- භාෂා ප්‍රවීනත්වය සඳහා වාචික විභාග(සිංහල සහ දෙමළ)

කාබනික කෘෂිකර්මය සහ පැළැටි පෝෂණ ඒකකය.

මෙම ඒකකයේ ප්‍රධාන ඉලක්කය වනුයේ දිවයිනේ පරිසර හිතකාමී කෘෂිකර්මය පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමය. කෘෂිකර්ම අමාත්‍යංශය මගින් අරමුදල් ප්‍රතිපාදිත ප්‍රජා පාදක බීජ නිෂ්පාදන වැඩසටහන සහ කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය යන විශේෂ ව්‍යාපෘති දෙක මෙම ඒකකය මගින් සම්බන්ධීකරණය කළ අතර අනෙකුත් ව්‍යාපෘති වල කාර්‍යීඵල පිළිබඳ පහත දැක්වේ.

1.**NSOFT (තිරසාර ව්‍යාපෘතිය සඳහා ආසියානු ජාලය)**

කාබනික ගම්මාන 10ක් ස්ථාපිත කිරීම, ගම්මාන 10කින් ගොවීන් 1500ක් තෝරා ගැනීම සහ කාබනික ගෙවතු 1500ක් ස්ථාපිත කිරීම සිදු කෙරිණි.

2. **ප්‍රරෝහණය පරීක්ෂා කරන ලද බිත්තර වී වැඩසටහන**

ප්‍රරෝහණය පිළිබඳව පරීක්ෂා කරන ලද බිත්තර වී වැඩසටහන ඇසුරෙන් බිත්තර වී බුසල් 35,000ක් නිපදවීම.

2011 වසර සඳහා සැලැස්ම

විශේෂ ව්‍යාපෘති

1. මාධ්‍ය වැඩසටහන - අරමුදල් ප්‍රතිපාදනය රු. මිලියන 20
2. කෘෂිකර්ම පාසැල් සහ පුහුණු මධ්‍යස්ථාන වල ඉඩම් සංවර්ධනය
3. කෘෂිකර්ම විද්‍යාල සහ පුහුණු මධ්‍යස්ථානයේදී පුහුණු කිරීම් සහ කුසලතා ඔප්නැංවීමේ වැඩසටහන්
4. කෘෂි උද්‍යාන - ගන්නෝරුව/බටඅත

5. අන්තර් පලාත් ප්‍රදේශ වල කන්න මැද රනිල බෝග වගාව

6. කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය

7. "අපි වවමු රට නගමු" වැඩසටහන යටතේ මාධ්‍ය වැඩසටහන

8. අන්තර් පලාත් ප්‍රදේශ වල වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය

9. මී පැණි නිෂ්පාදනය ඉහළ නැංවීම.

10. නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම

11. ප්‍රජා පාදක බීජ නිෂ්පාදන වැඩසටහන

12. බිබිලේ උද්‍යාන බෝග වගා පුහුණු සහ සංවර්ධන මධ්‍යස්ථානයේ බඩඉරිඟු වගාව

13. බිබිල උද්‍යාන බෝග වගා පුහුණු සහ සංවර්ධන මධ්‍යස්ථානයේ පැඟිරි පැළ වගාව

14. ආදර්ශ ගම්මාන ස්ථාපිත කිරීම

අනෙකුත් දෛනික කෘෂිකාර්මික වැඩසටහන්

ව්‍යාප්ති කටයුතු (අන්තර් පලාත් ප්‍රදේශ වල)

වී පිළිබඳ යාය වැඩසටහන් සංඛ්‍යාව	73,332
යාය වැඩසටහන යටතේ පවතින වගා වපසරිය	හෙ.249,742
වී පිළිබඳ පුහුණු පංති සංඛ්‍යාව	24,213
වී පිළිබඳ පුහුණු පංතිවල අභ්‍යාසලාභීන් සංඛ්‍යාව	551,437
සහතික කළ වී නිෂ්පාදන වැඩසටහනේ වගා වපසරිය	හෙ.9,116
ස්වයං බිත්තර වී නිෂ්පාදන වැඩසටහන	ගොවීන් සංඛ්‍යාව 44,388

කෘෂිකාර්මික තොරතුරු සන්නිවේදනය ශක්තිමත් කිරීමේ කටයුතු

ගොවිකම් සඟරා මුද්‍රණය කිරීම සහ බෙදා හැරීම	පිටපත් 32,000
ඇග්ටෙක් මුද්‍රණය කිරීම සහ බෙදා හැරීම	පිටපත් 28,800
ගුවන්විදුලි වැඩසටහන් ප්‍රචාරය කිරීම	ගුවන්විදුලි වැඩසටහන් 3,488 කෙටි පණිවිඩ 3,036
පැන විසඳුම් වැඩසටහන්	ගුවන්විදුලි වැඩසටහන් 720
රූපවාහිනි වැඩසටහන් විකාශනය	වැඩසටහන් 100
කෘෂිකාර්මික උපදේශ සේවාව	ගොවිගැටළු 37,200කට පිළිතුරු සැපයීම

කෘෂිකාර්මික අධ්‍යාපන කටයුතු

ඩිප්ලෝමා සිසුන් ගණන - 480 (1 වැනි සහ 2වැනි වර්ෂ)

පුහුණු කිරීම්

නිලධාරීන්, ගොවීන්, පාසැල් සිසුන් සහ විවිධ කෘෂිකාර්මික විෂයන් හා සම්බන්ධ අනෙකුත් පුද්ගලයින් සඳහා පුහුණු වැඩසටහන් 33,087ක් සැලසුම් කර ඇත.

කායික්‍ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
අධ්‍යක්ෂ	01
අතිරේක අධ්‍යක්ෂ	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ	05
සහාකාර අධ්‍යක්ෂ	28
කෘෂිකර්ම නිළධාරී	13

කථිකාචාර්‍ය	61
විෂයානුබද්ධ විශේෂඥ	16
යාන්ත්‍රික ඉංජිනේරු	01
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි	27
වැඩසටහන් සහකාර	36
මාධ්‍ය සහකාර	03
ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර	05
කෘෂිකර්ම උපදේශක	349
පර්යේෂණ සහකාර	02
ගොවිපළ යාන්ත්‍රික උපදේශක	01
යාන්ත්‍රික නිළධාරි	01
කෘෂිකර්ම ව්‍යාප්ති සේවා නිළධාරි	01
ඡායාරූප ශිල්පි	01
අකුරු අමුණන්නා	03
කාර්මික ශිල්පි (ශ්‍රව්‍ය දෘෂ්‍ය)	01
චිත්‍ර ශිල්පී	02
මී මැසි පාලක	06
මී මැසි ආදර්ශක	01
යන්ත්‍ර ශිල්පි	02
කාර්මික ශිල්පි	05
යන්ත්‍ර පරිවාරක	03
සිනමා යන්ත්‍ර ක්‍රියාකරු	04
පුස්තකාලයාධිපති	01
පරිපාලන නිළධාරි	02
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	109
භාෂා පරිවර්තක(ඉංග්‍රීසි)	01
ගබඩා භාරකරු	03
පොත් බඳින්නා (මුද්‍රණාල)	01
ගොවිපළ ලිපිකරු	05
කාර්යාල කාර්ය සහායක	15
වේලා සටහන්කරු	01
ස්ටුවර්ඩ්	01
අරක්කැමි	30
මුරකරු	60
සනීපාරක්ෂක කම්කරු	09
රියදුරු	71
ලොරි පවිත්‍රකරු	04
වෑල්ඩිංකරු	01
කම්මල්කරු	01
විදුලි ශිල්පි	02
පින්තාරුකරු	01
තණකොළ කපන යන්ත්‍රක්‍රියාකරු	11
ජල පොම්ප ක්‍රියාකරු	01
යන්ත්‍රාගාර සහායක	02
කම්කරු(III පන්තිය)	250
එකතුව	**1161**

4.1 පාලන අංශය

පාලන අංශයේ කායර්භාරය පත්වීමේ සිට විශ්‍රාම ගැනීම දක්වා කාල පරිච්ඡේදය තුළ ඇති වන විවිධ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම ලෙස සැකෙවින් අර්ථ දැක්විය හැකිය.අධ්‍යයන නිවාඩු ලබාදීම සහ විනයානුකූල හැසිරීම සම්බන්ධ කටයුතුද මෙම අංශයේ කාර්යයන් අතර වේ. විවිධ අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිසම, මානව හිමිකම් කොමිසම, නීතිපති දෙපාර්තමේන්තුව, පාර්ලිමේන්තු උපදේශක කමිටුව සහ පාර්ලිමේන්තු කටයුතු කොමසාරිස් කාර්යාලය සමඟ මෙන්ම අනෙකුත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු සමඟද කිරීමට සිදුවේ. 2011 වසරට අදාළ වැදගත් දත්ත සංඛ්‍යා ලේඛන මෙම වාර්තාවෙන් ඉදිරිපත් කෙරේ.

අයවැය

වගු අංක :4.1.1: වාර්ෂික අයවැය - 2011(රු)

වැය ශීර්ෂය	**ප්‍රතිපාදනය**	**වියදම**	**වියදම%**
මූලධන	5,487,412	4,253,278	78
පුනරාවර්තන	11,676,500	12,519,216	107
එකතුව	**17,163,912**	**16,772,494**	**98**

ප්‍රගතිය

වගු අංක :4.1.2: 2011 වසරේදී සිදු කරන ලද පත්කිරීම්

තනතුරු	**පත්වීම් සංඛ්‍යාව**
අතිරේක අධ්‍යක්ෂ	03
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ	24
කෘෂිකර්ම නිළධාරි	82
පර්යේෂණ නිළධාරි	87
කථිකාචාර්‍ය	22
කෘෂි ආර්ථික විද්‍යාඥ	04
වැඩසටහන් සහකාර	03
කෘෂිකර්ම උපදේශක III පන්තිය	01
කම්කරු	151
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සිදු කරන ලද පත්කිරීම්	
පුස්තකාලයාධිපති සේවය - III පන්තිය	03
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය- III පන්තිය	86

උසස් කිරීම්

වගු අංක :4.1.3: 2011 වසරේදී සිදු කරන ලද උසස් කිරීම්.

තනතුර	සංඛ්‍යාව
ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය- 11/1	05
ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය - I පන්තිය	10
